ඒවි උමංදාව

ශ්‍රී ධම්මදින්න ග්‍රන්ථමාලා අංක 1

සුළු උමංදාව

ශෝධක.

පරවාහැර පේමානන්ද ස්ථවිර

පණ්ඩිත ගලගම ධම්මික ස්ථවිර

ප්‍රකාශක.

සී. ඩබ්ලිව්. සිරිවර්ධන

මුද්‍රණය.

විද්‍යාලඞ්කාර මුද්‍රණාලය

කැලණිය.

2494 — 1950

ශ්‍රී ධම්මදින්න ග්‍රන්ථමාලා අංක - 1

මිහිස විද්‍යාචක්‍රවර්තීන් ප්‍රණීත

ඵළු උමංදාව

— තංගල්ලේ —

පොලොම්මාරුවේ වනවාස විහාරාධිපති

පරවාහැර පෙමානන්ද ස්ථවිරයන්වහන්සේ

— හා —

තදවිහාරස්ථ

ශ්‍රී ධම්මදින්න පරිවෙණාධිපති

පණ්ඩිත ගලගම ධම්මික ස්ථවිරයන්වහන්සේ

විසින් ද සංශොධිත යි.

සී. ඩබ්ලිව්. සිරිවර්ධන මහතා විසින්

කැලණියේ

විද්‍යාලඞ්කාර මුද්‍රණාලයෙහි

මුද්‍රාපිත යි.

2494

1950

සංඥාපනය.

මානව සමාජයෙහි ශ්‍රේෂ්ඨත්වයට පත්වීම ස්වකීය ඥානය පිළිබඳ විශිෂ්ට ලක්ෂණයකි. ඒ සඳහා මහෝත්තමයන්ගේ චරිතාශ්‍රයෙන් ප්‍රතිපාදිතවූ ගුණෝද්ග්‍රහණය ද ඉතා ප්‍රයෝජනවත්ය. භූතලයෙහි ප්‍රාදුර්භූතවූ සියලු ජනයන් අතුරෙන් තථාගතයන් වහන්සේ ම අත්‍යුත්තම ශ්‍රේෂ්ඨ පුද්ගල වූහ. එහෙයින් ම අග්‍රගණ්‍ය ද වූහ. උන්වහන්සේගේ චරිත ප්‍රතිබද්ධවූ සකල ගුණාඞ්ගයෝ ම විද්වජ්ජන සමූහයාගේ සම්මානයට පාත්‍ර වූහ. නිකෙලශීන්ගේ අපදාන ගැන කවර කථා ද?

මහබෝසතාණන් බොධිසම්භාර ධර්මයන් සම්පූර්ණ කරන අවස්ථාවෙහි උත්පත්තිය ලැබූ ඒ ඒ ජාතිවලදී විහිත සමස්ත ක්‍රියා කලාපය ම වීරෝදාර ගුණ සමූහයෙන් පරිපොෂිතය. එය සර්වඥපද ප්‍රාප්තියෙන්පසු යම්යම් කාරුණ්‍ය නිමිතිකොට බුද්ධරජාණන්වහන්සේ විසින් ම දෙශිතය. ඒ ඒ කථා ජාතක කථා නමින් සමභාවිතය. ප්‍රථමකොට මාගධ භාෂාවෙන් ප්‍රවෘත්තවූ ඒ කථාවෝ තත් තත්කාලීන පණ්ඩිතවරෙණ්‍යයන් විසින් ආගම භක්තියෙන් මෙහෙයනලදුව ස්වප්‍රතිභා ශක්තිය ප්‍රකාශ කරමින් සිංහල භාෂාවට පරිවර්තිත වූහ. ඇතැම් කථා කිහිපදෙනකුන් විසින් ද හෙළබසට නඟනලද බව දක්නට ලැබේ. එය ඒ ඒ කථාවිෂයෙහි ඔවුන්ගේ සිත් ඇදගැනීමෙන් ලත් ප්‍රතිඵලයකි.

මෙහිලා උම්මග්ග ජාතකය සකල සාධූන්ගේ චිත්තාහ්ලාදය පිණිස පවත්නේය. ශ්‍රාවකයන්ගේ සිත් විස්මයෙන් ප්‍රබොධ කිරීමෙහි සමර්ථවූ හෙයිනි. මේ අපදානය නොයෙක් කවීන් විසින් ගද්‍ය පද්‍යාත්මක ලෙස ස්වබුද්ධි බලය දක්වමින් අතිශයින් වර්ණිතය. එහි කර්තෘහු ද කිහිපදෙනෙකි.

“එළුඋමංදාව” වනාහි ද්විතීය විද්‍යාචක්‍රවර්ත්තින් විසින් විරචිතවූ උම්මග්ගජාතකයයි. එතුමා බුත්සරණ ආදි ග්‍රන්ථයන්හි කර්තෘවූ විද්‍යාචක්‍රවර්ත්තින්ට නොදෙවන තැනක් ගන්නා බව මෙම ග්‍රන්ථය හදාරන්නාවූ විද්වතුන්ට අවබොධ වනු නිසැකය. පළමුවෙන් විද්‍යාචක්‍රවර්ත්ති කෙනකු සිටිබැවින් “එළුඋමංදා” කතුතුමා ද්විතීය විද්‍යාචක්‍රවර්ත්ති නමින් හැඳින්විනැයි ද, එයින් ම මෙතුමා පසු කාලයක සිටියෙකැයි ද සැලකිය හැකිය.

ද්විතීය විද්‍යාචක්‍රවර්තීන්ගේ ශ්‍රේෂ්ඨ කෘතියක් වූ "එළු උමංදාව" වනාහි මේ තාක් මුද්‍රණද්වාරයෙන් ප්‍රචාරයට නො පැමිණි සිංහල ග්‍රන්ථයකි.

මෙය ධර්ම ග්‍රන්ථයක් වශයෙන් පමණක් නොව "සිංහලයෙහි කියවීමට සෑහෙන පොත් නැත" යන චෝදනාවෙන් සිංහල භාෂාව මුදා ගැන්මට මහෝපකාරී වූ ද, සිංහල භාෂා පෝෂණයෙහි ලා පරමෝත්කෘෂ්ට වූ ද ජාතික වස්තුවක් වශයෙන් සැලකිය හැක.

යම් ග්‍රන්ථයක් අසන පිරිවහන අයට චමත්කාර (රුචි) ජනක ද පැරණි වූ හෝ අලුත් වූ එම ග්‍රන්ථයාගේ වටිනාකම මිණිය යුත්තේ එයින් ම ය. එළු උමංදාව වනාහි එය කියවන්නවුන්ගේ මනෝරථ පූරණයෙහි හැම අතින් ම පොහොසත් බව එය කියවීමෙන් එකහෙලා වැටහේ.

මෙහිදු, පාළි උම්මග්ගජාතකය, මහා උම්මග්ගජාතකය, උමංදාව, උමංදකාව්‍යය යන ග්‍රන්ථයන්හි එන කථා ශරීරය ම ගැබ්වී ඇතත් රචනා කර්තෘත්, කාලයත්, රචනා රීතියත් ගැන සිතන විට මෙය අමුතු ම පොතක් ලෙස සැලකිමට කරුණු තිබේ.

පුරාණයෙහි සිට බොහෝ නිවෙස්වල නිතර භාවිත වූ බණ පොතක් වන එළු උමංදාව සැදැහැවතුන් භක්ති සාගරයෙහි හා විනෝදකාමීන් ප්‍රීතිසාගරයෙහි ද, කලා රසිකයින් සිතිවිලි සයුරෙහි හා නව නාට්‍ය රස ගරුකයන් ආහ්ලාද සාගරයෙහි ද නිමග්න කිරීමෙහි ඉවහල් වූ හැම රචනා ශෛලියකින් ම යුක්ත වන අතර රාජනෛතික වූ හා සංග්‍රාමෝපායායතන වූ ද විචිත්‍ර කරුණුවලින් ගහණ වූයේ ශතවර්ෂ ගණනකට පෙර සිරිත් විරිත් හා භාෂා තත්වය විදහා පාන කැඩපතක් බඳු ය.

දුර්භාග්‍ය කාලයේ පරිහානි නමැති හිමපටලින් වැසී අභාව ප්‍රාප්ත නිෂ්පන්න සිංහල ශබ්ද දහස් ගණනක් ආරක්ෂාවීමෙහි ශබ්ද රත්න භාණ්ඩාගාරයක් බඳු මෙම ග්‍රන්ථය ආධුනිකයින්ගේ පමණක් නො ව විද්වතුන්ගේ ද අමුතු ම රචනා විලාශයකට මං පාදයි.

ස්වභාවෝක්තිය ම ප්‍රාණවත් කොට දැක්වීමෙහි බුහුටි, මෙහි කර්තෘවරයෝ ඇතැම් වර්ණනාවන්හි දී වෙනස් මඟක් ද ගත්හ.

ප්‍රශ්නෝත්තර කථෝපකථනයෙහි සුරුබුහුටි ළපැටි බෝසත් මහෞෂධ පණ්ඩිතුමන්ගේ නානා වෘත්තාන්ත කථා නමැති රස ධාරාවන් බහුශ්‍රැත ද්විතීය විද්‍යාචක්‍රවර්තීන්ගේ රචනා විලාස නමැති

සැඩපහරින් වඩ වඩාත් වේගවත් ව ගලාබසින්නාක් මෙන් මෙහි පැනෙන විශෙෂත්වය ගැන සැලකීම කියවීම් ලොකයාට භාර කරමු.

මෙය සංශොධනයෙහිදී අපට ලැබුණු පුස්කොළ පොත් අතරින් ඉතා පැරණි එළු උමංදාව මුල් පොත වශයෙන් ද, එසේම පැරණිකමේ හැටියට ඉතිරි පොත්වල හා මුද්‍රිත පොත්වල අමුතු වචන පාඨාන්තර වශයෙන් ද මෙහි ඇතුළත් කෙළෙමු.

සංශොධනය නම්; පැරණි ලියන්නන් අතින් වූ පද බිදීම් අඩු අකුරු පිරවීම් හා ඉතාමත් ම විසදෘශ තැන් සකස් කිරීම පමණකි.

වර්තමාන ආචාර්ය කල්පිතයින්ගේ විවිධ මත අනුව නොගොස් මුල් පුස්කොළ පොතේ තත්වය ද, අක්ෂර වින්‍යාසය ද, විභක්ති භෙද ආදිය ද වෙනස් නො කිරීමට ලඞ්කාවිශ්ව විද්‍යාලයේ මහාචාර්ය වූ **ඇම්. ඩී. රත්නසූරිය** මහතුන්ගෙන් අපට ලැබුණු උපදෙස් ඉතා අගය කොට සලකම්හ.

තවද අපට ලැබුණු ඉතා පැරණි පුස්කොළ පිටපතේ අකුරු ගල් ලිපිවලට හා ග්‍රන්ථාක්ෂරවලට බොහෝ සේ සමානයහ. එහි ම පැනෙන "දෙවිඳුචක්‍රවර්තීන්ගේ එළු උමංදාව නිමි" යන පාඨයෙන්ම කර්තෘ කාලාදිය තීරණය වන බැවින් අපි එ ගැන ප්‍රපංච නො වමු. පොත් ශුද්ධ කරමුයයි පැරණි පොත්වල පැවති පෞරාණිකත්වය වෙනස් කොට ස්වමතයට අනුව සකස් කිරීමේ ජාතික අපරාධයෙන් ඉතා වටිනා පැරණි සාහිත්‍ය ග්‍රන්ථ කිලිටිකර තිබෙන මේ යුගයෙහි ඉන් මිදීමට අප ඉතා උත්සුක වූ බව ද, මෙය මුද්‍රණයෙහි දී ස්වධනය යෙදීමෙන් ජාතික වූ ද සාහිත්‍යික වූ ද සේවයක් කළ තංගල්ල නගරාධිපති සමාදාන විනිශ්චයකාර ධුරන්ධර සද්ගුණවත් **ඩී. පී. අතපත්තු** ආණ්ඩුවේ නීතිඥ තුමන්ට ද මෙය මනා ලෙස මුද්‍රණය කර දුන් කැලණියේ "**විද්‍යාලඞ්කාර මුද්‍රණාලයෙහි**" කළමනාකාර මහතුන්ට හා මෙහි ශුද්ධිපත්‍රාවලොකනයෙන් උදවු කළ ශ්‍රී ධම්මදින්න පිරිවෙනෙහි ආචාර්ය **බඩරන්දේ දීපංකර** ස්ථවිරයන්ට ද ප්‍රශංසාසහගත වන බව ද මතක් කරමු.

මීට,

පරවාහැර පෙමානන්ද ස්ථවිර.

පණ්ඩිත ගලගම ධම්මික ස්ථවිර.

ශ්‍රී ධම්මදින්න පිරිවෙන.
පොලොම්මාරුව.
තංගල්ල.
$\frac{2494}{1950}$ 8. 20.

ප්‍රාචාර්ය්‍ය ගුණානුස්මරණම්

යෝ'භූද් මහිභෘතාං පූජ්‍ය -
ස්තථා සෙව්‍යශ්ච ධීමතාං
වික්ඛ්‍යාතඃ ශ්‍රී ධම්මදින්න -
නාම්නා ධම්මවිදං විභුඃ

ලඞ්කායාං දක්ෂිණාශායාං
සුමනාද්‍රි පතිස්තථා
ගුරුඃ ශීලවතාං සඞ්ඝ -
නායකඃ ස්මර්‍ය්‍යතෙ සදා.

ස්වාමිනස්තස්‍ය නාම්නා'ත්‍ර
වර්තතෙ ශාස්ත්‍රමන්දිරම්
තෙන ග්‍රන්ථො 'ය මත්‍යන්ත -
සංක්ලිෂ්ටො විශදීකෘතඃ.

ශුද්ධි පත්‍රය.

පිට.	පෙළ.	අශුද්ධ.	ශුද්ධ.
3	23	කොනෙකුන්	කොනකුන්
4	3	කලී	කලි
5	35	පලාගෙන	පළාගෙන
6	35	ගමනින	ගමනින්
7	23	කාණමැදිරිෙයක	කාණමැදිරියක
8	7	කාණමැදිරිකුසේ	කාණමැදිරියකුසේ
8	35	සිතු	සිතා
9	35	කොලෙනාසේක්	කොළනාසේක්
10	9	ගෙස්	ගොස්
10	33	වදින්නාවූ	වදන්නාවූ
11	4	සිගල්ල	සියල්ල
12	2	ඥුවණින්	නුවණින්
12	15	වැටක්	වැටක්
12	20	ආශ්චර්යයෙන්	ආශ්චර්යයෙන්
12	35	වාලුකා	වාලුකා
13	31	දුපපත්	දුප්පත්
14	24	කියනනේ	කියන්නේ
14	34	එපාතින්	එතෙතින්
16	16	දූන	දූත
16	18	ධූනතී	ධූතතී
17	14	සියාලෝදූයි	සිසාලෝදූයි
18	17	මොලොස්ද	මොලොක්ද
21	18	කඹුලේ	කඹුළේ
22	23	දෙවතාවෙක	දේවතාවක
22	33	වහන්යේ	වහන්සේ
24	27	නම	නම්
27	27	විවාලෝ	විවාලෝ
28	7	පණ්ඩිතයන	පණ්ඩිතයන්
30	25	නුවණැත්තන	නුවණැත්තන්
43	17	කාමපමනවුල	කාමපමානවුල

44	11	ඉත්සි	ඉත්සී
51	4	කරකවී	කරකැවී
55	13	තැගී	තැඟි
56	4	සමෙම	ඝමෙම
56	10	අවිවේ	අවුවේ
56	16	අරඤඤ	අරඤ්ඤ
56	17	සමිංනාතතො	සමනාතතො
56	28	තැත්තේ	ඇත්තේ
57	6	දූප්තුන්	දූප්පතුන්
57	32	තිවමූළාරවෙගො	තිවවමූළාරවෙගො
57	34	තිරය	තිරයෙ
58	23	යසසස	යඤසසී
59	5	උතුමම	උතුම.
59	7	දෙයන්වහන්ස	දෙවියන්වහන්ස
59	21	උපද්දීමේ	උපද්දි. මේ
59	25	අතල්හියො	අතාළහියො
59	26	තත්‍වෟ	තත්‍ව
61	1	දෙවඟතත්	දෙවඟනන්
63	24	බෝවිසත්‍වයන්	බොධිසත්‍වයන්
65	36	කිය	කිහ.
68	4	වේදූසිදී	වේදූසි දී
68	23	බොධිත්‍වයන්දූ	බොධිසත්‍වයන්දූ
72	14	බොරු	මෝරු
72	15	නොවක්කොට	නොවත්කොට
72	19	සිතන්දූසි	සිතන්දූ
73	15	ගෙතව	ගෙනෙව.
74	18	වලා	වළා
74	20	මදින්	මඳින්
74	22	මදසි	මඳසි
75	10	උලා	උළා
77	7	අහිමත්‍වං	අභිමත්‍වං
78	14	බිසසක්	බිස්සක්
84	24	මධුසවරයෙන්	මධුර සවරයෙන්
85	9	සිඳපියත්වමි	සිඳපියත්ව සි
86	15	සත්පුරුෂයන්	සත්පුරුෂයෝ
87	10	රජ්රජුවන්	රජ්ජුරුවන්
48	12	කීය	කීහ.

88	32	රජුරුවෝ	රජ්ජුරුවෝ
89	13	කටයුක්ත	කටයුත්ත
90	28	රහං	රහස්
93	19	පසොඳහා	පසොඳා
94	13	අලසේක්	අළයේක්
94	36	දෙසක්	දෙයක්
95	22	ඇලි	ඇළි
96	23	වලහා	වළහා
96	25	අභිදෙසගතො	අභිදෙසගතො
96	26	භූරිපසොඤ	භූරිපඤ්ඤ
103	24	කටයුක්තෙක්	කටයුත්තෙක්
103	25	පෙන්වයි	පෙනේවයි
104	22	මන්ත්‍රිය	මන්ත්‍රීය
105	37	තෙලන්ත්‍රණය	තෙලෙ මන්ත්‍රණය
109	21	මහනුවණැති	මහානුවණැති
113	1	පරිද්දෙ	පරිද්දෙන්
113	38	කන්තියක්	කත්තියක්
116	12	කිය	කිහ.
120	11	නම	නම්
123	33	නැතිගත	නැතිගෙන
126	6	මිනුසුන්	මිනිසුන්
128	8	අපි	අප
128	27	කඩියලම	කඩියාලම
128	27	හායාලු	හයාලූ
128	35	බ්‍රමහදත්ත	බ්‍රහමදත්ත
130	5	නොකාමැති	නොකැමති
131	21	සැලලිහිණියෙක්	සැලලිහිණියක්
134	2	කව	නව
135	7	තවතව	නවතව
135	13	නොකාමැතිසේ	නොකැමතිසේ
136	16	මහෞසධෙන	මහොසධෙන
137	23	පොලඹා	පොළොඹා
138	28	භූපරිතතා	භූරිපතතා
139	18	පඤ්ඤවලං	පඤ්ඤවාලං
139	32	ඇණ	ඇත
140	28	පණ්ඩිතවරු සතරදෙනාහ.	පණ්ඩිතවරුන් සතරදෙනා හා,

142	5	පසබ්බස්ස	සබ්බස්ස
142	11	වෙසස	වෙසෙස
143	13	ඇඹුහ	ඇඹුව
144	22	සුසර	සුසඞර
145	18	ඇඹතියන්ව	ඇඹණියන්ට
145	19	සහශ්‍ර	සහස්‍ර
145	23	අකැමැත්තා නම්	ඇ කැමැත්තා නම්
145	27	කාමාභිසමපන්නො	කාමාභිසම්පන්නො
146	2	වස්ස	සුවස්ස
147	19	වසන්නේ	වසන්නේය.
147	31	තපස්වීන්	තපස්වී
148	7	ජාතියහ	ජාතියම්හ
152	7	වදුරතකේ	වදුරතසේක්
152	13	හද්‍රගටයක්	හද්‍රඝටයක්
152	13	කල්පදෘමයක්	කල්පද්‍රැමයක්
153	5	යතසේක්මිදූයි	යතසේක්මදූයි
159	11	බිදුව	බිදුවා
160	17	හඋමඟ	මහ උමඟ
160	18	සම්පයිවලිත	සම්පයිවලින්
161	10	සකල	සකල'ස
161	13	අඟුලු	අඟුලු
165	18	සරගා	සරහා
165	22	දෙතම	දෙතාම
167	6	රජුත්	රජුන්
168	8	ඇස්	අස්
168	19	සෙතක විලක්කු ආලොකය පණ්ඩිතයා	සෙතක පණ්ඩිතයා
168	20	බොහෝ පෙනෙන්නේ	බොහෝ විලක්කු ආලොකය පෙනෙන්නේ
169	20	මුඛෙසුව පරිසුස්සති	මුඛසුව පරිසුස්සති
169	27	මරන	මරණ
173	17	වාහනත්	වාහනත්
175	5	පස්සසෙතං	පස්සසො'තං
177	4	අතික්	අතික්
178	19	අස්වසයක්	අස්වසයක්
179	23	අඩන්නාවූ	අඬන්නාවූ

180	16	එරි	එරී
189	5	කසිණං	කසිණං
189	21	ඔබබා	ඔබ්බා
193	20	දෙවගතක්	දෙවගතන්
193	31	වග	වහ
196	26	කලෑ	කෑල
197	10	බඹ	බඩ
198	1	වලායෙක්	වලායෙන්
198	13	තපුරුවූ	තපුර
201	30	මේ රජහු තුදුටුවිරූ	මේ රජහු මා කරා තමාගතිමියි සිතා තනූදෙවීන් පෙර මේරජහු තුදුටුවිරූ
202	7	වදලසේක	මෙසේ වදලසේක
202	10	සබබගගසොභනා	සබබඞ්ගසොභනා
202	17	සඤ්ජනතා	සඤ්ජනනා
203	1	බඹරුවෑ	බඹුරුව
204	3	සමූහයන්	සමූහයෙන්
204	5	කොශකලාපයෙන්	රෝමරාජියෙන්
204	6	තෙමෙ	තොමෝ
204	12	සිට්යාත්	සිට්යාක්
205	11	අඞගුලීහු	අඞගුළිහුය.
205	18	කිසවුන්	කිසවු
205	32	තනූදෙවීත්	තනූදෙවින්
205	34	පණ්ඩිතයත්	පණ්ඩිතයන්
206	18	කෙනෙන්	කෙනෙක්
207	18	සන්ධිඡෙදනා	සන්ධිඡෙදකා
207	20	වලිත්	වැලිත්
207	26	රජ්ජුරවෝ	රජ්ජුරුවෝ
208	18	සියල්ලම	සියල්ලම ඇත් තෝය.
209	3	මාගේ අභීත	මාගේ ස්වාමිදරු වූ තිලෝගුරු බුදු කුරු බොධිසත්ව යන් වහන්සේ ඇත් සෙනාවක් ලඟට නොබා නික්මුණු අභීත

209	31	පිටත්	පිටත්වූ
209	33	ඇතයක්	ඇණයක්
210	11	ඔඝවා	බමවා
210	29	ඉඳින්	ඉඳින්
211	12	ඇයි දරුවෙනි	ඇයි! රජදරුවෙනි!
212	5	ද්වෙෂයම	ද්වෙෂමය
212	29	මාසාරගල්ල	මසාරගල්ල
213	3	රජව	රජවූ
214	12	නිමයෙක්	නියමයෙක්
215	19	දුවනියන්ට	දුවණියන්ට
216	14	නිදුකින්	නිදුකින්
216	18	මහාරාජ	මහාරාජා
219	25	රජ්ජුරවැන්	රජ්ජුරුවන්
224	32	සුළුගම්	සළුගම්
232	32	සුසැටත්	සුසැටක්
233	22	නසා	නංසා
238	17	කටයුතනක්	කටයුත්තක්
240	4	දෛවුද?	දෙවුද?
240	11	හොහොත්	නොහොත්
245	16	නුවතැත්තවුන්	නුවණැත්තවුන්
246	5	ආවාක්	ආවක්
246	24	රුජ්ජුරුවන්	රජ්ජුරුවන්
248	19	සවුවු	සවු වූ

එළු උමංදාව

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

සතං හත්ථී සතං අස්සා - සතං අස්සතරී රථා
සතං කඤ්ඤාසහස්සානි - ආමුත්තමණිකුණ්ඩලා
එකස්ස පදවීතිහාරස්ස - කලං නාග්ඝන්ති සොළසිං

යන මේ ගාථාව තිරතනයෙහි ඇදහිලි ඇති පින් පව් මේ යයි සැබැවින් දන්නාවූ සත්පුරුෂයන් නිසා වදාරනලදි.

හේ කෙසේ ද යත් ?

රන්සත් රන්පොරොදු ආදි වූ සියලු හස්ත්‍යලඞ්කාරයෙන් සරහා නිමවන ලද සර්‍වලක්‍ෂණ සම්පන්න වූ උතුම් වූ ඇතුන් ලක්‍ෂයක් ද, එසේ ම සියලු අශ්වාලඞ්කාරයෙන් සරහා නිමවන ලද අසුන් ලක්‍ෂයක් ද, එක වියෙහි ජාතිසෛන්ධවයන් සතර සතර දෙනා බැගින් යොදා රන් ධජ නඟා සියලු රථාලඞ්කාරයෙන් සරහා නිමවනලද උතුම් වූ රථ ලක්‍ෂයක් ද, තව ද, බඟා පලඳනා ලද මාණික්‍යමය කුණ්ඩලාභරණාදි වූ නොයෙක් බිසෝ පලඳනායෙන් සරහා නිමවන ලද ශරීර ශොභා ඇති සිවු සැටක් පමණ ස්ත්‍රී ලක්‍ෂණයෙන් විරාජමාන වූ බාලපරායෙහි ම සිටියා වූ ස්ත්‍රීන් ලක්‍ෂයක් ද යන මේ සියල්ල ම යමෙක් තමාගේ ශක්ති පමණින් දන විෂයෙහි පරිත්‍යාග කොට පියන්නේ වී නමුත් ඔහු විසින් කළා වූ පින්කම ඉතා ආශ්වය්‍ය ද යත් ? ඒ ආශ්වය්‍ය නො වන්නේ ය. ඇයි? මීට වඩා අනුසස් බොහෝ වූ ඉතා ආශ්චය්‍ය වත් වූ පින්කමක් ඇද්ද යත් ? ඇතැයි දත යුතු.

ඒ කවරේ ද යත් ?

බුද්ධරත්න ය, ධර්මරත්න ය, සඞ්ඝරත්න ය යන තුනුරුවන් ඇස දක්නා තබා කප් ලක්‍ෂයකිනුත් කප් අසඞ්ඛ්‍යයකිනුත් බුදු කෙනෙකුන් ලොව ඉපදීම දුර්ලභ හෙයින් බුද්ධරත්න ය දුර්ලභ වන්නේ ය. බුදුන් නූපන් කල ධර්මරත්න ය නැත්තේ ය. බුද්ධ රත්නයත්, ධර්මරත්නයත් නැති කල්හි සඞ්ඝයා වහන්සේ කැලම නැතිසේක. ඇත්, අස් ආදී වූ සියලු සම්පත් ම පිනැත්ත වුන්ට කවර කලත් සුලභ වන්නේ ය. එසේ හෙයින් යම්

තෙනෙක් හි ලොවුතුරා බුදුන් විසින් දෙශිත වූ ධම්මරතනය පවතී නම් ද, යම් තෙනෙක්හි ලොවුතුරා බුදුන්ගේ ධාතු දළදා පෙති පිළිම දාගොප් මාබෝ ආදි වූ සියල්ලෙක් ඇත් නම් ද; එසේම සම්බුද්ධ පුත්‍ර වූ සුප්‍රතිපන්නතාදි වූ ගුණගණාඝයෙන් උපලක්ෂිත වූ සඞ්ඝරතනය යම් තෙනෙක්හි ඇතිසේක් වී නම් ද, මේ තිරතනයෙන් බුදුන් වඳින්නට යම්හ බණ අසන්නට යම්හ සඞ්ඝයා වහන්සේ වඳින්නට යම්හයි තිරතනයෙන් එකක් උදෙසා ගියා වූ පින්කම මෙතෙක් විපාක ඇත්තේ යැ යි ලොවුතුරා බුදු කෙනෙකුන් විසින් වදරන් මුත් සෙස්සවුන්ට ඉතා අවිෂය වන්නේ ය.

හේ එසේ මැයි[1]

යම් සත්‍රියක් වත් පුරුෂයෙක් වත් බණ ඇසීම් ආදි වූ සුචරිත යක් නිසා තමා හුන් තෙතින් නික්මුණේ වී නම් ඔහු ගිය මඟ[2] පින්කම් තබා එක පියවරකින් සොලොස් වන කලාවෙකින් එක් කලාවෙක පිනටත් ඇත් අස් ආදිවූ ඒ දානය සවලප වන්නේය.

ඒ පියවර සොළොස් වන කලාවක් කොට බෙදන ක්‍රම කෙසේ ද යත්? නුවණැති ව අසා සිත තිබිය යුතු. එක් පින් කමක් උදෙසා තමා හුන්[3] තෙතින් නික්මුණා වූ සත්පුරුෂයාගේ පසු අඩියෙහි ඇඟිලි අග පටන් ඉදිරියෙහි තුබූ පය විළුඹට මෙ අතුර පියවරෙක් නම් වෙයි. නොහොත් පදවීතිහාරයෙක් නමුදු වෙයි. ඒ පදවීතිහාරය සරියේ සරියේ[4] අඩු වැඩි නො කොට සොළසක් කොටසක් කොට[5] බෙදා ඉන් පස ළොස් කොටසක් හැර ඉන් එක් කොටසක් ගෙන නැවත සොළසක් කොට බෙදා ඉනුත් පසළොස් භාගයක් හැර එක් භාගයක් ගෙන නැවත සොළසෙකැ යි මෙම ක්‍රමයෙන් එක පදවීතිහාරය සොළොස් වාරයක් බෙදූ කල ඉන් එක් කොට සෙක අවකාශ නම් අස් ලොමක් එලා[6] ලන පමණ අවකාශයක් මුත් වඩා නැත්තේ ය.

තිරතනය උදෙසා බුදුන් වඳින්ට යම්හ යි බණ අසන්ට යම්හ යි සඞ්ඝයා වහන්සේ වඳින්ට යම්හ යි කියා තමා හුන් තෙතින් අස් ලොමක් එලාලන පමණ තැන් පැන ගියවුන්ගේ[7] පින්කමට පළමු කීවා වූ උතුම් දානය අබ ඇට හා මහ

1. එසේමයි. 2. මගදිග. 3. උන්. 4. සරියේ. 5. සොළසක් කොට. 6. හෙලා. 7. ගියා.

මෙර උපමා කළාක්[1] මැතිල. එසේ වූ අනුසස් ඇති කප් අසඞ්ඛ්‍යයකිනුත් කනෙක නො වැකෙන්නා වූ ඉතා දුලීභ වූ ධම්ම යෙක අප අද අසන්නේයයි බුදුන් ආදී වූ තිරතනයෙහි තම තමා ශකති පමණින් කරනලද පූජා සත්කාර ආදර බහුමාන යෙන් බණ අසා එයින් ජනිත වූ ඉෂට විපාකයෙන් දෙව් මිනිස් සැපත් සාදා අන්තයෙහි අමා මහනිවන් සැපත් අත්පත් කටයුතු.

තව ද, සුජනයන් විසින් මේ ධම්මයෙහි ලඝු සිතක් නො සිතා සුවද මල් රඹ වැහැරින් ගෙතුවත් රඹ කොඳු නො ගරහා මල් මුදුනේ පලඳනාසේ ද, තව ද, පණුවන් පිලවුන් නොවන් මිහිවදයක් රන් වලදෙක ලූවත් මැටි වලදෙක ලූවත් පතෙක ලූවත් අත්ලෙක ලූවත් කැකල එක රස වන්නාක් සේ මධුර රසයෙන් ආර්ද්‍ර වූ බුදුන්ගේ දෙශනා කරනලද මධුර වූ ධම්ය බුදුන් වදාළේ මගධ භාෂායෙන් වේ ද, මෙ නම් හෙළු වේ දූයි[2] අනාදර නො සිතා මීවදයට කී උපමාව සිත තබා නො කොඳුරා නො නතනා අනන්‍ය විහිත නොව බුදුහු මය වදාරන සේකැයි යන ගෞරවයෙන් සිත හෙලා ඇසිය යුතු.

තුන්ලෝ මුදුනෙහි කෙලනා වූ ශ්‍රීපාද ඇති අප තිලෝගුරු වූ බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි සැවැත් නුවර නිසා ජේතවන මහා විහාරයෙහි වැඩ වසනසේක් තමන් වහන්සේගේ බුද්ධත්‍වයට කාරණ වූ දස පාරමිතායෙන් උතුම් වූ ප්‍රඥපාර මිතාව අරභයා මේ ජාතකය වදාළසේක.

යම් කෙනෙකුන් දැන් තමන්ගේ ඉතා සවල්ප වූ ප්‍රඥයෙන් ඉදුරා සලකාගත නොහී ඒ නම් කුමන බසෙක් ද, බුදුන්ගේ දස පාරමිතාව නම් වෛදූර්‍ය්‍ය භූමියෙහි උපන් අනඝ වූ මිණි රුවන් දසයක් හා සමාන වුව. එකක් එකකට අඩු වැඩිය යි යන්ට කාරණ කිම් ද යත් ?

ප්‍රඥ පාරමිතාව මෙසේ අසා සිත තබා ගතයුතු.

ඒ ප්‍රඥ විශෙෂ ය විස්තර කොට වණත් සර්‍ව්‍ඥයන් වහන්සේ විනා අන් කිසිවක්හටත් නො පිළිවන. එතෙකුදු වුවත් එක දෙශ මාත්‍රාවක් කියම්.

හේ කෙසේ ද යත් ?

පළමුවන්[3], දාන පාරමිතාව පූරන්නා වූ මහාත්මයන් නුව ණින් සිතන කල මේ අපගේ රැස් කොට තිබෙන්නා වූ නො

1. කළා. 2. එළුවෙන්. 3, පළමු.

යෙක් සමපත් මූළුල්ල පළමු රැස් කළාහු තමන් නුවණ මඳ හෙයින් මිය පරලොව යන්නාහු මින් කිසිවකුත් නො ගෙන සිසතින් ම ගියාහ. මා වූ කලි උන්සේ නුහුව මැනවැයි සිතා සොළොස් යාවකයන්ට ඒ ශකනි පමණින් දන් දෙන්නහු මේ මා දුන්නාවූ දානය නිසා ම මතු මට මෙවැනි අභිවෘද්ධියක් වන්නේයයි තමන්ගේ තීක්ෂ්ණ වූ ප්‍රඥයෙන් දානයෙහි ගුණ සලකා නුවණින් යෙදී දන් දෙන හෙයින් දානපාරමිතාවට ත් ප්‍රඥපාරමිතාව ම උතුම් වන්නේ ය.

තවද, සීලපාරමිතාව පුරන්නහු ප්‍රාණාතිපාත, අදින්නාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, සුරාපාන යනාදි වූ නුවණ නැත්තා වූ සත්ත්වයන් කරනලද නොයෙක් දුශ්චරිතයෙන් දුරුව පව් කළ වුන්ට අපාය සිද්ධ වන්නේ ය. මම එසේ වූ දෙයක් නො කෙරෙමි. මේ මා රක්ෂා කරන්නා වූ සීලයෙන් මතු මට වන්නේ මෙවැනි අභිවෘද්ධියකැ යි සීලගුණ නුවණින් සලකා රක්ෂා කරන හෙයින් සීලපාරමිතාවට ත් ප්‍රඥපාරමිතාව ම උතුම් වන්නේ ය.

නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව පුරන්නාහු නුවණින් යෙදී නුවණ පෙරදූරිකොට ම පුරන්නාහු ය.

ප්‍රඥපාරමිතාව පුරන්නාහු තමන්ගේ නුවණින් පාපයෙහි නොයෙදී දවසින් දවස පින්කමෙහි යොදා ආරත්‍රයෙන් ම කරන කියන සිතන යම් ම දෙයක් නුවණින් ම යෙදී අභිවෘද්ධිවන දෙයක් ම කරන්නාහ.

වීර්‍ය්‍යපාරමිතාවට ත් පළමුව නුවණ පෙරදූරි හෙයින් ප්‍රඥවම උතුම් වන්නේ ය.

ක්‍ෂාන්තිපාරමිතාවට ත් නුවණ ම උතුම් වන්නේ ය. තවද, සත්‍යපාරමිතාවටත් නුවණ ම උතුම් වන්නේ ය. තවද, අධිෂ්ඨාන පාරමිතාවට ත් ප්‍රඥව ම උතුම් වන්නේ ය. තවද, මෛත්‍රී පාරමිතාවට ත් ප්‍රඥව ම උතුම් වන්නේ ය. තවද, උපෙක්ෂා පාරමිතාවට ත් ප්‍රඥව ම උතුම් වන්නේ ය.

මෙසේ සමත්‍රිංශත් පාරමිතාවන්ට ප්‍රඥ පාරමිතාව ම උතු මැයි දත යුතු.

හේ කෙසේ ද යත් ?

නුවණ මූල් කොට සෙසු අවශෙෂ සත්වයෝ කෙසේ නම් සැපයෙහි නො පිහිටද්ද?

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ පවා මෙසේ සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි සුමෙධ තාපස කාලයෙහි ධන හැර නුවණින් යෙදී මහබිනික්මන් කළ තැන් පටන් සසර ඇවිදින සේක් දස පාරමිතාය, දස උප පාරමිතාය, දස පරමාර්ථ පාරමිතාය යන සමත්‍රිංශත් පාරමිතාවන් පුරා ලොවුතුරා බුදුවූ කලත් සවකීයවූ ඡායාව පරිද්දෙන් නො හැර ගෙනායේ ප්‍රඥා පාරමිතාවම ය.

තවද ප්‍රඥාබලයෙන් බුද්ධත්වය සාධා ගතත් මහාබ්‍රහ්මයා පටන් තිරිසනුන් දක්වා සියලු සතුන්ගේ සිත් නුවණින්ම පරීක්ෂා කොට උන් උන්ට තරම් ධර්මය නුවණින් පරීක්ෂා කොට ප්‍රඥා බලයෙන් ගොඩ නඟත් මුත් අන් සැටියෙක බැරිවන්නේය.

එසේ හෙයින් ලොවුතුරා බුදුන්ට ත් ප්‍රඥායෙහි නිමාවක් නැත්තේය. බුද්ධාදිවූ නුවණැති මහාත්මයෝ පවා ප්‍රඥාව ම වර්ණනා කරන්නාහ. එබැවින් සියල්ලවුන්ට ම ප්‍රඥාව ම උතුමැයි දතයුතු.

එක් දවසක් භික්ෂූන්වහන්සේ ධර්ම සභා මණ්ඩපයෙහි රැස්ව හුන්සේක් ඇවැත්නි! බුදුහු ඉතා මහත් වූ ප්‍රඥා ඇතිසේක. විශාල වූ ප්‍රඥා ඇතිසේක. ඉතා බහුල වූ ප්‍රඥා ඇතිසේක. ඉතා ශීඝ්‍ර වූ ප්‍රඥා ඇතිසේක. තීක්ෂ්ණ වූ ප්‍රඥා ඇතිසේක ඉතා සූක්ෂ්ම වූ ප්‍රඥා ඇති සේක. අනුන්ගේ වාද මැඩ පවත්නා වූ නුවණ ඇති සේක. තමන්වහන්සේගේ ප්‍රඥානුභාවයෙන් කූට දන්ත බමුණා ආදී වූ බ්‍රාහ්මණයන් ද, සභිය පරිව්‍රාජකාදී පරිව්‍රාජකයන් ද, අඞ්ගුලි මාලයන් ආදී වූ සොරුන් ද, ආලවකයන් ආදි වූ යක්ෂයන්ද, ශක්‍රයා ආදි වූ දෙවතාවන් ද බකබ්‍රහ්මයා ආදි වූ බ්‍රහ්මයන් ද, යන මෙකීවන්ගේ මාන මර්දනය කරමින් තමන්වහන්සේගේ වසඟත්වයට පමුණුවා සමහරුන් සරණ ශීලයෙහි ද, සමහරුන් පඤ්ච ශීලයෙහි ද, සමහරුන් දශ ශීලයෙහි ද, සමහරුන් මහණ කරවා මාර්ග ඵලයෙහි ද, පිහිටු වූසේක. යනාදීන් බුදුන්ගේ ප්‍රඥා ගුණ වර්ණනා කෙරෙමින් වැඩහුන්සේක.

එවේලෙහි බුදුරජාණන් වහන්සේ ගඳකිළියෙහි සැතපී වැඩ වසනසේක් ඒ කථා ප්‍රබන්ධය දිව කනින් අසා වදුරා එතෙනට ගියෙම් නම් තව ද මාගේ ප්‍රඥා විශෙෂය පස්වා දහසක් මුළුල් ලෙහි පවත්නා පරිද්දෙන් වන්නේ ය. එතෙනට යෙමියි. සිතා වදුරා දක්ෂිණ ශ්‍රී පාදය බිමට පොවන්නාහා ම සත් දහසක් පෙත්තෙන් ගැවසී ගත් රත්පියුමෙක් පොළොව පලාගෙන පැන නැඟී බුදුන්ගේ අතිරක්ත වූ පාද පද්මයෙහි පියුමක්

මත්තෙහි පියුමක් කිකිසිනි කළා සේ මිරිකාගෙන දක්‍ෂිණ ශ්‍රී පාදය පිළිගත. වම් ශ්‍රී පාදය පොවන්නාගා ම එසේ ම සෙවත පද්මයෙක් නැඟී වම් ශ්‍රී පාදය පිළිගත. පියුම් මත්තෙහි වැඩ සිටි කල්හි පියුමෙන් නැංගා වූ මූවරඳ සළා කැණීමඩල දක්වා නැඟී බුදුන්ගේ දෙළොස් රියන් රන්වන් ශ්‍රී ශරීරය ලාක්‍ෂා රස ධාරායෙන් පරික්‍ෂෙප කරන්නාසේ සුගන්ධයෙන් ආර්ද්‍ර වූ කල්හි පියුම් මත්තෙහි වැඩ සිට නුවණැති සංහුන් පුරුෂයක්හු රන් කතුරකින් පියුම් පෙති පෙළක් සරියෙහි කපන්නාසේ හඳනා සිවුර ත්‍රි මණ්ඩල ප්‍රතිච්ඡාදනයෙන් සකස් කොට හැඳ සවර්ණ පර්වතයක් වට විජ්ජුලතාවක් හුනු කලක් මෙන් පරිධා තුව බැඳ රන් ඇඟැයක් රකත කම්බලයකින් වසන්නාක් මෙන් මනාව විලිසඟුණු න්‍යග්‍රොධ ඵලවර්ණ වූ සුගත් මහ සිවුර සුදුසු පරිද්දෙන් පෙරව පියෙන් පියට නැංගා වූ පියුම් පිටින් දොර කඩ සමීපයට වඩුත් ම දීපඞ්කර පාද මූලයෙහි දී විවරණ ලත් වක් පටන් සාරාසඞ්ඛ්‍ය කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි සමත්‍රිංශත් පාරමිතාවන් පුරා සසර ඇවිදිනා කල්හි අන්ධය, බධිරය, දීනය, පඞ්ගුය යනාදී සොලොස් යාචකයන්ට තමන් වහන්සේ ගේ ගෙයි දොර එක දවසකුත් නො පිවූ විරූ ඒ සවාමි දරුවාණන් ශ්‍රී හස්තය නො දික් කරවා තෙමේ ම තමහට දොර හැරී ගියේ ය. එවේලෙහි මියරක් බිඳගෙන දිවගත් මහ වතුරක් මෙන් බුදුන්ගේ ශ්‍රී ශරීරයෙන් නීලය, පීතය, ලොහිතය, අවදාතය, මාඤ්ජෂ්ඨය, ප්‍රභාස්වරය යන ෂඩ්වර්ණ ඝන බුද්ධරශ්මි මාලාවෝ සදෙන බුදුන් වඩනා නියාව කියන්නාට වහ වහා දිවන දූවායන් සදෙනෙකු පරිද්දෙන් ඔවුනොවුන් පරදවා දිවගෙන ගොස් ධම් සභා මණ්ඩපයෙහි තුන් විටක් පැදකුණු කොට ආකාශයට පැන නැඟී කාමාවචරාදි දිව්‍යලෝක සය පැන ගෙන අකනිට්‍ා බ්‍රහ්මලෝකය දක්වා නැඟී ඒ ඒ දිග දිවන්නාහු තම තමන් යන යන අත උද්‍යාන, විමාන, පර්වත, වෘක්‍ෂලතා ආදි වූ සියල් ලක් ම නොයෙක් වෛවර්ණයෙන් යුක්ත වූවාහු තමන් තමන් සේ ම එක් වැනි පැහැ කෙරෙමින් ඇඹරෙමින් සළා දෙමින් සක්වළ ගලින් පැන පිටි සක්වළ ත් නො රඳ අනන්තාපරිමාණ සක්වළ අතුරු සිදුරු නැතුව දිවන්නෝය.

ඒ සලකුණෙන් ධම්සභා මණ්ඩපයෙහි වැඩ හුන් භික්ෂූන් වහන්සේ සවාමිදරුවාණෝ වඩිනා සේකැ යි පෙර මග බල බලා හිඳිනාසේක. එවේලෙහි තුන්තරා ගමනික කැමති ගම නෙක එතෙනට වැඩ පුහුදුරු මූදුනෙහි දිලියෙන ළහිරු මඬල පරිද්දෙන් පනවනලද බුද්ධාසන මස්තකයෙහි අනොපමෙය වූ

බුද්ධ විලාසයෙන් දිලිහි දිලිහී වැඩ හුන් කල්හි භික්ෂූන් වහන්සේ තමන් වහන්සේ වදාරමින් හුන් කථා ප්‍රබන්ධය තබාලා බුදුන් කෙරෙහි ගෞරවයෙන් සාදරව දෙහොත් මුදුනෙහි තබා වැඳ මූවෙන් නො බැණ හුන් කල්හි මහණෙනි ! මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව හුනුදූයි විචාරා වදාළ කල්හි ස්වාමීනි! ස්වාමිදරුවන් නො කියන්ට වදාළ දෙතිස් කථාවෙන් එකකුත් නොකීම්හ. ඉතුත් ස්වාමී දරුවාණන්ගේ ප්‍රඥා විශෙෂය වර්ණනා කෙරෙමින් උනුම්හ යි කීකල්හි එම්බා බුදුහු දැන් මතු නුවණැත්තෝ නො වෙති. පෙරත් නුවණැත්තෝ ම වේ දැයි වදාළ කල්හි ස්වාමීනි දැන් මේ ප්‍රඥා විශෙෂය ඉඳුරා ම දැනෙන්නේ ය. පෙර දවස නුවණ හවයෙන් සැහවී තුබූහෙයින් අපට නො දැනෙයි. එසේ හෙයින් අසනු කැමැත්තම්හ යි ආරාධනාකළ කල්හි ඉකුත් වත් ගෙනහැර දක්වා වදාළසේක.

ශේ කෙසේදයත් ?.

යටගිය දවස මිථුලු නුවර වේදේහ නම් රජක්හු රජකරන කල්හි ඕහට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නාවූ සෙනකය, පුක්කුසය, කාවින්දය, දෙවින්දය යි පණ්ඩිතවරු සතර දෙනෙක් වූහ.

පිරූ පෙරුම් ඇති අපගේ ශ්‍රී මහා බොධිසත්වයන් වහන්සේ මවුකුස පිළිසිඳ ගත් දවස් රජ්ජුරුවෝ ස්වප්නයක් දක්නාහු තමන්ගේ රාජාඞගනයෙහි සතර කොණ ගිනිකඳ සතරෙක් මැවී නැඟී මහාප්‍රාකාර ප්‍රමාණ ව බබ්ලා සිටියේ ය. ඒ ගිනිකඳ සතර මධ්‍යයෙහි කණමැදිරියෙක සා ගිනි පුපුරෙක් නැඟී එක්ෂණයෙහි ම පළමු තුබූ ගිනි කඳ සතර නිෂ්ප්‍රභා කෙරෙමින් බඹලොව දක්වා නැඟී සක්වළ මුළුල්ල එකාලොක කෙරෙමින් හිරු දහස් සඳ දහස් නැංගා සේ බබලන්ට වන්නේය. දෙව් මිනිසුන් සහිත වූ සියල්ලෝ ම ගඳ දුම් මල් පහන් ආදීන් පූජා කරන්නාහ. බොහෝ දෙන ගිනි දූල් අතුරෙහි ඇවිදිනාහ. ඔවුන්ගේ ලෝම කූප මාත්‍රයකටත් උෂ්ණාකාරයෙක් නැත්තේය. මේ ස්වප්නය දැක භයින් තැති ගෙන කුමකින් කුමක් වේ දෝ හෝ යි සිතන්නාහු ස්වප්නය දුටු වේලෙහි පටන් නොනිදා හිඳම පාන් කළහ.

සේනකාදී පණ්ඩිතවරු සතරදෙන අවුත් කිමෙක් ද? මහ රජ ! සුවසේ නිදි ලත් සේක්ද? යි විචාළහ. කුමක් කියව් ද? මෙසේ වූ ස්වප්නයක් දුටුවාවූ මට නින්දෙක් නම් කොයින්දැයි තමන් දුටු ස්වප්නය වූ පරිද්දෙන් කීහ. එබස් අසා සේනකයෝ

මහරජ! තොබා වදාළ මැනව. දුටුවේ මඟුල් ස්වප්නයෙක. ඉන් වන්නේ මහා අභිවෘද්ධියෙකැ යි කීහ. රජ්ජුරුවන් ඊට කාරණා කිම්දැයි විචාළ කල්හි අප නුවණින් අග්‍රප්‍රාප්ත වූ පණ්ඩිත වරුන් සතරදෙනා නිශෙෂාහා කෙරෙමින් අපට ශත සහස්‍ර ගුණයෙන් වඩනා පස්වන පණ්ඩිත කෙනෙක් උපදනාහුය.

එබැවින් අපි සතර දෙන සතර ගිනිකඳ වැන්නම්හ. ඒ මධ්‍යයෙහි කණමැදිරිකුසේ ම පලඹු කුඩාව පෙනීලා ඒක්ෂණ යෙහි මහත් වූ ගිනි කඳ නම් පස්වනුවැ උපදනා පණ්ඩිත යෝය. මේ එක සක්වළ තබා දස දහසක් සක්වළත් ඉන් වඩා අනන්තාපරිමාණ සක්වළත් දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ මනුෂ්‍ය යන් ආදී වූ සියලු සතුන් කෙරෙහි උන් හා සමාන කෙනෙකුත් නැත. උන්ට වඩනා කෙනෙක් කැලම නැතැයි කීහ.

පණ්ඩිතයෙනි! ඔහු දැන් කොයිදැයි කීකල්හි අද මවුකුස පිළිසිඳ ගැන්මක් වත් මවුකුසින් බිහිවීමක් වත් විය යුතු යයි තමන්ගේ ශාස්ත්‍ර බලයෙන් දිවසින් දුටුවාසේ කීහ. රජ්ජුරුවෝ එද පටන් එක දවසකුත් සඳහන් නො කළාහ.

ඒ මිථුලු නුවර සතර වාසලින් පිටත නැගෙනහිර යවමැදුම් ගමය, දකුණුදිග යවමැදුම් ගමය, බස්නාහිර යවමැදුම් ගමය, උතුරුදිග යවමැදුම් ගමය, යි මහා නියම් ගම් සතරෙක් විය. එයින් නැගෙනහිර යවමැදුම් ගම්හි ශ්‍රීවර්ධන සිටාණෝය යි යන කෙනෙක් එගම වසන්නාහු දහසක් පමණ අනු සිටුවරුන්ට හා අවශෙෂ බොහෝ ජනයන්ට නායකව ලොව විද්‍යමාන වූ සියලු සම්පත්තීන් ආඪ්‍යව වසන්නාහ. දිව්‍යාඞ්ගනාවක මෙන් සියලු රූපශ්‍රීන් විරාජමාන වූ සිවු සැටක් පමණ ස්ත්‍රී ලක්ෂණයෙන් හොබනා වූ සුමනා නම් දේවී කෙනෙක් ඒ සිටාණන්ට භාර්‍ය්‍යා වූහ.

බෝධිසත්ත්වයන් වහන්සේ තව්තිසා භවනයෙහි චුතව ඒ රජ්ජුරුවන් ස්වප්නය දුටු වේලෙහි ම ඒ සුමනා දේවීන් කුස පිළිසිඳ ගත්සේක. එදවස් තව්තිසා භවනයෙන් දිව්‍යපුත්‍රයෝ දහසෙක් මිය එම ගම අනු සිටුවරුන්ගේ අඹුවන් කුස පිළිසිඳ ගත්හ. සුමනා දේවී දසමසක් ගිය කල රන්වන් පුතණුකෙනෙකුන් වැදූහ. ඒ ඇසිල්ලෙහි ශක්‍රදෙවෙන්ද්‍රයෝ මිනිස්ලොව බලන්නාහු බෝධිසත්ත්වයන් මවු කුසින් බිහිවන්නවුන් දැක මේ බුද්ධාංකුරයාණන් වහන්සේ දෙව් මිනිසුන් කෙරෙහි ප්‍රසිද්ධ කෙළෙම් නම් යහපතැයි සිතූ මහතාණන් මවුකුසින් බිහිවන්නවුන් අතට තුමූ අදෘශ්‍යමානව සිට ඖෂධ ඝටිකාවක් තබා තමන්ගේ

දෙව්ලොවට ම ගියාහ. බෝධිසත්ත්වයන් වහන්සේ ඒ රත් හඳුන් හර ගැටය මිට මුළුවා අල්වා ගත්සේක.

ඔබරාවකින් ගත් පැනිත්තක් සේ මවු කුසින් බිහි වූසේක. මැණියෝ පුතණුවන් අත බෙහෙත් ගැටය දැක පුතණුවනි! අත කිමිදැ යි විචාළහ. මැණියෙනි! "ඖෂධයකැ" යි කියා අත්ලේ තුබූසේක. පුතණ්ඩ "මින් කුමක් කෙරෙම්දැ"යි කී කල්හි මැණියෙනි! මේ ඖෂධය ඇරගෙන යම් කිසි ව්‍යාධියකින් පෙළෙන්න වුන්ට දුන මැනව යි" කීහ. දේවී ද සතුටුව ඒ බව සිටාණන්ට කීහ. ඒ සිටාණන්ට සත් අවුරුද්දක් පහරන ඉතා දුඃඛ වූ ඉස රුජාවෙක් ඇත්තේ ය. ඒ අසමින් ම සිටාණෝ සතුටුව සිතන්නාහු මේ මහතාණෝ මවුකුසින් බිහිවන්නෝ ම ඖෂධයකුත් ගෙනාහ. උපන් විගස මැණියන් හා කථාත් කළහ. මෙබඳු පින්වතුන් දෙනලද ඖෂධයෙහි මහානුභාව ඇත්තේ ය"යි ඒ බෙහෙද ගලදෑයෙහි ගහා මඳක් නලළ ගා ලන්නා හා ම සත් අවුරුද්දක් පහරණ රුජාව ඒ ක්‍ෂණයෙහි සමන ව ගියේ ය. ඖෂධය ඉතා යහපත් නියායයි අතිශයින් සතුටුව ගියහ. බෝධිසත්ත්වයන් වහන්සේ ඖෂධයක් අල්වාගෙන උපන් බව හැම තැන ම ප්‍රසිද්ධ විය. යම් කිසි කෙනෙකුන්ගේ ව්‍යාධියකට ඉල් වූ නම් ගලදෑයෙහි ගහා පැන් මිශ්‍ර කොට දෙන්නාහ. ඒ දිව්‍ය ඖෂධය ගැවෙන්නා හා ම දිව්‍යානුභාවයෙන් සතතයෙන් නිරොගි වූවාහු ශ්‍රී වඩ්ඪන සිටාණන්ගේ ඖෂධයක් ඉතා යහපත් නියා යයි වණ්නා කොට යන්නාහ.

මහතාණන්ට නම් තබනා දවස් සිටාණෝ මාගේ දරුවන්ට මුතුන් මිත්තන්ගේ නමින් ප්‍රයෝජන නැත. එබැවින් තමන් ගෙනා ඖෂධයෙහි නම් වේවා යි කියා "ඔහෞෂධ කුමාරයෝ යයි" නම් තුබූහ. එ දවස් සිටාණෝ සිතන්නාහු මාගේ පුතණුවෝ මහපිනැති කෙනෙක. එ බැවින් උදෙකලාව උපදනා කෙනෙක් නො වෙත්. මූන් හා එක වේලෙහි උපන් දරු කෙනෙක් ඇත්නම් බලා පරීක්‍ෂා කරව යි කියා පරීක්‍ෂා කරවන්නාහු එම ගම දසක් පුතුන් දුටු බව අසා කුමාර පලඳනා හා දසක් කිරි මවුන් දෙවා මෙවක් පටන් මාගේ දරුවන්ට සේවය කරත්වයි කියා බෝධිසත්ත්වයන් හා සමග සියලු මඟුල් කරවූහ.

ඒ දරුවන් දහස ම දවස් පතා කුමාර පලඳනායෙන් සරහා බෝධිසත්ත්වයන්ට උපස්ථානයට ගෙනෙන්නාහු ය. බෝධිසත්ත්වයන් වහන්සේ බාල දරුවන් හා කෙළෙනාසේක් තරු පිරිවරනලද පුන් සඳක් සේ සත් හැවිරිදි වයසට පැමිණ රන් පිළිමයක් මෙන් බැලු

බැලූවන් ඇසට ඉතා ප්‍රිය වූසේක. ඒ මහතාණන් බාලදරුවන් පිරිවරා ගම් මැද හිඳ කෙළනා කල්හි ඇතුන් අසුන් හා ගව මහිෂා දීන් ආ කල්හි කෙළි මඩුලු බිඳෙන්නේ ය. වැසි, අව්, සුලං ආදී යෙන් බාලදරුවෝ කලාතන වන්නාහ.

මෙසේ ම එක් දවසක් ඔවුනොවුන් හැම කෙළනා කල්හි අකාල මේඝයක් නැගී ය. ඒ දැක ඇත්බල ඇති බොධිසත්ත්වයන් වහන්සේ දිවගෙන ගොස් එක් ශාලාවකට වන්සේක. සෙසු බාල දරුවෝ පස්සෙහි දිවන්නාහු ඔවුනොවුන් ඇඟ ගැසී පැකිල හී තලල් දන වැලමිටි ආදී වූ තැන් ලෙලි[1] ගෑස් මහාව්‍යසනයට පැමිණියාහ. ඒ දැක බෝධිසත්ත්වයන්වහන්සේ මෙතැන කෙළනා ශාලාවක් ඇත්නම් මෙසේ වූ පීඩාවෙක් නැත්තේ වේ දැයි සිතා කුමාරවරුන් දැසට වදාරනසේක්, කුමාරවරිනි! මෙතෙන වැසි අව් සුලං ආදීන් කිසි උපද්‍රවයක් නො වන ලෙස හා සතර ඉරියව් වෙන් සුව එලවන්නා වූ එක් ශාලාවක් කරවම්හ. එබැවින් තොප තොපගේ වැඩිමහල්ලන්ගෙන් එකී එකී මස්සක් බැගින් ගෙනෙ වයි වදාළසේක. ඒ දහසක් කුමාරවරු තමතමා මස්සක් බැගින් එක්කොට මසු දහසක් දුන්හ.

බොධිසත්ත්වයන් වහන්සේ එම ගම මහාවඩුවා කැඳවා මෙතෙන ශාලාවක් කොට ලයි කියා මසුරන් දහස දුන්සේක. ඒ යහපතැයි මසුරන් දහස ගෙන බිම සම කරවාලා කණු ගස්වා හුය එලාලීය. බෝධිසත්ත්වයන් සිත් නො වන්නේ ය. නැවත වදාරනසේක් එසේ නො හෙලා යහපත් කොට එලාලයි වදාළසේක. ස්වාමීනි! මා දන්නා විවරෙක් හුය එලාලීම්. මින් වඩා මම නො දනිමි යි කීය. මා සිත් ගෙන හුය පමණක් හෙලාලිය නො හෙන්නෙයි ශාලාව මාසිත් ගෙන කෙසේ නම් කෙරෙයිද යි වදාරා තට හුය ගසා දෙම්හ යි හුයක් ගෙන්වා ගෙන හෙලූසේක. එවිට විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් හෙලූ හුයක් සේ ඉතා යහපත් වීය. ඉක්බිති වඩුවාට තෝ මෙසේ හුය එලාලිය හෙයිදැයි වදාළසේක. නො පිළිවන ස්වාමීනි! කීය. මාගේ විධාන පරිද්දෙන් කී ලෙස කරන්ට ශක්ති ඇත්තෙහි දැ යි වදාරා පිළිවන ස්වාමීනි! කී කල්හි බෝධිසත්ත්වයන්වහන්සේ සිතනසේක් යම් සේ මේ ශාලාවේ එක් තෙනෙක්හි මගීව යන්නවුන් සැතපෙන ස්ථානයක, එසේ ම ගර්භිනී ස්ත්‍රීන් වදින්නා වූ තිඹිරිගෙයක, එසේ ම ශ්‍රමණ බ්‍රාහ්මණයන් සැතැපෙන්නා වූ ස්ථානයෙක, අවශෙෂ වූ ආගන්තුකයන් සැතපෙන්නා වූ ස්ථානයෙක, වෙළෙඳුන් බඩු තබා

1. ලේ සැලී.

ගන්නා ස්ථානයෙක යන මේ සියලු ගෙවල් දොර පිටතින් යොදා කරවයි යනාදීන් විධාන කොට කරවූසේක. කෙළිමණ්ඩලයක් එහි ම කරවූසේක. අධිකරණයක් එහි ම කරවූසේක. ධර්මශාලාවක් එහි ම කරවූසේක. යන මේ සියල්ල ම නිෂ්ප දවසකින් නිමවා චිත්‍රකාරයන් ගෙන්වා තමන්වහන්සේගේ විධානයෙන් ඇලුම් කටයුතු ඉතා සිත්කලු වූ අනෙක ප්‍රකාර වූ විචිත්‍ර වූ සිත්තම් කර වූසේක. ඒ ශාලාව සුධර්මා නම් දිව්‍ය සභාව හා සමාන විය.

ඉක්බිති මේ ශාලාව මෙතෙකින් මතු හොබනේ නො වෙයි සිතා මාහැඟි පොකුණක් බිඳුවා උළුවඩුවන් ගෙන්වා තමන්වහන් සේගේ විධානයෙන් ම දසක් වක් ඇති, සියක් තොට ඇති අති මනෝහර වූ ඒ පොකුණ රක්තොත්පලය, නීලොත්පලය, සේවතොත්පලය, රක්තපද්මය, සේවතපද්මය, සඞ්ඛ්‍යාත වූ පස්පියුමෙන් සැදි ඒ පොකුණ ශක්‍රයන්ගේ නන්‍දා නම් පුෂ්කරණිය සේ ඉතා සිත් කලු විය. තවද, ඒ පොකුණ වට අඹ, දෙඹ, තා, පනා, සපු, සමන්, ඇසල, දුනුකේ ආදි වූ මල්ඵල ගෙන සිටිනා වූ වෘක්ෂජාතියෙන් හා බමර, මොනර, කොකිලාදි පක්ෂිසමූහයාගේ මධුරස්වරයෙන් කණී යට රසාඤ්ජනයක් බඳු වූ ඒ උයන දෙවියන්ගේ නඳුන් වන උයන සේ ඉතා සිත්කලු විය. ඒ ශාලාව නිසා ම ආවා වූ ධාර්මික ශ්‍රමණබ්‍රාහ්මණයන් හා ආගන්තුක දුගීමගීන්ට දන්වැටකුත් තැබූහ.

මෙසේ උන්වහන්සේ විසින් කළා වූ මේ සියල්ල හැම රට මුළුල්ල ප්‍රසිද්ධ විය. බොහෝදෙන එතෙනට ගොස් සඤ්චාරය කෙරෙමින් හැසිරෙන්නාහ. බොධිසත්ත්වයන්වහන්සේ ශාලාවෙහි වැඩහිඳ ආ ආවුන්ගේ යුක්ති අයුක්ති කාරණා වූ පරිද්දෙන් ගිවිස්වා ධර්මයෙන් විනිශ්චය කොට වදාරනසේක. එතෙන බුද්ධොත්පාදයක්සේ ඉතා මැදහත් විය.

මෙසේ සත් හවුරුද්දකින් වේදේහ රජ්ජුරුවෝ සිතන්නාහු පණ්ඩිතවරු සතරදෙනම තමන් මැඩ පවත්නා වූ නුවණැති පස්වැනි පණ්ඩිත කෙනකුන් උපදිති යි කීහ. දැන් ඔහු කොයිදෙහෝ යි සිහිකොට උන් වසන තෙනක් පරීක්ෂා කරවයි සතර වාසලින් අමාත්‍යයන් සතර දෙනකු යවූහ. තෙසු තුන් වාසලින් ගියෝ බෝධිසත්ත්වයන් නො දැක ම ආහ. නැඟෙනහිර වාසලින් ගිය අමාත්‍යතෙමේ ශාලාව හා උයන් පොකුණු ආදි වූ සියල්ල ම දැක සිතන්නේ ඒ කියන පණ්ඩිතයන් නම් මේ ශාලාව කළ තැනැත්තන් හෝ කර වූ තැනැත්තන් වුව මැනවැයි සිතාගෙන එතෙන සිටියවුන් අතින් විචාරන්නේ පින්වත්නි ! මේ ශාලාව කිනම්

වඩුවකු විසින් කරන ලද්දේදැ යි කිය. ඕහට කියන්නාහු වඩුවකු තමාගේ නුවණින් කළ දෙයක් නො වෙයි. ශ්‍රීවර්ධන සිටාණන්ගේ පුතණුවන් මහෞෂධ පණ්ඩිතයන්ගේ විධානයෙන් උන් කී සැටියේ කරන ලදැයි කීහ. ඒ පණ්ඩිතයෝ කී හැවිරිද්දෝදැයි විචාළේය. ඒ මහතාණෝ බාල කෙනෙක් ද? පුරා ම සත් හැවිරිද්දේ යයි කිහ.

ඒ නුවණැති අමාත්‍යයා රජ්ජුරුවන් සිහිනය දුටුවක් පටන් ගණන්නේ ස්වප්නය දුටු දෙන් මේ මහතාණන්ගේ වයසත් අඩුවැඩි නැති සත් අවුරුද්ද ය. එසේ හෙයින් ගණන් සරි ය. පණ්ඩිතයෝ නම් මූ යයි විනිශ්චය කොට රජ්ජුරුවන්ට දූතයන් යවන්නේ මෙසේ කියා යැවීලු. දේවයන් වහන්ස! නැගෙනහිර යවමැදුම් ගම ශ්‍රී වර්ධන සිටාණන්ගේ පුතණුවෝ මහෞෂධ පණ්ඩිතයෝ පුරා ම සත් හවුරුද්ද ය. අනුන් විසින් කරන්නා තබා සිතන්ටත් අවිෂය වූ ශාලාවක් හා පොකුණක් හා එතෙන නොයෙක් නෙතින් එන්නා වූ මගීන්ට දවස්පතා තබා දෙතලද දන්වැටක් හා ධර්මිෂ්ඨ වූ අධිකරණයක් හා එසේ ම ධර්මාන්විත ව පවත්නා වූ නොයෙක් ආශ්චර්යයෙන් බුදුන් උපන් කලක් මෙන් මේ ගම ඉතා සමෘද්ධ විය. එබැවින් ඒ පණ්ඩිතයන් ගෙනෙම්දැ යි කියා යැවීය.

රජ්ජුරුවෝ එපවත් අසා ඉතා සතුටුව සෙනකයා කැඳවා කිමෙක් ද සෙනකයෙනි! පණ්ඩිතයන් ගෙන්නමෝදැයි විචාළහ. ඒ තමා ගුණමකුවා හෙයින් ඒ බව අසා ඉවසා ගතනොහී මහරජ! ශාලාවක් කරවාලූ පමණින් පණ්ඩිත නම් නො වෙති. එපමණක් කවුරුත් කරවා ලන්නාහ. ඒ නිකම් ස්වල්පමාත්‍රයෙක. ඉවසුව මැනවැ යි කිය. ඔහුගේ බස් අසා රජ්ජුරුවෝ එයිත් කාරණ යෙකැ යි උදාසීනව අමාත්‍යයාට කියා යවන්නාහු තෝ ඔබ ඉඳ ඒ පණ්ඩිතයන් පරීක්ෂාකොට තවත් දුටුදෙයක් කියා එවයි නැවත මිනිසුන් යවූහ. අමාත්‍යයා ඔබ ඉඳ විමසූ ප්‍රශ්න නම් :-

මංසං ගොණො ගණ්ඨි සුත්තං පුත්තො ගොළු රථෙන ච
දණ්ඩො සීසං අහිචෙව කුක්කුටො මණි විජායනං
ඔදනං වාලුකඤ්චාපි තලාකුය්‍යානං ගද්‍රභො මණීති.

ඒ කවරේ ද යත්?

මාංස ප්‍රශනය, ගොන් ප්‍රශනය, ගණ්ඨි ප්‍රශ්නය, සූත්‍ර ප්‍රශ්නය, පුත්‍ර ප්‍රශ්නය, කාළගොළ ප්‍රශ්නය, රථ ප්‍රශ්නය, දණ්ඩ ප්‍රශ්නය, ශීර්ෂ ප්‍රශ්නය, අහි ප්‍රශ්නය, කුක්කුට ප්‍රශ්නය, මණි ප්‍රශ්නය, විජායන ප්‍රශ්නය, ඔදන ප්‍රශ්නය, වාලුකා ප්‍රශ්නය, තලාක ප්‍රශ්නය, උද්‍යාන ප්‍රශ්නය, ගද්‍රභ ප්‍රශ්නය යන මේ වෙන වෙන ම අපූරු කොට විසඳූ පැන යි.

මාංස ප්‍රශ්නය නම්:-

එක් දවසක් බෝධිසත්ත්වයන් වහන්සේ ශාලාවට කෙළියට වඩනා කල්හි උකුස්සෙක් මස් ලොඹුවකින් මස්වැදැල්ලක් ගෙණ ගෙන අහසට නැංගේ ය. ඒ දැක කැපිව යන්නා වූ බාලදරුවෝ මස් කැටිය එලවම්හ යි උකුස්සා ලුහු බඳවා ලූහ. එයිත් ඇත් මෑත් බලා දිවන්නෝ ය. උඩ බල බලා පස්සෙහි දිවන්නා වූ බාලයෝ කැට කැබිලිති ආදියෙහි පැකිල හී මහත් දුකට පැමිණියාහ.

ඉක්බිති බොධිසත්ත්වයන් වහන්සේ ඒ මස්කැටිය එලවා පියම් දැයි වදාළසේක. හෙලවාපුව මැනව, ස්වාමීනි! යි කිවුය. එසේ වී නම් බලවයි වදූරා උඩ නො බලා වාත වේගයෙන් දිවගෙන ගොස් උකුස්සාගේ ඡායාව පයින් මිරිකා මිරිකා අත්පොළා මහත් කොට ශබ්ද පැවැත්වූසේක. මහතාණන්ගේ තේජසින් ඒ ශබ්දය උකුස්සාගේ ලෙහි ඇනී පිටින් නැංගාසේ උකුස්සාට මහත් වූ භය උපන්නේ ය. ඒ තෙම භයින් තැතිගෙන මස්කැටිය එලාපී ය. උඩින් හෙන්නා වූ මස්කැටිය ඡායාවෙන් ම දක්නාලද ඒ මහතාණෝ බිම හිය නො දී අත්ලෙහි එලවා ගත්සේක. ඒ ආශ්චර්‍ය්‍යය දුටුවා වූ ජනයෝ බොහෝදෙන නටන්නාහ. අත් පොළසන් දෙන්නාහ අසුරුසන් දෙන්නාහ. පිළී හිස සිසාරන්නාහු මහත් කොලාහල පැවැත්තූහ.

අමාත්‍යයා එපවත් රජහට කියා යැවීය. රජ්ජුරුවෝ සෙන කය! පණ්ඩිතයන් ගෙන්නමෝද යි කීහ. සේනකයා සිතන්නේ ඒ පණ්ඩිතයා මෙයට ආයේ වී නම් අපි හැම හිරු දුටු කදෙපැණි යන් මෙන් නිෂ්ප්‍රභාවම්හ. රජ්ජුරුවෝ අප ඇති නියාවත් නො දන්නාහ. එබැවින් ඔහු මෙයට එන ගමන අපට තුරුස්නේ යයි තමා ගුණමකු[1] හෙයින් කියන්නේ මහරජ! මස්කැටියක් එලවාපී පමණකින් පණ්ඩිත නම් නො වෙති. මෙ නම් ඉතා ලඝු දෙයක. ඉවසුව මැනවැ යි කිය. රජහු ඔහුගේ බස් ගිවිස තවත් පරීක්‍ෂා කරවයි කියා යවූහ.

ගොන් ප්‍රශ්නය නම්:-

එක් දවසක් එම ගම වසන්නා වූ දුප්පත් පුරුෂයෙක් වැසිවට කල්හි හීයක් සාමියි සිතා පිටිසර ගමකින් ගොන් ගෙයක් ඉල්වා ගෙන අවුත් රැ තමාගේ ගෙයි රඳවා දෙවන දවස් තණබිමකට

---

1 ගුණමකුවා ඉසුරු හෙයින්.

ගෙන ගියේ ගොන් පිට හිඳ තණ කවා ඇවිදිනේ ශරීර පීඩාවක් ඇතිව ගොන් පිටින් බැස සෙවන බල බලා හුන්නේ මඳක් නිදාපීය. එකලත් දුන්සේ ම සොරුන් ඇති වන්නේ ය. ඔහු නිදියදී සොරෙක් ගොන් හැරගෙන පලා ගියේ ය. ඒ පුරුෂ පිබිද ගොන් ගෙය නො දැක, ඈත් මෑත් බලා දිවන්නේ දැක වහ වහා ගොස් හඹා ගෙන මාගේ ගොන් කොයි ගෙනයේදැයි කිය. එවිට තන් වැසි [1] සොරා කියන්නේ මාගේ ගොන් මා කැමති තෙනකට ඇර ගෙන යෙමි. තෝ කවරෙක් දැයි කිය. මෙසේ කලහ කෙරෙමින් ශාලාව සමීපයෙන් යන්නවුන් දැක බොහෝදෙනා රැස්ව ගියාහ.

බොධිසත්වයන් වහන්සේ ඔවුන්ගේ කොලාහල අසා ඔවුන් දෙන්නා කැඳවා ක්‍රියාවෙන් ම මේ සොරා ය. මේ නො සොරා යයි දන්නා සේක් ම කුමක් නිසා විවාද කෙරෙද්දැ යි වදාළසේක. ගොන්ගෙ ස්වාමියා කියන්නේ මේ ගොන් අසවල් ගම මේ නම් තැනැත්තන් අතින් ඉල්වා ගෙන අවුත් රෑ මගේ ගෙයි රඳවා අද තණ බිමට ගෙන ගියෙමි. එතෙන මාගේ පමාවක් දැක මේ සොරා ගොන් හැරගෙන ගියේ ය. මම ඈත් මෑත් බලා දිවන්නෙම් දැක අල්වා ගතිමි. මේ නම් ගම ඇත්තොත් මේ ගොන් මා ඉල්ලා ගෙන ආ නියාවත් දනිතියි කීය. නැවත සොරා කියන්නේ මෙමා වදා වඩා ගත් ගොන් ය. මේ බොරු කිය යි කිය.

එවිට ස්වාමි දරුවාණෝ වදාරනසේක් තොප දෙන්නාගේ මේ ගොන් යුක්තිය ධර්මිෂ්ඨව පසිඳලම්. මාගේ යුක්තියෙහි සිටුදැයි වදාරා සිටුම්හයි ස්වාමීනි! කී කල්හි බොහෝ දෙනා සිත් ගන්නා පිණිස පළමු සොරා අතින් විචාරනසේක් තොපගේ ගොන් කුමක් කවා කුමක් පොවා වැඩීදැයි වදාළසේක. සොරා කියකනේ මේ මාගේ ගොන් තලමුරුවට හා උඳු උළුකැන් පොවම් කිය. නැවත ගොන් ඇති තැනැත්තහු විචාළ කල්හි මා දුගියාට තල මුරුවට හා උඳුකැඳ ආදීවූ දෙය ගොනුන්ට තබා මටත් කොයින් ද? තණ කවා පැන් පොවම් කීය. උන් දෙන්නාගේ බස් ම සිටිය වුන්ට ගිවිස්වා පුවගුපත් ගෙන්වා වත ලා කොටා පැන් මැඩ ගෙන ඒ පැන් පෙවූකල්හි ගොන් තමන් කෑ තණම නැගූහ. පණ්ඩිතයන්වහන්සේ ඒ බොහෝ දෙනා දක්වා සොරුට තෝ සොරාද නො සොරාදැයි විචාළ කල්හි ඔහු විසින් ස්වාමීනි! මම සොරාමි කීකල්හි බොධිසත්වයන් වහන්සේගේ පුරුෂයෝ ඔහු එතනින් පිටත්කොට ගෙන මෙවක් පටන් සොරකම් කෙරෙයි ද නො කෙරෙයි දැයි ඔහු හඬව හඬවා අතින් පයින් තළා දුර්වල කොට පීහ.

---

1 ගම්වැසි.

බෝධිසත්වයන් වහන්සේ තැවත ඔහු ගෙන්වා ගෙන වදුර නයෙක් එම්බා දරුව! සොරකමින් මතු පරලොව විඳිනා දුක් තබා දැන්ම එහි විපාක දුටුයෙහි වේදැයි. සොරකම් කළවුන්ට දෙලොවින්ම වන්නා වූ අනර්ථය ඔහු සිතට හැගෙන පරිද්දෙන් වදුරා මතු මෙවැන්නක් නොකරවයි තමන්වහන්සේගේ අත වැස්සන් දුන් පන්සිල් මඳින් දෝ තමන් වහන්සේත් පන්සිල් දී අවවාද කොට යැවූසේක. සවාමිනි! මා පණ තබා මතු මෙවැන් නක් නොකෙරෙමියි අවවාද පිළිගෙන ගියේය.

අමාත්‍යයා එපවත් වූ නියායෙන් රජ්ජුරුවන්ට කියා යැවිය. රජ්ජුරුවෝ සෙනකය! පණ්ඩිතයන් ගෙන්නමෝදැයි විචාළෝය. ඒ ලාමකයා කියන්නේ අසව. කොල! ගොන් ගෙය ඇත්තන්ට ගොනු පාවා දුන්නේත් එක් පණ්ඩිත කමෙක් දැයි ඉවසුව මැන වැයි කිය. රජ්ජුරුවෝ එබසින් උදාසීනව තවත් පරීක්‍ෂා කර වයි කියා යැවූහ. එවක් පටන් අමාත්‍යයා රජහට කියා යැවී මත් රජහු සේනකයා විචාරීමත් සෙනකයා තමාගේ නපුරු ගුණයෙන් පණ්ඩිතයන් එන ගමන් නැවතීමත් ඉදිරියෙහිත් යට ගිය දවස සේ මයයි දතයුතු. මෙයින් මතු ප්‍රශ්න පමණක් කියනු ලැබේ.

ගණ්ඨි ප්‍රශ්නය නම්:-

රත්රන් ආදියෙන් පලඳනාවක් කරවා ගන්ට අපොහො සත් දුප්පත් එක් ස්ත්‍රියක් පස්පැ හුයෙන් ගැටහූ පළඳනාවක් කරවාගෙන පලඳිනී පණ්ඩිතයන් වහන්සේගේ පොකුණෙන් නහන්නට ගොස් පලඳනාව කරින් ගලවා හිණ කඩපිට ගොඩ තබාලා පොකුණේ නාන්නට බට කල්හි ඉතා සෙර වූ බාල ස්ත්‍රියක් එහි ලොභය උපදවා මැණියෙනි! මේ පලඳනාව ඉතා හොබනේය. මේ නුඹ කෙසේ කරවා ගත්තෙහි ද? මමද මෙසේ වූ එකක් කරවා ගන්නා කැමැත්තෙමි. මාගේ කර ලා ප්‍රමාණ බලාපියමිදැයි කිව. අරෝ තමා නො සෙර හෙයින් යහපත; ප්‍රමාණ බලා පියවයි කිව. ඒ සෙර තමාගේම දෙයක්සේ ම කර පැලඳගෙන යන්නට වන. ඈ යන්නිය දැක දියෙන් වහා ගොඩ නැගී එසේ මෙස් දූකසේ තඩ හැඳ හැඳ ලුහු බඳවා එකුරුත්ත අල්ලාගෙන මාගේ පලඳනාව කොයි ඇරගෙන යෙයිදැයි කිව. සෙර කියන්නී මම තොපගේ පලඳනාවක් ගතිම්ද? මා කර මාගේ පලඳනාවයයි මෙසේ ඔවුනොවුන් හා කලහ කෙරෙමින් ශාලාව සමීපයෙන් යන්නාවුන් දැක බොහෝ දෙන රැස්වූහ.

බෝධිසත්ත්වයන් වහන්සේ බාල දරුවන් හා ශාලාවෙහි කෙළිනාසේක් ඒ කොලාහලය අසා කුමන කලහයෙක්දැයි විචාරා ඔවුන් කැඳවාලා උන්ගේ ආකාරයෙන් ම මේ සෙරය මේ නො සෙරය යි දැන තෙපි දෙන්න මාගේ විනිශ්චයෙහි සිටුදැයි විචාරා සිටුම්හ, ස්වාමීනියි කීකල්හි පළමු සෙර අතින් විචාරනසේක් නෝ මේ පලඳනාව පලඳින්නේ කවර සුගන්ධයෙක බහාදැයි වදාළසේක. ස්වාමීනි! අනවරතයෙන් සර්වසංහාරක සුගන්ධයෙහි ලා තබමි කීව. සර්වසංහාරක නම්, ලොව පවත්නා වූ සුගන්ධ ද්‍රව්‍ය මුළුල්ල එක්කොට යොදා කරනලද ඉතා අනර්ඝ වූ සුගන්ධයෙක. දෙවෙනිව පලඳනාව ඇති තැනැත්තිය අතින් විචාළ කල්හි මා දුප්පත් තැනැත්තියට සර්ව සංහාරක නම් කොයින්ද? නිරන්තරයෙහි පුවඟු මලෙහි ලා තබමියි කීව. පණ්ඩිතයන් වහන්සේ තලියෙක පැනෙහි ඒ පලඳනාව ලවා එසඳ ඔසනාවටුවකු ගෙන්වා තෙලෙ පැන් ආඝ්‍රාණය කොට මෙනම් සුවඳකැයි කියවයි වදාළසේක. ඒ හිඹ පරීක්ෂාකොට පුවඟු මලෙහි සුගන්ධ බව දැන මේ එකනිපාතයෙහි ගාථාවෙන් කීය.

සබ්බ සංහාරකො නත්ථි සුද්ධං කඞ්ගු පවායති
අලිකං භාසත'යං ධුත්තී සච්ච මාහු මහල්ලිකා, ති.

එහි සර්වසංහාරක සුගන්ධයෙක් නැත. එකාන්තයෙන් පුවඟු මල සුවඳමය. තෙලෙ ධූර්තවූ සෙර කීයේ බොරුමය. මැහැල්ල කියේ සැබෑමය යි කීය. බෝධිසත්ත්වයන් වහන්සේ ඈ තමා ලවා ම සෙර නියාව ගිවිස් වූ කල්හි සිටි පුරුෂයන් විසින් දූරිය එතෙනින් පිටත් කරවා හැරගෙන ගොස් තමන් සිත්වූ පරිද්දෙන් තළා මරා වත් උගන්වා ගෙනාකල්හි ඒ මඳින් තමන් වහන්සේත් පන්සිල් දී මතු මෙවැන්නක් නො කරවයි අවවාද කියා යැවූසේක.

එවක් පටන් ඔබගේ පණ්ඩිතත්වය හැම තැනම ප්‍රසිද්ධ විය. අමාත්‍යයා ඒ වූ පරිද්දෙන් රජ්ජුරුවන්ට කියා යැවූ කල්හි ඔහු සෙනකයා විචාරා ඒ ගුණමකුවා විසින් පලඳනාව ඇති තැනැත්තියට පාවා දුන්නේත් එක් පණ්ඩිත කමෙක්ද? තවත් ඉවසා වදාළ මැනවැයි කී කල්හි, තවත් පරීක්ෂා කරවයි කියා යවූහ.

සූත්‍ර ප්‍රශ්නය නම්:-

කාපුසේනක් රක්නා ගැහැනියක් යහපත් කපු තෝරා සිහින් හූ පුහක් කැට හූවටක් සිසාරා හිණ තබාගෙන ගමට යන්නී පණ්ඩිතයන් වහන්සේගේ පොකුණෙන් නාපියා යෙමියි සිතා

කඩ ගොඩ තබාලා කඩ පිට හූවට තබා දියට බට කල්හි අතික් සෙරක් ඒ දැක ලොභ උපදවා හූවට අතට ගෙන ඉතා යහපත කැටි තියාය, තොප ම ද? මේ කැටියා යි ආශ්චර්‍යවත්ව අත පොළා පියා බලන්නියක මෙන් අතට ගත් තැනැත්තී හිණ තබාගෙන නමාගත. ඒ දැක වහ වහා දියෙන් ගොඩ නැඟී සැඩ හඬිමින් දිවන්නී අල්වා ගෙන මාගේ හූවට කොයි ගෙන යෙයි දැයි කිව. අරෝ කියන්නී එසේ ද තොපිත් කපු කපිනා සේ දනු ද? තොප මුත් අපි කපු කොයි දනුමෝ ද? එසේ වී නම් තොපගේ හූ අතිකක් තියා ය. මේ මාගේ හූය මාම කැටියයි ගසා හඬාගත. මෙසේ උන් දෙන්නා කලහ කෙරෙමින් ශාලාව සමීපයෙන් යන්නවුන් දැක බොහෝ දෙන රැස්වූහ.

බොධිසත්ඣයන් වහන්සේ උන් ගෙන්වා ගෙන මාගේ විනිශ්චියෙහි සිටුදැයි විචාරා සිටුම්හ ස්වාමීනි! කීකල්හි පළමුව සෙර විචාරනසේක් මේ හූවට ඇතුළේ කුමක් ලාලා සිසාලෝද යි කීකල්හි ස්වාමීනි! කපුරොඩුවකැ යි කිව. නැවත අතිකිය අතින් විචාරා ස්වාමීනි! තිඹිරි ඇටයකැයි කී කල්හි දෙන්නාගේ බසම සිටියවුන් ගිවිස්වා හූවට විදහා තිඹිරි ඇටය දැක ඇ සෙරබවට ගිවිස් වූ කල්හි පෙර පරිද්දෙන් සිටියවුන් විසින්[1] අවවාද ලදින් උන් පැලා කල්හි විනිශ්චය කළ නියාව ඉතා යහපතැයි බොහෝ දෙන සතුටුව සාධුකාර දගස් ගණන් පැවැත්තූහ. එපවත් අසා අමාත්‍යයා විසින් රජහට කියා යවූ කල්හි පණ්ඩිතයන් ගෙන්වමෝදැයි සෙනකයා විචාරා මහරජ! එයින් එක් ආශ්චර්‍යයෙක් ද? ඇති තැනැත්තියට හූවට පාවා දුන්නෝත් පණ්ඩිත කමෙක්දැයි කියා නැවැත්විය.

පුත්‍රප්‍රශ්නය නම් :—

එක් ස්ත්‍රියක් තමාගේ පුතකු වඩාගෙන පණ්ඩිතයන් වහන්සේගේ පොකුණට ගොස් පළමුව පුතු නාවා තමාගේ ඉණ කඩ පිට ගොඩ ඉඳුවා තොමෝ මුව සුද්ධ කරන පිණිස දියට බට. ඒක්ෂණයෙහි එක් යකින්නක් ඔහු කා පියනු කැමතිව ගැනු වෙසක් මවා ගෙන අවුත් නැන! ඉතා ශොභමාන වූ සුරතල් පුතණුවෝ තොපගේම දැයි විචාලාය: මැණියෙනි! මා දරුවෝ යයි කීකල්හි වඩාගෙන ඔහු නැටවීම් ආදී වූ නොයෙක් පරිද්දෙන් කෙළ කෙළ සිටලා ඇරගෙන නමාගත. මවු ඒ දැක වහ වහා දියෙන් ගොඩ

1 අතින්

නැඟී දුකාෂස් කඩ හැඳ ගැඳ දිවමින් ගොස් අල්වාගෙන මා දරුවන් කොයි ගෙන යෙසිදැයි කිව. යකින්නී කියන්නී තොප දරුවන් ලද්දේ කොයිදී ද? මූ මා දරුවෝයයි කිය කියා දෙන්නා කලහ ඝොරෙමින් ශාලාව සමීපයෙන් යන්නාවුන් දැක බොහෝ දෙනා රැස්වූහ.

බොධිසත්වයන් වහන්සේ ඔවුන් කැඳවා දුටුසේක්ම මෝ යකින්නීය, මෝ මූගේ මවුයයි දත්සේක්ම ය. කෙසේ දත්සේක් ද යත්? ඇස් නො මරණ හෙයින් ද, ඇස් රත් හෙයින් ද, ඡායාව නැති හෙයින් ද, යකින්නියයි දැන මාගේ විනිශ්චයෙහි සිටුදැයි විචාරා සිටුම්හයි ස්වාමීනි! කීකල්හි බිම හිරක් හැඳ ඒ හිරපිට කුමාරයා හොවා යකින්නට දැත හා මවුට දෙපය හා අල්වාගෙන ඇද හිමි කෙනෙක් දරුවන් ඇර ගන්වයි වදාළසේක. ඔවුන් දෙදෙනා විසින් හදනාළද කල්හි වේදනාව ඉවසාගත නොහී කුමාරයා හඬන්නට වන. පුතුගේ දුක් බැලිය නොහී ළය පැළීයන තරම් ශොක උපදවා මව අතහැර හඬන්නිය දැක පණ්ඩිතයන්වහන්සේ එතෙන රැස්වූවන් විචාරනසේක් දරුවන් කෙරෙහි මවුන්ගේ ළය මොලොක් ද? නො මවුන්ගේ ළය මොළොක්දැයි වදාළසේක. මවුන්ගේ ළය මොලොකැයි ස්වාමීනි! කීහ. එසේ කල දැන් වඩා ගෙන සිටින්නී මවු ද? අතහැර සිටින්නී මවුදැයි වදාළසේක. ස්වාමීනි! අතහැර අඬන්නී මවුයයි කීහ. මේ දරුසෙර නෙපි කවරක යයි දනුදැයි වදාළසේක. නො දනුම්හ ස්වාමීනි! කීහ. එසේ වී නම් තොලෝ යකින්නී ය. තෙලෙ කුමාරයා කන්ට ගතැයි වදාළසේක. ස්වාමීනි! නුඹවහන්සේ කෙසේ දැනගත්සේක් දැයි කීහ. ඇස් නො මරණ හෙයින් ද, ඇස් රත් හෙයින් ද, නිර්භීත හෙයින් ද, ලෙහි කරුණාවක් නැති හෙයින් ද යන මෙකී කාරණයෙන් දනිම්යි කියා නැවත අෑ අතින් විචාරනසේක් තෝ කවරක්හිදැයි විචාළසේක. ස්වාමීනි! මම යකින්නියක්මියි කිව. මොහු කුමට ඇල්ලීදැයි වදාළසේක. ස්වාමීනි! කාපියන්නට ගතිමියි කිව. එවිට වදාරනසේක් නුවණ නැති ජඩ තැනැත්තිය! තෝ පෙර කළ පව්න් දැන් යකිනිව ඉපිද ප්‍රාණවධ ආදී නොයෙක් පව් කොට තව තවත් වඩ වඩා සතර අපායෙහි දුක් විඳිනීවේදැයි වදුරා තී පණ යේ නමුත් මතු මෙවැන්නක් නො කරවයි අවවාද කොට පන්සිල් දී යවූසේක.

කුමාරයාගේ මවු පුතු ලදින් පස්වණක් ප්‍රීතීන් පිනා ගිය තැනැත්තී ස්වාමීනි! බොහෝ කාලයක් ජීවත්වුව මැනවැයි තමා ඹුබ නො සෑහෙන පරිද්දෙන් මහතාණන්ට අා වඩ වඩා ගියා ය.

අමාත්‍යයා පෙර පරිද්දෙන් ම රජ්ජුරුවන්ට කියා යවීය. රජ්ජුරුවෝ පණ්ඩිතයන් ගෙන්නමෝදැයි සෙනකයා විචාළහ. මවුන්ට දරුවන් පාවා දුන්නේත් එක් පණ්ඩිතකමෙක් ද? තවත් ඉවසා වදාළ මැනවැ යි සෙනකයා කී කල්හි එහි උදසීනව තවත් පරීක්‍ෂා කරවයි ඇමතිහට කියා යවූහ.

මෙසේ මිතීස් වෙසින් අවුත් ගකුන් අල්ලාගත් දරුවන් පවා සත්හැවිරිදි වයස සිට තමන් වහන්සේගේ ප්‍රඥාබලයෙන් අතැඹුලසේ දැන තමන් වහන්සේගේ මහිම ලොව ප්‍රසිද්ධ කළ මහතාණන් ක්‍ෂාත් ක්‍ෂාත් කළ ශාන්ත වූ නිවන් සම්පත් අත්පත් කටයුතු.

ගෝලකාල ප්‍රශනය නම් :-

ඉතා ලකුණ්ටක හෙයින් ගෝළයයි ද, දැගිය දැලි කණු වක්සේ ඉතා කළු හෙයින් කාලයයි ද මේ දෙක නිසා ගෝලකාල නම් එක් පුරුෂයෙක් අයවැය පසිඳ බිරින්දක් ලැබ ගන්ට තමා අපොහොසත් හෙයින් සත් අවුරුද්දක් ගෙයි කඹුට දික්තලායි නමැති අඹුවක ලද. එක් දවසක් ඒ තමා අඹුව බණවාලා සොදුර! අපගේ දෙමවුපියන් බලාපියා එන පරිද්දෙන්, කැවුම් පෙවුම් ආදි උපකරණයක් සපයවයි කිය. තාගේ දෙමවුපියන්ගෙන් ප්‍රයෝජන කිම් ද? මැන නො දෛඩා හිදුවයි කියා නො ඊවිස්සී ය. එසේ කීවත් දෙතුන් වෙනුව හඩා දෛඩා දත්පත් නියා තමාගේ අවනත කමින් දුකසේ ඇ සිත් ගෙන කන බොන දෙයක් හා මාගෝපකරණයක් සපයවාගෙන එහැම තමා කද බැඳ කර තබාගෙන අඹුව හා එක්ව යන්නේ අතර මග ගැඹුරු නොවි දිය පැනී[1] යන්නා වූ පළල් ගඟක් දැක සවභාවයෙන් ම තමන් දියට බත[2] හෙයින් ගඟින් එතර නොවී සිටියේ ය.

එවේලෙහි දික්පිටියා යි යන නමක් ඇති ඉතා දුක්පත් පුරුෂයෙක් බිලී බාදේ කිසියම් කටයුත්තක් නිසා ගංහිකනියෙහි ඇවිදිනේ අවුත් එතෙනට පැමිණියේ ය. ඔහු දැක ගෝලකාලයා විචාරන්නේ සබඳ! මේ ගඟ පොවාද? නොහොත් ගැඹුරුදැයි කිය. එබසින් ඔහු දියට බනබව දැන අනිකා කියන්නේ කුමක් කියයි ද? ඉතා ගැඹුරය. ඊටත් වඩා චණ්ඩවූ කිඹුලුන් හා මෝරුන් විසින් ඉතා භයානකයයි කිය. එසේ කාල නොප යන්නෝ එන්නේ කොසේදැයි කිය. ඒ කියන්නේ ඒ කියන කිඹුලුන් හා මෝරුන්

---

1 වැනී. 2 බම,

හා මා හා බොහෝ දවසක් එක තැන පුරුද්දම්හ. එසේ හෙයින් අතිමිත්‍රයම්හ. එබැවින් උන් නිසා මට කිසි පීඩාවක් නැතැයි කීය. යාළුව! එසේ වී නම් අප එතරකර ලවයි කීය. ඔහු ගිවිස කල්හි කන බොන දෑ දුන්හ. දරු ඒ හැම කා බී අනතයෙහි කියන්නේ යාළු! පළමු කවුරුන් එතර ලවම්දැයි කීය. ගෝළු කාලයා කියන්නේ යාළු! මා පසුව එතර ලව. තෙලේ තොපගේ බැදෑණියන් පළමුකොට එතර ලවයි කීය. දික්පිටියාත් තමාත් ඒ කැමති හෙයින් යහපතැයි ගිවිස දික්තලය කර හිඳුවා ගෙන කන බොන දෑ ආදී වූ සියල්ලම නො තබා හැරගෙන ගඟට බැස පමණක් තැන් කෙළින් ගොසින් මඳක් තැඹුරු තැඹුරුව දිය බොහෝ ලෙස හඟවා උක්කුටකයෙන් හිඳ දත නමාගත. ගොඩ බලා සිටි ගෝළුකාලයා සිතන්නේ රිටක්සේ මෙසේ උස් තැනැත් තහුට මෙපමණ දිය ය. මට වූකලි නො පොවන්නේ සබාමයයි සිත සිතා සිටියේ ය.

දික්පිටියා ඈ කර හිඳුවාගෙන ගං මැදට ගෙන ගොස් කියන්නේ සොඳුර! මා කීවා කොට මා කෙරෙහි රුකෙවු නම් වහල්, සරක්, වස්ත්‍රාභරණ, අන්නපානාදීන් සමෘද්ධව මහා පරිවාර යෙන් යුක්ත ව ඇඳිම් පැලඳිම් ආදි වූ දෙයින් සැරහී දිව්‍යාප්සරා වක මෙන් බැලු බැලූවන්ට ප්‍රියව ඇවිදිනවාදැයි මේ ලකුණ්ටක වූ වාමනකයා තොපට කුමක් කොට ලන්ට සමත්දැයි මා කීවා කරවයි කීය. දික්තල උගේ බස් අසමින් තමා නිසා සත් අවුරුද්දක් ගෙසි කඹුට එසේ දුක් ගත් සවාමියා කෙරෙහි ප්‍රේමයක් ඇත්තම් පොකුරු පත පැනක් මෙන් නො තබාම් සිඳ හැරපියා ඒක්ෂණ යෙහි ඔහු කෙරෙහි පිළිබඳ සිත් ඇතිව කියන්නී සවාමිනි! මතු මා නො හරිනාදැ වීනම් නුඹ කීවා කෙරෙම්සි කීව. මෙසේ ඔහු දෙදෙනා ගොඩ නැඟී ගෝළුකාලයා බල බලා සිටියදීම ගෙනයන කැවුම් සපා තළා කාපියා ප්‍රිය කථා කෙරෙමින් නික්මුනාහ.

ගෝළුකාලයා සිතන්නේ මූන් දෙන්නා මා හැරපියා යන සැටි යයි සිත සිතා කෝපයෙන් ඈත් මැත් බලා දිවන්නේ දියටත් පැනපියයි. ගොඩටත් පැනපියයි. උන් දසාවත් බලාපියා දියෙහි බයක්වත්, කිඹුලුන්, මෝරුන්ගෙන් භයක්වත් නො සිතා ක්‍රොධ ඉවසාගත නො හී මළ කිමි, හුන් කිමි, සිතා දියට පැනපියා යන්නේ පොවන බව දැන දියෙන් ගොඩ නැඟී වහ වහා දිවගෙන ගොසින් කොල දුෂට වූ සොර! මා අඹුව කොයි ගෙන යෙයිදැයි කීය. නැවත දික්පිටියා කියන්නේ නිඃශ්‍රීක වූ ලකුණ්ටකය! තටත් අඹුවෝ ඇද්දැයි කර පහරක් පැහැර බොටුව අල්වාගෙන දමාලීය.

ගෝළකාලයා පහර කා, කීප පිම්මක් පැනපියා මූණින් හී දූකසේ නැඟී ඕට "අඹුවන් තබා හී මළමෝයයි" කීවාසේ නැවත ලුහු බඳවා දිවගෙන ගොස් දික්තලය අත අල්වාගෙන සත් හවුරුද්දක් ගෙයි කඹුට ලත් මාගේ අඹුව කොල! තෝ කොයි ගෙන යෙයිදැයි කියාලා කලහ කෙරෙමින් ශාලාව සමීපයෙන් යන කල්හි බොහෝ දෙනා රැස්ව ගියාහ.

පණ්ඩිතයන් වහන්සේ ශාලාවෙහි කෙළනාසේක් කෝලාහලය අසා කාගේ කුමන ශබ්දයෙක්දැයි විචාරා ඒ බව අසා ඔවුන් කැඳවා මාගේ විනිශ්චයෙහි සිටුදැයි කියා වදාළසේක. සිටුම්හයි ස්වාමීනි! කී කල්හි තුන්දෙනාගෙන් පළමුව දික්පිටියා බණවා තෝ කිනම්හිදැයි විචාරා ස්වාමීනි! මට දික්පිටියා යැයි කියතියි කීය. තාගේ අඹු කිනම් ද? ඇගේ මවුපියෝ කිනම්හුදැ යි කීකල්හි අතර මගදී දුටු තැනැත්තිය හෙයින් විචාරාගත නුහුන. එසේ හෙයින් තමා කටට ආවක් ම කීය. ඌගේ තෙලෙ බස් සිත තබවයි සිටියවුන් ගිවිස්වා ඔහු එතෙතින් පහකොට ගෝළකාලයා ගෙන්වා තාගේ නම කිනම් ද? තාගේ මවුපියෝ කිනම්හු ද? තාගේ අඹුව කිනම් ද? ඇගේ මවුපියෝ කිනම්හුදැයි විචාළ කල්හි සත් හවුරුද්දක් ගෙයි කඹුලේ නැදිමයිලන්ගේ නම් හා අඹුවගේ නම් පමණකුත් නො දනිම් ද? එබැවින් සියල්ලවුන්ගේ නම් ඹූළුල්ල නො වරදවා ඇති සැටියේ කීය.

නැවත ඔහු පිටත සිටුවා දික්තලය[1] බණවා තෝ කිනම්හි ද? තීගේ මවුපියෝ කිනම්හු ද? ඌ කිනම්හි ද? ඌගේ මවුපියෝ කිනම්හු දැ යි විචාළසේක. ස්වාමීනි! මට දික්තලා යයි කියාත් තමාගේ දෙමවුපියන්ගේ නම් නො වරදවා කිව. අමුතුව දුටු තැනැත්තහු හෙයින් ඌගේ හා ඌගේ මවුපියන්ගේ නමුත් පළමු තමා විචාරා නො ගත් හෙයින් නන් දෙඩන්නියක මෙන් තමා කටට ආවක් ම කිව එයින් සිටියවුන් ගිවිස්වා පිටත සිටි දෙන්නාත් කැඳවා තුන් දෙනාම සිටුවා ගෙන මුන් තුන් දෙනාගෙන් දික්තලාගේ බස් හා දික්පිටියාගේ බස් හා එකදැයි විචාරා ගෝළකාලයාගේ බස් එක්දැයි විචාළසේක. දික්තලාගේ බස් හා ගෝළකාලයාගේ බස එක ය, ස්වාමීනි! යි කී කල්හි එම්බා! ගෝළකාලයා නම් මැගේ සැමිය. දික්පිටියා නම් අතරමග දුටු සොරායයි වදාළසේක.

එවේලෙහි එතෙන සිටියවුන් විසින් දික්පිටියා එතෙතින් පිටත හැරගෙන අතින් පයින් තළා වලා පරදුරාවන් කෙරෙහි රුචි ඇර වූ කල නැවත වෙත ගෙන්වාගෙන එම්බල අඥාන වූ

1. දික්තලාඞිය.

ජඩය! පරදාර නම් පරලොව දුක් තබා මෙලොව මහා අනර්ථයට කාරණ තියාව දැන් ම දුටුයෙහි වේදැයි මතු මෙවැන්නක් නො කරවයි අවවාද කියා පන්සිල් දී යවූසේක. අමාත්‍යයා එයින් රජ්ජුරුවන්ට කියා යවී ය. රජ්ජුරුවෝ සෙනකය! පණ්ඩිතයන් ගෙන්නමෝදැයි කීහ. අඹුවන් ඇත්තන්ට අඹුවන් පාවාදුන් නෙත් පණ්ඩිතකමෙක් ද? තවත් ඉවසා වදාළ මැනවයි කීය.

රථ ප්‍රශ්නය නම් :-

එක් දවසක් එක් පුරුෂයෙක් රථයෙක හිඳගෙන මුව ශුද්ධ කරන්නට නික්මිණ. ඒ ඇසිල්ලෙහි ශක්‍රයෝ මිනිස්ලොව බැලුවාහු බොධිසත්ත්වයන් වහන්සේ දැක මහෞෂධ බුද්ධාඞ්කුරයාණන් වහන් සේගේ ප්‍රඥානුභාවය තවත් වඩ වඩා ලොවට ප්‍රසිද්ධ කෙරෙමියි සිතා මිනිස් වෙසින් අවුත් රථයෙහි පසු කොළවර අල්වාගෙන නමා ගත්හ. රථයෙහි හුන් පුරුෂතෙම කුඩෙනි! කුමක් පිණිස අවුදැයි විචාරා තොපට සේවයට ආමි කීකල්හි යහපතැ යි ගිවිස රථයෙන් බැස රථය බලවයි කියා තෙමේ ශරීරකෘත්‍යයට ගියේ ය. ඒක්ෂණයෙහි ශක්‍රදෙවෙන්ද්‍රයෝ රථයට නැඟී වහා රථය පැදපීහ. රථ ස්වාමියා කටයුතු සපයාගෙන අවුත් රථය ගෙන යන්නහු[1] දැක දිව දිව ගොස් සිටුව සිටුව, මාගේ රථය කොයි ගෙන යෙහිදැයි කීය. තාගේ රථය අනිකක් නියා ය. මේ මාගේ රථයයි කලහ කෙරෙමින් ශාලාව කරා පැමිණියාහ.

බොධිසත්ත්වයන් වහන්සේ කුමන කලහයෙක්දැ යි ඔවුන් බණවා එන්නවුන් දැක ම බය නැති බැවින් හා ඇසිපිය නො මරණ බැවින් හා මේ කලි දෙවතාවෙක, අනිකා රථ ස්වාමියායයි දත්සේක. එසේ දැන දැනත් දෙන්නාගේ විවාද කාරණය විචාරා මාගේ විනිශ්චයෙහි සිටුදැයි කියා සිටුම්හ ස්වාමීනි! කී කල්හි එසේ වී නම් මම රථය පදවා ලමි. තෙපි දෙදෙන රථයෙහි පසු කොළ වර අල්ලාගෙන දිවව. රථය හිමි එකෙක් නො හැරම දිවන්නේය. අහිමි එකෙක් හැරපියන්නේයයි වදාරා තමන් වහන්සේගෙන් පුරුෂයක්හු ලවා රථය පැදවූසේක. ඔහු දෙදෙන රථය පසු කොළවර අල්වාගෙන දිවන්නාහ. ඉන් රථස්වාමියා මඳක් තැන් දිව බලා දිවිය නොහී අතහැරපියා සිටියේ ය. ශක්‍රයෝ අත නො හැරම දිවන්නාහ.

බොධිසත්ත්වයන් වහන්සේ රථය නවත්වා සිටියවුන්ට වදාරන සේක් බලව. මේ පුරුෂතෙමෙ රථය හා එක්ව මඳක් තැන් දිව

---

[1] යන්නවුන්.

නොයාගී අතහැරපියා සිටියේ ය. මේ තෙමේ රථය හා එක්ව ම අත නො හැර දිව එක්ව ම නැවතියේ ය. මොහුගේ ශරීරයෙන් ඩා පෙණෙක්වත්, ආශ්වාස ප්‍රශ්වාස මාත්‍රයෙක්වත් කිසි භයෙක් වත්, තැති ගැන්මෙක්වත්, ඇස්මරා ලීමෙක්වත් නැත. මේ තෙමේ අතිකෙක් නො වෙයි. ශක්‍රදෙවේන්ද්‍රරාජයා වනැයි දැන තෙපි ශක්‍රදෙවේන්ද්‍රයාණෝ වේදැයි වදාළසේක. එසේ ය පණ්ඩිත යෙනි! කීහ. කුමක් පිණිස අවුදැයි කීකල්හි පණ්ඩිතයෙනි! තොපගේ ප්‍රඥ විශෙෂය තවත් වඩ වඩා ප්‍රකාශ කොට පියන පිණිස ආමි කීහ. එම්බා! තොප එක ශක්‍රයකු තබා දස දහසක් සක්වළ දස දහසක් ශක්‍රයෝත් මාගේ ප්‍රඥයෙහි කෙළවරක් දක්ක හෙද්ද? මතු මෙවැන්නක් නො කරවයි අවවාද කළ කල්හි ශක්‍රයෝත් තමන්ගේ ශක්‍රානුභාවය දක්වන්නාහු ආකාශයෙහි තමන්ගේ ශක්‍රවිලාසයෙන් සැදී පැහැදී සිට ඉතා යහපත යුක්තිය පසුන් තියාය යි පණ්ඩිතයන් වහන්සේට සතුති කොට තමන්ගේ ශක්‍රභවනයට ගියාහ.

එදවස් අමාත්‍යයා තෙමේම රජ්ජුරුවන් ලඟට ගොස් මහ රජ්ජුරුවෙනි! රථ යුක්තියක් පසුන් තියාවට ශක්‍රයෝ පවා පැරද නිසුවට පැමිණ ගියාහයි තමා ඇස දුටු දෙය විස්තර කොට කියා කුමක් පිණිස පුරුෂ විශෙෂයක් නො දන්නාසේක්දැයි තරව දෙඩී ය. එබස් අසා සෙනකය! පණ්ඩිතයන් ගෙන්නමෝදැයි කීහ. ඒ කියන්නේ මහරජ! ඉවසා වදාළ මැනව. මෙතෙකින් මතු පණ්ඩිත නම් නොවෙති. තවත් පරීක්ෂා කරම්හයි කීය.

ඉක්බිති දණ්ඩ ප්‍රශ්නය නම්:-

පණ්ඩිතයන් වහන්සේ ම විමසන පිණිස දිග වියතක් පමණ කිහිරි දණ්ඩක් වඩුවන් ලවා අගමුල එක මහත නො හැඟෙන පරිද්දෙන් ලියවා මෙසේ කියා යවන්නාහ. නැගෙනහිර යව මැදුම්ගම ඇත්තෝ ඉතා නුවණැත්තෝල. එබැවින් තෙලෙ කිහිරි දණ්ඩෙහි මේ අගය, මේ මුල යයි කියා එවත්වයි; එසේ නො කිව දහසක් දඩයයි කියා යවූහ. ගම්වැස්සෝ රැස්ව බලා දැනගත නොහී සිටාණන්ට කීහ. සිටාණෝ තුමූත් දැනගත නොහී කුමක් කරමෝදැයි කීහ. නැවත ගම්වැස්සෝ කියන්නාහු යම්සේ පණ්ඩිතයන් වහන්සේ දන්නා දෑ වී නම් විචාළ මැනැවැයි කීහ. ක්‍රීඩා මණ්ඩලයෙහි කෙළිමින් සිටි පුතණුවන්දෑ කැඳවාලා මේ දණ්ඩෙහි අගමුල අපි නො දනුම්හ. පුත! තෙපි දැනගත හෙවූ දැයි විචාළහ. ඒ අසා සිතනසේක් රජ්ජුරුවන්ට මේ දණ්ඩෙහි අගින්වත්, මුලින්වත් ප්‍රයෝජනයෙක් නැත. මා ම විමසන පිණිස

එවූහයි සිතමි. මෙසේ ගෙනෙවයි කියා අතට ගත්සේක් ම මේ අගය, මේ මූලයයි කියා දැනගත්සේක. එසේ දැන දැනත් බොහෝ දෙනා සිත් ගත මනාවේදැයි සිතා පැන් තලියක් ගෙන්වා කිහිරි දණ්ඩ මැද සරියේ හුයක් බැඳ හු කෙළවර ගෙන දිය පිට තැබූ කල්හි මූල බර හෙයින් පළමු දියෙහි ගැලිණ. එ බව සිටියවුන් අතින් විචාරනසේක් ගස මූල බර ද? අග බරදැයි වදාළසේක. ස්වාමීනි! මූල බර වේදැයි කීහ. එබැවින් පළමු ගැලුණු අත මූලයයි නියම දැන ගෙන ගොස් දෙවයි වදාළසේක.

ගම්වැස්සෝ අග මේය, මූල මේයයි කියා ගෙන ගොස් රජ්ජුරුවන්ට පාවා දුන්හ. මේ කවුරුන් විසින් දන්නා ලද්දේදැයි විචාල කල්හි ශ්‍රී වඩ්ඪන සිටාණන්ගේ පුත්‍රණුවන්ද මහෞෂධ පණ්ඩිතයන්ද විසින් දන්නා ලදැයි අසා ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න ව සෙනකය! පණ්ඩිතයන් ගෙන්නමෝදැයි කීහ. ඉක්මන් කිම් ද? තවත් විමසන තෙක් ඉවසුව මැනවැයි කියා නැවතී ය.

ශිෂ ප්‍රශ්නය නම්:-

නැවත එක් දවසක් ගැනු පිරිමි ඉස් දෙකක් ගෙන්වාගෙන මේ ස්ත්‍රියගේ ඉසය, මේ පුරුෂයාගේ ඉස යයි කියා නියම දැන එවත්වයි, නො කිව දහසක් දඬයයි කියා යවූහ. බොහෝදෙනා රැස්ව බලා දැනගත නොහී පණ්ඩිතයන් වහන්සේ විචාළහ. උන්වහන්සේ දුටුසේක් ම දැනගත්සේක. කෙසේ දැනගත්සේක් ද යත්? පුරුෂයාගේ ඉස මැස්ම සෘජුව තිබෙන්නේ ය. ස්ත්‍රියගේ ඉස මැස්ම ඇගේ සිතසේ ම වක්ව ඇදව තිබෙන්නේයයි කියා මේ සලකුණෙන් දැනගෙන ගොස් රජහට දෙවයි යවූසේක. ඒ බව රජ්ජුරුවන් අසා ඒ දතුවන් විචාරා පණ්ඩිතයන් වහන්සේයයි අසා ඉතා සතුටුව පණ්ඩිතයන් ගෙන්නමෝදැයි සෙනකය! කීකල්හි තවත් පරීක්ෂාකරවයි කියා නැවතීය.

අහි ප්‍රශ්නය නම:-

තවද, එක් දවසක් සර්පයකු හා සැපින්නක ගෙන්වා මේ සර්පයාය, මේ සැපින්න යයි නියම දැන කියා එවත්වයි; නැත, දහසක් දඬයැයි කියා යවූහ. ගම්වැස්සෝ තුමූ නො දැන බෝධිසත්ත්වයන්ද විචාළහ. ඔබ දුටුසේක් ම දැනගත්සේක. කෙසේ දැනගත්සේක් ද යත්? සර්පයාගේ නඟුට දළ ය, සැපින්නගේ නඟුට සිහින. සර්පයාගේ ඉස දළය, සැපින්නගේ ඉස සිහින, දික්ව තිබෙන්නේය. සර්පයාගේ ඇස් මහත, සැපින්නගේ ඇස් කුඩාව තිබෙන්නේ ය. සර්පයාගේ සෝවැත්ත ඝනය, සැපින්නගේ සෝවැත්ත තුනුව

පිසිර තිබෙන්නේයයි ඔබ මෙතෙක් කාරණයෙන් මේ සපීයාය, මේ සැපින්න යයි දූත රජ්ජුරුවන්ට ගෙන ගොස් දෙවයි යවූ සේක. ගම්වැස්සෝ වදාළ ලෙස ගෙන ගොස් මේ සපීයාය, මේ සැපින්න යයි පාවා දුන්නාහ. කීවෝ කවුරුදැයි විචාරා පණ්ඩිත යන් වහන්සේ යයි අසා ඉතා සතුටුව පණ්ඩිතයන් ගෙන්නමෝ ද? කීකල්හි තමාගේ ක්‍රොධ මානය ඉවසා ගත නොහී මහරජ! ඉවසා වදාළ මැනව. කිසිවක් නො දන්නා අභිගුණ්ඨිකයෝ [1] පවා සපීයන් අඳුනන්නාහ. මූ නුවණැත්තෝ [2] යන්නවුන් මේ දූතගත්තෙත් මහා ආශචයර්‍යයක් ද? තවත් පරීක්‍ෂාකරන තෙක් ඉවසා වදාළ මැනවැයි කියා නැවැත්විය.

කුකුකූට ප්‍රශනය නම් :-

තවද එක් දවසක් කියා යවන්නාහු නැගෙනහිර යවමැදුම් ගම්වාසීහු ඉතා නුවණැත්තෝල. පය අං නැගි ඉස මොල්ලියක් ඇති තුන්වේලෙහි නො වරදවා තප් ලන සඡාබගයෙන් ඉතා ධවලවූ ඇලි ගොනකු එවත්වයි එසේ නො එවුව දහසක් දඩ යයි කියා යවූහ. ගම්වැස්සෝ ඒ බව දූතගත නොහී බොධිසත්‍වයන් වහන්සේ විචාලහ. ඔබ වදාරනසේක් රජ්ජුරුවෝ ඇලි කුකුළකු කැමති වුව. පය අං නම් පොරකටුය. ඉස මොල්ලිය නම් ඉසමලය.[3] තුන් වේලේ තප් ලීම නම් හුසවය, දීඝීය, ප්ලුත යයි කියා ද, නොහොත් උදෑසනය, දවහල්ය, සවසයැයි කියා ද යන කාලත්‍රය නොවරදවා හඬතැලීමය. එබැවින් හැලිකුකුළකු වහා යව යි වදාළසේක. ගම්වැස්සන් කුකුළා ගෙනගිය කල්හි මේ දතුවෝ කවුරු දූයි විචාරා මහතාණන් කි තියාව අසා ප්‍රීතීන් පිනාගොස් සෙතකය! පණ්ඩිතයන් ගෙන්නමෝ දූයි විචාරා ඔහු විසින්ම නැවැත්තු කල්හි තවත් පරීක්‍ෂා කරන්වයයි කියා කීය.

මණි ප්‍රශනය නම් :-

අපගේ මේ මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ කුසරජ කල ප්‍රභාවතීන් නිසා යුද්ධපිණිස අවුත් තමන් වහන්සේගේ මයිල් රජු වසන සාගල නුවර රජදරුවන් සත්දෙනකු හා සත් සේනා වක් වටලාගත් කල්හි ප්‍රභාවතීන් ආදිවූ නුවරවාසීන් එක් වල හම් ගෙයක් සේ මරණ භයින් තැතිගෙන යඩන්නට වන්කල්හි තමන් වහන්සේගේ මහිම දක්වනු පිණිස තමන් නැගි ඇතුපිට ප්‍රභාවතීනුත් ඉඳුවාගෙන නුවරවාසීන්ට "තෙපි හැම උත්සව කෙළවයි, සටන් මට භරුව"යි කියා තමන් වහන්සේ විසින්

---

1. අභිගුණ්ඨිකයෝ 2. නුවණැත්තෙතම 3. කරමලය

වහසල් හරවා ඇත්සමූහයක් ලූහට, නොබා නික්මුණු අභීත කෙශර සිංහ රාජයකු පරිද්දෙන් නතිව ගොස් "මම යසි සිංහ සඬර කුසරජය" යි කී බසින් දිවියා දුටු මුව රැළක් බුන්නාසේ රජුන් සත්දෙනා තබා සත් සේනාව උනුන් නොගෙන [1] ආයුධ ආදී සියල්ලක්ම දමා ඉස් ලූ ලූ අත පැලා කල්හි අපට නායකව සිටිනා රජ්ජුරුවන් වහන්සේ කළදෙයක් විඳුම්හයි ආයුධ දමා නිරායුධව සිටි රජුන් සත් දෙනා නොමරා අල්වා බැඳගෙන අවුත් ශ්‍රීපාදය වැඳවූ කල්හි ඒ සතුරු රජුන් සත්දෙනාට අභයදානය දෙවා බැඳුම් මුදවා පෙර පරිද්දෙන් ම සියලු ආභරණයෙන් සරහා බැඳූවූ සත්දෙනා පිළිවෙළින් ඔවුන්ට සරණ පාවාදී සේනා සහිත රජුන් සත්දෙනා සවසථයෙන් උන් උන්ගේ රටට යවා කළ සංග්‍රහත්, නතිව සටනේ ජයගත් ලෙසටත්, අතිප්‍රසන්නවූ ශක්‍ර දෙවෙන්ද්‍රයන් කුස රජ්ජුරුවන් කර බැඳි අෂ්ටවංක මාණික්‍ය රත්නය කල්යාමෙන් ඇමුණු [2] හුය දිරාගියේය.

ඒ මැණික අට තැනකින් වක්ව තිබෙන හෙයින් පරණව දිරාගිය හුය ඇර අලුත් හුයක් අවුනා [3] ලන කෙනෙක් මනුෂ්‍යයන් කෙරෙහි එකද සඬයෙකුත් නැත. දෙවියන් කළ දෙයක් දෙවතාවන් මුත් නොකොට හැකි නියාවත්, මනුෂ්‍යයන්ට එ අවිෂය නියාවත් දන්නා සේනකයා විසින් 'මිනුත් තමා පරදවා නිෂ්ප්‍රභා කරවමි' සිතා මැණික යවන්නෝ නැගෙනහිර යවමැ දුම්ගම් වාසීහු ඉතා නුවණැත්තෝල. තෙලෙ මැණික පරණ හුය හැරපියා අලුත් හුයක් අවුනා එවත්වයි එසේ නොඑවුව දහසක් දඩයයි කියා යවූහ.

ගම්වැස්සෝ පරණ හුය හරනටවත් අලුත් හුයක් අවුනන්ටවත් නොපොහොසත්ව පණ්ඩිතයන්වහන්සේට කීහ. ඔබ වදුරනසේක් එවිවරක් බැරි නො වෙයි. කියා මී ටිකක් ගෙන්වාගෙන මැණික දෙකෙළවර පායා මී බිඳු ගතා [4] රත් පලස් හුයක් අඹරා දෙකෙළවර කටුවෙන් මඳක් සිදුරු පායාලා මීයේ ගලා හූ කෙළවර මැණික සිදුරට බහාලා කුහුඹු බිලයෙක්හි තැබූ කල්හි කුහුඹුවෝ මීයේ ගන්ධය අසමින් වහා අවුත් පරණ හුය කාගෙන මැණික ඡිද්‍රයෙන් නැගී සිදුරට බහාලා තැබූ හූ කෙළවර හයාගෙන මැණිකින් පිටත්වූහ. ඇවිණි බව නියම දැන තෙලේ ගෙනගොස් දෙවයි ගම් වැස්සන්ට දුන්සේක. ගම්වැස්සෝ රජ්ජුරුවන්ට දුන්හ. ඇවිණි උපාය රජ්ජුරුවන් විචාළ කල්හි මහරජ! අපගේ පණ්ඩිතයන්

1. ගොනතත 2. පැමිණි 3. අමුණා 4. ගසා

වහන්සේ මෙපමණක සරු නො කොට තමන් වහන්සේවත් අතික් මනුෂ්‍ය කෙනෙකුන් ලවාවත් නො ඇවුණුවූසේක.

වැලි කෙසේ ද යත් ?

සෙනකයා බැරි යයි නෝරාගත් මෙබඳු නො කොට හැකි කටයුත්ත කිසිවකුත් නො දන්නා තිරිසනුන් ලවා කරවමි යන්නාක්මෙන් තමන් වහන්සේගේ උපායෙන් කුහුඹුවන් ලවා අවුණුවා එවූසේකැයි කිහ. ඒ ඇව්ණි උපාය අසා රජ්ජුරුවන් අතිප්‍රසන්නව පණ්ඩිතයන් ගෙන්නමෝ ද? සෙනක යයි විචාළ කල්හි තමාගේ මානය [1] ඉවසාගත නොහී විදපියා තුබුණු මැණික හුය ඇව්ණියේත් එක් පණ්ඩිත කාමෙක් ද ? මැණික් සැට්ටවරු පවා නොවිදි ගල් විදපියා හුය අමුණන්නෝවේ ද ? තවත් ඉවසා වදාල මැනවැ යි කියා නැවැත් වීය.

විජාශන ප්‍රශනය නම් :-

එක් දවසක් ඔබම පරීක්‍ෂා කරන පිණිස රජ්ජුරුවන්ගේ මඟුල්ගොනු බොහෝ කොට උඳු කවා හං [2] කපා තෙල් නල්වා කසා නාවා මෙෂස් කියා යවන්නාහු තැගෙනහිරි යවමැදුම් ගම් වැස්සෝ ඉතා නුවණැත්තෝල. රජ්ජුරුවන්ගේ තෙලෙ මඟුල් ගොනු දූරි ඇතිව වදන පියලි බඩය, ඔහු වදවා වසු පස්සේ ලා එවත්ව යි එසේ නො එවූව දඟසක් දඩ යයි කියා යවූහ.

ගම්වැස්සෝ ඒ නොදන පණ්ඩිතයන් වහන්සේ විචාළහ. ඔබ සිතනසේක් මේ වූකලී උපායකින් ම විතිශචය කොට ගැල වෙත්මුත් කට හැකි දෙයෙක් නො වෙයි සිතා රජ්ජුරුවන් මැද යෙහි කියා බැණලන්ට සමත්වූ පුරුෂයකු ගෙන්වා ගෙන වදුරනසේක් එම්බල පින්වත් පුරුෂය ! තාගේ ඉසකේ මුදු පිට හෙලාගෙන බැගැපත්ව හඩ හඩා රජගෙයි මිදුලට ගොස් හඬන කල්හි තා හඬන්නහු දැක සෙස්සවුන් විචාළ කල කිසි වකුත් නො කියා ම හඬව. රජ්ජුරුවෝ ගෙන්වා විචාළෝ නම් එවිට කියන කල මාගේ පියාණන් වදන්ට විලි ලන්නේ අදින් සත් දවසය. වදාගත නොහෙති. උන්ට පිරිවහල් වුව මැනවැ යි කියාත්, නොහොත් වදපියන උපායක් හෝ වදාල මැනවැ යි කියව ඉදින් රජ්ජුරුවෝ කියන කල තෝ නන්දෙඩයිද? පිරිමින් දරුවන් වැදූ තෙනක් ඇද් ද? මේ තා කියන්නේ පෙර ඇසූවිරූ

---

1. අවිගුණ 2. අං

දෙයක් නොවෙයි කිවුනම් ස්වාමීනි! එසේ කල නැගෙනහිරි යවමැදුම්ගම ඇත්තෝ කෙසේ මගුල්ගොනු වදවද් දැයි කියා ලයි, උගන්වා යවූසේක.

එයින් ගොසින් කී පරිද්දෙන් මදකුත් නොවරදවා රජහු මැදයෙහි කිය. රජ්ජුරුවෝ මේ ප්‍රශ්න ප්‍රතිභාග[1] සිතුවෝ කවුරු දැයි විචාරා මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ විසිනැ යි අසා ඉතා සන්තෝෂයට පැමිණ සේනකය! පණ්ඩිතයන් ගෙන්නමෝ දැයි විචාළහ. කුමක් කියනසේක් ද ? ගොන් දරුවන් නො වදන තියාව උන් ම කිවමනා ද? ඒ ඇයි? නො දන්නෝ කවුරු ද? තවත් මදක් ඉවසුව මැනවැයි කියා ගිවිස්විය.

ඔදන ප්‍රශ්නය නම් :-

තවද එක් දවසක් ඔබම පරීක්ෂාකරන පිණිස කියා යවන් නාහු නැගෙනහිර යවමැදුම් ගම්වාසිහු ඉතා නුවණැත්තෝල. අෂ්ටාඞ්ගයෙන් සමන්විතවූ පැසිබතක් පිස එවත්වයි නොඑවුව දඩසක් දඩයයි කියා යවූහ. එහි අෂ්ටාඞ්ග නම්, නො සාල, නො පැන, නො බඳුන, නො උදුන, නො ගිනි ය, නො දර ය, නො ගැහැනි ය, නො පිරිමිය, නො මඟ ය යන මේ අෂ්ටාඞ්ග යයි දත යුතු. මේ බව ගම්වැස්සෝ නොදුන බෝධිසත්වයන් වහන්සේ අතින් විචාළහ.

ඔබ වදුරනසේක් නො සාලින්, නො සාලින් පිසන පැසිබත් උන්ට බැරිබවමුත් මට ඉතාපිළිවන් දෙයක. තෙපි හැම නො සිතව යි වදුරා නො සාල් නම් සුන්සාල, නො පැන නම් පිනිය, නො බඳුන නම් නො පිසූ බඳුන, නො උදුන නම් කණු උදුන, නො ගිනි නම් අමුතුව ගෑ ගිනිය, නො දර නම් පරඬලා ය, යන මෙසින් බත පිසවා බඳුනෙක ලා හස් ඔබා පණ්ඩකයකු අත නුවරට යන මාවත හැර පිටත කුඩා හසරකින් යවයි වදාළසේක. එපරිද්දෙන් ම බත ඉදිකරවා යවූහ. රජ්ජුරුවෝ අසා ඉතා ප්‍රසන්නව මේ කාගේ නුවණකින් වීදැයි විචාරා බෝධිසත්වයන් වහන්සේගේ උපදෙසයෙනැයි අසා සේනකය! පණ්ඩිතයන් ගෙන්නමෝ දැයි කිහ. ඒ ගුණමකුවා කියන්නේ මහරජ ! එයින් බැරිදෙයකැයි සිතුසේක්ද? මේ ලොව තමාට බැරිදෙයක් නම් කළ හැකිද ? තමන් මදක් ඉවසා වදාළ මැනවැයි නැවතීය.

---

1. කථානය

ඉක්බිති වාලුකා ප්‍රශ්නය නම් :-

ඒ මහතාණන් විමසන පිණිස කියා යවන්නාහු රජ්ජුරුවන් වහන්සේ හෝවිලි කෙළනා කැමතිසේක. පරණ වැලිබාන් හැම දිරා කැඩී ගියේය. යහපත් වැලියොතක් අඹරා එවත්ව යි, එසේ නො එවුව දහසක් දඩ යයි කියා යවූහ. ගම්වැස්සෝ ඒ නො දැන පණ්ඩිතයන් වහන්සේ විචාළහ. ඔබ වදාරනසේක් මෙයිත් උපායකින්ම විසඳිය යුතුයයි සිතා ගම්වැස්සන් අස්වසා රජ්ජුරුවන් මැදයෙහි කියන්ට බණන්ට දක්‍ෂවූ බුහුටි පුරුෂයක්හු කැඳවා යව. රජ්ජුරුවන්ට ගොස් කියන කල ස්වාමීනි! ගම් වැස්සෝ අඹරන වැලිබාණෙහි මහත කුඩා බව මේ යයි ප්‍රමාණ නො දැනෙන්නාහුය. පරණ වැලිබාතකින් වියතක්වත් සතර ගුලක් දිගවත් වැලිබාන් කොටක් ලබන්නා ඒ ප්‍රමාණ බලා වැලිබාතක් අඹරා ගෙනෙම්හයි කියවයි කියා වහා වැලිබාන් කොටක් දෙවුව මැනවැයි කියව.

ඒ අසා රජ්ජුරුවෝ මේ නම් කුමන බසෙක් ද ? අපගේ වැලිබාන් ඇත්තේ නැත. බැහැරින් වැලිබාන් ගෙන් වූ විරූ දුත් නැත. මේ තොප කියන්නේ පෙර ඇසූවිරූ දෙයෙක් නො වෙයි කියති. තොප කියන කල එසේ බැරි කටයුත්ත නැගෙන හිර යවමැදුම්ගම ඇත්තෝ කෙසේ කෙරෙද් දැයි කියව යනාදීන් උගන්වා යවූසේක. ඔහු ගොසින් එපවත් කී කල්හි ඒ අසා රජ්ජුරුවෝ ඉතා යහපත. මේ උපාය කාවිසින් දන්නා ලද්දේ දැයි විචාරා පණ්ඩිතයන් වහන්සේ විසිනැයි කී කල්හි ඉතා සතුටුව සෙනකය! පණ්ඩිතයන් ගෙන්නමෝ දැයි විචාරා ඒ ගුණමකු වූ ලාමක ස්වරූප ඇති සෙනකයා විසින් ස්වාමීනි! වැලිබාන් අඹරන්ට බැරි නියාව උන්ම කිවමනා ද? නුවණැත්තෝ නොපිළිවන් වැලිබාන් අඹරා එවුවමනා වේ ද? බැරිනදය බැරි යයි කීයේත් එක් පණ්ඩිත කමෙක් ද? තවත් ඉවසා වදාළ මැන වැයි කීය.

තලාක ප්‍රශ්නය නම් :-

නැවත එක්දවසක් ඔබම පරීක්‍ෂාකරන පිණිස කියා යවන් නාහු රජ්ජුරුවන් වහන්සේ දිය කෙළනා කැමතිසේක. පස් පියුමෙන් සැදි පොකුණක් එවන්වයි නොඑවුව නම් දහසක් දඩයයි කියා යවූහ. ගම්වැස්සෝ දැනගත නොහී පණ්ඩිතයන් වහන්සේ විචාළහ. ඔබ සිතනසේක් මෙයිත් ප්‍රශ්න ප්‍රතිභාගය කැයි සිතා වදාරා තමන් වහන්සේ වදාළ පරිද්දෙන් කියන්ට බණන්ට සමර්ථවූ පුරුෂයන් ගණනක් දෙනා කැඳවාලා කුඩා

වරිනි! තෙපි හැමදෙන දියෙහි කෙළ ඇස් රතුකොටගෙන තෙමුණු පිළී හා ඉසකේ ඇතිව[1] ඇඟ මඩ ගාගෙන වැල් බාන් දඬු මුගුරු ගත් අත් ඇතිව ගොස් රජ්ජුරුවන් වහන්සේට තොප සිටි නියාව කියා යවා ගෙන්වා විචාළ කල ස්වාමීනි! තුබවහන්සේ විසින් නැගෙනහිර යවමැද්දුම්ගම්වැස්සන්ට පොකුණක් එවන්ට කියා යවනලද. අපිත් තුබවහන්සේට ම තරම් වූ පස් පියුමෙන් සැදි අති මනොහරවූ පොකුණක් ගෙනාම්හ. ඒ පොකුණ බොහෝ දවසක් තමා වල විසූ හෙයින් මේ නුවර අගල පවුරු වාසල් ජනකොලාහල ආදිවූ තමා පෙර නුදුටු විරූ සියල්ලක් ම දැක හයපත්ව වැල් බාන් කඩාගෙන ගොස් තමා පළමු විසූ වලට ම පලාගියේ ය. අපි දඬු මුගුරු ගල්කැට ආදීන් ගසා නවතාගත නුහුනු වම්හ. තුබවහන්සේ පේර වලින් ගෙන් වූ පොකුණක් ලදමෝ නම් ඒ ගෙනගොස් එක්කොට ඈඳගෙන එම්හ යි කියව.

ඒ අසා රජ්ජුරුවන් විසින් තොපට කියන කල පෙර වලින් පොකුණක් ගෙන් වූ විරූත් නැත. එක්කොට ඈඳගෙන එන්ට පොකුණක් යවූ විරූත් නැතැ යි කිවූනම් එසේ කල නැගෙනහිර යවමැද්දුම්ගම වැස්සෝ එසේ නො පිළිවන් සාටයුත්තක් කෙසේනම් කෙරෙද් දැයි කියව යි උගන්වා යවූසේක. ඔහු ගොසින් කී පරිද්දෙන්ම රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ එපවත් අසා මේ කාවිසින් දන්නා ලද්දේ දැයි විචාරා පණ්ඩිතයන් වහන්සේ විසිනැ යි අසා මහත් සොම්නසට පැමිණ සෙනකය! පණ්ඩිතයන් ගෙන්නමෝ දැයි විචාරා ඒ ඉතා දුෂ්ට වූ අනාර්‍ය ස්වරූප ඇති සෙනක නම් ජඩයා විසින් පොකුණක් ගෙනා නො හැකි නියාව උන්ම කිවමනා ද ? උන් තබා නුවණැත්තන් වත් නො දන්නේ ද ? ඉවසා වදාළ මැනවැ යි කියා නැවැත්වීය.

උද්‍යාන ප්‍රශ්නය නම් :-

නැවත එක් දවසක් කියා යවන්නාහු අපගේ රජ්ජුරුවන් වහන්සේ උයන් කෙළි කෙළනා කැමැතිසේක. ඇති උයන් හැම පරණව ගියේය. නැගෙනහිර යවමැද්දුම්ගම් වැස්සෝ පලු පලලව කුසුමයෙන් සැදුනා වූ අලුත් යහපත් උයනක් එවත්ව යි එසේ නොඑවුව නම් දහසක් දඩයයි කියා යවූහ. එයිත් අසා ඒ ස්වාමිදරුවාණෝ ඉතා බැරි දෙයකැ යි නො සිතව. ගම් වැස්සන් අස්වසාලා පළමු කී පරිද්දෙන්ම ගණනක් දෙනා උගන්වා

1. ඉසකෙස් විද

පොකුණට පැමති කථා පරිද්දෙන් කියා යවූ කල්හි රජ්ජුරුවන් ඒ අසා ප්‍රීතීන් පිනාගොස් මේ කවුරුන් විසින් දන්නා ලද්දේ දැයි විචාරා පණ්ඩිතයන් වහන්සේ විසිනැයි අසා ඉතා ආශවයී වත්ව සේනකය! පණ්ඩිතයන් ගෙන්නමෝ දැයි විචාළ කල්හි සෙනකයා සිතන්නේ ඒ පණ්ඩිතයා සැබැවින් මෙයට ආයේ වීනම් අපි සතරදෙන හිරු නැඟිකල කද්‍යොපැණියන් නිෂ්ප්‍රභා වන්නාසේ වම්හ. ලාභයෙනුත් පිරිහෙම්හ. රජ්ජුරුවෝ අප ඇති නියාවත් නොදන්නාහයි තමාගේ ලොභ මාන ද්වෙෂ මොහ යෙන් තවත් මේ මූග්ධවූ රජු ගිවිස්වා ඔහු මෙයට නේනා විවරක් ම කෙරෙම්යි සිතා මහරජ! ශමපමණකින් ම පණ්ඩිතනම් නො වෙති. තවක් ඉවසා වදාළමැනවැයි කිය.

ඔහුගේ බස් අසා රජ්ජුරුවෝ සිතන්නාහු මහෞෂධ පණ්ඩිතයෝ දූරක ප්‍රශනයෙහි පටන් ගෙන දන් නමන් විමසන පිණිසම කියා යවනලද ප්‍රශ්න ප්‍රතිභාග ආදිවූ ඉතා දැඩිවූ ප්‍රශ්න මූළුල්ලම ලොවුතුරා බුදු කෙනෙකුන් පරිද්දෙන් කිසිවකත් නොපැකිල ශඞකාරහිතව මා සිත්ගෙන කිවූය. එසේවූ මධුර කථා ඇති අසමධුරවූ පණ්ඩිතයන් ගෙනෙන්ට බාධා කෙරෙයි. එබැවින් සෙනකයාගෙන් මට ප්‍රයෝජන කිම්ද ? පණ්ඩිතයන් ගෙනෙන්ට මම්ම යෙමි සිතා තමන්ගේ මහත්වූ රජ පෙරහරින් ඒ නියම්ගම් බලා නික්මුණාහ. රජ්ජුරුවන් නැඟී යන අසුගේ පය පැළිවලක් අස්සේ වැටී බිඳීගියේය. එතෙන සිට රජ්ජුරුවෝ නුවරට ගොසින් වන්හ. එවිට සෙනකයා මහා සොම්නසට පැමිණ රජ්ජුරුවන් සමීපයට ගොස් විචාරන්නේ පණ්ඩිතයන් ගෙනෙන්ට යවමැදුම්ගම් ගියේ[1] ඇද් දැයි කිය. එසේය සෙනකය! ගියම්හයි කිය. සවාමීනි! නුබවහන්සේට මා කෙසේ සිතුවත් මේ කලි මට අනර්ථකාරයායයි සිතනසේක් වේද ? තවත් ඉවසා වදාළ මැනවැයි කියව කියවා නො කීකරුව වහ වහා යන නුබ වහන්සේගේ මඟුලසුගේ පය පළමු ගමනේ ම බිඳිණ ඉදින් ඒ පණ්ඩිතයා මෙයට ආයේ විනම් වන්නාවූ අනර්ථය මෙතෙකැයි කියනුම කිම් දැයි කීය. එබසට රජ්ජුරුවෝ මුවින් නො බිණුහ.

නැවත එක් දවසක් සෙනකයා හා මන්ත්‍රණය කරන්නාවූ රජ්ජුරුවෝ කිමෙක් ද සේනකය! පණ්ඩිතයන් ගෙන්නමෝ දැයි කීහ. සේනකයා එබස් අසමින් ම තමාගේ අධික වූ මානය හා ද්වෙෂය ඉවසාගත නොහී දේවයන් වහන්ස! මාගේ බස් නො ගිවිස ඒ අනර්ථකාරයා මෙයට ගෙන්වන පසු නුබවහන්සේ

1, වැඩියේ

නො ගොස් දූතයකු අත මෙසේ කියා යවුව මැනව. පණ්ඩිතයෙනි; තොප සමීපයට එන්නාවූ අපගේ මහලුසුගේ පය බිඳිණ. එබැවින් අශ්වතරයකු හෝ එවව, නොහොත් ශ්‍රෙෂ්ඨතරයකු හෝ එවවයි කියා යවුව මැනව. මේ අපවිසින් කාටත් නොදැනෙන පරිද්දෙන් සඟවා කියනලද හස්න දැනගත්තුනම් අශ්වතරයකු එවන්නේ යයි කීවාට තුමූ එති. ශ්‍රෙෂ්ඨතරයකු එවන්නේ යයි කීවා දත්තුනම් පියාණන් එවති. එසේ කල්හි අපට එයින් එක් ප්‍රශ්නයෙක් වන්නේයයි කිය. ඔහු කීවාවූ යම් දෙයක්ම ගිවිස්නාවූ මුග්ධවූ රජ්ජුරුවෝ එයින් යහපතැයි ගිවිස සේනකයා කී පරිද්දෙන්ම කියා යවූහ.

ගද්‍රභ ප්‍රශ්නය නම් :-

ඒ මාගේ ප්‍රඥ සම්බුද්‍රයාණන්වහන්සේ ගියාවූ දූතයාගේ කථාව අසා සේනකයා හා රජ්ජුරුවන් කළ මන්ත්‍රණය තමන්වහන්සේගේ අභිමුඛයෙහි කී දෙයක් මෙන් දැන වදරා රජ්ජුරුවෝ මාත් මපියාණන්වහන්සේත් දක්නා කැමැත්තෝවනැයි[1] සිතා පියාණන්වහන්සේ ළඟට ගොස් වැඳලා පියාණන්වහන්ස! රජ්ජුරුවෝ මාත් නුබවහන්සේත් දක්නා කැමැත්තාහ. එබැවින් නුබවහන්සේ සිටුවරුන් දහස පිරිවරා පළමුව වැඩිය මැනව. වඩනාසේකුත් සිස් අතින් නො ගොස් අලුත් එලගිතෙල් පිරූ සඳුන් කරඬුවක් අල්වාගෙන ගොස් දීලා දුටුව[2] මැනව. රජ්ජුරුවෝ නුබවහන්සේ හා කථා කොට සිටාණෙනි! තොපට තරම් ආසනයක් බලා හිඳුවයි කියති. එවේලෙහි නුබවහන්සේට තරම් ආසනයක් බලා හුන මැනව. එසේ නුබවහන්සේ හුන් කල්හි මම එම්. රජ්ජුරුවෝ මා හාත් සිහිකටයුතු සුවදුක් දෙඩාලා පණ්ඩිතයෙනි! තොපට සුදුසු ආසනයක් බලා හිඳුව යි කියති. එවිට මම නුබවහන්සේගේ මුහුණ බලම්. මා බැලූ සලකුණෙන් හුනස්නෙන් නැඟීසිට පුත මහෞෂධ පණ්ඩිතයෙනි! මේ ආසනයෙහි හිඳුවයි කිවමැනව. අදත් මට එක් ප්‍රශ්නයෙක් මුදුන් පැමිණෙන්නේ යයි වදාළසේක.

ඒ අසා සිටාණෝ යහපතැයි ගිවිස- පුතණුවන්වහන්සේ කී පරිද්දෙන්ම ගොසින් තමන් සිටිබව රජ්ජුරුවන්ට කියා යවා එන්නට කියව යි කී කල්හි ගොසින් රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටියාහ. රජ්ජුරුවෝ සිහිකටයුතු කථාකොට සිටාණෙනි! තොපගේ පුතණුවෝ මහෞෂධ පණ්ඩිතයෝ කොයි දැයි විචාළහ.

---

1. කැමැතිසේකැයි 2. දුව 3. සැරසී

මහරජ! පස්සේ එමින් සිටියෝ යයි කීහ. ඒ කියන බසින් සතුටුවූවා වූ රජ්ජුරුවෝ සිටාණෙනි! තොපට තරම් ආසනයක් බලා හිඳුව යි කීහ. සිටාණෝ ද තරම් ආසනයක් බලා එකත් පස්ව හුන්හ.

ඉක්බිති ජනානන්දකර වූ තිලෝගුරු බෝධිසත්ත්වයන් වහන්සේ ද සුවඳ පැන් සොළොස් කළයකින් ඉස් සෝධා නහා සර්වාභරණයෙන් විභූෂිතව[1] එසේ ම සැරහී ආවා වූ කුමාරවරුන් දහස හා අවශේෂ වූ බොහෝ ජනයන් විසින් පිරිවරන ලදුව උතුම් මඞ්ගල අශ්වයන් සතර දෙනකු යොදා රන් ධජ නඟා විසිතුරු කොට සරහා නිමවන ලද මඞ්ගල්‍ය රථ වාහනයෙක්හි හිඳ ගෙන මහ පෙරහරින් නුවරට වදනාසේක් පවුර පිටත සිටි කොටළුවක්හු දැක ජවසම්පන්න පුරුෂයන් කිප දෙනකු කැඳවා තෙලෙ කොටළුවා ලුහු බඳවා අල්වාගෙන ඔහු බැඳගන බැණ නො නැඟෙන පරිද්දෙන් නො මියන ලෙස මුඛය බැඳලා අනුන්ට නො පෙනෙන ලෙස යමකින් වසාලා කර තබාගෙන එව යි වදළ සේක. නියෝග ලත් පුරුෂයෝ ද එලෙස ම කළහ. බෝධිසත්ත්වයන් වහන්සේ ද උපමා නැත්තා වූ නොයෙක් ශ්‍රී විලාසයෙන් ගොස් නුවරට වන්සේක.

එවේලෙහි ඒ සා මහත් සත් යොදුන් මියුලු නුවර සඳරැස් වන් කිරිමුහුද සේ ශෝභාවත් ව ගියේ ය. එවේලෙහි ඒ ස්වාමි දරුවන් දුටුවා වූ නුවරවාසී බොහෝ ජනයෝ එකහෙලා මෙසේ කියත්ලු. ශ්‍රී වර්ධන සිටාණන් වහන්සේගේ පුතණුවන්දෑ මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ නම් මූන්වහන්සේ ද? උපදනා දවස් බෙහෙත් ගැටයක් අල්වාගෙන උපන්සේකුත් මූන් වහන්සේ ද? උපන් ඇසිල්ලෙහි මැණියන් වහන්සේ හා කථා කළසේකුත් මූන්වහන්සේ ද? සෙනකයා ආදි වූ පණ්ඩිතවරුන් සතරදෙනා හා රජ්ජුරුවන් ඇතුළු වූවවුන් දැන ගත නො හැකි පරිද්දෙන් කියා යවන ලද ප්‍රශ්න හා ප්‍රශ්න ප්‍රතිභාග ආදි වූ සියල්ලක් ම අනුන් විසින් නො දැක නො අසා කිය නො හැකි දෙය ඇසූ දුටු දෙයක් මෙන් ස්වයම්භූඥතයෙන් . සිතාගෙන අවකිත ව නො පැකිල ශඞ්කා රහිත ව ලොවුතුරා බුදු කෙනකුත් පරිද්දෙන් විසඳා වදාළසේකුත් මූන්වහන්සේ ම දැයි යනාදීන් ස්තුති ඝෝෂා හා ආශීර්වාද කෙරෙමින් බලන්නාවුන්ගෙන් ඇසිපියක් මරාලුවෝ කවුරු ද? අනික් දසාවක් බැලූවෝ කවුරු ද? අනික් සිතක් සිතූවෝ කවුරු ද? අනික් බසක් ඇසූවෝ කවුරු ද?

1. සැරසී

මේ මහතාණන් තව තවත් වඩ වඩා බලාපියන පරිද්දෙන් නාළලත් ඇසක් මැවී නො ගියේ යයි නො සිතුවෝ කවුරු දයි නො කිව යි නො සිතමි.

තවද ඒ මිථුලු නුවර වාසී වූ බොහෝ ජනයන් සත් ඇවිරිදි වූ ඒ ස්වාමිදරුවාණන්ගේ ශ්‍රී මුඛය හා රූපශ්‍රී බලන පිණිස ඒ දසාවට තමන්ගේ නෙත්‍ර සමූහයන් යොමු කළ ලෙස කුමක් වැනි ද යත්? ඒ මහෞෂධ බුද්ධාඞ්කුරයාණන් වහන්සේ යටගිය දවස දීපඞ්කර නම් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාද මූලයෙහිදී විවරණ ලත් තැන් පටන් සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි පාරමිතා පුරනකල ඇස් ඉල්වා ආවාඩු යාචකයන්ට නිලුපුල් පෙති පරදවන්නාවූ පස් පැ දිස්නා ඇස් උපුටා ආකාශයෙහි තරු පරයා දන් දුන්සේක.

තවද ලොවුතුරා බුදුව අනන්තාපරිමාණ සක්වළ අයත්න යෙන් බලා වදාරන දිවැස් ලබන්ට පූර්ව නිමිත්ත පානාසේ එදා ඒ මිථුලු නුවරවාසී වූ ස්ත්‍රී පුරුෂයන්ගේ තුෂාර බින්දුයෙන් ආර්ද්‍ර වූ නිලුපුල් පෙතිසේ සන්තොෂ බාෂ්පධාරායෙන් ගැවසී ගත්තා වූ නෙත්‍ර සමූහයන් එදවස් තමන්වහන්සේ කරා හයා ගත්හ යි සිතමි. තවද ඒ බලන්නවුන්ගේ නෙත්‍ර සමූහයෙහි නීල කාන්තිය ඒ මහතාණන් වහන්සේගේ ස්වර්ණ ප්‍රතිබිම්බයක් හා සමාන වූ රන්වන් ශ්‍රී ශරීර ශොභාව නිල් පැහැව ගියාදෝහෝයි සැක නො කටයුතු ය.

ඊට කාරණ කිම් ද යත් :-

ලොව එකට පැතිරී සිටිනා වූ ඉතා කළු වූ මහත් ඝනාන්ධ කාරය පවා සරාගී වූ දිව්‍යපුත්‍රයා වසන සූර්‍යමණ්ඩලයෙහි ආලෝක යෙන් ඒ අන්ධකාරය දුරුවන කල ඒ මාගේ ස්වාමිදරුවාණන් වහන්සේගේ ප්‍රඥා නැමැති සූර්‍යමණ්ඩලයෙහි ආලෝකයෙන් ඒ නෙත්‍රයෙහි නීලකාන්තිය දුරුව ගියේ යයි දතයුතු යි.

මතු තමන්වහන්සේගේ ප්‍රඥා ආලෝකයෙන් අනන්තා පරිමාණ සක්වළ සත්වයන්ගේ මොහ නමැති අන්ධකාරය දුරුකරන ඒ මහතාණන්ගේ ශරීරාලොකයෙන් ඒ නුවර එකාලොක කෙරෙමින් ගොස් රජගෙට පැමිණ රථයෙන් බැස ආ නියාව කියා යවා මපුතණුවන්ට වහා එන්ට කියව යි කී කල්හි කුමාරවරුන් දහස පිරිවරා මාලිගාවට නැගී රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටිසේක. රජ්ජුරුවෝ බෝධිසත්වයන්වහන්සේ දැක බුද්දක ප්‍රීතිය, ඛණික ප්‍රීතිය, ඔක්කන්තික ප්‍රීතිය, ඵරණ ප්‍රීතිය, උද්වෙග

ප්‍රීතිය යන පස්වනක් ප්‍රීතීන් පිනාගොස් මිහුරු වූ කථාකොට පණ්ඩිතයෙනි, තොපට තරම් ආසනයක් බලා දැන හිඳුවයි කීහ. එවිට බොධිසත්ත්වයන් වහන්සේ පියාණන්ගේ මුහුණ බැලූසේක. ඒ සලකුණෙන් සිටාණෝ හුනස්නෙන් නැඟී සිට පණ්ඩිතයෙනි; මේ ආසනයෙහි හිඳුවයි කීහ. ඒ මහතාණන් ගොසින් පියාණන් දෑ හුන් ආසනයෙහි උන් කල්හි ඒ දුටුවා වූ සෙනකය, පුක්කුසය, කාවින්දය, දෙවින්දය යන පණ්ඩිතවරු සතරදෙන ආදී වූ අතිකුත් උන්සේ ම අඥාන ජඩයෝ බොහෝදෙන අතින් අත්ද, අත් උරෙහි ද ඇලයෙහි අත් පැහැර මහත්කොට සිනාසී අසව කොල! මේ නුවණ නැති අඥබාල තැනැත්තහු පණ්ඩිත යයි කියති. ඒ තෙමෙ දූත් පියා හුන් අස්නෙන් නඟාසිටුවා තෙමේ පියා හුන් අස්නේ හුන්නේ ය. මෙසේ වූ ජඩයන් පණ්ඩිත යයි කීම අයුතැයි යයි තිසරු කළහ. ඒ දැක රජ්ජුරුවෝ දුර්මුඛ වූහ.

පරසිත් දන්නා නුවණැති පණ්ඩිතයන් වහන්සේ කිමෙක් ද මහරජ, දුර්මුඛසේක්නැ යි වදාළසේක. එසේ ය පණ්ඩිතයෙනි, සිතට සතුටෙක් නො වී ය. පළමු තොපගේ බස ඇසීම ඉතා මිහිර, දැක් ම නො මිහිරි යයි කීහ. මහරජ, නො සතුටුවූයේ කුමක් පිණිස දැයි වදාළසේක. පියාණන් හුනස්නෙන් නඟා ඒ අස්නේ උන්නෝනැ යි කීහ. කිමෙක් ද? මහරජ, හැම තන්හි ම පුතුන්ට පියෝ උත්තමයෝ යයි සිතනසේක් දැයි වදාළසේක. එසේවේ ද පණ්ඩිතයෙනි කීහ.

ඉක්බිති බොධිසත්ත්වයන් වහන්සේ වදාරනසේක්, නුබ වහන්සේ විසින් මට අශ්වතරයකු හෝ ශ්‍රෙෂ්ඨතරයකු හෝ එවන්නේ යයි හස්නෙක් යවන ලද්දේ වේ දැයි හුනස්නෙන් පැන නැඟී සිට තොප ගෙනා කොටළුවා ගෙනෙව් යි ගෙන්වාගෙන රජ්ජුරුවන් පාමුල හොවාලා මහරජ, මේ කොටළුවා කෙතෙක් වටී දැයි විචාළසේක. පණ්ඩිතයෙනි! ඉදින් උපකාර වශයෙන් දෙතහොත් අටමස්සක් වටනේ යයි කීහ. එවිට වදාරනසේක් එසේ ද මහරජ, මේ කොටළුවා නිසා වෙළඹ බඩ පිළිසිඳගත් ආජානීයා සෙන්ධවයා කෙතෙක් වටී දැයි විචාළසේක. ඇයි පණ්ඩිතයෙනි, අනඝීවේ දැයි කීහ. මහරජ, එසේ නො වදාළ මැනවැ යි කියා වදාරනසේක් පුතුන්ට පියෝ උත්තමයෝ යයි දැන්ම කියන ලද. ඉදින් නුබවහන්සේගේ වාදයෙහි පුතුන්ට පියෝ උත්තමයෝ නම් පුත් වූ සෙන්ධවයාට මේ කොටළුවා වැඩි සිටිය මනාවේ ද, කිමෙක් ද? නුබවහන්සේගේ පණ්ඩිතවරු මෙපමණක් පවා නො දැන ඇලයෙහි අත් පැහැර කට කට දත්

නියාංගත සෙන සේ දන්නා බව මුත් මෙපමණකුත් නො දන්නාහ. ආ! හා! නුබවහන්සේගේ පණ්ඩිතවරුන්ගේ ප්‍රඥා විශෙෂයන් ඉතා ආශ්චර්‍ය්‍යයි කියා ය. මේ ප්‍රඥා සමුද්‍රයාණන් සතරදෙනා දියෙහි ගොඩෙහි අත් ගා කෙසේ ලත්සේක් දැයි කියා පණ්ඩිතවරුන් එවිට ම නිඃශොභා කොට රජ්ජුරුවන්ට වදාරනසේක් හැම තෙනම පුතුන්ට පියෝ උතුම් වෙත් නම් අශ්වතරයාට කොටළුවා වැඩිසිටිය මැනව. එසේ නැති ව පියා අට මස්සක් වටිති සි කියාත් ඔහට ද පුතු අනඝී යයි කීම ඉතා අයුක්ති යයි වදරා

හංසි තුවං එවං මඤ්ඤසි සෙය්‍යො - පුත්තෙන පිතාති රාජසෙට්ඨ හඤ්දස්සතරස්ස තෙ අයං - අස්සතරස්ස හි ගද්‍රභො පිතාති.

නැවත කියනසේක් ඉදින් පුතුන්ට පියෝ උත්තම නම් මපියාණන් රඳවා ගත මැනව. පියන්ට පුත්‍රයෝ වඩිත් නම් මා රඳවාගත මැනවැ යි වදළසේක. ඒ අසා රජ්ජුරුවෝ ඉතා බලවත් සන්තොෂයට පැමිණියාහ. සියලු රජපිරිස පණ්ඩිතයන් වහන්සේ කී නියා ඉතා යහපතැ යි සාධුකාර දෙන්නාහු කොල් වර හඩ ගසමින් අසුරුසන් දෙමින් පිළිහිණ සිසාරමින් කොලාහල කොරෙමින් මහා සන්තොෂයට පැමිණියාහ. පණ්ඩිත වරු සතරදෙන මාගේ ස්වාමිදරුවාණන්ගේ ප්‍රඥා නමැති සූර්‍ය්‍යයා තෙජසින් මලාගිය ඇඹුල මල් සේ ඉතා නිෂ්ප්‍රභා වූහ.

තවද එකෙක් ඇත.- දෙමවුපියන්ගේ ගුණ දන්නාවුන්ගෙන් මාගේ ස්වාමිදරුවාණන්ට වඩා දන්නා කෙනෙක් නැත. එසේ දැන දැනත් මෙවැන්නක් කුමක් පිණිස කළසේක් ද යත්? පියාණන්වහන්සේට අනාදරයක් පිණිස නො වෙයි.. පළමු රජ්ජුරුවන් යවන හස්නෙක අශ්වතරයකුවත් ශ්‍රෙෂ්ඨතරයකුවත් එවන්නෝ යයි උන් තමන් විසින් ම දැනගත නො හැකි ලෙස සඟවා කියන ලද ප්‍රශ්නය තමන්වහන්සේ හා සමාන අනික් පණ්ඩිත රත්නයක් මේ එක සක්වළ තබා දසදහසක් සක්වළ දෙව් මිනිසුන් කෙරෙහිත් නැති නියාවත් "අපි අපි ම පණ්ඩිත යම්හ" යි බැහැවෙන සෙනකයා ආදී වූ පණ්ඩිතවරුන් සතර දෙනා නිඃශොභා කරන පිණිසත් මෙසේ කළසේකැ යි දතයුතු.

මේ ගද්‍රභ ප්‍රශ්නයෙහි අති ප්‍රසන්න වූ රජ්ජුරුවෝ සුවඳ පැනින් පිරූ ස්වර්ණභිඞ්කාරය ගෙන්වාගෙන අනු සිටුවරුන් දහස හා සෙසු බොහෝ රාජපුරුෂයන් ආදි වූ සියල්ලෝ ම තොපට සේවය කෙරෙත්ව යි කියා තොප හුන් නැගෙනහිරි

යවමැදුම්ගම මෙවක් පටන් රාජභොගයෙන් අනුභව කරව යි කියා සිටාණන් අත පැන් වත්කොට පමුණු කොට දුන්හ.

බොධිසත්ත්වයන් වහන්සේගේ මෑණියන්දෑට බිසෝ පළඳනා ආදිවූ සියලු ආභරණ යවූහ. ඉක්බිති රජ්ජුරුවෝ බොධිසත්ත්වයන්දෑ තමන්ට පුත් කොට ගන්නා පිණිස කියන්නාහු සිටාණෙනි! මහෞෂධ පණ්ඩිතයන් මට පුත්කොට දෙව යි කීහ. සිටාණෝ කියන්නාහු ස්වාමීනි! ඉතා බාලවූව අද දක්වා මුඛයෙන් කිරි සුවඳ වහනය කරයි. වැඩි ගත් කල නුබවහන්සේ සමීප යෙහි රඳන්නෝ වේදැ යි කීහ. එබසට රජ්ජුරුවෝ කියන්නාහු මා ගුණෙන් කි හෙයින් තෙපි මට උත්තර කියවූ ද? සිටාණෙනි, මෙවක් පටන් තෙපි මූ මාගේ පුතණු කෙනෙකැයි නොසිතව. අදවක් පටන් මූ මාගේ පුතණුවෝය. මම මාගේ පුතණුවන් රැකගන්ට පොහොසත්මි. තෙපි යව යි කියා සමු දුන්හ.

එවේලෙහි සිටාණෝ රජ්ජුරුවන් වැඳ පුතණුවන් සිප ගෙන ලෙහි වතුරුවා ගෙන ඉස සිඹ සනහා රජගෙයි වසන් නවුන් විසින් රැ දෙවෙහි අප්‍රමාදව විසිය යුතු යයි අවවාද දුන්හ. බොධිසත්ත්වයන් වහන්සේ ද පියාණන්දෑ වැඳ 'රජගෙයි වැසගුන් නා වූ උපදෙශය මට වඩා දන්නෝ නැත. නුබවහන්සේ නො සිතා වැඩිය මැනවැ යි පියාණන්දෑට අවවාද දී යවූසේක.

සිටාණන් ගිය ඉක්බිති රජ්ජුරුවෝ කියන්නාහු පුත, ඇතුළු ගෙයිදී බත් කව් ද? නොහොත් පිටතදී බත් කව් දැයි විචාළහ. මාගේ පරිවාර ජනයෝ බෙහෙව, එබැවින් පිටතදී බත් කැම යහපතැ යි සිතා මහරජ! පිටතදී කාමි වදාළසේක. රජ්ජුරුවෝ ඔබට තරම් මාලිගාවක් දෙවා කුමාරවරුන් දහස ඇතුළු වූ සියල්ලවුන්ට ම මෙ නම් දෙයකින් අඩුවෙක් ඇතැයි නො කියන පරිද්දෙන් බත් වැටුප් ආදි වූ සියල්ලෙන් ම කිසිවකුත් අඩු නො කොට දෙවූහ. එවක් පටන් බොධිසත්ත්වයන් වහන්සේ රජ්ජුරුවන්ට සේවය කරනසේක. රජ්ජුරුවෝත් ඔබ විමසනු කැමැත්තාහ.

මණි ප්‍රශනය නම් :-

එසමයෙහි එනුවරට දකුණුදිග නුදුරු තෙනක පොකුණෙක්හි මියර පිට සිටි තල් ගසෙක්හි කවුඩු කැදැල්ලෙක අනඝ වූ මාණික්‍ය රත්නයෙක් වූයේ ය. ඒ මැණික ඡායාව පොකුණේ දියෙන් පෙනෙන්නේ ය. පොකුණේ දියෙහි මැණිකක් පෙනෙ යි. කියා රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ සේනකයා [illegible] කැඳවා

සේනකය, පොකුණේ දියෙහි මැණිකක් පෙනේල. කෙසේ ගනුමෝද්ද යි විචාළහ. මහරජ! ඒ හැයි, මහා ආශ්චර්‍යයෙක් ද? දිය ඉස්වා පියා ඇරගනුම්හ යි කීය. එසේ වී නම් තෝම ගොසින් එලෙස කරවා ගෙනෙව යි කියා ඔහු ම යවූහ. ඒ පැන නැඟී ගොස් බොහෝදෙනා රැස්කරවා දිය ඉස්වා කලල් මඩ හරවා බිම කනවාත් මැණික නුදුටුයේ ය. නැවත පොකුණේ දිය පිරෙත්නාහා ම ඡායාව පෙනෙන්නේ ය. දෙවනුවත් දිය පිටත ඉස්වා බිම බිඳුවාත් මැණික නුදුටුයේ ම ය.

ඒ බව රජ්ජුරුවෝ අසා බොධිසත්වයන් වහන්සේ කැඳවා පණ්ඩිතයෙනි! පොකුණේ මැණිකක් පෙනේල. සේනකයා ඒ මැණික ගන්නා පිණිස බොහෝදෙනා ලවා දිය ඉස්වා කලල් හරවා බිම බිදුවාත් මැණික නුදුටුයේ ම ය. නැවත පොකුණේ දිය පිරුණු කල මැණික පෙනෙන්නේ ය. පුත, තෙපි ඒ හැරදී ලන්ට පොහොසතුද්ද යි විචාළහ. මහරජ, ඉතා බැරි දෙයෙක් නො වෙයි. හැර දී ලිය හැක්කැ යි වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ ඉතා සතුටුව අද මපුතණුවන්ගේ ප්‍රඥානුභාවය බලමී, සිතා බොහෝදෙනා විසින් පිරිවරන ලදුව පොකුණට ගොස් මියර පිට සිටියාහ.

මහතාණෝ ඡායාව බැලූසේක් ම මේ මැණික වූකලි පොකුණේ දියෙහි නැත. මියර පිට සිටී තල්ගස විය යුතුය යි සිතා වදාරා දේවයන් වහන්ස, දියෙහි මැණිකෙක් නැත. දියෙන් පෙනෙන්නේ ඡායාව පමණක්ම යයි වදාළසේක. කුමක් කියව් ද? තෙලෙ පෙනෙන්නේ මැණික වේද්ද යි කී කල්හි. එසේ නො ගිවිස්නා බැවින් තලියක් ගෙන්වුව මැනවැ යි ගෙන්වා පැන් පුරා දිය පිට තබාලා බැලුව මැනව. පොකුණේ පෙනෙන් නා වූ ඡායාව දැන් තලියෙහි පැනෙහිත් පෙනෙන්නේ ය. එබැවින් දියෙහි ආලෝකය මුත් යම් මැණිකෙක් නැතැ යි වදාළසේක. එසේ කල පණ්ඩිතයෙනි, මැණික කොයිද්ද යි කීහ. මහරජ, පොකුණේ දියෙන් හා තලියෙහි පැනින් මැණික ආලෝකයම පෙනෙන්නේ ය. එබැවින් දියෙහි ආලෝකය මුත් මැණික වූකලි තෙලෙ තල්ගස කපුටු කැදැල්ලෙක විය යුතු යයි මිනිසකු නංවා බාවා ගත මැනවැ යි වදාළසේක.

රජ්ජුරුවෝ එක් පුරුෂයකු නංවා මැණික බැවූහ. ඒ පුරුෂයා මැණික බොධිසත්වයන් වහන්සේට දින. රජහුගේ ප්‍රතාපය මෙන් දීප්තිමත් වූ මාණික්‍ය රත්නය පණ්ඩිතයන්වහන්සේ ඇරගෙන රජ්ජුරුවන් අත තුබූසේක. එතැන්හි රැස් වූ බොහෝ

ජනයෝ මහතාණන්ට සාධුකාර දහස් ගණන් පවත්වා සේනක යාට නින්දා බණන්නාහු මෙසේ කියත්ලු. හෝ! හෝ! කොල, අසව, අසව, සේනකයාගේ ප්‍රඥා විශෙෂයක් ඉතා නො සිතිය හැකි තියා ය. මැණික තල්ගස තිබියදී බලසම්පන්න පුරුෂයන් ලවා පොකුණ සාණවා ඇවිද්දී. අනේ! මේ සෙනකයා නම් කට යුතු නො දන්නා ජඩයෙක් ම වන. නුවණැති පණ්ඩිතවරුන් නම් මහෞෂධ පණ්ඩිත ස්වාමීන්ගේ වුව මැනව. ජඩයන් නම් සේනකයා සේ වුව මැනවැ යි ඔහු ලජ්ජාවන පරිද්දෙන් තරව නින්දා පරිභව බිණූහ. බොධිසත්වයන් වහන්සේට මුඛ නො සෑහෙන පරිද්දෙන් සතුති කළාහ.

රජ්ජුරුවෝ ද පස්වනක් ප්‍රීතීන් පිනා ගොස් තමන් කර තුබූ ලක්‍ෂයක් වටනා මුත්හරය ගලවා බොධිසත්වයන් වහන්සේ කර පළඳවා කුමාරවරුන් දහසට ද දහසක් මුතුපට දෙවූහ. එදා පටන් බොධිසත්වයන් වහන්සේට හා පිරිවරට කවර වේලක වත් රජගෙයි රැකවල් නැතැ යි අනුදත්හ.

ඝකණ්ටක ප්‍රශ්නය නම් :-

නැවත එක් දවසක් රජ්ජුරුවෝ පණ්ඩිතයන් වහන්සේ හා සමග උයනට නික්මුණාහ. එසමයෙහි එක් කටුස්සෙක් තොරණ අග වසන්නේ එන්නා වූ රජ්ජුරුවන් දැක තොරණින් බැස බිම වැද හොත්තේ ය. රජ්ජුරුවෝ ඔහුගේ මේ ක්‍රියාව බලා පණ්ඩිතයෙනි, මේ කටුස්සා කරන්නේ කිම්දැ යි විචාළහ.

නායං පුරෙ උන්නමති තොරණග්ගෙ කකණ්ටකො
මහොසධ! විජානාහි කෙන ථද්ධො කකණ්ටකොති.

මහරජ, නුබවහන්සේට සේවය කෙරෙයි වදාළසේක. එසේ කල මට සේවය කරන්නවුන් නිෂ්ඵලවීම සුදුසු නො වෙ යි. ඔහට තරම් සම්පත් දෙව යි කීහ. මහරජ, ලැබේ නම් කාපියන දෙයක් විනා භොගයෙන් ඔහට කම් නැත යි වදාළසේක. එසේ කල කුමක් කා දැයි කීහ. දඹමස් කයි වදාළසේක. කෙතෙක් දුනහොත් යහපත් දැයි කීහ. රත්රන් කිප වියවෙක මස් ඇතැ යි වදාළසේක. රජ්ජුරුවෝ එක් පුරුෂයකු කැඳවා දරුව, මෙවක් පටන් තෙලෙ කටුස්සාට රජදරුවන්ගෙන් දෙන වෘත්තියක් මඳ කොට දීම සුදුසු නො වෙ යි. දවස් පතා මදටක් පමණ රත්රන් දී දඹමස් ගෙන දෙව යි නියොග කළාහ. යහප තැ යි ගිවිස එවක් පටන් දඹමස් ගෙන දෙන්නේ ය. එක් පොහෝ දවසක් මස් නො ලදින් එම අඩ මාසකය විද හුයකින් අවුනා ඔහු කර බැඳපි ය. ඒ කටුස්සාට තමා කර බැඳි රත්රන් සුග

නිසා මෙසේ වූ මානයෙක් උපන. එදවස ම රජ්ජුරුවෝ උයනට නික්මුණාහ. එන්නා වූ රජ්ජුරුවන් දැක කටුස්සා මෙසේ සිතාලූ.

කෙසේ ද යත් ?

තමාට උපන් අධික වූ මානය ඉවසාගත නොහී වේදේහයෙනි, තෙපි මහා ධන ඇත්තෙම් සිතව් ද? එසේ නො සිතව. තෙපිත් තොප පමණ ධන ඇත්තව. මමත් මා පමණ ධන ඇත්තෙමි කියා ඒ රජ්ජුරුවන්නේ අයම් විතරින් අටවිසි ගවුවක් පමණ දිව්‍ය පුරයක් වැනි ඒ සා නුවරක් හා එසේ ම අයම් විතරින් එක්දහස් දෙසියයක් ගවු පමණ දිග පළල ඇති, වස්ත්‍රාභරණ අන්නපානයෙන් සමෘද්ධ වූ ඒ සා මහත් ජනපදයක නායක වූ රජ්ජුරුවන් තමා හා ධනයෙන් සමකොට සිතී ය.

ඒ එසේමැ යි. මේ සම්පත් නම්, තිකෘෂ්ට වූ තිරිසනුන් පවා මානයට පමුණුවන්නේ මිනිසුන්ට වූකලී කෙසේ නම් මානයට නො පමුණුවා ද? එබැවින් නුවණැත්තවුන් විසින් මෙලෙස මන් වඩා අනර්ථයට පමුණුවන්නා වූ සැපතක් ලත් විගස ම ඒ නිසා වන්නා වූ අනර්ථයෙන් දුරුව පරලොවට අභිවෘද්ධි දායක වූ තුනුරුවන් විෂයෙහි පරිත්‍යාග කටයුතු.

මෙසේ කටුස්සා රජ්ජුරුවන් හා තමා හා ධනයෙන් සම යෙම් සරිකොට සිතන්නේ පෙරසේ ම බිමට නො බැස වඩ වඩා තොරණ මුදුනට නැඟී ඉස සල සලා වැදහොත්තේය. රජ්ජුරුවෝ ඔහුගේ මේ ක්‍රියාව දැක පණ්ඩිතයෙනි, මේ තෙමෙ පෙරසේ ම බිමට නො බැස තොරණ මුදුනේ හෙව ඉස සලන්නේ ය. තෙපි ඊට කාරණා දනුදූ යි විචාළහ. පරසිත් දන්නා නුවණැති පණ්ඩිතයන් වහන්සේ ඒ ක්ෂණයෙහි සිතනසේක් පොහෝ දවස් මස් නො ලත් රාජපුරුෂයා විසින් කර බඳනා ලද අඩ මාසකය නිසා ඔහට මානයක් උපන් සැටියයි නියමකොට[1] වදාරන සේක.

අලද්ධපුබ්බං ලද්ධාන අඩ්ඪ මාසං කකණ්ටකො
අතිමඤ්ඤති රාජානං වෙදෙහං මිථිලග්ගහන්ති

යන මේ ගාථාවෙන් මහරජ! පෙර තමා නො ලත් විරූ අඩ මාසකයක් පමණ වස්තුව නිසා මෙසා මහත් මිථුලු නුවර ගේ කොට වසන්නා වූ නුබවහන්සේ හා තමා හා ධනයෙන් සම කොට සිතා බිමට නො බටැ යි වදාළසේක. රජ්ජුරුවෝ ඒ නම් කුමන බසෙක් දැයි නො ගිවිස පළමු තමන් විධානයෙන් මස්

1. සිතා

ගෙන ලන පුරුෂයා ගෙන්වා විචාළහ. ඒ පුරුෂයාත් බෝධිසත්ත්වයන් වහන්සේ වදාළ ලෙස ම නොවරදවා ඇති සැටියේ ම කිය.

රජ්ජුරුවෝ සිතන්නාහු කිසිකෙනකුන් අතින් නො විචාරා මේ සියල්ල ම ස්වයම්භූඥානයෙන් පරෝපදෙශ රහිතව අතැඹුලු සේ දන්නා වූ ලොවුතුරා බුදුකෙනකුන් විසින් දන්නාසේ මේ තිරිසන් කටුස්සාගේ අදහස් වූ පරිද්දෙන් පණ්ඩිතයන් විසින් මනාකොට දන්නාලද්ද යි පස්වනක් ප්‍රීතීන් පිනාගොස් ඉතා සතුටු සිත් ඇති රජ්ජුරුවෝ මෙවක් පටන් මේ සත් යොදුන් මියුලු නුවර සතර වාසලින් නිමවන සුංකම් මපුතණුවන් මහෞෂධ පණ්ඩිතයන්ට දිනිමි කියා දෙවූහ. කටුස්සාට කිපී වියදම් කඩන්ට වන්හ. ස්වාමිදරුවාණෝ එසේ නො කොට හැක්කැ යි පෙර පරිද්දෙන් ම දෙව යි සම්මත කරවූසේක.

සිරි කාලකණ්ණි ප්‍රශනය නම්:-

තවද එම මියුලු නුවර පිඬුපාතර නම් මානවකයෙක් ගන්ධාර දෙශයෙහි තක්ෂලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි ශිල්ප උගන්නේ නොබෝ කලකින් සියලු ශිල්පයෙහි නිෂ්පත්තියට පැමිණ ගුරුන්ට ශිල්ප දක්වා තමාගේ රට[1] යෙමි කීය. ඒ ආචාරීන්ගේ ශාස්ත්‍රයෙහි මෙසේ වූ බැවහාරයකුත් ඇත්තේ ය. කෙසේ ද යත්? උන්ගේ කුලයෙහි වැඩිවයසට පැමිණ හිඳිනා තරම් දුවක් ඇද් ද, ශිෂ්‍යයන් මුළුල්ලට පළමු ශිල්ප ඉගෙන නිම වූ වැඩිමාලු ශිෂ්‍යයෙකුත් ඇද් ද, එසේ වූ ශිෂ්‍යයාට ඒ දුව සරණ දෙන්නේය යි බැවහාර ය. එබැවින් ඒ ආචාරීන්ගේ එවකට සරණ ඉඳිනා තරම් දුවක් සිවුසැටක් පමණ සත්‍රීලක්ෂණයෙන් හොබනී ය. රූපශ්‍රීන් විරාජමාන වූ දිව්‍යාඞ්ගනාවකා හා සමාන ය. එබඳු වූ මාගේ දුව සරණ දෙමි. පාවාගෙන යවයි කීහ. නුවණැතිව ශිල්ප උගත් බවක් මුත් ඒ තෙමෙ පින් මඳ කාලකණ්ණියෙක. ඒ කුමාරිකා නම් එසේ මෙසේ එකක් නොවෙයි. සොළොස් දහසක් බිසෝවරුන්ට නායක රජක්හට අගමෙහෙසුන් වන මහා පිනැත්තී ය. එබැවින් කුමාරිකාව කෙරෙහි ඔහුගේ සිත නො ඇලෙන්නේ ය. එසේ තමා නො කැමැති වුවත් ගුරුන්ගේ බස් නො ගිවිසීම නපුරු යි සිතා යහපතැ යි ගිවිස්සේ ය.

"මිගුලටම තරමැ"යි[2] යන පරිද්දෙන් අතිමනෝහර කොට ගෙයක් සරහා දුවණියන් පාවා දුන්හ. සරහා නිමවන ලද

---

1. නුවරට. 2. සුදුසුය යි.

ශ්‍රියහන් මදුනේ පිඬගුත්තරයා වැදහොත්තේ ය. දිව්‍යප්සරාවකගේ මෙන් ඉතා ශෝභමාන වූ ඒ කුමාරිකාව සැරහීගෙන අවුත් තමා වැදහොත් යහන් මුදුනෙහි හිඳිනා කා ම ක්‍ෂත්‍රිය කන්‍යාවක දුටුවා වූ චණ්ඩාලයකු මෙන් තතත තතතා යහතින් බැස බිම හොත්තේ ය. නැවත ඒ කුමාරිකාව සිතන්නී සරණ පාවා දුන් දවස් මෙයින් එක් බැව්හාරයෙක් වතැ යි යහතින් බැස ඔහු සමීපයට ගියා ය. ඒ නැවත කෙඳිරි ගාගෙන[1] නැඟී සිට යහනට නැංගේ ය. නැවත කුමාරිකාව යහනට නැඟි කල්හි පිඬගුත්තරයා පින් ඔද කාලකණ්ණී තැනැත්තී මා වැදහොත් වැදහොත් තැනට ම එන්නීය යි වහ වහා යහතින් බැස බල්ලකු සේ කෙඳිරි ගගා පෙරලි පෙරලී බිම නිදී ය. කුමාරිකාවෝ යහන් මුදුනෙහි ම නිදූහ.

ඒ එසේමැ යි, කාලකණ්ණියා හා ශ්‍රී කාන්තාව එක තෙනෙක්හි නො වෙසෙ යි, යනු සබාම ය. මේ ලෙසින් ම සත් දවසක් එහි දුක සේ ම දවස් යවා ගුරුන් වැඳ සමුගෙන අඹුව කැඳවාගෙන නික්මිණ. මෙසේ යන්නවුන් දෙන්නාගේ අතර මඟ ඔවුනොවුන් හා අල්ලාප සල්ලාප කථා මාත්‍රයකුත් එක විටකත් නො විම ය. තමා හා කැටිව එනසේය යි සිත සිතා ගොස් මියුලු නුවර සමීපයට පැමිණ නුවරට නුදුරු තෙනක යහපත්ව පල ගත් එක් දිඹුල් රුකක් දැක පිඬගුත්තරයා සයින් පීඩිතවූයේ ගසට නැඟී දිඹුල් කන්නට වන. ඒ කුමාරිකා ද සයින් ඉතා පීඩිත වූ තැනැත්තී ගස මුලට ගොස් මටත් දිඹුල් දෙව් යි කිව. අනේ! අනේ! පුරුෂයකුගේ ලෙහි ගුණ ලවයක් නැති නියා ය. මෙබඳු වූ රූපශ්‍රීන් යුක්ත වූ බාල සත්‍රියක ක්‍ෂුධාව ඉවසිය නොහී ලජ්ජා ශූන්‍යව ඉල්ලුවාටත්, තමා නිසා මෙසේ කතර ආ නියාවටත්, තමාගේ ගුරුන්ගේ දුව නිසාත්, තමා නො කැමති වුවත් ඉන් දිඹුල් කීපයක් එලා නො පියා කිසි දයා සිතක් නැතිව රූක්‍ෂ වූ බස් කියන්නේ කිමෙක් ද, තොපගේ අතපය නැද් ද? අපසේ ම නෙපිත් දිඹුල් කඩාගෙන කව යි කිය.

ඒ අසා ක්‍ෂුධාව බලවත් හෙයින් ඉවසිය නොහී ගැනුන්ට ගස් නැඟීම් නො තරමැ යි, යන්නාක් ම නො සිතා බිම් මුල අතු විහිද නැහෙන්ට ඉතා සුව ලද වූ ගස හෙයින් කුමාරිකා ගසට නැඟී දිඹුල් කන්නට වන. පිඬගුත්තරයා උන් ගසට නැඟි බව දැන තෙමෙ තමා කන දිඹුල් තබා වහ වහා ගසින් බැස අතින්

1. ගගා.

හා දතින් කඩා ගස වට කොට කටු ගසා කාලකණ්ණිය කෙරෙන් මිදී ගිය සේ ඉතා යහපතැ යි සිතා මහා සන්තොෂයෙන් මත් ව පලා ගියේ ය. කුමාරිකා ගසින් බට නොහී ඉඳුනිල්මිණි කරඬුවෙක්හි ලා තුබූ ජාතිරඞ්ගමාණික්‍යයක් මෙන් නිල් වූ කොළ තුරෙහි අත්තක් පිට උන්නී ය.

ඉක්බිති රජ්ජුරුවෝ එදවස් දිවාභාගයෙහි උයන් කෙළපියා සවස් වේලෙහි ඇතුපිටින් නුවරට වදනාහු නිල් වූ වලාකුළක් අස්සෙන් පෙනී ගිය පූර්ණ චන්ද්‍රමණ්ඩලය පරිද්දෙන් රූපශ්‍රීන් විරාජමාන වූ බබලන්නා වූ කුමාරිකාව දිඹුල්ගස උන්නිය දැක පිළිබඳ වූ අදහසින් සස්වාමික දේ හෝ අස්වාමික දේ හෝ යි විචාරා යවූහ. ගියවුන්ට කුමාරිකා කියන්නී මාගේ දෙමවු පියන් පාවා දුන් එක් පුරුෂයෙක් ඇත. ඒ මා නො කැමැති ව මේ ගස හිඳුවා මුල කටු ගසා තිරාලයව මා හැරපියා පලා ගියේ ය යි කිව. විචාරා යවා රජ්ජුරුවෝ මෙසේ සිතත්ලූ. කන උණුදිය වත් කළා සේ සස්වාමික යෙමි කියා දෝ හෝ නො හොත් කන මි වත්කළා සේ අස්වාමික යෙමි කියා දෝ හෝ යි, සුළඟින් ලෙලෙන ලද පල්ලවයක් මෙන් කම්පමානවූල. රජ්ජුරුවෝ අස්වාමික යනු අසා පස්වනක් ප්‍රීතීන් පිනා ගොස් අස්වාමික බඩුවෙක් නම් රජහට පැමිණෙන්නේ ය යි ගසින් ඇතු පිටට බාවාගෙන ගොස් අභිෂෙකයට පමුණුවා සොළොස් දහසක් බිසෝවරුන්ට නායක කොට අගමෙහෙසුන් කළහ.

එවක් පටන් ඒ බිසවු රජහට ඉතා ප්‍රියව සිත්සේ වසන්නාහ. දිඹුල් ගසදී දුටු හෙයින් "උදුම්බරා දේවී ය" යි නම් තුබූහ. නැවත එක් දවසක් රජ්ජුරුවන් උයන් කෙළියට යන පිණිස නුවර වාසීන් නුවර සරහන කල්හි පිඞ්ගුත්තරයා ඒ මියුලුනුවර ගෙයක බැළමෙහෙ කොට ජීවත්වන්නේ අමුඩක් ගොතා ගෙන උදැල්ලකින් මඟ සස්නේ ය. ඔහු තමාට නියම කළ තැන් සැස නො නිමනතෙක් රජ්ජුරුවෝ උදුම්බරා දේවීන් හා සමඟ රථයකින් නික්මුණාහ. උදුම්බරාදේවී පිඞ්ගුත්තර නම් කාලකණ්ණියා දැක මෙබඳු වූ රූපශ්‍රීන් විරාජමාන වූ අනඝ වූ ස්ත්‍රීරත්නයක් දරාගන්ට අසමර්ථ වූ පින් මඳ කාලකණ්ණියා ය යි ඔහු බලාපියා සිපීහ. රජ්ජුරුවෝ සෙන්නා වූ බිසවුන් දැක කුමක් නිසා සිපී දැයි විචාළහ: ස්වාමීනි! තෙලෙ මහ සස්නා පුරුෂයා නම් මාගේ මවුපියන් විසින් පාවා දෙන ලද පරණ සමණෝ ය. තුලු මා දිඹුල් ගස හිඳුවා මුල කටු ගසා ගියෝ ය. මම ඔහු දැක මෙබඳු වූ ශ්‍රී කාන්තාවක ධරා ගත නුහුනු කාලකණ්ණියා ය යි සිතා සිපිමි යි කිවා ය. රජ්ජුරුවෝ නී කියන්නේ

බොරුය. අතික් කිසිවක් දූනය තී සුණේ ය යි, එබැවින් තී මරමියි කියා කඩුව අතට ගත්හ. කිසවු මරණ භයින් තැති ගෙන සවාමීනි! එසේ වී නම් පණ්ඩිතවරුන් විචාළ මැනවැ යි කීහ. රජ්ජුරුවෝ ඒ අසා සෙනකයා විචාරන්නාහු මාගේ බස් තෙපි අදහව්දැ යි කීහ. සෙනක නම් වූ බමුණු මහලු කියන්නේ මහරජ! මං එක විටෙකත් අදහන්නේ ම නැත. කවර නම් ඇස් ඇති පුරුෂයෙක් මෙබඳු වූ ස්ත්‍රියක් හැරපියා යේද? කියේ බොරුම ය යි කීය. ඔහුගේ බස් අසා කිසෝ අතිශයින් ම භය පත්වූහ. ඉක්බිති රජ්ජුරුවෝ සිතන්නාහු මේ සෙනකයා කුමක් දනී ද? මපුතණුවන් මහෞෂධ පණ්ඩිතයන් විචාරමි සිතා

ඉත්ථි සියා රූපවතී සා ච සීලවතී සියා
පුරිසො තං න ඉච්ඡෙය්‍ය සද්දහාසි මහොසධා'ති.

පුත මහෞෂධ පණ්ඩිතයෙනි! යම් ස්ත්‍රියක් ආචාර ශීලයෙන් හා රූපයෙන් අසමාන ද, ඒ එසේ වූ ස්ත්‍රියක පුරුෂයෙක් නො කැමතිවේ ද ඒ තෙපි අදහව්දැ යි විචාළහ.

සරණාගත වජ්‍රපඤ්ජර වූ සකල ජනානන්දකර වූ මාගේ සවාමි දරු වූ තිලෝගුරු බෝධිසත්ත්වයන් වහන්සේ වදාරනසේක්

සද්දහාමි මහාරාජ! පුරිසො දුබ්භගො සියා
සිරි ච කාලකණ්ණි ච න සමෙන්ති කුදාචනන්ති.

යන මේ ගාථාවෙන් මහරජ! ඒ එසේම ය. පුරුෂයා පින් මඳ කාලකණ්ණියෙක් නම් ස්ත්‍රිය මහාපිනැති එකක් වූ නම් කාලකණ්ණියා හා ශ්‍රී කාන්තාව හා එක්ව නො වසන්නාය. යම්සේ සමුද්‍රයෙහි මෙතෙරට එතෙර සේ ද අහසට පොළොව සේ ද ඔවුනොවුන් ඇසිනුත් නො දක්නාහ. ඒ මම අදහමි යයි වදාළ සේක.

මෙසේ සිතට නංවා බොධිසත්ත්වයන් වහන්සේ කාරණා සහිත කොට කියා ගිවිස් වූ කල්හි රජ්ජුරුවෝ සිත උපන් ක්‍රොධය සංසිඳුවා ඉතා සතුටුව කියන්නාහු පණ්ඩිතයෙනි! ඉදින් තෙපි මෙතැන්හි නැත්නම් අද මම අඥාන වූ ඉතා මුළු වූ කාරණාකාරණ නො දන්නා වූ සෙනකයාගේ බස් ගිවිස මරා මෙබඳු රූපශ්‍රීන් යුක්ත වූ ස්ත්‍රීරත්නයක් නො ලබමි. දැන් තොප නිසා ය මූන් මා ලද්දේ ය යි සතුටුව ලක්‍ෂයකින් නො අඩු කොට පූජා කළහ.

ඉක්බිති කිසවූ රජ්ජුරුවන් වැද ස්වාමීනි! මා ජීවිතය ලද්දේ පණ්ඩිතයන් නිසා ය. එබැවින් උන් මට මල් තනතුරෙහි තබා දක්නා පරිද්දෙන් වරයක් ලදින් නම් යහපතැ යි වර ඉල්වූහ. යහපත දෙවීනි! මෙවක් පටන් මේ මහෞෂධ පණ්ඩිතයෝ තොපගේ මලණුවෝ ය යි වර දුන්හ. තවද මෙවක් පටන් මාගේ මලණුවන් හැර මධුර රසයක් අනුභව නො කරමි. වේලේ වත් නො වේලේ වත් දොර හරවා යවනලද කිසිවකටත් රැකවල් නැතැ යි වරයක් ලබනු කැමැත්තෙමි කීහ. යහපත සොඳුර! ඒ වරයත් ගන්ව යි කියා දුන්හ.

එළක ප්‍රශනය නම් :-

නැවත එක් දවසක් පෙරවරු දහවල් මේ තිමවා[1] මතු මාලේ තඹයෙහි සක්මන් කරන්නා වූ රජ්ජුරුවෝ බස්නාහිර සිවුමැදුරු කවුළුව හැර පිටත බලන්නාහු එළුවකු හා බල්ලකු හා මිත්‍රව ගෙන වසන්නාවුන් දුටුහ. හේ කෙසේ ද යත්? ඇත්හල බොහෝ දවසක් තණ කා වැඩි එක් එළුවෙක් එක් දවසක් ඇතුන් ඉදිරියෙහි ලූ තණ කන්නට වන. ඒ දැක ඇත්ගොව්වෝ මරා නෙර පීහ. ඔහු ඒ පහර කා හඩාගෙන යන්නාහු අනිකෙක් වහා දිව ගෙන ගොස් පිට අවුරා දණ්ඩකින් ගැසීය. ඒ එළුවා තෙමෙ පිට නමාගෙන කටින් ගත් තණ දමාපියා වෙදනාව ඉවසා ගත නොහී ගොසින් රජගෙයි මහාභිත්තිය නිසා පිට පදනම වැද හොත්තේ ය.

එදවසේ ම රජ්ජුරුවන්ගේ මහ මුළුතැන්ගෙයි ඇට මස් ආදි වූ සියල්ලක් ම කුකුරුපරායෙහි පටන් කා වැඩි බලු තෙමෙ අරක්කැමියා රාජ භොජනය පිස වසුන් කොට තබාලා ඇඟ ගිම් නිවා ඩා සංහිඳුවා ගන්නා පිණිස ගෙන් පිටත්ව සිටි කල්හි මච්ඡමාංසයෙහි සුගන්ධය ඉවසා ගත නොහී බලු දරු සෙමෙන් ගෙට වැද වලන් වැසු[2] පියන දමා පියා වස්න හෙලාපියා මාංස කන්නට වන. අරක්කැමියා වලන් හුනු ශබ්දය අසා ගෙට වැද බල්ලා දැක දොර පියාගෙන දඬුමුගුරු ආදියෙන් සිත් වූ පරිද්දෙන් තලන්ට[3] වන. ඒ බලු තෙමෙ කෑ මස් කටින් වමාරා මහ හඬින් හඬමින් නික්මිණ. ඔහු යන්නාහු දැක ලුහු බඳවා ගෙන ගොස් පිට අවුරා දණ්ඩකින් තරයේ පහරක් ගැසී ය. ඒ බලු පිට නම නමා එක් පයක් ඔසවාගෙන තුන් පයින් දිවගෙන ගොස් එළුවා වැදහොත් පිලට ම ගියේ ය.

---

1. පෙරවරු බත් කා. 2. වසුන්. 3. මරන්ට.

එසේ ආ බල්ලාට එළුවා කියන්නේ සබඳ! කිමෙක් ද? පිට නම නමා කෙඳිරි ගගා එව. හැයි? තොපට පිට- රුජාවෙක් පහරී දැ යි කිය. ඒ අසා බලු කියන්නේ තෙපිත් පිට නමාගෙන කෙඳිරි ගාව. තොපටත් රුජාවෙක් පහරී දැ යි කිය. මෙසේ විචාළ බල්ලාට එළුවා කියන්නේ තමා ඇත්හලට තණ කන්ට ගොසින් තරවා බැට ලදින් ආ නියාව ඇති සැටියේ ම නො වලහා කිය. එවිට බලුත් මුළුතැන් ගෙට මාංස කන්නට ගොසින් තමන් ගෙඩි බැට කෑ නියාව ඇති සැටියේ ම නො වලහා කිය. ඉක්බිති බල්ලාට එළුවා කියන්නේ ඒ වන්නාට, යාළුව නැවත මුළුතැන් ගේ බලා යන්ට රුචි ඇද්ද නැද්දැ යි කිය. තෝ කුමක් කියයි ද? ගියෙම් නම් මාගේ ජීවිතය නැත්තේ වේදැ යි කිය. නැවත බලු කියන්නේ තෙපිත් ඇත්හලට යාහෙව්දැ යි කිය. එයිත් කියන්නේ කුමක් කියව් ද? ඒ දසාවට නො යෙම්ම ය. ඉදින් ගියෙම් නම් මාගේ පණ නැත්තේ වේදැ යි කිය.

මෙසේ ඔහු දෙදෙන වැලිත් කෙසේ ජීවත්වමෝ දෝ හෝ යි සිතන්නාහු, ඉක්බිති එළුවා කියන්නේ ඉදින් අපි දෙදෙන සමඟ ව වසමෝ නම් රැකෙන උපායෙක් ඇතැ යි කිය. එසේ වී නම් කියව යි කී කල්හි සබඳ! තෙපි මෙවක් පටන් ඇත්හලට යව. බල්ලන් තණ නො කන හෙයින් ඇත්ගොව්වෝ තොප කෙරෙහි සැක නො කරන්නාහ. එබැවින් තෙපි මට තණ ගෙනෙව. මම මුළුතැන් ගෙට යෙමි. මා දඬමස් නො කන හෙයින් අරක්කැමියෝ මා කෙරෙහි සැක නැත්තාහ. මම තට දඬමස් ගෙනෙමි කිය. කොල! එයිත් එක් උපායකැ යි දෙන්නාම ගිවිස බලු තෙමෙ ඇත්හලට ගොස් තණ කැරැල්ලක් ඩැහැ ගෙන අවුත් පිල තබාල යි. එළුවා මුළුතැන් ගෙට ගොස් මුඛය පුරා දඬමස් කැටියක් ගෙනවුත් පිල තබාල යි. බලු තෙමේ මස් කන්නේ ය. එළුවා තණ කන්නේ ය මෙසේ ඔහු දෙදෙන එක්සිත්ව ඔවුනොවුන්ට ප්‍රිය ව මහා හිතනිය නිසා පිට පදනම වසන්නාහ.

රජ්ජුරුවෝ මුත් දෙන්නාගේ මිත්‍ර ධර්මය දැක මෙසේ සිතූහ. පෙර නුදුටුවිරූ දෙයක් මා දුටුයේ ය. මොහු ඔවුනොවුන්ට පස මිතුරුව හෙවත් සතුරුව සත් පියවරක් ළඟ නො වන දෙදෙන මෙසේ සමඟව වෙසෙති. මේ කාරණය පැනයක් කොට පණ්ඩිතවරුන් විචාරමි. නො දත් කෙනකුන් මාගේ රටින් නෙරපියමි. දත් කෙනකුන්ට මෙබඳු පණ්ඩිතයෝ

---

1. ඝුඝු-නැඝු.

නැතැ යි යහපත් කොට සංග්‍රහ කෙරෙමි යි සිතා අද මේ නො වේලා ය. සෙට උදෑසන ම සේවයට ආ කල විචාරමි සිතා දෙවන දවස් පණ්ඩිතවරුන් අවුත් උන් කල්හි විචාරන්නාහු මේ ගාථාවෙන් කීහ.

යෙසං න කදාචි භූතබ්බං සක්ඛිං
සත්තපදම්පි ඉමස්මිං ලොකෙ
ජාතා අමිත්තා දුවෙ සහායා
පටිසන්ධාය චරන්ති කිස්ස හෙතු'ති

පණ්ඩිතවරුනි! මේ මා කියන්නා වූ ප්‍රශ්න පෙර කිසි කලෙක ත් ඇසූ විරූ දෙයෙක් නො වෙයි. යමත් පිරිසෙකින් සත් පිය වරකුත් ඔවුනොවුන් පස්සෙහි නො යන තරම් වෛරී වූ සතුරෝ දෙන්නෙක් දැන් මේ සමයෙහි යහළුව ගෙන ඇවිදිනාහ. තෙපි ඈම උන් දෙන්නා කවුරුනැ යි සිතව් ද?[1] තත් වූ පරිද්දෙන් මට කියව යි කීහ. මෙසේ ද කියා නැවත මේ ගාථාවෙන් කියන්නාහු

යදි මෙ අජ්ජ පාතරාසකාලෙ-
පඤ්හං න සක්කුණෙථ වත්තුමෙතං
පබ්බජයිස්සාමි වො සබ්බෙ
න හි මත්ථො දුප්පඤ්ඤජාතිකෙහි'ති.

අද පෙරවරු බතට පළමු මේ ප්‍රශ්නය සිතාගෙන මට නො කිවු නම් නුවණ නැත්තා වූ තොප පස්දෙනා ම රටින් නෙරමී කීහ.

එවේලෙහි සේනකයා මුල් අස්නෙහි හුන්නේ ය. මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ කෙළවර ආසනයෙහි හුන්සේක් ප්‍රශ්නය සිතා අර්ථය නො දැක මෙසේ සිතූසේකි. මේ රජ්ජුරුවෝ දන්ධ ධාතුකයෝ ය. ඉතා මුග්ධයෝ ය. එසේ හෙයින් මේ ප්‍රශ්නය සිතාගෙන කියාලන්ට අසමර්ථයෝ ය. මේ රජ්ජුරුවන් විසින් එකාන්තයෙන් ම දුටු දෙයෙක් වුව මැනව. ඉදින් එක දවසකට අවකාශ ලදින් නම් මේ ප්‍රශ්නය කියාලමි. සෙනකයා යම් කිසි උපදෙශයකින් අද එක දවසකට රජ්ජුරුවන් ඉවසන පරිද්දෙන් කෙළේ වී නම් යහපතැ යි සිතූසේක. සෙනකාදි සතරදෙන අඳුරු ගැබකට වන්නවුන් සේ කිසිවකුත් නුදුටුවාහ. එවිට[2] සෙනකයා සිතන්නේ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ පුවත් කිම් දෝ හෝ යි බැලී ය. බෝධිසත්ත්වයන් වහන්සේ ද සෙනකයා

1. දසද 2. එබැවින්

මුහුණ බැලූසේක. ඒ සෙනකයා තමා මුහුණ බැලූ බැල්මෙන් ම මහතාණන්ගේ අභිප්‍රාය දැන ගෙන පණ්ඩිතයන්ටත් නො දැනුනේ වන. එබැවින් එක දවසකට අවසර ඉල්වා දෙනු කැමැත්තාහ. උන්ගේ මනදෙළ පුරම් සිතා රජ්ජුරුවන් හා සමඟ සමාධිව මහත් කොට සිපියා සැබැද? මහරජ! මේ ප්‍රශ්නය කියන්ට නුහුනුවොත් අප ඇම රටින් නෙරනාසේක් ද? එසේ ද? තමා මෙයින් අපට එක් ප්‍රශ්නයක් දූ යි සිතූ සේක් ද? අපි වන්නා මේ ප්‍රශ්නය කියමෝම ය. එතෙකුදු වුවත් ඉතා ගැටමුසු පැනයෙක. බොහෝදෙනා මැදයෙහි වහා සිතා කියාලිය හැක්කේ නො වෙ යි. තනි ව එක්තෙනෙක්හි හිඳ සිතාලා නුඹවහන්සේට ම කියාලම්හ යි බොධිසත්ත්වයන් වහන්සේ අරභයා අවකාශ ඉල්ලන්නේ මේ ගාථා කීය.

මහාජනසමාගමම්හි ඝොරෙ ජන-කොලාහල සමාගමම්හි ජාතෙ
විකඛිත්තමනා අනෙකචිත්තා-පඤ්හං න සක්කුණොම වත්තුමෙතං
එකග්ගචිත්තා එකමෙකා-රහසිගතා අත්ථං නිචින්තයිත්වා
පවිවෙකෙ සම්මසිත්වාන ධීරා-අථ වක්ඛන්ති ජනින්ද අත්ථමෙත'න්ති

දෙපා ඇත්තවුන්ට නායක වූ ජනප්‍රධාන වූ රාජශ්‍රෙෂ්ඨයාණන් වහන්ස! බොහෝ දෙනා රැස්ව කොලාහල කරන කල්හි වික්ෂිප්ත වූ සිත් ඇති අපට ප්‍රශ්නය සිතා කියාලන්ට නො පිළිවන. එබැවින් තනිව විවේකස්ථානයේ හිඳ අර්ථය සිතාලා මහපොළොව සේ නුවණැති පණ්ඩිතවරු කියාලති කියා ව්‍යාජයෙන් දවසකට අවසර ඉල්වීය.

රජ්ජුරුවෝ සෙනකයාගේ බස් අසා යහපත මනාකොට සිතාගෙන කියාලව. නො කිවු නම් රටින් නෙරපියම් කියා තරව භය ගැන්වූහ. පණ්ඩිතවරුන් සතරදෙනා මාලිගාවෙන් බට කල්හි සෙනකයා ගෙවලට යන්නවුන් තුන්දෙනාට කියන්නේ කුඩාවරුනි! රජ්ජුරුවන් විසින් දැනගත නො හැකි ඉතා සූක්ෂ්ම වූ ගැටමුසු පැනයක් විචාරන ලද. නො කිවහොත් ඉතා මහත් වූ භය උපදනේ ය. එබැවින් සුවසේ බත් අනුභව කොට යහපත් කොට ප්‍රශ්නය සිතව යි කියා තම තමන්ගේ ගෙවලට ම ගියාහ. බොධිසත්ත්වයන් වහන්සේ හුනස්නෙන් නැඟී සිට උදුම්බරා දෙවීන් සමීපයට ගොස් දෙවීන් වහන්ස! අදවත් ඊයේවත් රජ්ජුරුවන් වහන්සේ කොතෙනෙක කල්යවා සිටිසේක් දූ යි විචාළසේක. මලණ්ඩ! මතු මහලේ බස්නාහිර සිවුමැදුරු කවුළුව සමීපයෙහි පිටත බල බලා කල්යවා තඹයේ සක්මන් කළසේකැ යි කීහ. එබස් අසමින් ම සිතනසේක් රජ්ජුරුවන්

විසින් ඒ දසාවෙහි දුටු දෙයක් ම වුවමැනවැ යි සිතා උඩුමහලට නැඟී පිටත බැලූසේක් එළුවා හා බල්ලා හා දෙන්නාගේ මේ ක්‍රියාව දැක රජ්ජුරුවන් ප්‍රශ්නයක් කොට විචාළේ මේ වනැ යි සනිටුහන් කොට තමන් වහන්සේගේ ගෙට වැඩිසේක.

ඉක්බිති පුක්කුසය, කාවින්දය, දෙවින්දය යන පණ්ඩිතවරු තුන් දෙන කිසිවකුත් සිතාගත නොහී සෙනකයා සමීපයට ගියාහ. ඒ ගිය තුන්දෙනාට සෙනකයා කියන්නේ තොප ඇමදෙනා විසින් ප්‍රශ්නයේ අර්ථය දන්නාලද්දේ දැ යි කීය. ආචාරීනි! නො දන්නම්හ යි කීහ. එසේ කල රජ්ජුරුවෝ තොප රටින් නෙරත් නම් කුමක් කරමෝ දැ යි කීහ. වන්නාට! අපි වන්නා නො දන්නම්හ. නුබවහන්සේ දුටුසේක් දැ යි කීහ. මමත් නුදුටිමි කීය. නුබවහන්සේ පවා නුදුටු කල අපි කෙසේ නම් දතුමෝ දැ යි කීහ. රජ්ජුරුවන් සමීපයෙහිදී සිතාලා කියාලම්හ. මෙසින් අපට එක් ප්‍රශ්නයෙක් දැ යි සිංහනාද කොට ආම්හ. නො කී කල්හි රජ්ජුරුවෝ කිපී අප රටින් නෙරනාහ. කුම් කරමෝ දැ? අපට දැනෙන ප්‍රශ්නයෙක් නො වෙයි. සිතා කියන්නාහු මහෞෂධ පණ්ඩිතයන් විසින් මේ ප්‍රශ්නය ශතසහස්‍ර ගුණයෙන් සිතා නිමවනු ලැබෙයි. ගම්යට මතු නො හිඳ උන් සමීපයට යම්හ යි සතරදෙනම ගොසින් තමන් සිටි බව කියා යවා එන්නට කීයව යි කීකල්හි මාලිගාවට වැද සිහි කටයුතු සුවදුක් දොඩා එකත්පස්ව සිට මහනාණන් අතින් විචාරන්නාහු කිමෙක් දැ? නුබවහන්සේ විසින් ප්‍රශ්නය සිතන ලද්දේ දැ යි කීහ. හැයි? මා නො සිතන කල අනික් කවරෙක් සිතා දැ? එසේ ය සිතීම් යි වදාළසේක. එසේ වීනම් අපටත් වදාළ මැනවැ යි කීහ.

පරහිත නිරත වූ මාගේ ස්වාමිදරුවාණෝ සිතනසේක් ඉදින් මම මුන්ට ප්‍රශ්නය නො කියෙම් වී නම් රජ්ජුරුවෝ මුන් සතර දෙන රටින් නෙරනාහ. මට වූ කලි සත්රුවනින් පුදන්නාහ. එබැවින් මේ අඥාන වූ ජඩයෝ නො නසිත්ව යි මුන්ට කියම් සිතා තමන්වහන්සේගේ ප්‍රඥා නමැති සූර්‍ය තෙජසින් ඇකිලගිය ඇඹුල මල් සතරක් පරිද්දෙන් දෙහොත් මුදුනේ තබා වැඳ වැඳ සතරදෙන නීචාසනයෙහි උන් කල්හි රජ්ජුරුවන් දුටු නියාව නො හඟවා රජ්ජුරුවන් විචාළ කල්හි මෙසේ කියව යි සතර දෙනාට ගාථා සතරක් බැඳ පාළිය පමණක් උගන්වා යවූසේක.

ඔහු දෙවන දවස් රාජසේවයට ගොසින් රජ්ජුරුවන් වැඳ පනවනලද අසුන්වල උන්හ. එවිට රජ්ජුරුවෝ සෙනකයා විචාරන්නාහු සෙනකය! ප්‍රශ්නය දනී දැ යි විචාළහ. මා නො

දන්නා කල අතික් කවුරු දතිද් දැ යි කීය. එසේ වී නම් කියව යි රජ්ජුරුවන් කීකල්හි මහරජ! ඇසුව මැනවැ යි කියා තමා උගත් පරිද්දෙන් ගාථාව පමණක් කීය.

උග්ගපුත්ත රාජපුත්තියානං, උරබ්භමංසං පියං මනාපං
න තෙ සුනඛස්ස අදෙන්ති මංසං, අථ මෙණ්ඩස්ස
සුණෙන සඛ්‍යමස්සා'ති.

මේ ගාථාවෙහි අභිප්‍රාය නම්, ප්‍රධාන පුත්‍රයන් හා රාජපුත්‍රයන්ට එළුවන්ගේ මාංස ප්‍රියවන්නේ ය. මහදෙළ වඩන්නේ ය. බල්ලන්ගේ මස් එසේ නො වන්නේ ය. එතෙකුදු වුවත් එළුවා හා බල්ලා හා මිත්‍ර බවෙක් විය යනු මෙහි අර්ථයි.

එබැවින් සෙනකයා තමා උගත්තෙන් ගාථාව කීය. අර්ථ විචාලෝතින් කිසිවකුත් නො දන්නේ ය. රජ්ජුරුවෝ තමන් දුටු දෙය හෙයින් එළුවාය, බල්ලා යැ යි කී බසින් දැනපීවනැ යි සිතූ බව මුත් බොධිසත්ත්වයන්ද අතින් උගත් නියාව නො දනිති සිතියයුතු.

රජ්ජුරුවෝ සෙනකයා වන්නා දත. පුක්කුසය! තොපිත් දනී දැ යි විචාළහ. පුක්කුසයා පැන නැඟී හැයි? මහරජ? මම පණ්ඩිතයෙකිම් නො වෙම් දැ යි, තමා බොධිසත්ත්වයන් අතින් උගත් ගාථාව පිරිවා හෙළාපී ය.

චම්මං විහනන්ති එළකස්ස, අස්සපිට්ඨත්ථරණා සුඛස්ස හෙතු
න තෙ සුනඛස්ස අත්ථරන්ති, අථ මෙණ්ඩස්ස සුණෙන
සඛ්‍යමස්සාති

මේ ගාථායෙහි අභිප්‍රාය නම් අසුන් පිට හිඳිනාහු සුවපහස් එලවන පිණිස එළුසම් අතුරන්නාහ. බලුසම් එසේ අතුරන්නෝ නො වෙති. [1] එසේ වුවත් එළුවා හා බල්ලා හා මිත්‍ර බවෙක් විය. යනු මෙහි අභිප්‍රාය යි.

පුක්කුසයාත් තමා උගත්තෝ[2] ගාථාව මුත් අර්ථ නො දන්නේ ය. රජ්ජුරුවෝ තමන් ප්‍රත්‍යක්ෂකොට දුටුදෙය හෙයින් එළුවා ය, බල්ලාය කීමෙන් ම මෙපිත් දැනගත්වනැ යි සිතා කාවින්දයා විචාළහ. හැයි ? මහරජ! මම කාට එලඹියෙම් දැ යි[3] කියා බොධිසත්ත්වයන් වහන්සේ අතින් උගත් පරිද්දෙන් ගාථාව කීය.

1. අතුරන්නා නොවෙයි 2. උගත්තෙන්. 3. එලඹියෙම් දැ යි.

ආවෙල්ලිත සිඞ්ගිකො හි මෙණ්ඩො, න සුනඛස්ස විසාණානි අත්ථි
තිණභක්ඛො මංසභොජනො ච, අථ මෙණ්ඩස්ස සුනෙඛන
සඛ්‍යමස්සා'ති.

මේ ගාථායෙහි අභිප්‍රාය නම්, එළුවන්ගේ ඇඹරී කරක වී තිබෙන්නා වූ අං ඇත්තේ ය. බල්ලන්ගේ අං නමාම නැත්තේ ය. එළුවා තණ කන්නේය. බලු තෙමෙ මාංස කන්නේය. එසේ වුවත් එළුවා හා බල්ලා හා මිත්‍ර බවෙක් විය යනු මෙහි අර්ථයයි.

රජ්ජුරුවෝත් තමා දන්නා හෙයින් අර්ථ නො විචාරා මොහු විසිනුත් දන්නා ලද්දේ වතැයි සිතා දෙවිඳුයා විචාළහ. එසිත් තමා උගත් ගාථාව කිය.

තිණමාසි පලාසමාසි මෙණ්ඩො,
න සුනඛො තිණමාසි නො පලාසං
ගණ්හෙය්‍ය සුණො සසං බිළාරං,
අථ මෙණ්ඩස්ස සුණෙන සඛ්‍යමස්සා'ති.

මේ ගාථායෙහි අභිප්‍රාය නම්, එළුවා තණකොළ කන්නේය. බලු තණකොළ නො කන්නේය. එසේ වුවත් එළුවා හා බල්ලා හා මිත්‍රබවෙක් විය යනු මෙහි අභිප්‍රායයි.

දෙවිඳුයාත් දූතපීවතැයි සිතා නැවත පණ්ඩිතයන් වහන්සේ විචාරන්නාහු පුත! තෙපිත් ප්‍රශ්නය දතුදූයි කීහ.

ඒ මාගේ ස්වාමිදරුවාණෝ වදාරනසේක් මහරජ! අවීචියේ පටන් භවාග්‍රය දක්වා මා විනා මේ ප්‍රශ්නය දන්නෝ කවුරු දූ යි වදාළසේක. එසේ වී නම් කියවයි කීහ. මහරජ! ඇසුව මැනව කියා ඒ කාරණය නම් තමන්වහන්සේ ඉඳුරාම දත් නියාව ප්‍රකාශ කොට වදාරනසේක් ගාථා දෙකකින් වදාරනසේකි.

අඩ්ඪට්ඨපාදෙ චතුප්පදස්ස, මෙණ්ඩො අට්ඨනඛො අදිස්සමානො
ඡාදියං ආහරති අයං ඉමස්ස, මංසං ආහරති අයං අමුස්ස
පාසාදගතො විදෙහසෙට්ඨො, වීතිහාරං අඤ්ඤ
මඤ්ඤභොජනානං
අද්දක්ඛි කිර සක්ඛි තං ජනින්දො, භොභුක්කස්ස ච
පුණ්ණමුඛස්ස චෙත'න්ති.

මේ ගාථාවන්හි අභිප්‍රාය නම්, මහරජ! ඇසුව මැනව. අටකින් භාගයෙක් නම් සතරෙක. එකි එකී පය දෙ දෙකුර බැගින් අට කුරයක් හා පා සතරකින් යුක්ත වූ එළුවා තෙමෙ බල්ලාට මාංස සඟවා ගෙනෙන්නේය. බලුතෙමෙ එළුවාට තණ සඟවා ගෙනවුත් ලන්නේය. එළුවා ගෙනා මස් බලු කන්නේය. බල්ලා ගෙනා තණ එළුවා කන්නේය.

වෛදේහ මහා රජෝත්තමයා මාළිගාවේ මතු මහලේ සක්මන් කරන්නහු[1] එළුවා මස් ගෙනෙන්නාත්, බල්ලා තණ ගෙනෙන්නාත්, ඔවුනොවුන් ගෙනා දෙසින් ඔවුනොවුන් ආහාර කෘත්‍යය සපයන නියාවත්, සතුරන් දෙන්නා මිත්‍රව වසන නියාවත් දන්නාලද. ඒ වූ නියායෙන්ම ප්‍රත්‍යක්ෂ කොට මමත් දත්මියි වදාළසේක.

රජ්ජුරුවෝ සෙසු පණ්ඩිතවරුන් බෝධිසත්ත්වයන් වහන්සේ නිසා මේ දත් නියාව නොදන්නාහු මොහු පස්දෙනම තම තමන්ගේ ප්‍රඥා බලයෙන්ම දත්හයි සිතා සතුටුව මෙසේ කියන්නාහු.

ලාභා වත මෙ අනප්පරූපා, යස්ස මෙ එදිසා පණ්ඩිතා කුලම්හි
ගම්භීරගතං නිපුණමත්ථං, පටිවිජ්ඣන්ති සුභාසිතෙන ධීරා'ති.

මෙබඳුවූ පණ්ඩිතවරුන් ඇත්තා වූ මට වූයේ මහා ලාභයෙක. දිවැස් ඇති කෙනකුන් හෝ දුටු කෙනකුන් මුත් සිතින් සිතාලා කිය නොහැකි ප්‍රශ්නයෙහි අර්ථය මේ පස්දෙනම දිවැසින් දුටුවාසේ මා සිත් ගෙන කියාලූහ. එබැවින් ඔවුන් කෙරෙහි සතුටුව මා විසින් උනුත් සතුටු කරවාපීම් නම්[2] යෙහෙකැ යි සිතා ප්‍රසාද දෙන්නාහු. එකි එකී දෙනාට අසුන් සතර සතර දෙනා බැගින් යොදන ලද රන් ධජ නැගූ එකි එකී රථයක්ද, වස්ත්‍රාභරණ අන්නපානයෙන් සමෘද්ධවූ අවුරුද්දකට ලක්ෂයක් බැගින් නිමවන් නා වූ එකි එකී ගමෙක් දූ යි තොප පස්දෙනාට රථ පසක් හා ගම් පසක් හා දෙමියි කියා දුන්හ.

මෙණ්ඩක ප්‍රශ්නයයි.

ඉක්බිති උදුම්බරාදේවී පණ්ඩිතයන් නිසා සෙස්සවුන් ප්‍රශ්නය දත් නියාව තුමූ දැන සිතන්නාහු, රජ්ජුරුවන් කළ දෑ උඳු සා මුං හා පැයෙන් සම කළා වැන්න. පණ්ඩිතවරුන් පස්දෙනාට සමයේ[3] ප්‍රසාද දුන් නියාය. මාගේ මලණුවන්ට විශේෂයෙන්ම සත්කාරයක් කරවම් සිතා, රජ්ජුරුවන් සමීපයට ගොස් දේවයන් වහන්ස! තුඹවහන්සේට ප්‍රශ්නය කවුරුන් විසින් කියන ලද්දේදැයි විචාළහ. හැයි? සොඳුර! පණ්ඩිතවරුන් පස්දෙනා විසින්ම කියනලදැයි කී කල්හි දේවයන් වහන්ස! සේනකාදී සතරදෙන ප්‍රශ්නය කා විසින් දත්තුදැයි විචාළහ. සොඳුර! ඒ මා දන්නේ නැතැයි කීහ. එසේ වී නම් ඔහු සතරදෙන කුමක් දනිද්ද? මේ අඥානවූ ජඩයෝ නොනසිත්වයි සිතා පණ්ඩිතයන්

1, කරන්නේ. 2, කරවාපියා නම්. 3. එකහරම.

විසින් ප්‍රශ්න උගන්වන ලද. නුඹවහන්සේ විසින් ඇම දෙනාටම එකතරම් සත්කාර කෙළේ අයුක්තිය. පණ්ඩිතයන්ට වඩා සත්කාරයක් කිරීම යහපතැ යි කීහ.

රජ්ජුරුවෝ සිතන්නාහු මාගේ පුතණුවෝ තමන් නිසා සෙස්සවුන් ප්‍රශ්නය දත් නියාව මඳකුත් නො හැඟවූවෝමය යි පණ්ඩිතයන් වහන්සේ කෙරෙහි ඉතා සතුටුව මාහැඟි කොට ප්‍රසාදයක් දීපියන්නා කැමැතිව වන්නාට, මපුතණුවන් අතින් අතික් ප්‍රශ්නයක් විචාරමි. ඒ කී කල්හි යහපත් කොට උපකාර කෙරෙමියි සිතා ප්‍රශ්නයක් සිතන්නාහු සිරිමන්ද ප්‍රශ්න සිතා එක් දවසක් පණ්ඩිතවරුන් පස්දෙනා උපස්ථානයට අවුත් මිහිරි කථා කෙරෙමින් සුමසේ උන්කල්හි සෙනකය! තා අතින් ප්‍රශ්නයක් විචාරමියි කීහ. දේවයන් වහන්ස! විචාළ මැනවැයි කීය. ඉක්බිති විචාරන්නෝ සිරිමන්ද ප්‍රශ්නයෙහි පළමුවන ගාථාව කියත්.

පඤ්ඤායුපෙතං සිරියා විහීනං, යසස්සි නං වාපි අපෙතපඤ්ඤං
පුච්ඡාමි තං සෙනක එතමත්ථං, කමෙත්ථ සෙය්‍යො
කුසලා වදන්ති.

මේ ගාථාවෙහි අර්ථ නම්, එම්බල සෙනකය! එකෙක් සම්පත් නැත. නුවණ ඇත. එකෙක් සම්පත් ඇත. නුවණ නැත. මේ දෙන්නාගෙන් කවුරු උත්තමයෝ ද? කවුරු අධමයෝද යි කීහ. මේ ප්‍රශ්නය වූ කලී සෙනකයාගේ වංශානුගත වූ ප්‍රශ්නයෙකි. එසේ හෙයින් වහාම සිතාලා මහරජ! ඇසුව මැනැවැයි කියා මේ ගාථාවෙන් කීය.

ධීරා ච බාලා ච හවෙ ජනින්ද, සිප්පූපපන්නා ච අසිප්පි නො ච
සුජාතිමන්තො ච අජාතිමස්ස, යසස්සිනො පෙස්සකරා භවන්ති
එතම්පි දිස්වාන අහං වදාමි, පඤ්ඤ නිහීනො සිරිමා, ච
සෙය්‍යොති.

මේ ගාථාවෙහි අර්ථ නම් – යම්සේ නුවණ ඇත්තෝද, නුවණ නැත්තෝද? නොයෙක් ශාස්ත්‍ර ධරන්නෝද, [2] කිසිවකුත් නො දන්නෝද, උත්තමයෝද, අධමයෝද යන මේ සියල්ලෝම සම්පත් ඇත්තවුන්ට කිකරු වන්නාහ. එබැවින් නුවණැත්තෝ අධමයෝය. සම්පත් ඇත්තෝ උත්තමයෝයයි කීය.

රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා පුක්කුසය, කාවින්දය, දෙවින්දය යන තුන්දෙනා අතින් නො විචාරාම හැමදෙනාට වයසින්

---

1. දෙවන්නා 2. දන්නෝද

බාලව කෙලවර ආසනයෙහි හුන්නාවූ මහෞෂධ පණ්ඩිතයන් වහන්සේට කියන්නාහු මේ ගාථාවෙන් කීහ.

තවම්පි පුච්ඡාමි අනොමපඤ්ඤ, මහොසධ කෙවල ධම්මදස්සි
බාලං යසස්සිං පණ්ඩිතං අප්පභොගං, කමෙත්ථ සෙය්‍යො
කුසලා වදන්ති ති.

යත මේ ගාථාවෙහි අභිප්‍රාය නම්, සියලු ධර්මයන් හුදෙක් අතැඹුළසේ දන්නාවූ අලාමක වූ ප්‍රඥ ඇති මහෞෂධ පණ්ඩිතයෙනි! තොපත් විචාරමි. නුවණැතිව සම්පත් නැත්තාවූද, නුවණ නැතිව සම්පත් ඇත්තාවූද යන මේ දෙන්නාගෙන් කවුරු වඩිද්ද ? කවුරු අඩුවෝද්දැයි නුවණැත්තෝ කියද්දැයි කීහ. මහරජ! එසේ වී නම් අසුව මැනවැයි කියා මේ ගාථාවෙන් වදාරන සේක.

පාපානි කම්මානි කරොති බාලො,
ඉධමෙව සෙය්‍යො ඉති මඤ්ඤමානො
ඉධ ලොකදස්සී පරලොකං අදස්සී,
උභයත්ථ බාලො කලිමග්ගහෙසි
එතම්පි දිස්වාන අහංවදාමි,
පඤ්ඤා'ව සෙය්‍යො න යසස්සී බාලො? ති.

මේ ගාථාවෙහි අර්ථ නම්, පොහොසත්ව සිටියාවූ නුවණ නැති නැනැත්තේ මේ අපට ස්ථිර සාරවූ යහපතෙකැයි සිතා පව් කරන්නේ පරලොව නොබලා මේ ලොවම බලා පව් කොට මෙලොව අයසස් හා පරලොව සතර අපායේ දුක් විඳිනේය. මේ දැක මම කියමි. සම්පත් ඇත්තේ අධමය. නුවණැත්තේ උතුමැයි වදාලසේක.-

එවිට රජ්ජුරුවෝ සේනකයා බලා මහෞෂධ පණ්ඩිතයා කියන්නේ නුවණැත්තන්ම උතුමැයි වේ ද, තෙපි කුමක් කියව් දැයි කීහ. සේනකයා කියන්නේ මහරජ! මහෞෂධ පණ්ඩිතයෝ ඉතා බාලයහ. අද දක්වා මූඛයෙන් කිරිසුවඳ වහනය කෙරෙයි. එබැවින් ඔහු කුමක් දනිද්දැයි කියා දෘෂ්ටාන්තයක් ගෙන හැර පානේ මේ ගාථාව කීය.

න සිප්පමෙතං විදධාති භොගං,
න බන්ධවා න සරීරාවකාසො
පසෙසලමූගං සුඛමෙධමානං,
සිරී හි තං භජතෙ ගොරිමන්දං
එතම්පි දිස්වාන අහං වදාමි,
පඤ්ඤා නිහීනො සිරිමා'ව සෙය්‍යො'ති

1. අපස්සි

මේ ගාථායෙහි අභිප්‍රාය නම්, මහරජ; මෙබඳු මියුලු නුවර නොයෙක් සම්පත්තීන් ආඪ්‍යවූ ගොරිමන්‍ද නම් සිටාණන් දත්තාවූ කිසිම ශිල්පශාස්ත්‍රයෙකුත් නැත. උන් ඇවෑමෙන් සම්පත් විඳගන්නා තරම් දරු කෙනෙක් වත්, සෙසු නෑසිය කෙනෙක් වත් නැත. බැණ නැඟී කල දෙකොලින් කුණු කෙල ධාරා වැහෙන්නේය. එසේ වූ නිඃශ්‍රීක නැනැත්තහු පවා ශ්‍රී සම්පතයින් යුක්තව වසනහෙයින් බොහෝදෙන ඔහු භජනය කරන්නාහ. ඒ දුක මම කියමි, සම්පත් ඇත්තේ උතුම, නුවණැත්තේ අධම යයි කීය.

ඒ ගොරිමන්‍ද සිටාණෝ නම් කෙසේ වූ කෙනෙක් ද යත්? එම මියුලු නුවර අසූ කෙළක් වස්තු ඇති සිටාණ කෙනෙක. ඉතා විරූපයහ. ඔහුගේ පුතෙක් වත්, දුවක් වත් නැත. කිසි ශිල්ප යකුත් නොදන්නී. ඔහු බැණ නැඟී කල දෙකොලින් කුණුකෙල ධාරා වැහෙන්නේය. දිව්‍යාප්සරාවක් බඳුවූ රූප ශ්‍රී ඇති ස්ත්‍රිහු දෙදෙනෙක් සර්වාභරණයෙන් සැරහුනාහු, සුපිෂ්පිතවූ නිලුපුල් මල් ගෙන දෑලයෙහි සිටියාහු ඒ වැගිරෙන්නා වූ කුණුකෙල ධාරා නිලුපුල් මලින් පිස වීපියට දමන්නාහ.

සුරාධූර්තයෝ රා අවනට යන්නාහු, නිලුපුල්මලින් ප්‍රයෝජ නයක් ඇති කල්හි ඔවුන් ගෙදොරට ගොසින් ස්වාමීනි! ගොරිමන්‍ද සිටාණන් වහන්සැයි කියති. සිටාණෝ උන්ගේ බස් අසා සිවුමැදුරු කවුළුව සමීපයට ගොසින් කිමෙක් ද ? දරුවෙනි! කියන්නාහ. ඒ බස හා සමඟ කුණුකෙල ධාරා වැහෙන්නේය. සිටියාවූ ස්ත්‍රිහු ඒ කුණුකෙල ධාරා නිලුපුල් මලින් පිස ඒ මල් අනතුර වීපියට දමන්නාහ. සුරා ධූර්තයෝ ඒ මල් ගෙන දියෙහි ලා පැලඳ රා අවනට යන්නාහ. මෙසේ නොයෙක් ශ්‍රී සම්පත්තීන් යුක්තවූ සිටාණන් නුවණ නැතත් සම්පත් ඇතිහෙයින් බොහෝ දෙන (ඔහු) භජනය කරන්නාහ යි උදාහරණ කොට සෙනකයා කීය.

ඒ අසා රජ්ජුරුවෝ කෙසේද? පුත මහෞෂධ පණ්ඩිතයෙනි! කීහ. දෙවයන්වහන්ස! මේ සෙනකයා කුමක් දනීද ? බඳුන් දෙව් නෙනෙක හුළු අවුලා කන කපුටුවකුසේද, දී කන්නට වන් බල්ලකුසේද මෙලොව පෙනෙන්නාවූ යසසම බලයි. හිස හෙන් නාවූ මහා මුගුරු නොදක්නේය. වන්නාව, මා කියන්නා කුම කුත් ඇසුව මැනවැයි කියා මෙසේ වදාරනසේකි.

ලද්ධා සුඛං මජ්ජති අප්පපඤ්ඤෝ,
දුක්ඛේන ඵුට්ඨෝ'පි පමෝහමෙති
ආගන්තුනා සුඛදුක්ඛේන ඵුට්ඨෝ,
පවේධති වාරිච රෝ'ව සම්මෙ
එතම්පි දිස්වාන අහං වදාමි,
පඤ්ඤෝ'ව සෙය්‍යෝ න යසස්සි බාලෝ' ති

නුවණ මඳ තැනැත්තේ යම්තම් සැපතක් ලදුයේ වී නම් මේ අපට තිර දෙයෙකැයි සිතා පව් කොරෙයි. මඳ දුකක් දුටු විට අතිශයෙන්ම තැවෙන්නේය. මෙසේ අස්ථිර වූ සුවදුක් දෙකින් මොහු පෙළුන නියාව දියෙහි හොත් මසකු ගොඩ ලූ කල අව්වේ තැවෙන්නා වැන්න. එබැවින් නුවණ මඳව සම්පත් ඇත්තේ අධමය. සම්පත් නැතත් නුවණැත්තේ උතුමැයි වදාලසේක.

ඒ අසා රජ්ජුරුවන් කිමෙක්ද ආචාරීනි, කී කල්හි දේවයන් වහන්ස,[1] මූ කුමක් දනිද්ද සිරිය දුතාමැනවැයි කියා මේ ගාථා වෙන් කීය.

දුමං යථා සාදු ඵලං අරඤ්ඤෙ,
සමන්තතො සමභිවරන්ති පක්ඛී
එවම්පි අඩ්ඪං සධනං සභොගං,
බහුජ්ජනො භජති අත්ථහෙතු
එතම්පි දිස්වාන අහං වදාමි,
පඤ්ඤෙ නිහීනො සිරිමා' ව සෙය්‍යො' ති

මේ ගාථාවෙහි අර්ථ නම්, මහරජ; මනුෂ්‍යයන් හා පක්ෂීහු පවා අරණ්‍යයෙහි නොයෙක් වෘක්ෂ ජාති බොහෝ වුවත් ඵල ගත් රුක් ම භජනය කරන්නාහ. නොපලදා[1] රුක් බොහෝ වුවත් ආශ්‍රය නො කරන්නාහ. නොපලගත් රුක් පරිද්දෙන් දිළිඳු වූ නුවණැත්තවුන් ආශ්‍රය නොකරන්නාහ. නුවණ නැතත් ඵල ගත් රුක් සේ සම්පත් ඇත්තවුන් ම ඇසුරු කරන්නාහ. මේ දනත් මම කියමි. නුවණ නැත්තේ අධමය. සම්පත් ඇත්තේ උතුමැයි කීය.

ඒ අසා කිමෙක්ද පුත මහෞෂධ පණ්ඩිතයෙනි කීහ. මහා සැලක් සේ බඩක් ඇති මහොදරයා කුමක් දනීද. දෙවයන් වහන්ස; ඇසුව මැනවැයි කියා මේ ගාථාවෙන් වදාරනසේකි.

1, නොපලගත්

න සාධු බලවා බාලො, සාහසං වින්‍දතෙ ධනං
කන්‍දන්‍තමෙව දුම්මෙධං, කඩ්ඪන්‍ති නිරයං[1] භුසං
එතම්පි දිස්වාන අහං වදාමි, පඤ්ඤා'ව සෙය්‍යො
[න යසස්සි බාලො'ති.

මහරජ! නුවණ නැති පොහොසත් තැනැත්තේ සම්පත් ඇත්තාවූ දුප්තුන් හඬව හඬවා සම්පත් උදුරා ගන්නේය. මම පොහොසතිම් මා කළ කී යම් දෙයක් වැටෙයි සිතන්නේය. ඔහු කළ පවින් මරණාසන්නයෙහි යමපල්හු ඔහු[2] හඬව, හඬවා ගෙන ගොස් නරකයෙහි හෙලා මහා දුකට පමුණුවන්නාහ. එසේ හෙයින් නුවණ නැති සම්පත් ඇත්තේ අධම ය. දුප්පත් වුවත් නුවණැත්තේ උතුමැයි වදාළසේක.

නැවත රජ්ජුරුවන් කිමෙක් ද සෙනක ය යි කී කල්හි මහරජ! ඇසුව මැනවැයි මේ ගාථාවෙන් කීය.

යා කාචි නජ්ජො ගඞ්ගමභිස්සවන්‍ති
සබ්බා'ව තා නාමගොත්තං ජහන්‍ති
ගඞ්ගා සමුද්දං පටිපජ්ජමානා,
න ඛායතෙ ඉද්ධිපරො හි ලොකො
එතම්පි දිස්වාන අහං වදාමි,
පඤ්ඤාව නිහීනො සිරිමා'ව සෙය්‍යො'ති.

මේ ගාථාවෙහි අභිප්‍රායනම්, මහරජ! කුඩා කුඩා ඇළ කඳුරු[3] හෝ ආදියෙහි ජලය එක් ව ගඟට වන්කල ගංගා නම් වෙයි. ගං ආදිය ගොස් සමුද්‍රයට වන්කල මුහුද ය යි කියන්නා සේ කොසා[4] නුවණක් ඇතත් දුප්පත් තැනැත්තේ පොහොසතුන් සමීපයට ගිය කල්හි ඔහු කොසා දස්කමක් කළත් කිවත් ඔහුගේ නම යට වන්නේ ය. කිසිවකුත් නොකළත් පොහොසත් තැනැත්තේ ම වැඩී සිටිනේ ය. මේ කාරණයෙනුත් සම්පත් ඇත්තේ උතුමැයි නුවණැත්තේ අධමය යි කීය.

නැවත රජ්ජුරුවන් කිමෙක් ද? පණ්ඩිතයෙනි! කී කල්හි මහරජ! ඇසුව මැනවැයි කියා මේ ගාථා දෙකකින් වදාරන සේක.

යමෙත මක්ඛා උදධිං මහන්‍තං
සවන්‍ති නජ්ජො සබ්බකාලං අසඞ්ඛං
සො සාගරො නිච්චමුළාරවෙගො,
වෙලං න අච්චෙති හි මහා සමුද්දො,

1. නිරය 2. අරුසේ ම 3. කඳුරැළි 4. එකසේ වූ

එවමපි බාලස්ස පජපපිතානි
පඤ්ඤං න අවෙච්ච සිරි කදාචි
එතම්පි දිස්වා න අහං වදාමි,
පඤ්ඤෝ'ව සෙය්‍යො න යසස්සි බාලො'ති.

මේ ගාථායෙහි අභිප්‍රාය නම්, මහරජ! යමක් යමක් ම මේ සේනකයා කියන්නේ වී නම් ඔහු ඒ කියන්නේ කටයුත්තෙක් ම නොවෙයි. මහත්වූ ඒ සමුද්‍රයට නොයෙක් දිගින් වදනාවූ බොහෝ ගංගා හෝවල ජලසකන්ධය එක දවසකුත් ඒ සමුද්‍රය තෙමෙ ඇතැයි යන්නාක්ම නො කියන්නේය. එසේ වූ බොහෝ වූ ජලය ඇත්තා වූ සමුද්‍රයෙහි වාතවේගයෙන් දිවන්නා වූ රලතෙමෙ[1] වෙරල ගැසී නැවත මුහුදට වදුත් මුත් වෙරල ඉක්ම යා නොහේ ද? එපරිද්දෙන් සමුද්‍රයසේ වූ මහාසම්පත් ඇති නුවණ මඳ තැනැත්තේ දුක්පත් වුවත් ප්‍රඥාවන්තයා ඉක්ම පවත්නට අසමර්ථ වන්නේය. යම්සේ ශ්‍රීමත් එකක්හට අර්ථයක්වත් අනර්ථයක්වත් පැමිණිකල්හි නුවණැති තැනැත්තහු හැර නුවණ නැති පොහොසත් තැනැත්තහු සමීපයට යන්නාහු නැත. දුක්පත් වුවත් නුවණැත්තහු පාපිටදී ම ඒ විනිශ්චය සකස් කොට ලදින් සතුටු වන්නේ ය. එ බැවින් සම්පත් ඇත්තේ අධම ය. නුවණැත්තේ උතුමැයි වදාලසේක.

ඒ අසා කිමෙක් ද? සෙනක යයි කී කල්හි අසා වදාල මැනවැයි මේ ගාථාවෙන් කීය.

අසඤ්ඤතො චෙපි පරෙසමත්ථං
භණාති සන්ථානගතො යසස්ස
තස්සෙව තං රූහති ඤාතිමජ්ඣෙ
සිරිහිතං කාරයතෙ න පඤ්ඤා
එතම්පි දිස්වාන අහං වදාමි,
පඤ්ඤා නිහිනො සිරිමා'ව සෙය්‍යො'ති.

මේ ගාථාවෙහි අර්ථ නම්, යම්සේ පොහොසත් තැනැත්තේ බොහෝ දෙනා රැස් වූ කල්හි සභායෙහි හිඳ තමා නුවණ මඳ හෙයින් කාරණාකාරණ සලකා ගත නොහී යුක්ති වරදවා හිමියන් ගැත්ත අහිමිකොට කියේ වී නම් ද, අහිමියන් හිමි කොට කියේ වී නම් ද ඒ සභාවෙහි උන්නාවූ බොහෝ දෙනා ගෙන් එක්කෙනකුත් ඔහු වරදවා කී නියාව දුන දූනත් ඔහු අබිබවා[2] නෙලෙ වැරැද්දේයයි හැරපියන[3] කිසි කෙනෙකුත්

1. ජලය 2. අභිබවා 3. හැර කියන

නැත. උන්නා වූ හැමදෙනාම කපින් කපින් ම සිනි තියා ඉතා යහපතැයි ප්‍රශංසා කරන්නාහ. නුවණැති තැනැත්තේ දුක්පත් වී නම් ඔහු අසමාන යුක්තියක් කිවත් වැරැද්දේ ය යි කියත් මුත් කිසිකෙනෙකුත් නො ගිවිස්නාහ. මේ කාරණයෙනුත් සම්පත් ඇත්තේ උතුම ම නුවණැත්තේ අධමයයි කීය.

නැවත රජ්ජුරුවන් කිමෙක් ද? පුත මහෞෂධ පණ්ඩිත යෙනි! කී කල්හි දෙයන්වහන්ස! මේ කෙලතොලු සේනකයා කුමක් දනීදැයි මදූරා අසා වදාල මැනවැයි කියා මේ ගාථාවෙන් වදාරනසේක.

පරස්සවා අත්තනො වා'පි හෙතු
බාලො මුසා භාසති අප්පපඤ්ඤො
සො නින්දිතො හොති සභාය මජ්ඣෙ,
පෙච්චම්පි සො දුග්ගතිගාමි හොති
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤො'ව සෙය්‍යො න යසස්සි බාලො'ති.

මේ ගාථායෙහි අභිප්‍රාය නම්, යම්සේ නුවණ මඳ පොහොසත් තැනැත්තේ තමාටවත්, අනුන්ටවත් යම් කිසිවක් නිසා බොරුවක් කියේ වී නම් මේ සා තනතුරෙක්හි සිට කියාපි බොරු වකැයි උන් තරමට සුදුසු නො වෙයි යනාදීන් බොහෝ දෙනා විසින් ම මේ ජාතියෙහි නින්දාවට පැමිණෙන්නේ ය. මිය පර ලොව ගියකල්හි එම අකුශලයෙන් ම අපායේ උපද්දිමේ කාරණ යෙනුත් නුවණ නැති පොහොසත් තැනැත්තේ අධම ය. දුක් පත් වුවත් නුවණැත්තේ උතුමැයි වදාලසේක.

අත්ථම්පි වෙ භාසති භූරිපඤ්ඤො,
අනාල්හියො අප්පධනො දළිද්දො,
න තස්ස තං රූහති ඤාතිමජ්ඣෙ,
සිරිච පඤ්ඤාණවතො න හොති
එතම්පි දිස්වාන අහං වදාමි,
පඤ්ඤො නිහීනො සිරිමා'ව සෙය්‍යො'ති.

නැවත සේනකයා කියන්නේ කිසිවකුත් නැති දරිද්‍රවූ මහා නුවණැති එකෙක් සභාවෙහි බොහෝ දෙනා මධ්‍යයෙහි ඉඳ යම් කිසි අර්ථසාරවූ අසමානවූ යුක්තියක් කීයේ වී නම් සබයට ඒ රුස්නෝ නොවෙයි. සියලු සම්පත්තීන් ආඪ්‍යවූ නුවණ නැති එකෙක් නො කටයුත්තක් කියේ වී නමුත් ඒ නියා ඉතා යහප

තැයි ඇම දෙනම ප්‍රියවන්නාහ. විද්‍යුඥාදීන් විසින් කව්වාරු කරන්නාහ. එබැවින් නුවණැත්තේ අධමය. සම්පත් ඇත්තේ උතුමැයි කිය.

නැවත රජ්ජුරුවන් කෙසේද? පුත මහෞෂධ පණ්ඩිතයෙනි; කී කල්හි මහරජ! සෙනකයා කුමක් දනීද? පරලොව මඳකුත් නො බලා මේ ලොව බලන්නේ ය යි කියා මේ ගාථාවෙන් වදුරනසේකි.

පරස්ස වා අත්තනො වා'පි හෙතු
න භාසති අලිකං භූරිපඤ්ඤ,
සො පූජිතො හොති සභාය මජ්ඣෙ
පෙච්චඤ්ච[1] සො සුගතිගාමි හොති
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤ'ව සෙය්‍යො න යසස්සි බාලො'ති.

මේ ගාථාවෙහි අර්ථ නම්, මෙලෝ ඇත. පරලෝ ඇතැයි දන්නා මහානුවණැත්තේ තමාටවත්, අනුන්ටවත් අභිවෘද්ධියක් නිසා සැබෑවක් මුත් බොරුවක් නොකියා ද, එසේ වූ උත්තම පුරුෂතෙමෙ කී තියා ඉතා යහපතැයි කටින් කටින් ඇමදෙනා ම විසින් මේලොව ම ප්‍රශංසා ලැබෙයි. මිය පරලොව ගිය කල්හි සතර අපායට නො ගොස් සුගතියට ම යන්නේ ය. එබැවින් සම්පත් ඇත්තේ අධමය. නුවණැත්තේ උතුමැයි වදාළසේක. මෙවිට කෙසේ දෑ යි ව්වාළ රජහට සෙනකයා මේ ගාථාවෙන් කියේ ය.

හත්ථි ගවස්සා මණිකුණ්ඩලා ච,
නාරියො ච ඉද්ධෙසු කුලෙසු ජාතා
සබ්බා'ව තා උපභොගා භවන්ති,
ඉද්ධස්ස පොසස්ස අනිද්ධිමන්තො
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤ නිහීනො සිරිමා'ව සෙය්‍යො'ති.

මේ ගාථායෙහි අභිප්‍රාය නම්, මහරජ! ඇතුන් අසුන් ගව මහිසාදීන් ආදීවූ ප්‍රාණගතවස්තු ද, නවද මුතු මැණික් පබළු වෛදූර්‍ය්‍ය මසාරගල්ල ලොහිතඞ්ක සඞ්ඛ ශිලා ප්‍රවාල රජත සුවර්ණාදි වූ දශවිධ රත්නාදි වූ රුවන් සමූහයෝද, එම රුවනින් විසිතුරු කොට කරනලද නොයෙක් ජාතියෙහි පලඳනා විශෙෂද, සාලි ව්‍රීහි ආදි වූ සප්තවිධ ධාන්‍යවිශෙෂද, නොයෙක් ජාතියෙහි

---

1 පෙච්චම්පි

දාසි දස් සමූහයෝද, සර්වාභරණයෙන් සැදි දෙවඟනක් හා සමාන රූ ඇති සත්‍රී සමූහයාද, අවශෙෂ පරිවාරජනයෝද යන මේ සියල්ලෝම පොහොසත් තැනැත්තහුට උපභොග පරිභොග පිණිස වන්නාහ. නුවණ ඇතත් දුක්පත් තැනැත්තහුට එසේ වන්නාහු නොවෙති. මේ කාරණයෙනුත් සමපත් ඇත්තේ උතුම. නුවණැත්තේ අධමය සි කියේය.

ඉක්බිති බොධිසත්වයන් වහන්සේ වදුරනසේක් සෙනකයා කුමක් දනීදැ යි වදුරා එක් කාරණයක් ගෙනහැර දක්වා මේ ගාථාවෙන් වදුරනසේකි.

අසංවිහිත කම්මන්තං
බාලං දුම්මන්ත මන්තිනං
සිරි ජහති දුමෙධං
ජිණ්ණං'ව උරගො තචං
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤාව සෙය්‍යො න යසස්සි බාලො'ති.

මහරජ! නුවණ නැතිව, නො කළමනා දෙයක් මේ කළමනා දෙයෙකැයි සිතාගෙන අපරීක්ෂිතව නොකටයුතු ම කරන්නා වූ අඥාන ජඩයා හැරපියා ශ්‍රීකාන්තාව දුරුවන්නීය. කුමක් මෙන්ද යත් ? දිරාගිය සැවය හැරපියා එහි ආලය නො තබා යන සර්පයා මෙනි. මේ කාරණයෙනුත් සමපත් ඇත්තේ අධමය. නුවණැත්තේ උතුමැයි වදාළසේක.

ඉක්බිති සෙනකයා තමා රජ්ජුරුවන් කෙසේදැ යි විචාළ කල්හි දේවයන්වහන්ස! මේ දරුවෝ කුමක් දනිද් ද? අසා වදාළ මැනවැයි මේ ගාථාවෙන් කිය.

පඤ්ච පණ්ඩිතා මයං භදන්ත
සබ්බෙ පඤ්ජලිකා උපට්ඨිතා
ත්වං නො අභිභුය්‍ය ඉස්සරො'සි
සක්කො භූතපතී'ව දෙවරාජා
එතම්පි දිස්වාන අහං වදාමි,
පඤ්ඤා නිහීනො සිරිමා'ව සෙය්‍යො' ති.

මේ ගාථාවෙහි අභිප්‍රාය නම්, මේ එක් කාරණයෙන් බොධිසත්වයන් තුඩ සොල්ලාපිය නොදෙමියි සිතා කියන්නේ මහරජ! මම දූන් අතික් උපමාවක් නොකියමි. මෙතැන්හිම අපි මහ පොළොව සේ නුවණැති පණ්ඩිතවරුන් පස්දෙනෙකු ම පවා නුවණින් අඩුවත් ඓශ්වර්‍ය්‍යයෙන් හා පොහොසත් කමින් හා

වැඩසිටි සෙයින් නුඹවහන්සේගේ ශ්‍රී පාදය දෙහොත් මුදුනෙහි තබා වැඳ වැඳ බලා හිඳුම්හ. නුඹවහන්සේ වූ කලි අප ඇමදෙනාට ශක්‍රදේවේන්ද්‍රයා සේ අප සියල්ලන් අභිභවා නුඹවහන්සේම බබලනසේක. මේ කාරණයෙන් ම සම්පත් ඇත්තේ උතුම නුවණැත්තේ අධමය යි කීය.

ඒ අසා රජ්ජුරුවෝ සේනකයා කී නියා ඉතා යහපත. මේ කාරණයට වඩා උදාහරණයක් දක්වා මොහුගේ වාදය බිඳපියන්ට මපුතණුවෝ සමර්ථයෝ වූ නම් විචාරමියි සිතා කිමෙක් ද? මහෞෂධ පණ්ඩිතයෙනි! කීහ.

සේනකයා විචාල විසින් මේ කියනලද කාරණය බිඳ ජය ගන්ට පරවාදමර්දන වූ මාගේ ස්වාමිදරුවාණන් විනා අනික් සමර්ථ එකෙක් කොයිත් නැත්තේ ය. බොධිසත්වයන් වහන්සේගේ ප්‍රඥාබලයෙන් ඔහුගේ වාදය බිඳිනාසේක් මේ ගාථාවෙන් වදාරනසේකි.

දුස්සෝ'ව පඤ්ඤස්ස යසස්සි බාලෝ
අත්ථේසු ජාතෙසු තථාවිධෙසු
යං පණ්ඩිතො නිපුණං සංවිධෙති
සම්මෝහ මාපජ්ජති තත්ථ බාලෝ
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤෝ'ව සෙය්‍යෝ න යසස්සී බාලෝ'ති.

මේ ගාථාවෙහි අභිප්‍රාය නම්, මහරජ! මේ නුවණ නැති ජඩයා කුමක් දනීද? මේ ලොව සම්පත් හා යසස් බලනබව මුත් පරලොව හා ප්‍රඥාවිශෙෂ මඳකුත් සලකන්නේ නොවෙයි. මහ රජ! ඇසුව මැනවැයි කියා මෙසේ වදාරනසේකි. යම්සේ පොහොසත් එකක්හට ඉදින් අනර්ථයෙක් පැමිණියේ වී නම් නුවණැති එකෙක් දුප්පත්ව සිටත් තමාගේ ප්‍රඥාබලයෙන් ඔහු ඒ දුකින් ගලවා ගන්නේ වීනම් ඒ දුප්පත් වූ නුවණැති නැනැත්තහුට දුකට පැමිණි පොහොසත් නැනැත්තේ ඔහුගේ ගැත්තක්හු පරිද්දෙන් යටත්ව කී යම්දෙයක් ම කරන්නේය. ඒ කාරණයෙන් මම සම්පත් ඇත්තේ අධමය. නුවණැත්තේ උතුමැයි කියමි වදාළසේක.

මහමෙර පල්ලෙන් රුවන්වැලි ගෙනහැර පානා කලක් පරිද්දෙන් ද, ආකාශයෙහි සඳමඬල පානා කලක් පරිද්දෙන්ද මේ කාරණය ගෙනහැර දක්වා නුවණැත්තේ ම උතුමැයි වදාළ කල්හි, ඉක්බිති රජ්ජුරුවන් කිමෙක්ද ? සේනකය! තෝ

පොහොසත් වීනම් මීට වඩා අනික් උපමාවක් කියන්නැයි කී කල්හි සෙනකයා, තෙමේ කොටුගෙයක තුබූ යම්තම් වී පිසක් හා නිමවාපියා මියන්ට එක ගැසුවකු සේ තමා දන්නා වූ ජීවිත රක්‍ෂාවට තුබූ තමාට හස්තසාර වූ ප්‍රාණ සමාන වූ වාදස්ථාන යෙක් ඇත්නම් ද, උපමායෙක් ඇත්නම්ද, උත්තරයෙක් ඇත් නම්ද, තෙළිම්පත ගොටුවෙන් ගත් පැතිත්තක් සේ ද කියා නිමවාලා එක ගසාගෙන කිසිවකුත් කියන්ට අසමර්‍ථව මුවෙන් නො බැණ උන්නේය.

ඉදින් සේනකයා සේසේ[1] සිහා සොයා අනික් කාරණයක් කීයේ වී නම් ගාථා දහසකිනුත් මේ ජාතකය නිමවන්නේ නොවෙයි. සෙනකයා කිසිවකුත් කියන්ට අසමර්‍ථව මුවෙන් නො බැණ යටැසින් බල බලා උන්කල්හි මහාසමුද්‍රයෙන් වතුරක් ගෙනයන්නාක්හු පරිද්දෙන් බෝධිසත්ත්වයන් වහන්සේ නැවතත් ප්‍රඥාවම වර්‍ණනා කරනසේක් මෙසේ වදාරනසේකි.

අඩ්ඪාහි පඤ්ඤා'ව සතං පසත්ථා
කන්තා සිරී භොගරතා මනුස්සා
ඤාණඤ්ච බුද්ධාන මතුල්‍ය රූපං
පඤ්ඤං න අච්චෙති සිරී කදාචි' ති.

මහරජ! ඒකාන්තයෙන් බුද්ධාදි මහොත්තමයෝ පවා නුවණැත්තන් ම ප්‍රශංසා කෙරෙති. ශ්‍රී කාන්තාවෝ ද නුවණැත්ත වුන් හැර බැහැර නො යන්නාහ. බෝගයෙහි ඇලුම් ඇති නුවණ නැති ජඩයන්ට නුවණැති උත්තමයෝ නිඤ කරන්නාහ. ශ්‍රී කාන්තාවෝ ද ඔවුන් ළඟ නො වෙසෙත්ම ය යි වදාළසේක.

ඒ අසා රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන් වහන්සේගේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි අතිප්‍රසන්නවූවාහු. ඝනවර්‍ෂාවක් වස්නා සේ මාගේ ස්වාමිදරුවාණන් වහන්සේට නොයෙක් වස්තුවෙන් පූජා කරන්නාහු ස්තුතිවශයෙන් මේ ගාථාවෙන් කීහ.

යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො
මහොසධ! කෙවලධම්මදස්සී
ගවං සහස්සං උසභඤ්ච නාගං
ආජඤ්ඤයුත්තෙ ච රථෙ දස ඉමෙ
පඤ්හස්ස වෙය්‍යාකරණෙන,
දදාමි, තෙ ගාමවරානි සොළසා'ති

1. සොසොසේ

මේ ගාථාවෙහි අභිප්‍රාය නම්, සියලු ධර්මයන් තමන්ගේ සර්වඥතාඥානයෙන් අනුන්ගෙන් නාසා කිසි උපදෙශයකුත් නැතිව තමන් දත්තාවූ මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ අතින් යම් ප්‍රශ්නයක් විචාළමෝ නම් ඒ අප විසින් විචාරනලද්දාවූ ඉතා සූක්ෂ්මවූ ප්‍රශ්න අප සිතට නංවා සැක හැර අපට දැනෙන පරිද්දෙන් විස්තර කොට කියා අප සතුටු කොට ලූද, එසේ සතුටු වූවාවූ අපත් උන් සතුටු කොට කිරින් තොපාල වූ නොමැහැලි වූ කිරිදෙනුන් දහසක් හා රන්සත් රන්පොරොදු ආදී වූ නොයෙක් හස්ත්‍යලඞ්කාරයෙන් සරහා නිමවන ලද සර්වලක්ෂණ සම්පන්නවූ නැඟෙන්නට යොග්‍යවූ (වෘෂභ සඞ්ඛ්‍යාතවූ) මඟුල් ඇත් රුවනක් ද, එකි එකි රථයෙහි ආජානීය සෛන්ධවයන් සතර සතරදෙනා බැගින් අසුන් සතළිසක් යෙදූ රථාලඞ්කාරයෙන් සරහා නිමවන ලද උතුම් රථ දසයෙක් ද, ගමකින් ලක්ෂයක් ලක්ෂයක් බැගින් අවුරුද්දකට සොළොස් ලක්ෂයක් නිමවන්නා වූ ගම්වර සොළසෙක් ද යන මේ සියල්ලම (මා විසින්) තොපට දෙනලදැයි අනඝවූ ප්‍රසාද දීමෙන් සියලු ජනයන් සතුටු කරවා බෝධිසත්ත්වයන් වහන්සේ ප්‍රසාද හා සමග මහාපෙරහරින් ගෙට වඩා යවූහ.

සිරිමන්ද ප්‍රශ්නයයි..

එවක් පටන් බෝධිසත්ත්වයන් වහන්සේ ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදි වයසට පැමිණි කල්හි උදුම්බරාදේවී සිතන් නාහු මාගේ මලණුවෝ වැඩිමාලුව ගත්හ. උන්ගේ සම්පත් ඉතා මහත් විය. ඔවුන්ට විවාහ මඞ්ගලයක් කළ මැනවැයි සිතා ඒ බව රජ්ජුරුවන්ට කීහ. යහපත, උන්ගේ අභිප්‍රාය දත් කල වේදැයි කී කල්හි තිසවු බෝධිසත්ත්වයන් වහන්සේ විචාරා ගිවිසි බව දැන එසේ වී නම් කුමාරිකාවක ගෙනමෝදැයි කීහ. බොධිසත්ත්වයන් වහන්සේ සිතනසේක් ඉදින් රජදරුවන් විසින් ගෙන්වන ලද එකක් අනාචාර සීලීවූ නම් ද, මට නොරුස්නී වූ නම් ද, නැවත උන් ඇරපීම තරම් නොවෙයි සිතා වදාරනසේක් මම් ම එක් කුමාරිකාවක පරීක්ෂා කොටඅවුත් කියලම්, එබැවින් කිපදවසක් රජ්ජුරුවන් වහන්සේට මා සඳහන් නොකරවුව මැනවැයි කියා යහපත, එසේ කරවයි කී කල්හි දේවීන් වැඳ තමන් වහන්සේගේ ගෙට ගොසින් වැඩ හැසිරෙන්නාවූ කීප දෙනෙක්හට මෙවැනි වෙසක් ගනිමියි කියාලා අප්‍රසිද්ධ වෙසින් හුු ඉදිකටු ආදී සන්නාලි උපකරණ ඇරගෙන තනිව උතුරුදිග වාසලින් නික්ම උතුරුයවමැදුම් ගම් බලා නික්මුණුසේක.

එසමයෙහි ඒ යවමැදුම්ගම්හි පළමු නොයෙක් සම්පත්තීන් ආඪ්‍ය වූ සිටුකුලයෙක් එවකට ඉතා දුප්පත් වීය. ඒ කුලයෙහි

අමරා නම් දූවක් අසමානවූ රූ ඇත්තීය. සිවුසැටක් පමණ ස්ත්‍රීලක්ෂණයෙන් බබලන්නීය. ඉතා පිනැත්තීය. ඉතා නුවණැත්තීය. ඒ කුමාරිකාවෝ එදවස් උදෑසන ම කැඳිත්තක් පිසගෙන පියාණන් සානා තෙනට යන්නාහු එම මහට ම පිළිපන්නාහ.

බෝධිසත්වයන් වහන්සේ දුර එන්නාවූ කුමාරිකාවන් දැක සිතනසේක් මා ඉදිරියෙහි එන්නාවූ කුමාරිකා සියලු ස්ත්‍රී ලක්ෂණයෙන් විරාජමානවූ උත්තම ස්ත්‍රියක. ඉදින් අස්වාමිකවූ නම් මට පාදපරිවාරිකා කෙලෙම් නම් යහපතැයි සිතූසේක. කුමාරිකාවෝ ද උන්වහන්සේ එන්නාවුන් දැක ඔබ සිතූ පරිද්දෙන් ම සිතන්නාහු මෙබඳු රූපශ්‍රීන් අසමානවූ ස්වර්ණ ප්‍රතිබිම්බයක් හා සමානවූ උතුම්වූ පුරුෂයක්හුගේ ගෙයි මෙසේ වූ එකක්හට බිරින්දව වෙසෙම් නම් යහපතැයි සිතූහ.

නැවත බෝධිසත්වයන් වහන්සේ ද මම මැ සස්වාමික බවත්, අස්වාමික බවත් නොදනිමි. සස්වාමික එකක් වූ නම් අතර මඟ මැ හා කථා කිරීම යොග්‍ය නො වෙයි. එබැවින් හස්තමුද්‍රායෙන් ප්‍රශ්නයක් විචාරමි යි සිතා දුර සිට ම අත මිට හකුළුවා පෑසේක. එවිට කුමාරිකාවෝ ද මූන්දෑ මා සස්වාමික බව විචාරන දෑ වනැ යි සිතා තමන්දෑ අස්වාමික බව හඟවන දෑ ඇඟිලි දික්කොට අත්ල විදෑ පෑදූය.

එවිට බෝධිසත්වයන් වහන්සේ උන්දෑ අස්වාමික බව දැන සමීපයට ගොස් සොඳුර! තෙපි කිනම් වූදෑ යි විචාළසේක. අතීතය, අනාගතය, දැන් පවත්නා කාලයැ යි යන මේ කාලත්‍රයෙහි යම් දෙයක්[1] නැත්නම් මම ඒ නම් කීහ. සොඳුර! තොප කී මේ තුන්කාලයෙහි අමර නම් දෙයක් නැත. තෙපි වැලින් ''අමරා'' නමුදෑයි වදාළසේක. එසේය, අමරා නමියි කීහ. සොඳුර! කාට කැඳ ගෙන යාදෑ යි වදාළසේක. ස්වාමීනි! පූර්ව දෙවතාවුන්ට ගෙන යෙමි කීහ. පූර්ව දෙවතාවෝ නම් මවුපියෝ ය. තොප පියාණන්ට කැඳ ගෙන යෙතියි සිතමි වදාළසේක. එසේය ස්වාමිනි!යි කීහ. සොඳුර! තොප පියාණෝ කුමක් කෙරෙද් දෑ යි වදාළසේක. එකක් දෙකක් කෙරෙතියි ස්වාමිනි!යි කීහ. එකක් දෙකක් කරන්නේ නම් සී සෑම ය. සොඳුර! තොප පියාණෝ සීයක් සේද්දෑ යි වදාළසේක. එසේය ස්වාමීනි!යි කීහ. තොප පියාණෝ කොතෙනක සේද්දෑයි වදාළසේක. ස්වාමීනි! එක තෙනකට එකවරක ගියෝ නොඑද් ද? එසේවූ තෙනක සේති ස්වාමීනි යි කීය. යම් තෙනකට එක වරෙක ගියවුන් නොඑන්නේ නම් සුසාන භූමියක් නියා ය. සොඳුර! තොප පියාණෝ සොහොනක් ළඟ

1. තමෙක්.

සේද්දැ යි වදාළසේක. එසේය, සවාමීනි!යි කීහ. තෙපි අද එවු දැයි වදාළසේක. ඉදින් අවහොත් නේම්, නාවොත් එම්යි කීහ. තොප පියාණන් ගඟකින් එතෙර සානා තියා ය. ගඟ දිය ආ නම් නේන තියා ය. ගඟ දිය නාවේ නම් එන තියා ය යි සිතමියි වදාළසේක. එසේය, සවාමීනි!යි කීහ. මෙතෙකින් මතු ඔවුනොවුන් හා සමග පසු පෙරත්තුවැ කිවමනා කථායෙන්ම අල්ලාප සල්ලාප නිමවා ඉක්බිති අමරා දෙවීන්දැ සවාමීනි! සෑදින් තක් පුව මැනවැයි පැවරූසේක.

බොධිසත්‍වයන් වහන්සේ සිතනසේක් කව, බොවයි කීම නම් මඞගලවචනය, ඒ ප්‍රතික්ෂෙප කිරීම සුදුසු නො වෙයි. සිතා යහපත, බොම්හයි වදාළසේක. කුමාරිකාවෝ ඔබ ඉවසූ බව දැන ඉසින් කළය බා තුබූහ. පණ්ඩිතයන් වහන්සේ සිතනසේක් තැටිය ශුද්ධ නො කොට අතට පැන් නො දී කැඳ නැති ව සිස් තැටිය අත තුබූ නම් මැ මෙතෙනම හැරපියා යෙමියි සිතූසේක.

කුමාරිකාවෝ තැටියෙන් පැන් ගෙනවුත් අතට පැන් දීලා සිස්තැටිය අතට නො දී තැටිය බිම තබාලා කළය සිසාරා පල්ලේ තුබූ හුළු මතුව කැඳ සම්මිශ්‍රවූ කල්හි කැඳ තැටිය පුරා අතට දුන්හ. කැඳ ඉතාම උළු මඳව, පැන් බොහෝ ව ගියේ ය. බොධිසත්‍වයන් වහන්සේ වදාරනසේක් සොඳුර! තොපගේ කැඳ බොල් වතැයි වදාළසේක. ඉන් ඇහවූ තියා කැඳ ඉතා දිය තියාවය. කුමාරිකාවෝ ඒ දැනගෙන සවාමීනි! කැඳ දියවූයේ පැන් නැත්තෙනැයි කීහ. සොඳුර! ගොයම් පූදිනා කල්හි දිය නවූයයි සිතම් වදාළසේක. එසේය, සවාමීනි!යි කිහ. මෙසේ දෙදෙන ඔවුනොවුන් හා ප්‍රියකථා කෙරෙමින් කුමාරිකාවෝ පියාණන්ට කැඳ තබා බොධිසත්‍වයන් වහන්සේට කැඳ පෙවූහ. මහතාණෝ කැඳ බී අත මූව ශුද්ධකොට සොඳුර! අපි තොපගේ ගෙට යම්හ. මඟ කියවයි වදාළසේක. ඉක්බිති මඟ කියන්නාවූ කුමාරිකාවෝ දකුණත ඔසවා මඟ කියන්නාහු මේ ගාථාවෙන් කියත්.

යෙන සත්තු බිලඞගා ච ද්විගුණපලාසො’ච පුපපිතො
යෙනාදමි තෙන වදාමි, යෙන නාදමි න තෙන වදාමි
එස මග්ගො යව මජ්ඣකස්ස, එතං ඡන්නපථං විජානාහී’ති.

මේ ගාථායෙහි අභිප්‍රාය නම්, ඉඳුරා මේ මඟ ගොසින් ගමට වන්කල අඟාතියෙහි එක් තැනෙක්හි අත්සුණු තිබෙන්නා දුව මැනව. ඉන් ඔබට ගියකල එක් තෙනෙක්හි කාඩි තිබෙන්නා දුව මැනව. ඉනුත් ඔබට ගියකල එකපත දෙකක්ව බෙදී තිබෙන්නාවූ ගසෙක් ඇත්තේ ය. එතැන දී යම් අතකින්

නො කත් නම් ඒ අත නො කියමි. යම් අතකින් කත් නම් ඒ අත කියමි. මෙසේ මා විසින් කියන ලද මඟ නො වරදවා ගියසේක් නම් අපගේ ගෙය දක්නාසේක් වේ දැ යි කියා පියාණන්ට කැඳ ගෙන ගියාහ.

බොධිසත්ත්වයන් වහන්සේ උන් කී පරිද්දෙන් ගොසින් ගමට වන්සේක් අත්පුණු තුබුවා පළමුකොට දැක ඒ සලකුණෙන් ගොස් ඔබ්බෙහි කාඩි තිබුවා දැක සලකුණු නො වැරදි සැටියයි සිත සිතා ඉන් මඳක් තැන් වැඩිසේක. යහපත්ව පිපී වැනී ගියාවූ දම්ගුණ පලාසයයි කියනලද රත් කොබෝලීල ගස දැක එතැන් දෙමං සන්ධියෙහි සිටිසේක් මෙසේ සිතූසේකි. ඒ කුමාරිකාව කීයේ යම් අතකින් නොකත් නම් ඒ අත නො කියමි. යම් අතකින් කත් නම් ඒ අත කියමි කියා ය. එබැවින් නො කන අත නම් වමතය. කන අත නම් දකුණ ය. ඒ දකුණත මඟ යෙමියි සිතා වැඩිසේක් නුමුළාව ගොස් උන්ගේ ගෙටම වැඩිසේක.

ජනපදයෙහි ප්‍රශ්න ය යි.

මෙසේ සඟවා කියාලූ මඟක් සොයා ගෙන ගිය නියාව ඉතා ආශ්චර්‍ය්‍ය නියා ය'යි නො සිතියයුතු. ඒ ආශ්චර්‍ය්‍ය නො වන්ට කාරණා කිම්දයත්. මේ අක් මුල් නැති අසාරවූ සංසාරයෙහි පඤ්ච දුශ්චරිතාදි වූ දශ අකුශල කර්මයෙහි යෙදෙන්නා වූ නුවණ නැති බොහෝ සත්ත්වයන් තම තමන් කළ කම් වූ පරිද්දෙන් යන්නා වූ අපාය මාර්ග සඞ්ඛ්‍යාත ඉතා දුඃඛ දායක වූ නොයෙක් මාර්ගයන් බොහෝ වුවත් තමන්වහන්සේගේ ස්වයම්භූඥානයෙන් අනුන්ගෙන් කිසි උපදෙශයක් නැතිව දීපඞ්කර නම් සර්වඥයන් වහන්සේගේ ශ්‍රීපාද මූලයෙහි දී විවරණ ලත්. තැන් පටන් ලොවුතුරා බුදුවන තැන් දක්වා අතුරෙහි සාරාසඞ්ඛ්‍ය කප් ලක්ෂයක් මුළුල්ලෙහි සසර ඇවිදිනා මහතාණන් විසින් කිසි මාර්ගය කට ඉතා ගොස් මං මුළා නොවී තිවන් නමැති මහ පටුන් මඟ සොයාගෙන යන්නා වූ ඒ මාගේ මහතාණන් වහන්සේ මෙතෙකින් මෙතෙන ඒ සිඟිත්තිය කියාලූ මඟ සොයා ගෙන යාම කවර ආශ්චර්‍ය්‍ය යෙක් ද?

ඉක්බිති අමරා දේවීන්ගේ මෑණියෝ බොධිසත්ත්වයන්වහන්සේ දැක හිඳිනා ආසනයක් දී වැඩහුන් කල්හි ස්වාමීනි! කැඳිත්තක් ගෙනෙම්දැයි කිහ. ඔබ වදූරනසේක්. මෑණියෙනි! අපගේ බාල නැඟණියෝ අමරාදේවී අපට කැඳිත්තක් දුන්හයි වදාළසේක. මැහැලි වහන්සේත් මාගේ දියණියන් නිසා ආ කෙනෙක් විය යුතුයයි සිතූහ.

මහතාණෝ ඔවුන් දුක්පත් නියාව දන්නාසේක් මැණියෙනි මම ඉදිකටු මෙහෙවර[1] දනිමි. සම් කිසි විද දුන මනා දෙයෙක් ඇද්දැයි වදාළසේක. ස්වාමීනි! අප දුක්පත් හෙයින් තරපිළී නැතත් රෙදි පෙරෙදි වන්නා ඇත්තේ වේදැයි දී ලන්ට මිල නැතැයි කීහ. මැණියෙනි! තුඹගේ මිලයෙන් මට ප්‍රයෝජන නැත මැනව. කී යම් දෙයක් විද දෙමැයි වදාළසේක. ඔහු තමන්ගේ ගෙයි රෙදි පෙරෙදි අවුලා ගෙනවුත් දුන්හ. ගෙනා දෙය කී පරිද්දෙන් මහා[2] නිමවා දුන්සේක. පින්වතුන් සිතූ යම් දෙයෙක් ම සිද්ධ වන්නේ ය.

ඉක්බිති වදුරනසේක් මැණියෙනි! ගෙත්තම් කරවන කෙනෙක් ඇත්නම් වීදිවල ඇත්තන්ට සැලකළ මැනවැයි කීසේක. මැහැලි වහන්සේ ඒ බව ගම මුළුල්ලෙහිම කියාපීහ. බෝධිසත්වයන් වහන්සේ ගෙන ගෙනාවා උන් උන් කී පරිද්දෙන් විද දී එක දවසින්ම මසුරන් දහසක් උපදවා ගත්සේක. මැහැලි වහන්සේ පෙරවරු බත මහතාණන්ට සපයා දී රට පිසන බත් කෙතෙක් පිසෙම්දැයි විචාළහ. මේ ගෙයි යම් පමණ කෙනෙක් කත් නම් එපමණකට බත් පිසව මැනවැයි වදාළසේක. මැහැලි වහන්සේ ද නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් යුක්තව නොමඳ කොට බත් මාළු පිස සැපවූසේක.

අමරා දේවීන්දූ සවස ඉසින් දරමිටියක් හා එකුරුත්තෙන් පලා ඇරගෙන වලින් අවුත් ඉදිරියෙහි දොර දර හෙළා පැලදොරින් ගෙට වන්හ. අමරා දේවීන්දූගේ පියාණෝ දිවාභාගයෙහි දඩ කර්මාන්ත කොට සවස ගෙට වන්හ. බෝධිසත්වයන්දූ නොයෙක් රසයෙන් අග්‍රවූ බත් අනුභව කළසේක. අමරා දේවී මවුපියන් බත් කවා තුමූ පසුව බත් කා දෙමවුපියන් පතුල් සෝද පය තෙල් ගල්වා දෙවෙනිව බෝධිසත්වයන් පය සෝද තෙල් ගැල්වූහ.

නැවත අමරා දේවීන් පරීක්ෂා කරනු පිණිස. කීප දවසක් එහි ම වැස එක් දවසක් අමරා දේවීන්දූ කැඳවාලා සොඳුර! අමරාදේවීනි! සාල් නැළියකින් බාගයක් ගෙන ඉන් මට කැඳත්, බතුත්, කැවුමුත් පිසවයි වදාළසේක. යහපත ස්වාමීනි!යි ගිවිස සාල් නැළියක් මැනගෙන බෝධිසත්වයන් ඉදිරියෙහිදී අඩු වැඩි නොකොට සරියේ බෙදලා සාල් මනාවක් ඇරගෙන වන ලා පැහැස සුන්සහලින් කැවුම් හා මුල් සාලින් කැඳ හා මධ්‍යම සාලින් බත් හා බතට සුදුසු මාළු ආදී සියල්ලක් ම ආදර සහිතව

1. මෙහෙයක්. 2. වහා

වහ වහා සම්පාදනය කොට බොධිසත්වයන්වහන්සේට කැඳ අවුළු බත් අනුභව කළ මැනවැයි කියා ව්‍යඤ්ජන සහිතව කැඳ වැඩූහ.

එවේලෙහි කැඳ කබලක් මුඛයෙන් ගන්නාහා ම, සත් දහසක් පමණ රසනහර එක පැහැර සතුටු කෙරෙමින් රසයෙන් පිනා සර්වාඞ්ගයෙහි පැතිර ගියේ ය. මහතාණෝ ඒ ක්ෂණයෙහි මුඛයෙන් ගත් කැඳ කෙල හා සමග කාරා බිම දමා සොඳුර! තොප පිසමන් නොදන්නා කල නොදනිම්යි තබා පියා නොහිමා සන්තක දෙය කුමක් පිණිස නැසූදැයි කියා උන්දෑ පරීක්ෂා කරන පිණිස ම වදාළසේක. අමරා දේවින්දෑ ඔබ වදාළ බසට කිසි දෙම්නසක් නැතිව එසේ ද? ස්වාමීනි! කැඳ නපුරු විතම් කැවුම් අනුභව කළ මැනවැයි කැවුම් වැළඳවූසේක. ඉන් එක කැවුමක් ගෙන දිවග තබන්නාහා ම පළමු පරිද්දෙන් ම සර්වාඞ්ගය රසයෙන් හරිතව සිටියේ ය. එයිත් කෙල හා එක් කොට මුඛයෙන් බිමට දමා තොප පිසමන් නොදන්නා කල නොදනිම්යි තබා නොපියා මා සන්තක දෙය මෙසේ නසද්දැයි රැහැණී වූ කල්හි තමන්දෑ එබසට කිසි දෙම්නසක් නැතිව ස්වාමීනි! කැවුම් නපුරු විතම් බත් අනුභව කළ මැනවැයි කියා බත් වැඩූ කල්හි ඉන් බත් ආලොපයක් මුඛයෙහි තබන්නාහා ම දෙවතාවන්ගේ දිව්‍යභොජනයක්සේ සර්වාඞ්ගයෙහි රස නහර ඉල්ප ගියේ ය. ඒ ක්ෂණයෙහි මුඛයෙහි තුබූ ආහාර කෙල මිශ්‍ර කොට කාරා බිමට දමාපියා තී පිසමන් නො දන්නා කල නො දනිම්යි තබා නො පියා. කියිකලෙකත් අප හා තොප හා වෛරයක් නැත. මා සන්තක දෙය මෙසේ වනසන්නට කාරණා කිම්දැයි කිපියා සේ හහවා කැඳත්, බතුත්, කැවුමුත් එක්කොට ලාලා තලපසේ මිරිකා පියා අමරාදේවීත්. ඉස සිට දෙපල්ලට ගල්වා දොර අවුවේ ඉදුවයි වදාළසේක.

එබසට අමරා දේවින්දෑ නොකිපිම යහපත ස්වාමීනි!යි. කියා ගොසින් අවුවේ උන්දුය. එවේලෙහි ඔවුන් අමාතිවූ බව දැන සොඳුර! මෙසේ එවයි වදාළසේහ. දෙබසක් නොකියාම එක බසින්ම මහතාණන් දිසාවට නැමී නැමී යටැසින් බල බලා සාදරව අවුත් සමීපයෙහි ඇඳ පැද නොවී කිසි දෙම්නසක් නැතිව සිටියදැය. එවේලෙහි බොධිසත්වයන් වහන්සේ පළමු එන ගමනේ ම මසුරන් දහසක් හා යහපත් පිළියක් හා බුලත් පයියෙහි ලාගෙන ආසේක් ඒ කඩ බුලත් පයියෙන් මැත්කොට ගෙන අමරාදේවින්දෑ අත තබා සොඳුර! තොපගේ යෙහෙළියන්

හා එක්ව ගොසින් නා පියා තෙලෙ කඩ හැඳගෙන එවයි වදාළ සේක් දේවීන්ද්‍ර ඔබ වදාළ පරිද්දෙන් ගොසින් නා පියා අවුත් සිටියාහ.

සජීවී සාධකවූ චින්තාමාණික්‍යයක් බඳුවූ මාගේ බෝධිසත්වයන් වහන්සේ ගෙත්තමින් උපදවා ගත් මසුරන් දහසත් එන කල ගෙනා මසුරන් දහසත් අමරාදේවීන්ගේ මවුපියන්ට දෙවාලා නුබත්, නුබගේ දුවණියනුත් රැකලන්ට තරම් එකෙකිම්යි කියා නැඳි මයිලන් අස්වසාලා අමරාදේවීන් කැඳවාගෙන නුවරට ගොස් තවත් විමසන පිණිස වාසල බලන එකකුගේ ගෙයි රඳවාලා ඒ දොරටුපාලයාගේ අඹුවට වූ නියාව කියාලා තමන් වහන්සේගේ ගෙට ගොසින් ඉතා ව්‍යවසපිත වූ නුවණැති පුරුෂයකු කැඳවාලා එම්බා කුඩෙනි! අසවල් ගෙයි කුමාරිකාවක රඳවාලා ආමි. මේ ලොව අකාක් මස්සක් නිසා අප්‍රිය කොතෙක් නම් නැත. තෙපි මේ මසුරන් දහස ගෙනගොස් උන් පරීක්‍ෂාකොට පියා එවයි කියා යවූසේක.

ඒ පුරුෂයා මසුරන් දහස ගෙන ගියේ නොයෙක් පරිද්දෙන් යාඥ කොට ගිවිස්වා ගත නොහී ඕහට දේවී කියන්නාහු තොපිත් තාගේ මසුරන් දහසත් මාගේ ස්වාමීන්ගේ පයෙහි රජසකුත් නොවටනේයයි කියා නොගිවිස්සාහ. ඒ පුරුෂයා ගොසින් තත්වූ පරිද්දෙන් බෝධිසත්වයන්දූට දැන් වීය. ඔබ ඉනුත් නො නැවත තුන්වාරයක පුරුෂයන් තුන් දෙනෙකු හා දසින් බඳ පියලි තුන්වරෙක යවාපියා සැබවින්ම නො ඉවසූ බව අසා සතරවන වාරයෙහි වදුරනසේක් උන් නේනත් අත අල්වා හයාගෙන එවයි වදාළසේක. ගියාවූ පුරුෂයෝ දේවීන් නො කැමති කරවා අලුත කර බාන ලූ කුළු නැඹක අඳනාසේ ඇදගෙන ආහ.

එවේලෙහි බෝධිසත්වයන්වහන්සේ මහ සම්පත පිහිටා සිටි හෙයින් දේවී ඔබ හැඳින ගත නොහී මුහුණ බලා සිනාසී නැවත අඬාපීය. ඒ දැන වදුරනසේක් තොප පළමු සෙන්ටත්, දෙවෙනිව අඬන්ටත් කාරණා කිම්දැයි වදාළසේක. ඉක්බිති දේවී කියන්නාහු මම සෙන්තෙම් නුබවහන්සේගේ සම්පත් බලා මේසා මහත් සම්පත් නිකම් අකාරණයකින් ලද දෙයෙක් නො වෙයි. යටගිය දවස යහපත්ව කළාවූ සුචරිතයකින්ම ලත් දෙයෙක. එබැවින් කුසල්ම මෙසේ යහපත් දෙයෙක්ම වනැයි සමාධිව සිපීම්යි කීහ,

නැවත අඩන්තෙම් අනුන් විසින් රක්‍ෂිත ගොපිතවූ අනුන් සන්තක වස්තුවෙහි කළ ලොභයෙන් උදුරාගෙන ඒ පව්න් අපායෙහි දුක් විඳිනාහයි සිතා නුඹවහන්සේ කෙරෙහි කරුණාවෙන් ඇඬීම්යි කී කල්හි අහෝ! මුන් අපටත් වඩා බණ දන්නා කෙනෙකැයි උන්දෑ ඉතා පිරිසිදු බව දැන යව, තුලුන් ඔබම ලා පියා එවයි යවා නැවත තමන් වහන්සේ සන්නාලි වෙසින් ගොස් ශ්‍රී උන්දෑ ලඟ සැතපී දෙවන දවස් උදෑසන රජගෙට ගොස් උදුම්බරාදේවීන්ට එපවත් කී කල්හි එවිට දේවී රජ්ජුරුවන්ට කිහ. රජ්ජුරුවන්ගේ විධානයෙන් ඒ සා මහත් සත් යොදුන් මියුලුනුවර දිව්‍යපුරයක්සේ නො යෙක් පරිද්දෙන් සරහා අමරාදේවීන් සියලු කිසෝ පලඳනාවෙන් සදා පහදා රන්දජ නහා විසිතුරු කොට සරහා නිමවනලද උතුම්වූ මඟල රථ වාහනයෙක්හි වඩා රථයේදී දේවීන් උනගොත් අමරාදේවීන්දෑ කැළිබවත්, එළලිබවත්, උස්බවත්, මිටිබවත්, රූ ඇතිබවත්, නැතිබවත් නුවර වාසීන්ට නොදැනෙන්නේ වේදැයි. සිතා දේවීන්ගේ රූප විලාසය නුවරවාසීන් සුවසේ දක්නා පරිද්දෙන් රථයෙහි සිටුවා. දෙවතාවන් හා සමග දිව්‍ය වීථියෙහි නමාගත් තරුණ දිව්‍ය ස්ත්‍රියක් පරිද්දෙන් මහා පෙරහරින් මඟුල්කොට ගෙනවුත් පාවාදුන්හ.

බොධිසත්‍වයන් වහන්සේගේ සරණ මඟුලට රජ්ජුරුවෝ එකී එකී වස්තුවෙන් දහස්ගණන් මිල වටනා පඬුරු යවූහ. රජ්ජුරුවන් ආදිකොට වාසල බලන්නාවූන් ඇතුළුව ගොපල් ලන් දක්වාත් ඒ සා මහත් මියුලු නුවර වාසීන්ගෙන් පඬුරක් නොගෙන ගිය එකද සත්‍වයෙක් නැත. අමරාදේවීන්දෑ රජ්ජුරුවන් යවූ පඬුරු සමයෙහි දෙකක් කොට බෙදා එක් භාගයක් ගෙට ගෙන. අනික්භාගය රජ්ජුරුවන්ටම යවූදැය. මෙම ක්‍රමයෙන් උදුම්බරා දේවීන් ඇතුළුවූ සියලු නුවර වාසීන් ගෙනා ගෙනා පඬුරු ඇරියේ දෙකක් කොට බෙදා උන් උන්ටම නැවත යවා ඒ සා මහත් මියුලු නුවර වාසීන් හැම දෙනම එක දවසින්ම එක ඇසිල්ලෙහි ම සිත් ගත්සේක.

එවක් පටන් තුන්ලොවට ඇසක්වැනි මාගේ බොධිසත්‍වයන් වහන්සේ අමරාදේවීන් හා සමග සව්සථයෙන් වාසය කරනසේක් රජ්ජුරුවන්ට අර්ථයෙන් හා ධර්මයෙන් අනුශාසනා කරනසේ ක.

එසමයෙහි නැවත එක් දවසක් සෙනකයා පුක්කුසය, කාවින්දය, දෙවින්දය, යන පණ්ඩිතවරුන් තුන්දෙන තමා සමීපයට ආවුන්ට කියන්නේ පින්වත්නි! පෙර අපි ගොවියා පිත්

මහෞෂධ පණ්ඩිතයන්ටත් නො සෑහෙම්හ. දැන් ඔහුවිසින් ගෙනා අඹුවත් ඔහුටත් වඩා නුවණැත්තීය. යම්කිසි උපදෙශයකින් රජ්ජුරුවන් කෙරෙහි ඔහු බිඳුවා පියම්හයි කීය. ආචාරීනි! නුඹ මූත් අපි කුමක් දනුමෝද්ද යි කීහ. එන්නාට! කොල! නොසි තව, එක් උපායෙක් ඇත. මම රජ්ජුරුවන් පළඳනා මැණික සොරා සඟවා ගෙන එමි. පුක්කුසය, තෝ රන්මාලාව හැරගෙන. කාමින්‍දය! තෝ පොරෝනා පලස හැරගෙන, දෙවින්‍දය! තෝ රන් මිරිවැඩි සඟල හැරගෙනැයි මන්ත්‍රණය කොට මේ අනඝිවූ වස්තු සතර, සතරදෙන උපායෙන් සොරා හැරගෙන සැල නොවන නෙක්ම නැවත ගොවියා පුතුගේ ගෙට යවා පියම්හයි කියා සෙනකයා තමා සඟවාගත් මැණික මෝරු කළයක ලා කෙල් ලක අත යවන්නේ ඈට මෙසේ උගන්වා. එම්බල! මේ මෝරු කළය බැහැරින් කිසි කෙනෙකුන්ටත් නොදී මහෞෂධ පණ්ඩිත යන්ගෙන් උන් සනාතක්වූ යම් කෙනෙක් ගතිත් නම් බොරු අතිකක නොවක්කොට කළය පිටින්ම දී පියා එවයි කියා යවීය.

ඒ කෙලිත් බොධිසත්‍වයන් වහන්සේගේ ගෙදොරටම ගොසින් මෝරු ගන්ව මෝරු ගන්ව යි කිය කියා එතෙතින් ඔබට නො ගොස් ඇත් මෑත් බල බලා ඇවිදිනී ය. අමරා දේවීන්ද්‍ර දොර සිට මේ ක්‍රියාව දැක සිතන්දැයි සැබවින් මෝරු විකුණන එකක් වූ නම් මෝරු ගන්වයි කියාගෙන පලායන බවමුත් එක තෙනක නොසිටිනීය. මෝ අතික් තෙනකට නොගොස් මෙතෙනම සිට මෝරු ගන්වයි කියයි. මේ කලි එක් වඤ්චාවක් සැටියයි. සිතා ළඟ සිටි කෙල්ලන්ට ඉඟි ලා ඇත් මෑත් යවාපියා තමන් දූම ඒ කෙල්ලට මෙසේ එව මැණියෙනි! අපි මෝරු ගනුම්හයි කියා කැඳවා ඈ එතෙනට ආ කල්හි තමන්දූගේ කෙල්ලන් කැඳවා ඒ කෙල්ලන්ට පළමු ම මා කැඳවූවත් නෙපි නොඑව්යයි ඉගැන් වූ හෙයින් බැණවුවත් මුවෙන් නොබැණ ඒ කෙල්ලන් සැඟවී උන්කල්හි යව දූරිය! අපගේ කෙල්ලන් කැඳවා ලවයි මෝරු ගෙනාවිය ම යවා කළයට අත බහා මැණික දැක නොහ හවා සිටිදැය.

නැවත ආ තැනැත්තියට මැණියෙනි! තොප කාගේදැයි විචාරා සවාමීනි! සෙනක පණ්ඩිතයන් වන්සේගේයයි කී කල්හි නෙපි කිනමුද? තොපගේ මැණියෝ කිනමුදැයි විචාරා ගෙන එසේ වීනම් මිල ගෙන දෙවයි කිවුය. ඇයවිසින් සවාමිනි! නුඹ වහන්සේ මෝරු ගන්නාකල මට මිලයෙන් ප්‍රයෝජන කිම්ද?

කළයෙන් ම ගෙන වදාළ මැනවැයි දුන් කල්හි එසේ වී නම් යවයි ඇය එතෙකින් යවා වෛදෙහ රජ්ජුරුවන්ට මෙවනු, අසෝ මස, මෙනම් වක් ලද මෙ නම් දවස, සේනකාචාරීන් තමන් මෙ නම් කෙල්ලගේ දූ වූ මෙනම් කෙල්ල අත රජ්ජුරුවන් පළඳනා මැණික මා සිත් ගන්නා පිණිස එවූ පඬුරු යයි පත ලියා තබා ගත් සේක.

නැවත පුක්කුසයා රන්මාලාව ද, සමන් මල් කරඬුවෙක ලා යවී ය. කාවින්දයා පොරෝනා පළස පලා පැසක් ඇතුළේ ලා යවී ය. දෙවින්දයා රන්මිරිවැඩි සඟල යව කැරැල්ලක ලා බැඳලා යවී ය. මෙකී වස්තු සතර ගෙනා උන් උන්ගේ නම් පළමු පරිද්දෙන් ලියාගෙන ඒ වස්තු සතරත්, ලියා ලූ පතුත් බොධිසත්වයන් දක්වාලා තුබූ සේක.

ඉක්බිති පණ්ඩිතවරු සතර දෙන රජගෙට ගොසින් කිමෙක් ද ? දෙවයන්වහන්ස ! මැණික නො පළඳිනේ ඇයි දැයි කීහ. පළඳිමි, ගෙනව යි කී කල්හි සොයා ගියාහු මැණික නුදුටුවාහ. අතිකුත් රන්මාලාවය, පළසය, මිරිවැඩිය යන වස්තු සතර නුදුටුවාහ.

නැවත සතර දෙනාම කියන්නාහු රජගෙට බැහැරින් සොරු නොවදනාහ. ඒ ගත්තෝ ඉතා නන්වැසි කෙනෙක්ම ය. අනේ ! අනේ ! මිනිසුන් අදහා ගත නො හැකි නියා යයි කීහ. ඒ ගත්ත වුන් දනුවයි කී කල්හි නො දන්නේ ඇයි ද ? අපි වන්නා ඒ තත්වය ඉඳුරා යහපත් ව දනුම්හ. නුඹවහන්සේ නො දන්නා සේක් ද ? නුඹවහන්සේගේ වස්තු සතරම මහෞෂධ පණ්ඩිතයන්ගේ ගෙහි ය. සොරා ඇරගෙන ගොස් තෙමේ පළඳනේ ය. දැන් නුඹවහන්සේට පෙරළී රාජ්‍යය ප්‍රාර්ථනා කෙරෙයි. තව නො බෝ දවසකින් නුඹවහන්සේටත් වරදනේ වේදැයි කියා රජ්ජුරුවන් බිඳුවං පීහ.

ඉක්බිති බොධිසත්වයන්වහන්සේ තමන්වහන්සේට හිත වූ අර්චාරකයන් අතින් එපවත් අසා රජ්ජුරුවන් දුටු විට කියන් තෙම් වේ දැයි රජ ගෙට ගියසේක. ආ නියාව අසා රජ්ජුරුවෝ කිපී මීට එන්නේ මෙවිට කුමක් කරන්ට දැයි තමන් දක්ම නො කැමති වූහ. බෝධිසත්වයන්ද රජ්ජුරුවන් කිපී බව දැන තමන්වහන්සේගේ ගෙටම ගියසේක. රජ්ජුරුවෝ ද කොල ! ගනුවයි නියෝග කළසේක. එයිදු තමන්වහන්සේට වැඩ හැසිරෙන්න

වුන්ගෙන් අසා මෙතෙතින් ඉවත්ව ගැන්ම යහපතැයි සිතා අමරාදේවීන්දෑට කියා අප්‍රසිද්ධ වෙසින් නුවරින් නික්ම දකුණු දිග යවමැදුම්ගම්හි කුඹල්ගෙයක කුම්භකාරයාට අත වැසි ව ජීවත්වනසේක.

නුවර මුළුල්ලෙහි ම පණ්ඩිතයෝ පැලූහයි එකකොලාහල විය. සෙනකයා ආදි වූ පණ්ඩිතවරු සතරදෙන උන්වහන්සේ පැලූ බව දැන අමරාදේවීන්දෑට කියා යවන්නාහු වැලිත් තමන් පණ්ඩිතයෝ ගියෝ වේ දැ යි ශොක නො කළ මැනව. ඇයි! අපි නො පණ්ඩිතයෝමෝ ද? කිසි උකට ලියක් ම නුව මැනවැයි සතරදෙන ඔවුනොවුන් නො දන්නා පරිද්දෙන් වෙන වෙන ම පඬුරු යවූ හ.

සතරදෙනාගෙන් ම යවූ පඬුරු ම කිසි වක්‍රකමක් නො හඟවා සොම්නසින් පින පිනා හැරගෙන අසෝ මස, අසෝ අසෝ වේලෙ එන්නේ යයි කියා දෙන්නෙකුට එක වේලාවක් නො කියා වෙන වෙන ම වේලා නියම කොට ලා දැඩිතර පුරුෂයන් ගණනක් සඟවා සිටුවා ගෙන තම තමන්ට නියම කළ වේලෙහි ම ආවාවුන් අල්වා ගෙන අනුන්ගේ බිරින්දයක් උන්. නෙනට යන්නා තබා සිතිනුත් නො සිතම්හ යි යන පරිද්දෙන් අතින් පයින් තළා වලා පණ නො යන පමණෙ තබාලා ඒ මදින් දෙ නැවත ඉසකේ සුඟක් පැන් නොගා කරයකින් මුල සිඳම ගා ඇරපියා, එයිදු මදින් වැලමිටි දෙක පිටින් හයා[1] ළය පැළීයන්නාසේ පිටිතල හයා බැඳ, එයින් උන්ට මදයි සිතා පරණ මඩෝරාවලෙක්හි සකස් කොට ගලාලා මාලිගාවෙන් පිටත අපවිත්‍ර වූ එක් ස්ථානයෙක්හි රුකවල් ලවාලා පාන්වූ කල පැදුරු රෙදිවල හා පැස්මාලුවල හොවා වසා බඳවා හූරු බැම්මෙන් උන් සතර දෙනා තඹින් ගෙන්වා ගෙන බොහෝ නිලමැසි සමූහයන් පිරිවරන ලදුව ඔවුන් හා සමඟ රුවන් සතරත්, ලියා ලූ පතුත් ගෙන්වාගෙන රජ්ජුරුවන් සමීපයට ගොසින් එකත් පස්ව සිට දෙවයන්වහන්ස! මහෞෂධ පණ්ඩිතයෝ සොරු නො වෙති. නුඹවහන්සේගේ සොරු නම් මොහු සතර දෙනය. ඉනුත් සතර දෙනාගෙන් සෙනකයා මැණික් සොරාය. පුක්කුසයා රන්මාලා සොරාය. කාවින්දයා පලස් සොරාය. දෙවින්දයා රන්මිරිවැඩි සොරාය. අසෝ මස, මෙනම් වක් ලද මෙනම් දවස් මෙනම් කෙල්ලකගේ දූ මෙනම් කෙල්ලකගෙ අත මට සතුටු පඬුරු පිණිස යවූහයි එදවස් ම මා ලියා තබාගත් පතුත් බැලුව මැනව. නුඹවහන්සේගේ සොරුන්පාවා ගත මැනව. රුවනුත් පාවාගත මැනව. තෙලෙ ඉතා ව්‍යවස්ථිත වූ සෙනකාචාරීන් වහන්සේ ආදි වූ පණ්ඩිතවරුන් සතර දෙනාත් පාවාගත මැනවැයි කියා පාවා දී රජ්ජුරුවන්වහන්සේ වැඳ පැදකුණු කොට සමුගෙන තමන්දෑගේ ගෙට ම ගියාහ.

---

1 සංසාවපරිද්දෙනා

ඒ පණ්ඩිතවරුන් සතරදෙනා හා බොහෝ දවසක් පුරුදු රජ්ජුරුවෝ පවා මහාවිප්‍රකාරයට පමුණුවාපී හෙයින් ඇඳින ගත නොහී අමරාදේවීන්දු කී හෙයින් ම ඇඳිනගත්හ යී දතයුතු.

රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්දු පැලා විසින් හා මේ පණ්ඩිත ජඩකොල්ලන්ගේ බසින් උන්වහන්සේ මහෞරහි නිස්කාරණයෙන්[1] තමන් සැක ඇතිහෙයින් අතික් තමන්ගේ නුවර නුවණැති පණ්ඩිත කෙනකුත් නැතිහෙයින් උන් සතරදෙනාට කිසිවකුත් නො කීයා තෙලෙ දුගීඣග පැතිරේ[2] නම් ඉඳුරා ඔවුනොවුන්ගේ සමවායෙන් උලා නාපියා තොප තොපගේ ගෙවලට යව යි සවුදුන්හ.

පරදූර සන්තෝෂයට ගොස් ඉතා අසන්තෝෂයට පැමිණ ඉසකේ බාවාගෙන, සකුපිට හා ඇලපිට ඉලපිට ඇන ගැට ගඩු නංවා බැඳි බැම්මෙන් අතකර හළු හෙලාගෙන ලෙහෙයෙන් රැඳි හිස, දණ, වැලමිටි, තලල් ආදියෙහි රුජා ආදි වේදනායෙන් මහත් වූ පීඩාවට පැමිණ කෙඳිරි ගගා ලජ්ජාවෙන් කරබාගෙන බොහෝ නිලමැසි සමූහයා විසින් පිරිවරන ලදුව සෙමෙන් සෙමෙන් හැලි හැලී ගෙවලට ගියා වූ උන් සතරදෙනා උන් උන්ගේ පරිවාර ජනයා හා අඹු දරුවෝ ඇඳින ගත නොහී උන් උන් අතින් නම් සලකුණු විචාරා දැන කෙසේ නම් සමාධි වූ ද ?

මෙසේ මේ අඥාන වූ ජඩයෝ සතරදෙන ඒ සා මහත් තන තුරෙක පණ්ඩිත ව රාජපූජ්‍යව සිට ඉතා නිරපරාධ කාරුණ්‍යවෙන් වඩනාලද අදහස් ඇති මාගේ සවාමිදරු වූ බොධිසත්ත්වයන් වහන් සේ නසම්හ යි කලාවූ මන්ත්‍රණයෙන් "වරකා කන්ට උන් මැස්සන් වරකා තබා එහි ලායෙහි බැඳී තමා ගැලවී ගත නුහුනුවාසේ" තුමූම ප්‍රමාණාතික්‍රාන්ත වූ මහාව්‍යසනයට පැමිණියාහ.

ඉක්බිති රජ්ජුරුවන්ගේ ධවලච්ඡත්‍රයෙහි අධිගෘහිත වූ දෙවතා දූ බොධිසත්ත්වයන්වහන්සේගේ ඉතා මධුර වූ ධර්මදෙශනායෙහි ධර්මිෂ්ඨ කථා නො අසන්නී මීට කාරණා කිම් දෝ හෝ යි පරීක්ෂා කරන්නී මේ කොල්ලන්ගේ බසින් රජහු කිපිහෙයින් පැලෑබව දැන පණ්ඩිතයන් ගෙන්වා ගන්නා උපායක් සිතා රාත්‍රි භාගයෙහි කුඩ[3] පුඩුවෙන් පිටත් වෙලා සිට රජ්ජුරුවන්ට චතුෂ්ක නිපාතයෙහි දෙවතා ප්‍රශ්නයෙහි ආ නියායෙන් "හනති හත්ථෙහි පාදෙහි" යනාදීන් ප්‍රශ්න සතරක් විචාළීය. රජ්ජුරුවෝ එහි අර්ථය දැනගත නොහී මම නොදන්මියි පණ්ඩිතවරුන්

1 නිෂ්කරුණායෙන් 2 පැටිෂෙව් නම් 3. දළ පුඩුවෙන්

විචාරා කියා ලම්යි එක දවසකට අවසර ඉල්වා ගෙන දෙවන දවස් සෙනකාදී පණ්ඩිතවරුන් කැඳවා යවූහ.. ඔහු නැවත කියා එවන්නාහු මහරජ ! අපි කුරමූඩයම්හ. එබැවින් විපියට බස්නට ලජ්ජා ඇත්තම්හයි කියා තො අා කල්හි ඉස්පයි සතරක් යවා තෙලෙ ඉස ලා ගෙන එන්නේ යයි කියා යවූහ. එතැන් පටන් ඉස්පයි ඇතිවී යයි. දතයුතු.

ඔහු සතරදෙන ඉස්පයි ඉස වසා ලාගෙන පොරට එන මල්ල වයන් සේ ලජ්ජාවෙන් කරබාගෙන අවුත් රජගෙට වැද පනවන ලද ආසනවල උන්හ. ඉක්බිති රජ්ජුරුවෝ කියන්නාහු සෙනකය! සේසත අධිගෘහිත වූ දෙවතා දූ රාත්‍රියෙහි මා අතින් ප්‍රශනයක් විචාළී ය. මම ඒ නො දන පණ්ඩිතවරුන් විචාරා කියම්යි කීමි. ඒ ප්‍රශනය කියවයි කියා දෙවතා දූ කී පරිද්දෙන් පළමුවන ප්‍රශනයෙහි ගාථාව කියන්නාහු

හනති හත්‍ථෙහි පාදෙහි, මුඛඤ්ච පරිසුම්භති[1]
ස වෙ රාජ! පියො හොති කං තෙන මභිපස්සසී'ති.

මේ ගාථාවෙන් දෙවතා දූ විචාළේ නම් අතින් අනිති. පයින් අනිති. මූණ අත් සපති. ඉසකේ ඇද කඩති. ඒ ගෙඩි කන්නෝ ගෙඩි දෙන්නවුන්ට ඉතා ප්‍රියවෙති. රජ්ජුරුවෙනි! තොපි උන් කවුරුනැයි දනුද ? ගෙඩි දෙන්නෝ කවුරු ද ? ගෙඩි කන්නෝ කවුරු දූයි යනු මෙහි අභිප්‍රා යයි.

මේ ගාථාව ඇසූ සෙනකයා "කං හනති කිං හනති" කවුරු අනිද්දෙ කවුරු මරද්දෝ යනාදීන් තන් දෙඩන්නකුසේ තමා සාටට ආවාක්ම දෙඩා අග මුල දූන ගත නොහිත. සෙස්සෝ කරබාගෙන බැණ නො නැගී උන්හ. රජ්ජුරුවෝ කලකිරී කිසිවකු ත් නො කීහ.

නැවත රාත්‍රිභාගයෙහි දෙවතා දූ අවුත් ප්‍රශන විචාළ කල්හි රජ්ජුරුවෝ කියන්නාහු මා විසින් පණ්ඩිතවරු විචාරන ලද. ඔහු දූන ගත නුහුනුවහයි කීහ. එබසට දෙවතා දූ කියන්නී ඒ කොල්ලෝ කුමක් දනිද් ද ? මහෞෂධ පණ්ඩිතයන් විනා මේ ප්‍රශනය කියන්ට සමර්ථ කෙනකු මේ එක සක්වළ තබා දසදහස් සක්වළත් මිනිසුන් කෙරෙහි ම නැතැයි කිව. මෙසේ ද කියා නැවත කියන්නී ඉදින් ඒ පණ්ඩිතයන් උන් තෙනකින් ගෙන්වා මේ ප්‍රශනය කියවා නූලූනම් මේ ගිනි ගෙන දිලියෙන යකුළින් තොප ඉස සත් කඩක් කොට පළා ලම් යි රජ්ජුරුවන් තරව භය ගන්වා නැවත කියන්නී මහරජ ! ගින්නෙන් ප්‍රයෝජන ඇත්තවුන් ගිනි නිබිය දී කනමැදිරියන් පිම්බාසේ

---

1 චුම්භති

කිරෙන් ප්‍රයෝජන ඇත්තවුන් කිරි පිරුණු බුරුලු බල බලා අඟ ඇද කිරිදෝනා සේ තොපපිසින් කළදෑත් ඒ හා තො සම දෑයි කියා පඤ්චසතිපාතයෙහි බජ්ජාපනක ප්‍රශ්නය දෘෂ්ටාන්ත කොට කියන්නී ගාථා පසක් කිවු ය.

කො නු සන්තම්හි පජ්ජොතෙ, අග්ගි පරියෙසනං චරං
අද්දක්ඛි රත්තිං ඛජ්ජොතං, ජාතවෙදං අමඤ්ඤථ.

ස්වා'ස්ස ගොමයචුණ්ණානි, අභිමත්ථං තිණානිච
විපරීතාය සඤ්ඤාය, නාසක්ඛි පජ්ජලෙතවෙ.

එවම්පි අනුපායෙන, අත්ථං න ලභතෙ මගො
විසාණතො ගවං දොහං, යත්ථ ඛීරං න වින්දති.

විවිධෙහි උපායෙහි, අත්ථං පප්පොන්ති මානවා
නිග්ගහෙන අමිත්තානං, මිත්තානං පග්ගහෙන ච

සෙණිමොක්ඛූපලාභෙන, වල්ලභානං නයෙන ච
ජගතිං ජගතීපාලා, ආවසන්ති වසුන්ධරන්ති'ති.

මහරජ ! ගින්නෙන් ප්‍රයෝජන ඇති තොපසේ ඉතා නුවණ මඳ පුරුෂයෙක් ගිනි සොයා ඇවිදිනේ ඇවිලෙන්නාවූ ගිනි ඇසින් බල බලා පැයෙන් ගිනි පුපුරක් වැන්නැයි වරදවා සිතා තත් පමණකින් මේ ඒකාන්තයෙන් ගිනිම ය යි සිතා කනමැදිරි යකු අල්වාගෙන කනමැදිරියා මත්තෙහි ගොම්වැරටි පිදුරු තණ පරඩලා ආදී වූ දෙය නුසුඹ[1] කොට අතින් ගටාලන්නේ දෙදන බිම ඔබාගෙන සුබුක්ක. පැළී යන්නාසේ ඇස් රත්වන තුරු පිඹ මහාඋත්සාහ කොටත් කවරනම් නුවණින් අඬවූ පුරුෂයෙක් අනුපායෙන් ගින්නෙන් විත්ද මනා ප්‍රයෝජන කනමැදිරියා ගෙන් විඳගනී ද ?

තෙපි රජ්ජුරුවෙනි ! අඟ කිරි නැති නියාව දූන දූන අගින් කිරිදෙනකු වැන්නාහ. තරාදිය තිබැදී අතින් කිරන්නකු වැන්නාහ. එසේ හෙයින් මේ පොළෝතෙලෙහි රජකම් කරන්නා වූ රජදරුවන් විසින් සතුරන්ට නිග්‍රහ කිරීම ද මිතුරන්ට සංග්‍රහ කිරීම ද, තමාට වැඩ හැසිරෙන්නා වූ නුව ණැත්තවුන් හා එක්ව හජනය කිරීමදැ යි මෙසේ නොයෙක් උපායෙන් ම රජ කරන්නේම ය. එබැවින් තොප වැන්නන්ට කවර නම් කලක වැඩෙක් වේදැයි කියා දූන් මෙබඳු ඉතා ගම්භීරවූ ප්‍රශ්නයක් සේනකයා වැනි නුවණ නැති අඬයන් අතින් විචාරව. ඒ සේනකාදී සතරදෙන කනමැදිරියන් වැන්නාහ. මහෞෂධ

---

1. සුණු

පණ්ඩිතයෝ නම් ප්‍රඥයෙන් මහා ගිනිකන්දක් හා සමානයහ. ඔවුන් උන් තෙනකින් ගෙන්වා මේ ප්‍රශ්නය කියවාලව. ඉදින් එසේ නො කෙළේ නම් ප්‍රශ්නය නො කීවාවූ තොපගේ ජීවිතය නො සිතවයි තරව භය ගන්වා අන්තර්ධාන වූ ය.

ඛජ්ජෝපනක ප්‍රශ්නය යි

ඉක්බිති රජ්ජුරුවෝ මරණ භයින් භය පත්වූවාහු දෙවන දවස් අමාත්‍යයන් සතර දෙනකු කැඳවා සගයෙනි ! තොප සතර දෙන රථ සතරකට නැගී සතර වාසලින් නික්ම ගොස් මපුත ණුවන් මහෞෂධ පණ්ඩිතයන් යම් තෙනෙකදී දුටු නම් එතෙනදී උන්ට සත්කාර කොට වහා කැඳවාගෙන එවයි කියා යවූහ. ඒ ගිය සතරදෙනාගෙන් තුන්දෙනෙක් බොධිසත්වයන් නුදුටු වාහ. දකුණුදිගවාසලින් ගියා වූ පුරුෂයා වනාහි දකුණු යව මැදුම්ගම කුඹලාට මැටි ඇදලා වලන් ඉදිකරන්ට සක ඇදලා මැටි වැකි ශරීරයෙන් ම පිදුරු බිසසක් පිට හිඳ මාළු නැති යව සාලේ බත් මිටි මිටි කොට කන්නවුන් දිට. එසේ වූ නොතරම් කටයුත්තක් කුමක් පිණිස කළසේක් ද යත් ? මහෞෂධ පණ්ඩිතයෝ වනාහි මහානුවණැත්තෝ ය. ඒකාන්තයෙන් රාජ්‍යය ඇරගනිතියි රජ්ජුරුවෝ සැක ඇත්තාහ. කුඹලාට මෙහෙ කොට ජීවත් වෙතියි ඇසූ කල සැක නො කරන්නෝ වේ දැයි සිතා මෙසේ කළසේකැයි දතයුතු.

සවාමිදරුවාණෝ ඒ අමාත්‍යයා තමන්වහන්සේගේ සමීපයට ආ නියාව දැන මාගේ සම්පත් නැවත මටම පිහිට වන්නේ ය. මෙවිට අමරාදේවීන් විසින් ඉදිකරන ලද අනගි රසමසවුලෙන් යුකත අග්‍රභොජනයම් අනුභව කෙරෙමියි සිතා අතින් ගත් බත් පිඩ එලාපියා නැගී සිට මුව ශුද්ධ කළසේක. ඒ ක්ෂණයෙහි අමාත්‍යයා අවුත් වන්නේ ය. වැලි, ඒ අමාත්‍යයාත් සෙනකයා පක්ෂ එකෙක. එසේ හෙයින් බොධිසත්වයන්ට ගටා කියන්නේ අපගේ සෙනකාචාරීන්ගේ බස් ඉතා සබාම ය. කාරණා කිම්ද යත් ? නුඹවහන්සේ මේසා යසසින් පිරිහුනුවන්ට මෙබඳු නුඹ වහන්සේගේ මහා සාගරයසේ වූ ප්‍රඥාව පිහිට නුවූයේම ය. දැන් මැටි වැකි ශරීරයෙන් පිදුරුබිස්සක් පිට හිඳ නුඹවහන්සේගේ වහලකටත් නො තරම් වූ මෙබඳු මාළු නැති යව සාලේ බත් කෑසේක් දැයි දසනිපාතයෙහි භූරිප්‍රශ්නයෙහි පළමුවන ගාථාව කීය.

සච්චං කිර ත්වම්පි භූරිපඤ්ඤ,
යා තාදිසී සිරි ධිති මුතීච
න තායතෙ භාවවසූපනීතං,
යො යවකං භුඤ්ජසි අප්පසූපනති.

මෙ ගාථාවෙන් කියන්නේ අලාමක වූ ප්‍රඥා ඇති පණ්ඩිත යෙනි! නුඹවහන්සේගේ ඒ සා මහත් යසස ද, කීර්තියද, ධෛර්‍ය්‍යය ද, අනෝපමෙය්‍ය වූ ප්‍රඥාව ද, ඉතා නිඃශ්‍රීකවූ මාළු නැතිව මේ කන්නාවූ යව සාලේ බතට පිහිට නො වූයේ මැයි නින්දා කොට කීය.

ඉක්බිති බෝධිසත්ත්වයන්වහන්සේ වදාරනසේක් එම්බල නුවණ නැති ජඩය! මම මාගේ ප්‍රඥාබලයෙන් මාගේ සම්පතෙහි පිහිටා ගන්නා පිණිස මෙසේ දුක් ගනිම්යි වදාරන සේක් ගාථා දෙකකින් වදාළසේකි.

සුඛං දුක්ඛෙන පරිපාචයන්තො,
කාලාකාලං විචිනං ඡන්දඡන්නො
අත්ථස්ස ද්වාරානි අවාපුරන්තො,
තෙනා'හං තුස්සාමි යවොදනෙන.

කාලඤ්ච ඤත්වා අභිජීහනාය,
මන්තෙහි අත්ථං පරිපාචයිත්වා
විජම්හිස්සං සීහ විජම්හිතානි,
තායිද්ධියා දක්ඛසි මං පුනාපී'ති.

යන මේ ගාථාවෙන් වදාරනසේක් එම්බල! මට ඉදිරිවන්නා වූ සැපය දුක් ගෙන සොයන්නෙමි. කල් නො කල් පරීක්‍ෂා කොට සංහවනලද අදහස් ඇත්තා වූ මම මාගේ සම්පත් ඔවා ගන්නා දොර හරවා ගන්නාතෙක් මෙසේ නොමිහිරි වූ යවසාලේ බතින් සතුටු භාවයට පැමිණෙම්යි වදාළසේක. මෙසේ ද කියා නැවත වදාරනසේක් එම්බල ජඩය! මේ සැහවී ඇවිදිනා කල, මේ නො සැහවී ඇවිදිනා කල යැයි කල් නො කල් ඉඳුරා දන්නා වූ මම මාගේප්‍රඥාබලයෙන් නැවත එම අර්ථයෙහි පිහිටා මා අභීත කේසර සිංහරාජයකුසේ මෙම නුවර විජෘම්භනය කොට ඇවිදිනා නියාව නොබෝ කලකින් තෝම දක්නෙහි වේ දැයි වදාළසේක.

ඉක්බිති අමාත්‍යයා කියන්නේ පණ්ඩිතයන්වහන්ස! සේතත අධිගෘහිත දෙවතා දූ රජ්ජුරුවන් අතින් ප්‍රශ්නයක් විචාළීය. රජ්ජුරුවෝ නො දැන සේනකාදී පණ්ඩිතවරුන් සතර දෙනා විචාළහ. ඉන් එකකුත් කියාගත නුහුනුවාහ. එසේහෙයින් රජ්ජුරුවෝ නුඹවහන්සේ කැඳවා එවූහයි කීය. එසේ වීනම් මාගේ ප්‍රඥාවෙහි ආනුභාව තොම දක්නේ වේදැයි එම්බල නුවණින් අන්ධවූ ජඩය! මෙසේ වූ ආපදාවක් පැමිණි කල්හි මහමෙරසා වූ සම්පත කුත් ඒ දුකට පිහිට නො වන්නේම ය. නුවණැත්තෝම පිහිට වන්නාහුයි. ප්‍රඥාවම වර්ණනා කොට අසරණයන්ට සරණවූ ප්‍රඥාවෙන් ගගනොපමෙය වූ ඒ මාගේ ස්වාමිදරුවාණෝ වඩ වඩා මූබ නො සෑහෙන පරිද්දෙන් ප්‍රඥාවම වර්ණනා කළසේක.

ඉක්බිති අමාත්‍යයා එහා ගමනේ රජ්ජුරුවන් විසින් පණ්ඩිත යන් යම් තෙනකදී දිටිනම් නාවා සරහාගෙන තෙලෙ සළුව හඳවා මසුරන් දසින් පූජා කොට කැඳවා ගෙන එව්යි කියා දෙන ලද සළුව හා මසුරන් දහස මං කුලියට දෙන්නාසේ බොධිසත්ව යන් අත තිබිය. එවිට කුම්භකාරයා තෙමෙ මහෞෂධ පණ්ඩිත යන්වහන්සේ වත, මට අතවැසි කම් කලසේක. උන්වහන්සේ අතින් වත, මා මෙහෙ ගත්තේ ය. ඉදිරියෙහි කුමකින් කුමක් වේද්දෝ හෝයි මහත් වූ භයට පැමිණියේ ය. ඔහු හයින් වෙවුලන්නා දූත කාරුණාතිධාතවූ මාගේ ස්වාමිදරුවාණෝ වදුරනසේක්, නො බව, ආචාරීනි! තෙපි අපට බොහෝ උපකාරව සිටියව යි කුඹලා අස්වසා ඕහට මසු දස දී මැටි වැකි ශරීර යෙන් ම රථයෙහි ඉඳගෙන නුවරට වන්සේක.

අමාත්‍යයා රජ්ජුරුවන් සමීපයට ගොස් පණ්ඩිතයන් ගෙනාමියි කිය. දරුව! පණ්ඩිතයන් කොයිදී දුටු දූ යි කිහ. ස්වාමීනි! දකුණු දිග යවමැදුම් ගම කුඹලාට බැල මෙහෙ කොට ජීවත්වනසේක් තුඹවහන්සේ කැඳවූ සේක යනු අසා මැටි වැකි ශරීරයෙන් ම නොනාම ආසේකැයි කිය. ඒ අසා රජ්ජුරුවෝ සිතන්නාහු ඉදින් මට වෛරී වූනම් මහා ඓශ්වර්යයෙන් බල ඇණි පිරිවරා පරිවාර සහිතව ඇවිදිනාහ. උන් මට නිසතුරු තියා යි සිතා මපුතණුවන් තමන්ගේ ගෙට ගොසින් නා බී සැරහී මා විසින් තමන්ට පළමු දෙනලද පෙරහරින් එන්ට කියවයි කිහ.

එපවත් අසා තමන්වහන්සේගේ ගෙට ගොසින් සොළොස් කළයක් සුවඳ පැනින් ඉස් සෝද නාපියා නොයෙක් රසයෙන් අග්‍ර වූ භොජනය අනුභව කොට සර්වාභරණයෙන් සැරහී නො යෙක් රථාලඞකාරයෙන් සරහා නිමවන ලද අති මනෝහර වූ මඞගල රථවාහනයෙක්හි හිඳගෙන නොයෙක් පරිද්දෙන් සැරහී පඤ්චායුධ සන්නද්ධව .ආ සහජාත යොධයන් දහස හා ඉන් පිටත් අනන්ත වූ පදාදි සෙනාවෙන් පිරිවරන ලදුව ඇත්, අස්, රථ සමූහයෙන් ද, බෙර, දාර, සක්, සින්නම් ආදි වූ නොයෙක් කොලාහලයෙන් ද, උපමාතික්‍රාන්ත වූ මහා පෙරහරින් ගොස් රජගෙයි දොරකඩට ආ බව කියා යවා මපුතණුවන් වහා එන්-නට කියව යි කී කල්හි රජගෙට වැද රජ්ජුරුවන් වැඳ එකත් පස්ව සිටිසේක. රජ්ජුරුවෝ සිහිකටයුතු මිහිරි කථා කොට ඉක්බිති බොධිසත්වයන්වහන්සේ විමසන්නාහු මේ ගාථාවෙන් කියත්.

සුඛී හි එකෙ න කරොනති පාපං
අවණ්ණසංසගග භයා පුනෝ'කෙ
පහූ සමානො විපුලතථ චිනතී
කිං කාරණා මෙ න කරොසි දුකඛනති.

මේ ගාථාවෙහි අභිප්‍රාය නම්, පණ්ඩිතයෙනි! සමහර කෙනෙක් සුවපත්ව සිට මෙතෙක් සම්පත් සෑහෙයි කියාත් පව් නොකරන්නාහ. සමහර කෙනෙක් යසදුයක වූ සවාමිහට වැරදිකල බොහෝ දෙනා විසින් ම කලයේ තපුරැයි යන අවණ්සංසගීයෙන් වන්නාවූ පරිභව නමැති ලජ්ජාවෙන් භයපත්ව නො කරන්නාහ. එකෙක් තෙමෙ කිසිවකුත් කොටගන්ට අසමර්ථව නොකරන්නේය. එකෙක් තෙමෙ වස්තුබල සේනාබල ආදිවූ බල ඇත් නමුත් නුවණ මඳහෙයින් උපාය නොදැන කල නො හෙන්නේය. පණ්ඩිතයෙනි! තෙපි වනාහි මහත්වූ ප්‍රඥවෙන් බොහෝ අර්ථයන් සිතාපියහෙන තරම් නුවණැතිවද අර්ථබල, සෙනාබල, කායබල යෙන් අසමානව හෙවත් තොප හා සමාන කෙනකුත් නැතියාව. සිතුවහොත් දස දූසක් යොදුන් දඹදිව රාජ්‍යය අනායාසයෙන් ගෙන එකසේසත් නගා රජකරන්ට පොහොසත්ව සිට කුමක් නිසා මාගේ රාජ්‍යය ගෙන මං දූකට නොපමුණුවාදූ යි කීහ. එබසට බොධිසත්වයන් වහන්සේ මේ ගාථාවෙන් වදරනසේක්.

න පණ්ඩිතා අතන සුඛසස හෙතු
පාපානි කම්මානි සමාචරනති
දුකෙඛන ඵුට්ඨා බලිතනතා'පි සනතා
ඡනදා ච දොසා න ජහනති ධම්මනති.

මේ ගාථාවෙන් වදලේ මහරජ! නුවණැත්තාහු ආත්ම සැපයක් පිණිස පව්කමෙහි නො යෙදෙන්නාහ. අනුන්ට දුක් දී උදුරා ගන්නා සැප නම් ඉතා ලාමක දෙයෙක. එබැවින් සත් පුරුෂයෝ තමන්ගේ සවභාව ධර්මය හැරපියා සම්පතෙහි කල ලොභයෙන් අනුන් කෙරෙහි දොෂ නොකරන්නාහයි වදාලසේක.

ඉක්බිති ක්‍ෂත්‍රිය මායමින් විචාරන්නාවූ රජ්ජුරුවෝ මේ ගාථාවෙන් කියත්.

යෙන කෙනචි වණ්ණෙන, මුදුනා දරුණෙන වා
උද්ධරෙ දීන මතතානං, පචඡා ධම්මං සමාචරෙ'ති.

මේ ගාථාවෙහි අභිප්‍රාය නම්, යම්කිසි කාරණයකින් වත් දූෂිකමකින් වත් මොලොක් කමකින් වත් යමක්හුගෙන් සම්පත් උදුරා පොහොසත්ව සිටගෙන නැවත සත්පුරුෂ ධර්මයෙහි

පිහිටිය හැක්කේ වේදැයි කීහ. එසේ කී රජහට වෘක්ෂෝපමාවක් දක්වන්නාවූ බෝධිසත්ත්වයෝ මෙසේ වදාරනසේකි.

යස්ස රුක්ඛස්ස ඡායාය, නිසීදෙය්‍ය සයෙය්‍ය වා
න තස්ස සාඛං භඤ්ජෙය්‍ය, මිත්තදුබ්භො හි පාපකො'ති.

මෙහි අර්ථය නම් මහරජ! යම ස්ත්‍රියක් වත්, පුරුෂයෙක් වත් යම් රුකක් මුල තමාගේ ශරීරපීඩා සංසිඳුවා සැතපීගෙන නැවත එම ගසින් අත්තක්වත් පතක්වත් බිඳපියේ, විනම් ඒ මිත්‍රද්‍රෝහියාය. ඔහුවිසින් ඒ කළාවූ පාපය ඉතා ලාමකය. ගසින් විඳගත් මහාප්‍රයෝජනයක් නැතිව ගසමුල සැතපුනුමත් ඒ ගසට කළ අපරාධය පාපයයි නිඳුවට පැමිණෙන කල නුඹ වහන්සේ විසින් මාගේ පියාණන්ද ඒසාමහත් ඓශ්වර්‍ය්‍යයෙහි පිහිටු වන ලද, මාද නුඹවහන්සේ විසින් මහත්වූ කරුණායෙන් සත් ඇවිරිද්දෙහි පටන් වඩා මේසානනතුරක් හා අපමණ යසස් දීමෙන් සම්පතින් නුඹවහන්සේ විනා අනික් මා හා සමාන කෙනකුන් නැති නියාව මම් ම රාජ්‍ය පූජ්‍යව සිට නැවත නුඹවහන්සේට අපරාධ කොට කුමක් නිසා මිත්‍රද්‍රෝහි වෙම්දැයි වදාළසේක. මෙසේ කියා මින්ඉදිරියෙහිත් තමන්වහන්සේට රජ්ජුරුවන් කිපියා අපරාධයක් සිතුවත්, තමන්වහන්සේත් ද්‍රෝහයක් නොසිතන නියාව හඟවා නැවත රජ්ජුරුවන්ට චෝදනා කරනසේක්.

යස්ස හි ධම්මං පුරිසො හි ජඤ්ඤා
යෙ යස්ස කඞ්ඛං විනයන්ති සන්තො,
තං හි'ස්ස දීපං ච පරායනං ච,
න තෙන මෙත්තිං ජරයෙථ පඤ්ඤො'ති.

යන මේ ගාථාවෙන් වදාරනසේක් රජ්ජුරුවන් වහන්ස! යම් නුවණැති පුරුෂයෙක් නුවණැති එකක්හට උපන්නාවූ යම්කිසි ශංකාවක්[1] තමාගේ ප්‍රඥාබලයෙන් ඒ ශංකාව දුරුකොට ලා ද එසේ වූ තැනැත්තේ ඔහුගේ මොහ නමැති අන්ධකාරයට ප්‍රදීපයකුත් වන්නේ ය. පරම ප්‍රතිෂ්ඨාවක් වන්නේය. එසේවූ සත්පුරුෂයා හා කරන්නාවූ මිත්‍රකම එක දවසකුත් නොදිරවා චිරාත් කාලයක් ම තර කරන්නේ යයි වදාළසේක. මෙසේද කියා රජ්ජුරුවන්ට අවවාද කරනසේක් මේ ගාථා දෙකක් වදාරණසේකි.

අලසො ගිහී කාමභොගී න සාධු
අසඤ්ඤතො පබ්බජිතො න සාධු,
රාජා න සාධු අනිසම්මකාරී
යො පණ්ඩිතො කොධනො සො න සාධු.

1 සාංසාවක්

නිසම්ම බහනියො කහිරා, නානිසම්ම දිසම්පති
නිසම්ම කාරිනො රාජ! යසො කිත්තී ච වඩ්ඪතී'ති.

මේ ගාථාවෙහි අභිප්‍රාය නම් මහරජ! ගිහිගෙයි වසන්නාවූ උපයා කන පුරුෂයාගෙන් අලස තැනැත්තේ යහපත් නොවන්නේය. පැවිදිව වසන්නාවූ තපස්වීන්ගෙන් අසඤ්ඤතකාරී තපස්වීත් යහපත් නොවන්නේය. කාරණා කාරණා පරීක්‍ෂා නො කොට යමක්හු කී බස අසා නොවිමසා සිතට තහා ගන්නාවූ ඇසූ දුටු දෙයෙහිම වහා කිපෙන්නාවූ රජ්ජුරුවෝ ත් යහපත් නොවන්නාහ. යම් පණ්ඩිතයෙක් එක්වන් ක්‍රොධ වීනම් එයිත් යහපත් නොවන්නේය. දිශානායකවූ රජ්ජුරුවන් වහන්ස! යම් රජෙක් කරන යම් දෙයක්ම නුවණින් යෙදී පරීක්‍ෂාකාරීව කරන්නේ වීනම් එසේවූ රජහුගේ යසසද, කීර්තියද දවසින් දවස පෙරදෙපෝයෙහි සඳමඩල මෙන් වැඩෙන්නේයයි වදාලසේක.

භූරි ප්‍රශනයයි.

මෙසේ කී කල්හි ජනනෙත්‍රරසායනවූ, සකල ජනානන්ද කරවූ මාගේ ස්වාමිදරුවූ තිලෝගුරු බොධිසත්වයන්වහන්සේ තමන්ගේ ධවලච්ඡත්‍රය යට අග්‍රාසනවූ උතුම්වූ සිංහාසනය මස්තක යෙහි වඩා හිඳුවා තුමූ මිටිවූ ආසනයෙක්හි උන්නාහු, පණ්ඩිත යෙනි! සෙවතච්ඡත්‍රයෙහි අධිගෘහිත දෙවතා දූ මා අතින් ප්‍රශන සතරක් විචාළීය. මම ඒ නොදැන පණ්ඩිතවරුන් සතරදෙනා විචාළීමි. උයිත් නොදන්නාහ. පුත! තොපි ඒ ප්‍රශන කියා බලන සී කිහ. සත්පුරුෂයන් විසින් ඒ මාගේ ස්වාමිදරුවාණන්ගේ බාල වයස කලාවූ මෙවැනි ආශචර්‍ය්‍ය දූකත්, තම තමාගේ නුවණ පමණින් ඉඳුරා සලකා සිත තිබියයුතු.

මෙතින් දෙවතාවන් කී පැනයෙක් ල. දෙවෙතිව විචාරන්නෝ වචනශුද්ධවූ ජනප්‍රධානව සිටි රජ්ජුරුකෙනෙක් ල. උයිත් සෙසු පණ්ඩිතවරුන් විචාලසේ නොවිචාරා බොහොම ආදර බහුමාන යෙන් තමාගේ අග්‍රාසනයෙහි ඉඳුවා තුමූ නීචාසනයෙහි හිඳ ආදර දක්වා විචාලෝ ල. ඉදින් මේ ප්‍රශනය කියා නුහුනුයේනම් මේ අඥාන අපරීක්‍ෂිතවූ රජහු විසින් කුමකින් කුමක් වේ දෝ හෝයි සිතා කිසි ශංකාවක් නැතිව රන්ගල් තෙලෙහි සිංහනාද කරන අභීත කෙසර සිංහරාජයකු සේ ඒ මාගේ ප්‍රඥා සමුද්‍රයාණන් වහන්සේ වදාරනසේක්, මහරජ! සේසත වසන දෙවතාවන් කිම? චාතුර්මහාරාජිකාදී දිව්‍යලෝකවල දෙවියන් කිම? දස දහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මයන් කිම? නාගසුපර්ණ මනුෂ්‍යාදීවූ කවර කෙන කුන් විචාල පැනයකුත් මම කියමියි කියා නොහෙති යන්නාක්

නොසිතා ශංකා රහිත ව කිව මැනවැයි සර්වඥප්‍රවාරණයෙන් පැවරූසේක. එවිට රජ්ජුරුවෝ දෙවතාදූව කී පරිද්දෙන් කියන්නාහු මේ ගාථාවෙන් කියත්.

> හනති හත්ථෙහි පාදෙහි, මුඛඤ්ච පරිසුම්භති
> ස වෙ රාජ! පියො හොති, කං තෙන මභිපස්සසී'ති.

යන මේ ගාථාව රජ්ජුරුවන් කියන්නාහාම ආකාශයේ පූර්ණචන්ද්‍රමණ්ඩලය පෙනීගියාසේ මහතාණන්ගේ නුවණැසට අර්ථය ප්‍රකාශව පෙනී ගියේය. ඉක්බිති රජ්ජුරුවන් ගිවිස්වා වදාරනසේක් මහරජ! ඇසුව මැනව. ඒ දෙවතා දූව විචාළේ අතින් අනිති, පයින් අනිති, මුහුණ අත් සපති, ඒ ගෙඩි කන්නෝ ගෙඩි දෙන්නවුන්ට ඉතා ප්‍රිය වන්නාහ. ඔහු කවුරුදැයි කියා වේද ? යම්සේ මවක ඇකයෙහි වැදහෙව කෙළෙනා කුමාරයා තම බඩ පුරා කිරි බී මව මුහුණ බලා කෙළනේද? අතින් මරයි, පයින් මරයි, තනයේ මුහුණ අත් සපයි, ඉසකේ ඇද කඩයි, තමාගේ මිටි සුගින් සක්කේ ගසයි. එ වේලේම මවු නෙලෙ ධූතීවූ සොරුගේ පුත! මා කුමක් පිණිස මරයිදැයි නාමා සිත්වූ පරිද්දෙන් මේ ආදී බස් ප්‍රේම වශයෙන් කිය කියා ප්‍රේම දරා ගන්ට නොපොහොසත් තැනැත්තී පුතු ළෙහි හොවා සිපගෙන සිඹ සනහයි. මෙසේ දරුවන් කෙළනාකල්හි මවුන්ට ඉතා ප්‍රියවන්නාහ. යම්සේ මවුන්ට ප්‍රියවෙත්ද දෑ පියන්ටත් එසේමයයි දතයුතුයයි ආකාශයෙහි හිරමඬල පානාසේ අතිප්‍රසන්නකොට දූනෙත පරිද්දෙන් ප්‍රශ්නය වදාළසේක

ඒ අසා දෙවතාදූ කුඹ පුඹුවෙන් මෑත්ව අඩ ශරීරයක් දක්වන්නී ඉතා යහපත. ප්‍රශ්නය කී නියායි මධුස්වරයෙන් තුන්විටක් සාධුකාර නාද පවත්වන්නී රන් කරඬුවෙක දිව සුවඳ සුණු පුරා, දිව සුවඳ මල් හා සමග බොධිසත්වයන් වහන්සේට පූජා කොට අනතර්ධානවූව. රජ්ජුරුවෝද සුවඳමල් ආදීන් පුදා සෙසු පැන කියන්නට ආරාධනා කොට කිව මැනවැයි කී කල්හි දෙවෙනි පැනය කියන්නාවූ රජ්ජුරුවෝ මේ ගාථාවෙන් කියත්.

> අක්කොසති යථාකාමං, ආගමඤ්චස්ස න ඉච්ඡති.
> ස වෙ රාජ! පියො හොති, කං තෙන මභිපස්සසී'ති.

එහි අභිප්‍රාය වදාරනසේක්ම මහරජ ! මවු කීවා කරන තරම් සත් අට ඇවිරිදි පුතකුට මවු කියන කල පුත! කුඹුරට යව. පිලට යව. අගාතියට යවයි යනාදීන් කිසියම් කර්මාන්තයක් කී කල්හි මා බඩඝාය. මේ මේ කන බොනදෑ දුනහොත් යමියි කියයි. මවු නමා

දුක්පත් හෙයින් එසේත් තමා වැඩෙක් වේදෑහෝයි සිතා ගහපත වැලි ඉඳ, පුතැයි ඉල්වූ දෙයක් දුන් කල්හි ඒ කාලා ලඟින් මදක් තැන් දුරුවගෙන සිට නුඹ ගෙයි සිසිල් සෙවන වැද හිඳිනේ ය. මම නුඹට පිටත මේ කොට ඇවිදිම්දැයි අතින් මූහුණින් උසුළු විසුළු පෑ පෑ ඉදිරියට අවුත් නොයෙක් විකාර පානා කල්හි ඉප ලක් වත් කෝටුවක් වත් අල්වා ගෙන තෝ මා සන්තක දෙය කාලා දඩබිම කිසිවකුත් නො කෙරෙයි දැයි ලුහු බඳවා ඔහු දිවගත් කල්හි අල්වාගත නොගී තැතිව, පාළුව, ගියාව, සොරු තා කඩ කඩ කොට සිදපියත්වම් තෙලෙ එසේ ගියෙයි. මැත නො එවයි යනාදීන් තමා කටට ආ දෙයකින් පුතුට ආක්‍රොශ එරුෂවචනයෙන් හවයි. බෙණෙයි. හේ තමා හැවූ හැවිල්ලෙන්[1] සවල්ප මාත්‍රයකුත් පුත්‍රයාට වදනා නො කැමැත්තීය.

ඒ පුත් මව රැකැණී කරවා ගියේ දිවාභාගයෙහි කෙලපියා සවස ගෙට එන්ට නො පොෂොසත්ව නැයන්ගේ ගෙවලට යෙයි. මවු සවස් සවස් වත් පුතු එන පෙරමග බලන්නී බයින් නොඑන නියාවනැයි සිත සිතා ශොකයෙන් පිරුණු ලය ඇතිව ඇස් පිරුණු කඳුලෙන් යුක්තව නැයන්ගේ ගෙවල සොයා ඇවිදිනී යම් තෙනෙක්හි පුතු දුටු නම් සිපගෙන ඉස සිඹ සනහා දෑතින් අත් තරව අල්ලා ගෙන පුතණ්ඩ! මාගේ බසක් සිත තබද්දැයි කිය කියා පුතු කෙරෙහි වඩ වඩා ප්‍රෙම උපදවන්නීය. මෙසේ මවු දරුවන්ට කිපි කල අතිරේකව ප්‍රෙම කරන්නාහයි දෙවත ප්‍රශනය වදළ සේක.

දෙවතා දූ පළමු පිදුවා සේම බොධිසත්වයන් වහන්සේට සාධු කාර දී පූජා කළහ. රජ්ජුරුවෝද එසේම පුදා තුන්වන පැනයට යාඥා කොට කිව මැනවැයි කී කල්හි දෙවතා දූ කී පරිද්දෙන් මේ ගාථාව කීහ.

අබ්භක්ඛාති අභූතෙන, අලිකෙන මභිසාරයෙ
ස වෙ රාජ! පියො හොති, කං තෙන මහිපස්සසී'ති.

මේ ගාථාවෙහි අභිප්‍රාය වදාරනසේක්, මහරජ ! දෙමහලු කෙනෙක් නතිවූවාහු ළොකාසවාද රතියෙන් සනතුෂටව කෙලනාහු ඔවුනොවුන්ට කියන කල තොප මා කෙරෙහි ප්‍රෙමයෙක් නැත. මා ළඟ උන් තොපගේ සිත බැහැරමය. යනාදී ඔවුනොවුන්ට අභූතයෙන් චොදනා කරන්නාහ. එවේලෙහි මෙසේ කියන්නාහු දෙදෙන ඔවුනොවුන්ට ඉතා ප්‍රිය වන්නාහ. මේ ප්‍රශනයෙහි අර් මෙයේ දත මැනවැයි වදළසේක. පළමු පරිද්දෙන් දෙවතා දූව

1 ඇවූ ඇවිල්ලෙන්

පිදුව. එලෙසම රජ්ජුරුවෝත් පුද සතරවන ප්‍රශ්නයට ආරාධනා කොට මහරජ! කිව මැනවැ යි කී කල්හි දෙවතා දූ කී පරිද්දෙන් ගාථාව කීහ.

> හරං අන්නාංඝාව පානඝාව, වත්ථ සෙනාසනානි ච
> අඤ්ඤදත්ථුහරා සන්තා, තෙ වෙ රාජ! පියංගොනානි,
> සං තෙන මහිපස්සසී'ති.

මේ ගාථාව අසමින්ම වදාරනසේක්, මහරජ! මේ ප්‍රශ්නය වූ කලි ධාර්මික ශ්‍රමණබ්‍රාහමණයන් නිසා කියන ලද. ඒ කෙසේද යත්? යම් ම කෙනෙක් සැදූ ඇත්තාහු නම් මෙලෝ පරලෝ අදහා යමක් යමක්ම දෙත්නම්ද, දෙන්නා කැමති වෙත් නම්ද, එසේ සිතන්නවුන් සමීපයට ශ්‍රමණ බ්‍රාහමණයන් හා අන් කිසි යාචක කෙනෙකුනුත් අවුත් යමක් යමක් ඉල්ලූ කල්හි ඇති දෙයක්ම නැතැයි නොකියා දෙන්නාහ. මෙසේ තමන් ගැත්ත යාචකයන් ගෙන යන කල්හි අප සන්තක දෙය ගෙන යන්නාහ යි උන් කෙරෙහි දොම්නස් නැතිව සත්පුරුෂයන් ඉතා ප්‍රෙම කරන්නාහ යි වදාළ සේක.

මේ ප්‍රශ්නය කී කල්හි දෙවතා දූ පලමු පිදුවා සේ ම පූජාකොට තමා මූබ නො සැහෙන පරිද්දෙන් සාධුකාර දී කී නියා ඉතා යහ පතැයි මහා සන්තොෂයට පැමිණ නැවත රත්කරඬුවෙක සත් රුවන් පුරා පණ්ඩිතයෙනි! තෙලෙ ගන්වයි කියා බොධිසත්වයන් වහන්සේගේ පාමුල තිබුව. මේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි ඉතා ප්‍රසන්න වූ රජ්ජුරුවෝ පට බඳවා සෙනෙවිරත් ධුරය පාවා දුන්හ එවක් පටන් බොධිසත්වයන් වහන්සේගේ යසස් ඉතා මහත් විය.

දෙවතා ප්‍රශ්නය යි.

තවද, එක් දවසක් සෙනකාදී සතරදෙන ගොවියා පිත් දූන් ඉතා මහත් වූ යසස් හා කීර්ති හා පරිවාරයෙන් ඉතා ආඪ්‍ය විය. කුමක්කරමෝ දෝ හෝයි ඔවුනොවුන් හා මන්ත්‍රණය කළහ. ඉක් බිති සෙනකයා කියන්නේ වන්නාට, එක් උපායක් දිටිමි. ගොවියා පිතු සමීපයට ගොස් රහස් නම් කාට කිය හැකිදැයි විචාරම්හ. ඒ තමා මහත් වූ ප්‍රඥ ඇති හෙයින් කාටත් කිය නො හැක්කැයි කියයි. එවිට අපි රජ්ජුරුවන් සමීපයට ගොස් ගොවියා පිත් නුඹ වහන්සේට සතුරු වීයයි කියා බිඳුවා පියම්හයි මන්ත්‍රණය කොට සතර දෙන බොධිසත්වයන් වහන්සේගේ මාලිගාවට ගොස් සිහි කටයුතු කථා කොට පණ්ඩිතයන් වහන්සේ අතින් ප්‍රශ්නයක් විචාරන්නා කැමැත්තම්හ යි කීහ. —විචාරවයි— වදාළ සේක.

එවිට සෙනකයා කියන්නේ පණ්ඩිතයන් වහන්ස! පුරුෂයා විසින් පළමු කුමක පිහිටිය මනාදැයි කීය. එම්බල සෙනකය! සැබෑවෙහි පිහිටිය මැනවැයි වදාළසේක. සත්‍යයෙහි පිහිටා පසුව කුමක් කළමනාදැයි කීය. වස්තුව උපදවා ගත මැනවැයි වදාළසේක. ඒ ධන උපදවා පසුව කුමක් කළමනාදැයි කීය. මන්ත්‍ර උගත මැනවැයි වදාළසේක. මන්ත්‍ර ඉගෙන පසුව කුමක් කළමනාදැයි කීය. තමා සිත ඇති රහස් අනුන්ට නොකිය යුතුයයි වදාළසේක.

යහපත, පණ්ඩිතයන් වහන්සේ වදාළ නියායයි ඉතා සතුටු සිත් ඇත්තා සේ හඟවා එතෙතින් නික්ම මෙවිට කොල! ගොවියා පිතු පිටි දුටුම්හයි රජ්රජ්ජුරුවන් සමීපයට ගොස් මහරජ! ගොවියා පිත් නුඹ වහන්සේට පෙරළියේ වේ දැයි කීහ. තොපගේ බස් මා අදහන්නේ නැත බොරුයයි කීහ. මහරජ! ඇසුව මැනව. ඉදින් නො අදහන සේක් නම් උන් අතින්ම පණ්ඩිතයෙනි! තමාගේ සිත ඇති රහස් කාට කිය හැකිදැයි විචාළ මැනව. ඉදින් නිසතුරු වී නම් අසවලුන්ට කිය හැක්කැයි කියති. සතුරුවූ නම් කාටත් කිය නොහැක්ක. තමා සිත ඇත්තක් මුදුන් පැමිණි කල එවිට කියයුතුයයි කියති. එවේලෙහි අපගේ බස් අදහා සැක හැරගත මැනවැයි කීහ.

රජ්ජුරුවෝ යහපතැයි ගිවිස එක්දවසක් පණ්ඩිතවරුන් පස්දෙනා අවුත් උන්කල්හි වීසතිනිපාතයෙහි **පඤ්චපණ්ඩිත ප්‍රශ්න**යෙහි ගාථාවෙන් පස්දෙන අතින් රහස් කථා විචාරන්නාහු මෙසේ කියත්;

පඤ්ච පණ්ඩිතා සමාගතා, පඤ්හා මෙ පටිභාති තං සුණාථ
නින්දිය මත්ථං පසංසියං වා, කස්සෙවා' විකරෙය්‍ය ගුය්හමත්ථනති.

මේ ගාථාවෙන් කියන්නාහු පණ්ඩිතවරුන් පස්දෙනා උන් තැන්හි මට ප්‍රශ්නයෙක් වැටහිණ. ඒ අසව, යහපත් වේවයි, නපුරු වේවයි, තමා සිත ඇති යම්ම රහසක් කාට කියහැකිදැ යි විචාළහ.

මෙසේ රජ්ජුරුවන් කී කල්හි සෙනකයා සිතන්නේ රජ්ජුරුවනුත් අප හා උපායෙන් එක්කොට ගත මැනවැ යි, සිතා කියන්නේ,

තං නො ආවිකරොහි භූමිපාල!
භත්තාගාර! සහෙතුවං වදෙතං,
තවඡන්ද රුචිං නිසම්මසිත්වා,
අථ වක්ඛන්ති, ජනින්ද පඤ්ච ධීරා'ති.

යන මේ ගාථාවෙන් කියන්නේ මහරජ! නුඹවහන්සේ පෘථිවීශ්වර හෙයින් දැන් අපට භර්තෘස්වාමී ව සිටිසේක. එබැවින් නුඹ වහන්සේගේ රුචියත්, අදහසත් පරීක්ෂා කළ කල පළමු නුඹ

වහන්සේ විසින් රහස් අසවලුන්ට කිය හැක්කැයි වදාළ කල පණ්ඩිතවරුන් පස්දෙනත් තමන් සිත්වූ පරිද්දෙන් කියන්නෝ වේදැයි කීහ. රජ්ජුරුවෝ තමන් කාමයෙහි ගිජු බැවින් තමන්ගේ අදහස් වූ පරිද්දෙන් කියන්නාහු,

යා සීලවතී අනඤ්ඤදෙය්‍යා
භත්තුච්ඡන්ද වසානුගා පියා මනාපා
නින්දිතමත්ථං පසංසියංවා,
භරියාය'විකරෙය්‍ය ගුය්හමත්ථ'න්ති:

එම්බල සේනකය! යම් ස්ත්‍රියක් ආචාර ශීලයෙන් යුක්තවූද, තමාගේ ස්වාමිහු සිත්ගෙන වෙසේද, දවසින් දවස ප්‍රිය වේද, ප්‍රේම වඩනා දෙයක්ම කියාද, කෙරේද, යහපත් වුවත් නපුරු වුවත් තමා සිත ඇති යම්ම රහසක් ඒ ස්ත්‍රියට කියයුතුයයි කීය. එවේලෙහි සේනකයා සිතන්නේ රජ්ජුරුවනුත් අප හා එක්කොට ගන්නා ලදැයි අතිශයින් ඔද වැඩී සතුටුව තමා කළ දෙයක්ම කියන්නේ මහරජ! යම්සේ ලෙඩව දුඊලවූ පුරුෂයකුහට යම් මිත්‍රයෙක් පිටිවහල්ව පරම ප්‍රතිෂ්ඨාව සිටීද, යහපත් වුවත්, නපුරු වුවත් තමා සිත ඇති යම්ම රහසක් ඒ යහළුවාට කිය යුතුයයි කීය.

නැවත රජ්ජුරුවන් විසින් පුක්කුසයා විචාළ කල්හි ඒ කියන්නේ යම්සේ තමා ඉක්බිති මල්බෑයන්ගෙන් බාලව සිටි මලෙක් ආචාරශීලයෙන් යුක්තද, නොයෙක් අභිවෘද්ධියෙහි පිහිටුවන්නාවූ අභිප්‍රාය දනීද, යහපත්වූ හෝ නපුරු වූ හෝ යම් තමා සිත ඇති රහසක් එසේවූ මලුට කියයුතු ය යි කීය.

ඉක්බිති කාවින්දයා විචාළ කල්හි එයිත් කියන්නේ යම්සේ තමා සුතප්‍රේමයෙන් වඩාගත් පුතෙක් ඇත්නම් ඒ පුත්‍රයා පියාණන්ට අනුව පවත්නේ වීනම් තවද කාරණාකාරණ දන්නා නුවණින් යුක්ත වී නම් යහපත් වුවත්, නපුරු වුවත් තමා සිත ඇති යම්ම රහසක් එසේවූ පුතුට කියයුතුය යි කීය.

ඉක්බිති දෙවින්දයා විචාළ කල්හි එයිත් කියන්නේ ජනප්‍රධාන වූ ශ්‍රේෂ්ඨයාණන්වහන්ස! යමක්හුගේ වැදූ මවක් තමාගේ ප්‍රාණය සේ ඉතා සිතින් පුතු රක්නී වූ නම් යහපත් වූවත් නපුරු වුවත් තමා සිත ඇති යම්ම රහසක් එසේවූ මවට කියයුතුයයි කීය.

උන් අතුරෙන් විචාරා ඉක්බිති රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන් විචාරන්නාහු, පණ්ඩිතයෙනි! රහස නම් කාට කියහැකිදැයි කීහ. ඔබ වදාරනසේක්

ගුය්හස්ස හි ගුය්හමෙව සාධු
නහි ගුය්හස්ස පසත්ථ මාවිකම්මං
අනිප්පධාය සහෙය්‍ය ධීරො
නිප්ඵන්නත්ථං යථාසුඛං භණෙය්‍යා'ති.

යන මේ ගාථාවෙන් රජ්ජුරුවන්වහන්ස! රහස් නම් තමා ම නොකිය හැක්ක. සිත ඇත්ත සාදාගත් කල කිය යුතුය. නොතිබි යාවූ කටයුතු කීම ඉතා නපුර. යම් වැඩක් සාදාගන්නා තෙක්ම නුවණැත්තවුන් විසින් ඉවසිය යුතුය. සිතූ අර්ථය සම්පූර්ණ වූ කල සිත් වූ පරිද්දෙන් සුවසේ කියයුතුයයි වදාළසේක.

මෙසේ පණ්ඩිතයන්වහන්සේ කී කල්හි ඉතා නොසතුටුව රජ්ජුරුවෝ සේනකයාද, සේනකයා රජ්ජුරුවන්දැයි ඔවුනොවුන් මුහුණ බැලූය. බෝධිසත්වයන්වහන්සේ මූන් දෙන්නාගේ ක්‍රියා යෙන්ම මොහු සතර දෙන මා රජ්ජුරුවන් කෙරෙහි බිදුවා පියා තමන් විමසන පිණිස ප්‍රශ්නයක් විචාළෝවනැයි සිතූසේක මෙසේ කථා කරමින් හින්දදී ම හිරු අස්තයට ගියේය. රජගෙයි පහන් දල්වූහ. පණ්ඩිතයන්වහන්සේ සිතනසේක් රජ්ජුරුවන්ගේ කටයුක්ත නම් නො සිතිය හැක්ක. කුමක් වන බවත් නො දනෙයි. වහා මෙතෙනින් යා යුතුයයි සිතා හුනස්නෙන් නැගී රජ්ජුරුවන් වැඳ නික්මෙනසේක් මෙසේ සිතූසේකි.

මූන් සතර දෙනාගෙන් එකෙක් යාළුවාට කිය හැක්කැයි කිය. එකෙක් මලුටය, එකෙක් පුතුටය, එකෙක් මවට යයි සතර දෙන සතර දෙනකුන්හට කිය හැක්කැයි කිහ. මේ වූ කලි ඒකාන්ත යෙන් මූන් සතරදෙන කළ දෙයක් හෝ දුටු දෙයක් හෝ ප්‍රත්‍යක්ෂ කොට ඇසූදෙයක් හෝ වුව මැනවැයි සිතමින් වන්නාට! එසිත් අදම දැනපීම් නම් යහපතැයි සිතා මොහු සතරදෙනා සෙසු දවස් රජගෙන් නික්මුණු කල රජගෙයි මාලිගා දොරකඩ බත් බෙදන් නාවූ එක් ඔරුවක්පිට හිඳ තමන් කළමනා යම් කටයුත්තක් එතෙ නදීම මන්ත්‍රණය කොට ගෙවලට යන්නාහ. එබැවින් මම මූන් සතර දෙනාගේ රහස් කථාව මේ ඔරුව යට වැද හෙව දැනපීම් නම් යෙහෙකැයි සිතා කැටිව සිටියවුන් ලවා ඔරුව පෙරලවා ඇතිරිලි අතුරුවා ඔරුව යට වැදහෙව තමන් වහන්සේගේ පුරුෂයන්ට සලකුණු දුන්සේක් තොපි පණ්ඩිතවරුන් කථාකොට නැගී ගිය කල අවුත් මා කැඳවාගෙන යවයි වදාළසේක. උසිත් යහපතැයි ගිවිස නුදුරු තැනක සැඟවී සිටියාහ.

සේනකයා රජ්ජුරුවන්ට කියන්නේ මහරජ! අපගේ බසක්ම නො අදහනසේක්ම වේදැයි කිය. රජ්ජුරුවෝ හෙදකාරයන්ගේ බස් ගෙන විමසා නොපියා භය පත් වූවාහු දැන් කුමක් කරමෝදැ? පණ්ඩිතයෙනි! කීහ. මහරජ! ප්‍රපඤ්ච නොකොට කවුරුනුත් නො දන්වා ගොවියා පුතු සෙඛ උදෑසනම සෙවයට එන වේලෙහි මරා

පියමෝමයයි කීහ. එවේලෙහි රජ්ජුරුවෝ සේනකයෙනි! තොප විනා මට හිතකාමී කෙනෙක් නැත. තොපිම තොපට එක් සිත්වූ ගණනක් දෙනා ඇරගෙන රජගෙට වදනා වහසල් දොර හස්සේ සැඟවී සිට ගොවියා පිතු උදෑසනම රාජසේවයට එන වේලෙහි වාසලින් ඇතුළුවූ විට ම මේ කඩුවෙන් ඔහුගේ හිස කපා පියවයි තමන්ගේ මඟුල් කඩුව දුන්හ. යහපත, දෙවයන්වහන්ස! මෙවිට තොබා වදළ මැනව. අපි ඔහු මරම්හයි ගිවිස රජගෙන් නික්ම කොල! ගොවියා පිතු පිටි දුටුම්හයි කිය කියා ගොස් ඔරුව පිට උන්හ.

ඉක්බිති සේනකයා කියන්නේ කොල කවරෙක්ද? ගොවියා පුතුට පහරක් ලන්නේයයි කිය. අනික් තුන් දෙනා කියන්නාහු ආචාරීනි! ඒ තුඹටමය, අපට බැරියයි කඩුපහර ඔහට භාර කළහ. ඉක්බිති සේනකයා විචාරන්නේ කිමෙක් ද තොප ඇම විසින් රහස්නම් මුන් මුන්ට කිය හැක්කැයි වෙන වෙනම කිව. ඒ තොප විසින් කළ දෙයෙක්ද? දුටු දෙයෙක්ද? ප්‍රත්‍යක්ෂ කොට ඇසූ දෙයෙක්දැයි කීය. අනික් තුන්දෙනා කියන්නාහු වන්නාට! ඒ අපගේ රහස් කථාව තිබේවයි. තුඹ කියන දෑ රහස් නම් යහළු වන්ට කිය හැකැයි කියේවේද? ඒ කුමක්දැයි කීහ.

ඒ අසා සේනකයා ඉන් තොපට ප්‍රයෝජන කිම්දැයි කීය. එසේ නැත, ආචාරීනි! කියවයි කීහ. එවිට කියන්නේ මේ රහස් කථාව රජ්ජුරුවන් ඇසුව හොත් මාගේ ජීවිතය නැතැයි කීය. තොබා කිව මැනව ආචාරීනි! මෙතෙන තුඹට මන්ත්‍ර භේදකයෝ නැතැයි කීහ. එවිට සේනකයා නිය පිටින් ඔරුවට ගසා ගොවියා පුතු මේ ඔරුව යට නැතැයි නොසිතමියි කීය. ආචාරීනි! ඒ තමාගේ ඓශ්වර්‍ය්‍ය මදයෙන් මත්වූයේ මෙසේ වූ තැනකට වදනා එකෙක්ද? දැන් ඒ තමාගේ යසසින් මත්ව මාලිගාවේ ඉඳ සම්පත් අනුභව කෙරෙයි. සැක නොකොට කියව මැනවැයි කීහ.

ඉක්බිති සේනකයා තමාගේ රහ ් කථාව කියන්නේ මේ නුවර මේ නම් වෛශ්‍යාව අඳුනාදැයි කීය. ආචාරීනි! අඳුනම්හයි කීහ. දැන් ඕ පෙනේද නොපෙනේදැයි කීය. නුදුටු විරුම්හයි කීහ. එසේවීනම් එම්බා! මම රජ්ජුරුවන්ගේ සල්වන උයනදී ඈ හා සමඟ ලොකාස්වාද රතියෙන් සතුටුව නැවත ඇටත් වඩා ඇගේ පලඳනාවෙහි කළ ලොභයෙන් ඇය මරා මළ ලාපියා පලඳනා පුහ ගලවා ඇගේ හන්කඩින් ම පොට්ටනියක් බැඳ ගෙන වුත් මාගේ ගෙයි අසුවල් මාලේ මෙනම් ගබඩාවේ බිත්ති කොණෙක කොක්කේ එල්වා තබාගෙන පැලඳ ගන්ට මඳක් පරණ

වතාතුරු බලා හිඳිමි. මෙබඳු රාජාපරාධවූ නොකට යුත්තක් පවා කොට පියා මාගේ එක් යාළුවකුට කීමි. ඔහු විසින් ඒ කාටත් කීදෑ නැත. මේ කාරණයෙන් මම යාළුවාට රහස් කීම යහපතැයි කීමියි කීය. පරසිත් දන්නා නුවණැති ස්වාමිදරුවාණෝ ඔරුව යට හිඳ මොහුගේ රහස් කථාව යහපත් කොට සලකා සිත තබා ගත්සේක.

ඉක්බිති පුක්කුසයා තමාගේ රහස් කථාව කියන්නේ මාගේ කලවයෙහි අසාධ්‍යවූ කුෂ්ට රෝගයෙක් ඇත. මාගේ මලණුවෝ උදෑසනම කිසි කෙනෙකුන්ටත් නොහඟවා කසට පැනින් සෝද බෙහෙත් අලවා මත්තෙහි කඩරෙදි පුරා තබා බඳිති. රජ්ජුරුවෝ යම් තෙනෙක මා දුටුවාහු නම් මා කෙරෙහි විස්වාසින් මොලොක්වූ සිත් ඇතිව මෙසේ වර පුක්කුසයයි කැඳවා මාගේ කලවයෙහි ඉස තබාගෙන සැතපෙන්නාහ. නැවත කියන කල පුක්කුසයාගේ කල වය ඉතා මොළොකය. යහපත් සුව පහස් දෙන්නේයයි කියති. ඒ වැලිත් ඒකාන්තයෙන් මාගේ කලවයෙහි මොළොකෙක් නො වෙයි. කුෂ්ට වණය වසා ඇලවූ බෙහෙත් හා ඒ පිට වසා බැඳි කඩරෙදි සලාවෙහි මොළොකය. මේ වූ නියාව රජ්ජුරුවෝ දත්තු නම් ජීවිතය නැත. ඒ බව මාගේ මලණුවන් හා මා මුත් දන්නෝ නැත. මේ කාරණයෙන් රහස් නම් මල්බෑයන්ට කිය හැක්කැයි කීමියි කීය. මහතාණෝ එයිත් අසා සිත තබාගත්සේක.

නැවත කාවින්දයා කියන්නේ මස්පතා කළුවර දෙපෝයෙහි නරදෙව නම් යක්ෂයෙක් මා අල්වා ගන්නි. මම එවිට වියරු හුනු බල්ලකුසේ මහා හඬින් හඬා පෙරලෙමි. ඒ මා පුත් මා යක්ෂයා ගත් බැව් දැන තමාගේ ගෙයි පිටිතල හයා බැඳ හොවාලා දොර පිටින් හයා බැඳ දොර අගුළු ගෙන එබඳු හඬ අනුන්ට නො ඇසෙන පරිද්දෙන් විද්දත් ආදීන් බොහෝ දෙනා රැස් කරවා රඟ මඬුලු බඳවා කෝලාහල කිරීමෙන් ඒ වස්මර වියරු සන්සුන් කල උදෑසනම හැම දෙනා යවා දොර හැර බැඳුම් මුදා ලිප් හළුයෙහි තැවරී පිටත්වූ බල්ලකුසේ ධූලින් ගැවසීගත් ශරීර ඇත්තාවූ මා ඉස් සෝද නාවා ඒ වස්මර වියරුවෙන් වූ සියලූ කුණු පැවි කරවා මා සුවපත් කරවන්නේය. එබැවින් රහස් නම් පුතුට කිය හැකිමියි කීය.

ඉක්බිති දෙවින්දයා විචාළ කල්හි එයිත් කියන්නේ රජ්ජුරුවන්ගේ මැණික් බලන්නහුගේ වෙසින් ශක්‍ර දෙවෙන්ද්‍රයන් එදවස් කුසරජ්ජුරුවන්ට දුන් ශ්‍රී එලවන ඒ මඞ්ගල මාණික්‍ය රත්නය සොරා සඟවාගෙන අවුත් මාගේ මැණියන්ට දුනිමි. ඒ බව

කාවුරුන්ටත් නොහඟවා මා රජගෙට නික්මෙන වේලෙහි ඒ මැණික සෙමෙන් මා අතට දෙන්නාහ. මම ඒ මාණික්‍ය රත්නයෙහි ශොභාව මා ඇඟ මුහුණ ගස්වා ශ්‍රී එලවාගෙන රජගෙට යෙමි. රජ්ජුරුවෝ තොප ඇම හා කථා නොකොට පලවූ මා හාම කථා කොට දවස් පතා මට අට කාලඳක්වත්, සොළොස් කාලඳක්වත්, දෙතිස් කාලඳක්වත්, සූ සැට කාලඳක්වත් වියදම් පිණිසයයි රන් දෙන්නාහ. ඒ මාගේ සෙසු ශාස්ත්‍ර බලයක් හා පුරුදු කාමක් තකා දෙවනදූසේක් නොවෙයි. ඒ වූ කලි මාණික්‍ය රත්නයෙහි ආනුභාවයෙන්ම වන දෙයය. ඒ බව රජ්ජුරුවෝ දත්තු නම් මාගේ ජීවිතය නැත. මේ කාරණයෙන් මම රහස් නම් මවුන්ට කියහැක්කැයි කීම් කිය.

අභිමතාර්ථ සාධක වූ චින්තාමාණික්‍යයක් බඳුවූ බොධිසත්ත්වයන් වහන්සේ මුන් සතර දෙනාගේ රහස් කථා මුළුල්ල සුවර්ණ භාජන යෙක්හි බහාලූ සිංහ තෛලයක් සේ සකස් කොට දරා සිත තබා ගත්සේක.

මොහු සතරදෙනා තම තමන්ගේ ලය පලාපියා හෘදය මාංසය පානාවුන් සේ සියලු රහස් කථාව වූ පරිද්දෙන් ප්‍රකාශ කොට කියා කොල! අප්‍රමාදව රෑ මක්සේම කා බී හැඳ පැලැඳ පඤ්චවාසුඛ සන්තෘප්තව ගොවියා පුතු මරන්නට වහා එවයි කියා නැගී සිට තම තමන්ගේ ගෙවලටම ගියහ.

උන් සතරදෙනා ගිය පසු සැඟවී සිටි පුරුෂයෝ අවුත් ඔරුව නහා බොධිසත්ත්වයන්වහන්සේ කැඳවා ගෙන ගියාහ. මහතාණෝ තමන්වහන්සේගේ ගෙට ගොසින් ඉස් සෝදා නහා අග්‍රභොජනය අනුභව කොට අද මා බූනණියෝ උදුම්බරාදේවී රජගෙන් මා කරා අස්නක් එවතියි වදාරා දොරකඩ හඳුලාවූ පුරුෂයකු සිටුවා රජගෙන් ආ කෙනකුන් වහා ගෙනවුත් මට දක්වා ලවයි වදාරා යහන සැතපුනුසේක.

ඉක්බිති රජ්ජුරුවෝ උදුම්බරා දේවීන් හා සමග යහන සැතපුනාහු බොධිසත්ත්වයන්වහන්සේගේ ගුණ සඳහන් කරන් නාහු, මහෞෂධ පණ්ඩිතයෝ සත් හැවිරිද්දෙහි පටන් මට සේවය කරන්නාහු මට කිසි අනර්ථයක් කරන්නා තබා සිතිනුත් නො සිතූහ. දෙවතා ප්‍රශ්නයෙහිදී ඉදින් පණ්ඩිතයෝ මෙහි නැත් නම් මාගේ ජීවිතය එදාම නැත්තේය. මේ වෛරීවූ කොල්ලන්ගේ බස් ගෙන අසමධුරවූ විදුරක් බඳුවූ ප්‍රඥාඇති පණ්ඩිතයන් මරන්නට කඩුව දුන්නාවූ මා විසින් කෙළේ අයුක්තිය. මා කෙළේම අපරාධය. මම සෙට උන් දක්නටත් නොලැබෙමියි සිතා ලය

පැළී යන තරම් ශොක උපදවා මහත්වූ පීඩාවට පැමිණියහ. ශරීරයෙන් බා සෙල්විණ. ලෙහි පිරුණු ශොකයේන් සිතට අස් වසකුත් නො ලද්දුහ. උදුම්බරා දේවී උන්හා එක යහනත සැත පුතාහු, වසයෙ ලෙඩ හුරකුයේ කාත කාතා සැපි තැළී වෙසෙන්නා වූ රජ්ජුරුවන් දුක යම් කිසි මාගේ අපරාධයෙක් ඇද්දෙ නොහොත් අතික් කිසි ශොකයට කාරණයෙක් ඇද්දෙ හෝ යි ගාථාවකින් විචාරන්නාහු,

කිං තුවං දුම්මනො'සි රාජසෙට්ඨ,
දිපදිඥ වාචං සුණොම මෙතං
කිං චින්තයමානො දුම්මනො'සි
නහි දෙවී අපරාධො අත්‍ථි තුයහනති'.

දෙපා ඇත්තවුන්ට නායකවූ ජනප්‍රධානවූ රජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේගේ මේ සිත ඇති මූසුප්පු කාරණය අසන්නා කැමැත්තෙමි. කුමක් දුක, කුමක් නිසා, කුමක් අසා, කුමක් සිතා කවර කාරණයකින් දුර්මුඛව ශොකයෙන් පෙළෙනසේක් ද? ඒ තමා අනුන් නිසාවූ දෙයෙක්ද? නොහොත් මාගේ අපරාධයෙක් ඇද්ද? ඒ මට නත්වූ පරිද්දෙන් නොවළහා කිව මැනවැයි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ තමන් උපන්නාවූ ශොක කාරණය කියන්නාහු.

පඤ්හා වජෙඣා මහොසධො'ති
ආණත්තො මෙ වධාය භූරිපඤ්ඤො
තං චින්තයමානො දුම්මනො'සමි
නහි දෙවී අපරාධො අත්‍ථි තුය්හ'න්ති.

අලාමකවූ ප්‍රඥ ඇති මහෞෂධ පණ්ඩිතයෝ සෙනකාදී ජඩ කොල්ලන් විසින් නුඹවහන්සේට සතුරුව නොබෝ කලකින් මරා රාජ්‍යය ගන්නාහයි කී හෙයින් මම ඒ වූ පරිද්දෙන් දූන නො පියා ඔහු මරා පියවයි මඟුල් කඩුව දී වධයට නියොග කෙළෙමි. ඒ සිතන්නාවූ මම මා මියත් මාගේ පණ්ඩිතයන්ට එසේවූ දුකෙක් නොවෙවයි සිතා උන් කෙරෙහි උපන්නාවූ බලවත් ශොකයෙන් සැලෙමි. තොපගේ වරදෙක් නැතැයි කීහ.

එබස් අසමින්ම උදුම්බරා දේවීන්ට බොධිසත්වයන් කෙරෙහි මහමෙරටත් වඩා ලය පැළී යන තරම්වූ මහත්වූ ශොක උපන. නැවත දේවී සිතන්නාහු යම් කිසි උපදෙශයකින් රජ්ජුරුවන් අස්වසා උන් නිදිගත් කල මාගේ මලණුවන්ට ඒ වූ නියාව කියා අස්නක් යවමියි සිතා කියන්නාහු, අනේ! නුඹවහන්සේ ඉතා බාලද නියාය. සීඝා කාන්තාවූ ශොවියා පුතු මෙසා මහත්

යසසක පිහිටුවා තවත් ඒ මදින් පට බඳවා සෙනෙවිරත් ධුරයකුත් දෙවා නොතරම් තැනැත්තවුට කල දෙය විපාක දුන් නියා ඉතා යහපත. තරම් නොදන නුවණින් කරන යම්දෙයක් මෙසේම අනර්ථයට පැමිණෙන්නේ වන. එසේද, තමා ඒ නුඹවහන්සේට දුන් සතුරු වීද? මහරජ! වැලිත් සතුරන් නම් සුඛාවැයි නො සිතිය හැක්ක. නියෙන් සිඳ පියන්නාවූ දළුව පොරෝවින් කපන්ට තිබුවාසේ නොකොට ලහම සිඳුවාපීසේ ඉතා යහපත. අතිස, රාජ ධෛර්යයක් නැති නියාය. සතුරන්ට වඩ යොදු නැවත කතස්සලු වීම ඉතා නොයෙදෙන්නේය.

ඒ මහෞෂධ පණ්ඩිතයා නම් එසේ එකෙක් නොවෙයි. තමාගේ ප්‍රඥයෙන් ඉදින් සිතීනම් අහස පොළොව ගැට ලා ලන්ට සමර්ථය. එසේවූ තැනැත්තවුව. වඩ යොදු පළමු ඔහුගේ යම් යම් ගුණයක් නිසා නොමරා අලසේක් වීනම් නුඹවහන්සේ දුටු දුටු විටක්ම මා මරන්ට වඩ යෙදූ සතුරායයි නුඹවහන්සේට ඉදිරියෙහි ජන්මාන්තර වෛරී වන්නේය. නොමරා අලසේක් වීනම් දණ්ඩෙන් ගැසූ හල නයෙකු වැන්නැයි සිතමි. එබැවින් නැවත කතස්සලු වීම නොයෙදෙන්නේය. ශොක නොකල මැනවැයි නොයෙක් පරිද්දෙන් කාරණා කියා රජ්ජුරුවන් අස්වැසූහ.

රජ්ජුරුවෝ ඕසවුන් කී කාරණයෙන් ශොක සංහිඳී නිදන්ට වන්හ. එවිට දේවී යහනින් නැඟී සිට තමන්ගේ ශ්‍රී යහන් ගබඩාවට වැද වූ නියාව කියා පතක් යවන්නාහු, මහෞෂධ පණ්ඩිතයෙනි! සේනකයා ආදිවූ පණ්ඩිතවරු සතරදෙන බොරු කියා රජ්ජුරුවන් කෙරෙහි තොප බිඳුවා පීහ. දැන් රජ්ජුරුවෝ කිපී උදෑසන තොප රජගෙට වදනා කල දොරකඩදී මරණ පරිද්දෙන් මඟුල් කඩුව දී වධයට යෙදූහ. සෙට රජගෙට නොඑව. ඉදින් එවූනම් නුවර අත් පත් කොට ගෙන බලඇණි සහිතව තොප කෙරෙහි රැකවල් සුරක්ෂිතව සමර්ථව ගෙන එවයි පත ලියා අග්ගලාවක් පළාපියා පත යට ලාලා අනික් පියනින් වසා වෙළා අලුත් බඳුනක ලා කඩ බැඳ අස් ඔබා වැඩ හැසිරෙන්නාවූ කොල්ලක අතට පාවා දී මේ අග්ගලා කැවුම් ගෙන ගොස් මාගේ මලණුවන්ට දී ලවයි කියා යවූහ.

ඔසිත් ගෙන ගොස් කී පරිද්දෙන් පාවා දුන. රෑ දවස රැක වලින් කෙසේ ගෙන ගියාදැයි සැක නොකට යුතුය. කාරණා කිම්දයත්? රජ්ජුරුවන් විසින් දේවීන්ට පළමුව වරයක් දෙනලද. එබැවින් කවර වේලකත් බිසවුන්ගෙන් පණ්ඩිතයන්ට යවන දෙසක් නවතන කෙනෙක් නැත්තාහ. එබැවින් කවුරුත් නො වැලකූහ.

බොධිසත්ත්වයන්වහන්සේ කැවුම් පාවාගෙන තො යවයි ගෙනාවිය යවූසේක. ඔයිත් ගොසින් කැවුම් පාවා දූන් තියාව කිසවුන්ට කිව. එවිට දේවී සැක නැතිව මගොස් රජහු සමීපයෙහි සැතපුනාහ. බොධිසත්ත්වයන් වහන්සේ අග්ගලාව පලාපියා පත කියවා ඒ බව දූන සියලු කලමනා කටයුත්තෙහි සංවිධාන කොට යහනෙහි සැතපුනු සේක.

සෙනකාදී සතරදෙන කඩුගත් අත් ඇතියාව පහන් නොවන තෙක්ම ගියාහු දොර අස්සෙහි සැඟවී සිට පණ්ඩිතයන් වහන්සේ නොදූක තමන්ගේ මවුත් පියත් මල ශොකයට වඩා ශොකාග්නියෙන් තැවෙනලද සිත් ඇත්තාහු දොර අස්සේ සැඟවී සිට මහා කනස්සල්ලෙන් රජ්ජුරුවන් සමීපයට ගියාහ. කිමෙක්ද? පණ්ඩිත වරිනි! ගොවියා පිත් තොපවිසින් මරණලද්දේදූයි කීහ. මහරජ! මරන්නා තබා ඇසිනුත් නුදුටුම්හයි කීහ.

මාගේ ස්වාමිදරුවූ බොධිසත්ත්වයන්වහන්සේද අරුණු නැඟී පහන් වන දූ තුරෙහි අගම් විතරින් අටවිසි ගවුවක් පමණ ඒසා මහත් නුවර තමන්වහන්සේ හස්තප්‍රාප්තකොට ගෙන ඒ ස්ථාන යෙහි රැකවල් ලවා රජගෙට බලා යම්හයි නික්මුණු සේක. කවර උපමාවකින් නික්මුණු සේක්දයත්? වෛජයන්ත නම් රථයට නැඟී දෙදෙව්ලොව දෙවියන් පිරිවරා අසුර විජයට නික්මුණු ශක්‍ර දෙවෙන්ද්‍ර ලීලායෙන් ඒ මාගේ රූප සමුද්‍රයාණන් වහන්සේ සර්වාභරණයෙන් විභූෂිතව සුදු ඇඹුල මල්පෙත්තක පැහැ සමානවූ පැ ඇති ඇලි අසුන් සතර දෙනකු යෙදූ ධජ නැගූ මඞගල[1] රථ වාහනයෙක්හි සිට ගෙන, ඒ ස්වාමිදරුවාණෝ තමන් වහන්සේගේ ප්‍රඥ නමැති සූර්‍ය්‍ය තෙජසට ඒ පුර නමැති විල්හි පිපී වැනී ගිය හෙළ පියුම් වනයක් මෙන් බබලන්නාවූ ධවලච්ඡත්‍ර සමූහයෙන් විරාජමානවූ, තවද, සර්වාභරණයෙන් සැරහි පඤ්චායුධ සන්නද්ධව ඇවිත් වට රැකවල් ගන්නාලද එකදූ උපන් යොධයන් දහස හා ඇත් අස් රථ පදදි සෙනායෙන් හා ගම්භාර, සක්, සින්නම්, බෙර, තලි ආදිවූ ආතතය, විතතය, විතතාතය, ඝනය, සුසිරය යන පඤ්චාඞගික තූර්‍ය්‍ය නාදයෙන් හා ආයුධ ඊ ඊ සැටෙන්නාවූ කොලාහලයෙන් හා, ඒ මහතාණන්ගේ නොයෙක් ශ්‍රී විභූති බලා සන්තොෂයෙන් අපොළන්නාවූ සාධුකාර දෙන්නාවූ අවශෙෂ ජන කොලාහලයෙන් හා, මහ පොළොව කම්පාකරන කලක්සේ ද, සුලඟින් ඇලළී මහා සමුද්‍රය රළ හඬින් එක කොලාහල කරන්නා සේද, කල්පාන්ත වර්‍ෂාවෙහිවූ ආකාශ ගර්ජනාවක් සේද, උපමාතික්‍රාන්තවූ ශ්‍රී විලාසයෙන් යුක්තව අනන්‍ය සාධාරණවූ මාගේ

---

1 මංගල්ල

ස්වාමිදරුවාණෝ අසමසිත කෙශර සිංහරාජයකුසේ කිසි වක්ත යක් නැතිව රජගෙට තමා බලා ගත්සේක.

ඒ කුමක් වැනිදයත්? අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව හා එක් සියයක් රජුන් පිරිවරා මතු බ්‍රහමදත්ත රජු මෙනුවරට එන්නාවත්, මෙම වෛදෙහ රජු භය ගන්වන්වත් පූජී නිමිත්ත පානාසේ මහතාණන් වඩනා කොලාහල අසා සිවුමැදුරු කවුළුව හැර එන්නාවූ සේනාව බැලුවාවූ රජ[1] මූර්ච්ඡානුවූයේ ඒ මාගේ ස්වාමි දරුවාණන්ගේ කරුණාශයන්මයයි සිතමි. මෙසේ මහා පෙරහරින් වඩනාසේක් මාලිගාවේ මතු මහලේ සිටි රජ්ජුරු වන් දූක රඑයෙන් බැස වැඳිසේක.

එවිට රජ්ජුරුවෝ සිතන්නාහු පණ්ඩිතයන් එන තියා ඉතා භයංකාර වන්නේය. එතෙකුදු වුවත් සැබවින් මට සතුරුව එන් නම් රථයෙන් බසිද්ද? තමාම මා කුමකට වඳිද්ද? එබැවින් උන් මට නිසතුරු සැටියයි සිත සිතා එසේ වුවත් සැක ඇතිව බෝධි සත්‍වයන් වහන්සේ කැඳවා රාජාසනයෙහි උන්හ. බෝධිසත්‍වයන් වහන්සේත් එකත්පස්ව උන්සේක. වෛදෙහ රජ්ජුරුවන්ම පණ්ඩිතයයි කියනලද ජඩයෝ සතර දෙනත් එතනම උන්හ. රජ්ජුරුවෝ කිසිවකුත් නොදන්නා කෙනකුන් පරිද්දෙන් පුත! තෙපි ඊයේ සවස ගිය තැනැත්තා දැන් මෙතෙක් වේලා නො ආයේ කුමන සැකයකින්ද? කවුරු තොප මා දකිනට නොඑන්ට කිවුද? මහ පොළොව හා සමාන නුවණැති අසම ධුරවූ පණ්ඩිත යෙනි! ඒ තොප නො ආ කාරණය අසනු කැමැත්තෙමි. තො වලහා මට කියවයි කීහ. මෙසේද කියා රජ්ජුරුවෝ මේ ගාථාවෙන් කියන්නාහු.

අභිදෙස ගතො ඉදානි එසි
කිං සුත්වා කිමාසඞකත මනො තෙ
කො තෙ කිමවොච භූරිපඤ්ඤ
ඉඞඝ තං වචනං සුණොම බ්‍රෑහි මෙ තනාති'.

මේ ගාථාව අසා බෝධිසත්‍වයන්වහන්සේ වදාරනසේක් මහරජ! නුඹවහන්සේ විසින් මට සතුරුවූ පණ්ඩිතවරුන් සතර දෙනාගේබස් ගිවිස නිරපරාධවූ මා මරණ පිණිස තෙලෙ සෙනකයා අතට මඟුල් කඩුව දී රජගෙට වදනා දෙරකඩදී මරණ පරිද්දෙන් වධයට යොදා නනිව සැතපුනාවූ නුඹවහන්සේ ඒ බව බිසවුන් වහන්සේට රහස් කී දැය. ඒ කීවාවූ රහස ඇසිල්ලෙහිම ප්‍රත්‍යක්ෂ කොට මා විසිනුත් දන්නා ලද. එසේ හෙයින් සතුරන් මහ කඩු ගෙන සිටි තියාව දන්නා මම නො ආයෙමි වදාළසේක.

[1] රජ්ජුරුවන්

රජ්ජුරුවෝ ඒ බව අසා මෝ තමාට කී රහස ඒ ඇසිල්ලෙහිම මලුට කියා යවාපී වනැයි කිපී කිසවුන් මුහුණ බැලූහ. අනුන් සිත ඇත්ත අතැඹුලසේ දන්නාවූ නුවණැති මාගේ බොධිසත්වයන් වහන්සේ රජහු බැලූ බැල්මෙන්ම දූතගෙන වදාරනසේක් මේ ගාථාවෙන් වදාරනසේකි.

පඤ්ඤො වරේකා මහොසධො'ති
යදි තෙ මන්තයිතං ජනිඥ දෙසං,
හරියාය රහොගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතන්ති.

මේ ගාථාවෙන් කියනසේක් කිමෙක්ද? මහරජ! දේවීන්වහන් සේට රැහැණී ඇසිද? මම වූ කලි අතීත, අනාගත, පච්චුප්පන්නය යන කාලත්‍රයෙහි වන්නාවූ දෙය ඉඳුරාම දන්මි. එබැවින් මට මේ පමණක් අතික් කෙනකුන් කිව මැනවැයි කියා ඇද්ද? එසේද මා මේ කථාව දේවීන්වහන්සේටත් කියේ ඇද්ද? වන්නාට, ඒ කථාව දේවීන්වහන්සේ මට කිදූය. සෙනකාදී පණ්ඩිත වරුන් සතරදෙනාගේ රහස් කථාවත් මට කීසේක් මේ දේවීන් වහන්සේමද? මුන් සතරදෙනාගේ රහස් කථා බැහැරින් මට කී කෙනෙක් තමාම නැත. මම ඉඳුරාම දනිමියි ඇසුව මැනවැයි කියා පලමුකොට සෙනකයාගේ රහස් කථාව මේ ගාථාවෙන් වදාරන සේකි.

යං සාලවනසමිං සෙනකො
පාපකම්මං අකාසි අසබ්භිරූපං,
සඛිනො ච රහොගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතන්ති.

මේ ගාථායෙහි අභිප්‍රාය නම්, මහරජ! අනුන් වරදවා තෙමෙ සාපරාධව තත්වැයි කමින් ඇවිදිනා සෙනකයාගේ රහස් කථාව අසා වදාල මැනවැයි කියා වදාරනසේක්; මේ නුවර අසවල් නම් වෙශ්‍යාව සල්වන උයනදී මරාපියා ඇගේ පලඳනා ඈ හත්කඩ ම පොට්ටනියක බැඳ තමාගේ ගෙයි අසවල් මාලේ මෙනම් හබඩාවේ කොක්කෙක එල්වා තිබීය. ඒ වූ තියාව තමාගේ යහළුවකුට රහස් කීය. ඒ මා විසින් අසා දන්නාලද. එයිත් දේවීන් වහන් සේමද මට කීදූද? ඔබට නොකිපුන මැනව. නුඹවහන්සේට මා සතුරු කමෙක් නැත. සතුරන්ගෙන් ප්‍රයෝජනයෙක් ඇත්නම් සත්‍රිධූතීවූ රාජද්‍රොහිවූ තෙලෙ ඉසනකයා පාවා ගත මැනවැයි වදාලසේක.

රජ්ජුරුවෝ සෙනකයා බලා සැබෑද සෙනකයයි කිහ. සැබව

ස්වාමීනි කියා. ඉදින් බොරුයයි කීයේ වී නම් කොල! යව. තුලු ගෙ ගෙයි මෙනම් තැන තුබූ කබ පොඑට නිය ගෙනෙවයි මිනිසුන් යවුවහොත් ඒකාන්තයෙන් ගෙනෙන්නා සබාවුව. එසේ හෙයින් සැබවැයි කිය එවේලෙහි රජ්ජුරුවන් තෙලෙ සෙනකයා නොයෙක් විත්‍ර වධයෙන් ගෙන ගොස් සිරගෙයි ලවයි කී කල්හි එතෙන සිටියාහු උනස්තෙන් හයා පිටත් කොටගෙන අතින් පයින් තලා මහාව්‍යසනයට පමුණුවා සිරගෙයි කරපය මැසුහ.

නැවත, පුක්කුසයාගේ රහස් කථාව කියන්නේ මේ ගාථා වෙන් වදරනසේකි.

පුක්කුස පුරිසස්ස තෙ ජනින්ද!
උප්පන්නො රොගො අරාජයුත්තො
භාතුච්ච රහොගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතං.

මේ ගාථාවෙන් වදරනසේක්, මහරජ! තුඹවහන්සේ වූ කලී පුක්කුසයාගේ කලවය ඉතා මොලොකැයි සිතා බෝසේ. ඔහුගේ කලවයෙහි ඉස තබාගෙන සැතපෙනසේක. ඒ මෙලෙක නම් ඔහුගේ කුෂ්ට ව්‍රණය වසා තිබූ බෙහෙත් හා ඊපිට වසා බඳනාලද කඩරෙදිවල මොලකාය. ඒ වූ නියාව කුෂ්ටයට බෙහෙත් කරන නිසා තමන්ගේ මලුට කියා ඒ වූ නියාව මම ඇසීමි. තුඹවහන්සේගේ රහස් කථාව දේවීන්වහන්සේ මට කී නමුත් මේ උන්වහන්සේ මට කීයේ නැත. ඔබට නොකිපුන මැනව. මා තුඹවහන්සේට සතුරු කමෙක් නැත. සතුරන් උවමනා වී නම් තෙලෙ කඩරෙදි පණ්ඩිතයා පාවා ගත මැනවැයි වදාළසේක. සැබෑද? පුක්කුසයයි කී කල්හි සැබෑව ස්වාමීනි!යි කිය. බොරුයයි කිවහොත් උනා බැලිය හැකිවුව. බොරුයයි කුමකට කියාද? තුලුත් සෙනකයා ළඟට ගෙන යවයි කී කල්හි, උනුත් එතෙනින් පිටත්කොට ගෙන මතු සෙනකයා එක්ව වියරු කෙරේදැයි නොකෙරේදැයි නරයෙහි කටයුතු උගන්වා සිරගෙයි කර පය මැසුහ.

නැවත කාවින්දයාගේ රහස් කථාව වදරනසේක් මේ ගාථා වෙන් වදරනසේකි.

ආබාධො'යං අසබ්භිරූපො
කාවින්දෙ නරදෙවෙන ඵුට්ඨො
පුත්තස්ස රහොගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතං.

මේ ගාථාවෙන් වදරනසේක් මහරජ! තෙලෙ කාවින්දයා මස් පතා කළුවර දෙපෝයෙහි නරදෙව නම් යක්ෂයෙක් අල්වා ගන්නී.

මේ තෙමෙ එවේලෙහි වියරු හුනු බල්ලකු මෙන් හඬා පෙරළෙන්නේය. ඒ වස්මර වියරු නම් ඉතා නොබැලිය හැකි රෝගයෙක. එසේවූ වියරුවත් රජුන් දක්නා තබා රජගෙය සමීපයටත් යන්ට තරම් නොවෙයි. ඒ දුකින් තමා රක්නා පිණිස වැද ප්‍රතුව කීය. එයින් මා විසින් අසා දන්නාලද. තෙලෙ කාවින්ද නම් මීමස්මර පණ්ඩිතයාගේ රහස් කථාව මෙපරිද්දෙන් දූතගත මැනවැයි වදාළසේක. රජ්ජුරුවන් සැබෑද? කාවින්දයයි කී කල්හි සැබෑව ස්වාමීනි!යි කීය. තෙලෙ කාවින්දයන් පළමු පණ්ඩිතවරුන් ගෙන ගිය සේම ගෙන යවයි කී කල්හි උනුන් පිටතට ගෙන මහත් දුණ්ට නිග්‍රහයෙන් තරයෙහි හික්මවා සිරගෙයි කරපය මැසූ කල්හි, නැවත දෙවින්දයාගේ රහස් කථාව කියනසේක් මේ ගාථාවෙන් වදාරනසේකි.

අට්ඨවඞ්කං මණිරතනං උළාරං
සක්කො තෙ අදදා පිතාමහස්ස
දෙවින්දස්ස ගතං තදජ්ජ හත්ථං
මාතුච්ච රහොගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතනති.

මේ ගාථාවෙහි අර්ථ නම්, මහරජ! තුඹවහන්සේගේ මී මුතුන් කුසරජ්ජුරුවන්ට අතිප්‍රසන්නවූ ශක්‍රදෙවේන්ද්‍රයන් දෙනලද අෂ්ට වඞ්කමාණික්‍යරත්නය පරම්පරායෙන් අවුත් තුඹවහන්සේගේ භාණ්ඩාගාරයෙහි තුබුවා දැන් මෙවක සොරා සඟවාගෙන දෙවින්දයා හස්තප්‍රාප්ත බවට පැමිණියේය. ඒ වූ නියාව තමාගේ මවට නතිව කීය. එයින් මා විසින් දන්නාලද. ඒ මට දෙවීන්වහන්සේ කියේ නැත. එබැවින් තෙලෙ මැණික්සොර දෙවින්ද පණ්ඩිතයාගේ රහස් කථාව මෙපරිද්දෙන් දූතගත මැනවැයි වදාළසේක. රජ්ජුරුවන් සැබෑද? දෙවින්දයයි විචාරා සැබව ස්වාමීනි!යි කී කල්හි පළමු තුන් දෙනා පරිද්දෙන් බොහෝ පීඩාවට පැමිණ සිරගෙයි රැකවල් කර කර පය මැසුම් ලදහ.

නැවත බෝධිසත්වයන්වහන්සේ වදාරනසේක් මහරජ! මේ කාරණය ගෙනය, තමාගේ රහස් අනුන්ට නොකිය හැක්කැයි මා කියේය. රහස් නොකිකල තාපුර, කී කල යනපතැයි කිවාවූ පණ්ඩිත ජඩයෝ දූන් මහා විනාශයට පැමිණියෝයයි වදාරා නැවත වදාරනසේක්,

ගුය්හස්ස ගුය්හමෙව සාධු
නහි ගුය්හස්ස පසත්ථ මාවිකම්මං
අනිප්පඵාය සහෙය්‍ය ධීරො
නිපඵන්නත්ථො යථා සුඛං භණෙය්‍ය.

න ගුය්හ මත්ථං විවරෙය්‍ය, රක්ඛෙ නං යථානිධිං
න හි පාතුකතො සාධු, ගුය්හං අත්ථො පජානතා.

යා ගුය්හං න සෙවෙය්‍ය, අමිත්තස්ස ච පණ්ඩිතො
යො චාමිසෙන සංහීරො, හදයත්ථෙනො ච යො නරො.

ගුය්හ මත්ථ සම්බුද්ධං, සංසොධයති යො නරො
මන්තභෙදභයා තස්ස, දාස භූතො තිතික්ඛති.

යාවන්තො පුරිසස්සත්ථං, ගුය්හං ජානන්ති මන්තිනං
තාවන්තො යස්ස උබ්බෙගා, තස්මා ගුය්හං න විස්සජෙ.

විවිච්ච භාසෙය්‍ය දිවා රහස්සං
රත්තිං ගිරං නාතිවෙලං පමුඤ්චෙ
උපස්සුතිං කාහි සුණන්තු මන්තං
තස්මා මන්තො ඛිප්පමුපෙති භෙදන්ති.

යනාදී ගාථාවෙන් බණ කියා මහරජ! සිත ඇති රහසක් කාටත් නොකියා නිධානයක් මෙන් රැක්කයුතුය. ඉදින් ඉවසිය නොහී කියන්නා කැමති වුවහොත් ඊ දවස නොකිය යුතුමය. කාරණා කිම්දයත්? පාන් ජායාවලය, ගෙකණුවලය, බිත්තක් ආදී පටිච්ඡන්න ස්ථානවල සිටිනොනෙක් මේ කථා අසා දත්මය. දවල් කියනහොත් මිනිසුන් දුරු කොට ඇත් මැත් බලාපියා කියන්න වුන් හා අසන්නවුන් හා ඔවුනොවුන් සානටම ඇසෙනසේ සෙමෙන් කිය යුතුය. යම් අර්ථයක් සාධාගන්නා එකක්හු විසින් මෙවැන්නක් සිතම්; නෙරෙම්යි පලමු කාටත් නොකිය යුතුය. සිත ඇත්ත සාදා ගත්කල සුවසේ කැමති ලෙසම කියයුතුය.

තමාම රහස් නොකියමනා නම් සත්‍රීන්ටය, ජාතිවෛරී තැනැත්තවුන්ටය, මහීව අවුත් බත කඩ නිසා අවුත් සිටි තැනැත්තවුන්ටය, අමෛත්‍රියෙන් සිත වෛර තබා බසින් මිතුරු බව හඟවාතම් ඕහටත් නොකිය යුතුය. එබැවින් අනුන්ට රහස් කීම ඉතා නපුර. එහි වරද කවරේදයත්? යමෙක් යමක්හට නො කිවමනා රහසක් කියේ වීනම් ඒ පුරුෂයා තමාට කුමක් කීවත්, බිණුවත් ඉදින් මරා තලා කැමැති නිග්‍රහයක් කලත් ඔහු විසින් කරනලද යම් නිසරුවක් විඳ ගනුත් මූත් වඩා බසක් කීම් නම් මා විසින් මුව කී රහස් කථාව සැලකොට පී නම් මට අනර්ථයට කාරණා වන්නේයයි සිතා ඔහුගේ ගැත්තක්හු මෙන් ඔහු කී කල යම් ම දෙයක් විඳ ගන්නේය. එබැවින් රහස් කීමෙහි ආදීනව ඉතා බොහෝවයි වදාළසේක.

රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ගේ ධර්මාන්විතවූ මධුර ස
අසා පණ්ඩිත කොල්ලෝ තුමූ මට වෛරීව සාපරාධව සිට අ
වූ නිරපරාධිවූ කිසි කෙනකුන් විසින් අතිඥිතවූ කරුණාවෙ
වඩනාලද අදහස් ඇති තුන්ලොවට එකනෙත්‍රවූ කලපද්‍රැ
බඳුවූ මාගේ අභිමතාර්ථ සාද දෙන චින්තාමාණික්‍යයක් බඳුවූ, ම
ම ඇසක් වැනි, මාගේම ළයක් වැනි, මාගේම ජීවිතයක්
මාගේ පණ්ඩිතයන් මට වෛරීයයි කිපියව. කොල! ඒ කොල
සතරදෙනා නුවරින් පිටත්කොට නොමරා උල ඇණ
නොහොත් ඉස කපා ඇරපියවයි කීහ.

රජ්ජුරුවන්ගෙන් නියෝග ලත් පුරුෂයෝ උන් සතර
සිරගෙන් පිටත් කොටගෙන දම් කපා වැලමිටි එක්වන පරිද්
තරවා පිටිතොල කයා බැඳ හිස පස් කොණ්ඩයක් බැඳ අතප
ඒ ස්ථානයෙහි පිදුරු වෙණි බැඳ රත්මල් කණේරුමල්
කාරලා සඞ්ඝාඩගයෙහි අළු ගා උළු සුණු ගහා වීපි සතරක්
සන්ධි සන්ධියෙහිදී[1] එලාගෙන පිට බඩ[2] පහර සිය ගණන් ගස
වධයට කලමනා යම් විකාරයෙක් ඇත්නම් මුන් සතරදෙ
එකකිනුත් ඌනයක් නොකොට අවමඞගල වේශයෙන් සද
උල් සතරක් කර තබා වදබෙර ගස්වා ගෙන ඒ උන්ගේ වි
වලහම් දුටුවවුන්ගෙන් සමහර කෙනකුන්ගේ ළය කම්ප
පරිද්දෙන් උන් සතරදෙනා මහා විකාරයට මහා විනා
පමුණුවා මරන්ට ගෙනයන කල්හි,

කරුණානිධානවූ මාගේ ස්වාමිදරුවාණෝ උන් සතරෙ
ගේ ඒ දුඃඛය තමන්වහන්සේ ඉවසිය නොහී සියලු ස
කෙරෙහි පතලවූ මෛත්‍රී සිත අබ ඇටයක මහමෙර පෙරලා
සේ උන් සතරදෙනා කෙරෙහි කරුණා පවත්වා රජ්ජුරු
වදාරනසේක් දෙවයන් වහන්ස! මොහු සතරදෙන නම් නුඹ
සේගේ පුරාතන අමාත්‍යයෝය. උන් සතරදෙන අඥනව
අපරාධ ක්ෂමා කල මැනවැයි කිසේක.

රජ්ජුරුවෝ යහපතැයි උන් සතරදෙනා ගෙන්වා
බොහෝ දෙනා මධ්‍යයෙහි බොධිසත්ත්වයන්වහන්සේට ප්‍රසාද
කොට පාවා දුන්හ. එවේලෙහි ම ලෝකාලෝක දිව
ලොකෙකනෙත්‍රවූ ජනානන්දකරවූ මාගේ ස්වාමිදරුවාණෝ
වහන්සේගේ ගැත්තන් සතරදෙනා එම විටම රජ්ජුරුවන
යෙහි නිදහස් කරනසේක්, වෙදෙහ රජ්ජුරුවන්ට මෙවනු,
මස, මෙනම් වක් ලද, මෙනම් දවස්, මෙම රජ්ජුරුවන් මට
වහල්කොට දුන්නාවූ සෙනකය, පුක්කුසය, කාමින්දය, දෙ

1. අතපය එක්වූ සන්ධිසන්ධියේ හිදිගෙලා. 2. මැඩ

යන පණ්ඩිත ගැත්තන් සතරදෙනා මට පින් පිණිස නිදහස් කොළෙම්යි රජ්ජුරුවන් හා රැස්වූ බොහෝදෙනා මධ්‍යයෙහි පත් ලියා දී නිදහස් කොට වදාළසේක.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු ඒ කොල්ලන් මාගේ ආඥව පවත්නා තෙනින් තොරවයි කිහ. නැවත මහතාණෝ වදරන සේක් දෙවයන් වහන්ස! ඒ නුවණ නැති ජඩයන් කෙරෙහි ක්‍ෂමා කළ මැනවැයි රජහු ක්‍ෂමා කරවා ඔවුන්ගේ තානාන්තර[1] නවමු කොට දෙවා වදාළසේක. රජ්ජුරුවෝ සිතන්නාහු තමන්ට සතුරු වූ මෙවැනිවූ පසමිතුරන් කෙරෙහි පවා මෙසේවූ මෛත්‍රී කරන්නාහු සෙස්සවුන්ට නම් කෙසේ වෙත්දැයි බෝධිසත්ත්වයන් කෙරෙහි වඩ වඩා අතිප්‍රසන්නවූහ. එවක්පටන් පණ්ඩිතවරු සතරදෙන දළ උදුරාපු නයින් සේ ඉතා නිඃශොභාවට පැමිණ කිසිවකුත් කියන්නට කරන්නට නොපොහොසත් වූහ.

පඤ්ච පණ්ඩිත ප්‍රශ්නයයි.

පරිභණ්ඩ කථාව නිමියේයි.

එවක් පටන් බෝධිසත්ත්වයන්වහන්සේම රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරනසේක් මෙසේ සිතූසේකි. හේ කෙසේදයත්? රජ්ජුරුවන්ට එකසේවතච්ඡත්‍රය ම පමණෙක. මේ රජ්ජුරුවන්ගේ ආඥව පවත්නාවූ අයම් විතරින් එක් දහස් දෙසිය යක් ගවු පමණ. මේසා මහත් ජනපදයක් හා, එසේම අයම් විතරින් අටවිසි ගවුවක් පමණ මේසා මහත් නුවරක් හා චතුරඞ්ගිනී සේනාවක් ඇතුළුවූ සියල්ලක්ම එක පැතිර මාගේ විධානය. මා කීවක් කෙළේමය. එබැවින් මේසා මහත් රාජ්‍යයක් විචාරන්නාවූ මා විසින් පමා නොව රෑ දෙවේලෙහි අප්‍රමාදව විසිය යුතුයයි සිතා ඒ සත්යොදුන් මියුලු නුවර වටා අටළොස් රියන් උස මහා පවුරක් කරවා පවුර ඇතුළ පිට සලක්‍ෂණකොට පදනමකුත් බඳවා ලූ සේක. මහාවාසල් සතරක් හා අට්ටාල අනතරට්ටාළ බලකොටු කුරුබිලි ආදිවූ දෙයත් කරවා ලූ සේක. සතුරු කෙනකුන් නොසේසේ අවත් ඇද යනා හෙලා නොපියන ලෙස වාසල් දෙපිට ඉන්ද්‍රඛීල ඉඳුවාලූසේක. පවුරෙන් ඇතුළේ ඒ ඒ ස්ථානයෙහි ගල් ගසන යන්ත්‍ර කර්මාන්ත[2] ඉඩම් ගිනී කරවාලූසේක.

පවුරෙන් පිටත පැන් අගලය, කලල් අගලය, වියලි අගලයයි අගල තුනකුත් කරවාලූසේක. අගලවල් මැද ගොඩ ගොඩ වළ පා පොළොම් හා බොරුවළ සදවාලූසේක. ඇතුළු නුවර දිරා ගිය ගෙවල් හැම තර කරවාලූසේක. මහත් පොකුණු බිඳුවා පැන්

1 ස්ථානාන්තර 2, යන්ත්‍රකර්ම භා

පුරවාලූසේක. ඒසා මහත් නුවර කවුරුන්ගේ කොටු ගෙවලුත් වී ගෙන්වා පුරවාලූසේක. තමන්වහන්සේ හා කුලූපගව හිඳිනා තපස්වීන් ලවා හිමාලයෙහි විල්වලින් ඇඹුල අල හා ඉන් මැටි ගෙන්වා තබවා ගත්සේක. නුවරින් පිටතත් නොනතර ගෙවල් තාක් මුළුල්ල තර කරවාලූසේක.

වෙදෙහ රජු මහලුවත් මේවිවර වනතුරු පළමු නොකරවූවාවූ මෙතෙක්දු තමන්වහන්සේ බාල වයසම මෙසේ කරවූසේ කුමක් පිණිසදයත්? ඉදින් නොසේසේ ඉදිරියෙහි භයෙක් පැමිණියේ වීනම් ඒ භය සංහිඳුවා ගන්නා පිණිසය.

නැවත දඹදිව ඒ ඒ නුවරවලින් ආවාවූ වෙළෙඳුන් අතින් කොයි සිට අවුදුයි විචාරා මෙනම් තෙනසිට ආම්හයි කී කල්හි තොප තොපගේ රට රජදරුවෝ එක්වන් කුමක් කුමක් ප්‍රිය වෙද්දයි විචාරා මෙනම් මෙනම් දෑ කැමැත්තාහයි කී කල්හි එකීවන්ට උපකාර කොට යවා තමන්වහන්සේ හා සහජාත යොධයන්ගෙන් සියයක් දෙනා කැඳවා කුඩාවරිනි! මේ මාවිසින් දෙන ලද පාක්කුඩම් ඇරගෙන එක් සියයක් රාජධානියෙහි රජදරුවන් සමීපයට ගොස් මේ පඬුරු දී රජ්ජුරුවන් ඉන කොටගෙන උන් උන්ට සේවාකම් කරන්නාවූ තෙපි ඇම උන් උන් කරන්නාවූ යුධ ප්‍රයොග ආදීවූ යම් ක්‍රියාවක් මන්ත්‍රණයෙක් ඇත් නම් පරීක්ෂාකොට මට කියා එවා තෙපි හැම දෙන එහිම වසව. මම තොපගේ අඹුදරුවන් සුවසේ රකිම්යි කියා සමහරුන්ට කුණ්ඩලාභරණය, සමහරුන්ට රන්මිරිවැඩිය, සමහරුන්ට මඟුල් කඩුවය, සමහරුන්ට රන් මාලාය, යන මේ සියල්ලෙහි තමන්වහන්සේගේ නම අකුරු ලියා යම් දවසෙක මාගේ කටයුක්තෙක් පැමිණියේ වීනම් එදවස් මේ අකුරු බැලූවන්ට පෙන්වයි අධිෂ්ඨාන කොට ඔවුන් අත යවූසේක.

ඒ පුරුෂයෝ එක් සියයක් දෙන එක් සියයක් පාස්කුඩම් ගෙන, එක් සියයක් රජුන් සමීපයට ගොස් ගෙන ගිය පඬුරු පාවා දී කුමක් නිසා අවුනැයි කී කල්හි නුඹවහන්සේට සේවයට ආම්හයි කියා කොයි සිට අවුනැයි කී කල්හි ආ තැන් තබා අතික් තැනක්ම කියන්නාහු ඔවුන්ට අභ්‍යන්තරව ප්‍රාණ සමාන වූහ.

එසේ වසන සමයෙහි "එකබල" රට "සඞ්ඛබල" නම් රජ්ජුරුවෝ ආයුධ සන්නාහ කරවන්නාහ. සෙනාව පෙළ ලවන්නාහ. පිරිස් එක් කරවා පෙළ බලන්නාහ. උන් සමීපයෙහි සිටි චර පුරුෂයා බොධිසත්ත්වයන්වහන්සේට අස්නක් එවන්නේ මේ මෙරට රජ්ජුරුවන් එක්වන් කරන්නාවූ ක්‍රියාවය. ඒ මම කුමක් බවත් නොදනිම්. ඊට තිසි කෙනකුන් එවා තත්වූ පරිද්දෙන් දූත වදාළ මැනවැයි කියා එවීය.

ඉක්බිති බොධිසත්වයන්වහන්සේ තමන්ද වැඩූ මාණ්ඩගොත්‍රයෙහි උපන් රන්වන් ගිරා පැටවාණන් කැඳවා උන් අවුත් තමන්ගේ පක්ෂද්වය මුදුනෙහි තබා වැඳ ආදර දක්වා සිට නුඹවහන්සේ වදාළ යම් අභිමතාර්ථයක් සාද දී ලමි. සැක නොකොට වදාළ මැනවැයි කීකල්හි වදරතසේක්, මාගේ එකාත්මිකවූ ගිරවාණෙනි! තොප මෙතෙතින් පලාගොස් "එකබල" රට "සඞ්ඛබල" නම් රජ්ජුරුවෝ මෙතම් මෙතම් දෙයක් කෙරෙතියි තියම දූතගෙන සියලු දඹදිව එක් සියයක් රාජධානි මූළුල්ලෙහිම පරීක්ෂා කොට අවුත් අමුත්තක් දුටු නම් මට කියවයි කියා මීයෙන් හැනූ විලඳ කාවා සතපාක, සහස්‍රපාක තෙලින් දෙපියා අතුරු පිරිමැද තැගෙනහිර සිවුමැදුරු කවුළුවෙහි සිට ආකාශයට හලසේක.

ඒ රන්වන්වූ ගිරවාණෝ තිල්වූ ආකාශයෙහි තමාගත් තියාව කුමක් වැන්දයත්? අඤ්ජනකූට පර්තයෙහි විජ්ජුලතාවක් හුනු කලක් මෙන්ද, ශරදාකාශයෙහි ඉන්ද්‍රචාපයක් මෙන්ද, නොහොත් ඉන්ද්‍රනීල මාණික්‍ය තලයක් රන් හූ ගසා බෙදන්නක්හු මෙන් වහාම එකබලරට ගොසින් එහි සිටි පුරුෂයා අතින් රජහුගේ පවත් තත්වූ පරිද්දෙන් දූත දඹදිව මූළුල්ලෙහි පරීක්ෂා කොට ගෙන කම්පිල්ල දෙශයෙහි උත්තර පඤ්චාලනුවරට පැමිණියාහ.

එසමයෙහි ඒ නුවර "චූලනී බ්‍රහ්මදත්ත" රජ්ජුරුවෝ රජ කරන්නාහ. ඒ රජ්ජුරුවන්ට කෙවට්ට නම් පුරොහිත බමුණෙක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නේය. ඒ බමුණු තෙමෙ කිමෙහි බිණිමෙහි ඉතා දක්ෂය, මන්ත්‍රිය. එක් දවසක් ඒ බමුණු තිද පිබිද අලුයම් වේලෙහි යහන් මුදුනෙහි උන්නේ දිලියෙන්නාවූ පහන් ආලොකයෙන් තමන්ගේ සරහා තිබෙන්නාවූ ශ්‍රී යහන් ගබඩාව හා අනන්තවූ සම්පත් බලා මේ මාගේ මේසා සම්පත් විශෙෂය කා විසින් මට දෙන ලද්දේ දෝ හෝ මාගේ නෑසිය කෙනකුන් මට දුන් දෙයකුත් නොවේය. අත බලයෙන් මා උපයාගත් දෙයකුත් නොවෙයි. මේ හැම වූ කලි චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් සන්තකය. උන් විසින්ම මට දෙන ලද්දේය. මෙබඳු යස දායක රජ්ජුරුවන් මාගේ උපායෙන් දස දහසක් යොදුන් දඹදිවට නායක කරවා මමත් අග්‍ර පුරොහිත වීම් නම් යහපතැයි සිතා උදෑසන රජ්ජුරුවන් සමීපයට ගොස් මහරජ! සුවසේ රෑ සැතපුනු සේක්ද? යනාදීන් මිහිරි කථා කොට නැවත මහරජ! කිවමනා රහස් කථාවක් ඇතැයි කීය. කියව ආචාරීනි. කී කල්හි! මහරජ! ඇතුළු නුවරදී රහස් කීම නපුර. උයනට යම්හයි කියා යහපතැයි ඔහු සමගින් උයනට ගොසින් සේනාව පිටත රඳවා වට රැකවල් ලවා බමුණා හා දෙන්නාම උයනට වැද මඟුල් සල්වට උන්හ.

ගිරවාණෝ මූත්දෙන්නාගේ මේ ක්‍රියාව දැක මේ වූ කලී නොකාරණයෙක් නොවෙයි. එකාන්තයෙන් අද මාගේ පණ්ඩිත යන්වහන්සේට කියා පියන තරම් යම් කිසිවක් අසම්හි උයනට වැද මඟුල් සල්ගස පාත අත්තෙක කොළතුරෙ සැඟවීලා වැද උන්හ. එ වේලෙහි රජ්ජුරුවෝ කියව ආචාරීනි'යි කීහ. මහරජ! මෙසේ කන තමා ලුව මැනවැයි, මේ මා කියන්නේ සතරකන් මන්ත්‍රණයෙක. ඉදින් මා කීවා කලෙසක් වී නම් නුඹවහන්සේ සියලු දඹදිව අගරජ කොට ලම්හි කිය. ඒ රජතෙමේ බමුණා බස අසමින්ම රාජ්‍යලොභයෙන් මහත්වූ සොම්නසට පැමිණ කියව ආචාරීනි! තොප කීවා ලෙසක්ම කොරෙමියි කිය.

දඹදිව ගන්නා උපාය කියන බමුණු දේවයන්වහන්ස! අපි අපගේ සෙනාව සරහාගෙන ගොස් පළමු කුඩා නුවරක් වටලා ගනුම්හ. මම එවිට කුරුකිලියෙන් එනුවරට වැද රජහට කොල! මහරජ! තොපගේ යුඩයෙන් ප්‍රයෝජන නැත. උදක් තොප විසින් අප හා සමගවන්නා තොපගේ රටත් සේනාවත් තොපටමය. ඉදින් යුඩ කරාතම් අපගේ බලඇණි මහත්හෙයින් තොප එකාන්තයෙන්ම පරදවයි කියමි. එසේ මා කී කල්හි ගිවිස්සාහු වීනම් සංග්‍රහ කරම්හ. නොවිස්සාහු වීනම් සටන් කොට රජහු ජීවිතක්ෂයට පමුණුවා දෙසෙනග ඇරගෙන අනික් නුවරකට ගොස් එයිත් එපරිද්දෙන්ම ගෙන ඉන් අනික් නුවරෙක; ඉන් අනික් නුවරෙකැයි මෙම ක්‍රමයෙන් සියලු දඹදිව රාජ්‍යය ගෙන ජය පානය බොම්හයි කියා එක් සියයක් රජුන් අපගේ නුවරට ගෙන්වාගෙන උයනදී විෂ මිශ්‍රවූ රා පොවා සියලු රජුන් ජීවිතක්‍ෂයට පමුණුවා කකුල් අල්වාගෙන ගඟට දමා පියා එක් සියයක් රාජධානියෙහි රාජ්‍යය අප සන්තක කරම්හ. එසේ කල්හි සියලු දඹදිවට නුඹවහන්සේ අගරජ වනසේකැයි කිය.

රජතෙමෙ ඒ උපාය ඉතා යහපත. එසේම කෙරෙම් ආචාරීනි!යි කීය. නැවත බමුණු කියන්නේ මහරජ! මේ සතර කන් මන්ත්‍රණය නම්, අනික් කවුරුනුත් ඇසිය යුතු නොවෙයි. එසේ හෙයින් කල් යවන්ට නොපිළිවන. වහා සේනාව සරහා නික්මුන මැනවැයි කීය. රජ්ජුරුවෝ යහපතැයි ගිවිස්සාහ.

ගිරවාණෝ දෙන්නාගේ රහස් මන්ත්‍රණය කියා නිමියා අසා සිත තබාගෙන සාල්ලකින් බානාසේ කොවටායාගේ මට්ටවූ ඔළුව මුදුනෙහි වළිසක් එලූහ. එ බමුණු මහලූ කිමෙක්දැයි කට දල්වා ගෙන උඩ බැලූවහු මුඛයෙහි නැවත වසුරු පිඩක් හෙලා "ක්‍රිත්" යන ශබ්දයක් පවත්වා කොළතුරෙන් උඩ නැඟී කොල දුෂ්ටවූ කොවටාය! තෝ තාගේ තෙල මන්ත්‍රණය සතරකන් මන්ත්‍රණයයි

සිතසිද? එසේ නොසිතව. තොප දෙන්නාගේ සතර කනත් මාගේ දෙකනත් එක්කොට සකාන් මන්ත්‍රණය විය. නොබෝ කලකින් අට කනකට යෙයි: ඉන් ඔබ්බේ සතසහස්‍ර කන්වලට යෙයි කියා තුලු ගනුව, විදුවයි කියමින් සිටියදීම වාත වෙගයෙන්ම දිවගෙන අවුත් බොධිසත්ත්වයන්ගේ මාලිගාවට වන්හ.

ඒ ගිරවාණන්ගේ පෙර තිබී එන්නාවූ මෙසේවූ වතෙක් ඇත්තේය. ඉදින් යම් තෙනකින් ගෙනා අස්නක් බොධිසත්ත්වයන් වහන්සේට කිවමනා වී නම් ඔබගේ උරයට බස්නාහ. අමරා දේවීන්දූත් ඇසුවමනා වී නම් ඇකයට බස්නාහ. බොහෝ දෙනා ම ඇසිය යුතු වී නම් බිමට බස්නාහ. එදවස් ගිරවාණෝ බොධිසත්ත්වයන්ගේ උරයට බටහ. ඒ සලකුණෙන් රහස් කථාවක් වී යයි සමීපයෙහි සිටියාවූ බොහෝ දෙනා අවකාශ දී එතෙකින් පිටත් වූහ.

මහනාණෝ ගිරවාණන් වඩාගෙන මතු මහලට නැගී පුත! තොප ඇසුවයේ දුටුයේ කිම්දැයි විචාළහ. ස්වාමීනි! සියලු දඹදිව ඇවිදිනාවූ මම එකද රජක්හුගෙනුත් භය කාරණයක් දුටුයේ නැත. උත්තරපඤ්චාල නුවර චූලනී බ්‍රහමදත්ත රජහුගේ කෙවට්ට නම් පුරොහිත බමුණෙක් රජහු උයනට ගෙනවුත් සතරකන් මන්ත්‍රණයක් කිය. මම මගුල් සල්ගස සාඛා අතුරෙහි සැඟවී උන්නෙම්, ඒ සියල්ල අසා සිත තබාගෙන ඒ සා මගත් අපරාධයක් කිවාවූ ඒ බමුණාගේ කට වළිස් කොටපියා ආමියි කියා සියලු දුටුවාවූ ඇසුවාවූ මුළුල්ලම තත්වූ පරිද්දෙන් කිය. රජ්ජුරුවෝ ගිවිස්සෝදැයි කී කල්හි ගිවිස්සෝයයි කීහ.

බොධිසත්ත්වයන්වහන්සේ ගිරවාණන් මී හා විලඳ කවා මී පැන් පොවා කළමනා සත්කාර කොට මොලොක් ඇතිරි ඇති රන් මැදිරියෙහි සතපා තමන්වහන්සේ සිතනසේක් කෙවට්ටයා මා මහෞෂධපණ්ඩිත නියාව තව නොදන්නාවනැයි ඔහුගේ මේ මන්ත්‍රණය මුදුන් පත් විය නොදෙමියි සිතා තමන්වහන්සේගේ නුවර නොයෙක් කුලවල දුක්පත් යම් කෙනකුන් නුවරින් පිටත් කරවා දුරු ගම්වල වැස්වූසේක. තමන් වහන්සේගේ රට ජනපදවාසීන්ගෙන් සියලු සමපතතීන් ආඪ්‍යයන් ගෙන්වා ඇතුළු නුවර වැස්වූසේක. බොහෝවූ ධනධාන්‍ය රැස් කරවූසේක.

ඉක්බිති බ්‍රහමදත්ත රජ්ජුරුවෝ ද කෙවට්ටයාගේ බස් ගෙන සෙනාව පිරිවරා ගෙන ගොස් කුඩා එක් නුවරක් වට කළාහ. කෙවට්ටයා තමා පළමු කී පරිද්දෙන් කුරුබිලියෙන් ඇතුළු නුවරට වැද රජහු ගිවිස්වා වසඟ කොටගෙන ඉදසෙනාව එක්ව ගොසින් අනික් නුවරක් ගෙන ඉන් අනික් නුවරක, අනික් නුවරකැයි කියා මෙසේ

බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ කෙවට්ටයාගේ බස් ගිවිස වෛදෙහ රජු වසන මියුලු නුවර තබා දඹදිව එක් සියයක් රාජධානියෙහි රජ දරුවන් තමන් සන්තක කළාහ.

බෝධිසත්ත්වයන්වහන්සේගේ චරපුරුෂයෝ පළමු ජය ගත් නුවර පටන් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මෙතෙක් නුවර ගත්හයි පමා නුවුව මැනවැයි එක්වන් කියා යවන්නාහ. බෝධිසත්ත්වයන් වහන්සේ මාගෙන් පමාවෙක් නැත. තෙපි ඇමත් උකටලීව නොව වසවයි කියා යවූසේක.

බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද සත් අවුරුදු සත්මස් සත්දවසකින් මියුළුනුවර තබා දඹදිව එක්සියයක් රාජධානි අත්පත්කොට කෙවට්ටයාට කියා යවන්නාහු වෛදෙහයා වසන මියුලු නුවර ඇරගනුම්හයි කීහ. කෙවට්ටයා කියන්නේ මහරජ! මහෞෂධ පණ්ඩිතයන් වසන නුවර ඇරගන්ට ඉතා නොපිළිවන. පණ්ඩිත යෝ ප්‍රඥාසම්පන්න උපායෙහි දක්ෂ මහාමාත්‍ය කෙනෙකැයි තමා මූඛ නොසෑහෙන පරිද්දෙන් බෝධිසත්ත්වයන්ගේ ගුණ සඳ මඬල අඳනාසේ විස්තර කොට කියා තමා නුවණැති මන්ත්‍රියා හෙයින් තමාගේ නුවණින් රජහු ගිවිස්වා මහරජ! ඒ මියුලු නුවර නම් ඉතා ක්ෂුද්‍රවූ නුවරෙකැයි සියලු දඹදිව රාජ්‍යය අපට සෑහෙයි. ඒ ගෙන කාරිය කිම්දැයි උපායෙන් රජහු ගිවිස්වාපීහ.

සෙසු රජදරුවෝ ඇමත් මියුලුනුවර ඇරගෙනම ජයපානය බොම්හයි කීහ. කෙවට්ටයා නොයෙක් කාරණයෙන් උන් හැම ගිවිස්වන්නේ රජදරුවෙනි! වෛදෙහ රට අමුතුව ගනමනාද? ඒ රජ්ජුරුවෝ තමාම අප සන්තකයෝයයි කියා ගිවිස්වා නැවතීය.

බෝධිසත්ත්වයන්වහන්සේගේ චරපුරුෂයෝ කියා යවන්නාහු බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ දඹදිව සාද එක් සියයක් රජුන් හා සේනාව ගෙන මියුලු නුවරට එන්නාහු නැත. තමන්ගේ නුවරටම ගොසින් වන්හයි කියා යවන්නාහ. ක්ෂණ මන්ත්‍රිවූ මාගේ ස්වාමි දරුවාණෝ නැවත කියා යවනසේක් මෙයින් මතු උන් කරන ක්‍රියාවක් ඇත්නම් දැන කියා එවයි යවූසේක. පළමු කී පරිද්දෙන් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ජය පානය බොම්හයි කෙවට්ටයා හා මන්ත්‍රණය කොට උත්සවයට තරම් ලෙස ධජ, පතාක, නොයෙක් තොරණ, පුන්කලස්, සුදුවැලි, ධජපතාකා ලදපස්මල් දම් ආදියෙන් උයනද, මගද, නුවරද සරහා ශක්‍ර පුරයෙහි දෙවතාවන්ගේ සමෘඩ හාරයෙන් නඳුන්වන උයනින් භාගයක් බිමට බට්ටුවාසේ අතිමනෝ හර කොට සැල සිය දහස් ගණන් රා තබවා මච්ඡ මාංස කනබොන දෑ පැසි ආදී වූ දෙය නොමඳ කොට රැස් කරව යනාදීන් නියෝග කළහ.

චරපුරුෂයෝ ද එපමත් බොධිසත්වයන්වහන්සේට කියා යවූ හ. ඒ පුරුෂයෝත් ජය පානය බොති, දන්නා බව මුත් විෂ යොදා රජදරුවන් මරති, නොදන්නාහ. බොධිසත්වයන්වහන්සේ සිරවාණන් අතින් ඇසූ හෙයින් දන්නාහ. එබැවින් ජය පානය බොන දවස් මේයයි නියම දන එවයි කියා යවූසේක. චරපුරුෂ යෝත් උත්සව දවස් මේයයි නියම දන කියා යවූහ.

කරුණා නිධානවූ අසරණයන්ට සරණවූ මාගේ සවාමිදරුවාණෝ සිතනසේක් මාසේවූ නුවණැති මහාමාත්‍යවූ ජගත් පණ්ඩිත යකු ජීවත්ව ඉන්දදී මෙතෙක් රජදරුවන් අනාථ මරණෙන් නැසී යාම සුදුසු නොවන්නේය. උන්ට පිටිවහල්ව රැක පියම් සිතා සහජාත යොධයන්ගෙන් පලමු මෙහෙවර ගිය එක් සියයක් දෙනා හැර සෙසු යොධයන් බණවාලා කුඩාවරිති! බ්‍රහමදත්ත රජ්ජුරුවෝ තමන්ගේ මගුල් උයන සරහා එක්සියයක් රජුන් පිරිවරා සුරාපාන උත්සව කෙරෙත්ල. තෙපි එතෙනට පලාගොස් රජදරුවන්ට පනවනලද ආසනවල එක රජකුත් නොහිඳිනාතෙක්ම බ්‍රහමදත්ත රජ්ජුරුවන්ට පැනවූ ආසනයට ඉක්බිති මාහැඟි ආසනය අපගේ රජ්ජුරුවන්ටයයි අල්වා ගනුව. එතෙන සිටි පුරුෂයන් තෙපි කාගේදැයි විචාල කල්හි වෙදෙහ රජ්ජුරුවන්ගේ යයි කියව. ඔහු නුදුටුම්හ. කිමෙක්ද උන් තොපට රජබව මුත් අපට රජ්ජුරු කෙනෙක්ද? යව උවමනා වීනම් කෙළවර ආසනය ගනුවයි කලහ කෙරෙති. තෙපි කියන කල බ්‍රහමදත්ත රජ්ජුරුවන් හැර අපගේ රජ්ජුරුවන් හා සරිකෙනෙක් දඹදිව අතික් කවුරුදැයි කියා කලහ වඩ වඩා අපගේ රජ්ජුරුවන් හිඳිනා ආසන පමණ කුත් නොලබන කල දුන් තොප රාපියත් නොදෙම්හ. මචඡ මාංසත් කෑ නොදෙම්හයි කියා මහත්කොට හඩ ගසමින් ඔල්වර සන් දෙමින් තොපගේ ශබ්දයෙන් ඔවුන් ඇම අතිශයෙන්ම කුප්පවා තොප තොප අත මුගුරෙන් රා මස් පුරා තිබූ සිය දහස් ගණන් රා සැළ බිඳ රා හා මචඡ මාංස මුළුල්ල විසුරුවා පයින් මැඩ වැලි මිශ්‍ර කොට වහා දිවගෙන ගොස් දිව්‍යපුරයට වන් අසුරයන් පරිද්දෙන් සියලු මනුෂ්‍යයන් හයින් තැති ගන්වා ඝෝෂාහා කොටපියා අපි මියුලු නුවර මහෞෂධ පණ්ඩිතයන්ගේ යොධයම්හයි කොල! සපන් එකෙක් අප අල්වා ගන්වයි, තොප මාගෙන් ගිය නියාව හඟවා කියාලා වහා එවයි කියා යවූසේක.

ඒ යෝධයෝත් යහපතැයි ගිවිස පඤ්චායුධ සන්නද්ධව නික්මුණාහු සාරසියයක් ගවු ගෙවා එකදුම ගොස් ශත්‍රුයන්ගේ නදුන් වන උයන පරිද්දෙන් සරහා නිමවනලද උයනට වැද

නගන ලද ධවලච්ඡත්‍ර ඇති එක් සියයක් රජදරුවන්ට සැරහූ ආසන ආදීවූ නොයෙක් ශ්‍රී විභූති දක එනකල බොධිසත්ත්වයන්වහන්සේ කළ විධානවූ නියාමයෙන් කිසිවකුත් නොවරදවා රා මස් කන බොන දූ ආදියෙන් කිසිවකුත් අනුභවයට නොනිසිවන පරිද්දෙන් බිඳ සුණු විසුණු කොට පියා සුරෙක් අප අල්වා ගනුවයි තමන් වූ නියාව කියා මියුලු නුවරට බලා නමාගත්හ. උයන සිටි රාජ පුරුෂයෝ එපවත් තම තමන්ගේ රජදරුවන්ට ගොසින් කීහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් මාගේ මේ නියා විෂයෝගයට අන්තරාය කළාහයි කිපියාහ. එක් සියයක් රජදරුවෝද අපගේ ජය පානය පිය නුදුන්නෝයයි කිපියාහ. අටළොස් අක්ෂෞහිණී සංඛ්‍යාත මහා සේනාවද කොල! අතින් මිලයක් නොදී අනායාසයෙන් සිතසේ බී පියන සුරාව නොලද්දම්හයි කිපුණාහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක් සියයක් රජ දරුවන් කැඳවා පින්වත්නි! මියුලු නුවරට පලා ගොස් වෛදෙහ රජු ඉස කඩුවෙන් කපා පියා පයින් මිරිකා ගෙන ජය පානය බොම්හයි, වහා සේනාව සරහා නික්මෙවයි නියෝග කොට නැවත නතිව කෙවට්ටයාට මෙපවත් කියා. අපගේ මෙබඳු මන්ත්‍රණයට අන්තරාය කළ පස මිතුරන් දෙන්නා අල්වා ගන්නා පරිද්දෙන් එක් සියයක් රජදරුවන් හා අටළොස් . අක්ෂෞහිණී පමණ සේනාව පිරිවරා ඒ මියුලු නුවරට යම්හ ආචාරිනි! අප හා කැටිව එවයි කීහ.

කෙවට්ටයා තමා මහනුවණැති හෙයින් මෙසේ සිතා. මහෞෂධ පණ්ඩිතයන් පරදවා ජයගන්නට ඉතා නොපිළිවන. ඉදින් ගියහොත් ඒකාන්තයෙන් පරදනා හෙයින් ලජ්ජා වන්නේය. එබැවින් ගොසින් ලජ්ජාවට පැමිණෙන්නාත් බලාත් නවතා පියම්'යි සිතා රජ්ජුරුවන්ට කියන්නේ මහරජ! වැලිත් වෛදෙහ රජ්ජුරුවන්ගේ බලයෙක් නොවෙයි. මහෞෂධ පණ්ඩිතයන් නුවණින් යෙදී කරන්නාවූ විධාන ශක්තියය. ඒ පණ්ඩිතයෝ මහත්වූ ආනුභාව ඇති කෙණෙක. ඒ පණ්ඩිතයන් රක්නාලද මියුලු නුවර තම් සිංහයකු රක්නා රන් ගල් ගුහාවක් වැන්න. එබැවින් ඒ නුවර ගැන්ම ඉතා නොපිළිවන. ගියොත් ඒකාන්තයෙන් ලජ්ජාවට පැමිණෙන්නේ නිසැකය. ඔබ ගමනේ ප්‍රයෝජන නැත. නැවැත්ත මැනවයි කීය.

රජ්ජුරුවෝ ඓශ්චර්‍ය්‍ය මදයෙන් හා ක්ෂත්‍රිය මානයෙන් මත් වූවාහු එක රජෙක් කුමක් කරන්ට ශක්ති ඇත්තේ දැයි ක්‍රොධයෙන් දිලිහී එක් සියයක් රජ දරුවන් හා සේනාව පිරිවරා නික්මුණාහ. කෙවට්ටයාත් තමාගේ බස් ගිවිස්වා ගත නොහී රජදරුවන්ට පට ගැනිව නොකීකරුවීම යුක්ත නොවෙයි සිතා සිතින් නොසිතින් කැටිව නික්මුණ. රා සැලවල් බිඳ, කෝප කරවා [නික්මුණු] යෝධයෝ

එකද රැයින්ම සාරසියයක් ගවු ගෙවා ගොසින් තමන් කළ බුහුටි කම් බොධිසත්වයන්වහන්සේට කීහ. පළමු යැවූ චරපුරුෂයෝත් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් වෛදෙහ රජ අල්වා ගනුම්හයි, එක් සියයක් රජුන් හා මහාසේනාව පිරිවරා නික්මුණාහ.

චරපුරුෂයෝ පණ්ඩිතයන්වහන්සේ අප්‍රමාද නුවණින් යෙදී හිඳිනාසේක් වනැයි කියා අද මෙතම් තෙනට ආහ. අද මෙතම් තෙනට ආහයි, අද නුවරට වදිතියි යනාදීන් එක්වන් කියා යවන් නාහ. ඒ අසා බොධිසත්වයන්වහන්සේත් මාගෙන් කිසි ප්‍රමාදයෙක් නැතැයි කියා යවනසේක්මය.

බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මේ නුවර ගන්නා පිණිස එත්ලයි වෛදෙහ රජ්ජුරුවෝත් අසත්මය. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මියුලු නුවරට ආ දවස රෑ නොවනතෙක් විලක්කු සිය දහස් ගණනින් යුක්තව අවුත් සත් යොදුන් මියුලු නුවර තුන් සඬියකින් හා සතර වලල්ලකින් චතුරඞ්ගිනී සෙනාව වටලා අතුරු සිදුරු නැතිව පිරිවරා ගත්හ.

ඒ කෙසේදයත්? පවුරෙන් පිටත තුන් අගලෙකින් දිය අගල වට කොට නුවරට මුහුණ ලා කන්තලින් කන්තල ගටා පිට හුන් ඇතරුවන් සහිතව සිදුරක් නොපෑ සිටුවා ගත් ඇත් සේනාවය. ඒ ඉක්බිති ඔවුන්ට පස්සෙහි ඉතා නුදුරු නොළංකොට කරින් කර බඳ අසරුවන් සහිත සිටුවාගත් අශ්වසෙනාවය. උන්ට ඉක්බිතිව රථසකින් රථසක එකම්යෙහි අසුන් සතර දෙනා බැගින් යොද සියලු රථාලඞ්කාරයෙන් සරහා නිමවනලද රන් ධජ නඟා යුද්ධයෙහි දක්ෂ යොධයන් පුරා සිටි රථ සේනාවය. ඒ ඉක්බිති පස්සෙහි අපමණ තෙනෙක්හි පඤ්චායුධ සන්නාඬව අතුරු සිදුරු නැතිව සිටියාවූ මහාසෙනාවය. යන මේ සතර වලල්ලය.

තුන් සඬිය නම්, ඇත් පවුරටත් මධ්‍යයෙහි උරයෙන් උරය ගැවී දුනු හී ගත් අත්ඇතිව හියවුරු පිට බැඳ සන්නාහ සන්නද්ධව නුවරට මුහුණ ලා සිටි දුනු සේනාවය, යනාදි තුන් සඬියකින් හා සතර වලල්ලකින් සුරක්ෂිතකොට රැකවල් ලවා ඒ ඒ ස්ථානයෙහි බලඇණි සිටුවා වටලා ගත්හ.

මනුෂ්‍යයෝ තාක් මුළුල්ල කොක් සන් දෙන්නාහු අඹපාළන් නාහු, ඔල්වර සන් ගසන්නාහු, ගී කියන්නාහු, මහත්වූ කොලා හල කළහ. විලක්කු ආලොකයෙන් හන් පළන් වස්ත්‍රාභරණාදි යෙහි ආලෝකයෙන් අටවිසි ගවුවක් පමණ ඒසා මහත් මියුලු නුවර හිරු නැංගාසේ ආලෝක විය. ඇතුන්ගේ කුඤ්චනාදයෙන් හා අසුන්ගේ හෙසාරවයෙන් හා රථචක්‍ර ඝර්ෂණයෙන් හා පදදී

සේනාවෙහි කොලාහලයෙන් හා, අංඛාර, සක්, සින්නම්, බෙර, තලි ආදීවූ නොයෙක් කෝලාහලයෙන් ඒ නුවර මහපොළොව පැලී යන්නාසේ කෝලාහලයෙන් ඉතා භයපත් විය.

නුවණින් අපමුත් නැතැයි බැහැවෙන්නාවූ සේනකාදී පණ්ඩිතවරු සතරදෙන ඒ කෝලාහල අසා කුමක් බවත් නොදන්නාහු රජ්ජුරුවන් සමීපයට ගොස් මහරජ! නුවරින් පිටත මහත්වූ කෝලාහල ශබ්ද ඇසෙයි. අපි ඒ කුමක් බවත් නොදනුම්හ. පරීක්ෂා කළහොත් යහපතැයි කීහ. ඒ අසා රජ්ජුරුවෝ වැලි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ අවුදෝ හෝයි සිවුමැදුරු කවුළුව හැර බලන්නාහු උන් ආ බව දැන ඉතා භයපත්ව මෙවිට අපගේ ජීවිතය නැත. සෙට උදෑසන නුවරවාසීන් හා අප හා මරා ජීවිතක්ෂයට පමුණුවති. කුමක් කරමෝදෝහෝයි උනුත් හා කථා කරමින් උන්හ.

සරණාගත වජ්‍රපඤ්ජරයක් බඳුවූ මාගේ ස්වාමිදරුවූ බෝධිසත්වයන්වහන්සේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් ආබව දැන කේශර සිංහරාජයකුසේ ඉතා නිර්භීතව සියලු නුවර ඒ ඒ ස්ථානයෙහි රැකවල් සංවිධාන කොට රජ්ජුරුවන් අස්වසා ලමියි සිතා රජගෙට ගොස් මාලිගාවේ මතුමහලට නැගී රජහු වැඳ එකත්පස්ව සිටියේක. පළමු භයින් පීඩිතවූ රජ්ජුරුවෝ බෝධිසත්වයන්වහන්සේ දැක මඳකුත් නුවූ භයින් සිහි එලවා ගෙන මාගේ පුත්‍රණුවන් මහෞෂධ පණ්ඩිතයන් විනා මේ දුකින් මා මුදලන්ට සමර්ථ කෙනෙක් නැතැයි සිතා ඔබ හා සමග කථා කරන්නාහු මේ ගාථාවෙන් කියත්.

පඤ්චාලො සබ්බසේනාය - බ්‍රහ්මදත්තො සමාගතො
සායං පඤ්චාලියා සේනා - අප්පමෙය්‍යා මහොසධ!.

පිට්ඨිමතී පත්තිමතී - සබ්බසඞ්ගාමකොවිදා
ඔහාරිනී සද්දවතී - භෙරිසඞ්ඛප්පබොධනා.

ලොහවිජ්ජාලඞ්කාරාභා - ධජිනී වාමරොහිනී
සිප්පියෙහි සුසම්පන්නා - සූරෙහි සුප්පතිට්ඨිතා.

දසෙත්ථ පණ්ඩිතා ආහු - භූරිපඤ්ඤා රහොගමා
මාතා එකාදසී රඤ්ඤො - පඤ්චාලියං පසාසති.

අථෙත්ථෙකසතං ඛත්‍යා - අනුයුත්තා යසස්සිනො
අච්ඡින්නා රට්ඨා ව්‍යථිතා - පඤ්චාලීනං වසංගතා.

යං වදා තක්කරා රඤ්ඤො - අකාමා පියභාණිනො
පඤ්චාල මනුයායන්ති - අකාමා වසිනො ගතා,

තාය සෙනාය මිථිලා - තිසන්ධිපරිවාරිතා
රාජධානී විදෙහානං - සමන්තා පරිඛඤ්ඤති.

උද්ධං තාරකජාතාව - සමන්තා පරිවාරිතා
මහොසධ! විජානාහි - කථං මොක්ඛො භවිස්සතී,ති.

මේ ගාථාවල අර්ථ මෙසේ දතයුතු. මහෞෂධ පණ්ඩිතයෙනි! මේසා මහත් සෙනාවක් සියලු දඹදිව අනික් රජක්හට ඇත්තේ නොවෙයි. නුවණ මඳ කෙනකුන් විසින් මෙතෙකැයි ගැණ ගත නොහැක්කාවූ ප්‍රමාණාතික්‍රාන්තවූ මේ සෙනාව ඒකාන්තයෙන් පඤ්චාලදෙශයෙහි කම්පිල්ල නුවර රජ කරන බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා සේනාව ආහයි සිතමියි කීහ. මෙසේද කියා ඒ සේනාවගේ වෙනස කියන්නාවූ රජ්ජුරුවෝ මෙසේ කියන්නාහ. ඇතුන් පිටින්ද, අසුන් පිටින්ද, රථ පිටින්ද, ඉද්දෙලි, කූනම් ආදිවූ නොයෙක් වාහන පිටින් යන්නාවූ මහාසෙනාවය. සංග්‍රාමයෙහි දක්ෂවූ වාසි බෙණෙමින් ඔවුනොවුන් පරදවා දිවන්නාවූ පදාදි සේනාවය. ඔවුනොවුන් කිවමනා යම්තම් කටයුත්තක් විනා කොලාහලයෙන් නොඇසෙන හෙයින් බෙර සක් සින්නම් ආදීවූ ශබ්දයෙන් මුත් දැනගත නොහැක්කේය.

තාම්‍රලොහ සුවර්ණාදී වූ අලඞ්කාරයෙන් සරහනලද ඇත්, අස් ආදීන්ට වාමපාර්ශ්වයෙන් නැගී දක්ෂිණ පාර්ශ්වයෙන් බස්නාවූ ගිය ගිය ස්ථානයෙහි නතිව නතිව සතුරන් පරදවා ජය ගන්ට සමර්ථවූ වීර්‍ය්‍ය හා සාමර්ථ්‍යයෙහි පිහිටියාවූ යොධයන් සිය දහස් ගණතින් යුක්තවූ පඤ්චාල දෙශයෙහි බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ වැදූ මෑණියන් ඇතුළුවූ මහපොළොව සමාන නුවණැති පණ්ඩිතවරු එකොළොසෙක් ඇත්තාවූ එක්ව එක්ව එක් දවසක් කථා කළාහු නම් අහස හා පොළොව එක්කොට ගැවලන්ට සමර්ථවූ නුවණැත්තාහ. එසේවූ පණ්ඩිතවරුන් විසින් පඤ්චාල දෙශයෙහි සියලු සත්ත්වයන්ට අනුශාසනා කොට රක්නා ලබන්නේය.

එබැවින් ශ්‍රී සම්පත්තීන් හා පරිවාර සම්පත්තීන් අනූනවූ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් විසින් දඹදිව එක්සියයක් රජදරුවන් හා සෙනාව තමන් වසඟ කොට ගන්නා ලද. තමන්ගේ බලයෙන් රට සාදා වසඟ කළ රජදරුවන්ට බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ යමක්, යමක් කිවූ නම් තමන් නොකමැතිව වසඟවූ හෙයින් සිතින් ඉතා නසකරයහ. එසේ නොකැමැතිවත් රජහු කීවාට උත්තර නොකියා රජහු අනුවම යන්නාහ. එසේවූ බ්‍රහ්මදත්ත රජහු හා මෙබඳු සෙනාව අවුත් මාගේ සත්යොදුන් මිසුලු නුවර තුන් සන්ධියකින් හා සතර වලල්ලකින් අතුරු සිදුරු නැතිව වටලා ගත්හ.

ආකාශයෙහි තරු පිපී කලක් පරිද්දෙන් විලක්කු ආලෝකයෙන් ඒකාලෝක විය. කිසි තෙනකිනුත් නැගී යන අවකාශයෙක් නො පෙනෙන්නේය. පුත! මහෞෂධ පණ්ඩිතයෙනි! මේ දුකින් මිදීමෙක් නම් කවර කලෙක වේද? ගැලවීයන උපායක් දනුදෑයි විචාළහ

ඒ පඤ්චාල දෙශයේ කම්පිල්ල පුරයෙහි නුවණැති පණ්ඩිත වරුන් දසදෙනාට එකොළොස් වෙනිවූ රජහුගේ මවු තලතාදේවී කොසේවූ නුවණින් අග්‍රවූදයත්? එක් දවසක් පුරුෂයෙක් සාල් නැළියක් හා බත් මුළක් හා මස්සෙන් දූසක් ඇරගෙන ගඟකින් එතෙර යන්නේ දියට බැස පීනා ගංමැදට ගියේ අත වැහැර පීනා ගොඩ දක්ක නොහී පාත බලා යන්නේ ගොඩ සිටියන්ට මෙසේ කියාලූ. තෙලෙ ගොඩ සිටි පින්වත්නි! මා අත සාල් නැළියක් හා බත් මුළක් හා මස්සෙන් දූසෙක් ඇත. මා ගොඩ ලූ එකක් හට මේ තුනින් මා කැමැති එකක් දෙමි. ශක්ති ඇති කෙනෙක් වහා මා ගොඩලවයි කිය.

ඉක්බිති පීනුම් දන්නා බලසම්පන්නවූ පුරුෂයෙක් එක් කඩියක්[1] තරව හැඳ දියට පැන පීනාගෙන ගොස් ඔහු අල්වාගෙන ගොස් ගොඩ සිටුවාලා මට දෙන දෙයක් දෙවයි කිය. ඒ තෙමෙ සාල් නැළියත්, බත්මුළත් ගනුවයි කීය. අනිකා කියන්නේ කුමක් කියවුද? මම මාගේ ජීවිතයටත් නොසිතා ඒසා මරණින් මුදා ගොඩ ලීමි. මසු දූස මට දෙවයි කීය. නැවත ඒ අසත්පුරුෂයා කියන්නේ දියෙන් යෙමින් සිට මා කියේ මින් මා කැමැත්තක් දෙමියි කියාය. එබැවින් දනුත් මා කැමැත්තක් දෙමි. ගනී නම් ගනීය, කියා එතෙන සිටි එකක් හට කිය. එයින් සෙනකයාසේම අධර්මිෂ්ඨ එකෙක් වන. ඒ කියන්නේ තමා කැමැත්තක් දෙයි. ඇරගන්වයි කීය. එසේ නොගන්නෙමියි ඔහු ඇරගෙන අධිකරණයට ගොස් සභානායකයන්ට කීය. ඒ අමාත්‍යයෝත් සියල්ලම අසා පළමු කී ලෙසම ඒ තමා කැමැත්තක් දෙයි. ඇරගන්වයි කීහ. ඒ පුරුෂයා අධිකරණ යුක්තියෙහි නොසතුටුව රජහට ගොසින් කිය. රජ්ජුරුවෝත් නැවත අධිකරණයන් ගෙන්වා ගෙන උන් මැදව දෙන්නාගේ බස් අසා යුක්තිය නොදන්නා අමාත්‍යයාසේ තමාගේ ජීවිතයට ආශාවක් නැතිව ඒ සා දුකින් ගොඩ ලූ පුරුෂයාම පැරද වූහ.

එවේලෙහි රජ්ජුරුවන්ගේ මැණියෝ එතෙනට නුදුරු තෙනක උන්නාහු රජ්ජුරුවන් විතිගඩය වරදවා කල තියාව දූන පුත! ඒ යුක්තිය දූන විචාරා ලන්නේයයි කිහ. මැණියන්වහන්ස! මම මෙතෙක් වඩා නොදන්මි. ඉදින් නුඹවහන්සේ මීට වඩා යුක්ති

1. කත්තියක් පටුවක්

දන්නාසේක් වී නම් විචාල මැනවැයි කීහ. යහපත විචාරමියි කියා ඒ පුරුෂයා කැඳවා තොප අත තුබූ තුනම බිම පිළිවෙළින් තබා ලවයි කියා තුබූ කල්හි තෙපි දියෙන් යන්නාහු මූන් කුමක් කිවුදැයි විචාරා මින් මා කැමැත්තක් දෙමියි කියායැයි කී කල්හි එසේ වී නම් තෙපි තොප කැමැත්තක් ඇරගෙන යවයි කීහ. ඒ තෙමෙ දුසින් බැඳි පියල්ල ඇරගෙන නමාගත. මඳක් තැන් ගියහු නැවත ගෙන්වාලා දරුව! තෙලෙ දුස තෙපි කැමැත්තාදැයි විචාරා කැමැත්තෙමි ස්වාමීනි! යි කී කල්හි තා කැමැත්තක් තාම දෙමියි කී බැවින් තෙලෙ මසු දුස තුලුට දෙවයි කීහ. අඬමින් වලපමින් මසු දුස පසිය බඳවමින් දින . අනිකා මහා සොම්නසින් මත්ව මසු දුස ලදින් ගියේය.

ඒ ඇසිල්ලෙහි අමාත්‍යයෝ සමාගිව සාධුනාද පැවැත්වූහ. එවක් පටන් බිසවුන් නුවණැති බව හැම තැනම ප්‍රසිද්ධ විය. මැණියන් එකොළොස්වෙනි කොට ඇත්තාවූ පණ්ඩිතවරුන් දස දෙනා යැයි මෙවදෙහ රජ්ජුරුවන් කියේ ඒ නියායැයි දතයුතු.

මෙසේ මහපොළොව හා සමාන නුවණැති පණ්ඩිතවරුන් එකොළොස් දෙනකු හා එක්සියයක් රජුන් හා චතුරඞ්ගිනී සේනාව ගෙන බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ තුන් සඬියකින් හා සතර වළල්ලකින් අතුරු සිදුරු නැතිව වටලා ගත්හ. කවර කලෙක කෙසේ නම් මිදීමෙක් වේදැයි කීහ. මෙසේ කී රජ්ජුරුවන්ගේ බස් අසා බෝධිසත්ත්වයන්වහන්සේ සිතනසේක් මේ රජ්ජුරුවෝ අතිශයින් මරණභයින් පීඩිතයහ. සා කල ආහාරය හා පිපාස කල පැන්ම පිටිවහල් වන්නේය. එබැවින් මේ රජහු මේ දුකින් මුදලන්ට මා විනා අනික් වහලෙක් නැත්තේය. එබැවින් අස්වසාලමියි සිතා රන්ගල්තෙලෙහි සිංහනාද කරන අභීත කෙශර සිංහ රාජයකුසේ නිර්භීතව මහරජ! නොබා වදාළ මැනව මේසා සේනාවක් මාගේ නුවර වටලා ගත්තෝ වේදැයි නොසිතා අත පය දික්කොට නොබා පඤ්චකාමයෙන් යුක්තව රාජ්‍යශ්‍රී අනුභව කළ මැනව. මේ එක්සියයක් රජදරුවන් හා අටළොස් අක්ෂෞහිණී සංඛ්‍යාත මහාසේනාව කැටක් අල්වාගෙන දමා කපුටු රැසක් තෙරන කලක් පරිද්දෙන්ද, දුන්නක් අල්වාගෙන වඳුරු සමූහයක් තෙරනා කලක් පරිද්දෙන්ද, ඒ බ්‍රහ්මදත්තයන් ගෙනා මේසා රාජ සේනාව හන්කඩටත් අස්වාමික කරවා නිහඬ සේනාවක් පරිද් දෙන් ඉස් ලූ ලූ අත ලුහු බඳවාපීම මටම භාරය. සටනෙකැයි සිතක් නොතිබා භය නැතිව සුවසේ රාජ්‍යශ්‍රී අනුභව කළමැනවැයි වදාළසේක.

මෙසේ කියා රජ්ජුරුමහ් අස්වසා මාලිගාවෙත් බැස නුවර බෙර ලවා හැමදෙනාට වදුරතසේක්, පින්වත්නි! තෙපි හැම සතුරෝ වටලා ගත්තෝ වේදැයි නොසිතා මල් ගඳ විලවුන් හා අටලොස් වර්ගයෙහි කැවුම් හා රා මස් ආදීවූ නොයෙක් අන්න පාන සපයා වස්ත්‍රාභරණයෙන් සැරහී උත්සවයට පටන් ගනුව. සමහර කෙනෙක් තොප තොපට සුදුසු පරිද්දෙන් බොවු නම් මහාපානයන් බොව්. නටව්. බෙර ගසව්. ගී කියව්. එළු සත්, ඔල් වර සත්, අසුරු සත් දෙවයි, සියල්ලක් නැති කෙනකුන්ට මාගෙන් දෙමි. මහෞෂධපණ්ඩිතයෝ නම් මමය. කිසි භයක් නොකරව්. මාගේ ආනුභාව බලවයි කියා අස්වසා වදාළසේක.

එබසින් නුවරවාසීහු සත් ඇවිරිද්දෙහි පටන් ඔබගේ බල තමන් ඇම ඉදුරාම දන්නා හෙයින් කිසි භයක් නැතිව ශඞ්කා රහිතව නැටුම් ආදී සියල්ලෙන්ම මහතාණන් වදාළ පරිද්දෙන් උත්සවයට පටන් ගත්හ. නුවර ඇතුළෙහි ගී කියන හඬ පිටත සිටි සතුරෝ අසන්නාහ. සතුරන්ගෙන් බොහෝදෙනා කුරු බිලියෙන් ඇතුළු නුවරට වදනාහ. සතුරන් ආ විටක මුත් දුටු දුටුවන් නොඅල්වන්නාහ. එසේ හෙයින් සතුරන්ගේ සඤ්චාරය නොසිදෙන්නේය. නුවරට වත් මනුෂ්‍යයෝ උත්සව කෙළනාත්, ජය පානය බොන්නාත් ජණකොලාහලත් දක්නාහ.

බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ඇතුළු නුවර කොලාහල අසා සමීප යෙහි සිටියවුන්ට කියන්නාහු පින්වත්නි! අටලොස් අක්ෂෞහිණී යක් පමණ මේසා සේනාව ගෙනවුත් තමන්ගේ නුවර වටලා ගත් තියාවට කිසි භයක්වත් නැති ගැන්මක්වත් නැත්තේය. සතෝෂයෙන් යුක්තව පස්වනක් ප්‍රීතින් පිනා ගියවුන්සේ අත් පොලසන් දෙන්නාහ. ගී කියන්නාහ. බෙර ගසන්නාහ. කොල! කුමන ආශ්චර්යයෙක්දැයි කීහ.

එසේ කී රජහට වරපුරුෂයෙක් බොරුවක් ගොතාගෙන කියන්නේ දේවයන්වහන්ස! මම කිසි කටයුත්තක් නිසා කුරු බිලියෙන් ඇතුළු නුවරට වත්තෙම් සැණකෙළි කෙළනා ජනයන් දැක මෙසේ විචාළෙමි. පින්වත්නි! සියලු දඹදිව රජදරුවන් සේනාව සහිතව අවුත් තොපගේ නුවර වටලාගෙන සිටියදී තොප හැම මෙසේ ප්‍රමාදව වසන්ට කාරණ කිම්දැයි විචාළෙමි. ඔහු මට කියන්නාහු අපගේ රජ්ජුරුවන්ට කුමාර කල මෙසේවූ දෙලෙක් විය. කෙසේදයත්? දස දැසක් යොදුන් දඹදිව රජුන් මුළුල්ල සෙනාව පිරිවරා අවුත් මා උන් නුවර පිරිවරා සිටි කල "සැණ කෙළියක් කෙළිමියි" දෙලෙක් උපන. එබැවින් දෙල දුන් මුදුන්

පැමිණියේය. එබැවින් සත් දවසක් සැණකෙළි කෙළවයි, නුවර බෙර ලවා තමන්වහන්සේ මාලිගාවේ මතුමාලේ අමාත්‍ය මණ්ඩලය පිරිවරා හිඳ මහා සන්තොෂයෙන් මත්ව ජය පානය බොනසේක් මේ රජදරුවන් හා සේනාව අා නියාව තමාම දන්නාසේක්‍යයි කීහ.

මම එබස් අසා රජකු බොලඳ නියායයි තිඬු කෙළෙම්යි කීය. බ්‍රහමදත්තයෝ එබස් අසා දණ්ඩෙන් ගසනලද ආශීවිෂයකු පරිද්දෙන් ක්‍රොධයෙන් දිලිහී කිපුනාහු කොල! වහා මේ නුවර වට ඒ ඒ දිගින් අගල මැඩ හස්වා පවුරු දොරටු අට්ටාල වාසල් බල කොටු ආදිය බිඳ සුණු විසුණු කෙරෙමින් වහා මේ නුවරට වැද ගැල් පුරා ගෙනවුත් කොමඩු බානාසේ මහාජනයන් ඉස් කපා ගෙන වෙදෙහ රජු ඉසත් වහා ගෙනෙවයි කීය.

එබස් අසා බලසම්පන්න යෝධයෝ නොයෙක් ආයුධ ගත් අත් ඇතියාව නුවර ගනුම්හයි පවුරු වාසල් සමීපයට ගියාහු බොධිසත්ත්වයන්වහන්සේගේ යොධයන් විසින් දමා ලනලද කලල් වැලි ආදියෙන්ද, මහා විනාශයට පැමිණ නුවර බිඳිනා තබා පවුර සමීපයටත් යා නොහී නැවත යන්නාහ. ඉන් සමහර කෙනෙක් නොනැවත පවුරු බිඳුම්හයි වාසි කියා සාහසිකව ගොස් අගලට බටවු නම් අන්තරට්ටාලවල සිටියාහු හී දඬු මුණ කොහොල් තෝමර භෙණ්ඩිවාල ආදියෙන් දමා මහා විනාශයට පමුණුවන්නාහ.

බොධිසත්ත්වයන්වහන්සේගේ යොධයෝ බ්‍රහමදත්තයන්ගේ යොධයන්ට වැලමිටි කැසිමද තොල් ඇඹරීමද යනාදීන් අතින් මුහුණින් උසුළු විසුළු පෑ නොයෙක් ප්‍රකාරයෙන් ආක්‍රොශ පරිභව බෙණෙමින් සැහෙන්නාහ. තෙපිත් ලබවු නම් සුභකුත් තමා බොන්නාවාද කන්නාවාද නොලබන්නෝ වේද නොකන්නෝ නොබොන්නේය. ඉද! වැලි සුභක් බී පියව. කාපියවයි රා ඔඩම් හා කුඩමස්සන් හුල පැලහු දඩමස් කැටි සතුරන් දිශාවට දික් කොට පොළු[1] ගන්ව ගන්වා නැවත තුමූම කන්නාහ. බොන්නාහ. වට පදනම සක්මන් කරන්නාහ. චූලනී රජ්ජුරුවන්ගේ සේනා වෙහි ඇත්තෝ තමන්ට උසුළු විසුළු පානා බොධිසත්ත්වයන්වහන්සේගේ සේවායන්ට කිසිවක් කොට ගත නොහෙන්නාහු සුලඟට පතන පුළුන් පෙදක්සේ බිදී බ්‍රහමදත්ත රජ්ජුරුවන් සමීපයට ගොස් දෙවයිනි! සෘද්ධිමත් කෙනකුන් විනා අන් කිසිකෙනකුන් විසින් මේ නුවරට වදින්ට නොපිළිවනැයි කීහ.

---

1. පුළු.

රජ්ජුරුවෝ සතර පස් දවසක් වැස අල්වා ගත හැකි උපායක් නොදක්නාහු නුවර ගන්නට නොපිළිවන. මේසා සේනාංවන් එක කෙනෙකුනුත් නුවරට ලං වන්නට නොපිළිවන්න. කුමක් කරමෝ දැ යි හෝයි කේවට්ටයන් විචාළහ. ආචාරීනි! නුවර ගන්නා තබා පවුර ළඟට යන්නටත් සමර්ථ එකද සත්ත්වයෙක් නැත. කුමක් කරමෝදැයි කීහ.

බමුණු මගලු කියන්නේ වන්නාට, මහරජ! නුවරට පැන් තම් පිටතින්ම වන්නේය. කීප දවසක් පැන් නවතාලන්නා පැන් නොලදින් කලානතවූවාහු දොර ඇරපියන්නාහ. එවිට අපි සිත්වූ පරිද්දෙන් සතුරන්ට කටයුතු කියම්හයි කීය. කොල! එසින් උපායකැයි එදා පටන් පැන් වැද්ද නොදෙන්නාහ. එපවත් බෝධි සත්ත්වයන්වහන්සේගෙන් රජ්ජුරුවන් සමීපයෙහි සිටියෝ පතක ලියා ඊයක බැඳ ඇතුළු නුවරට විදපීහ.

බෝධිසත්ත්වයන්වහන්සේද සතුරන් ආ දවස්ම විධානයක් කරනසේක් යමෙක් ඊ දණ්ඩක ලියා බැඳි විදි පතක් දුටුයේ වීනම් වහා ගෙනවුත් මට දෙවයි වදාළසේක. එබැවින් එක් පුරුෂයෙක් ඒ පත ගෙනැවිත් දින. ස්වාමිදරුවාණෝ ඒ බව දැන මේ අඥාන ජඩයෝ මා මහෞෂධ පණ්ඩිත බව නොදන්නාහයි සිතා සැට රියනක් දිග උණ දණ්ඩක් ගෙන්වා සරියෙහි දෙකක් කොට පළවා ගැට ගස්වා ශුඬ කොට නැවත එක්කොට තබා සමින් වසා බඳවා පිට මැටි ගාවා ඍද්ධිසම්පන්න තාපසවරුන් ලවා හිමාලයෙන් ගෙන්වූ අරුණුවන් මැටි කලල් මඩහා ඇඹුල කිඳුවට පොකුණු තෙර මඩ මත්තෙහි රෝපනය කොට ඊ මත්තෙහි උණ දණ්ඩ සිටුවා දණ්ඩ ඇතුළේ පැන් පිරවූසේක.

එක රැයින් පැලය නැගී උණදඬු මුදුනෙන් රියනක් පමණ වැඩී මලෙක් පිපී සිටියේය. අභිමතාර්ථ සාධක චින්තාමාණික්‍යයක් බඳුවූ මාගේ ස්වාමිදරුවූ බෝධිසත්ත්වයන්වහන්සේ ඒ මල්දඬු මුලින් උදුරා ගෙන්වා මේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට දෙවයි තමන්වහන් සේගේ සේනාවට දෙවූසේක. ඔහු ඒ ඇඹුල දණ්ඩ වලල්ලේ ලා කොල! බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ සේවාෙයනි! සයින් හිඳ නො මියව. තෙලෙ මල කඩා ඉස පැලඳ ගෙන මල් දඬු උයා බඩ පුරා කා පියවයි පවුරෙන් පිටත දමාලූහ. එයින් බෝධිසත්ත්වයන්වහන්සේ ගේ අනන්තශූර යොධයන්ගෙන් සේවායෙක්ම ගෙන රජහු සමීප යට ගෙන ගොස් බැලුව මැනව, දෙවයන්වහන්ස! මෙබඳු ඇඹුල මලක් හා මේ දිග ඇඹුල දණ්ඩක් හා දුටු විරූද නැතැයි කීය. රජහු මැණ බලවයි ක් හෙයින් බෝධිසත්ත්වයන්වහන්සේගේ පුරුෂ යෙක් මණන්නේ සැට රියනක් දිග දණ්ඩ අසූ රියනක් කොට මැණපීය.

රජහු මේ කෙසේවූ තෙනක ඇතිවීදැයි කී හෙයින් ඉන්ම එකෙක් බොරුවෙන් ගොතා ගෙන කියන්නේ මහරජ! මම එක් දවසක් පිපාසා ඇතිව රා බොමි කියා කුරුබිලියෙන් ඇතුළු නුවරට වන්නෙමි, නුවරවාසීන් දිය කෙළනා මහාපොකුණක් දිටිමි. බොහෝ මනුෂ්‍යයෝ ඔරු අගුළු ආදියේ ඉඳගෙන මල්කඩා දිය කෙළ ඇවිදිනාහ. මේ කලි ඒ පොකුණු බඩ ගොඩ අස පිපි මලෙක් සැටිය. ඉදින් ගැඹුරෙහි පිපි මලෙක් වී නම් සියක් රියනටත් වඩා ඇත්තේ වේදැයි කිය.

ඒ අසා ආචාරීනි! පැන් නවතාලා මේ නුවර ගනුම්හයි නො සිතව. ඒ තොපගේ උපායෙක් නොවෙයි. අනුපායෙකැයි කීහ. එබැවින් දෙවයන්වහන්ස! මෙවිට මා සිතන උපාය ඉතා යහපත. නුවරට වී සාල් නම් පිටතින්ම වන්නේය. වී සාල් වැද්ද නො දෙන්නා බතින් පීඩිතවූ මනුෂ්‍යයෝ දොර හැර පියන්නාහ. එවිට අල්වාහෙන කැමැත්තක් කරම්හයි කිය. ඒ මන්ත්‍රණයත් පළමු පරිද්දෙන් පතකින් සරුප දැන මේ නිවටවූ කෙවට්ටයා මා නුවණැති බව නොදන්නේ වනැයි කියා අනුපකාරයයි[1] කියන ලද පදනම මුදුනේ කලල් මඩ අතුරුවා ඒ පිට වී ඉස්වාපීසේක.

බොධිසත්වයන්වහන්සේගේ අභිප්‍රාය නම් සිද්ධවන්නේය. එබැවින් ඒ වී එක රැයින්ම පැල නැගී සත්යොදුන් නුවර වට පවුරු මුදුනේ නිල්වලා සමූහයක්සේ අතිනීලව පෙනෙන්නට වන. එය දුටු බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ පවුරු මුදුනෙන් ඉතා නිල්ව අර මේ පෙනෙන්නේ කිමෙක්දැයි විචාළහ. එවිට පණ්ඩිතයන්වහන් සේගේ චරපුරුෂයෙක් රජහුගේ කටින් බස උදුරා ගන්නක්හු පරිද්දෙන් කියන්නේ දෙවයන්වහන්ස! ගොවියා පිත් මහෞෂ ධයා තමාගේ ප්‍රඥාබලයෙන් මතු වන්නාවූ භය දැන තමාගේ විධාන වැටෙන මේ ජනපදයෙහි වී ටිකක් හැයි තිබීද? එකහෙලා ගෙන්වා මේසා මහත් නුවර කොටගෙවල් හැම පුරවා ඉතිරි වී පවුර පිටත හා වීපියෙහි ඒ ඒ ස්ථානයෙහි ලවාපීය. ඒ වීතාක් මුළුල්ල අවුවේ වියලී වැස්සේ තෙමී පැල නැගී ගොයම්ව ගියේය. මම එක් දවසක් කටයුත්තක් පිණිස කුරුබිලියෙන් ඇතුළු නුවරට වන්නෙම් පවුරු අස තුබූයෙන් වී ටිකක් ඇරගෙන ඒ වීපියට දමාපීමි. ඒ දැක එතෙන සිටි ජනයෝ මා වෙහෙසන්නාහු ඉතාම බඩ සා සැටිය. කැමැත්තෙහි වී නම් තිලින් වී පොදියක් බැඳගෙන තාගේ ගෙට ගොස් පැරපියා පිසගෙන බඩපුරා කා නොපියනැයි කීහ. ඒ වීමා ඇල්ලුයේ ඉතා නපුරැයි. මම්මලජ්ජාවට පැමිණි යෙමි කීය.

---

1 අනුපාකාරයයි

ඒ අසා රජ කෙවට්ටයාට කියන්නේ වී නවතාත් මේ නුවර ගත නොහැක්ක. තාගේ එයිත් උපායෙක් නොවේ. ඒත් ඇර පිය වයි කීය දේවයන්වහන්ස! නොසිතා වදාළ මැනව. අතික් බලවත් උපායෙක් ඇත. නුවර ඇතුළේ වලක් නැති හෙයින් දර නම් පිටතින් මූත් ගෙනා නොහැක්කේය. "දර නවතාලා නුවර ඇර ගනුම්හයි" කීයේය. ඒ මන්ත්‍රණයත් පෙර පරිද්දෙන්ම දූත වදුරා පවුර පිටින් වී හා ගොයම් හරවා පිටතට පෙනෙන නියායෙන් දර රැස් කරවා පීසේක.

ඒ පවුරේ උන් මනුෂ්‍යයෝ බ්‍රහමදත්ත රජ්ජුරුවන්ගේ යෝධයන්ට සිතා සිසී වෙහෙසන්නාහු තෙලෙ දර නැතිව පිස කෑ නොහී සයින් පීඩිත කෙනෙක් උළුකැන් බත් ආදිය පිස කව, බොවයි කියන්නාහු තෙලෙ ඇරගන්වයි මහත් දර කඳන් ඇහට දමාලන්නාහ. සමහරු ඒ වැදගෙන තැළී වැලි මහත් දුකට පැමිණෙන්නාහ. රජ්ජුරුවන් පවුර පිට දර රාශිය පෙනෙන්නා දූකා තෙපලෙ කිමෙක්දැයි විචාරා එතෙන සිටි චරපුරුෂයන්ගෙන් එකෙක් ඇයි මහරජ! නොදන්නාසේක්ද? ගොවියා පිත් මහෞෂධ පණ්ඩිතයා මතු වන්නාවූ භය දූත වල දරයක් තිබ්ද? එක හෙලා අද්දා ගෙනවුත් නුවර ගෙයක් පාසා පැල දොරවල් ආදි වූ ඒ ඒ ස්ථානයෙහි පුරාලීය. ඉතිරි දර ලන තැන් නැති හෙයින් පවුර පිට රැස් කරවාපී"යයි කීය.

රජ්ජුරුවෝ ඒ අසා කෙවට්ටය! මේ නුවර දර නවතා හැර ගන්නට නොපිළිවන. තාගේ උපාය උපායෙක් නොවෙයි. ඇර පියවයි කීහ. ඉතා ඇවිලිය පත්වූ කෙවට්ට නම් ජඩයා කියන්නේ මහරජ! නොසිතා වදාළ මැනව. බලවත් මාගේ අතිත් උපායෙක් ඇතැයි කීය. ඒ අසා ආචාරීනි! උපාය නම් තමා කිම්ද? මම තාගේ උපායෙහි කෙළවරක් නොදනිමි. නුවර වැද රජු ගත නො පිළිවන. එබැවින් අපගේ නුවරට යම්හ"යි කීහ. නැවතත් අඥාන වූ බමුණු මහලු කියන්නේ දේවයන්වහන්ස! බ්‍රහමදත්ත රජ්ජුරුවෝ එක් සියයක් රජදරුවන් හා අටළොස් අක්ෂෞහිණියක් පමණ චතුරඞ්ගිනී සේනාව ගෙනවුත් වේදේහ රජහු අල්වා ගත නොහී පැරද පලා ගියහ"යි අපට ලජ්ජා වන්නේය. එබැවින් නුවණැත්තෝ නම් මහෞෂධ පණ්ඩිතයෝ මතු නොවෙති. මමත් මහා නුවණැත්තෙමි. එකාලේසයකින් ඔහු පරදවාපියම්හ"යි කීය. ආචාරීනි! ලේසය නම් තමා කිම්දැයි කීහ. බමුණු මහලු කියන්නේ ධර්මයුඩයක් කෙරෙමි"යි කීය. ධර්ම යුඩය නම් කිම්දැයි කීහ. මහරජ! දෙසේනාව සටන් කළ මැනවැ"යි නැත. රජදරුවන් දෙදෙනාගේ පණ්ඩිතවරු දෙන්නා එක් තෙනකට එත්ද? ඉන්

එක් කෙනෙක් එක්කෙනකුන්ට වැන්දේ වී නම් වැඳි පක්ෂයෙහි රජහට පරාජය වන්නේය. වැඳුම් ලත් පක්ෂයෙහි රජහට ජය වන්නේය. එබැවින් මේ මන්ත්‍රණය මහෞෂධ පණ්ඩිතයෝ නො දන්නාහ. මම ඉතාම වැඩිමහල්ලෙමි. මහෞෂධ පණ්ඩිතයෝ බාලයෝය. ආචාර දන්නාහ. නුවණැති පණ්ඩිතයන් හෙයින් ඔහු මා දුටු කල්හි සැක නැතිව වඳනාහ. එවේලෙහි වෛදෙහ රජ සැබවින් පැරැද්දා නම් වන්නේය. එසේ කොට වේදේහ රජු පරදවාපියා අපගේ නුවරට නැගී යම්හ. එසේ කල අපට ලජ්ජා නැති වන්නේය. ධර්මයුද්ධ නම් මේ යයි කිය. ඒ රහස් කථාවත් පෙර පරිද්දෙන්ම හි දණ්ඩක බැඳ විදි පතකින් දූත කෙවට්ටයාට මිනුත් මම පැරැද්දෙමි වේ නම් කුමන මාගේ පණ්ඩිත කමෙක්දැයි සිතූසේක.

බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් ආචාරීනි! ඒ උපාය ඉතා යහපත. සෙට උදෑසන ධර්මයුද්ධ වන්නේයයි පණ්ඩිතවරුන් දෙදෙනාගේ ධර්මයුද්ධය දූහැමෙන් සෙමෙන් විය යුතුයයි, ඉදින් ධර්මයුද්ධය යමෙක් නොකෙළේ නම් එයිත් පැරැද්දා නම් වන්නේයයි, පතක ලියා කුරුබිලියෙන් වෛදෙහ රජහට යවූහ. ඒ අසා වෛදෙහ රජ්ජුරුවෝ බෝධිසත්වයන් කැඳවා එපවත් සැල කළාහ. ඒ අසා සකල ජනානන්දකරවූ තිලෝගුරු බෝධිසත්වයන්වහන්සේ යහපත දේවයන් වහන්ස! බස්නාහිර වාසලින් පිටත ධර්මයුද්ධ කරන්වත්, ධර්මයුද්ධයට එන්වත් කියා යවුව මැනවැයි වදාළසේක. ඒ බව මේ වර අා දූතයන් අතම පත් ලියා දී යවූහ. දෙවන දවස් පරාජය කෙවට්ටයාටම වෙයි සිතා පශ්චිමද්වාරයෙහි ධර්මයුද්ධ මණ්ඩලය සැදූසේක. එතෙකුදු වුවත් ඒ ඒ රජදරුවන් කෙරෙහි සිටි වර පුරුෂයෝ එක් සියයක් දෙනා කවුරු කිම් දනිද්දැයි බෝධිසත්ව යන්වහන්සේට ආරක්ෂා පිණිස කෙවට්ටයා වට පිරිවරා සිටගත්හ.

එක් සියයක් රජදරුවෝ මහාධර්මයුද්ධමණ්ඩලයෙහි සිටියාහු පුර දියවක යහපත් දවස් සඳ බලන්නට එක්ව එක දසාව බලන්න වුන් පරිද්දෙන් පැදුම් දිග බල බලා සිටියාහ. එසේම නිවටවූ කෙවට්ටයාත් නැගෙනහිර දිශාව බල බලා කල්යේනුයි කල්යේනුයි කිය කියා සිටියේය.

තමන් පා පියුම් ලෝ මුදුන් මල් කළ තිලෝගුරු බෝධිසත්ව යන්වහන්සේ එදවස් උදෑසන සොළොස් කළයක් සුවඳ පැනින් ඉස් සෝදා නහා ලක්ෂයක් වටනා කසී සළුවක් හැඳ සර්වාභරණ යෙන් සැරසී අමරාදේවීන් විසින් සපයනලද්දවූ නොයෙක් රස යෙන් අග්‍රවූ භොජනය අනුභව කොට මහපෙරහරින් රජගෙට ගොස් අා නියාව කියා යවා මපුතණුවන්ට වහා එන්ට කියවයි

කී කල්හි රජගෙට වැද රජහු වැඳ එකත්පස්ව සිටි සේක් කිමෙක්ද? පුත! මහෞෂධ පණ්ඩිතයෙහි යි කී කල්හි මහරජ! ධම්යුඬයට යෙම් යි වදාළසේක. රජ්ජුරුවන් මා විසින් කළමනා කිම්දැයි කී කල්හි දෙවයන්වහන්ස! කෙවට්ටයා මැණිකකින් වඤ්චා කොට පරදවනු කැමැත්තෙමි. එබැවින් අෂ්ටවඞ්ක මාණික්‍ය රත්නය ලද මැනවැයි වදාළසේක. පුත! එයිත් මට කියාද? ගන්නේය. ඇර ගන්ව යි කී කල්හි ශක්‍රයා විසින් පළමුත් තමන්වහන්සේට ම දුන් ඒ මාණික්‍යරත්නය ශ්‍රී හස්තයෙන් හැරගෙන රජහු වැද මාලිගාවෙන් බැස පඤ්චායුධ සන්නද්ධව ආවාවූ මදක් හුන්නාවූ සහජාත යොධයන් දහස හා ඉන් අවශෙෂ මහාසේනාව විසින් පිරිවරන ලදුව අනූදහසක් රන් වටනා ඇලි අසුන් සතරදෙනකු යොදන ලද රන්ඛජ නඟා සැරහූ උතුම් වූ මඞ්ගල රථවාහනයට නැඟී මාගේ ස්වාමිදරුවාණන්ගේ ප්‍රඥා නමැති සූර්‍ය්‍ය තෙජසට පිපී වැනී ගිය සුදු පියුම් වනයක් පරිද්දෙන් හිරුරැස් වළකා දෙපාශ්වයෙහි ගෙනයනලද ධවලච්ඡත්‍ර සමූහයෙන් යුක්තව ආනතය, විතතය, විතතානතය, ඝනය, සුසිරය යන පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය නාදයෙන් මහපොළොව සැලී යන්නාසේ මහා සමුද්‍රය සුළඟින් හැලළ ගොඩ ගමන් ගන්නාසේ කල්පාන්තයෙහි මේඝ ගර්ජනාවක් පරිද් දෙන් එක නින්නාද කෙරෙමින් උපමාතික්‍රාන්තවූ ශ්‍රී විලාසයෙන් යුක්තව වඩනාසේක් පෙරබත්[1] වේලාවට වාසල් සමීපයට වැඩිසේක.

කෙවට්ටයාත් අරුණොදයෙහි පටන් එතෙනට ගියේ දැන් එති, දැන්එතියි ඔබ වඩනා පෙරමඟ කර ඔසවා බැලීමෙන් ඒ කෙවට්ටයාගේ කොකකුසේ ඥේ හෝ නොහොත් ඔටුවකුසේ ඉතා දික්වූ කර පළමු නියාවට දියුණක්ව දික්ව ගියේය. ඒ මහතාණන් විසින් පළමු කොටම මාගේ ප්‍රඥාතෙජසින් හා සූර්‍ය්‍ය තෙජසින් හා මොහු සකස්කොට තවාලුව මැනවැයි නුවණින් යෙදී කරලූ ධම් යුඬය. එයිත් නැගෙනහිරව මූහුණ ලා කිසි සෙවණක් නැතිව උඩ බලා සිටිනෙයින් අවුවේ තැවී සම්බාධයෙහි ඕ සෙල්වී ගියේය.

එවේලෙහි බොධිසත්ත්වයන්වහන්සේගේ මහාසේනාව හෙයින් ද, පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය නාදයෙන් ද එක නින්නාද කෙරෙමින් ඇත් සේනාවක් ළඟව නොබා නික්මුණු සැටහොඳුන් රත්ගල් තලා මුදුනෙහි සිංහනාද කරන කෙශර සිංහරාජයකුසේ කිසි භයක්වත්, තැති ගැන්මක්වත් නැතිව මහත්වූ උත්සවයෙන් ඔලක්කම් දිදී නුවර පැදකුණු කොට නමාගත් චක්‍රවර්ති රජක්හුසේ මාගේ ස්වාමිදරුවාණෝ දෙර හරවා වාසලින් පිටත්ව රථයෙන් බැස

1 පෙරවරු

සතුරන් ලඟට වේද? මා යන්නේයයි කිසි වකිතයක් නැතිව සිංහ යකු මෙන් විජෘම්භණය කෙරෙමින් ධර්මයුද්ධ මණ්ඩලය බලා නමා ගත් සේක.

එක් සියයක් රජදරුවෝ මහතාණන්ගේ රූප ශ්‍රී බලා ඔබ තමන් හැමදෙනට සතුරු නියාවත් පළමු තමුන්ට කළ නිසරු මුළුල්ල ඒ ස්වාමිදරුවාණන්ගේ මුඛ ශොභාව දුටු දක්මෙහිම තමන් තමන් සිත ඇති දෙමිනස් නාක් මුළුල්ල තමන් හැමදෙනා නොදන්නා පරිද්දෙන්ම කොයි වලකට වන් බවත්, කවර අතක පැලැබවත් නොදන්න පස්වනක් ප්‍රීතීන් පිනාගියාහු ඔබගේ රූප ශ්‍රී හා ගුණවර්ණනා කළ කල බ්‍රහමදත්ත රජ්ජුරුවෝ අපට උදහස් වන්නාහයි යන ශඞ්කාවක් නැතිව සතුති කරන්නාහු මෙසේ කියත් ලු

ශ්‍රී වර්ධන සිටාණන් පුතණුවෝ මහෞෂධ පණ්ඩිතයෝ නම් මූද? සියලු දඹදිව මූන් හා සමාන නුවණැති කෙනෙක් නැත්ල. මන්ත්‍රී කමින් හා සියලු උපායෙහි දක්‍ෂකමින් හා නිර්භීතකමින් හා මූන්ට වඩනා කෙනෙක්වත් මූන් හා සමාන කෙනෙක්වත් මේ සක්වළ තබා දසදසක් සක්වළත් දිව්‍යබ්‍රහමාදී සියල්ලවුන් කෙරෙහි නැත්ලයි කියා ඔල්වර හඬ දහස් ගණන් පැවැත්වූහ.

තුන්ලෝ මුදුන්වූ ශ්‍රී පාද ඇති මාගේ ස්වාමිදරුවූ බොධි සත්‍වයන්වහන්සේ දෙදෙව්ලොව දෙවියන් පිරිවරා ගිය ශක්‍ර දෙවෙන්ද්‍ර ලීලායෙන් අනොපමෙයවූ ශ්‍රී විලාසයෙන් යුක්තව ඒ මාණික්‍යරත්නය ශ්‍රී හස්තයෙන් ගෙන කෙවට්ටයා ඉදිරියට බලා නමාගත්සේක. එවේලෙහි කෙවට්ට බ්‍රාහමණ මහලු තෙමෙ ස්වාමිදරුවාණන් තමා ඉදිරියට එත් එත් චක්‍රවර්තිරජක්හු දුටුවාවූ චණ්ඩාලයකුසේ හිටි පියෙහි සිටිපිය නොහී පෙරගමන් කොට ඉදිරියට අවුත් මෙසේ කියාලු. ඈයි! මහෞෂධ පණ්ඩිතයෙනි! අපි දෙන්නාම පණ්ඩිතයම්හ. අප තොප නිසා අවුත් මෙතෙක් දවස් මෙතන ඉදිනවුන්ට යම්තම් පඬුරක් එවා නොවිචාළේ කුමක් පිණිසද? යනාදීන් මැසිවිලි රාශියක් කියා ගෙන එන්නවුට මහතාණෝ වදාරණසේක් පණ්ඩිතයෙනි! තොපට තරම් පඬුරක් සොයන්නෙම් අද මේ මාණික්‍යරත්නය ලදිමි. මෙබඳු මාණික්‍ය රත්නයක් මනුෂ්‍යලෝකයෙහි කිසි තෙනකත් නැත. එබැවින් මේ මිණි රුවන ඇරගන්වයි වදාළසේක.

ඒ මාගේ ස්වාමිදරුවාණන්ගේ ප්‍රඥ තෙජසමෙන් දීප්තිමත්ව ශ්‍රී හස්තයෙහි බබලන්නාවූ මාණික්‍යරත්නය දුටුයේම එහි ලොභ උපදවා මට දෙනසේක්මය යි සිතා එසේ වී නම් දුන මැනවැයි

කියා අත දික් කෙළේය. මහතාණෙනි තෙල ගන්වයි කියා දමන සේක් ඔහුගේ දික් කළ අත ඇඟිලි අගට දමාලූසේක තේජඃශ්‍රීන් යුක්තවූ ඉතාබරවූ මාණික්‍යරත්නය ඇඟිලි අගින් රඳවා ගත නුහුනුයේය. ඒ මැණික ඔහු ඇඟිලි අග වැදගෙන ආපස්සේ පැනගෙන අවුත් බොධිසත්ත්වයන්වහන්සේගේ පා පිටම හින. ඒ බමුණු මහලු මැණිකට කළ ලොභයෙන් ඇර ගනිම්යි සිතා බොධිසත්ත්වයන්වහන්සේගේ ශ්‍රීපාද මූලයට නැබුරු විය.

පරවාද දඹ මදිනවූ මාගේ සවාමිදරුවාණෝ ඒ බමුණා තමන් වහන්සේගේ පා පිටට නැබුරු කළ ඉස උඩුම්යා කළ නොදී එක් අතකින් පිටිකර හා එක් අතකින් පිටිමූල හා තරවා අල්වාගෙන නැඟී සිටුව ආචාරීනි! නැඟී සිටුව ආචාරීනි! මම ඉතා බාලයෙමි. මා තොපට මුනුබුරු තරමටත් නැත. මා නොවඳුව, මා නොවඳුව යි මහත්කොට කියනසේක් ඔහුගේ මැත සිරන.[1] දෙඛන දෙතොල හා දෙසොඬ හා නාසය හා නළල ආදී තැන් බිම ඇත් මැත් පෙරල පෙරලා කොරසැඩී බිම උලා ලේ හා පස්වකා අලනා ගැල්ලුවාසේ ලේ කැත් ලේ මඬුලුලු[2] කොට පියා නුවණින් අඬවූ ජඩය! තොයිත් මා අතින් වැදුම් ප්‍රාර්ථනා කෙරෙයිදැයි බොටුව අල්වාගෙන ඔහු කෙරේ මෛත්‍රී සිතින් එක් විවරෙක දමාලූසේක.

ඒ බමුණු මහලු තෙමෙ ප්‍රචණ්ඩ වාතයකින් ගොස් වැටී ගිය පුවක් පත් කඩක්සේ ආකාශයෙන් ගොස් විසියටක් පමණ තැන් ගොමගොත් සියක් රියනක වැටී පියා දුකසේ නැඟී සිට වැලි මිශ්‍ර වූ ලේ පිස පිස පලා ගියේය. මැණික බොධිසත්ත්වයන්ගේ සිටි යෝධයෝම ඇරගත්හ. බොධිසත්ත්වයන්වහන්සේ ආචාරීනි! මා නොවඳුව නැඟී සිටුව, නැඟී සිටුවයි කී ශබ්දයෙහි ඝොෂාව ඒසා මහත් සත් යොදුන් මියුලු නුවර වට සිටියාවූ අටළොස් අක්ෂෞහිණී පමණ සේනාවෙන් නොඇසූ කෙනෙක් මඳවූහ. කෙවට්ටයා මහෞෂධ පණ්ඩිතයන්ගේ පා වඳනාලදැයි රජදරුවන් හා මහා සේනාව කොලාහල කළහ. බ්‍රහමදත්ත රජ්ජුරුවන් හා එක් සියයක් රජදරුවන් ඇතුළුවූ හැමදෙනම කෙවට්ටයා මහෞෂධ පණ්ඩිතයන් පා පිටට නැමූනා දුටහ. නැවත කියන්නාහු අපගේ කෙවට්ට ආචාරීන් විසින් මහෞෂධ පණ්ඩිතයෝ වඳනා ලදහ. එබැවින් අපි එකාන්තයෙන්ම පැරැද්දම්හ. මහෞෂධ පණ්ඩිතයෝ අපගේ ජීවිතය නොදෙතියි භයින් නැති ගන තම තමන්ගේ අසුන් පිටට නැඟී උතුරු පසල්නුවර බැලූහ.

යුගඳුරු මුදුනේ පත් හිරු රැසින් බිඳී පලන්නාවූ ගනඳුරු පරිද්දෙන් ඛම්සුඛ මණ්ඩල නාමැති යුගන්ධර පර්වත මස්තකයට

1 සිරන 2 මුඩු

පැමිණි මහෞෂධ පණ්ඩිත නමැති සූර්යරශ්මීන් බිඳී දිවන්නට වන්හ. ඒ රජදරුවන් බිඳී පලන්නවුන් දැක බොධිසත්වයන් වහන්සේගේ පිරිස එකාඋහැර කියන්නාහු චූලනීබ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක්සියයක් රජුන්හා සේනාව හැරගෙන බිඳී පලා යන්නාහුයයි මහත්කොට හඬගසා පිළි හිස නටවා අත්පොළසන් දී කොලාහල කළාහ. ඒ අරගල අසා රජදරුවෝ මරණභයින් භයපත්ව වඩා වඩාලාම බිඳී දුවන්නාහ. වෙරල ගැසී ඉක්මුණු මහ මුහුද රළ පරිද්දෙන් සෙනඟ බිඳෙන්නාහ.

කාරුණාභිධානවූ මාගේ ස්වාමිදරුවාණෝ බිඳී යන්නවුන් ලුහු බඳවයි යන බසකුත් නො කියා තමන්වහන්සේගේ මහාසේනාව පිරිවරා මහොත්සවයෙන් නුවරටම වන්සේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා ඒ සා මහත් රාජසේනාව දෙලොස් ගවුවක් පමණ තැන් බිඳී පලාග. අලජ්ජවූ කෙවට්ටයා අසකූ නැගීගෙන කටින් ලේ කඳු දම දමා නළල ලේ පිස පිස දිවන්නේ සේනාව මැදට පැමිණ අසු පිට ම හිඳ පින්වත්නි! නො යව, නො යව, නොයවයි. මම ගොවියා පුතු නො වැන්දෙමි. සිටුව සිටුව, සිටුව''යි කිය. එසේ කීවත් නො රඳම දිවන්නාහු මෙසේ කියන්නාහ

කොල පව්ටුවූ දුෂ්ටවූ අධර්මිෂ්ටවූ අනාර්‍ය[1] ස්වරූප ඇති අවලක්ෂණ අඳුන වූ බමුණුමහල්ල! තෝ නො පිළිවන් ධර්මයුද්ධයක් කෙරෙමියි ගොස් තට මුනුබුරු තරමටත් බාලවූ පණ්ඩිතයන් වැන්දෙයි. මේ මනුෂ්‍යලෝකයෙහි උපන් සත්වයන්ගෙන් ජඹූ යම් එකක්හු කළමනා යම් නො කටයුත්තෙක් ඇත්නම් ඒ සියල්ලෙන් ම තා විසිනුත් නො කළමනා දෙයින් තුබූ දෙය ඇද් ද? ජඩය! මැන නොදෙඩා තොයිත් තාගේ පණ නොනසා යන අතන නැගී යයි යනාදීන් කිය කියා ඔහු බස් තමන් කන නො හෙළා ආක්‍රොශ පරිභව බෙණෙමින් නො රඳම් දිවන්නාහ.

බමුණු මහලු වහ වහා දිවගෙන ගොස් සේනාව මැදට පැමිණ ඇයි කුමක් කියවු ද? මම ගොවියා පිතු නො වැන්දෙමි. වදිනා කෙනෙක් නළල මූණ දන වැලමිටි ලෙලි ඇරගෙන ලේ හෙළා වදින්නෝ ඇද්ද? ඒ ගොවියා පිත් මාණික්‍ය රත්නයකින් මා වඤ්චා කොටපීය යි සියලු රජදරුවන් හා සේනාව නොලක් කාරණා කියා සිතට නංවා තමා වසඟ කොට එසේ බිඳී තුන් යොදුන් තැන් පසුබා ගත් සේනාව කඩා ගෙන එක පැතිර සම්න් ගත් වැවෙක දිය බැඳ රඳවා ගත් පරිද්දෙන් තමන්ගේ ප්‍රඥ නමැති වැටියෙන් සෙනාව නවතා ගෙනවුත් පලමු පරිද්දෙන් නුවර වටලා ගත.

1 අනාරිය

බෝධිසත්ත්වයන්වහන්සේගේ ආනුභාවයෙන් නොසිතූ හෙයින් මුත් ඒසා සේනාව ඉදින් පස් මිටක් වත්, එකි එකී කැටක් වත්, කැබිලිත්තක් වත් ඇතුළු නුවරට දමූ නම් අගල පුරා ගෙනගොස් අටළොස් රියන් පවුර පිට නැවත එපමණ ගොඩ කරන්ටත් වඩා ඇතිවන්නේය. ඒ එසේමැයි. තිලෝගුරු බුදුරජාණන්වහන්සේ ශ්‍රී මුඛයෙන්ම "බෝධිසත්තානං පන අධිප්පායො නාම සමිජ්ඣති. එකො'පි පංසුමුට්ඨිං වා ලෙඩ්ඩුං වා නගරාභිමුඛං ඛිපනෙතා නාම නාහොසි" වදාළ බැවින් අභිමතාර්ථසාධකවූ චින්තාමාණික්‍යයක් බඳුවූ මාගේ බෝධිසත්ත්වයන්වහන්සේගේ තෙජසින් පස් මිටක් වත්, කැටක් වත්, කැබිලිත්තක් වත් නුවර දිශාවට දමන්නා තබා සිති නුත් සිතූ එකද සත්ත්වයෙක් නැත. සියල්ලෝ ම අවුත් තමන් පළමු හුන් හුන් ස්ථානයෙහි ම හිඳගත්හ.

බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ආචාරීනි! මෙවිට කුමක් කරමෝදැයි කෙවට්ටයා විචාළහ. ඒ දුෂ්ටයා කියන්නේ දේවයන්වහන්ස! කිසි කෙනකුනුත් මහවාසලින් තබා කුරුබිලියෙනුත් පිටත්විය නො දෙම්හ. එසේ කල මනුෂ්‍යයෝ ගොවුදෙක ලාගත් ගවයන් පරිද්දෙන් උකටලීව, තුමූම දොර හැරපියන්නාහ එවිට අපි හැම අනායාසයෙන් සතුරන් අල්වාගෙන කැමැත්තක් කරම්හයි කිය. ඒ වූ තියාවත් බෝධිසත්ත්වයන්වහන්සේගේ චරපුරුෂයන් විසින් විදිර්දණ්ඩක තිබූ පතකින් පෙර පරිද්දෙන් දූත වදුරා මේ සතුරන් බොහෝ දවසක් මෙතෙන විසී නම් අප හැමදෙනාට සැපයෙක් නම් නැත්තේය. උපායකින් මුන් හැම පලවා පියම්යි සිතා තමන් වහන්සේගේ මන්ත්‍රණයෙහි ඉතා දක්‍ෂවූ උපායවත් එක් පුරුෂයක්හු පරීක්‍ෂා කරන්සේක් "අනුකෙවට්ටයායයි" යන එකක්හු දූත ඕහට වදුරනසේක් අපගේ එක් කටයුත්තෙක් ඇත. ඒ තොප විසින් සමෘද්ධ කොට දූත යහපතැ යි වදාළසේක.

ස්වාමීනි! කුමක් කෙරෙම්දැයි වදාළ මැනවැයි කිය. තෙපි මහ පවුරෙහි පිට පද්නම සිට අපගේ මිනිසුන්ගේ ප්‍රමාදයක් බලා අතුර අතුරෙහි බ්‍රහ්මදත්තයන්ගේ පිටත සිටි සේවායන්ට කැවුම් පෙවුම් දඩමස් කුඩමස්සන් ආදීවූ දෙය දමා කොල! මේ මේ දෙය අනුභව කරව. උකටලී නොවව. අතික් කිප දවසක් වට්ලාගෙන මෙතෙන වසන්ට උත්සාහ කරව. නුවරවාසී මූළල්ලම මැදිරියෙහි හසුවූ කුකුළන් පරිද්දෙන් ඉතා උකටලීව ගියාහ. නොබෝ දවසකින්ම තොපට වාසල්වල දොර හැර පියන්නාහ. ඉක්බිති තොපි මැද රජුත් දුෂ්ටවූ ගොවියා පුතුත් අල්වා ගනුවයි කියා ඔවුන් සිත් ගෙන ඇවිදුව. ඒ තොපගේ කථා අපගේ මිනිස්සු අසා තොපට ආක්‍රොශ පරිභව බැණ තොප අල්වා ගෙන බ්‍රහ්මදත්තයන්ගේ

මිනිසුන් බලා සිටියදීම තොප අත පය හුණුපතු සැම්පි ආදියෙන් ගසන්නාක් මෙන්ම පදනමින් බාගෙන ඉස පස් කොණ්ඩයක් බැඳ උළු සුණු ඇඟ ගල්වාලා රත්මල් කනේරු වඩම් කරලා කිප පහරක් ගසා පිට ගඩු නංවා පිටිතොල හයා බැඳ පවුර පිට නංවාගෙන සාල්ලෙක හිඳුවා යොතකින් බඳවා බ්‍රහමදත්ත රජ හුගේ මිනුසුන් බලා සිටියදී මන්ත්‍ර භෙදක සොරායයි කියා පිටත ලෑවූ කල එවේලෙහි තොප ගෙන ගොස් රජහට පාන්නාහ.

රජ්ජුරුවෝ තොපට මෙවැන්නක් කරන්නට තොපගේ අපරාධ කිම්දැයි විචාලෝ නම් තොප කියන කල මහරජ! පෙර මාගේ සම්පත් ඉතා බොහොව. ගොවියා පිත් මඃහඖෂධයා අප අපගේ යම් රහස් මන්ත්‍රණයක් හිතන කරන මන්ත්‍ර භෙදක සොරා යයි මට කිපී වෙදෙහ රජ්ජුරුවන්ට කියාලා මාගේ යසස ගෙන හෙද වන මා හැර ගත. එබැවින් මාගේ සම්පත් නැසුවාවූ සොරවූ ගොවියා පුතුගේ ඉස දෙවන්නට සිතන්නාවූ මම නුඹවහන්සේගේ සේනාව මේ නුවර සාදගත තොගී උකටලීවන ගෙසින් එහි ඉතා කතස්සලුව ඔවුන්ට අතරතුරේ කන බොන දූත් දෙම්. ඇතුළු නුවර අඩු වැඩියත් කියම්. ඒ දූනගෙන මාගේ පරණ වෛරයත් සිත තබා මට මේසා මහත් ව්‍යසනයක් කරවිය. මේ සියල්ලම නුඹ වහන්සේගේ මනුෂ්‍යයෝ දන්නාහයි කියා රජහු නොයෙක් කාරණයෙන් ගිවිස්වා තොපකෙරෙහි තරව ඇදහිලිව ගත්කල, නැවත, තෙපි මෙසේ කියව. මහරජ! මෙවිට මා ලත් පසු තොසිතා වදළු මැඬව. වෙදෙහයාත් ගොවියා පුතු මහෞෂධයාත් මෙවිට ජීවිතය නැත්තේය. මම මේ නුවර පවුර තර තැන්ද, තොතර තැන්ද අගල කිඹුලුන් හා මූවරුන් ඇති තැන්ද, නැති තැන්ද දනිමි. නොබෝ කලෙකින් නුවර ගෙන දී ලම් යි කියව.

ඉක්බිති රජ්ජුරුවෝ සැබවැයි ගිවිස තොපට බොහෝ සත් කාර කොට තමන්ගේ සේනාව තොපට පාවා දෙති. තෙපි ඒ සේනාව ගෙන සටනට ගොස් චණ්ඩවූ කිඹුලුන් හා මූවරුන්ගෙන් භයපත්වූවාහු සටන් තබා අගල සමීපයටත් ලං නොවන්නාහ. එවිට තෙපි අවුත් දෙවයන්වහන්ස! නුඹවහන්සේගේ මේ සේනාව ගොවියා පුතු විසින් හිංසනව ගියාහ. කෙවට්ටයාත් ඇතුළුව සියලු රජදරුවෝම ඔහු අතින් අල්ලස් නො ගත් එකද කෙනෙක් නැත. නුඹවහන්සේට හිතයෝ නම් මමය. හුදෙක් නුඹ වහන්සේ පිරිවරා ඇවිදින බව මුත් මේ සියලු දෙනම ගොවියා පුතු වසඟයෝය. මෙතෙක් දෙන නුඹවහන්සේට වෙනස් කල මම තනිව කුමක් කොටලිය හෙම්ද? ඉදින් මාගේ බස් නො අදහන සේක්වී නම් සියලු රජදරුවන් හැමදෙනම සඡ්ඣාහරණයෙන් සැරහී අවුත් මා දකින්වයි නියොග කල මැනවැයි කියව.

එබසින් යැමදෙනම හැඳගෙන ආ සළුවෙහිද, පළන් ආභරණයෙහිද, අල්වාගෙන ආ මගුල් කඩු ආදියෙහිද ගොවියා පුතු තමා නමින් ලියා තුබූ අකුරු දැක සැක හළ මැනවැයි කියව. රජ්ජුරුවෝ තොප කී ලෙස කොට වස්ත්‍රාභරණයෙහි අකුරු දැක නිශ්චය දැන භයින් ත්‍රස්තව රජදරුවන් යවා දැන් කුමක් කරමෝද? ආචාරීනි! සී තොප විචාරති. එසේ විචාළ කල දෙවයිනි! ගොවියා පුත් බොහෝ මායම් දන්නී. ඉදින් අතික් කීප දවසක් මෙතෙන විසුයේක් වී නම් තුඹවහන්සේගේ සියලු සේනාව තමා අත්පත් කොටගෙන තුඹවහන්සේත් අල්වා ගන්නාහ. ප්‍රපඤ්ච නො කොට අද මධ්‍යම රාත්‍රියෙහි අසුපිට නැඟී පලා යම්හයි කියව. සතුරන් අත මියෙන මරෙක් අපට නො වේවයි කියව. රජ්ජුරුවෝ ගිවිස තොප කී ලෙසම කරන්නාහ. තෙපි උන් නික්මෙන වේලාව දැන නැවත අපගේ මනුෂ්‍යයන්ට ඒ බව හඟවා ලව යි වදාළසේක.

ඒ අසා අනුකෙවට්ට බ්‍රාහ්මණයා පණ්ඩිතයන් වහන්ස! මා නිසා වැඩෙක් වේ නම් තුඹවහන්සේ වදාළ ලෙසම කෙරෙමියි කිය. එසේ වී නම් උන්ට පෙනෙන පරිද්දෙන් පහර කීපයක් ඉවසාපුව යහපතැයි වදාළසේක. පණ්ඩිතයන් වහන්ස! මාගේ ප්‍රාණයත් දෑතත් දෙපයත් නො නසා සර්වාඞ්ගය මුළුල්ල තුඹ වහන්සේ කැමැත්තක් සාළ මැනවැයි කිය. එවේලෙහි අනුකෙවට්ටයන්ගේ අඹු දරුවන් පටන් උන් සන්තක කිසි කෙනකු නුත් නොවරදවා සියලු සත්කාර කොට අනුකෙවට්ටයන් හිස පස් කොණ්ඩයක් බැඳ පිට ගඩු පෙනෙන ලෙස පහර කිහිපයක් ගසා ගඩු නංවා ඉස පටන් සර්වාඞ්ගයෙහි උළු සුණු ගල්වා කණේරු මල්දම් කර ලා මහා විප්‍රකාරයට පමුණුවා සාල්ලෙක හිඳුවා ලනු වෙසා බැඳ පවුරෙන් පිටත බාවා බ්‍රහමදත්තයන්ගේ මනුෂ්‍යයන්ට දැක්වූහ.

රජ්ජුරුවෝ අනුකෙවට්ටයා විමසා අදහා ගෙන ඔහට ප්‍රසාද දී සේනාව පාවා දුන්හ. එතෙමෙ උන් සැම ඇරගෙන නුවර ගන්මියි ගොසින් මෙතෙනින් මෙතෙනින් බට කල නිරුපද්‍රවය. මෙතෙන පවුර දුර්වලය. මෙතෙන රැකවල් නැතැයි ගෙන ගෙන ගොස් පොවාලූ ඇඟිල්ල කඩා ගෙන යන තරම් වණ්ඩවූ කිඹුලුන් හා මුවරුන් ඇති තෙනට බහා ලයි. මිනිස්සු කිඹුලුන් විසින් කනු ලබන්නාහු අට්ටාල වාසල් උඩ සිට සේවායන් විසින් විදිනාවූ හී දඬු හා දමාලා අන්නා අඩයටි හා තොමර වර්ෂාවෙන් විත් හා හැනුම් කමින් බොහෝ විනාශයට පැමිණියාහ.

එතැන් පටන් භයින් සටන් කරන්නා තබා ළං වියත් නො දෙන්නාහ. අනුකෙවට්ටයා රජ්ජුරුවන් ළඟට ගොස් දෙවයන්

වහන්ස! නුඹවහන්සේ නිසා සටන් කරන කෙනෙක් නැත. එම් සේනාවෙහි හැම දෙනම ගොවියා පුතුගෙන් අල්ලස් ගන්නා ලදහ. ඉදින් මා කීවා මෙනා අදහනසේක් වී නම් එක් සියයක් රජ දරුවන් ගෙන්වා ඇඳි පිළී ආදියෙහි ගොවියා පුතු නම අකුරු බැලුව මැනවැයි කීය. රජ්ජුරුවන් උන් කී ලෙසම කොට සියලු රජදරුවන්ගේ ඇඳි පිළී ආදියෙහි බොධිසත්වයන්වහන්සේගේ නම අකුරු දැක ඒකාන්තයෙන් මූන් විසින් අල්ලස් ගන්නාලදූයි තියම කොට ආචාරීනි! දැන් වැලි අපි කළමනා කිම්දැ යි විචාරා දෙවයිනි! අනික් කළමනා දෙයෙක් නැත. ඉදින් මෙතෙන කල් යවූ සේක් නම් ගොවියා පිත් යම් ලෙසක නුඹවහන්සේ අල්ලා ගන්නේය. නුඹවහන්සේට ඇත්තෙම්යි හිඳිනා කෙවට්ටාචාරීහු දක්වා නළල වණයක් කොටගෙන ඇවිදිනා බව මූත් අල්ලස් වූ කලි උයිත් ගත්තාමය. ධර්මයුඞයෙහිදී අනඝිවූ මාණික්‍යරත්නයක් කාත් නොදන්නා පරිද්දෙන් හැරගෙන නුඹවහන්සේ තුන් යොදුනක් පලා ගියවුන් නැවත ගිවිස්වා ගෙනවුත් මෙම නුවර මූළුල්ලේ ලාපීය. එයිත් නුඹවහන්සේට ඒකාන්තයෙන්ම අහිතය. එක රැයකුත් මෙතෙන රඳන්නා මා කැමති නැත. අද රෑ දවස් මධ්‍යම වේලේ නැඟී යන්නා කැමැත්තෙමි. මා විනා නුඹවහන් සේට උවමනා කෙනෙක් මේසා සේනාවෙන් එකද සත්‍ව කෙනෙක් නැතැයි කිය.

ඒ අසා රජ්ජුරුවෝ ගයින් තැති ගෙන එසේ වී නම් ආචාරීනි! තොප විනා මට හිත කෙනෙක් නැත. තෙපිම අසකු සදා ගමනට මට තිල කරවයි කිහ. අනුකෙවට්ටයාත් රජහු ඒකාන්තයෙන් යන බව දැන මහරජ! නොබා වදාළ මැනවැ යි අස්වසා ඒ ක්ෂණයෙහි පිටත අවුත් චරපුරුෂයන්ට කියන්නේ අද රෑ රජ්ජුරුවෝ පැලෑ යති. නිදාපියම්හයි නොසිතවයි කියාලා රජුහට අසු සදන්නේ යම්සේ රඳවන්නට කඹියාලම හායා ලූ කල නොරඳුම වහ වහා දිවේද, එපරිද්දෙන් අවකම්පනය යන සැදී මෙන් අසු සදලා මධ්‍යම රාත්‍රියෙහි අවුත් සදලා ගෙනාමි. වේලාව දන මැනවැයි කීය. රජ්ජුරුවෝ අසු නැඟීගෙන ගියාහ. අනු කෙවට්ටයාත් අසු නැඟී රජ්ජුරුවන්හා කැටිව යන කෙනකුන් මෙන් මඳක් තැන් ගොස් රඳා ගියේය.

අවකම්පන සැදුමෙන් සැදූ අස් තෙමෙ රඳවන්නට ගයාලූසේ නොරඳුම ඉදිරියටම දිවන්නේ බ්‍රහ්මදත්ත රජහු හැරගෙන පලාම ගියේය. අනුකෙවට්ටයා සේනාව මැදට වැදලා චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ පැලෑහයි මහත් කොට හඬ ගසාලීය. එක් සියයක් රජදරුවන් සමීපයෙහි සිටි පණ්ඩිතයන්වහන්සේගේ එක්සියයක් යෝධයෝ තමන් තමන්ගේ සේවායන් සමග බ්‍රහ්මදත්ත රජ්ජු රුවෝ සිඳී පලා ගියෝයයි මහත් කොට හඬ ගැසූහ.

එක් සියයක් රජදරුවෝ ඒ අඩ අසා සිතන්නාහු මහෞෂධ පණ්ඩිතයෝ වාසල් හරවා සේනාව හැර ගෙන පිටත් වූ වන්හ. මෙවිට අප හැම දෙනා දිවි නැත්තේය සී හයින් තැති ගත්තාහු ඇතුන් අසුන් පිළී පලඳනා ආදිවූ සියලු සම්පත් රුවන් මාලාවක් සේ තිබියදී කිසිවක් නොබලාම තිගණ්ඩ සේනාවක් බුන්නාසේ ඉස් ලූ ලූ අත උනුන් නොගෙන දිව ගත්හ. බොධිසත්ත්වයන් වහන් සේගේ චරපුරුෂයෝ එක් සියයක් රජදරුවෝ පලා ගියහයි වඩ වඩා කොලාහල කොට හඩ ගැසූහ. ඒ හඩ අසා නුවර වාසල් අට්ටාල පවුරු පදනම්වල සිටියාහුද එක පැහැර ඔල්වර[1] හඩ දෙමින් මහත්කොට ශබ්ද පවත්වා අත්පොළසන් දුන්හ.

මෙසේ එකල පොළොව පැළී ගිය කලක් පරිද්දෙන්ද, මහ මුහුද ඇලළීගිය කලක් පරිද්දෙන් ද සියලු ඇතුළු නුවරද පිටත් නුවරද එක කොලාහල වූයේ ය. අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාවෙහි මිතිස්සු මහෞෂධ පණ්ඩිතයන් බ්‍රහමදත්ත රජ්ජුරුවන් හා එක් සියයක් රජදරුවන් හා එකාන්තයෙන්ම අල්වා ගන්නාලදැයි මරණ හයින් තැති ගත්තාහු කිසි සරණයක් වත් පිටි වහලක් වත් ගැලවෙන්නට කිසි උපායක් වත් නොදත්තාහු සෙසු දෑ තබා හන්කඩ පමණකට වත් ආලයක් නොකොට සියල්ලම හුන් හුන් තැනම හැරපියා පලමු ගියවුන්ගේ ඉස් ලූ ලූ අත දිවගත්හ. ඒ සා රාජ සේනාවක් කඳවුරු බැඳ හුන් තෙන එකද මනුෂ්‍යයකු නැතුව යකුන් කෙළි සිරිපිටියක් සේ හිස්ව ගියේය. චූලනි බ්‍රහ්ම දත්ත රජ්ජුරුවෝ එක් සියයක් රජදරුවන් හා සමග තමන්ගේ නුවරටම ගියාහ. රෑ පැවති කොලාහලයෙන් ඇත් අස් ආදීහු කඹ බාන් කඩා ගෙන බිඳ ගෙන ඒ ඒ දික් දිවගෙන ගොස් වල් පැන නැංගාහ.

මෙසේ ඒ මහතාණන් වහන්සේ මතු වජ්‍රාසනාරූඪව දස බිම්බරක් මාරසේනාව පරාජය කිරීමට පූර්වනිමිත්ත පානා කලක් පරිද්දෙන් මෛත්‍රී නමැති මිණිපලඟය හා ප්‍රඥා නමැති කඩුරුවන තුරයේ අල්වාගෙන තමන් වහන්සේගේ ආනුභාව නමැති සැඩ වතුරෙන් පලන්නාවූ කසල වැටියක් පරිද්දෙන් මර සෙනඟසේ සිටියාවූ පර සෙනඟ මැස්සකු බොන පමණක් ලේ ටිකක් නොසොල්වා උපායෙන්ම බිඳ වදළ සේක.

දෙවන දවස් උදෑසනම නුවර වාසල්වල දොර හරවා සේනාව නුවරින් පිටත්ව අභිමතාර්ථ සාධකවූ කල්පද්‍රැමයක් වැනි මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ කළ වික්‍රමයට සතුටුව දෙවියන් විසින්

---

1. පොල්වර,

වස්වන ලද සත් රුවන් වණිාවක් මෙන් දෝ හෝ නොහොත් මග මෙරගල් වටා සිටියා වූ රුවන් වැල්ල සේ මුතු මැණික් ඇතුන් අසුන් වස්ත්‍රාභරණ ආදිවූ නොයෙක් රුවතින් සැදී තුබූ වස්තු දැක කුමක් කරමෝ දැ යි විචාළහ. ඔබ වදුරතසේක් ඔවුන්ගෙන් අප නොකමැති කරවා ගන්නා වස්තුවක් නොවනබැවින් උන් තමන් ආලය නැතිව දමාපියා ගිය වස්තුබැවින් ඒ සියල්ලම අප සන්තක වන්නේ ය. ඉතුත් රජදරුවන් හැමදෙනා සන්තක වස්තුව අපගේ රජ්ජුරුවන් වහන්සේට දෙව. සිටුවරුන් හා කෙවට්ටයා සන්තක වස්තු තාක් මුළුල්ලම අපට ගෙනෙව. සෙසු අටළොස් අක්ෂෞහිණියක් පමණ මහා සේනාව සන්තක වස්තු මුළුල්ල නුවර වාසීහු ඇර ගන්ව යි වදාළසේක. ඉන් මාහැඟි රත් රුවන් ආදිවූ වස්තු අදනවුන්ට දෙපෝයෙක් ගියේය. වී සාල් ආයුධ ආදී අවශෙෂ වස්තු සාර මසකින් ඇද්දූහ.

බෝධිසත්වයන් වහන්සේ අනුකෙවට්ටයන්ට බොහෝ සත් කාර කළසේක. වල ගිය ඇත් අස් ආදීන් බඳවා ගෙන්වා ගත්හ. එවක් පටන් මියුලු නුවර වාසීහු දශවිධ රත්නයෙන් සමෘද්ධවූහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා එක් සියයක් රජුන් හා එක්ව බැඳී ගොස් උත්තර පඤ්චාල නුවර වසන්නවුන්ට අවුරුද්දෙක් ඉකුත් ව ගියේ ය.

ඉක්බිති එක් දවසක් කෙවට්ට බ්‍රාහ්මණ මහලු කැඩපත කින් මුහුණ බලන්නේ නොපිළිවන් යුධයක් කෙළේ ඇසිදු සි පාටවයට ශ්‍රී පාද ලාඤ්ඡනයක් වැනිවූ තලළ තුබූ කැලල දැක මේ අතිකෙක් නොවෙ සි. ගොවියා පුතු අත මෙහෙවරය. ඔහු විසින්ම එක් සියයක් රජුන් හා මේසා සේනාවක් මධ්‍යයෙහි මා ලජ්ජාවට පමුණුවනලදු යි දණ්ඩකින් ගසනලද ආශීවිෂයකු පරිද්දෙන් වඩනලද ක්‍රෝධ ඇත්තේ කවර දවසෙක ඔහු පිටි දැක පියම් දෝ හෝ යි සිතන්නේ ඒ බව දන්නා බලවත් උපා යෙක් ඇත. අපගේ රජ්ජුරුවන්ගේ දූ පඤ්චාලචණ්ඩි කුමාරි කාවෝ දිව්‍යප්සරාවක මෙන් උතුම් වූ රූ ඇත්තාහ. සිවු සැටක් ස්ත්‍රී ලක්ෂණයෙන් යුක්තයහ. ඒ කුමාරිකාව වෛදේහ රජ්ජුරුවන්ට සරණ පාවා දෙම්හයි කියා වෛදෙහයා කාමයෙන් පොලඹා ගෙන බිලියක් ගිලූ කුඹමස්සකු ගොඩ නගා ගන්නාසේ මහෞෂධ පණ්ඩිතයන් හා සමග මේ නුවරට ගෙන්වා ගෙන දෙන් නාම මරා ජයපානය බොම්හ යි සිතිවුහන් කොට මේ උපාය උන් දෙන් නාම මරන්ට ඇතැයි සිතා රජහු සමීපයට ගොස් දෙවයන් වහන්ස! එක් රහස් මන්ත්‍රණයෙක් ඇතැයි කීය.

පලමුත් තොපගේ මන්ත්‍රණය නිසා අපගේ උතුරු සළුවටත් අස්වාමිකව දමාපියා ආම්හ. මෙවිට මේ මන්ත්‍රණයෙන් කුමක් කෙරෙම්ද? මූවෙන් නොබිණුවයි කීහ. මහරජ! මේ උපාය හා සමාන අතික් උපායෙක් නැතැයි කීය. මහරජ! අප දෙන්නා මතු නතිවිය යුතුයයි කීය. ඔහු ඇරගෙන මාලිගාවේ මතු මහලට නැගී මහරජ! වෙදෙහරජු කාමයෙන් පොලඹා ගොවියා පුතු හා සමග මේ නුවරට ගෙනවුන් ජිවිතක්‍ෂයට පමුණුවා පියම්හයි කීය. කවර උපායකින් පොලඹා ඔවුන් මෙනුවරට ගෙනෙමුද යි විචාළ කල්හි මහරජ! නුඹවහන්සේගේ දූවණියෝ පඤ්චාලචණ්ඩි කුමාරිකාවෝ උතුම් රූ ඇත්තාහ. ඒ සඅී ලක්‍ෂණ සම්පන්නවූ කුමාරිකාවගේ රූපශ්‍රී විලාසය කවීන් ලවා ගී බඳවා ඒ කාව්‍යය මියුලු නුවර ගායනා කරවා මෙබඳු වූ ස්ත්‍රීරත්නයක් නොලබන්නාවූ වෙදෙහ රජහට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්දැයි කියා රූපය ඇසූ පමණකින්ම ඔහු සවණ සංසගීයෙහි බැඳුණු බව දැන මම ඔබ ගොස් දවස් නියමකොට නැකැත් ලා එමි. ඒ රජ දවස් නියමකොට තමාපු කල්හි බිලියක් ගිලූ මසකු පරිද්දෙන් ගොවියා පුතු හා සමග මේ නුවරට එන්නේය. එවිට උන් දෙන්නා අල්වාගෙන ජිවිතක්‍ෂයට පමුණුවා පියම්හයි කීය. රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා ඉතා සතුටුව ආචාරීනි! ඒ උපාය ඉතා යහපතැ යි කියා තොප කී ලෙසම කෙරෙමියි ගිවිස්සාහ. දෙන්නාගේ රහස් කථාව චූලනී රජ්ජුරුවන්ගේ යාන බලන එක් සැළලිහිණියෙක් සකස් කොට අසා සිත තබාගත.

ඉක්බිති රජ්ජුරුවෝ යහපත් කොට හදාළ කාව්‍යකාරයන් ගෙන්වා ඒ වූ නියාව කියා බොහෝ සම්පත් දී ඔවුන්ට දූවණියන් දක්වා කුඹාවරිනි! මේ කුමරිකාවගේ රූපශ්‍රී වණීනා කෙරෙමින් මූන් නිසා කාව්‍යයන් කරවයි කීහ. ඒ කාව්‍යකාරයෝ කණීරසායනය කොට අතිමනොහරවූ ගී බැඳ රජහු ඇස්වූහ.[1] එ දවස රජ්ජුරුවෝ බොහෝ වස්තු දුන්නාහ. ඒ කඩින් අතින් විද්දත් නාටකයෝ බොහෝ දෙනා මධ්‍යයෙහි ගායනා කළහ. ඒ ගීතිකා[2] ඇසූ ඇසූවන් කනට ඉතා මධුරවිය. මෙසේ ඒ කාව්‍යයෙහි ගීතිකාවන් බොහෝ දෙනා කෙරෙහි ප්‍රසිඩ වූ කල්හි රජ්ජුරුවෝ ගීකියන් නවුන් කැඳවා කියන්නාහු දරුවෙනි! තොපි කොස්ලිහිණියන් අල්වාගෙන[3] රැ ගස් උඩ හිඳ ගීතිකාවන් කියා අලුයම් වේලේ උන් කර කාංසතාලම් බැඳලා උන් ආකාශයට හැරලා කාත් නො දන්නා පරිද්දෙන් බැස පියව යි කීහ. එසේ විධාන කොළේ ඒ කුමක්

1. හැස්වූහ 2. ගිතිකාවන් 3. දන්වා:ගෙන

පිණිසදයත්? බ්‍රහමදත්ත රජ්ජුරුවන්ගේ දුවණියන් රූප විලාසය දෙවතාවෝ පවා කියත්තාහයි දඹදිව ප්‍රසිද්ධවන පිණිස කරවූහයි දතයුතු.

නැවත රජ්ජුරුවෝ කවීන් කැඳවා කුඹාචරිනි! දැන් තොප කියන කල මෙබඳුවූ රූ ඇති කුමාරිකාවක් දඹදිව අතික් රජක්හට තරම් නොවෙයි. මියුලු නුවර වේදේහ රජ්ජුරුවන්ට තරමය යි වේදේහ රජ්ජුරුවන්ගේ රාජ ඓශ්වය්‍ය්‍යීය හා කුමාරිකාවගේ රූප වර්ණනාව හා එක්කොට ගී බැඳ කාව්‍යයක් කරවයි කීහ. ඔහු වහාම කාව්‍ය කොට රජ්ජුරුවන් පෑහ. රජ්ජුරුවෝ ඔවුන්ට ප්‍රසාද දී දරුවෙනි! මියුලු නුවරට පලාගොස් නුවර ගායනා කරවයි කියා යවූහ. ඔහු එතැන් පටන් වන් වන් තැන ගායනා කෙරෙමින් සාරසියක් ගවු ගෙවා මියුලු නුවරට පලා ගොස් බොහෝ දෙනා රැස්වූ මහා සභායෙහි ගායනා කළහ. ඒ අසා බොහෝ ජනයෝ ඔල්වර හඬ දහස් ගණන් පවත්වා මහාසෙනනාණයෙන් උන්ට බොහෝ වස්තු දුන්නාහ.

ඒ නාටකයෝ රෑ ගස්වල උඩ ඉඳ ගායනා කොට අලුයම කොස්ලිහිණියන් කර කංස තාලම් බැඳ ආකාශයට හැර බස්නාහ. ආකාශයෙහි ඒ කංස තාලම් හඬ අසා චූලනී රජ්ජුරුවන්ගේ කුමාරිකාවගේ රූප වර්ණනාව දෙවතාවෝ පවා කියන්නාහ යි නුවර මහත්වූ කොලාහල විය. වේදේහ රජ්ජුරුවෝ ඒ අසා කාව්‍ය කාරයන් ගෙන්වා තමන්ගේ රජගෙයිදී බොහෝදෙනා මධ්‍යයෙහි කියවා බ්‍රහමදත්ත රජ්ජුරුවෝ තමන්ගේ මෙබඳුවූ රූපශ්‍රීයෙන් විරාජමානවූ දුවණියන් මට සරණ දෙත්ල යි මහා සොම්නසට පැමිණ නාටකයන්ට බොහෝ වස්තු දීමෙන් මහත් සත්කාර කළහ.

ඔහු නැවත අවුත් එපවත් බ්‍රහමදත්ත රජ්ජුරුවන්ට දැන්වූහ. ඒ අතරතුරෙන් කෙවට්ට බමුණු කියන්නේ මහරජ! දැන් මම ගොස් නැකැත් ලාලා දවස් නියම කොටලා එන්නට යෙමි යි කීය. යහපත ආචාරීනි! කුමක්ද? තොපට දියයුතුයයි විචාළහ. රජ්ජුරු කෙනකුන් ළඟට යන කල සිසතින් යාම සුදුසු නොවන්නේය. මහරජ! යම්තම් පඬුරක් ලද මැනවැයි කියා යහපත ගනුවයි කියා මාහැඟි පඬුරු දුන්හ. ඒ බමුණු මහ පිරිවරින් ගොස් වෙදෙහරටට පැමිණියේ ය. ඔහු එන ගමන් අසා මියුලු නුවරවාසීහු බ්‍රහමදත්ත රජ්ජුරුවෝ තමන්ගේ දුවණියන් අපගේ රජ්ජුරුවන්ට සරණ දෙත්ල. රජදරුවන් දෙදෙනාගේ බන්ධුභාවයත් මිත්‍රකමුත් යහපත් වන්නේය. කෙවට්ට බ්‍රාහමණයා නැකත් ලන්ට එමින් සිටියේලයි නුවර එකකොලාහල විය. එ පවත් වෙදෙහ රජ්ජුරුවෝත් ඇසූහ.

පරසිත් දන්නා නුවණැති බොධිසත්වයන්වහන්සේ එපවත් අසා සිතනසේක් මේ විවාහය කියා කෙවට්ටයා එන ගමන මා රැය්නෝ[1] නොවෙයි. තත්වය දූතපිම් නම් යහපතැ යි සිතා චූලනී රජ්ජුරුවන්කෙරේ සිරි වරපුරුෂයන්ට මේ සරණමගුලේ තත්වය වූ පරිද්දෙන් කියා එවත්ව යි කියා යවූසේක. නැවත ඔහු කියා එවන්නාහු අපිත් ඒ තත්වය නොදනුම්හ. කෙවට්ටයා හා රජ්ජුරුවන් හා දෙදෙන මාලිගාවේ මතු මහලේ ශ්‍රියහන් ගබඩාවේ හිඳ මන්ත්‍රණය කලාහ. රජ්ජුරුවන්ගේ යාන බලන සැලලිහිණියක් ඇත. ඒ තත්වය ඕතොමෝ ඉඳුරා දන්නී යයි නැවත කියා අසුත් යවූහ.

ඒ අසා බොධිසත්වයන් වහන්සේ සිතනසේක් යම්සේ සතුරන්ට අවකාශයෙක් නොවේද? එබැවින් ප්‍රාකාර ගොපුරද්වාර ට්ටාල ශාලාදීන් සකස් කොට වින්‍යාස කරනලද දිව්‍යපුරයක්සේ සරසනලද නුවර මම මේ දුෂටවූ කෙවට්ටයාට නොපාමියි සිතා නුවර මහා වාසල පටන් රජගෙයි දෙරකඩද, රජගෙයි දෙර පටන් යම්තාක් තමන්වහන්සේගේ දෙර දක්වා අතුරෙහි යන වීපිමාගී දෙපාශ්වයෙහි වට පැදුරු[2]අදවා මුදුනෝ හීන් පැදුරෙන් වස්වා සිත්තම් කරවා බිම සුදුවැලි ලවා පස්වනක් මල් ඉස්වා දෙපාශ්ව යෙහි පූණිසට හා කලස් මාරුක්මල් තබා තොරණක් පාසා කෙහෙල්ගස් බඳවා නානා සථානයෙහි නානා වණී ධජ පතාක නැංවූසේක

කෙවට්ටයාත් නුවරට වන්නෝ නුවර ගෙවල් ආදිය ඉඳුරා, නොදක රජහු විසින් මා එන්නවුට මගුල් පිණිස නුවර සරහන ලද්දේයයි සිතී ය. ඒ බමුණු තමාට නුවර නොපානා පිණිස කල තියාව නොදන්නේ ය. කෙවට්ටයාත් සරහනලද වීපියෙන් ගොස් රජ්ජුරුවන් දැක ගෙනා පඬුරු පාවා දී මියුරු කථා කොට එකත් පස්ව හිඳ රජහු විසින් කරනලද සත්කාර සමමාන විද තමා ආ කාරණා කියන්නෝ ගාථා දෙකකින් කීය.

රාජා සන්ථවකාමො තෙ රතනානි පවෙච්ඡති
ආගච්ඡන්තු තතො දූතා මඤ්ජුකා පියභාණිනො
භාසන්තු මුදුකා වාචා යා වාචා පටිනන්දිතා
පඤ්චාලා ච විදෙහා ච උභො එකා භවන්තු තෙති

මහරජ! අපගේ රජ්ජුරුවන් වහන්සේ හා ඥාති සම්බන්ධයෙන් අතිශයින් හිතමිත්‍රව හිඳිනා කැමතිසේක් අනසීවූ රුවන් ආදි පාක් කුඩම් හා එවූසේක. ඒ ආවාවූ දූතයෝත් මිහිරි තෙපුල් දන්නාහ.

---

1. රුස්සන්නේ 2. බට පැලැලි

ප්‍රියවූ කථා දන්නාහ. විරොධයට සුදුස්සක් සිතිනුත් නොසිතත් නාහ. දෙතෙනටම සමසිතින් වැඩ නැසිරෙන්නාහ. උන් කව බැහැරයයි නොසිතු ව මැනව. ඒ සියල්ලට මධ්‍යස්ථව ආයෙම් මමය යි කීය. මෙසේද කියා නැවත කියන්නේ යම් යම් බසෙක් සන්තොෂ කර වී නම් ඔවුනොවුන්ට එසේවූ ප්‍රිය තෙපුල්ම කියත් වයි, කුමක් නිසාද යත්? පඤ්චාලදෙශයහි රජ්ජුරුවන් හා වෛදෙහ රජ්ජුරුවන් හා දෙදෙනා ආවාහ විවාහයෙන් එකාත්මිකව නිස තුරුව සමග ඔවුනොවුන් කෙරෙහි සතුටුව වසන්නාහ. එබැවින් අවමඞ්ගල වචනයක්ම නොකියා මඞ්ගල සන්නිශ්‍රිතවූ බස්ම කියත්ව යි කීය.

නැවත කියන්නේ තව ඒ මතු නොවෙයි. තමන්ගේ දූ රුවන හා සමග උතුම් වූ මාහැඟි රුවන් එවනසේක. මෙවක් පටන් නිසතුරුව දෙරටින් ඔවුනොවුන්ට පාක්කුඩම් ගෙන මිහිරිවූ ප්‍රිය තෙපුල් දන්නා දූතයෝ මොබින් ඔබ යෙත්ව යි ඔබින් මොබ යෙත් වයි ඒ දෙරට සම්බන්ධ වන නියාව කුමක් මෙන්දයත්? ගංගා නම් ගඟ දිය හා යමුනා නම් ගඟ දිය හා එක්වූ කලක් පරිද්දෙන් ඔවුනොවුන් හා එක්සිත්ව සමගව සන්තොෂව වෙසෙත්ව යි කිය. මෙසේ ද කියාලා නැවත කියන්නේ අපගේ රජ්ජුරුවන් වහන්සේ අතික් මහා අමාත්‍යයකු එවනු කැමතිවත් අතික් කෙනෙක් මේ මඞ්ගල වචනය සිත් ගෙන ඉඳුරා කියාලන්ට අසමර්ථයහයි සිතා මට කියනසේක් ආචාරීනි! තොපිම ගොස් මේ මඟුල් කියා රජ්ජුරුවන් යහපත්කොට සතුටුකරවා කැඳවා එන් නට යවයි කීසේක.

එබැවින් රාජොත්තමයාණන් වහන්ස! වැඩිය මැනව. ඔබ ගියාවූ නුඹවහන්සේට වැඩ දෙකෙක් වන්නේය. ඒ කවරේදයත්? අසමාන රූ ඇති කුමාරිකාවනුත් ලබනසේක. රජ්ජුරුවන් හා සමඟ මෛත්‍රී සිතත් අධික වන්නේය යි කීය. වෛදෙහ රජ්ජුරුවෝ කෙවට්ටයාගේ බස් අසා ඉතා සතුටුව උතුම්වූ රූ ඇති කුමාරිකාවම ලැබෙම්ලයි ඇසූ බස් පමණෙක බැඳීගොස් නැවත කියන්නාහු ආචාරීනි! තොප හා මහෞෂධ පණ්ඩිතයන් හා දෙන්නාගේ ධර්මයුද්ධයෙහි වාදයෙක් වූයේ වේද, යව, මප්‍රතණුවන් දකුව. තොප හා දෙන්නාම නුවණැති පණ්ඩිතවරුන් බැවින් ඔවුනොවුන් ක්ෂමා කරවා ප්‍රියකථා කොට එවයි කියා කීහ.

ඒ අසා කෙවට්ට බමුණා යහපතැයි පණ්ඩිතයන් දක්නට යෙමියි නමා ගන. බොධිසත්වයන් වහන්සේත් එම දවස් උදෑසන ඒ පව්ටා හා මාහා එක්ව කථාවක් නොවේවයි සිතා උදෑසනම බසට

කැප පිණිස එලගිතෙල් සුඟක් අනුභව කොට ගෙයි ඇම[1] පිරිබඩ අඟුල් දෑඟුල් බොල ඇති කොට ගාවා කප්වල තෙල් ගල්වා බොධිසත්වයන් වහන්සේ වැද හෝනා එක පට[2] හැඳක් පමණ තබා සෙසු ඇඳ පුටු ආදිය ගෙන් පිටත් කරවූහ.

සිටියවුන්ට විධාන කරනසේක් බමුණා හා මා හා කථාවට ආරම්භ කළ කල බමුණ! පණ්ඩිතයන් වහන්සේ හා නොදෙඩා. අද බෙහෙත් තෙලක් අනුභව කළසේකැ යි ඔහු නවතව මාත් ඔහු හා කැටිව දෙඩන්ට වන්කල ස්වාමීනි! බෙහෙත් තෙලක් වැළඳු සේක් වේද? නොදෙඩාවදලමැනවැයි නවතවයි විධාන කොට රතක් පෙරවා ගෙන සත්වන දොරටුවේ පට හැඳෙක වැදහොත් සේක.

කෙවට්ටයාත් සත් දොරටුවේ පළමු වන දොරටුවට අවුත් රැකවලුන්ට පණ්ඩිතයෝ කොයිදැයි කිය. නැවත එතෙන සිටියාහු බමුණ! මගත් කොට නොදෙඩ. අරගල කිරීම් නොකමැතිසේකැයි කිහ. සෙසු දොරටුවල සිටියාහුත් එලෙසම කීහ. ඒ බමුණු මුවෙන්[3] නොබැණ කරබාගෙන සත්වන දොරටුව ගෙවා බොධිසත්වයන් වහන්සේ සමීපයට ගියේය.

බොධිසත්වයන්වහන්සේ ඒ ගිය බමුණු හා කථාවට ආකාර දැක්වූසේක. ඉඟ සිටියාහු ස්වාමීනි! ඉතා සූක්ෂමවූ තෙලක් වළඳනලද්දේ වේද? එබැවින් මේ දුෂ්ට බ්‍රාහ්මණයා හා කථාවෙන් ප්‍රයෝජන කිම්දැයි කියා නැවතූහ. කෙවට්ටයා බොධිසත්වයන් වහන්සේ සමීපයට ගියේ හිඳිනට ආසනයක් වත් වැතිරගෙන සිටින ආධාරයක්වත් බොධිසත්වයන් වහන්සේගෙන් වචනයක් වත් නොලදින් වැසි සමයේ ගවර[4] පිරි ගාලකට වන් ගොන් මාල්ලකු සේ බොල් ගොම ඇඟිලි අස්සෙන් පලව පලවා ඒ පයින් ඒ පයට ලලා මිරිකා මිරිකා සිටියේය.

ඉක්බිති එසේ සිටියහු මූණ බලාලා එකෙක් තමාගේ නුවන කසාලීය. එකෙක් බැමය බිඳ උඩ නගාලීය. එකෙක් වැලමිට කසා ලීය. බමුණු ඔවුන්ගේ මේ ක්‍රියාව දැක ඉඟිකරුව[5] ඇත් මැත් බලන්නේ පණ්ඩිතයෙනි! අපි යම්හයි කියා වියරු හුනු ගම් බලන්න වූනට මස්මර[6] හුනු බෝගවාරියා[7] සැපත්වූවාසේ එතෙන සිටි දුෂ්ට යෙක් කෙවට්ටයාට කිපුණේ කොලනි! දුෂ්ටවූ බමුණු කොල්ල![8] බැණ නොහැගෑයි කිවත් මහත් කොට දෙඩයි ද? දැතින් තා අල්වාගෙන තළා ඇට සුණු සුණු කොට[9] පියම්යි කීය.

1. සෑම 2. පටු 3. මුයෙන් 4. ගව 5. ඉඟිත් කරුව 6. මස්වර 7. බෝගවරියා 8. මහල්ල 9. ඇට බැට සුණු විසුණු කොට

ඒ බමුණු හයින්[1] නැතිගෙන යම්හයි තමා ගත්තේ නැවත ආ පසුබැලිය. බැලුව වුගේ පත්ත උණ පත්තෙන් දෙපත්තේ අසු කොට[2] පැහැර පත්තේ පොත්ත උණපත්තෙන් ඇලී[3] යන පරිද් දෙන් ඇති දිරියට පැහැර ගඩු නංවාපිය. ඒ මදින් නැවත එකෙක් බොටුව අල් ලාගෙන දමාලීය. අනිකෙක් පිටි කර අත්ලෙන් පැහැර අත පසගිල්ල බමුණු පිට පෙනෙන පරිද්දෙන් ගඩු නංවා පීය. ඒ බමුණු මහලු දිවියා කටින් ගැලවී ගිය ගොන් මාල්ලකු පරිද්දෙන් හයින්නැතිගෙන දිවන්නේ දූකසේ රජගෙට පැමිණි යේය.

රජ්ජුරුවෝ සිතන්නාහු මපුතණුවෝ අද මෙපවත් අසා අතිශයෙන් සතුටු වන්නාහ. තවද පණ්ඩිතවරුන්ගේ ධර්මයෙන් යුක්තවූ මිහිරි කථා වන්නේය. අද දෙන්නා ඔවුනොවුන් ක්ෂමා කරවන්නාහ. එබැවින් මට වූයේ මහා ලාභයෙයකැයි සිත සිතා උන්නාවූ රජ්ජුරුවෝ එතෙනට ආ කෙවට්ටයා දැක දෙදෙනා ඔවුනොවුන් හා කල කථා සම්බන්ධය විචාරන්නාහු.

> කථං නු කෙවට්ට මහෞසධෙන සමාගමො ආසි තදිඞ්ඝ බ්‍රෑහි
> කච්චි තෙ පටිනිජ්ඣතො කච්චි තුට්ඨො මහොසධොති,

යන ගාථාවෙන් කිමෙක්ද? කෙවට්ටයෙනි! මහෞෂධ පණ්ඩිතයන් හා තොප හා එදවස් ධර්ම යුද්ධයෙහිදී වූ කතාස්සලූ හරවා ක්ෂමා කාරවා ගතුද? නැවත තොප දෙන්නාගේ මිහිරි කථා එසේ පැවැත්තේද? තොපගේ රජ්ජුරුවන් කියා එවූ විවාහ මඞ්ගලය අසා සතුටු වූද? තත්වය වූ පරිද්දෙන් කියවයි කීහ. ඒ අසා කෙවට්ටයා බොධිසත්වයන් වහන්සේගේ නුගුණ කියන්නේ,

> අනරියරූපො පුරිසො ජනින්ද! අසම්මොදකො ථද්ධො
> අසබ්භිරූපො
> යථා මූගො ච බධිරො ච න කිඤ්චිත්ථං අභාසථාති.

ජනප්‍රධානවූ රජ්ජුරුවන්වහන්ස! මහෞෂධ පණ්ඩිතයා නම් අනාර්ය ස්වරූප ඇති එකෙක. සාධුගුණයක් නැති තද එකෙක. සබායෙන් ම අසත්පුරුෂයෙක යම්සේ ගොළුවකු මෙන් තෙමේ බසක් නොකීය. බිහිරකු මෙන් මාගේ බසකුත් නො ඇසූයේය. ඒ පණ්ඩිතයා නුඹවහන්සේටම තරම. ඔහු නම් අසත්පුරුෂයෙක. මනුෂ්‍යයන් කෙරෙහි එක තෙතකත් නැතැයි ද්වේෂ ම කුළුවූ බමුණු මහලු තමා කටට ආවාක් ම යම් නුගුණයක්ම කීයේය. තමා කෑ බැටේ ගෙඩි නමක් තමාම නොකියා සම්දුරුවා කෑ බැටනම් මේ

---

1. යත්නාව තමාගත් නැනැත්තේ 2. උණපත්තේ දෙපත්ත හසුකොට
3. හැලී

ය යි සිතමි. තමන් ලත් අවවාදයෙන් මදකුත් නොසියා මහ තාණන්ගේ නුගුණම කියත් කියත් රජ්ජුරුවෝ ඊට මැනවෙයැයි නො සිතා කෙවට්ටයා හා කැටිව ආවාවුන්ට බත් වියදම් හා නවා තැන් ලවා යවා[1] ආචාරීනි! සැතපී ගන්වයි සමුදුන්හ.

ඉක්බිති රජ්ජුරුවෝ සිතන්නාහු මාගේ පුතණුවෝ මහා නුවණැත්තෝය. මිහිරිවූ කථා හා ප්‍රිය තෙපුල් දන්නා කෙනෙක. උන්ට වඩනා නුවණැති කෙනෙක් නැත. මේ බමුණා හා කථාවකුත් නොකළාහ. රජ්ජුරුවන් කියා එවූ හස්නෙහි සතුටකුත් නොවූල. එසේ හෙයින් විවාහය නිසා මතු එන්නාවූ භයක් උන් විසින් දන්නාලද වනැයි තමන් අතුරෙහි ගාථාවක් උපද්ද.

අද්ධා ඉදං මන්තපදං සුදුද්දසං
අත්ථො සුද්ධො නරවිරියෙන දිට්ඨො

තලාභිකායො මම සම්පවෙධති
භික්ඛාසයං කොපරඅත්ථමෙස්සතී' ති.

මපුතණුවන් විසින් ඥාන නමැති දිවැසින් යම් මන්ත්‍රණයෙක් දක්නාලද ද, ඒ මන්ත්‍රණය එකාන්තයෙන් ලාමක එකකු විසින් දක්ක නොහැක්කේය. වීර්‍ය්‍යවත්වූ මහෞෂධ පණ්ඩිතයන් විසින් මෙහි කාරණා තඹ හෙයින් දක්නා ලද්දේ වන්නේය. උන් බමුණා හා සමග බැණ නො නැහැයි අසා මාගේ ශරීරය පවනින් කම්පිතවූ පල්ලවයක් මෙන් වෙවුලන්නේය. එසේම නොවෙයි කවර නම් දන්නා එකෙක් තමා රට හැර අනුන් අත හස්නට යන්නේද? ඒ බමුණා එන්නේ මිත්‍ර සන්ථවයක් නිසා එන්නේ නොවෙයි. මා කාමයෙන් පොලඹා ගෙන තමාගේ නුවරට ගෙන ගොස් අල්වාගෙන මරණ පිණිස ආයේ වන. ඒ මතු වන භය මපුතණුවන් විසින් දක්නාලදැයි ඒ කාරණය සලකා භයින් ත්‍රස්තව රජ්ජුරුවන් හුන් වේලෙහි සෙනකාදී ප්‍රඥසමුද්‍රයෝ සතර දෙන ආහ.

ඔවුන්ට රජ්ජුරුවෝ කියන්නාහු මසක් මං මුළා කෙනකු විසින් සමසක් මං මුළාවූ අනිකකු අතින් මං විචාළාසේ කිමෙක්ද? සෙනකය! උත්තර පඤ්චාල නුවරට ගොස් චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ දුවණියන් සරණ ගෙන එන්නට යමෝදැයි එ ගමන තොප විසින් කැමැත්තාදැයි විචාළහ.

---

1. යව

ඉක්බිති සෙනකයා මහට බට කෙනකුන් මහවලෙක ගොස් ලන්නාසේ මහරජ! කුමක් කියනසේක්ද? තමා කාරා එන ශ්‍රී කාන්තාව ගසා දුරු කරන කෙනෙක් ඇද්ද? ඉදින් නුඹවහන්සේ ඒ නුවරට ගොස් පඤ්චාල චණ්ඩි කුමාරිකාව ගෙනෙසේක් වී නම් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හැර සියලු දඹදිව නුඹවහන්සේ හා සමාන රජෙක් නැත්තේය. කුමක් පිණිසදයත්? හාංක රජ්ජුරුවන්ගේ දුවණියන් රක්‍ෂා කරන හෙයින් ඒ රජ්ජුරුවන් සිතන කල තෙසු රජදරුවෝ නම් මාගේ සේවක රජදරුවෝය. මා හා සරියෝ නම් එක වෛදේහ රජ්ජුරුවෝය යි සිතා සියලු දඹදිව සත්‍රින්ට වඩා රූ ඇති දුවණියන් නුඹවහන්සේට පාවා දෙන්නාහ. ඉන් නුඹවහන්සේට මහා අභිවෘද්ධියෙක. මීට නැක නොකොට උන් විවා[1] කළ මැනව. අපි නුඹවහන්සේ හා ගියකල පිළී හා අනන පානාදියෙන් සංග්‍රහ ලබම්හයි කිය. අතික් තුන් දෙනත් එම ලෙසම කිහ. ඔවුන් හා සමග කථා කෙරෙමින් උන් තෙනට කෙවට්ටයා තමා හුන් තමාතැනින් අවුත් මහරජ අප රදන්ට නො පිළිවන. යම්හ යි කිය. රජ්ජුරුවෝ ඕහට සත් කාරකොට යවූහ.

බොධිසත්වයන් වහන්සේ ඔහු ගිය බව දන සුවඳ පැනින් නහා සර්වාලඞ්කාරයෙන් සැරහී රාජ සේවයට අවුත් රජහු වැඳ එකත් පස්ව හුන්සේක. රජ්ජුරුවෝ සිතන්නාහු මපුත ණුවෝ මහා මන්ත්‍රිය සියලු මන්ත්‍රණ යෙහි පාරප්‍රාප්තයහ. අතීත අනාගත පච්චුප්පන්න යන තුන් කල්හි වන්නාවූ අර්ථයන් පරොපදෙශ රහිතව තමන්ගේ සර්වඥතයෙන් මනා කොට දන්නාහ. අප ඔබ යන ගමන යහපතත්, නපුරත් පණ්ඩිතයෝ දනිති යි සිතා තමන් පළමු සිතූ ලෙසම නොසිට රාගයෙන් රත්ව මොහයෙන්[2] මූඪව විචාරන්නාහු

ඡන්නං හි එකාව මතී සමෙති
යෙ පණ්ඩිතා උත්තම භූරිපත්තා
යානං අයානං අථවා' පි ඨානං
මහොසධ! ත්වම්පි මතිං කරොහී'ති.

සෙනකය පුක්කුසය කාවින්දය දෙවින්දය කෙවට්ටය වෛදෙහය යන අප සදෙනාගේ අදහස එක්සිත්ව උත්තර පඤ්චාල දෙශයට ගොස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ දුවණියන් රක්‍ෂා කිරීම යහ පතැයි එක්වූ නියාව ගන්ධාදකය හා යමුනොදකය සේ වෙනසක්

1. කීවා
2. ලොභයෙන්

නැතිව සඟලා විය. මහෞෂධ පණ්ඩිතයෙනි! තෙපිත් කියව. ඔබ යාමවත්, නොයාම වත්, නොගොස් රැඳීම වත් යහපත නපුර යන මේ දෙකෙන් එකක් තොපගේ සූක්‍ෂමවූ ප්‍රඥාවෙන් පරීක්‍ෂා කොට කියව. ඔබ යමෝද, නොයමෝදැයි කීහ.

එබස් අසා මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ සිතනසේක් මේ රජ තමා නුවණ මඳකෙයින් මුන් සතර දෙනාගේ බස් ගිවිස නුවණින් අඬකෙයින් කාමයෙහි ගිජුව එකාන්තයෙන් යන්නේය. ගමනෙහි දොෂ කියා නවතා බලමි සිතා මහරජ! ඇසුව මැනවැයි වදාරනසේක් ගාථා සතරක් දක්වූසේක.

ජානාසි ඛො රාජ මහානුභාවො,
මහාබලො චූලනීබ්‍රහමදත්තො
රාජා ච තං ඉච්ඡති කාරණත්ථං
මිගං යථා ඔකචරෙන ලුද්දො
යථාපි මච්ඡො බලිසං වඞ්කංමංසෙන ඡාදිතං
ආමගිද්ධො නජානාති, මච්ඡො මරණ මත්තනො
එව මෙව තුවං රාජ චූලනීයස්ස ධීතරං
කාමගිද්ධො නජානාසි, මච්ඡොව මරණ මත්තනො
සචෙ ගච්ඡසි පඤ්චාලං ඛිප්ප මත්තං ජහිස්සසි
මිගං පථානු පන්නං ච මහන්තං භය මෙස්ස සි'ති.

මෙහි අභිප්‍රාය නම් කෙසේ ද යතහොත්? චූලනී බ්‍රහමදත්ත රජ්ජුරුවෝ මහත් තේජස් ඇත්තාහ. අටළොස් අක්‍ෂෞහිණියක් පමණ සේනාව ඇත්තේය යි දන්නාසේක් වේද, යම්සේ වැදි පුත්‍රයා එක් මුවදෙනක හික්මවා ගෙන රැහැන් බැඳ රැන අල්වා ගෙන වලට ගෙන ගොස් මුවන් කන තෙන සිටුවන්නේද? ඕ තොමෝ නුවණ නැති මුවරජු තමා කරා එවා ගන්නා කැමතිව තමාගේ ශබ්දයෙන් රාග නිශ්‍රිත කොට හඬාද[1] ඇගේ හඬ අසා අඥනවූ මුවා තෙමේ මුවා ද මුව සමූහයා පිරිවරා වන ලැහැබෙහි ඔත්තේය. තමාගේ සෙසු මුවදෙනුන්ට නොහඟවා එසේ මුවදෙනගේ රාග නිශ්‍රිත හඬෙහි බැඳුනේ නැඟී සිට වනලැහැබෙන් නික්ම කර ඔසවා බලමින් කෙලෙස් වසඟව ඒ මුවදෙන ළඟට ගොස් වැද්දාට පසුව සිටීද, එසේ සිටියාවූ මුවා දැක වැද්දා සිහුම් මුවහත් ඇති තෙබ දමාලා ඇණ මරාද, එසේම චූලනී රජ නමැති වැද්දා තමා දුව පඤ්චාල චණ්ඩි කුමාරිකාව නමැති මුවදෙන පෑලා අඥන බැවින් මුවකු වැනි නුඹවහන්සේ කාමයෙන් පොළඹා තමා පස්සට එවා ගෙන කොවටට බමුණු නමැති ආයුධයෙන් මරනු කැමැත්තේය.

1. හඬවාද

තවද දෙවසිති! යම්සේ බ්‍යාම ශත ප්‍රමාණ ගැඹුරු දියෙහි මත්ස්‍යයා ඇමයෙහි[1] ගිජුව තමා බාහා වක්බිලිය ඇමින් වසන ලද්ද වූ ගොදුරෙහි ලොල්වූයේ මසින් වැසී සිටි තියාව නොදැක ගැල තමා තමාට වන මරණ නොදනිද? එසේ වූ චූලනී රජ නමැති වැද්ද තමාගේ දුව පඤ්චාල චණ්ඩි කුමාරිකා නමැති ඇමින් වසාලා කෙවට්ට බමුණු නමැති බිලියෙන් ගොදුරෙහි ලොල්වූ නුඹවහන්සේ බාලා ගෙන මරනු කැමතිව ගෙන්වන්නේ ය. ගැඹුරු දියෙහි හොත් මත්ස්‍යයා ඇමයෙහි ගිජුව තමාටවන මරණ නොදනීද? නුඹවහන්සේත් කාමයෙහි ගිජුව නුඹවහන්සේට වන මරණ නොදන්නාසේක.

ඉදින් නුඹවහන්සේ උතුරු පසල් නුවරට නැවත ගියසේක් නම් යම්සේ ගම්දෙරට පැමිණි මුවකු මාංසයෙහි ලොභයෙන් දූනු ඊතල තෙප් ගෙන මරන්ට ගිය මිනිසුන්ගෙන් යම් කෙනෙක් දුටුවූ නම් උඹ තුමූ ඒ මුවා විද මරද්ද, එසේම නුඹවහන්සේත් මරන්නාහ මුවාට වූ මරණභය මෙන් නුඹවහන්සේටත් මරණභය වන්නේයයි මෙසේ රජ්ජුරුවන්ට නිග්‍රහ කොට වදාළසේක.

එබස් අසා රජ්ජුරුවෝ නුවණින් සලකාගත නොහී තමන්ට හෙලා දෙඩුවයි සිතා මේ තම්හුගේ දසයකු කොට සිතති. රජ්ජුරුවෝය සි මඳකුත් නොසිතයි. දඹදිවට අග්‍රරජ්ජුරුවන් තමන්ගේ දුවණියන් මට සරණ දෙමියි මා සමීපයට දූතයන් එවුවා දැන එකද මඟුලට සුදුසු බසක් නොකියා මා කෙලතොලුවකුසේ ද බිලී ගිලූ මසකුසේ ද පන් හසුවූ මුවකුසේ ද මහත් භයට හා මරණයට පැමිණෙති කියයි කිපීහ.

මෙබඳුවූ අපි සත්‍රිරතන ප්‍රතිලාභ සඩ්ඛ්‍යාතවූ උත්තමාර්ථ කෙන කුත් නොපට කිමෝ නම් එසේවූ අපිම නුවණ නැත්තම්හ. අපි කෙලතොල්ලම්හ. මඟුලට තිසි කථා දන්නෝත් සෙනකාදී පණ්ඩිත වරු සතරදෙනාහ. කෙවට්ට පණ්ඩිතයෝය. තා තිමූත් මිට එලී ගෙන සී සා[2] කත ගොවියා පුතු අතින් මෙසේවූ උතුම් මඞ්ගල වචනය විචාළේයසි. බොධිසත්ත්වයන් වහන්සේට නොයෙක් පරිද් දෙන් නින්ද පරිභව බැණ ගොවියා පුතු මෙතතින් පිටත ලවයි කියන්නාහු ගාථාවකින් කියත්.

ඉමං ගලෙ ගහෙත්වාන නාසෙථ විජිතා මම
යො මෙ රතනලාභස්ස අන්තරායාය භාසතී, ති.

---

1. ආමිෂයස්
2. සී සෑ

රජ්ජුරුවෝ කිපී මාගේ ඊනියා ශ්‍රීලාභ නමැති රත්න ලාභයට අන්තරායට සුදුසු බස් කීවාවූ මොහු කර අල්වාගෙන මාගේ ජීවිතයෙන් පිටත් කරවයි කීහ. බොධිසත්ත්වයන් වහන්සේ රජහු කිපි බව දැන සිතනසේක් ඉදින් යමෙක් මේ නුවණ නැති රජහු බස් ගෙන මා අතක්වත්, කරවත්; අල්වාපිතම් මා දිවිහිමියෙන් ලජ්ජාවට එම සෑහෙන්නේය. එබැවින් මම්ම යෙමි සිතා රජහු වැඳ තමන්වහන්සේගේ ගෙටම වැඩිසේක.

රජ්ජුරුවෝ කිපී සිතට කී බව මුත් බොධිසත්ත්වයන් වහන්සේ කෙරෙහි ගරුත්වයෙන් එක් කෙනකුන්ට තෝරාලා පිටත ලවයි නොකීහ. එසේ හෙයින් තමන් තමන් මූණ බලා වෙනම නොකී හෙයින් බොධිසත්ත්වයන් ලඟට ගිය එකද සත්ත්වකෙනෙක් නැත්තාහ. රජගෙයි වසන්නවුන් විසින් රජහු යමක්හට කිපී තුලු ගසව, මරව, පිටත ලවයි සාමාන්‍යයෙන් කී කල්හි යටැසින් රජහු මුහුණ බල බලා සිටූත් මුත් අතක් නො සෙල් විය යුතුය. එකකු මුහුණ බලා කීකල නියොග ලද්දවුන් මුත් අනිකකු කිසිවකුත් නොකටයුතුය. ඉදින් නියොග ලද්දහු තබා අනිකෙක් නොමෙහෙවර කෙළේ වී නම් අරුට කළමනා නිග්‍රහ වරදවා කළ නැනැත්තේම විඳ ගන්නේය. එබැවින් රජහු එකකුට තෝරා නොකී හෙයින් බොධිසත්ත්වයන් ලඟට ගොස් පිටත ගිය මැනවැයි යන බසක් පමණකුත් කී එකෙක් නැත්තේය.

ඉක්බිති බොධිසත්ත්වයන් වහන්සේ සිතනසේක් මේ රජ්ජුරුවෝ නුවණ නැතිව තමන්ට හිතයන් අහිතයන් නොදැන කාමයෙහි ගිජුව බ්‍රහමදත්ත රජහුගේ දූව ලැබෙමියි සිතා මතු වන භය නොදැන ගොස් මහා විනාශයට පැමිණෙන්නාහ. මට මහා යස දායකවූ බොහෝ උපකාරව සිටි රජ්ජුරුවන්ගේ බස් සිත තිබීම මට තරම් නොවෙයි මාවිසින් මොහුට පිටිවහල් වියයුතු යයි සිතා "පඨමං සුව පොතකං පෙසෙත්වා තත්තතො ඤත්වා පච්ඡා සයං ගමිස්සාමීති චින්තෙත්වා සුවපොතකං පෙසෙසි. තමත්ථං පකාසෙන්තො සත්ථා ආහ" වදාළ බැවින් පළමු ගිරවාණන් යවා තත්වය දැන පසුව මම යෙමියි සිතා එනුවරට ගිරවාණන් යවූසේක. පණ්ඩිතයාණන් වහන්සේ ගිරවාණන් යවා ඒ තත්වය දත් පරිද්දෙන් බුදුව වැඩ හිඳ වදාරන මාගේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මෙසේ වදාරනසේක.

තතො ච සො අපක්කම්ම වෙදෙහස්ස උපන්තිකා
අථ ආමන්තයි දූතං මාඨරං සුවපණ්ඩිතං
එහි සම්ම හරීපක්ඛ, වෙය්‍යාවච්චං කරොහි මෙ
අත්ථි පඤ්චාල රාජස්ස, සාළිකා සයනපාලිකා
තං පත්ථරෙන පුච්ඡස්සු, සා හි පසබ්බස්ස කොවිදා
සා තෙසං සබ්බං පජානාති, රඤ්ඤො ච කොසියස්ස ච
ආමොති සො පටිස්සුත්වා, මාඨරො සුවපණ්ඩිතො
අගමාසි හරීපක්ඛො, සාළිකාය උපන්තිකං
තතො ච ඛො සො ගන්ත්වාන, මාඨරො සුවපණ්ඩිතො
අථං ආමන්තයි සුඝරං, සාළිකං මඤ්ජුභාණිකං
කච්චි තෙ සුඝරෙ කමනීයං, කච්චි වෙස්ස අනාමයං
කච්චි තෙ මධුනා ලාජා, ලබ්භතෙ සුඝරෙ තව
කුසලඤ්චෙව මෙ සම්ම, අථො සම්ම අනාමයං.
අථො මෙ මධුනා ලාජා, ලබ්භතෙ සුවපණ්ඩිත!
කුතො නු සම්ම ආගම්ම, කස්ස වා පහිතො තුවං
න ච මෙ සි ඉතො පුබ්බෙ, දිට්ඨො වා යදි වා සුතො'ති.

වදාළ බැවින් එපරිදි එම්බා මහණෙනි! මහෞෂධ පණ්ඩිතයෝ වෙදෙහ රජ්ජුරුවන්ගේ උදහස් අසා තමන්ගේ ගෙට ගියාහු තමන් වැඩූ මාඨර ගොත්‍රයෙහි උපන් ගිරා පැටවාණන් කැඳවා ඔහට දූත මෙහෙවර කියන්නාහු රන්වන්වූ පක්‍ෂ ද්වයක් ඇති මාගේ සබඳවූ ගිරා පණ්ඩිතයෙනි! මෙසේ එව. තොපවිසින් මට කළමනා මෙහෙවරෙක් ඇතැයි කීහ. එබස් අසමින්ම තමන් හිඳිනා රන්මැදිරියෙන් පිටත්ව අවුත් මහා සත්ත්වාශයට පැමිණ තමන්ගේ දෙපියා මුදුනේ තබා වැඳ එකත් පස්ව සිට කිමෙක්ද? මෙහෙවරක් කොට දී ලමි, සැක නොකොට වදාළ මැනවයි කීහ.

ඒ අසා මහෞෂධ පණ්ඩිතයෝ කියන්නාහු කොසිය ගොත්‍රයෙහි උපන් කෙවට්ටයා හා බ්‍රහ්මදත්ත රජහු හා දෙන්නා සරණ දෙම්හයි කළ රහස් කථාව සැබෑද බොරුදැයි එරජහුගේ යාන බලන සැළලිහිණිය අතින් තත්වූ පරිද්දෙන් විචාරා දැනගෙන අවුත් වහා මට කියවයි කියා මී හා විළඳ කවා සක්කරා මැඩි මී පැන් පොවා ශතපාක සහස්‍රපාක තෙලින් දෙපියා අතුර මැඩි කල්හි ඉතා සියුම් නුවණැති ගිරවාණෝ අසාගත් මෙහෙවර ඉදුරා

සිත තබා ගෙන බොධිසත්‍වයන් පැදකුණු කොටලා මාලිගාවේ මතු මහලේ හරතලද සිවුමැදුරු කවුළුවෙන් නික්මුණාහු වාත වෙගයෙන් සිවිරට දිශාවට මූණ ලා නික්ම අරිෂ්ටතම් පුරයට පලමු කොට ගොස් ඒ නුවර සවරූප දැනගෙන උත්තර පඤ්චාල නුවර සැළලිහිණිය සමීපයට ගියාහ.

කෙසේ ගියෝද්දැයි යතහොත්? ගිරා පොතකයෝ ගොසින් බ්‍රහ්මදත්ත රජහුගේ මාලිගාවේ රන්කොත් කැරැල්ල මුදුනේ හුන්නාහු මධුර සවරයෙන් රාග නිශ්‍රිතවූ අඩක් ඇඹූහ. ඒ කුමක් නිසාදයත්? සැළලිහිණිය. කවර ගබඩාවක බවක් නොදනිමි.[1] මේ මාගේ ශබ්දය අසා මට ප්‍රතිවචන දී තොමෝ හඩයි. ඒ සංඥවෙන් ඈ සමීපයට යෙමි සිතා ඇඹූහ. ඒ ශබ්දය අසා එරජුගේ ශ්‍රී යහන් සමීපයෙහි රන් මැදිරියෙහි උන් තැනැත්ති රාගයෙන් රත්වූ සිත් ඇත්තී පිට පිට තුන් අඩක් ඇඹූහ.

ගිරාපොතකයෝ මඳක් ගොස් නැවත නැවත ශබ්දය අසා සැළලිහිණිය විසින් කරන ශබ්දයෙහි අනුසාරයෙන් ගොස් සිවු මැදුරු කවුළුවෙහි එළිපත පිට හිඳ කර දික්කොට ඇතුළෙහි උවදුරු නැතිසේ බලා පරීක්ෂා කොට නැතිසේ දැන ඈ සමීපයට ගියාහ. කුමක් පිණිසදයත්? මේ සත්වලොකයෙහි ස්ත්‍රීන් නිසා ඇත තොල් මොට්ටාව කිදුවා ගෙන මහා පිඩාවට පැමිණෙන්නාහු ඇත. ඉදින් මේ ගෙයි යමෙක් මා දුටු නම් මටත් අපවාදයක්[2] කෙළේ නම් නපුරැයි සිතා දොර ඉඳ එසේ ප්‍රීක්ෂා කළැයි දතයුතු.

ඉක්බිති ගිරා පොතකයන්ට සැළලිහිණි සබඳ! මෙසේ අවුත් මේ මැදිරියේ හිඳුවැයි කීව. ගිරා පණ්ඩිතයෝ ගොස් මැදිරියට වැද රන් මැදිරියේ හිඳිනා සැළලිහිණිය සි බැණවූහ. හැසිද? සවාමීනී! කිව. කිමෙක්ද? තොප මේ රන්මැදිරියේ වසන්නවුන්ට සැපද? සිතට දෙම්නසෙක් නැද්ද? මී හා විලඳ' සුවසේ ලැබේදැයි විචාළහ. සැළලිහිණිද සබඳ ගිරා පණ්ඩිතයෙනි! මා මෙහි වසන් නවුන්ට ඉතා සැපයයි. සිතට දෙම්නසකුත් නැත. මී හා විලඳ සුවසේ ලැබෙයි. පණ්ඩිතයෙනි! කිව.

මෙසේ ඒ ගිරවාණන් තමාගේ සුව දුක් විචාළ ඉක්බිති නැවත තොපමෝ විචාරන්නී සබඳ! තොපි කොයි සිට අවුද? කවුරු තොප එවුද, මීට පළමු තොපසේවූ කෙනකුන් දුටු විරූත් නැත. මෙසේවූ කෙනෙක් ඇතැයි ඇසූ විරූත් නැතැයි කිව. ගිරවාණෝ ඈගේ බස් අසා ඉදින් මම මිථුලු නුවර සිට ආමි කීම් නම් තමා පණ යේ නමුත් මා හා සමග එක් නොවන්නීය යි සිතා සිවි දෙශයෙහි

1. නොදැන 2. අවවාදයක්

අරිෂ්ටපුරය සඳහන් කොට ඔබ සිට ආමි කියා සිවි රජ්ජුරුවන් එවුවා කොට බොරු ගොතාගෙන කියන්නාහු.

අහොසිං සිවිරාජස්ස පාසාදෙසයනපාලකො
තතො සො ධම්මිකො රාජා බද්ධෙ මොචෙසි බන්ධනා' ති.

සොඳුර! මමත් එසේ මෙසේ එකෙකිම් නොවෙමි. සිවි රජ්ජුරුවන්ගේ යාන බලන්නාවූ මෙසේම රන් මැදිරියෙක වසන්නාවූ ගිරවෙකිමි. අපගේ රජ්ජුරුවෝ ඉතා ධම්මෂ්ඨ කෙනෙක. එසේ හෙයින් දඟගෙයි හිඳිනා මනුෂ්‍යයන්ද, මැදිරිවල හිඳිනා පක්ෂීන්ද හරනසේක් මාත් රන්මැදිරියෙන් හරවාපීසේක. මමත් කැමති තැන ඇවිද ගොදුරු කා අවුත් දවස්පතා මාගේ සවර්ණ පඤ්ජර යෙහි වෙසෙමි. තොපසේ මම මැදිරියෙන් පිටත් නොවී ඇතුළු මැදිරියේ හිඳින්නේ නොවෙමි කිහ. එසේ කී ගිරවාණන්ට සැළලිහිණි තමා කන්නට රන් තට්ටුව ලා තුබූ මී හා විලඳ කවා මී පැන් පොවා සැළලිහිණි කියන්නී සබඳ! තොප ඉතා දුර සිටය ආයේ, කුමක් පිණිස අවුදූ සි කිව. "සො තස්සා වචනං සුත්වා රහස්සං සොතුකාමො මුසාවාදං කත්වා ආහ" යි යනු හෙයින් ගිරවාණෝ ඇගේ බස් අසා මේ ලොව බොරුවක් නොකියා බොරු සනාවක්[1] නොකොට සත්‍රීන් තම් සිත් ගත නොහැක්ක. එබැවින් බොරුවක්ම කියා මැ සිත තනාගෙන රහස් විචාරමි යි සිතා කියන්නාහු.

තස්ස මෙකා දුතියා'සි, සාළිකාමඤ්ජුභාණිකා
තං තත්ථ අවධී සෙනො, පෙක්ඛතො සුසර මමනති.

යන මේ ගාථාවෙන් එම්බා සොඳුර! තොපගේ කුලෙයි ම තොපට දෙවනුවූ මාගේපළමු එක්සැළලිහිණි අඹු කෙනෙක් ඇත. උසිත් එසේ මෙසේ කෙනෙක් නොවන්නාහ. පුරුෂයන් සිත් ගන්නා තරම් ලඳ බොලඳ මිහිරිවූ ප්‍රිය තෙපුල් දන්නාහ. මාගේ ඇසට රසාඤ්ජනයක් බඳුවූ ඒ සමාන මාගේ ශාරිකාව මා බල බලා සිටියදී මා ඇස් සමූයේම දියවවුලෙක්[2] අල්වාගෙන පලාගියේ යයි කීහ.

එසේ කී ගිරවාණන් අතින් සැළලිහිණි තොපගේ අඹුවන් දිය[2] වවුලා කෙසේ මරාපියා හැරගෙන ගියේදැයි. කිව ගිරවාණෝත් සිතට නැඟෙන පරිද්දෙන් බොරු ගොතාගෙන කියන් නාහු වැලි අසනු කැමති බැවින් සොඳුර! අසවයි කියන්නාහු

1. සිනාවක් 2. උකුස්සෙක්

එක් දවසක් අපගේ රජ්ජුරුවෝ උයන් කෙළියට යන්නාහු මාත් කැඳවූසේක. මම මාගේ අඹුවත් කැඳවාගෙන රජ්ජුරුවන් හා කැටිව ගොස් දවල් දිය කෙළ සවස රජ්ජුරුවන් හා කැටිව ම නැවත අවුත් මාලිගාවට නැඟී පියායෙහි දිය වියලෙන පිණිස මාගේ බිරින්ද කැඳවා ගෙන සිවුමැදුරු කවුළුවෙන් නික්මලා පිටත කූටාගාර කුක්ෂියෙහි කොබෝගෙඩි වලල්ලේ හුන්නෙමි. එ වේලෙහිම එක් දියවවුලෙක් කුළුගෙය අසින්[1] යන්නේ මා අල්වා ගන්නට දිවීය. මම මරණ හයින් හයපත්ව වහාම දිව ගත්මි. ඒ මාගේ ඇඹෙණියෝ මුහුකරතලද දරුගැබ එකලට ඇත්තෝය. එසේ හෙයින් බඩ බරව වහා පලා යා නුහුනුව. ඉක්බිති දියවවුලා මා බල බලා සිටියදීම අල්වා ගෙන මරාපියා හැර ගෙන ගියේය. උන්ට ශෝකයෙන් මා අඬන්නා දැක අපගේ සිව් රජ්ජුරුවන් වහන්සේ සබඳ! කුමට හඬාදැයි විචාරා එපවත් අසා සබඳ! නො හඬව. අනික් බිරිඳක් සොයා යවසි කී කල්හි මම කියන්නෙම් ස්ත්‍රීහු නම් බොහෝසේ අනාචාර ශීලීහුය. එසේ හෙයින් එසේ වූ අනාචාර දන්නා දුශ්ශීල එකක ගෙනෙන්නා බලාත් උදෙකලාව විසීම ම යහපතැයි කීමි.

එබසට රජ්ජුරුවන් වහන්සේ කියනසේක් තොපගේ ඇඹනී යන්ට ශත සහශ්‍ර ගුණයෙන් වඩනා ශීලාචාර දන්නා සැළලිහිණියක් චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ යාන බලා හිඳිතිය. ඕ තොමෝ ඉතා යහපත. තෙපි වහ ඔබ පලාගොස් ඇගේ සිත් පරීක්‍ෂාකොට පියා යහපත හිඳිම් ගිවිස්සූ නම් ඇගෙන් අවකාශයක් ලදූනම් තෙපිත් අකැමැත්තා නම් වහා අවුත් කියව. මමවත් මාගේ බිසවු වත් ගොසින් මහ පෙරහරින් ගෙනවුත් පාවා දෙම්හයි කියා තොප සමීපයට එවූය. මම සරණ බණවා ආමි කීහ.

තස්ස කාමාහි සම්පන්නො ආගතො'සම්හව'නාතිකෙ
සවෙ කරෙය ඔකාසං ලද්ධවාසො ච වසෙමසෙති.

මෙසේද කියා ඉදින් තෙපි මා කැමැත්තා නම් වහා කියව. මා රඳන්නට නො පිළිවන. මා කෙරෙහි රැකෙන්නා කැමැත්තා නම් අපි දෙන්නාම සමග ගෘහ වාසයෙන් එක්සිත්ව සුවසේ වසම්හයි සිත ඇත්ත නොවලහා කියවයි කීහ. උන්ගේ බස් අසා සැළලිහිණී ඉතා මහත් සොම්නසට පැමිණ ඕ තොමෝ තමා සතුටු බව නො හඟවා නො කැමති ලෙසක් හඟවන්නියක මෙන් කියන්නී මෙසේ කියයි.

---

1. අහසින්

සුවො ච සුවිං කාමෙය්‍ය සාළිකො පන සාළිකං
වස්ස සාළිකාය ච, සංවාසො හොති කීදිසො'ති.

සබඳ ගිරා පණ්ඩිතයෙනි! කුමක් කියවුද? ගිරවෙක් රක්‍ෂා කෙරේ නම් ගිරාධෙනුවකම රක්‍ෂා කරන්නේය. බොසාලෙක් රක්‍ෂා කෙරේ නම් සැළලිහිණියකම රක්‍ෂා කරන්නේය. ගිරවකු සැළලිහිණියක රක්‍ෂා කිරීම නම් කවර කලෙක ඇසූ විරූ දෙයක්ද? එසේවූ දෙයක් මා ඇසූ විරූත් නැත. දුටු විරූත් නැතැ යි කීව. නැවත කියන්නී අසමාන ජාති ඇති ගිරවාගේ හා සැළලිහිණියගේ වියවාසය කෙබඳු වන්නේද? සමාන ජාති ගිරාධෙනුව දුටුවිටම බොහෝ දවසක් දුක් ගත්තාවූ සැළලිහිණිය ගිරවා හරනේය. එසේ කල්හි සිතූ නැති සැමියා හා වන්නාවූ වියෝ දුකසේ දුකෙක් නැත. එහින් අසමාන ජාති ඇති අඹු සැමි දෙදෙනාගේ සංවාසය නම් බොහෝ දවසක් නොලූ වන්නේය යි කීව. ඒ අසා ගිරවාණෝ සිතන්නාහු දූරි බැහැ බැවිම කියන බව මුත් මා නොකැමති සැටි නොවෙයි. සිතින් ඉතා මා කැමැත්තී යයි නොයෙක් පරිද්දෙන් කාරණා කියා හිවිස්වාගත මැනවැයි සිතා කියන්නාහු.

යං යං කාමී කාමයති, අපි චණ්ඩාලිකාමපි
සබ්බත්ථ[1] සදිසො හොති, නත්ථි කාමෙ අසාදිසො'ති.

යම් ස්ත්‍රියක් යම් පුරුෂයකු කැමැත්තී වීනම් චණ්ඩාල වුවත්[2] උත්තම වුවත් මධ්‍යම වුවත් ඇම දෙනාගේම පඤ්චකාම යෙන් සමයාග. කාම විෂයෙහි අඩු වැඩියෙක් නම් නැතැයි කියා මනුෂ්‍යයන් විෂයෙහි පවා නොයෙක් නොයෙක් ජාති චේත චේත ඇතත් ප්‍රමාණ නම් කාම චේතනාවය යි හඟවන්නාහු මෙසේද කියා පළමුකොට මිනිසුන් කෙරෙහි ජාතියෙන් ප්‍රමාණයක් නැති බව දක්වන පිණිස සකාරණයක් ගෙනහැර දක්වන්නාහු

අත්ථි ජම්බාවතී නාම- මාතා සිබ්බිස්ස රාජිනො
සා භරියා වාසුදෙවස්ස, කණ්හස්ස මහෙසී පියා'ති.

සිවි රජ්ජුරුවන්ගේ මැණියෝ ජම්බාවතී නම් චණ්ඩාල දියණි කෙනෙක. උඹ තුමූ දස බෑ රජ්ජුරුවන්ට වැඩි මහලු කෘෂණ ගොත්‍රයෙහි උපන් වාසුදෙව රජ්ජුරුවන්ට ප්‍රියවූ අගමෙහෙසුන් වූහ ඒ කෙසේද යතහොත්? වාසුදෙව රජ්ජුරුවෝ වනාහි යට ගිය දවස ද්වාරවතී නම් නුවරින් නික්ම උයනට යන්නාහු චණ්ඩාල ග්‍රාමයෙන් තමාගේ යම්කිසි කටයුත්තක් නිසා නුවරට එමින් සිට මඟින් ඉවත්ව සිටි අනඝවූ රූපශ්‍රීන් යුක්තවූ ඒ කුමාරිකාව දැක පිළිබඳවූ අදහස් ඇති රජ්ජුරුවෝ ඇගේ ජාති විචාරා චණ්ඩාල

1 සබ්බෙහි 2 උවත්

කුලේ උපන් නියාව අසා බලවත්වූ ප්‍රේම ඇතිව එබැවින් ලජ්ජාවක් නැතිව සැමියන් ඇති නැති නියාව විචාරා සැමියන් නැත්තිය යනු අසා ඒ චණ්ඩාල දූව හැරගෙන ඇතු පිට හිඳුවා උයනට යන ගමන් තබා එතෙන සිටම නැවතමාලිගාවටම ගෙනගොස් රුවන් රැසක් මත්තේ සිටුවා රන්කෙණ්ඩියෙන් සුවඳ පැන් ඉස වත්කොට සොලොස් දහසක් බිසෝවරුන්ට නායක කොට අගමෙහෙසුන් කළහ.

ඒ බිසවු රජහට දූ කොට සිවි නම් පුතකු වැදූහ. ඒ කුමාර පියරජහු අයාමෙන් ද්වාරවතී නම් නුවර රාජ්‍යය කොළේයයි මේ මෙසේ ගිරා පණ්ඩිතයෝ උදාහරණය ගෙනහැර එබඳු අසමහිනන ක්ෂත්‍රියවූ රජ්ජුරුවෝ පවා චණ්ඩාල ස්ත්‍රිය රක්ෂා කළාහයි අපත් නොපත් තිරිසනුන් හෙයින් කවර වෙනසෙක්ද? අපට ප්‍රමාණ නම් ඔවුනොවුන් කැමති වන පමණෙක්මය යි කීහ. නැවතත් අනික් කාරණයකින් ගිවිස්වන්නාහු.

රථාවතී කිම්පුරිසි – සාපි.වච්ඡං අකාමයි
මනුසෙසා මිගියා සද්ධිං – නත්ථි කාමෙ අසාදිසො'ති.

මෙසේද කියා යටගිය දවස එක් බමුණෙක් පඤ්චකාමයෙහි ආදීනව දැක තමාගේ බොහෝ සැපත් හැරපියා හිමාලය වනයට වැද තවුස් පැවිද්දෙන් මහණව පන්සලක් කොට වසන්නේ, ඒ තාපසයන්ගේ පන්සල සමීපයෙහි එක් ගල් ලෙනෙක බොහෝ කින්නරාවෝ වසන්නාහ. එතෙන මහා මකුළුවෙක් වසන්නේය. ඒ මකුළුවා රැ ලෙන දොරකඩ වසා දැල් බැඳ උදාසන දැල බැඳුනු කින්නරාවන්ගේ ඉස පළා මුල අනුභව කරන්නේය. ඒ කිඳුරෝ නම් ඉතා දුබල ජාතීහ. භීරුකස්වභාව ඇත්තාහ. ඒ මකුළුවාද වැලිත් මහා රථචක්‍රයක් සේ ඉතා මහා විශාල එකෙක. එබැවින් ඔහට කිසිවක් නොකොටහී වච්ඡ නම් එක් තාපසයකු සමීපයට ගොස් මිහිරිවූ කථා කොට ඒ තපස්වින් විසින් ආ කටයුතු විචාළ කල්හි ස්වාමීනි! එක් මකුළුවෙක් අපගේ ජීවිතය හරණය කෙරෙයි. නුඹවහන්සේ විනා අනික් අපට පිහිටවහලෙක් නැත. ඔහු මරා අප හැම ජීවිතය රැක දී අප සුවපත් කළ මැනවැ යි කීහ.

ඒ අසා තපස්වීන් අප වැන්නෝත් ප්‍රාණවධ කෙරෙද්ද යි මෙතෙනින් පහවයි නෙරපීහ. එවිට කිඳුරෝ උපායක් සිතන්නාහු රථාවතී නම් කින්නරා නොමෝ අස්වාමිකාය. ඈ සරහාලා තපස්වීන් ළඟට ගෙනවුත් මෝ නුඹවහන්සේට පාදපරිචාරිකා වෙයි. අපගේ සතුරා මරා වදාළ මැනවැයි කීහ. තාපසයා ඈ කෙරෙහි පිළිබඳවූ සිත් ඇතිව ඈ හා සමඟ වැස ලොකාස්වාදරති

යෙහි යෙදී එක්ව වාසය කොට අලුයම් වේලෙහි කිඳුරන්ගේ ලෙන දොර සැඟවී සිට ගොදුරු සොයා ආ මකුළුවා මුගුරෙන් ගසා ජීවිතක්ෂයට පමුණුවා ඈ හා සමඟ වසන තපස්වියා එහිදී දරුවන් ලදින් බොහෝ දවසක් වැස කාලක්‍රියා කෙළේයයි, ගිරාවාණෝ මේ උදාහරණය ගෙනහැර දක්වා තාපසයෝ මනුෂ්‍ය ව සිට තිරිසන් කින්නරාව සමඟ විසූහ. අපි දෙපක්ෂයම පක්ෂීම්හ. වැලිත් තිරිසන් ජාතියහ. එබැවින් තොපගේ හා අපගේ සරණ මඟුලට ප්‍රමාණ නම් ඔවුනොවුන් කැමති වීමය යි කීහ. එවිට සැළලිහිණි ගිරවාණන්ගේ බස් අසා ස්වාමිනි! සිත නම් හැමදාම එක ලෙස නො තිබෙන්නේය. ප්‍රියවිප්‍රයොග ඉතා නො කැමැත්තෙමි. හෙවත් නුඹවහන්සේගෙන් වියෝවීමක් ඇත. දූන්ම නැවැත්ත මැනව. පසුව! වියෝවීම ඉතා නොකැමැත්තෙමි යි කිව. ගිරා පෝතකයෝ නුවණැති හෙයින් හා ස්ත්‍රී මායමෙහි දක්ෂ හෙයින් හා තවත් ඈ විමසනු පිණිස කියන්නාහු.

හන්‍ද බො හං ගමිස්සාමි සාළිකෙ මඤ්ජුභාණිකෙ
පච්චක්ඛානුපදං හෙතං, අති මඤ්ඤසි නූනමන්ති.

මිහිරි තෙපුල් බණනා සැළලිහිණිය! මා කියන බස් නොගිවිස්නා බැවින් වැලි මාගේ නුවරට යෙමි. තී මට කියන යම් බසෙක් ඇත්නම් ඒ සියලු බස්ම මා හරනට සුදුසු කාරණයෙන් යුක්ත බස්මය. තෝ මාකෙරෙහි පුරුෂයෙක් වේදැයි යන සිතක්ම නැත්තෙහිය. මා හෙලාම දකි. මාගේ අරුම මදකුත් නොදන්නී. වැලිත් මමරාජ වල්ලභයෙමි . එසේහෙයින් මට අඹුවෝ අරුම නොවෙති. තී මා නොකැමති බැවින් අතික් බිරින්දක් සොයා ගන්මි යි කීහ. ඒ සැළලිහිණි ගිරා පණ්ඩිතයන් කී බස අසමින් ම ලය පැළී යන තරම් ශොකයෙන් පීඩිතවන්නී ඔහු දුටුවිටම උපන් ස්නෙහයෙන් හා කාමචෙතනාවෙන් ඤීඩගයෙහි දූහවැදගත්තාසේ වියෝගින්නෙන් පැලහෙසී. ඔහිත් තමා ස්ත්‍රී මායමෙන් නො කැමැත්තියක මෙන් හඟවා තොයාදී රඳන්ට උපමා නිශ්‍රිත කොට කියන්නී

න සිරී තරමානස්ස, මාඪර සුවපණ්ඩිත,
ඉධෙව තාව අච්ඡස්සු, යාව රාජානං දක්ඛසි.
සොස්සසි සද්දං මුතිඞ්ගානං, ආනුභාවඤ්ච රාජිනොති.

මාඪර ගොත්‍රයෙහි උපන් ගිරා පණ්ඩිතයන් වහන්ස! යම්සේ සිත ඇත්තක් කැමති පරිද්දෙන් සාදාගන්නා එකක්හු ඉක්මන් නොවිය යුතුය. ඉක්මන් නැනැත්තවුට ශ්‍රී කානතා තමාම දුරු වන්නීය. එබැවින් අද මෙහිම රඳව. සරවාසය නමුත් බිරින්දක් රක්ෂා කොම ගැන්ම නමුත් ඉතා ඉක්මන්ව බැරිය. ඉක්මන්ව කළ දෙය නොවහාබනේය. එබැවින් අද මෙහි රැ රඳව. ඉදින් රැඳුනු

නම් අපගේ රජ්ජුරුවන්ගේ මහත්වූ රාජ ඓශ්වර්යයද, උතුම්වූ රූපශ්‍රීන් යුක්තවූ සර්වාභරණයෙන් සැරසුනු නාටිකාඞ්ගනාවන් හා කින්නරාඞ්ගනාවන් හා වැනිවූ ලීලා ඇති උතුම් රූ දරන්නාවූ ගැනුන් විසින් කියන්නාවූ ගීතිකා අසව. නැවත ඔවුන් විසින්ම වයනලද තාල නොවරදවා ගසනලද මෘදඞ්ග නාදයන් අසව. ඉක්මන් නොවී සැබැවින් අද රුඳුනු නම් වැඩෙක් මුත් අවැඩක් නැත්තේය. තොපගේ ගම කිරින්දක් නැත. ඇති කිරින්ද උකුස්සා ගෙන ගියේය යි කිව. සබඳ! තොප ඉක්මන්වන්නේ ඇයිද? අවශ්‍යයෙන් අද මෙහි රුඳුනු නම් තොපගේ සියලු අභිමතාර්ථය සිද්ධවන්නේය යි කියා, බැහැවුම්[1] වශයෙන් රඳන්නා කැමතිව කිව.

ගිරවාණෝ වැලි තොප මෙසේ කියත පසු රඳා යෙමි කියා රුඳුනාහු අල්ලාප සල්ලාපයෙන් රඳා ඇ සිත් ගෙන එදවස් සවස් වේලෙහි ලොකාස්වාද රතියෙන් සන්තුෂ්ටව ඔවුනොවුන් කෙරෙහි සමග වීමෙන් ප්‍රාණ සමාන වූහ. ඉක්බිති ගිරාපණ්ඩිතයෝ මෙ විට මෝ තමා සිත ඇති රහසක් මට නොවලහා කියයි. ප්‍රපඤ්ච නොකොට විචාරාගෙන මෙතෙතින් වහා නැගී යෙමි සිතා සැළලිහිණි යයි බැණවූහ. කිමෙක්ද ස්වාමීනි! කිව. යමක් විචාරන්නා කැමැත්තෙමි. කියයිදැයි කීහ. සැළලිහිණි ඉදින් මඞ්ගලයෙන් යුක්ත කථාවක් වීනම් වදාළ මැනව. අවමඞ්ගලයෙක් වීනම් නොකිව මැනවැයි කිව. ගිරවාණෝත් මා කියන්ට සිතන්නේ එක් මඞ්ගලයෙන් යුක්ත කථාවකැ"යි කීහ. සැළලිහිණි එසේ වීනම් වදාළ මැනැවයි කිව. ඉක්බිති ගිරාපණ්ඩිතයෝ ඉදින් තෝ කන් දී අසනු කැමැත්තෙහි වී නම් කියමියි කියා රහස් මන්ත්‍රණය මෙසේ විචාරන්නාහ.

යො නු ඛොයං තිරොසඤෙ, නිවෙවා ජනපදෙ සුතො
ඕතා පඤ්චාලරාජස්ස, ඔසධී විය වණ්ණිතා
තං දස්සති විදෙහානං සො විවාහො භවිස්සති? ති.

කිමෙක්ද? බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ඔසධී තාරකාවක් සමාන වර්ණ ඇති රුවින් පැහැපත් දුවණියන් වෛදෙහ රජ්ජුරුවන්ට සරණ දෙති යනු දඹදිව ඒ ඒ ජනපදයෙහි සිවි රට ප්‍රසිද්ධ විය. ඒ සබා දෙයක්ද? නොහොත් බොරු දෙයක්ද? ඒ සරණ මගුල් වේද? නොවේදැයි කීහ මෙසේද කියා නැවත කියන්නාහු එම්බා සොඳුර! මම ඒ අසා මෙසේ සිතමි. වෛදේහ රජ්ජුරුවෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට ජාති වෛරීහුව, නැවත වැඩිමාලු වූව. එසේ වූ නැනැත්තන්ට තමන්ගේ රූපශ්‍රීන් විරාජමානවූ දුවණියන් තමන්ට වසඟව හිඳිනා එක් සියයක් රජ දරුවන්ට නොදී සතුරු වූ වේදේහ රජ්ජුරුවන්ටම කුමක් නිසා සරණ දෙද්දැයි කීහ.

1 බැගැවුම. බැහැවුත්

සැළලිහිණි ගිරාපණ්ඩිතයන්ගේ බස් අසා ස්වාමීනි! අපගේ මිතියා මඟුල් දිනයක අවමඟුල් කථා කුමට කියනසේක්දැ යි කිව. ගිරවාණෝ කියන්නාහු මම මඟුල් කියමි. තොපි අවමඟුල් කියව. අප දෙන්නාගේ බස් විපරීත වන. ඒ කුමක් නිසාදැ යි කීහ. ස්වාමීනි! මෙසේ වූ මඞ්ගල දිනයෙහි කිවමනා දෙයෙක් නොවෙයි නොකියමි කිව. ඒ අසා ගිරා පණ්ඩිතයෝ එසේ වීනම් ඒවූ නියාව කියා බලවයි කීහ. සැළලිහිණි ස්වාමීනි! එසේ කියන්ට නො පිළිවනැයි කිව. ගිරවාණෝ සොඳුර! තොප දත් අදහස මට නොකියන කල මෙතැන් පටන් එසේ අපගේ එක්ව විසීමෙක් නැතිනියාවේදැයි කීහ. සැළලිහිණි එබසට ශොකයෙන් ඉපිලගිය සිත් ඇතිව නො කියෙම් වීනම් මා හැරපියා පලා ගියෝ නම් නපුරැයි සිතා එසේ වීනම් කියමීයි කියා රහස් මන්ත්‍රණය කියන්නී

තෙදිසො තෙ අමිත්තානං. විවාහො හොතු මාඪර!
යථා පඤ්චාලරාජස්ස, වෙදෙහෙන භවිස්සතී ති.

ගිරා පණ්ඩිතයන් වහන්ස! බ්‍රහමදත්ත රජ්ජුරුවන් හා වෛදෙහ රජ්ජුරුවන් හා දෙන්නාගේ විවාහමඞ්ගලයසේ වූ මඟුලෙක් තොපගේ සතුරන්ටත් නොවේවයි කිව. ගිරවාණන් ඊට කාරණා කිම්දැයි කීකල්හි එහි දෝෂය කියමි. ඇසුව මැනවැයි කියන්නී මෙසේද කියා.

ආනයිත්වාන වෙදෙහං, පඤ්චාලානං රථෙසභො
තතො නං ඝාතයිස්සති-නාස්ස සඛී භවිස්සතී' ති.

ඇසුව මැනව ගිරා පොතකයන් වහන්ස! බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ දුවණියන් සරණ දෙම්හයි කියා වේදෙහ රජ්ජුරුවන් හා ඔවුන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන මහා මන්ත්‍රිවූ මහෞෂධ පණ්ඩිතයෝයයි කියන නොනෙක් ඇත්ල-මේ මායමින් උන් දෙන්නා මෙනුවරට ගෙන්වා මරා ජයපානය බොම්හ යි මන්ත්‍රණය කළහ. ඉදින් අවු නම් උන්ට මර බාධා නැත. මිත්‍ර ධර්මයට කියන කරන දෙයෙක් නොවෙ යි. මේ මඞ්ගලය නිසා වන්නාවූ අභිවෘද්ධියෙක් නැත. එකාන්තයෙන් මරන්නට යයි කිව. නැවත කියන්නී සරණ දෙන්නා තබා දුව ඇසිනුත් දක්ක නොදෙන්නාහ. දෙන්නම මරා ජයපානය බොම්හයි කෙවට්ටයා හා රජු හා දෙන්නා මතු මහලේ නතිව මේ අප හුන් ශ්‍රී යහන් ගබඩාවේ හිඳ රහස් කථා කොට කෙවට්ටයා රජු ගිවිස්වා ගියේයයි ඒ දෙන්නාගේ රහස් කථාව මඳකුත් නොවරදවා ගිරාපණ්ඩිතයන්ට කිව.

ගිරාපණ්ඩිතයෝ රහස් මන්ත්‍රණය අසා නිමවා ගෙන ඉක්බිති ඈ හා ඉතා ආශ්චර්‍ය්‍ය ය. කෙවට්ටයාගේ නුවණත් ඉතා යහපත් නියාය. මේ උපායෙන් ඒ රජහු මේ නුවරට ගෙන්වා මරන්නට බැරි නොවෙයි. සිතූ නියා ඉතා යහපත. උපායවත් කෙවට්ට

දාව සායිමාරු කොට වඛ වඛා ඔහුගේ නුවණ වර්ණනා කොට අපගේ මේ නියා මඟුලේ අවමඟුල් කීමෙන් අපට ප්‍රයෝජන කිම්ද? ඒ නොකියයි තවතා තමන් ආ කම් සැපවුණු බව් දැන ඒ රාත්‍රියෙහි ඇ හා සමග දූකසේ දවස් යවා වැස පහන්වූ කල්හි සොඳුර! මම යෙමි. සිවිරටට ගොසින් මා සිත්වන් කිරින්දක් ලදි මීයි මාගේ රජ්ජුරුවන්ට කියන්නට යෙමි. මට සමු දෙවයි කියන්නාහු,

හන්ද බො මං අනුජානාහි-රත්තියො සත්ත මත්තියො
යාවා හං සිවිරාජසස ආරොචෙමි මහෙසිනො' ති.

සොඳුර! තොප මා කැමති බැවින් සිවි රජ්ජුරුවන්ටද උන්ගේ බිසවුන්ටද චූලනී රජ්ජුරුවන්ගේ යාන රක්නා සැලලිහිණිය ගෙන එක්ව වසන පරිද්දෙන් අවසර ලබන ලද හෙවත් ඔ මා කෙරෙහි හිඳිනා සැමැත්තීය යි කියම්ද, නැවත අව මැනව. ඈ සමීපයට යම්හයි එම්ද, එදතුරට සතියක් වුව මැනව. සත් දවසකින් රජ්ජුරුවන්වත් බිසවුන්වත් කැඳවා ගෙන අවුත් තුඹ අටවන දවස්හි මහත්වූ පෙරහරින් මඟුල් කොට කැඳවා ගෙන යෙමි. ඒ මා යන සත්දවසකට කනස්සලු නොවව. මා එන තෙක් තෙපි මා කෙරේ ශොකයෙන් නොකා නොබී වැහැර[1] නොගොස් (නො හිඳ) සුවසේ හිඳුවයි කීහ.

සැලලිහිණී ගිරවාණන්ගේ ප්‍රිය විප්‍රයෝගය ඉවසිය නොහී සමණන්ට උත්තර කිය නොහී යාපත. සත් දවසකට අවකාශ දෙමි. සත් දවසින් නොඅවුත් අටවෙනිද ආයේ විනම් ඒ කාන්තා-යෙන් මා මළ තෙනටය තුඹ එන්නේ. සැබවින් මා කැමත හොත් සත් දවස ඇතුළත අව මැනවැයි කිව. ඈ එසේ කිකල්හි ගිරවාණෝ සොඳුර! කුමක් කියවුද? ඉදින් මමත් අටවෙනිද තොප නුදුටිම් නම් මාගේ ජීවිතය නමාම ඇද්ද. දූරි ඇති අඹුවන් නො බෝසාලෙක මිය යාමත් අලුත් අඹුවන් රක්‍ෂා කළ සත් දවසින් මළ කාල හැකි! මගේ ලය ගලෙක්ද? තෙපි මා එන ගමන සැක නො කරව ඊ බසින් කියා සිතින් සිතන්නාහු තෝ මියෙයි වා, රැකෙයි වා මෙවිට තිගෙන් මට ප්‍රයෝජන කිම්දැයි සිතා මැදිරියෙන් නික්ම සිවිරට දසාවට මූණ ලා මඳක් තැන් ගොසින්ලා නැවත මියුලු නුවරට පලා ගොස් බොධිසත්ත්වයන් වහන්සේගේ අංශකූටයට බටසේක.

1 බැහැර

බොධිසත්ත්වයන් වහන්සේ උන් මතුමාලට වඩා ගෙන ගොස් විවාල කල්හි සැලලිහිණිය කී කල ද සියල්ලම ආද්‍යන්ත කොට වූ පරිද්දෙන් කීහ. බෝධිසත්ත්වයන් වහන්සේ ගිරවාණන් මී හා විලඳ කවා මී පැන් පොවා ශතපාක සහස්‍රපාක තෙලින් දෙපියා අතුරු හා කකුල් සඬි මිරිකා මොලොක් ඇතිරිලි ඇති රන් මැදිරියේ සැතැප්පූසේක. ඒ බව බුදුව වැඩහිඳ වදාරන තිලෝ ගුරු බුදුරජාණන් වහන්සේ වදාරනකේ

තතො ච ඛො සො ගන්ත්වාන – මාඨරො සුවපණ්ඩිතො
මහොසධස්ස අක්ඛාසි සාළිකාය වචනං ඉදන්ති.

වදාළ බැවින් එම්බා මහණෙනි! ඒ ගිරවා සැලලිහිණියගෙන් රහස් කථාව ගෙනවුත් මහෞෂධ පණ්ඩිතයන්ට කීයේ වේදැයි වදාළසේක. ඒ ඇසූ අනතුරෙන් තිලෝගුරුවූ චින්තාමාණික්‍යයක් බඳුවූ භද්‍රඝටයක් බඳුවූ කල්පද්‍රැමයක් බඳුවූ අසාධාරණවූ ශ්‍රද්ධා බුද්ධි සම්පන්නවූ ගුණ ගණාංගයෙන් උපලක්ෂිත වූ තිලෝක තිලක වූ මාගේ ස්වාමිදරුවූ මහාබොධිසත්ත්වයන් වහන්සේ සිතනසේක් මේ රජ්ජුරුවෝ මා නොකැමති කරවා උත්තර පඤ්චාල නුවරට ගොසින් මහාවිනාශයට පැමිණෙන්නාහ. මා විසින් මෙබඳු යසදායකවූ සම්පත් දුන් රජ්ජුරුවන් කතස්සලුව නොසලකා කී බස් පමණක් සිත තබා උන්ට පිටිවහල් නුවූය යි දත් කෙනකුන් විසින් මට නින්ද උපදනේ ය. තවද මා සේ වූ නුවණැති ජගත් පණ්ඩිතයකු ජීවත්ව හින්දදී මේ රජ්ජුරුවෝ කුමක් පිණිස නසිද්ද? මම රජහට පළමු ගොස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් දැක වේදේහ රජ්ජුරුවන්ට යහපත් නුවරකුත් කරවාලා ගවුවක් පමණ සුළු උමඟක් හා දෙගවුවක් පමණ මහ උමඟක් කරවාලා චූලනී රජ්ජුරුවන්ගේ දුවණියන් අපගේ රජ්ජුරුවන්ට අභිෂේක කරවා පාවාදී එක් සියයක් රජදරුවන් හා අටළොස් අක්ෂෞහිණියක් පමණ මහා සේනාව අප හුන් නුවර වටලා ගෙන සිටියදී අපගේ රජ්ජුරුවන් හා සේනාව රාහුමුඛයෙන් සඳමඬල ගලවා ගන්නාසේ ගලවා ගෙන එන ගමන මටම භාර වන්නේයයි සිතන ස්වාමිදරුවාණන්ට ශරීරයෙහි පස් වනක් ප්‍රීති උපන්නේය. ඒ ප්‍රීති වේගයෙන් උදන් අනනසේක්.

“යස්සෙව ඝරෙභුඤ්ජෙය්‍ය, භොගංතස්සෙව
අත්ථංපුරිසො චරෙය්‍යා”ති

යම් පුරුෂයෙක් යම් රජක්හුගෙන් සියලු සම්පත් ලදින් කිසිවකිනුත් අනූනව මහා ආඪ්‍යව වෙසේද, එසේවූ ප්‍රඥ සම්පන්න පුරුෂයාවිසින් කයින්ද, වචසින්ද, මනසින්ද යන ද්වාරත්‍රයෙන්ම ඒ රජහට වැඩෙගිම හැසිරිය යුතුය. ඔවුන්ගේ ආපදාවක් දුටුකල්හි ඉන් මුදාලන්ට ශක්තිව ඊට පිටිවහලක් නොවී නම් ඒ මිත්‍රද්‍රෝහි යාය. එබැවින් ඒ රජහු නුවණ නැතිව කී බස් පමණකින් නොදැන

කියාලූ යම් නම් දෙයක් සිත තබා ගැන්ම මට නරම් නොවෙයි සිතා සොලොස් කළයක් සුවඳ පැනින් ඉස් සෝදා නහා සර්වාලංකාර යෙන් සැරහී මහපෙරහරින් රජගෙට ගොස් රජහු වැඳ එකත් පස්ව සිට වදාරනසේක් කිමෙක්ද මහරජ! උත්තර පඤ්චාල දෙශ යට යනසේක්මිදැයි විචාළසේක. එසේය පුතණ්ඩ! යෙමි. පඤ්චාල චණ්ඩි කුමාරිකාව නොලබන්නාවූ මට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්ද? තොපිත් මා අත් නොහැර මා හා කැටිව එව. අප ඔබ යාමෙන් වැඩ දෙකෙක් වන්නේය. ස්ත්‍රීරත්නයක් ලැබෙමි. රජ්ජු රුවන් හා නෑ වීමෙන් ඔවුනොවුන් කෙරෙහි මිත්‍ර සන්ථවයක් පිහිට වන්නේයයි[1] කීහ. ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ වදාරන සේක්

හන්දහං ගච්ඡාමි පුරෙ ජනින්ද, පඤ්චාලරාජස්ස පුරං සුරම්මං
නිවෙසනානි මාපෙතුං, වෙදෙහස්ස යසස්සිනො.
නිවෙසනානි මාපෙත්වා වේදෙහස්ස යසස්සිනො
යදා තෙ පහිණෙය්‍යාමි, තදා එය්‍යාසි ඛත්තිය’ති.

මෙසේ කියා මහරජ! එසේවී නම් මම පළමු ගොස් නුඹ වහන්සේට හිඳිනා මාලිගා ආදිවූ ගෙවල් නංවාලා යම් දවසක මා කැඩපත් එවු කල[2] වැඩිය මැනවැයි වදාළසේක. ඒ අසා රජ්ජු රුවෝ එකාන්තයෙන් දරුවන් මා අත් නොහරන සැටියයි ඉතා සතුටුවූ සිත් ඇතිව පුත! තොප පළමු යන්තවුන්ට කුමක් ලදමනා දැයි කීහ. පණ්ඩිතයන් වහන්සේ වදාරනසේක්, දෙවයන්වහන්ස! මහ බල සෙනඟ ලද මැනවැයි කීහ. යම් පමණක් කැමැත්තා නම් එ පමණක්ම ගෙන යවයි කීහ. පණ්ඩිතයන් වහන්සේ වදාරන සේක් නර[3] සිරගෙයි දොර හරවා අත පය මැසූ දම් බිඳුවා මා හා කැටිව එවුව මැනවැයි වදාළසේක.

රජ්ජුරුවෝ කියන්නාහු මට කියන්නේ කිම්ද? තොප කැමැත්තක් කරවයි කීහ. ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ සිරගෙවල දොර හරවාපියා ගිය ගිය තෙන ගිය කටයුතු සිඩකොට ගෙන එන්ට සමර්ථවූ බුහුටි ශක්ති සම්පන්න යොධයන් මැත් කරවා මට සේවය කරවයි කියා ඔවුන්ට ප්‍රසාද දෙවා ඇත් සෙනඟද, අස් සෙනඟද, රථ සෙනඟද, පාබල සෙනඟද, වඩුවන්, කඹුරන්, සොම්මරුන්, සිත්තරුන් ආදිවූ අටළොස් වර්ගයක සෙනඟ ගෙන සිය දහස් ගණන් උදලු කුන්තානි, කැති, පනකෙටි, යහුල් ආදිවූ බොහෝ උපකරණ ගෙන්වා මහ සෙනඟ පිරිවරා අසුර පුරයට නික්මුණු ශක්‍ර දෙවෙන්ද්‍රයා පරිද්දෙන් නුවරින් නික්මුණුසේක.

1 පිහිටවන්නේය 2 එවුම්කල 3 නතර

"තමත්ථං පකාසෙන්තො සත්ථා ආහ"යි වදාල බැවින් ඒ මාගේ බොධිසත්වයන් වහන්සේ නික්මුණු නියාව ප්‍රකාශකරන තිලෝගුරු බුදුරජාණන්වහන්සේ වදාරනසේක්,

තතො ච පායාසි පුරෙ මහොසධො
පඤ්චාලරාජස්ස පුරං සුරම්මං.
නිවෙසනානි මාපෙතුං වෙදෙහස්ස යසස්සිනොති.

එම්බා මහණෙනි! ඒ මහෞෂධ පණ්ඩිතයෝ වෛදෙහ රජ හට පළමු ගොස් රජුට නුවර හා ගෙවල් කරවනු පිණිස බලවාහන ගෙන නික්මුණෝ වේදැයි වදාළසේක. බොධිසත්වයන් වහන්සේද, වඩනාසේක් උත්තරපඤ්චාල නුවරට අතුරෙහි සතර ගවුවෙන් සතර ගවුවට එකෙකි ගමක් බැගින් කරවා එකෙකි ඇමැත්තකු බැගින් සිටුවා මෙසේ විධාන කරනසේක්. තෙපි අපගේ රජ්ජුරුවන් පඤ්චාලචණ්ඩී කුමාරිකාව හැරගෙන එන කල් ඇත්, අස්, ආදී වාහන සරහා සිටුවාගෙන දුම්ලයන් රඳවා තොප තොපගේ වාහනයට නංවාගෙන සතුරන්ට හසුවිය[1] නොදී වහා මියුලු නුවරට පලා යවයි[2] විධාන කොට සිටුවූසේක.

මෙසේ ඒ ස්වාමිදරුවාණෝ මාගී විධානයෙන් බාරාණසී ගං තෙරට පැමිණ ආනන්ද කුමාරයෝයයි යන අමාත්‍ය කෙනකුන් කැඳවා ආනන්ද කුමාරයෙනි! තෙපි තුන් සියයක් පමණ වඩුවන් හැරගෙන උඩුගඟට පලාගොස් හර ඇති දඬු කප්පා ගෙන්වාගෙන ඔරු අගුළු පඩවු තුන් සියයක් නැව් ඉදි කරවා, මාළිගා වාසල් දෙර අටවාල, ගෙවල්, ඇත්හල්, අස්හල් ආදිය කරවා ගන්නා ලෙස වලදීම ලසුණනොට[3] සස්වා, සහල සහ: ලි යම්, දුවපත්‍ර සිනි, පිටි පෝරු, දෙරලී, දෙරබා, ආදිවූ නොයෙක් දරු සමහාරයෙන් නැව් තුන්සියය පුරවා ගෙන එවයි විධාන කොට යවා වදාළසේක.

තමන්වහන්සේ පඬවුවෙන් එතරව ගොස් ගොඩ නැඟිතැන් පටන් පියවර සතින් ගණනසේක් මේ දෙගවුවක් පමණ තෙන මහ උමඟ වන්නේය. ඉක්බිති මෙතෙන අපටත් රජ්ජුරුවන්ටත් හිඳිනා නුවරෙක් වන්නේය. නැවත මෙතෙන පටන් රජගෙය දක්වා මේ අතර ගවුවක් පමණ තැන් සුළු උමඟ වන්නේය යි තමන් වහන්සේගේ ප්‍රඥාවෙන් මැන නියම දැන මහ පෙරහරින් නුවරට වන්සේක.

---

1 අසුවිය නොදී   2 නුවර ලාලවයි   3 ලප්පුකොට

බොධිසත්ත්වයන් වහන්සේ එන නියාව චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ අසා මහෞෂධපණ්ඩිතයා ආකල වෛදෙහයා නොඑබෝ දවස කින්ම එන්නේය. ඒකාන්තයෙන්ම මාගේ සතුරන් පිටි දක්මි. මෙවිට මාගේ මන දෙළ පිරෙන්නේය. එවිට දෙන්නා මරා ජයපානය බී සියලු දඹදිව එක්සත් කොට අගරජ කෙරෙමියි ඔද වැඩී සතුටුව ගියාහ.

ජනනෙත්‍ර රසායනවූ ස්වාමිදරුවූ බොධිසත්ත්වයන් වහන්සේ නුවරට වදුත්ම අයම් විතරින් අට සාළිස් ගවුවක් පමණ ඇති ඒ සා මහත් නුවර වාසී මනුෂ්‍යයෝ එකහෙලාම මහෞෂධ පණ්ඩිතයෝ නම් මූද? එක් සියයක් රජදරුවන් හා අටළොස් අක්ෂෞහිණී සඞ්ඛ්‍යාත මහා සේනාව කැටක් දමා කපුටු සමූහයක් නෙරියාසේ හන් කඩටත් අස්වාමික කරවා හිස් ලූ ලූ අත උනුන් නොදන දිවත පරිද්දෙන් නෙරපූවෝ මේ මහතාණෝදැයි කියමින් බලා ඇස් ඇද ගත නොහී මහා ආශ්චර්‍ය්‍යයට පැමිණ වෙරම්හ නෙලෙන් ඇලළුණු සාගරය පරිද්දෙන් හැලළී ගියෝය.

සියලු නුවර එදවස් සඳරැස් වන් කිරිමුහුදසේ ක්ෂොභව ගියේය. මෙසේ නුවරවාසීන් තමන්වහන්සේගේ රූපශ්‍රී දශීනයෙන් සන්තොෂව බල බලා සිටියදී රජගෙයි වාසලට ගොස් රථයෙන් බැස රජ්ජුරුවන්ට තමන්වහන්සේ ආ නියාව කියා යවා රජ්ජුරුවන් විසින් එන්නට කියවයි කී කල්හි රජගෙට වැද රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටිසේක.

ඉක්බිති රජ්ජුරුවෝ සුව දුක් දෙඩා පුත මහෞෂධ පණ්ඩිතයෙනි! තොපගේ රජ්ජුරුවෝ කවරදා එද්දැයි කිහ. මා කැඩපත යැවූ කලය දෙවයන් වහන්ස යැයි කිහ. තොපි පළමුකොට එන්නාහු කුමක් නිසා අවුදැයි විචාළහ. දෙවයන් වහන්ස! අපගේ රජ්ජුරුවන්ට මඟුලට මාලිගා නංවන්ට ආමියි වදළසේක. රජ්ජුරුවෝ යහපත පුතැයි කියා ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ හා කැටිව ආ සේනාවට බත් වියදම් දෙවා බොධිසත්ත්වයන් වහන්සේට මහා සත්කාර කොට හිඳිනට යහපත් මාලිගාවක් දී පුත! රජ්ජුරුවන් එනතෙක් උකටලියක් නොව අපටත් කළමනා දෙයක් කරවාලා සුවසේ හිඳුවයි කිහ.

බොධිසත්ත්වයන්වහන්සේ රජගෙට නැගෙනගමනින් මතුමාලට නැගෙන හිණි පාමුල සිට මෙතැන සුළු උමඟ දොරකඩ විය යුතුයයි සිතූසේක. නැවත ඔබට මෙසේවූ අදහසෙක් වූයේය. මේ රජ්ජුරුවෝ අපටත් කළමනා දෙයක් කරවාලවයි තුමූම කීහ, උමඟ බිඳිනට

වත්කල මේ හිණ වැටීනොහෙන ලෙසක් කළමනායයි සිතා රජ්ජුරුවන්ට වදාරනසේක් මහරජ! මාලිගාවට නැඟෙන්නෙම් හිණිමුල සිට මාලිගාවේ තව කර්මාන්ත බලන්නෙම් තෙසු මා දුටු වරදෙක් නැත. මහාහිණි පාමුල වැරැද්දක් දිටිමි. ඉදින් කැමතිසේක් වීනම් ඊට තරම් දඬුපත් ලදිම් නම් තිකම් වඩුවකු තබා විශ්ව කර්මයාත් නපුරැයි නොකියන ලෙස කරවාලම් වදාළසේක. රජ්ජුරුවෝ යහපත තොප කැමති ලෙස පෝරු අතුරවා ලව'යි දාරු සම්භාර දෙවූහ. පණ්ඩිතයන් වහන්සේ මෙතෙන උමං දොරකඩ වන්නේ යයි සිතා ඉඳුරා සලකාගෙන පරණ හිණ උදුරුවා හරවා යම් තෙනක උමං දොරකඩ වේද එතෙන පස් නොවැගිරෙන පරිද්දෙන් පෝරු අතුරවා හිණ පාතට නොහෙන පරිද්දෙන් නොසැලෙන සැටියේ ගිණ සිටුවාලූසේක.

රජ්ජුරුවෝ මේ අනතුරාය නොදන්නාහු තමන් කෙරෙහි ඉතා සිතින්ම කෙරෙතියි සිතූහ. ඒ පරණ හිණ බෝධිසත්වයන් වහන්සේ දුටු වරද නම්, යටින් උමඟ බිඳිනාකල හිණ නොහෙන පමණෙක්මය. මෙසේ එදවස් තව කර්මාන්තයෙන්ම යවා දෙවන දවස් රජ්ජුරුවන්ට කියන්නාහු දෙවයන් වහන්ස! එක් තිලයක් ලදුමෝ වීනම් අපගේ රජ්ජුරුවන් හිඳිනා පරිද්දෙන් යහපත් කොට මාලිගා ආදී වසන තැන් කරවා ලන්නමෝ වේදැයි වදාළසේක. යහපත පණ්ඩිතයෙනි! මාගේ මාලිගාව හැර අට සාළිස් ගවුවක් දිග පළල ඇති මේ නුවර යම් ගෙයක් කැමැත්තෝ වීනම් ඒ ඒ ගෙය ගන්වයි කීහ. මහරජ! අපි ආගන්තුකයම්හ. තුඹවහන්සේගේ බොහෝ වල්ලභයෝය. ඔහු තමන්ගේ ගෙවල් ගන්නා කල අප හා කලහ කරන්නාහ. උන්ට අප කරන්නේ කිම්දැයි වදාළසේක. පණ්ඩිතයෙනි! තොපි උන්ගේ බස් නොගිවිස තොප කැමති තෙනක් ම ගන්වයි කීහ. දෙවයන් වහන්ස! ඔවුන් එක්වන් අවුත් කියා කන් කෝටු කරන කල තුඹ වහන්සේගේ සිතට සැප යෙක් නම් නැත්තේය. ඉදින් කැමැතිසේක් වීනම් අප ගෙයක් තිලකොට ගන්නා තුරු අපගෙන් දොරකඩ රැකවල් වීනම් ඒ කියන්නට ආවාහු වැද්ද නොහී තැවත පලායන්නාහ. එසේ කල අපටත් තුඹවහන්සේටත් දොම්නසෙක් නැත්තේයයි වදාළසේක.

රජ්ජුරුවෝත් ඒ අසා ඉතා යහපත. තොපගෙන් කැමති ලෙස රැකවල් ලවා ගන්වයි කීහ. බෝධිසත්වයන්වහන්සේද හිණි හිසය, හිණි පාමුලය, රජගෙයි මහා දොරකඩය, යන හැම තැන්ම තමන්වහන්සේගෙන්ම රැකවල් ලැවූසේක. රජගෙට කාත් වැද්ද

නොදෙවයි කියා රැකවල් ලවා ඉක්බිති පලමු කොට ගොස් රජ්ජුරුවන්ගේ මැණියන් තලතාදේවීන්ගේ ගෙය බිඳුවයි තියොග කලසේක. ගියාවූ පුරුෂයෝ වැලිකොන්දෙහි පටන් සිතැති පදනම් ඇතුළුව උළු-සුණු-මැටි-ආදීවූ දෙය බිඳ හරනට පටන් ගත්හ.

රාජමාතාවෝ එපවත් අසා වහ වහා අවුත් කොල! අපගේ ගෙය බිඳුතෝ කවුරුදැයි කීහ. මහෞෂධ පණ්ඩිතයන්ගේ විධාන යෙන් මේ ගෙය බිඳුවා තමන්වහන්සේගේ රජ්ජුරුවන්ට මාලිගා තංවනසේකැයි කීහ. හැයි! මේ ගෙයි හුන්කල නපුරු කිම්දැයි කීහ. අපගේ රජ්ජුරුවන්ගේ බොහෝ සේනා වාහන බලඇණි ඇති හෙයින් මේ ගෙය ඉතා කුඩා වන. මහත්කොට මාලිගාවක් කරවන්නටයයි කීහ. එබසට කිසවූ කිපී කොල! තෙපි මා රජ්ජුරු වන්ගේ මැණියන් බව නොදනුද? දූන් දූන් මපුතණුවන්ට කියාලා තොපට කියවි දන්නෙම් වේදැයි කීහ. නුඹ කුමක් දෙඩන් නෙහිද? අපි අපගේ පණ්ඩිත සවාමීන්ගේ බසින් බිඳුම්හ. ශක්ති ඇතිදැවීනම් නවතා ගන්නැයි කීහ.

තොපට කියවියක් දනිම්සි කියමින් කිපීගෙන රජගෙට ගොස් රජහට කියන්නට ගියාහ. දොරකඩ සිටි රැකවල්ලු නොවදුවා'යි කියා නැවතූහ. දරුවෙනි! මම රජ්ජුරුවන්ගේ මැණියෙමි. මට පෙර රැකවලෙක් නැත. මා යාදෙවයි කීහ. අපි තී නොහඳුනම්හ රජ්ජුරුවන් විසින් කිසි කෙනකුන් වැද්ද නොදෙවයි තියෝග අසන ලදුම්හ. තෝ මෙතෙන නොසිට පලායායි කීහ. කිසවූ කිසි වකුත් කියන්නට අසමර්ථව තමන්ගේ ගෙය බිඳිනු බල බලා සිටි යාහ. ඉක්බිති තෝ මෙතෙන සිට කුමක් කෙරෙසිද? යෙසිද? නොයෙසිදැ?යි එකෙක් නැඟී සිට තලතා දේවීන්ගේ බොටුව අල්වා ගෙන තරවා දමාපීය.

ඒ මැහැලින් වහන්සේ මුණින් වැටීපියා දූකයේ නැඟී සිට සිතන්දෑ එකාන්තයෙන් මහරජ්ජුරුවන් කියේම සැබෑසැවිය. ඉන් මිසක් මට මෙසේ කරන්නට සමර්ථ එකෙක් ඇද්ද? පණ්ඩිත යන් සමීපයට යෙමි සිතා ගොස් පුත! මහෞෂධ පණ්ඩිතයෙනි! මාගේ ගෙය කුමක් නිසා බිඳුවාදැයි කීහ. ඔබ උන් හා කැටිව එක බසකුත් නොකියා නැසූ කන්ව ඒ දසාවත් නොබලා සිටිසේක. ළඟ සිටි පුරුෂයෝ දේවීන්දෑ කියන්නේ කිම්දැයි කීහ. දරුවෙනි! පණ්ඩිතයෝ මාගේ ගෙය කුමකට බිඳුදැයි කීහ. වේදේහ

රජ්ජුරුවන්ට මාලිගා කරවන්වයයි කීහ. හැයි දරුවෙනි! මේසා නුවර අතික් හිඳිනා මතනක් නොලැබේදැයි සිතවුද? මාගෙන් මසුරන් ලක්‍ෂයක් හැරගෙන අතික් තෙනකින් ගෙයක් ගෙන මාලිගා කරවයි කීහ. ඒ වන්නා නුඹගෙන් මේ ලක්‍ෂය හැරගෙන ගෙය හැරපියම්හ. මෙනුවර අපොහොසත් කෙනකුන් මඳගෙ යින් අතික් ගෙයක් අල්වා ගත්කල උයිත් අත්ලස් දෙන්ටම සිතති. එසේ වන්නා ගත් ගත් ගෙවල් අත්ලසටම හරනා කල, අප ගෙවල් ලබන්නෙත්, මාලිගා නංවන්නෙත් කෙසේද? අත්ලස් දී ගෙය හරවා ගත් තියාව ඔබට නොකියනොත් හැරපියම්හයි කීහ. දරුවෙනි! කුමක් කියවුද? රජ්ජුරුවන්ගේ මැණියෝ පවා අත්ලස් දී ගෙය හරවා ගත්හයි කිකල මටත් ලජ්ජා වන්නේය. එබැවින් මා පණ තබා කාටත් නොකියමියි කීහ. ඔහු යහපතැයි බිසො වුන්ගෙන් මසුරන් ලක්‍ෂයක් හැරගෙන ගෙය බිසොවුන්ටම හැරපූහ.

වැලිත්, ඒ මසුරන් ලක්‍ෂය නම් දූන් මේ සමයේ රන් සුණු තඹ ආදි පස් ලෝයෙන් ගැසූ රනෙක් නොවෙයි. ඊට[1] නම නීලකෂීං පණයයි. ඉන් සතර අකෙක් මාඃරත්රන. සතර අකෙක් පස් ලෝය. එබැවින් ඒ බිසවුන් දුන් මසුරන් ලක්‍ෂයෙන් පනස් දාසෙක් මාඃරත්රනැයි දත යුතුයි.

එ තැනින් ගොස් කෙවට්ට බමුණාගේ ගෙය බාගෙන පළමු පරිද්දෙන් දෙරටුවේ පටන් බිඳිනට වන්හ. ඒ බමුණු පැන නැඟී ගොවියා පිත් තමාගේ නුවරදී එක් සියයක් රජදරුවන් හා මේසා සේනාවක් බල බලා සිටියදී තමාට සතුරුව ගිය මෙනෙක් දෙනා ගෙන් මූ මාම බොටුව අල්වා ගෙන බිම උලා තලල හා මූණ ආදිවූ තැන් ලේ මුඩුකොට පියා කබරව දූන් දැගියා සේ මේසා ලජ්ජාවට පමුණුවාපිය. නැවත විවාහමඟුල් කියා මෙවර ගියාවූ මා තමාගේ ගෙහිදී නනි කොට ගෙන තමාගේ බල සම්පන්න පුරුෂයන් ලවා උණ පත්තෙන් මරවා පිටිකර ගස්වා එසේත් මා නොම්නිසාවත් කොට පීය.

ඒ මදින් දෝ දූන් මෙතෙනට අවුත් මේසා නුවරක් තිබියදී මාගේ ගෙය බිඳුවයි. මා හුන් තෙනින් තෙරනට මාගම්[2] කෙරෙයි. වන්නාට, උගේ රජු නාවත් දෙන්නාටම කළමනා කටැටියක්[3] මූට ම කරවමියි තරව කිපී රජහට කියන්නට නමාගන[4]. ගොස් රජ

---

1 ඊ රනට
2 මාත
3 කිසටියක්
4 නමාගෙන

ගෙසි දොරට ගියේය. රැකවල සිටිය වුන් බමුණු මාල්ල! තෝ මැත නොඑව. යවයි කියව කියවා තමාගේ වල්ලහ සාමට දොරකඩට ගියේය. රැකවල්ලු කොල!නිකෘෂ්ටවූ ගුණ නැති[1] දුෂ්ටවූ බමුණ!මැත නොඑවයි කියව කියවා තව එයිදැයි එකෙක් තැගී සිට ගසන්නේ ගැසූ පසැහිල්ල පෙනෙන පරිද්දෙන් බමුණු මාල්ලා පිටිකර තරව පැහැර බොටුව අල්වා දමාලිය. ඒ පහර සා හීප පිම්මක් පැනපියා පෙරලී බැලුවවුනට අතිකෙක් උණ පත්තෙකින් දෙපැත්ත හසු කොට පිට පොත්ත පත්තේ ඇලී යන පරිද්දෙන් රස් සිඳ ගඩු නංවාපිය. ඒ පාර එතෙතින් කාගෙන අතික් කිසිවකුත් කියන්නට අසමර්ථව ගහ. යුක්තක් නොදන්නේ මසුරන් ලක්ෂයක් දී ගෙය අරවා ගන. මේ උපායෙන් එදා වක සියලු නුවර ගෙවල් බිඳුව, නැවත හරනට ගත් අත්ලස්[2] රන් එක්කොට නව කොටියක් අත් වන්නේය. ඒ නව කොටියෙන් සතර කෝටි පනස් ලක්ෂයක් මාළු රන් රනැයි දත යුතුයි. නැවත බොධිසත්වයන් වහන්සේ නුවර මුළුල්ලේ ඇවිද රජගෙට වැඩියේක. රජ්ජුරුවෝ පණ්ඩිතයෙනි! වසන තෙනැක් ලදුදැයි විචාලහ. දෙවයිනි! ඉල්ලූ කල හිඳිනා තෙ නක් නම් නොදෙන කෙනෙක් නැත. බල එකෙක් ඇත. තමන් බොහෝ දවසක් වැද හුන් ගෙවල් ගන්නා කල මහා දෞර්මනසින් කම්පිත වන්නාහ. උන්ට ප්‍රිය විප්‍රයෝග කිරීම මට තරම් නොවෙයි. මේ නුවරින් පිටත මෙතෙනට ගවුවක් පමණ තෙන ගඟටත් නුව රටත් මැද අඟවල් තෙන බිම අවකාශයෙක් ඇත. එතෙන අපගේ රජ්ජුරුවන්ට ගෙවල් මාලිගා නංවවිහයි වදාළසේක. ඒ අසා රජ්ජු රුවෝ සිතන්නාහු තමා ඇතුළු නුවර දී සටන් කරනකල සතුරන් මිතුරන් දත නොහැක්ක. පිටතදී විනම් වට්ලාගෙන සුවසේ සතු රන් මරා ජය ගත හැක්කැයි සිතා සොම්නස්ව යහපත පුත! තොප සැලකූ තෙනම නුවර කරවයි කීහ.

මහරජ! අපි වන්නා නුවර[3] කරවම්හ. නුඹවහන්සේගෙන් ඒ දසාවට දර පලාවට බටු ආදී යම් කිසිවක් පිණිස අපගේ නව කර්මාන්ත භූමියට නොයා යුතුය. ගිය කෙනෙක් යමසේ කලහයක් කොරෙත්මය. එවේලෙහි නුඹ වහන්සේගේ සිතටත් සුවයෙක්[4] නම් නැත. ඒ නිසායයි වදාළසේක. යහපත පණ්ඩිතයෙනි! නුවරින්[5] ඒ දිශාවට නොයනලෙසක් කරවම්යි කීහ. දෙවයන් වහන්ස! අප ගේ ඇත්තු එක්වන් දිය කෙළ රුස් වන්නාහ. එක්වන් දියෙහිම

---

1 ඇති 2 අල්ලස් 3 ඒ සියල්ල

4 සැපයෙක් 5 මැතින්

කොළතාහ. මහෞෂධ පණ්ඩිතයන් ආවක් පටන් පහන් පැනක් බී පියන්ටත් නොලබම්හයි නුවර වාසී කිපෙත් නම් එයින් ඉවසා වදාළ මැනවයි වදාළසේක. පුත! තොපගේ ඇත්තු සුවසේ ගිම් නිවා දිය කෙළිත්වයි කියා නැවත එම රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන්ගේ නව කර්මාන්ත භූමියට මේ නුවරින් යම් කිසිවෙක් ගියේ වී නම් දහසක් දඬයයි නුවර බෙර ලැවූහ.

ඉක්බිති බොධිසත්වයන් වහන්සේ රජ්ජුරුවන් වැද තමන් වහන්සේගේ සේනාව ගෙන නුවරින් නික්ම තමන්වහන්සේ නියම කළ තැන නුවරක් කරවන්නට පළමුකොට ගඟින් එතෙර "ගඟසල්"[2] නම් ගමක් කරවා ඇත්වාහන අශ්වාහන ආදී වාහනද බලු ගොන් හා කිරිසරක්ද එහිම රඳවා නුවර කර්මාන්තයට විධානකරනසේක් මෙතෙක් මෙතෙක් දෙනා මේ මෙහෙ කරව. මෙතෙක් මෙතෙක් දෙනා මේ මෙහෙ කරවයි. පවුරු පදනම් අගල් වාසල් අට්ටාල මාලිගා ගෙවල් ඇත්හල් මුළුතැන් ගෙවල් ළිං පොකුණු ආදිවූ සියලු කර්මාන්ත බෙදා උමඟ කර්මාන්ත පටන් ගැන්වූසේක.

මහ උමඟ මදුරකඩ ගංගායෙහි අසව්යෙහි[3] බලසම්පන්නවූ දහසක් පමණ පුරුෂයෝ මහ උමඟ කරන්නාහු මහත්වූ සම්පසිවළින් පස් හැරගෙන ගඟදියෙහි ලන්නාහ. ලූ ලූ පස් මුළුල්ල ඇත්තු මිරිකන්නාහ. එබැවින් ගඟ පැන් කැළඹී මඩව යන්නේය. නුවර වැස්සෝ මහෞෂධ පණ්ඩිතයා ආවක් පටන් පහන් පැනක් බොන්නට නොලබම්හ. ගඟදිය කැළඹීගෙන යන්නේය. මීට කාරණය කිම්දැයි කියන්නාහ. එසේ කිවන්ට බොධිසත්වයන් වහන්සේගේ චරපුරුෂයෝ මහෞෂධ පණ්ඩිතයන් වහන්සේගේ ඇත්තු දිය කෙළි රැස් වන්නාහ. උඹ තුමූ දිය කෙළ කෙළ මඩ මැඩ මැඩ උඩ උඩ නගන්නාහ. ඉන් ගඟ පැන් මඩව යන්නේයයි කියති. එබසින් සැක නොකරන්නාහ. "බොධිසත්තානං අධිප්පා-යො නාම සමිජ්ඣති. තස්මා උම්මග්ගෙ මූලානි වා පාසාණා වා සබ්බ භූමියං පවිසිංසු" යි වදාළ බැවින් බොධිසත්වයන් වහන්සේගේ අභිප්‍රාය නම් සිද්ධ වන්නේමය. එසේ හෙයින් ඒ උමඟ ගලෙක් වත් මූලෙක්වත් නැතිව බිමම ගිලී අන්තර්ධාන විය.

---

1 යහපස්වූ
2 ගඟුල්ගමුවයයි යන තෙනක
3 අසවයෙහිය

සුළු උමඟ දොරකඩ උපකාරි නුවර විය. සත් සියයක් පමණ යොධයෝ සුළු උමඟ කරන්නාහ. ඒ කැණීනා පස් මහත් වූ සම් පසිවලින් ගෙනවුත් නුවර ලන්නාහ. දූලූ පස් පැනින් මිරිකා අනා පවුරු බඳනාහ. පදනම් භිත්ති ආදියත් බඳනාහ. උමඟට වදනා දොරකඩ එම උපකාරී නුවර ඇතුළෙහි විය. අවලොස් රියන් උස ඇති යන්ත්‍රයෙන් යුක්ත දොරවලින් ගැවසී ගත්තේය. ඒ දොර වනාහි එක් ඇණයක් මැඩලූ කල්හි යතුර පියන් දෙදොරම එකවිටම පියෙන්නේය. එකක් මැඩලූ කල්හි ඇරී යන්නේය.

මහ උමඟ දෑලයෙහි උළින් භිත්ති බැඳ නගා සුණු කර්මාන්ත කරවූසේක. මුදුනෙහි වියන් පෝරු අතුරුවා කළු සකල[1] ලා ගාවා මකුළෙන් අතිධවල කරවූසේක. ඒ මහ උමඟ මහ දොර අසූවක් හා සුළුදොර සුසැටක් වූයේය. ඒ සියලු දොරවල්ම යන්ත්‍ර යුක්තවූ අගුලු ඇත්තේය. එක් ඇණක් මිරිකාලූ කල්හි මහ දොර අසූවත් සුසැටක් සුළු දොරත් එකවිටම පියෙයි. එක් ඇණක් මිරිකාලූ කල්හි සැම දොරවල්ම එක විටම හැරී යෙයි. ඒ උමඟ දෑලයෙහි නොයෙක් සිය දහස් ගණන් පහන් ගබඩාවල්ද ඇත්තේය. ඒ යන්ත්‍ර යුක්ත අගුලුම වන්නේය. එක් ඇණක් මිරිකාලන්නා සියලු ගබඩාවල දොර එකවිටම හැරීයෙයි. එක් ඇණක් මිරිකාලන්නා සියලු පාන් ගබඩාවල දොර එක විටම පිහි යන්නේය. ඒ උමඟ දෙපාර්ශ්වයෙහි එක් සියයක් රජදරුවන්ට ශ්‍රී යහන් ගබඩා වන්නේය. එකෙකි ගබඩාවේ නොයෙක් පැහැයෙන් යුක්තවූ කොඳු පලස් ආදියෙන් අතුට සරහා තබන ලද සැතපෙන මහා යානකුත් ඇත්තේය. මෙසේම කහතලද දළ පුඩු ධවලච්ඡත්‍ර ඇති එසේම සරහතලද එකෙකි සිංහාසනයකුත් වන්නේය. ශ්‍රී යහන් ගබඩාවල මහා යානය ළඟ උතුම් රූ ඇති දිව්‍යාප්සරාවන් බඳු සර්වාභරණයෙන් සරහා සිටුවන ලද පෙතැලි රුවකුත් වන්නේය. නොදත්තවුන් අතින් පිරිමැද මූත් අජීව රුවකැයිනොදත හැක්කේය.

තවද ඒ උමඟ දෙපාර්ශ්වයෙහි කර්මාන්තයෙහි දක්ෂ චිත්‍රකාරයන් ලවා අනේකප්‍රකාරවූ ඉතාමනොහර කොට විස්තරවූ සිත්තම් කරවන ලද්දේය. ඒ සිත්තම් කවර වේද යත්? සතර වරම් රජදරුවන්හා දෙදෙව් ලොව දෙවියන් පිරිවරා පණ්ඩුකම්බල ශෛලාසනයෙහි හුන් සක් දෙව් මහරජාණන්ගේ විලාසයද, වට සිටි සත් රුවන් වැල්ලෙහි හා රුවන් පාද නම් පසකින් යුක්ත මහාමේරු පර්වතයෙහි සිටියාද යුගන්ධරාදී සත්කුළ පර්වතයන් හා සතර මහා

1 කළු, සකල,-කළු, සක සකලා

සාගරයද, හිමාලයද, පර්වත සතරද, ඡද්දන්ත රථකාර යනාදී සත්
මහාවිල්ද දෙදහසක් කොදිව් පිරිවරා සිටි සතරමහාද්වීපයද, මහ දඹ
දිව පිරිවරා සිටි ඉන්ද්‍රනීල සාගරයද, අපරගොයාන පිරිවරා සිටි
පබළු සාගරයද, උතුරුකුරු දිවයින පිරිවරා සිටි ස්වර්ණ සාගර
යද, පූර්වවිදෙහය පිරිවරා සිටි ක්ෂීරසාගරයද, තුන් දහසක්
වට ඇති පන්සියයක් යොදුන් ඇති හිමාලයද, එකුන් පනස්
යොදුන් සඳමඬලද, පනස් යොදුන් වට ඇති දහසක් රශ්මීන්
ගැවසි ගත් හිරුමඬලද, චාතුර්මහාරාජිකාදිවූ සදිව්‍ය ලෝකයද,
බ්‍රහ්මපාරිසද්‍යාදි සොළොස් බඹ තලයද ආකාශානඤ්චායතනාදීවූ
අසඤ්ඥතල සතරදැයි මෙකී සියල්ල විස්තර සෙයින් උමඟෙහි
සිතියම් දැක්කූසේක.

බිම රිදීපට හා සමවූ සුදුවැලි අතුරුවාලූසේක. උඩවියන
තවූ උඩු බලා කෙමි බිම බලා එල්වතලද සුපිෂ්පිත පදම වන
යක් පරිද්දෙන් පියුම් ඇන්දවූසේක. උමඟ දෙපාශ්වයෙහි අනෙක
ප්‍රකාර ලමඟ, තකුල්, කපුරු, කස්තුරි, තුවරලා, සඳුන් සුවඳ,
සාන්ද්‍ර ආදිවූ සුවඳ බඩු තබා විකුණන සල්පිල්ද, ලූණු, මිරිස්
කසා, ඉඟුරු ආදිවූ නොයෙක් සාල් බඩු තබා විකුණන පිළවල්ද,
පටකඩ පිළිකඩ දෙවාඩග ආදීවූ නානා වර්ණ පිළී තබා විකු
ණන පිළවල්ද, සකුරු, පොල්, කෙහෙල්, උක්දඬු, යටත් පිරිසෙ
සින් රා හා කාඩි තබා විකුණන සල්පිල්ද, දැක්කූසේක. ඒ ඒ
ස්ථානයෙහි සුවඳ වටදම් හා සුවඳ මල්දම් එල්වා ඒ උමඟ
තව්තිසා දෙව්ලොව සුධර්මා දිව්‍යශාලාව මෙන් ඉතා අලංකාරවිය.

පළමු යැවූ ආනන්ද නම් අමාත්‍යයාත් තුන් සියයක් වඩු
වන් ලවා සැස නිමවතලද දුරු සම්භාර නැව් තුන් සියයක්
පුරා ගඟින් ගෙනවුත්, ගෙනා බව බෝධිසත්වයන් වහන්
සේට කීය. ඔබවහන්සේද දඹුපත් නුවරට බාවාගෙන තෙල
නැව් සඟවා තබා මා කී දවසෙක ගෙනෙවයි. උඩු ගඟ නික්
මෙන තෙන තොටට නුදුරු තෙනෙක්හි නොපෙනෙන පරිද්
දෙන් සඟවා තිබ්බවූසේක. නැවත එ නුවරට පැන් අගලය
කලල් අගලය, වියලී තිබෙන්නාවූ අගලයයි, අගල් තුනකුත්
වූයේය. තවද ඒ නුවර වට අටලොස් රියන් උස සීමා පවුරද;
ඒ පවුරට තරම් පදනමද, වාසල් අට්ටාල අන්තරට්ටාල, බල
කොටු කුරුබිලි ආදියද, රජගෙය ආදීවූ නොයෙක් ගෙවල්ද
ඇත්හල් අස්හල් ඔටුවන් සීසාන ගොන් සිටිනා තැන්ද, යටත්

වශයෙන් ලිං හා පොකුණු යනී යන මේ සියල්ල නිමාවට පැමිණියේය.

මෙසේ ඒ දෙගවුවක් පමණ මහ උමඟද, ගවුවක් පමණ සුළු උමඟද ඒසා මහත් බිම් පිස කරවා උපකාරී නුවරදැයි යන මේ සියල්ලම සාරමසකින් නිමියේය. "අථ මහා සත්තො චතුමාසච්චයෙන රඤ්ඤො ආගමනත්ථාය දූතං පාහෙසි. තමත්ථං පකාසෙන්තො සත්ථා ඉතරං ගාථ මාහ"යි වදාළ බැවින් ඉක්බිති බොධිසත්ත්වයන් වහන්සේ සියලු කර්මාන්ත නිමි සාරමසකින් රජ්ජුරුවන් කැඳවා දූතයන් යවූසේක. එපවත් බුදුව වැඩහිඳ ප්‍රකාශකොට වදාරන තිලෝගුරු බුදුරජාණන් වහන්සේ

තිවෙසන්ති මාපෙත්වා, වෙදෙහස්ස යසස්සිනො
අථස්ස පහිණි දූතං, එහි දානි මහාරාජ!
මාපිතං තෙ නිවෙසනන්ති.

මේ ගාථාව වදාරා එම්බා මහණෙනි! ඒ මහෞෂධ පණ්ඩිතයෝ වෙදෙහ රජහට පලාවූ ගොස් උමං රජගෙවල් ආදිය කරවා නිමි සාරමසක් ගිය කල වෙදෙහ රජු කැඳවා දූතයන් යැවූහෝ වේදැයි වදාළසේක. පෙර මහ බල බලා හුන්නාසේ හුන් රජ්ජුරුවෝ දූතයාගේ බස් අසමින්ම සේනා වාහන සමගින්ම නික්මුණාහ. එපවත් ප්‍රකාශකොට වදාරන බුදුරජාණන් වහන්සේ

තතො ච රාජා පායාසි, සෙනාය චතුරඞ්ගියා
අනන්තවාහනං දට්ඨුං, ඵීතං කම්පිල්ලියං පුරන්ති.

මේ ගාථාව වදාරා එම්බා මහණෙනි! අටළොස් අක්ෂෞහිණී පමණ ඒසා මහත් සතුරු සේනාවක් හා එක් සියයක් රජුන් කැඳවා හුන්නාවූ උත්තර පඤ්චාල දෙශයෙහි කම්පිල්ල නුවරට කාමයෙන්[1] ගිජුවූ නුවණින් අඩුවූ ඒ වෙදෙහ රජ මොහයෙන් මුසුවූයේ අවිනාශී ඉඳුරා සලකා ගත නොහී චතුරඞ්ගිනී සේනාව පිරිවරා නික්මුණෝ වේදැයි වදාළසේක. ඉක්බිති රජ්ජුරුවෝ සාරසියයක් ගවු ගෙවා ගොස් ගංතෙරට පැමිණියහ.

ඉක්බිති මහ බෝසතාණන් වහන්සේ රජ්ජුරුවන් ආ නියාව අසා රජ්ජුරුවන්ට පෙර ගමන් කොට අවුත් තමන් වහන්සේ කරවූ උපකාරී නුවරට ගෙනාසේක. රජ්ජුරුවෝ ඒ නුවරට වැද රජගෙයි මතු මහලට නැගී නොයෙක් රසයෙන් අග්‍රවූ භොජනය අනුභව කොට මඳක් සැතපී පස්වරුවේලෙහි තමන්

1 කාමයෙහි

ආ නිසාව චූලනී රජ්ජුරුවන්ට කියා දූතයන් යැවුවාහුය. ඒ අර්ථය ප්‍රකාශ කොට වදාරන තිලෝගුරු සර්වඥරාජොත්තමයන් වහන්සේ.

තතො ච බො සො ගන්ත්වාන, බ්‍රහ්මදත්තස්ස පාහිණි
ආගතොස්මි මහාරාජ, තව පාදානි වන්දිතුං.
දදාහි දානි මෙ භරියං, නාරිං සබ්බඞ්ගසොභිනිං
සුවණ්ණෙන පටිච්ඡන්නං, දාසීගණ පුරක්ඛතන්ති.

ගාථා දෙකකින් වදාරනසේක් එම්බා මහණෙනි! වෛදෙහ රජ බ්‍රහ්මදත්ත රජහට දූතයකු අත කියා යවන්නේ මහරජ! නුඹවහන්සේගේ ශ්‍රී පාදය වඳනා පිණිස ආමි. සර්වාභරණයෙන් සරසනලද ශොභා ඇති දාසි දස් සමූහයන් විසින් පිරිවරනලද නුඹවහන්සේගේ පඤ්චාලචණ්ඩි කුමාරිකාව මට බිරින්ද කොට එවුව මැනවයි කියා යැවූයේ වේදූයි වදාලසේක. අඹුවන්කෙරෙහි කළ ලොභයෙන් වදිම්යි කීවක් මුත් වෛදෙහ රජ්ජුරුවෝ ඉතාම වෑඩි මහල්ලහ. චූලනී රජ්ජුරුවෝ වූ කලි මුනුබුරු තරමටත් ඇත්තාහ. දූන් රක්ෂා කරන සැල කෙසේ මහලු වුවත් කෙසේ පොහොසත් වුවත් වැන්ද මනාගෙයින් එසේම තමා සිත් ගෙන කුමාරිකාව ලැබගනිම් නම් යහපතැයි සිතා කෙලෙස් වසඟව මොහයෙන් මුළාව මඩනාලද අදහසින් වැඳ යැවූහයි දතයුතු.

වෛදෙහ රජ්ජුරුවන්ගෙන් ගිය දූතයාගේ බස් අසා චූලනී රජ්ජුරුවෝ මහාසොම්නසට පැමිණ මෙවිට මාගේ පසමිතුරා කොයි යන්නේද? සෙට උන් දෙන්නාගේ ඉස් කපාපියා පයින් මැඩගෙන හිඳ ජයපානය බොම්හයි සිතා රක්තපද්මයකට බඳු ද්වෙෂයෙන් කොධ උපදවා බසින් කියන්නාහු දූතයාට සතුටු ලෙස ගහවා ඕහට ප්‍රසාද දී නැවත කියා යවන්නාහු.

ස්වාගතං තෙ වෙදෙහ, අථො තෙ අදූරාගතං
නක්ඛත්තඤ්ඤෙ'ව පරිපුච්ඡ, අහං කඤ්ඤං දදාමි තෙ
සුවණ්ණෙන පටිච්ඡන්නං, දාසී ගණ පුරක්ඛතන්ති.

යන මේ ගාථාවෙන් වෛදෙහ රජ්ජුරුවෙනි! තමන් මෙයට ආගමන නපුරු ගමනෙක් නොවෙයි. ඉතාම යහපත් ගමනෙක. තොප විසින් විවාළමනා නම් විවා මඟුලට යොග්‍යවූ නක්ෂත්‍රයෙක් මය. සියලු අඟ පසඟින් දිව්‍යාප්සරාවක් හා සමානවූ කෙලි කොලු සමූහයා විසින් පිරිවරනලද නානාභරණීන් හෙබියාවූ අවයව ඇති මාගේ දූවණියන් තොපට පාවා දෙමියි කියා යැවූහ. ඒ දූතයා ගොස් වෛදෙහ රජ්ජුරුවන්ට දෙවයන් වහන්ස! ඔබින් බාදා නැත,

මඟුලට සදළු නැකැත් වහා විචාළ මැනව. රජ්ජුරුවෝ දුවණියන් පාවා දෙන්නාහයි කීය. ඉක්මන්වූ වෛදෙහ රජතෙම නැවත කියා යවන්නේ මහරජ! අදම නැකැත් යහපත, සියලු ස්ත්‍රී ලක්ෂණයෙන් හොබනාවූ දුවණියන් පරිවාර සහිතව වහා එවුව මැනවයි එමදූතයා අතම නැවත චූලනී රජ්ජුරුවන්ට කියා යැවීය. එසිදු වදාරන බුදුරජාණන් වහන්සේ

තතො ච රාජා වෙදෙහො, නක්ඛත්තං පරිපුච්ඡථ
නක්ඛත්තං පරිපුච්ඡිත්වා, බ්‍රහ්මදත්තස්ස පාහිණි.
දදාහි දානි මෙ භරියං, නාරිං සබ්බඞ්ගසොභිනිං
සුවණ්ණෙන පටිච්ඡන්නං, දාසීගණපුරක්ඛතන්ති.

මේ ගාථාවන් වදාරා එම්බා මහණෙනි! ඒ බ්‍රහ්මදත්ත රජ නැවත කියා යවන්නේ මහරජ! අදම නැකැත් යහපතැයි සියලු කිසෝ පලඳනාවෙන් හොබනා සිවුසැටක් ස්ත්‍රීලක්ෂණයෙන් විරාජමානවූ මාගේ දුවණියන් දාසි දස් සමූහයා විසින් පුකනකොට මහ පෙරහරින් තොපට කිරිත්ද කොට දුන්ම එවමී. දුන්ම වහ වහා මඟුල් සරහා ගන මනා ඥවිදූයි බොරු කිය කියා දූතයන් යවා එක් සියයක් රජදරුවන්ට කියා යවන්නාහු එදවස් මියුලු නුවරට ගියාසේ අටලොස් අක්ෂෞහිණියක් මහාසේනාව සරහා ගෙන සියලු රජදරුවෝම පඤ්චායුධ සන්නද්ධව සටනට සැරහී උපකාරී නුවර බලා වහා නික්මෙන්නට කියවයි සතුරන් දෙන්නාගේ හිස් කපා සෙට ජයපානය බොම්හ'යි කියා ය වූහ.

එබස් අසා රජ්ජුරුවෝ හැම දෙ ම චතුරඞ්ගිනී සේනාව සරහා ගෙන යුද්ධයට නික්මුණාහ. තුමූ සටනට නික්මෙන්නාහුම මෑණියන් තලතා දේවීන්දූද, අගමෙහෙසුන් නන්දාදේවීන්ද, පුතණුවන් පඤ්චාල චණ්ඩකුමාරයන්ද, දුවණියන් පඤ්චාලචණ්ඩි කුමාරිකාවන්ද යන මේ සතර දෙනා පුර වැදුන් හා සමග මාලිගාවේ දෙවන මාලේ රඳවා සුරක්ෂිත කොට රැකවල් ලවාලා උපකාරී නුවරට නික්මුණාහ.

බොධිසත්වයන් වහන්සේද වෛදෙහ රජ්ජුරුවන් හා කැටිව ආ මහා සේනාවට බොහෝ සත්කාර කළසේක. ඉන් සමහර කෙනෙක් රා බොන්නාහ. සමහර කෙනෙක් මත්ස්‍ය මාංස කන්නාහ. සමහර කෙනෙක් ඉක්මන් ඉක්මන්ව එන රජ්ජුරුවන් හා කැටිව කොසැතපී දිව දිව ආ හෙයින් කලානතව වැද හෙව නිදන්නාහ.

වෛදෙහ රජ්ජුරුවෝ සේනකාදී පණ්ඩිතවරුන් හා අමාත්‍ය මණ්ඩලය පිරිවරා සරසනලද මාලිගාවේ මතුමහලේ ශ්‍රී යහන් මුදුනෙහි මිහිරි කථා කෙරෙමින් උන්නාහ.

චූලනී රජ්ජුරුවෝද එක් සියයක් රජදරුවන් හා අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාවෙන් උපලක්ෂිතව අවුත් උපකාරී නුවරට ගොස් එ දවස් මියුලු නුවර පරිද්දෙන් ඇත් වලල්ලෙක, අස් වලල්ලෙක, රථ වලල්ලෙක, පාබල සේනා වලල්ලෙකැයි මෙසේ සතර වලල්ලෙකින් හා තුන් සන්ධියකින් කිසි සිදුරක් නොපෑ වට ලාගෙන ගන්නා ලද්දාවූ සියදහස් ගණන් දඬුවැට පහන් ගත් අත් ඇතිව අරුණු නැගෙන තෙක් නුවර ගන්නට සැරසී සිටියාහ.

අභිමතාර්ථ සාධකවූ චින්තාමාණික්‍යයක් බඳුවූ මාගේ ශ්‍රී මහා බෝධිසත්වයන් වහන්සේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් ආ බව දැන සහජාත යොධයන් තුන් සියයක් දෙනා තෝරා තෙපි හැම සුළු උමගින් පලාගොස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මෑණියන් තලතා දේවීන්ද, අගමෙහෙසුන් බිසවුන්ද, පුතණුවන්ද, දුවණියන්ද යන සතර දෙන මාලිගාවෙන් බාවාගෙන සුළු උමගින් ගෙනවුත් මහඋමඟට බාලා ඉන් ගෙනගොස් උමගින් පිටත් කොට නොපියා ඇතුළු උමඟ රඳවාගෙන අප ආකල උමගින් පිටත් කොට මහ විසල් මලුවෙහි රඳවා සිටුවාලවයි වදාළසේක.

ඒ යොධයෝ බෝධිසත්වයන් වහන්සේ වදාළ මෙහෙවර යහපතැයි ගිවිස සුළු උමගින් ගොස් රජගෙට යන හිණි පාමුල පණ්ඩිතයන් වහන්සේ විසින් අතුරනලද්දාවූ පෝරූ උගුළුවා තිල කළ දෙර අගුළු හැර උඩ නැගී හිණි පාමුලය, හිණි හිසය, මතු මාලයයි. මෙකී තැන්හි සිටියාවූ රැකවලුන්ද කුරුන් කුදුන්ද කුඩා සල සින් ආදිවූ පරිවාරද අල්වාගෙන දෑත් දෙපා එක් කොට තරවා බැඳ බැණ නොනැගෙන පරිද්දෙන් කට කඩ කැටි ගන්වා මූවාව තිබෙන්නාවූ ඒ ඒ ස්ථානයෙහි කොකුවල එල්වා තබා රජහට රාජභොජනයට සකස් කොට සපයා තිබූ නොයෙක් වර්ගයෙහි අනන්තගීතවූ කැවුම් ජාති මූළුල්ල සමහරක් අනුභව කොටපියා සමහරක් සුණු විසුණු කොටපියා මාලිගාවේ මතුමහලට නැංගාහ.

එ දවස් තලතාදේවී යෙහෙළණියන් හා මුතුබූරන් දෙන්නා හා සතර දෙන එක යහනකට නැගී ඔවුනොවුන් වැළඳ ගෙන සටන් නම් චපල දෙයෙක, කවුරු කිම් දතිද්ද? ජය පරාජය නම් කාට වෙතියි සිතිය හැකිදැයි සිත සිතා තමන් හා කැටිව එගුගහනෝ සැතපුනාහ.

එවේලෙහි ගිය යෝධයෝ ඔවුන් හුන් ගබඩාවෙහි දොරකඩ සිට බැණවූහ. එබස් අසා තලතාදේවී යහනින් නැඟී සිට කිමෙක්ද? දරුවෙනි! කියමියි දොරකඩට ආහ. ඒ යොධයෝ ඔවුන්ට කියන්නාහු දෙවීන්වහන්ස! අපගේ රජ්ජුරුවෝ වෙදෙහ රජුත් මහෞෂධයාත් අල්වා ගෙන මරාපියා සියලු දඹදිව එක්සත් කොට තමන් අත්පත් කොට එක්සියයක් රජුන් පිරිවරා මහා ඓශ්වර්‍ය්‍යයෙන් ජයපානය බොන්නා ඒ මඟුලට නුඹවහන්සේලා සතර දෙනාත් කැදවා එවූහ. වහා වැඩිය මැනවැයි කීහ.

එබස් අසමින් අතිශයින් සතුටුවූවා හු දොර හැර සතර දෙන මාලිගාවෙන් බැස ගිණි මූලට ගියාහ. යොධයෝ ඔවුන් ඇරගෙන උමඟට වන්හ. ඔවුන්ට රජ දරුවෝ කියන්නාහු අපි මෙතෙක් කල්හි මෙහි වසන්නමෝ එක දවසකුත් මේ වීදියට නොබට විරූම්හ. මේ වීදිය කිනම්දැයි කීහ. එබසට යොධයෝ කියන්නාහු කුමක් කියන්නේද? මේ විදියට ඇමදුම නොබස්නාහ. මේ මඞ්ගල වීථිය නම් වෙයි. අද ජය පානය බොන මඟුල් හෙයින් රජ්ජුරුවෝ නුඹ සතර දෙනා මේ වීථියෙන් ගෙනෙන්ට කීහයි කීහ. ඔහු සතර දෙන එබස් සැබවයි ගිවිස ශඞ්කා රහිතව උමඟ විස්තර බලමින් කෙළිමින් සෙමින් සන්තොෂයෙන් යන්නාහුය. ඒ යොධයන්ගෙන් සමහර කෙනෙක් ඔවුන් සතර දෙනා ගෙන ගියහ. සමහර කෙනෙක් රඳා නැවත රජගෙට පලාගොස් රුවන් ගබඩාවල දොරවල් හැණ බිඳ පියා තම තමන් ගෙන යන පමණ සාරවූ මාහැඟි රුවන් පොදි බැඳ ගෙන උමඟට වැද දොර අගුළු ගෙන පලාහ.

රජ දරුවන් සතර දෙනා පළමු ගෙන යන යොධයෝ දිව්‍ය පුරයක් මෙන් සරහනලද උමඟට බා ගෙන නමාගත්හ. ඔහු සතර දෙන තම තමන් සිහිනෙන් නුදුටු සරහන ලද දිව්‍යාප්සරාවන් වැනි පෙනැලි රූඅාදීවූ රූපශ්‍රීන් දැක අපගේ රජ්ජුරුවන්ට මඟුලටම කලහයි සිතූහ. ඉක්බිති ඒ යොධයෝ උන් සතර දෙනා උමඟින් පිටත් නොකොට ගඟට ආසන්න කොට ගෙන ගොස් ඇතුළු උමඟ සරහනලද එක් ශ්‍රී යහන් ගබඩාවක හිඳුවා සමහර කෙනකුන් රැකවල් සිටුවා සමහර කෙනෙක් උන් ගෙනා නියාව බොධිසත්ත්වයන් වහන්සේට ගොස් කීහ. උන්ගේ බස් අසා ජනානන්දකරවූ මාගේ ස්වාමිදරුවාණෝ මෙවිට මාගේ මනදොළ මුදුන් පත්වියයි ඔද වැඩී සතුටුව රජ්ජුරුවන් සමීපයට ගොස් වැඳ එකත්පස්ව සිටිසේක.

රජ්ජුරුවෝද කොලශයෙන් මඩනාලද අදහස් ඇති බැවින් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ දූන්ම දුවණියන් එවතියි, දූන්ම දුවණියන් එවතියි සිත සිතා උන්නාහු වහා හුත් අස්නෙන් නැගී සිවුමැදුරු කවුළුයෙන් පඩුරෙන් පිටත බලන්නාහු දිලිසෙන්නාවූ විලක්කු සියදහස් ගණනින් යුක්තව අනන්තාපරිමාණ චතුරඞ්ගිනී සේනාව නුවර වටලා සිටියවුන් දැක ලය ඉපිල අතිශයින් සැකව සේනකාදී ප්‍රඥාසම්පන්නවූ පණ්ඩිතවරුන් හා සමග මන්ත්‍රණය කරන්නාහු ඇත් සේනාවය. අස් සේනාවය, රථ සේනාවය, අනන්තාපරිමාණ සන්නාහ සන්නද්ධව ගනුව මරව, කොටව යනාදීන් යුඩයෙහි කිවමනා බස්මබණන්නාවූ පදාදි සේනාවය, ශරදාකාශයෙහි තාරකා පරිද්දෙන් බබලන්නාවූ විලක්කු ආලෝකයෙන් මෙ නුවර හිරු නැංගාසේ අතිශයින්ම බබලා ගියේය. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මර සෙනඟක්පරිද්දෙන් මේසා සේනාවක් ගෙනාවාහු අප කෙරෙහි සතුටින් අවුද? නොහොත් රුහැණීව අවුද? පණ්ඩිත වරු මේ කුමකැයි සිතන්නාහුදැයි කියා මේ ගාථාවෙන් කීහ.

හත්ථි අස්සා රථා පත්ති, සෙනා තිට්ඨන්ති වම්මිතා
උක්කා පදිත්තා ඣායන්ති, කින්නු මඤ්ඤන්ති පණ්ඩිතා'ති.

ඒ අසා නුවණින් අඩුවූ ඉතා ජඩවූ ලොභීවූ ගුණමකුවූ කෙලෙහි ගුණ නොදන්නාවූ අනාර්‍ය්‍ය ස්වරූප ඇති සෙනක විලක්කු ආලෝකය පණ්ඩිතයා කියන්නේ මහරජ! තොබා[1] වදාල මැනව. බොහෝ පෙනෙන්නේ නකත් වේලා නොවරදවා සරණ දෙන පරිද්දෙන් දුවණියන් ඇරගෙන බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ[2] ආහයි සිතමියි කීය. නැවත පුක්කුසයා කියන්නේ මහරජ! නුඹ වහන්සේට ආගන්තුක සත්කාර පිණිස නොරට ආ හෙයින් රුක වල් ගෙන සිටිනා නියායයි කීය. ඒ අඥානවූ ජඩයෝ සතර දෙනම යමක් යමක්ම සිතුවාහු වි නම් නන් දොඩන්නාවුන් පරිද්දෙන් කටට ආවක්ම කීහ.

වෙදෙහ රජ්ජුරුවෝත් මේ මේ ස්ථානයෙහි මෙතෙක් මෙතෙක් සෙනාව බැගින් සිටිත්වයි මේ ස්ථානයෙහි සුරක්ෂිතව රුක වල් ගනුව, පමා නොවව, නොනිදව, යනාදීන් කියන්නාවුන් බස් අසන්නාහ. සන්නද්ධව යුද්ධයට සැරහී සිටි සෙනාව දැක මරණ භයින් තැති ගෙන බෝධිසත්ත්වයන් වහන්සේ වදාරන බස් අසනු කැමතිව මෙසේද කියන්නාහු හුනස්නෙන් නැගී මහෞෂධ පණ්ඩිතයෙනි! සෙස්සන් බසින් මට කාර්‍ය්‍ය නැත. ඇත්, අස්, රථාදීවූ අනන්තාපරිමාණ චතුරඞ්ගිනී සෙනාව ප්‍රමාණාතික්‍රාන්තවූ

1. තොසිතා. 2. රජ්ජුරුවන්.

විලක්කු ආලෝකයෙන් එකොබාස විය. තෙපි මේ කුමකැයි සිතවුදැයි කීහ. එබස් අසා කල්පද්‍රැමයක් වැනිවූ තිලෝගුරු බෝධිසත්වයන් වහන්සේ සිතනසේක් මේ අඥනවූ රජු මදක් මරණ ගින්නෙන් තවාලා පසුව මාගේ බල දක්වාලා අස්වසා ලම් සිතා වදාරනසේක්

රක්ඛති තං මහාරාජ!, චූළනෙය්‍යො මහබ්බලො
පද්ධටෙඨා තෙ බ්‍රහ්මදත්තො, පාතො ත්වං ඝාතයිස්සතී'ති.

මහරජ! අඹබල, කායබල, සේනාබල ආදිවූ නොයෙක් බලයෙන් අසමාන වූ චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් තුඹවහන්සේ මරනු පිණිස දූතයෙ මැත් කොට ගතිම්. පලාගියේ නම් නපුරැයි අද මේ වේලේ පටන් තුන් යම් රාත්‍රියෙහි සතරැස් ක්ෂෙපයකින් හා තුන් සන්ධියකින් සුරක්ෂිත කොට වට රැකවල් ලවා රැක සිට පාන්වූ කල තුඹවහන්සේ අල්වාගෙන මරන තියාව මූත් දුවණියන් සරණ දෙන්නට හා හිතකමට ආ ගමනෙක් නොවෙයි වදාලසේක.

එබස් අසමින්ම සේනකාදී සියල්ලෝම මරණභයින් තැති ගෙන කිසිවකුත් කියන්නට අසමර්ථවූහ. රජහු උගුර වියලී කට කෙල සිඳී ඇඟෙන් ඩා සෙල්ලී ගොස් වලප්නාහු මෙසේද කියන්නාහ.

උබ්බෙධති මෙ හදයං, මුඛඤ්ච පරිසුස්සති
නිබ්බුතිං නාධිගච්ඡාමි, අග්ගි දඩ්ඪොව ආතපෙ.
කම්මාරානං යථා උක්කා, අන්තො ඣායති නො බ'හි
එවම්පි හදයං මය්හං, අන්තො ඣායති නො බහි'ති.

ඉතා මෘදුවූ ලා අඹ පල්ලවයක් පරිද්දෙන් මාගේ ලය සුලඟට සැලෙන්නාවූ ලහෝ පලුපතක් මෙන් වෙවුලන්නේය. මුඛයේ කෙලත් සිඳී ගියේය. ගින්නෙන් පැලහී ගිය එකක්හු කකියන උණු වැල්ලෙහි පාලූ කලක් පරිද්දෙන් මරන ගින් නෙන් තිවී මා කවර කලෙක ගැලවීමක් නොදකිමි. කඹුරන්ගේ උදුනෙහි ගිනි ඇතුලෙන් දවන්නේය. පිටතට නොපෙනෙන්නේය. එපරිද්දෙන් මාගේ ලෙහි ගිනි හෘදය මාංසය ඇතුලෙන් දවන්නේය. පිටතට නොපෙනෙන්නේයයි කියා හැඬූහ.

කරුණා නිධානවූ තිලෝගුරු බොධිසත්වයන් වහන්සේ රජුගේ ඉතා බැගෑපත්වූ වලප්නා වලහම් අසා මේ නුවණින් අන්ධවූ රජ පලමු මා කීවා නොකෙලේය. මතු නිකරුවන ලෙස තවත් නිග්‍රහ කොට ගඳුන්වා ලම්යි සිතා වදාරනසේක්.

පවත්තො මන්තනාතීතො, භින්නමන්තො'සිබන්ධියො
ඉදානි බොතං'තායන්තු පණ්ඩිතා මන්තිනො ජනා.
අකත්වා මච්චස්ස වචනං අත්ථකාමහිතෙසිනො
අත්ත පීතිකතො රාජා මිගො කූටෙව ඔහිතො'ති.

මහරජ! තුඹවහන්සේ කාමලොභයෙන් අන්ධවූයේක් මොහයෙන් මුළාවූ සිත් ඇතිව ගමන විචාළ තැන මාගේ ප්‍රඥා බලයෙන් මතු මේ නිසා මෙවැනි භයෙක් වෙයි කියව කියවා ඒ නපුරැයි නොගිවිස සෙනකාදීන්ගේ බස් ගෙන යහපතැයි ගිවිස භින්නවූ මන්ත්‍රණයෙන් මේසා මහත්වූ දුඃඛයකට පැමිණි සේක. ඒ මහා මන්ත්‍රිවූ සෙනකාදී පණ්ඩිතවරුන් සතර දෙනාගේ බසින් සරණ හිඳුවා රජ්ජුරුවන් හා නෑ සම්බන්ධ කළ නියා ඉතා යහපත. තුඹවහන්සේගේ සිත් භින්න කොටලා තුමූත් ඉන් කඩක් පිඩක් ලැබ ගනිම්හයි ලොභ චෙතනාවෙන් කයි වාරු කොට ගෙනාවෝ මේ දුකින් කුමකට ගලවා නොග නිද්ද? වන්නාට! උන් ගලවා ගන්නාත් දකිමි. උන්ගේ බලත් දකින්නෙම් වේදැයි වදාළසේක.

මෙසේද කියා මෙලොවින් පරලොවින් වැඩක්ම වන්නා - කැමති සියල්ලෙන්ම උතුම් අමාත්‍යව සිටි මාගේ බස් නොගිවිස. කාමයෙන් ඇළුණු සිත් ඇතිව යම් කිසිවෙක්හි ලොභයෙන් මූවකු අවුත් ඉතා තදවූ මලෙක බැඳුනාසේ මාගේ බස් නො ගිවිස පඤ්චාලචණ්ඩි කුමාරිකාව ලැබෙයි යන ලොභයෙන් අවුත් මේ මර මුළුල්ලේ[1] හසුවූසේක. එදවස් පඤ්චාල දෙශයට යන ගමන යහපත්දැයි විචාළ තුඹවහන්සේට මේ උපමා කොට කීයෙම් වේද? ඉදින් ඔබ ගියසේක් වී නම් බිළියක් ගිලූ කුඩමසකු මෙන්ද, පන හසුවූ මූවකු පරිද්දෙන්ද තුඹ වහන්සේ වටලාගෙන මරන්නාහයි කීමි. මා එදවස් නොගිය මැනවැයි කීයේ මේ මතු වන්නා දූතයයි වදාළසේක.

මෙසේද කියා නැවතත් වදාරනසේක් යට තමන්වහන්සේ රජ්ජුරුවන්ට වදාළ උදාහරණ දක්වා දෙවයිනි! අනාර්ය්‍ය සවරූප ඇති අසත්පුරුෂ කෙවට්ටයා හා මිත්‍රධර්මයක් නොකළ මැනව. ඉදින් ඔහුගේ බස් ගිවිස සරණ සොයා ගියසේක් වීනම් මෙලො වින් පරලොවින් වන වැඩෙක්හම් නැත. දෙලොවින්ම ඔහට දුක්ම වන්නේ යයි කියව කියවා මා කීවා නොකොට ඔහු කීවාම කළ සේක. ඒ තෙමේ භිණ හොත් සර්පයකු මෙන් විනාශයටම පමුණු

1. පුළුල්ලේ

වන්නේය. එබඳු අසත්පුරුෂයා හා සමග විශ්වාස නොකරන්නේය. කුමක් හෙයින්ද යත්? මිත්‍රයා හා සමග එක වරකත් කල විශ්වාසයකට නැතක් සිතට දුක් එලවන්නේයි.

ඉදින් මා කීවා කලසේක් වී නම් අද මෙසේවූ දුකෙක්වත් භයෙක්වත් නැත්තේ වේදැයි වදුරා නැවතත් සිතනසේක් මේ රජු මතුත් නොකිකරු නොවන ලෙස තර කොට හික්මවාලා නිග්‍රහයට පමුණුවා ලමියි සිතා රජහු පළමු කීවාම කියා භය ලජ්ජාවට පමුණුවමියි වදුරනසේක් මහරජ! එදවස් මේ ගමන් නොගිය මැනවැයි කීවාවූ මට වදුරනසේක් කෙවට්ට පණ්ඩිත යන් හා සේනක පණ්ඩිතයන් ආදිවූ පණ්ඩිතවරුමය. රජගෙයි හසලයෝත්, රජදරුවන්ගේ අදහස් දන්නෝත් මඟුලට තිසි බස් දන්නෝත් උඹමය. ගොවියා පුත් තිමූත් මිට මගන සී සා කනසේ දන්නා බව මූත් රජගෙයි කාරිය හා මඟුල් බැවහාර නොදනීයයි මට කිපී තෙල ගොවියා පුතු මාගේ විජිතයෙන් බොටුව අල්වාගෙන පිටත ලවයි වදාළසේක් වේ දැයි එ දවස් එසේ කී තුඹවහන්සේ දූන් එසේවූ ප්‍රඥසමුද්‍රයන් සිටියදී මා ගොවියා පුතු අතින් ගැලවෙන උපාය විචාරනසේ ඉතා නොයෙදෙයි. ඒ මා අතින් උපාය විචාරන තුඹවහන් සේමය කෙලතොලුසේකුත්, නුවණ නැතිසේකුත්, තමන් වහන්සේමය. මා දන්නේ සීසාතාසේමය. උවමනා වීනම් සී සානා මානා විචාරා ගන මැනව. නුවණැත්තෝත් පණ්ඩිත වරුත් මේ බරින් ගැලවෙන උපාය දන්නෝත් සෙනකාදී පණ්ඩිතවරුමය. තුඹවහන්සේ මට කිවමනා වීනම් එදවස් කීවාසේ පිටි කර ගස්වා පිටත ලවාපුව මැනව. මම කුමක් දනිම්ද? මා දන්නේ ගොවිකම්ානනමය. නුවණැත්තෝ නම් සෙනකාදීහුමය. මේ අටළොස් අක්ෂෞහිණී සංඛ්‍යාත සේනාව විසින් වටලා ගත් තුඹවහන්සේ සෙනකාදීහුම ගලවා ගනිත් වයි. තවත් කිවමනා වීනම් ගොවියා පුතු මරා පිටත ලවා පුව මැනව. මා කුමක් දන්නාහෙයින් විචාරනසේක්දැයි තරවා දෙඩා නිග්‍රහයට පැමිණවූසේක.

ඒ අසා රජ්ජුරුවෝ සිතන්නාහු පණ්ඩිතයෝ පළමු මා කී අපරාධම කියන්නාහ. ම පුතණුවෝ මේ මතු වන්නාවූ භය තමන්ගේ ප්‍රඥාචක්ෂුසින් මනාකොට දුටුවන්හ. එබැවින් දූන් මා තරව නිග්‍රහයට පමුණුවති. අතීතය, අනාගතය, පච්චුප්පන්නය යන තුන්කල් දන්නා වජ්‍රබුද්ධි ඇති ජනහිත තිරතවූ මාගේ

පුතණුවෝ අනාගතයෙහි මෙබඳු භයෙක් වන්නේයයි දැන දැන සාර මසක් මුළුල්ලෙහි හිඳිනාහු නිකම් නොහිඳිනාහ. එකාන්තයෙන් ගැලවෙන උපායක් කෙරෙත්මය. එයින් මා විසින් පරීක්ෂා කළ මැනවැයි සිතා කියන්නාහු.

මහොසධ! අතීතෙන, ජාතු විජානන්ති පණ්ඩිතා
කිං මං අස්සං'ව සම්බද්ධං, පතොදෙනෙව විජ්ඣති.
යථෙවං පස්සසි මොක්ඛං, ඛෙමං වා පන පස්සසි
තෙනෙව මං අනුසාසි, අතීතෙන නවිජ්ඣසි, ති.

පුත! මහෞෂධ පණ්ඩිතයෙනි! නුවණැත්තාහු ගිය දවස කළ දුෂ්කම් හා නොදැන කියාපු බස් පමණක්ම සිත තබා ගෙන කිය කියා දුකට පැමිණියන්ට නිග්‍රහ නොකරන්නාහ. තෙපි මහා නුවණැතිව අනුවණින් නොදැන කියාපී වරදම කීයව. ඒ කුමක් වැනිදයත්? සතුරු සේනාවක් වට කළ කල්හි පිට හිඳුවා ගෙන නැඟී යන්නට තරම් ජවසම්පන්න අශ්වයකු සාදා සිටියාවූ තීක්ෂණවූ හියකින් විදිනා කලක් පරිද්දෙන් මා කුමකට විදිව්ද? ඉදින් කියම් නම් මා ගැලවෙන නැඟී යන උපායක් වත් සතුරන්ට හසු නොවී සැඟවී යන[1] තෙනක් දනු නම් මට ඉන් අනුශාසනා කරව. ගිය දවස මා නුවණ නැතිව කී කථා සිහිකොට තොපගේ මුඛයෙහි බස් නමැති හීයෙන් මා නොවිදුව. තර කොට බැඳි අසකු විදිනා කලක් පරිද්දෙන් මා නොවිදුව. මට කිවමනා නම් මින් ගැලවෙන උපායක්මයයි කිහ. තොප මුත් මට අනික් පිටිවහලෙක් නැත්තේ යයි හැඬූහ.

ඉක්බිති. ඒ අසා කරුණානිධානවූ බොධිසත්වයන් වහන් සේ සිතනසේක් මේ රජහට මා විනා අනික් පිටිවහලෙක් නැත්තේයයි සිතා නැවතත් සිතනසේක් මේ රජ ඉතා අන්ධ බාලය. තමා නුවණ නැතිහෙයින් පුරුෂ විශෙෂයක් මඳකුත් නොදන්නී. තව මඳක් බවාලා[2] පසුව අස්වසා ලම්යි සිතා වදාරනසේක්.

අතීතං මානුසං කම්මං, දුක්කරං දුරභිසම්භවං
න තං සක්කොමි මොචෙතුං, ත්වම්පි ජානස්සු ඛත්තිය.
සන්ති වෙහාසයා නාගා, ඉද්ධිමන්තො යසස්සිනො
තෙපි ආදාය ගච්ඡෙය්‍යුං, යස්ස හොන්ති තථාවිධා, ති.

1 නැඟි 2 තවාලං

යන මේ ගාථා පාළියෙන් වදාරනසේක් මහරජ! මේසා සෙනාවක් වටලා ගත්කල ඉන් මිදී යන්ට තරම් උපායක් කොට ගන්ට මෙවිට මනුෂ්‍යයන්ට බැරි වන්නේය. මිනිසුන් විසින් කළමනා යම් දෙයක් ඇත් නම් ඒ සියල්ල සතුරන් වටලා සිටිහෙයින් මනුෂ්‍යයන්ට අවිෂයය. එයින් ඉක්ම ගියේය. මෙවිට දැන් ගැලවෙන්ට උපායක් කරන්නා තබා සිතන්වත් නොපිළිවන. දැන් කරන උපායකින් නුඹවහන්සේ ගලවා ගන්ට මම අසමර්ථයෙමි. මහරජ! නුඹවහන්සේම ගැලවෙන උපායක් දත මැනවැයි වදාරා සමහර රජදරුවන්ගේ මෙසේවූ දුකෙක්හිදී ගලවා ආකාශයෙන් ඇරගෙන යන්නාවූ උපොසථය, ඡද්දන්තය යන සෘද්ධිසම්පන්නවූ ඇත් කෙනෙක් ඇත්තාහ. එසේවූ ඇත් කෙනෙක් නුඹවහන්සේගේ ඇත් නම් මේ දුකින් ගලවා ආකාශයෙන් ගෙන යෙත්වයි. නැවත සමහර රජදරුවන්ගේ සෘද්ධිමත්වූ වලාහක අශ්වයෝ ඇත්තාහ. එසේවූ අස් කෙනෙක් නුඹවහන්සේට ඇත්නම් උසින් නුඹවහන්සේ ආකාශයෙන් ගෙන යේත්වයි. නැවත සමහර රජදරු කෙනකුන්ගේ ආකාශචාරීවූ ගුරුළු වාහනත් ඇත්තේය. තවද එපරිද්දෙන්ම එබඳු පක්ෂි වාහනයෙක් ඇත්තේ නම් උසින් නුඹවහන්සේ මේ දුකින් ගලවා සතුරන්ගෙන් භය නැතිව මියුලු නුවර ලාපියත්වයි. තවද යම් රජක්හුගේ භාග්‍යයෙන් සෘද්ධිමත්වූ සාතාගිර හේමවතාදිවූ මහේශාඛ්‍ය දෙවියෝද යන කෙනෙක් ඇති වන්නාහ. එසේවූ කෙනෙක් ඇත්නම් නුඹවහන්සේත් මේ දුකින් ගලවා ගෙන යෙත්වයි. ඒ ආකාශචාරීවූ ඇතුන් අසුන්, ගරුඬ, යක්ෂ ආදීන් පරිද්දෙන් නුඹවහන්සේ ආකාශයෙන් ගෙන ගොස් මියුලු නුවර ලා ලන්ට ශක්තියෙක් මාගේ නැතැයි වදාළසේක.

රජ්ජුරුවෝ බොධිසත්වයන්වහන්සේ වදාළ බස් අසා කිසිවක් කියාගත නොහී අනික් පිළිසරණක් නැතිව මුවෙන් නොබැණ කරබාගෙන උන්හ. එවිට සෙනකයා සිතන්නේ රජ්ජුරුවන්ටත් අපටත් මේ පණ්ඩිතයන් විනා අනික් කිසි සරණයෙක් නැත්තේය. රජ්ජුරුවෝ වනාහි පණ්ඩිතයන්ගේ බස් අසා භයින් තැති ගෙන කිසිවකුත් කියන්නට අසමර්ථයහ. මෙවිට මමත් පණ්ඩිතයන්ට තමා දත් පත් නියා යාඥ කොට බලමියි සිතා කියන්නේ යම්සේ දිය සයුරෙක හුනු පුරුෂයෙක් දුකසේ ගොඩක් දුටුයේ වී නම් ගොඩ දුටු වේලෙහි පටන් ඕහට මහ සැප වන්නේය. එපරිද්දෙන් අපටත් රජ්ජුරුවන්ටත් නුවණින් සා

මන්ත්‍රීකමින් මුළු ලොවට උතුම් වූසේක් තුඹවහන්සේ වේද. එබැවින් මේ දුකින් මුදලා අප ගලවා ගත මැනවැයි මේ ගාථාවෙන් කියා.

අතීරදස්සී පුරිසො, මහනෙත උදකණ්ණවෙ
යත්‍ථ සො ලභතෙ ගාධං, තත්‍ථ සො වින්‍දතෙ සුඛං.
එවං අම්හඤ්ච රඤ්ඤොච, ත්‍වං පතිට්ඨා මහොසධ!
ත්‍වං නො'සි මන්තිනං සෙට්ඨො, අම්හෙ දුක්ඛා පමොචය'ති.

තැවත කියන්නේ පළමුත් මිසුලු නුවරට මෙම සේනාව ගොස් වටලා ගත් කලත් තුඹවහන්සේගේ ප්‍රඥබලයෙන්ම දිවි ලදුම්හ. තවද සමුද්‍රයෙහි නැව් බුන්නවුන් රළින් රළ පැහැර ඇවිදිනාකල්හි ඉදින් ගොඩක් පෙනී ගියේ වීනම් ඔහට මහත්වූ සොම්නස් වන්නාසේ එබැවින් මේ දුකින් අප ගලවා ගැන්ම තුඹවහන්සේටම භාරයයි යාඥ කෙළේය. ඉක්බිති එසේ යාඥ කළ සෙනකයාට තරවා භය උපදවා නිග්‍රහ කරන සේක් මේ ගාථාවෙන් වදාරනසේකි.

අතීතං මානුසං කම්මං, දුක්කරං දුරභිසම්භවං
න තං සක්කොමි මොචෙතුං, ත්‍වම්පි ජානස්සු සෙනකා'ති.

තිලොක තිලකවූ අපගේ බොධිසත්වයන් වහන්සේ කියනසේක් එම්බා අඥනවූ සෙනක නම් ජඩය! එදවස් මේ ගමන් නොකැමැත්තේයයි මා කියතුත් රජහට උල්ගල් දී නොයෙක් පරිද්දෙන් උගන්වා ගෙන ආ සෙයිත් තෝමය. ගෙන වුත් මේසා දුකකට පමුණුවා මේසා අනර්ථයක් යෙදුයෙහිත් තෝමය. එම්බල අසත්පුරුෂය! මනුෂ්‍යයන් විසින් ගැලවෙන් නට කළමනා යම් උපදෙශයක් ඇත්නම් මෙවිට මේයයි කරන්න තබා සිතන්නවත් නොපිළිවන. ඒ සියල්ලම ඉකුත්ව ගියේය. මා විසින් දූන් කොට සාදගත හැකි කිසිවකුත් නැත. මට නොපිළිවන. නොපත් පෙර අපමුත් නැතැයි බැහැවෙන පණ්ඩිත වරුන් වුව. තොපගේ නුවණින් ඊට උපායක් සිතා තොපත් ගැලවී රජ්ජුරුවනුත් ගලවා ගන්වයි වදාළසේක. මෙසේද කියා තැවත වදාරනසේක් තෝ සපනී නම් ආකාශයෙන් ගෙන ගොස් මිසුලු නුවර ලාපියවයි වදාළසේක.

රජ්ජුරුවෝ ගැලවෙන්නට සුදුසු උපායක් නොදන්නාහු මරණ භයින් තැති ගෙන බෝධිසත්ත්වයන් හා සමග කිසිවකුත් කියන්නට අසමර්ථව යම්සේ මේ සේනකයාත් පණ්ඩිතයකු වූව කිසි උපායක් දනී නම් විචාරමි සිතා විචාරන්නාහු,

සුණොහි එතං වචනං, පස්සසෙ'තං මහබ්භයං
සෙනකං, දානි පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසී'ති.

යන මේ ගාථාවෙන් සේනකයෙනි! ම කියන කෙපුල් අසව. මේ සේනාව අප වටලා ගත් නියාවත්; අප ඉන් ගැලවී ගනු නොහැකි නියාවත් දුටුයේ වේද? මේ භයින් ගැලවී ගන්නට සුදුසු උපායක් දනීනම් කියවයි විචාළහ. එබස් අසා සේනකයා සිතන්නේ මසක් මං මූළාවූ එකෙක් සමසක් මං මූළාවූ එකකු අතින් මං විචාළාසේ රජ්ජුරුවෝ මා අතින් ගැලවෙන උපාය විචාරන්නාහ. යහපත් වූවත් නපුරු වූවත් කටට ආවක්ම කියමියි සිතා එක් උපායක් සලකාගෙන කියන්නේ මේ ගාථා වෙන් කීය.

අග්ගිං ද්වාරතො දෙව! ගණ්හාමසෙ විකන්තනං
අඤ්ඤ මඤ්ඤං වධිත්වාන, ඛිප්පං හෙස්සාම ජීවිතං
මා නො රාජා බ්‍රහ්මදත්තො, චිරං දුක්ඛෙන මාරයි,ති.

මහරජ! කරනසේක් වී නම් මේ මා කියන උපාය ඉතා යහපත. මේ හුන් මාලිගාවට අප හැම වැදලා දොර පිටින් හයා බැඳ ගිනි ගස්වාලා තියුණු මුවහත් ඇති කඩුවක් බැගින් තමතට එක එක කඩුව අතට ගෙන ඔවුනොවුන් කොටා මියම්හ. එසේ මළාවූ නුඹවහන්සේ හා අප හැමදෙනාට මේ සැරහු මාලිගාවම එක් දරසෑයෙක් වන්නේය. ඒ වැලි කුමක් පිණිසදයත්? බ්‍රහ්මදත්තයෝ අප අල්වා ගත්තු නම් ජන්මාන්තර වෛරහෙයින් වධ කොට බොහෝ දවසකින් දුක් දී මරන්නාහ. එබැවින් වහා මියයාම උතුමැයි කීය. ඒ අසා රජ්ජුරුවෝ තට හා තාගේ අඹුදරුවන්ට මෙබඳු දරසෑයෙකුත් මෙසේවූ මරෙකුත් වේවයි මට මෙවැනි මරෙක් නොවේවයි කියා පුක්කුසයා ආදීවූ අනික් තුන්දෙනාත් එපරිද්දෙන්ම විචාළහ. උයිත් නුවණ නැතිව තම තමන් කටට ආවක්ම කීහ. එසේ හෙයින් කියන ලදී.

සුණොහි එතං වචනං, පස්සසෙතං මහබ්භයං
පුක්කුසං 'දානි පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසී'ති.

පුක්කුසය! තා අතිනුත් විචාරමි. මා කියන්නා අසව. බය දුටුවෙහි. තාත් අපත් ගැලවෙන උපායක් දනීනම් කියවයි විචාළහ. ඒ අසා පුක්කුසයා කියන්නේ මහරජ! බ්‍රහමදතන රජහු අප අල්වා ගත්තු නම් නොයෙක් වධ කොට චිරාත් කාලයකින් දුක් දී මරන්නාහ. කෙසේ කොටත් මරණ නොන වත්නා බැවින් අපි හැම්දෙනා සමගිව උග්‍රවූ විෂයක් යොදා කාපියා වහා මියම්හයි කිය. ඔහුගේ බස් අසා රජහු ඉතා නොසතුටුව තාගේ අඹුදරුවන් හා සමග තෝ විෂ කා මියව. මට මෙවැන්නක් නොකියා යි කියා තෙවනු කාවින්දයා විචාළහ. තාත් පණ්ඩිතයකු වුව. අප හැම මරන්ට සෙනාව වටලා ගත්තා දුටුයේ වේද? මීට ගැලවෙන්නට උපායක් දනී නම් වහා කිය යි කියා මේ ගාථාවෙන් කීහ.

සුණොහි එතං වචනං, පස්සසෙතං මහබ්භයං
කාවින්දං, දනි පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසී’ති.

එවිට කාවින්දයාත් කියන්නේ දෙවයන් වහන්ස! බ්‍රහම දතන රජතෙමේ අප අල්වාගෙන බොහෝ වධ කරවා මහා දුක් දී බොහෝ දවසකින් මරන්නේය. ඔහු අතින් වධ විඳ චිරාත් කාලයකින් මිය යන්නා බලාත් තමකට ලනුවක් බැගින් හැරගෙන මේ මාලිගාවේ මතු මහලට නැගිලා සිවුමැදුරු කවුළුවෙන් පිටත කොබෝලෙගෙඩි වලල්ලේ රැන බැඳලා තමතමන් ගෙලේ ලා පැනපියම්හ. නොහොත් ගැඹුරු ප්‍රපාතයට පැන පියා සතුරන්ගෙන් මහත් දුක් වද විඳ මියයාමට වඩා වහා තමන්ම මිය යාම යෙහෙකැයි කීය. ඒ අසා රජ්ජුරුවෝ එසේ කරවැල් ලා මියන මරෙක් තට හා තාගේ අඹුදරුවන්ට වේවයි. එසේවූ දෙයක් මට නොවේවයි කියා දේවින්දයා විචාරන්නාහු මේ උපන්භය නොයිත් දුටුයෙහි වේද? හැමදෙනම නුවණ නැතැයි කියාත් නැත. ඉදින් ගැලවෙන්නට තරම් උපායක් දනීනම් නොයිත් කියා බලවයි කියන්නාහු මේ ගාථාවෙන් කීහ.

සුණොහි එතං වචනං, පස්සසෙතං මහබ්භයං
දෙවින්දං ‘දනි පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසී’ති.

ඒ පැන නැඟී අතිකක් සොයා ගන්ට අසමර්ථව සෙන කායා කී ලෙසම මහරජ! බ්‍රහමදතනයෝ අල්වා ගත්තු නම් තමා කැමති යම්ම වධයක් කරවා බොහෝ දුක් දීලා කලාතුරකින් මරන්නේය. එසේ දුක් විඳ සතුරන් අත මිය යන්නා බලාත් මේ මාලිගාවේ දොර පිටතින් අයා බැඳ ගිනි ගස්වලා

අපි නම්නට කඩුවක් බැගින් ඇරගෙන ඔවුනොවුන් කොටා මියම්හ. මේ විසිතුරුවූ මාලිගාව බ්‍රහ්මදත්තයාට ප්‍රයෝජනවත් නොවී අප හැම දෙනාට එක දරසැයක්ම වන්නේය. මේ විනා මා දන්නා අනික් උපායෙක් නැත. පොළොව පැකිල්ලවුන්ට ඒ මහ පොළොවම පිහිට වන්නාසේ මේ දුකින් අප හැම දෙනා සැපසේ මුදපියන් නම් කරුණානිධානවූ ජනහිත නිරතවූ මහෞෂධ පණ්ඩිත ස්වාමීන් විනා අපසේවූ නුවණින් අඩයන්ට ඒ විෂයයෙක් නොවෙයි. ඇවිලෙන ගිනි තබලා කන මැදිරියන් පිම්බාසේ ප්‍රඥ නමැති වන්නිසකඩයෙන් සමස්ත ලෝකය එකාලෝක කරවා බබලමින් සිටි මේ උත්තමයාණන් සිටියදී අප සතර දෙනාගේ නුවණින් අඩයන් අතින් ගැලවෙන උපාය විචාරන්නේ අපට වඩා නුවණ නැති නියාවද? කාරන යාඥුවක් අපි හැම දෙනම පණ්ඩිතයන් වහන්සේවම කරම්හයි කිය. මෙසේද කියා අපි හැමදෙනම බැගැපත්ව හඬා දෙඩා අප ගලවා ගත මැනවැයි යාඥ කරම්හ. සතුරන් කෙරෙහිත් මිතුරන් කෙරෙහිත් සඳරුස් හුනු කිරිමුහුද සේද, සුදු යක කිරි වත් කළාසේද සමවූ මෛත්‍රී ඇති ඔම් උත්තමයාණෝ තමන්ට විෂය විනම් මෙපනක් දෙනා අනාථ මරණෙන් මිය යාම නොදෙන්නාහ. උන්වහන්සේත් නරව නොපිළිවනැයි කිවහොත් සෙනක පණ්ඩිතයන් කී ලෙසම දොර බැඳ ගිනි ගස්වාලා උනුන් හා කොටා මියම්හයි කිය. ඒ අසා රජ්ජුරුවෝ පෙර තමන් බෝධිසත්වයන්ට කළ කී අපරාධ සඳහන් කොට ඔබ හා සමග කිසිවකුත් කියන්නට අසමර්ථව මහතාණන් අස අසා සිටියදීම ඔබ ළය කම්පා වන පරිද්දෙන් බැගෑපත්ව හඬන්නාහු මෙසේ කියන්:

යථා කදලිනො සාරං, අන්වෙසං නාධිගච්ඡ'ති
එවං අන්වෙසමානානං පඤ්ඤං නාජ්ඣගමාමසෙ.

යථා සිම්බලිනො සාරං, අන්වෙසං නාධිගච්ඡති
එවං අන්වෙසමානානං, පඤ්ඤං නාජ්ඣගමාමසෙ.

අදෙසෙ වත නො වුත්ථං, කුඤ්ජරානං වනොදකෙ
සකාසෙ දුම්මනුස්සානං, බාලාන මවිජානතං.

උබ්බෙධති මෙ හදයං, මුඛඤ්ච පරිසුස්සති
නිබ්බුතිං නාධිගච්ඡාමි, අග්ගිදඩ්ඪොව ආතපෙ.

කම්මාරානං යථා උක්කා, අන්තො ඣායති නො බහි
එවම්පි හදයං මය්හං අන්තො ඣායති නො බහි'ති.

යනාදී ගාථා වශයෙන් මහෞෂධ ස්වාමීන්ට ඇසෙන පරිද්දෙන් කියන්නාහු යම්සේ කෙහෙල් ගස හරය ඇතැයි වරදවා

සිතා ගත් නුවණ මඳ පුරුෂයෙක් සැපෙන යකඩයක් නැවතත් ගා මුවහත් නංවාගෙන මහත් රඹ වනයකට වැද මහත් මහත් ගස් කපා බඩය දක්වාත් බිඩලු හැරත් එහි කිසි හරයක් වත් සාරයක් වත් නොදකිද? ඔහු පරිද්දෙන් මින් ගැලවෙන උපාය සොයන්නාවූ මා යම් කිසි කෙනකුන්ගෙනුත් නුවණ නමැති සාරයක් දුටුයේ නැත.

තවද හිඹුල් හරයකින් ප්‍රයෝජන ඇති පුරුෂයෙක් කෙහෙල් හර සෙවූ පුරුෂයාසේ හිඹුල්වනය කොටා එක ගසකත් හරයක් නොදකිද, එපරිද්දෙන්ම මේ දුකින් ගැලවී ගන්නා උපාය සොයන්නාවූ මම හර නැති හිඹුල් රුක් සෙවූ පුරුෂයාසේ මොවුන් අතින් ඇසුයෙමි. මොවුන් හැම දෙනාගේම ළෙහි ප්‍රඥා නමැති සාරයක් මඳකුත් මා දුටුයේ නැත.

තවද පැන් නැති මහා වනයෙක විසූ මහා ඇතක්හු ගිම් සමයෙහි ග්‍රීෂ්මයෙන් පීඩිතවූවාසේ දුකකට පැමිණි කල්හි ඒ දුකින් මුදා ගලවා ගන්නට තරම් උපායක් නොදන්නා අඥානයන් සමීපයෙහි අනේ! මා විසූ තියාවක් ඉතා තපුරු තියාය. දූන් මාගේ ළය සුළඟට වෙවුලන්නාවූ ළඳ පලලවයක්සේ කම්පිත වන්නේය. කට කෙල සිඳී උගුර වියලී ගියේය. ගින්නෙන් පැලගී ගිය එකක්හු අවුවේ ලූ කලක් පරිද්දෙන් කිසි අස්ව්සයක් නොලබමි. තවද කඹුරු උදුනේ ගිනි ඇතුළෙන් දවයි. ඒ ගිනි පිටතට නොපෙනෙයි. එපරිද්දෙන් දූන් මාගේ ළෙහි මරන ගිනි මා ඇතුළෙන් දවන්නේය. පිටතට නොපෙනෙන්නේය.

මේ පණ්ඩිතවරුන් පස්දෙනා අමාත්‍ය ධුරයෙහි නුවණට හා මන්ත්‍රීකමට තබා මා විසූ තියාව පැන් නැති මගවනයෙහි ඇතු විසුවා වැන්න. නුවණ නැති පුරුෂයන් කෙසෙල් හර හා හිඹුල් හර සෙවුවා වැන්න. ඒ තිරුදක වනයෙහි විසූ ඇත් උදකයෙන් පීඩිතවූයේ නොබෝ කලකින් සතුරන්ට හසන ප්‍රාප්තවේද, එපරිද්දෙන් මේ නුවණ නැති පණ්ඩිතවරුන්ගෙන් එකෙකුත් මා මේ දුකින් මුදලන්නට සමර්ථ නැතැයි බැගැපත්ව හැඬූහ.

මෙසේ ඇසුවන්ගේ ළය කම්පාවන පරිද්දෙන් අඬන්නාවූ රජ්ජුරුවන්ගේ බස් අදෝනා හඬ අසා ශරණගතයන්ට වජ්‍රපඤ්ජරයක් බඳුවූ තිලෝගුරු මාගේ ස්වාමි දරුවූ බොධිසත්ත්වයන් වහන්සේ මේ රජ මරණ භයින් ඉතා කලානත විය. සා පිපාසා ඇත්තවුන්ට අන්න පාන දෙක කැමති වන්නාසේ එම පිටිවහල් වන්නාසේ මේ

1 බඩලු

රජහට මා මුත් අනික් පිටිවහලෙක් නැත. මෙවිට මොහු අස්වසා නොලා තවත් තද වීම් නම් ශොකයෙන් ළය පැළී ගිය නම් නපුර. සාරමසක් මුළුල්ලේ මා ගත් දුක් අදුක්ව යන්නේය. එබැවින් අස්වසාලම්හි සිතා ළැව්ගින්නෙන් දවන්නාවූ මහවනයක සිය ගණන් වලාකුළු බිඳ වස්නා ගන වැස්සක් මෙන් තමන්වහන්සේගේ වචන නමැති මේඝයෙන් රජ්ජුරුවන්ගේ මරණ ශොක නමැති ගිනි නිවා අස්වසා වදාළසේක. ඒ බව ප්‍රකාශ කොට වදාරන බුදුරජාණන් වහන්සේ.

තතො සො පණ්ඩිතො ධීරො අත්ථදස්සී මහොසධො
වෙදෙහං දුක්ඛිතං දිස්වා ඉදං වචන මබ්‍රවී.

වදාරනසේක් එම්බා මහණෙනි! මහෞෂධ පණ්ඩිතයන් තමන් නොකැමති කරවා සරණ සොයා ගිය වෙදෙහ රජු හුන් උපකාරි නුවර බ්‍රහ්මදත්තයා එක් සියයක් රජුන් සහිතව මහා සේනාව ගෙනවුත් වටලා ගත් කල්හි අඹුවන් තබා තමා ගැලවී ගත නොහී එයින් මිදෙන උපාය විචාළ රජුට ඔබ නොබිය මැනව. ගියහොත් මහා විනාශයට පැමිණෙන්නේ එකාන්තය. යා නොයා හැක්කැයි කීම්. මා කටයුතු නොදනිතියි. බැණ නිග්‍රහයෙන් පිටත ලවා සෙනකාදී ප්‍රඥාවතුන් විසින් ඔබ වැඩිය මැනවැයි. ගියහොත් මහා විපාක වන්නේයයි කියා නුඹවහන්සේ මෙයට ගෙනා පණ්ඩිතවරුන් අතින් උපාය විචාරා ගැලවී ගත මැනවැයි කී කල්හි සෙනකයා ආදීවූ සතර දෙනාත් විචාරා උන් හැමදෙනා කියනලද මරණොපය අසා නොසතුටුව මහෞෂධ පණ්ඩිතයන්ට සිය නොහී හය ඇතිව. උන්ට ඇසෙන පරිද්දෙන් අඬන්නාවූ වෙදෙහ රජුගේ බස් අසා මෙවිට අස්වසා නොලීම් නම් ළය පැළී නැසී ගිය හොත් මා දෙවරුව ගත් දුක් මුළුල්ල ව්‍යර්ථව යන්නේය.

තවද මතු පස්වාදහසක් මුළුල්ලෙහි සඳමඩල ඇත්දසේ පෙනෙන්නාවූ මාගේ ප්‍රඥාවිශෙෂය ජලරේඛාවක් පරිද්දෙන් තුච්ඡ වන්නේයයි සිතා ඒ රජු අස්වසන්නාහු අතීතානාගත පච්චුප්පන්න යන කාලත්‍රය වර්තිවූ සියලු පදාර්ථයන් සර්වඥතාඥානයෙන් පරොප දෙශයක් නැතිව තමන්ම දත් ඉතා නුවණැතිවූ ඒ මහෞෂධ පණ්ඩිතයෝ වෙදෙහයා මරණ භයින් තැති ගෙන පීඩිතව වලප්න වූව මෙසේ කියා සන්හිඳුවූවෝ වේදූ යි වදාළසේක. එසේ හෙයින් කියන ලදී.

මා ත්වං භායි මහාරාජ, මා ත්වං භායි රථෙසභ
අහං තං මොචයිස්සාමි, රාහුගහිතංව චන්දිමන්ති.

මහරජ! තො බා වදාල මැනව. රථයොධයාණන් වහන්ස! නොබා වදාල මැනව, මේ එක් සියයක් රජුන් හා අටළොස් අක්ෂෞහිණී සඞ්ඛ්‍යාත මේ මහා සෙනාව වටලාගෙන සිටියදී රාහු මුඛයට වන් සඳමඬල ගලවා ගන්නාසේ නුඹවහන්සේ ගලවා ගනිමි.

මා භායි මහාරාජ, මා භායි රථෙසභ
අහං තං මොචයිස්සාමි, රාහුගහිතංව සූරියනානි.

තවද සාරදහස් අටසියයක් යොදුන් උස ඇති රාහු මුඛ ප්‍රාප්තවූ සූර්‍ය්‍ය බිම්බය ගලවා ගන්නාසේ මේ බ්‍රහමදත්ත රජ නමැති රාහු හස්ත ප්‍රාප්තවූ හිරුසේ තෙජස් ඇති වෛදෙහ රජ නමැති සූර්‍ය්‍යබිම්බය අමාත්‍ය මණ්ඩලය හා සමග ගලවා මියුලු නුවර ලා ලමි.

මා භායි මහාරාජ, මා භායි රථෙසභ
අහං තං මොචයිස්සාමි, පඞ්ක සත්තංව කුඤ්ජරනානි.

නොබා වදාල මැනව, රථොත්තමවූ රාජොත්තමයන් වහන්ස! නොබා වදාල මැනව, තවද මේ සෙනාව වටලාගෙන සිටිය දීම මහමඩෙහි එරී ගිය ඇතක්හු ගොඩ නඟන්නාක්හුසේ ගලවා මියුලු නුවර ලාලමි. තවද මේ සේනාව මෙසේම පිරිවරා සිටියදී උන්ගෙන් කිසි කෙනකුන් නොදන්නා පරිද්දෙන් පෙලා වේ හසුවුනු නයකු ගලවා ගන්නාසේ බ්‍රහමදත්ත රජ නමැති අහිතුණ්ඩිකයාගේ සෙනාව නමැති පෙලායෙහි හසුවූ ක්‍රොධ නමැති විෂයෙන් ආර්ද්‍රවූ වෛදෙහ නමැති නාගරාජයා ගලවා ගෙන ගොස් මියුලු නුවර ලාලමි.

තවද මහරජ! සෙනාව වට පිරිවරා සිටියදී උන් හැම නො දන්නා පරිද්දෙන් මැදිරියක හසුවූ පක්ෂීන් ගලවා හරනාසේ නුඹවහන්සේ ගලවා මේ සෙනාවත් අනායාසයෙන් සුවසේ ගලවා ගෙන ගොස් මියුලු නුවර ලාලමි. තවද මහරජ! නොබා වදාල මැනව. දැලක හසුවූ කුඩමස්සකු ගලවා හරනාසේ නුඹවහන්සේ හා මේ රාජ සෙනාව මහා සනෙනාෂයට පමුණුවා සුවසේ ගලවා ගෙන ගොස් මියුලු නුවර ලාලමි.

තවද මහරජ! නොබා වදාල මැනව, නුඹවහන්සේ මතු නතිව ගලවා ලතියි නොසිතුව මැනව. නුඹවහන්සේ හා කැටිව ආ ඇත්, අස්, රථ, පදාදී සේනාවෙන් එකක්හටත් මේ සතුරන්ගෙන් කිසි උපද්‍රවයක් විය නොදී සුවසේ ගලවා ගෙන ගොස් මියුලු නුවර ලාලමි.

තවද මහරජ! තොබා වදාළ මැනව. රජෝත්තමවූ රාජශ්‍රෙෂ්ඨ යාණන් වහන්ස! තොබා වදාළ මැනව. ඉදින් සිතීම් නම් මේ එක් සියයක් රජදරුවන් හා අටළොස් අක්ෂෞහිණියක් පමණ රාජ සෙනාව අන් කෙනකුන්ගේ උපදෙශයක් හා සටනට කළමනා යුද්ධ ප්‍රයොගයක් නැතිව මාගේ ප්‍රඥා බලයෙන්ම කැටක් දමා කපුටු සමූහයක් තෙරපාසේ පලවාපියන්ටත් මට බැරි නොවෙයි. නුඹවහන්සේ තොබා වදාළ මැනවැයි අස්වැසූසේක.

සෙස්සවුන්ගේ බසින් නුවණින් ප්‍රයෝජන කිම්ද? අමාත්‍යයෝ නමුත් නුවණැත්තෝ නමුත් මෙබඳුවූ දුකෙහිදී පිවිවහල්ව ඒ දුකින් මුදාලන්නාවූ උත්තමයෝ වේද?

> ආදූ පඤ්ඤා කිමත්ථියා, අමච්චා වා පිතාදයො
> යො ත්වං සම්බාධ පක්කන්තං දුක්ඛා තං පරිමොචයෙ'ති

මෙසේද කියා තිලෝගුරු බෝධිසත්වයන්වහන්සේ වදාරන සේක් මහරජ! නුඹවහන්සේට පළමු මා කුමක් පිණිස ආහයි සිතූසේක්ද? නුඹවහන්සේට මතු වන්නාවූ මේ භය එදවස්ම මාගේ ප්‍රඥා නමැති දිවැසින් දුටුවාවූ මා තවතාත් නොනවත්නා හෙයින් දූන දූන නුඹවහන්සේ නැසී යාදී හිඳීම මට තරම් නොවෙයි සිතා මට උදහස් වුවත් ඒ මා සිත නොතබා නුඹවහන්සේට පළමු අවුත් සාර මසක් මුළුල්ලේ මී හිඳ කුමක් කළහයි සිතූසේක්ද? මහ රජ! තොබා වදාළ මැනව. සුවසේ ගලවාගෙන ගොස් මියුලු නුවර ලා ලම්යි වදාළසේක.

බොධිසත්වයන් වහන්සේ ශඞ්කා රහිතව කිසි සැකයක් නැතිව සැට යොදුන් රන්ගල් මුදුනෙහි සිංහනාද කරන අභීත කේශර සිංහරාජයකුසේ කිසි භයක්වත් තැති ගැන්මක්වත් නැතිව කියන්නාවූ බස් අසා වෙදෙහ රජහු මෙවිට මාගේ ජීවිතය ලදිම්යි අතිශයින් සතුටුව අස්වැසී ගත්හ. බොධිසත්වයන් වහන්සේ මෙසේ සිංහනාද කළ කල්හි සෙනකයා ආදීවූ බොහෝ දෙනා සතුටුව ගියහ.

මාගේ ස්වාමිදරුවූ බොධිසත්වයන්වහන්සේ තොබව. තොප හැම සුවසේ ගලවා ගනිම්යි කියත්ම ඉක්බිති සෙනකයා මහා ආශ්චර්යයට පැමිණ ස්වාමීනි! ඔම්සා සේනාවක් අවුත් තුන් සඞ්ඛියකින් හා සතර වළල්ලකින් අතුරු සිදුරු නැතිව වටලා ගෙන සිටියදී කවර උපායකින් ගලවාගෙන යනසේදැයි කිය. එම්බල සෙනකය! මේ සතුරන් ලුහුබඳවා පියා වාසල් දොර හැර පිටත්ව සතුරන් බල බලා සිටියදී යන්නෙම් වී නමුත් මට බැරිනොවෙයි.

එතෙකුදු උවත් උන් හැම නොදන්නා පරිද්දෙන් සරහනලද උම ඟින් ගෙන යෙම් වදාළසේක. මෙසේද කියා සෙනකය! තෝ ගමනට සැරසී ගනැයි වදුරා උමඟ දොර හරනට තමන්වහන් සේගේ යොධයන්ට විධාන කරනසේක්.

එථ මානව උට්ඨෙථ, මුඛං සොධෙථ සන්ධිනො
වෙදෙහො සහ මච්චෙහි, උම්මඞ්ගෙන ගමිස්ස තීති.

මෙසේද කියා වදාරනසේක් මාගේ තුරුණු යොධයිනි! නැඟී සිට මෙසේ එව, මා කියන්නක් අසව, වෙදෙහරජ්ජුරුවෝ අමාත්‍ය මණ්ඩලය හා සිවුරඟ සෙනඟ ගෙන උමඟින් යන්නාහ. එසේ හෙයින් ගොසින් මහඋමඟ අසූ මහ දොරද, සූසැට සුළු දොරද, එක් සියයක් සිරියහන් ගබඩාවල දොරද, ලක්ෂ ගණනක් පහන් ගබඩාවල දොරද, වහා අරුවයි වදාළසේක. "තෙ උට්ඨාය උම්මඞ්ගස්ස ද්වාරං විවරිංසු. සකල උම්මඞ්ගො අලඞ්කත දෙව සභා විය විරොචි" වදාළ බැවින් ඒ අසා යොධයෝ නැඟී සිට උමඟ දොරවල් මුළුල්ල අගුළු හළහ. සියලු උමඟ එකාලොකව අලඞ්කෘතවූ දිව්‍ය සභාව මෙන් බැබලුනේ විය. බොධිසත්වයන් වහන්සේගේ විධානයෙන් ගොස් යොධයන් උමඟ දොර හළ නියාව ප්‍රකාශ කොට වදරන බුදුරජාණන්වහන්සේ මෙසේ වදරනසේකි.

තස්ස තං වචනං සුත්වා, පණ්ඩිතස්සානුකාරිනො
උම්මඞ්ගද්වාරං විවරිංසු, යන්තයුත්තෙ ච අග්ගළෙ'ති.

එම්බා මහණෙනි! මහෞෂධ පණ්ඩිතයන්ගේ සුශික්ෂිතවූ කිංකරුවූ යොධයෝ ඒ පණ්ඩිතයන්ගේ තීක්ෂ්ණවූ ප්‍රඥයෙන් කරනලද උමඟ යන්ත්‍ර යුක්තවූ දොර හැර ඒ බව බොධිසත්වයන්ට කිහයි වදාළසේක.

ඒ බව අසා බොධිසත්වයන්වහන්සේ වැඩිය මනා කලැයි වෙදෙහ රජ්ජුරුවන්ට කල් දන්වූසේක. රජ්ජුරුවෝ මාලිගා වෙන් බටහ. එවිට සෙනකයා එදවස් අමරාදේවීන් නිසා තමා ලත් තොප්පිය[1] ඉසින් ගලවා කෝනමක් තරව හැඳ ගිණ කඩ හකුළුවා තමා සිත බයව හන්කඩ පොට්ටනියක්සේ අල්වාගෙන ඇත් මෑත් බල බලා ඉඟිකරුව සැලෙයි. කඩ ඉරා දණ වැලම්ට් කළල් ආදිවූ සථානවල නොබැන්දයි නොසිතමි. මූගේ මේ සියලු විකාර බොධිසත්වයන්වහන්සේ දැක නුවණ නැති සෙනක නම් ජඩය! නෙල කුමක් කෙරෙයිදැයි විචාළසේක. පණ්ඩිතයන්වහන්ස!

1. ඉස්පසිය

උමඟින් යනකල තම් කෝනමක් හැඳගෙන හන් පලන් වස්ත්‍රාභර ණාදී සියලු අලඞ්කාර තබා දණ නමා බඩගාගෙන වේද යන්නේ. එසේ හෙයින් මවුත් උමඟින් යන්නට සැරහෙමියි කීය. භාගවත් වදා රනසේක් එම්බල සේනකය! වැලිත් උමඟට වදනා තෝ තැබුරුව ගෙන දණ නමා බඩගාගෙනද යන්නේ. හොයකුසේ යෙමැයි නො සිතා තෝ ඉදින් ඇතකු පිටින්වත් අසකු පිටින්වත් රථයකින් වත් යන්නා කැමැත්තෙහි වීනම් ඉන් තමා කැමති වාහනයකට නැඟී ගෙන යව. මාගේ උමඟ උස වඩුවෙන් අටළොස් රියනකට වඩා උස ඇත්තේය. ඉතා උස්වූ පළල්වූ වාසල් හා දොර ඇත්තේය එබැවින් තෝ උමඟින් යන්නට සැරහී ගෙන කෝ නම් නොගෙන දණ කඩ නොබැඳ සැරහෙන යම් අලඞ්කාරයකින් සැරහී කැමති වාහනයකට නැඟී රජ්ජුරුවන්ට පළමු නික්මෙවයි වදාළසේක.

බොධිසත්ත්වයන් වහන්සේ ඒ ඉතා භය පුද්ගලවූ සේනකයා පළමුව යන්ටත් රජ්ජුරුවන් මධ්‍යයෙහි. යන්ටත් ස ලකොට ලා තමන්වහන්සේ පසුව ගත්සේක. ඒ කුමක් නිසාදයත්? සේන කයා තරව බා ගියෙන් කිසිවෙකත් ආලයක් නොකොට පසු නො බලා දිවන්නේය. රජ්ජුරුවෝ සරහනලද උමඟ තමන් තුඳුටුවිරූ විසතර බලා මරණ භය නැතිව ගොස් සෙමින් සිට යෙති සිතාය. එබැවින් තමන් වහන්සේ මහරජ! වහා වැඩිය මැනව, වහා වැඩිය මැනවැයි කන් සන් කොට කොට ගෙන යන පිණිස රජහට පසුවූ සේකැයි දතයුතු.

ඒ උමඟ ඇතුළෙහි මහා ජනයාට කෑද අවුළුපත් බත් බුලත් ආදීවූ ඛාද්‍ය භොජ්‍ය මෙතෙකැයි පමණ නැති විය. එහි මනුෂ්‍ය යෝ කන්නාහු බොන්නාහු උමඟ විසතර බලමින් මහා සන්තොෂ යෙන් යන්නාහ. බොධිසත්ත්වයන් වහන්සේ වැඩිය මැනව මහරජ; වැඩිය මැනව මහරජ! යි කන්සන් කෙරෙමින් රජහු පස්සේ යන සේක. රජ්ජුරුවෝ සුදම්දෙව්සබයසේ ඉතා සිත් කලුවූ උමඟ විසතර බලමින් යන්නාහ. උන් හැම එදා උමඟින් ගිය පරිදි වදා රන බුදුරජාණන්වහන්සේ.

පුරතො සෙනකො යාති, පච්ඡතො ච මහොසධො
මජ්ඣෙ ච රාජා වෙදෙහො, අමච්චපරිවාරිතො’ති.

වදාරනසේක් එම්බා මහණෙනි! එදවස් උමඟින් යන ගමනේ සේනකයා පළමුයෙහි මහෞෂධ පණ්ඩිතයෝ පස්සෙහි යෙති. දෙනනා මැද වෛදෙහ රජ අමාත්‍ය මණ්ඩලය පිරිවරා නික්මිණැයි

වදාළසේක. රජ්ජුරුවන් හා මහෞෂධ පණ්ඩිතයන් හා අා තියාව දූත රැකවල සිටි යෝධයෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මෑණියන්ද, අගමෙහෙසුන් බිසවුන්ද, පුතණුවන්ද, දියණියන්ද යන සතර දෙනා උමඟින් පිටත් කොට මහවිසල් මලුවෙහි සිටුවාලූහ.

රජ්ජුරුවෝත් බොධිසත්ත්වයන්ද හා සැටිව උමඟින් පිටත්වූහ. ඔහු සතර දෙන බොධිසත්ත්වයනුත් රජ්ජුරුවනුත් දුක ඒකාන්ත යෙන්ම සතුරන්ට අත්පත් වූම්හ. අප ගෙනාවන් පණ්ඩිතයන් ගේ යොධයන් සැටියයි මරණ භයින් තැතිගෙන මහ හඬින් හැඬූහ. එවේලෙහි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ වෙදෙහරජු පලායෙති යන ක්‍රොධයෙන් එනුවර වට තුන්ගවුවක් මාතයේ රැකවල් ලවා අවුත් බරණැස හාංතොරට තුදුරු තෙතෙක්හි සිටියාහු නිශ්ශබ්දව තුබූ මධ්‍යම රාත්‍රියෙහි ඒ ඇඬූ ශබ්දය අසා තනුදේවීන්ගේ කට හඬක් වන්නැයි කිම් තම් කොයිද? තනුදෙවියයි ගිය යම් ‍තොතක තනු දෙවීන් සඳහන් නොකොට නොහිඳිනා දුයයි. අනුන් කියන බසට ලජ්ජායෙන් කාටත් නොකිහ.

බොධිසත්ත්වයන් වහන්සේ මහ විසල් මලුවෙහි උන්ගෙන්ම ගෙනා රුවන් රැසක් පිට සිටුවාලා පඤ්චාලචණ්ඩි කුමාරිකාවන් අභි ෂෙකයට පමුණුවා රන්කෙණ්ඩියෙන් සුවඳ පැන් ඉස වත්කොට මහරජ! නුඹවහන්සේ මේ කුමාරිකාව සොයා අවුදින් මේසා මහත් භයකට පැමිණිසේක. එබැවින් නුඹවහන්සේට අගමෙහෙ සුන් වන්නීයයි වදාළසේක. සඟවා තුබූ තුන්සියයක් නැව් එවේ ලෙහි කෙවුලෝ ගෙනවුත් තොටට බාලූහ. රජ්ජුරුවෝ මහ විසල් මලුවෙන් ගොස් සරහනලද නැවකට නැංගාහ. බ්‍රහ්මදත්ත රජ්ජු රුවන්ගේ මෑණියන් ඇතුළුවූ රජ දරුවෝ සතර දෙනාත් එම නැවට නැංගාහ. බුදුව වැඩහිඳ අර්ථ ප්‍රකාශකොට වදාරන්නාවූ බුදුරජාණන්වහන්සේ.

උම්මඟා නික්ඛමිත්වාන, වෙදෙහො නාවමාරුහි
අභිරූළ්හඤ්ච තං ඤත්වා, අනුසාසි මහොසධො.

අයං තෙ සසුරො දෙව, අයං සස්සු ජනාධිප!
යථා මාතු පටිපත්ති, එවං තෙ හොතු සස්සුයා.

යථා'පි නියකො භාතා, සොදරියො එකමාතුකො
එවං පඤ්චාලචණ්ඩො තෙ, දයිතබ්බො රථෙසභ!

අයං පඤ්චාලචණ්ඩී තෙ, රාජපුත්ති අභිච්ඡිතා
කාමං කරොහි තෙ තාය, භරියා තෙ රථෙසභාති.

මේ ගාථා වදාරා එම්බා මහණෙනි! එදවස් වේදේහ රජ උමඟින් පිටත්ව නැවට නැංගේය. ඔහුට මහෞෂධ පණ්ඩිතයෝ මෙසේ අවවාද කළහයි වදාළසේක. කෙසේදයත්? මහරජ! මේ පඤ්චාල කුමාරයෝ නම් නුඹවහන්සේගේ සුහුරු බඩු වූය. මේ නන්දාදේවී නම් නුඹවහන්සේගේ නැන්දණියෝය. ඒ නැන්දණියන් කෙරෙහි වැදූ මෑණිකෙනකුන්ට කරන ආදරයක් පරිද්දෙන් පිළිපැද්ද මැනව. පඤ්චාල චණ්ඩ කුමාරයන් සුහුරුබඩු ණුවෝයයි ආලිස්සන් නොවී එක් කුසින් උපන් මල්බෑ කෙනකුන් පරිද්දෙන් දයා කටයුතුය මේ පඤ්චාලචණ්ඩි කුමාරිකාවෝ නම් උභයකුල පරිශුද්ධ ක්‍ෂත්‍රිය කන්‍යාවෝය. උන් නුඹවහන්සේ කැමති පරිද්දෙන් රාජෛශ්වර්යයෙහි පිහිටුවා රක්‍ෂාකළ මැනවැයි වදාළසේක.

මෙසේ අනුසාසනා කෙළේ කුමක් පිණිසදයත් ? සරණ දෙම්හයි අප මායමින් ගෙන්වාගෙන මේසා මහත් භයකට පමුණුවා ගහට කළ රජුගේ මව මරව, අඹුදරුවන් මරවයි කියා මැරවූ සේක්නම් නපුරැයි සිතාත් දුවණියන්ට වඩා නන්දාදේවින් අධික රූ ඇතිහෙයින් කාමයෙන් අන්ධවූ මොහිවූ මූළාවූ රජ්ජුරුවෝ දුවණියන් තබා මෑණියන් කෙරෙහි ලොභ උපදවා නැකම් වරදවා පිනම් නපුරැයි සිතා පළමුකොට රජු අතින් ප්‍රතිඥා ඇරගත්හයි දතයුතු.

රජ්ජුරුවෝත් පුත! තොප කී ලෙසින් කිසිවකුත් නොවර දවා කෙරෙම්හයි ඔබගේ අවවාද සිහින්ම පිළිගත්හ. මෙසේ අවවාද කරනසේක් රාජමාතාවන් තලතා දේවින්ගේ නමකුත් නොවදාළ සේක. කුමක් පිණිසද යත්? උන් මැහැලිහෙයින් කිසිව කුත් නොවදාළසේක. මේ සියලු කළමනා වත් බොධිසත්වයන් වහ න්සේ ගංතෙරදී ගොඩසිටම වදාළසේක.

ඉක්බිති රජ්ජුරුවෝ මහා දුකින් මිදුනහයි නැවින් වහ වහා යනු කැමතිව පුත! තොප ගොඩසිටම දෙඩව්ද? වහා නැවට නැගෙව! කුමක් නිසා ගොඩ සිටුද? සතුරන් අතින් දුකසේ මිදු නමහ. එබැවින් වහා නැඟ යම්හයි රජ්ජුරුවෝ කිහ.

ආරුය්හ නාවං තරමානො කිංනු තීරම්හි තිට්ඨසි
කිච්ඡාමුත්තම්හ දුක්ඛාතො යාමදානි මහොසධාති.

මේ ගාථාව අසා දේවයන්වහන්ස! නුඹවහන්සේ හා එක්ව නැඟී යාම යුක්ති නොවන්නේයයි කියා වදුරනසේක්,

නෙස ධම්මො මහාරාජ! යොහං සෙනාය නායකො
සෙනඞ්ගං පරිහාපෙත්වා අත්තානං පරිමොචයෙ.

තිවෙසනම්හි තෙ දෙව! සෙනඞ්ගං පරිහාපිතං
තං දිස්වාං බ්‍රහ්මදත්තෙන ආනයිස්සං රථෙසභාති.

යනාදි ගාථාවෙන් කියනසේක් මහරජ! සෙනාවට නායක එකෙක් සේනාව සතුරන්ට අත්පත්වූ කල තමා දන්නා යම් උපායකින් ඒ සේනාව ගලවාගෙන යාමක් වත් නොයොත් එක්ව නැසියාමක් වත් නොකෙළේ වීනම් උන්ගේ සේනානායක කමින් ප්‍රයෝජනයක් නම් නැත්තේය. ඒ තමාම ධම්මිෂ්ඨ කමෙක් නොවන්නේය. දැන් මාත් සේනානායකව අවුත්, සේනාව සතුරන්ට හස්තප්‍රාප්තව ඇතුළු නුවර හින්දදී අප වැන්නෝත් තනිව දිවි රැකගන්නෝද? මහරජ! නුඹවහන්සේහා කැටිව සාරසියයක් ගවු ගෙවා ආ සේනාවෙන් සමහර කෙනෙක් මාර්ගයෙහි ගමනින් ශ්‍රාන්තව නිදන්නාහ. සමහරු අන්නපානාදියෙන් සන්තුෂ්ටව මේගමන් තමාම නොදන්නාහ. තවද මාහා කැටිව ආවුන්ගෙන් සාරමසක් මුළුල්ලේ උමඟ හා නුවර අගල පවුරු පදනම් ආදී සියලු කර්මාන්තකොට රැපාන අනවරතයෙන් දුක්ගෙන විඩා වූවාහු මේ එන නියාව උයිත් නොදන්නාහ.

එබැවින් උන් හැමටම උපකාරව සිටියන්ගෙන් එකකුත් හැරපියා එන්නට මට තරම් නොවෙයි. ඒසියලු සේනාව බ්‍රහ්මදත්ත රජහු ජයගෙන උන්ගෙන් දූන්සේනාවක් පරිද්දෙන් නැවත හැරගෙන එම්හ. මහරජ! නුඹවහන්සේ අතර මාර්ගයෙහි ඇසිල්ලකුත් නොරඳා වහා වැඩිය මැනව. පළමු මාවිසින් එන කල අතර මග නුඹවහන්සේට සතරගවුවකට ගමක් බැගින් මේ අතුරේ සාරසියයක් ගවුවට ගම් සියයක් කරවා වස්ත්‍රාභරණ අන්නපාන යෙන් සමෘද්ධකරවා ඇත්, අස් ආදීවූ වාහන සරහා සිටුවනලද. ඒ ගමින් ගමට පැමිණි කල කැටිව යන වාහනයෙන් දුර්වලයන් එහි රඳවා එහි සිටි වාහනයකට නැඟී වහා මියුලු නුවරට වැඩිය මැන වැයි වදාළසේක. ඒඅසා රජ්ජුරුවෝ කියන්නාහු,

අප්පසෙනො මහාසෙනං සාථං විගය්හ හඤ්ඤසි
දුබ්බලො බලවන්තෙන විගණ්හිස්සසි පණ්ඩිතාති.

පුත මහෞෂධ පණ්ඩිතයෙනි! තොපගේ සේනාව මඳවූව, බ්‍රහ්මදත්තයන්ගේ මහා සේනාවය. කෙසේ ජය ගනුද? බලවත්ත යෝ දුර්වලයන් නසාපියා මහා විනාශයට පමුණුවාපියන්නාහයි කීය. ඒ අසා බොධිසත්ත්වයන්වහන්සේ වදාරනසේක්

අප්පසෙනො'පි චෙ මන්තී, මහාසෙනං අමන්තිනං
ජිනාති රාජ! රාජානො ආදිච්චො වුදයං තමන්ති.

යන මේ ගාථාවෙන් මහරජ! ඇසුව මැනව. මහා සෙනාව ඇතිවත් අමන්ත්‍රි තැනැත්තහු මඳසෙනාව ඇති මහාමන්ත්‍රියා ජය ගන්නේය. එබැවින් අමන්ත්‍රිවූ බ්‍රහ්මදත්ත රජහුගේ එක් සියයක් රජුන්හා අටලොස් අක්ෂෞහිණී සංඛ්‍යාත මහාසේනාව මහාමන්ත්‍රිවූ මම මාගේ ප්‍රඥ බලයෙන් ජය ගනිමි.

තවද අමන්ත්‍රිවූ කෙවට්ටයා ඇති මහා සෙනාව සහිතවූ බ්‍රහ්මදත්ත රජහු මහා මන්ත්‍රිවූ මා වැනි එකක්හු ඇති මඳ සෙනාව සහිතවූ නුඹවහන්සේ ජය ගන්නාසේක. ඒ කුමක්මෙන්දයත්? සමස්ත ලොකයෙහි එක පැතිර පවත්නාවූ මහා අන්ධකාරය හිරු උදකල කල්හි ඒ අඳුරු එක පැහැර දුරුව ආලොකවූ කලක් පරිද්දෙන් සෙනාව මඳ වුවත් ජය ගන්නෙම් මම්මය. නුඹවහන්සේ සැකයක් නොසිතා වැඩිය මැනවැයි වදරා රජ්ජුරුවන් වැඳ රැඳුනුසේක.

ඉක්බිති රජ්ජුරුවෝ සතුරන් අභිනුත් මිදුනම්හ. ගොයා ආ බිසවනුත් ලදුම්හයි අපගේ මනදෙළ මුදුන් පැමිණියේයයි බෝධිසත්ත්වයන් වහන්සේගේ ගුණ සිහි කොට උපන්නාවූ පස්ව නක් ප්‍රීතියෙන් පිනා ඔබගේ ගුණ සෙනකයාට කියන්නාහු ගාථා වකින් කියත්.

සුසුඛං වත සංවාසො පණ්ඩිතෙහී'ති සෙනක!
පක්ඛී'ව පඤ්ජරෙ බද්ධෙ මච්ඡෙ ජාලගතෙරි'ව
අමිත්ත හත්ථත්තගතෙ මොචයී නො මහොසධොති.

සෙනකය! නුවණැත්තවුන්හා එක්ව විසීම මහා යහපත් වන්නේය. මෙලොවිනුත්, පරලොවිනුත් සැප වන්නේය. මැදිරියෙහි බැඳි පක්ෂීන් මෙන් දැල බැඳි මසුන් මෙන් එපරිද්දෙන් සතුරන් අත්පත්වූ අප හැම ඳදනම මහෞෂධ පණ්ඩිතයෝ ගලවා හැරපීහ.

එබැවින් තුවණැත්තවුන් හා එක්ව විසීම උතුමැයි මූබ නොසෑ හෙන පරිද්දෙන් ගුණ කිහ. ඒ අසා සෙනකයා තමා ඇතිවක් පවත් මහතාණන්ගේ ගුණ කියන්නේ මේ ගාථාවෙන් කීය.

එවමෙතං මහාරාජ! පණ්ඩිතා හි සුඛාවහා
පක්ඛී'ව පඤ්ජරෙ බද්ධෙ මච්ඡෙ ජාලගතෙරිව
අම්හාකං හත්ථගතෙ මොචයී නො මහොසධො'ති.

ඒ සැබව මරහජ! ඉතා සබාමය. නුවණැත්තවුන් හා එක්ව විසීමම ඉතා සැප වන්නේය. මැදිරියේ අසුවුණු පක්ෂීන් මෙන් දැල බැඳි මසුන් මෙන් එපරිද්දෙන් සතුරන් අත්පත්වූ අප හැම මහෞෂධ පණ්ඩිතයෝ සුවසේ ගලවාපීහයි කීය.

ඉක්බිති වෙදෙහ රජ්ජුරුවෝ ගඟින් එතෙර බැස බෝධි සත්වයන් වහන්සේ විසින් යොදුනෙන් යොදුනට කරවන ලද ගම් වලට වැද පැමිණ ඔබ විසින්ම පළමුවෙන් විධාන අසාගත් මනුෂ්‍යයන් විසින් සපයා එළවනලද ඇත් අස් ආදී වාහන හා අන්නපානාදියෙන් හා නොයෙක් මාගීයෙහි කන බොන දෑ බොහෝ ගෙයින් සන්තුෂ්ටව ගමන් විඩාවූ වාහන එහි රඳවා නවමු වාහනවලට නැගී යන්නාහු ගමින් ගමට පැමිණ මහතාණන්ගේ විධානවූ පරිද්දෙන්ම මාගීවිඩා සංසිඳුවාගෙන නොපමාව යන්නාහු සාර සියයක් ගවු ගෙවා දෙවන දවස් පෙරවරු බතට මියුලු නුවරට වන්හ.

තිලෝගුරුවූ ලොකනාථවූ ලොකස්වාමීවූ චින්තාමාණික්‍ය යක් බඳුවූ භද්‍රඝටයක් බඳුවූ කල්පද්‍රැමයක් බඳුවූ ආකාශයට වඩා අනන්තවූ ගුණ ඇති මහපොළොවට වඩා අචලවූ ගුණ ඇති මහ මෙරට වඩා උස්වූ ගුණ ඇති සාගරයට වඩා නැඹුරුවූ ගුණ ඇති හිරුට වඩා තේජස්වී ගුණ ඇති සඳුට වඩා සෞම්‍ය ගුණ ඇති අසාධාරණ සර්වබුද්ධි සම්පන්නවූ ගුණ ගණාඩගයෙන් උපලක්ෂිතවූ මාගේ ස්වාමිදරුවූ බොධිසත්වයන්වහන්සේ රජහු යවා උමංදොරට වැඩ තමන්වහන්සේගේ කර එල්වාගෙන ගිය මඟුල් කඩුව නොපු වෙන් මැත් කොට උමංදොර මහ විසල් මලුවෙහි වැලි පීරාපියා යට සඟවා තබා උමඟට වැද උමඟින් ගොස් තමන් වහන්සේ කරවූ උපකාරී නුවරට වැද සොළොස් කළයක් සුවඳ පැතින් ඉස් සෝද නහා නොයෙක් රසයෙන් අග්‍රවූ භොජනය අනුභව කොට යහන් මුදුනේ සැතපුණුසේක් මාගේ මනදෙළ මුදුන් පැමිණියේ යයි සිතා පස්වනක් ප්‍රීතින් පින පිනා සුවසේ සැතපුණුසේක. ඒ

රාත්‍රිය පහන්වූ ඇසිල්ලෙහි චූලනී රජ්ජුරුවෝ සේනාව මෙසෙ යන්නාහු නුවරට සමීපවූහ. ඒ රජහු සේනාවට විධාන කෙරෙමින් සැරහී ආ නියාව ප්‍රකාශ කොට වදාරන තිලෝගුරු බුදුරජාණන් වහන්සේ,

රක්ඛිත්වා කසිණං රත්තිං චූලනීයො මහබ්බලො
උදෙන්තං අරුණුග්ගමහි උපකාරි මුපාගමි.

ආරුය්හ පවරං නාගං බලවන්තං සට්ඨිහායනං
රාජා අවොච පඤ්චාලො චූලනීයො මහබ්බලො.

සන්නාහෙධං මණිවම්මෙන සර මාදාය පාණිනා
පෙසියෙ අජ්ඣභාසිත්ථ පුථුගුමෙබ සමාගතෙති.

වදාරතසේක් එම්බා මහණෙනි! බලවාහන සහිතවූ බ්‍රහ්මදත්ත රජ තුන්යම් රාත්‍රියෙහි තුන් සඬියකින් හා සතර වලල්ලකින් අතුරු සිදුරු නොපෑ සෙනාව සිටුවා ඒ ඒ ස්ථානයෙහි බලඇණි සිටුවා රැකවල් බලා ඇවිද අරුණු නැගී පාන්වන්නාහාම උපකාරී නුවරට ආය.

නවද පඤ්ච ප්‍රකාරවූ බලයෙන් යුක්ත ඒ බ්‍රහ්මදත්ත රජ සැට අවුරුද්දෙන් මද නැගී බල හිඳුනාවූ කන්පට තුන් තැනෙකින් පැළී තිබෙන්නාවූ සටනෙහි ජය බිම් අඳුනන්නාවූ ගිය ගිය තෙන සතුරන් බිඳ ජය ගැන්මට සමර්ථවූ මහ බලඇති සම්ලක්ෂණ සම්පන්නවූ සියලු රන්සැත්, රන්පොරොදු ආදී හස්ත්‍යලඞ්කාර යෙන් සරහනලද උතුම්වූ මඟුලැතක්හු පිටට නැගී මැණික් ඔබ්බා කරනලද මුදුවන් සන්නාහයක් ලමින් රුවන් වොසියක් බහා රුවන් ඔබ්බා විදුරු පුරා කරනලද කසිසරඹුවක් වමත බැඳ නාරාසියක් මාපට ඇඟිල්ලේ ලමින් සම්ලඞ්කාරයෙන් සැරහී මනහර හියොවුරක් පිට බැඳ මැඩහගු දුන්නක් අතින් ගෙන සඬ වස්වා කල විසිතුරු හි දණ්ඩක් නියපිට නටව නටවා, ඇතරුවන්, අසරුවන් රථ නියුක්තයන්වද ලක නොවරදවා විදිනලද දුනුවායන් ආදීවූ ධනුශශිල්පයෙහි දක්ෂවූ සන්නාහ සන්නඬ අනෙක ප්‍රකාර යොධයන්ට මෙසේ විධාන කෙරෙමින් නුවරට සමීප වීයසි වදාලසේක. ඒ රජහු සටනට සෙනාව මෙහෙයූ පරිදි සංක්ෂෙපයෙන් කියත්

හත්ථාරූහෙ අණීකට්ඨෙ රථිකෙ පත්තිකාරිකෙ
උපාසනමහි කතහත්ථෙ වාලවෙධෙ සමාගතෙ'ති.

ගාථාවෙහි අභිප්‍රාය නම් ඇතුන් නැඟෙන්නෝද, අසුන් නැඟෙන්නෝද, රථ නැඟෙන්නෝද, තවද පඤ්චායුධ සන්නද්ධව ආවාවූ පාබල මහා සෙනාවද ඉතුත් ධනුශ්ශිල්පයෙහි දක්ෂවූ කෘතහස්තවූ එක්වන් කරනලද අභ්‍යාස ඇති එසේහෙයින්ම කළු අස්ලෝමයක කරබටු පකක්[1] බැඳ දඬු බස්නා මානයෙහි දෙ දණ්ඩක් හිඳුවා එහි සරස බැඳි වියල දණ්ඩ බැඳ එල්වූ කරබටු පක විදුලිය ආදීවූ යම් කිසි ආලොකයකින් බටුපක එල්වූ කළු අස්ලෝමය පළා විදපියන්ට සමර්ථවූ යොධයෝ වහා සන්නාහ සන්නද්ධව එත්වයි කියාද, තවද චූලනී රජ්ජුරුවෝ කොල! වෛදෙහ රජු නොමරා අල්වා ගන්වයි කියන්නාහු මෙසේද කියත්.

පෙසෙළ කුඤ්ජරෙ දන්තී, බලවන්තෙ සට්ඨිහායනෙ
මද්දන්තු කුඤ්ජරා නගරං, වෙදෙහෙන සුමාපිතං.

වජ්ජන්තුවුඛා සෙනා තිඛිණගගා අට්ඨවෙඩිනො
පනුන්නා ධනුවෙගෙන සම්පතන්තු' තරීතරා.

මානවා වම්මිනො සූරා, චිත්‍රදන්තා යුනාවුධා
පක්ඛන්දිනො මහානාගා, හත්ථිනං හොන්තු සම්මුඛා.

සුත්තියො තෙලයොතායො – අච්චිමන්තා පභස්සරා
විජ්ජොතමානා තිට්ඨන්තු – සතරංසා විනායකානි.

මෙසේ විධාන කරන්නාවූ රජ්ජුරුවෝ සැට හවුරෙද්දෙන් මද හෙන්නාවූ වට මට මහත් දළ ඇති ශක්ති සම්පන්නවූ කුඤ්ජර යයි කියනලද බල සම්පන්න ඇතුන් නැඟි යොධයෝ ඇත් සමූහයන් සිය දහස් ගණන් අටලු වාසල් බිඳ සුණු විසුණු කොට ගෙන සෙන හඬසේ භයඞ්කාරවූ කුඤ්ච නාදයෙන් සතුරන් භය ගන්වමින් මෙම වෛදෙහ රජු නිසා මහෞෂධයා විසින් මවනලද මේ උපකාරී නුවර මේ අට්ලොස්රියන් උස පවුර මිරිකාපියවයි කියාද, එසේම අශ්වාලඞ්කාරයෙන් සරහන ලද්දාවූ ආජානීය කුලයේ උපන් දිව්‍ය පුත්‍රයන් මෙන් සැරහී පිට හිඳුනාලද අසරුවන් විසින් ගැවසී ගත් සුශික්ෂිතවූ මාගේ අශ්ව සෙනාව මහමුහුදෙහි රල පරිද්දෙන් සිවු දිශාවෙන් පවුර පැනගෙන ඇතුළු නුවර රට වැටෙත්වයි කියාද, තවද බාල වස්සන්ගේ දත්සේ ඉතා සුදුවූ තියුණු මුවහත් ඇති විදිනාකල ඇට පළා විද මුත් මැනක නොරදන්නාවූ ධනුශ්ශිල්පයෙහි හිසකේ ලොම් පළා විදිනට සමර්ථවූද, විදුලි ආලොකයෙන් සියක් රියනේ තුබූ ලක විදින්ට සමර්ථවූද, බැණ නැඟෙන හඬින් එකට විදින්ට සමර්ථවූද, හීදණ්ඩහි හීදණ්ඩ අවුනා බස්නා ගන වැස්සක්මෙන් ඊ ඊ පිට විදින්ට සමර්ථවූදයි

1 කරබටුව

මෙසේ නොයෙක් ප්‍රකාර ඇති තුන් සියසැටක් රණයෙහි දක්ෂවූ සජ්ජාලඞ්කාරයෙන් සැරහුණු මාගේ රථයෙහි නියුක්ත දුනු ගත් සේනාව සිවු දිශාවෙන් අඩා බස්නා බමරුන් පරිද්දෙන් බබලන්නාවූ දේහෝ නොහොත් ඝන වර්ෂා පරිද්දෙන් ශර වර්ෂා වස්වයි කියාද, තවද මණි කවචයෙන් සන්නද්ධවූ සංග්‍රාමයෙහි සූර වීරවූ විචිත්‍ර කර්මාන්තයෙන් යුක්ත දඬු ඇති අසි ශක්ති තොමරාදී අනේක ප්‍රකාර පඤ්චායුධ සන්නද්ධව සටනෙහි අඹි[1] පසු නොලා ඉදිරියටම දිවන්නාවූ තමන් ඉදිරියෙහි ඇතුන් දුටත් දළ අල්වාගෙන වෙවුල්වා පියන්ට සමර්ථ යොධයෝ වහා තික්මෙත්වයි කියාද, තුන් සණ ගහා තෙල් ගානාලද්දාවූ එසේ හෙයින් පැහැපත්ව බබලන්නාවූ ඔසධී තාරකාවන් පරිද්දෙන්ද නොහොත් විදුලිය පරිද්දෙන් කඩු පහර කෙරෙමින් බලසම්පන්න යොධයෝ වහා එත්වයි කියාද, "ආයුධ බලවන්තානං ගුණකායූර ධාරීනං එතාදිසානං යොධානං සංගාමෙ අපලායිනං වෙදෙහො තු නො මිද්ධිස්සති. ස වෙ පක්ඛීව කාහසී"ති. තවද ආයුධම බල කොට ඇත්තාවූ නොහොත් බල වත් ආයුධ ගත්තාවූ නා නා වර්ණ සන්නාහයෙන් සන්නද්ධවූ රන්පට රුවන්සෝළු කර්ණකුණ්ඩලා කාඹක නාගවඬම් කාදූ කාප්පු මුතුපට කර්වෝඩම් හා හුදණ්ඩ මිණිවලලු කටුවළලු මණි කයිවඩම් පස්රුවන්වැල රන්සවඩි පාදසඞ්ඛ ජාලා පාදාභරණ ආදීවූ නොයෙක් ආභරණ පලඳනා ලද්දාවූ සටනෙහි පිටි පා නොයන්නාවූ මාගේ යොධයන් අතින් වෙදෙහ නම් රජ කෙසේ නම් මිදී පලායන්නේද? ඉදින් කිසි දෛවයකින් පක්ෂියා මෙන් පලා ආකාශයෙන් යේ නමුත් මාගේ දුනුවා යෝධයෝ යා නොදෙන්නාහ.

නැවත මාගේ සියයෙන් දශ දෙනා තෝරන්නාසේ තෝරා ගත් තිස්නවදහසක් පමණ යොධයෝ සංග්‍රාමයට සිස් අතින් ගියාහු වී නමුත් සතුරන් අත ආයුධ උදුරාගෙන සතුරන් කාදා ගන්නාහ. උන් හා සමාන එකකුත් දඹදිව එකරජක්හු සමීපයෙන් මා දකින්නෙත් නැත. එබඳු යොධයන් ඇත්තේ තමාගේමය. උයිත් සන්නාහ සන්නද්ධව පඤ්චායුධ ගත් අත් ඇතිව වහා එත් වයි; තවද රන් සන්නාහයෙන් සරහනලද බල සම්පන්න ඇතුන් පිට හුන්නාවූ දෑකුම් ඇති රාජකුමාරවරුත් වහා ඇතුන් මෙහෙ යත්වයි, තවද රන්වන් පිළී හැඳ සවර්ණාභරණයෙන් සැරහී රන් වන් අඞ්ගරාග ඇඟ ගල්වා පඤ්චායුධ සන්නද්ධව රන්සැත් රන්

2 එඹ

පොරොදු ආදී සවර්ණාලඞ්කාරයෙන් සරහනලද ඇතුන් නැඟී නඳුන්වන උයන් කෙළියට නික්මුණු දෙව සමූහයන් පරිද්දෙන් අසමානවූ රූ ඇති තරුණ යෝධයෝ සිය දහස් ගණන් වහා එත්වයි?

තවද පෙටියන්ගේ බඩ පැහැ සමාන වර්ණ ඇති සහස් කොට ධාරා නගනලද නුවණැති පුරුෂයන් විසින් සුතීක්ෂ්ණ කොට තුන් සණ ගගා නිමවනලද සුලඟින් කඩු මුවහතට හසුවූ පුළුන් රලක් වුවත් සිඳී යන තරම් තීක්ෂ්ණවූ මුවහත් ඇති මධ්‍යාහ්නයෙහි සූර්යබිම්බමණ්ඩලය මෙන් බබලන්නාවූ යහපත් කොට කරනලද කඩුගත්තාහුද (ඒ කෙසේ වූ කඩු ජාතියක්දයත්? එහි වෙනස මෙසේ දතයුතු. ජාති වානේ කැටි පීරෙන් හා සුණුකොට ඒ සුණු දඩමස් හා එක්කොට හනා ඒ මස් කොස්ලිහිණියන් කවා උන් ලූ වසුරු දවා වානේ ගෙන නැවත හා පළමු පරිද්දෙන් හනා එම පක්ෂීන් කවා මෙපරිද්දෙන් සත් වාරයෙක කවා දවා ගත් වානෙන් කළ කඩුයයි දතයුතු.) මෙබඳු කඩු ගත් යොධයෝ සතුරන්ට නොවරදවාම පහර දෙන්නාවූ රත්වූ කොපුයෙන් හදනාලද කඩු ගෙන වහා එත්වයි?

තවද මාගේ අසමානවූ තිස්දහසක් පමණ පතාක යොධයෝ වහා එත්වයි, ඔහු කෙසේවූ යොධකෙනෙක්දයත්? යම්සේ මාර සෙනාවක් බඳුවූ සතුරු සෙනාවක් අගල පවුරු අට්ටාල බලකොටු වාසල් සහිත අයොධ්‍ය පුරය හා සමාන එක් නුවරක හුන්නාහු නමුත් මේ මාගේ පතාක යොධයෝ ඉන් පිටත සිටියාහු එබඳු අවිෂය ස්ථානයෙහි සිටි සතුරන් සාදම්හයි සිතූ නම් පිටත සිටි තැනම සිට ආකාශයට කරනම් පැන එසේ උඩ පිනූ කරනමින්ම නැවතත් බිම නොබී නැවත පනන්නාහු ආකාශයට කරනම් පැනම ගොස් අත තුබූ ආයුධයෙන් ඇතුළු නුවර හුන් සතුරන් නිරවශෙෂයෙන් සාධා නැවත එපරිද්දෙන් කරනම් පැන පැන ආකාශයෙන් අවුත් තමන් පළමු සිටි තෙනම සිටිනට පොහොසත්වූ මාගේ යොධයෝ ඉදින් ඇත් කඳ වී නමුත් තමන්ගේ කඩුවෙන් එක පහරින් මැදින් පොලු කසන්නට සමර්ථයහ.

එම්බල වෛදෙහ කොල්ල! පළමු තාගේ ගොවියා පුතුගේ මන්ත්‍රිකමින් හා ඔහුගේ ප්‍රඥානුභාවයෙන් ගැලවින. දැන් තට මීදී යාමක් නම් කොයින් ද? දැන් තාගේ රාජානුභාවත් තාගේ පණ්ඩිතයාගේ මන්ත්‍රීකමුත් මින් ගැලවී මිසුලු නුවරට යාමක් වත් බලන්නේ වේද? දැන් තෝ කරක හෙලා ගත් මසකු පරිද්දෙන් අසුවූයෙහි වේදැයි කියා වෛදෙහ රජහට තනනුවමින් දෑල්හි

අසුවූ මූවකු මසකු මෙන් දූන් අල්වම් දූන් අල්වම්යි වජ්‍රාඞ්කුශ යෙන් ඇතු මෙහෙයන්නාහු ගනුව විදුවයි කිය කියා සෙනඟ මෙහෙයන්නාහු උපකාරී නුවර මැඩ ගලා පියන්නාක් පරිද්දෙන් ආහ.

ඉක්බිති බොධිසත්වයන්වහන්සේගේ යොධයෝ පළමු ඒ ඒ රජදරුවන් අතුරෙහි සිටුවනලද එක්සියයක් චරපුරුෂයෝ තම තමන්ගේ ආඥා කළ පිරිස හා සමඟ කවුරු කිම දතිද්ද. ඉදින් පවුර බිඳ ගෙන නුවර මිරිකාගෙන නුවරට වදිත් නම් එක් සියයක් රජුන් හා බ්‍රහ්මදත්තයා හා ඉස් ගසාලා අපගේ පණ්ඩිත ස්වාමීන්ගේ පාපිට දමාලම්හයි තම තමන් සිටුවූ රජ දරුවන් පිරිවරා ගත්හ.

එවේලෙහි තිලොක තිලකවූ තිලොක ගුරුවූ තිලොකෙක නෙත්‍රවූ පරශත්‍රැ මදීනවූ මාගේ ස්වාමිදරුවූ බොධිසත්වයන් වහන්සේ රැ තමන් සැතපුණු ශ්‍රී යහනින් නැඟී සිට ශරිර කෘත්‍යය සපයා පෙරවරු බත කල් නබා අනුභව කොට ඔටුන්න හැර සෙසු සර්වාභරණයෙන් සැරහී ලක්‍ෂයක් පුස්නා රන් මිරිවැඩි සඟළක් පයලා එසේම ලක්‍ෂයක් පුස්නා කසී සළු වක් හැඳ ලක්‍ෂයක් වටිනා රන් පලසක් එකාංශකොට පොරවා ගෙන සත රතින් කොට රුවන් කර්මාන්තයෙන් විසිතුරුවූ සෝළු ලීයක් අතින් ගෙන දෙවඟනක් පරදවන රූ ඇති ස්වර්ණා භරණයෙන් සැරහුණාවූ තරුණ ස්ත්‍රීන් දෙදෙනකු ලවා සුදු චාමර දෙකක් සල්ව සල්වා කනක රජත මණී තාරකායෙන් විචිත්‍ර විතානොපලක්‍ෂිත ගන්ධදාම පුෂ්පදාමාවලම්බිත නානා විරාජ රත්න ප්‍රභා සමුදය සමුජ්වලිතාලඞ්කෘත තමන්වහන්සේගේ ප්‍රාසාදයෙහි සිවුමැදුරු කවුළුව හැර දිවි දළින් ඔප් නඟා කරන ලද සතරන් පිළිමයක් වැනි තමන්වහන්සේගේ රූප කාය චූලනී රජ්ජුරුවන්ට දක්වනසේක් ශක්‍ර දෙවෙන්ද්‍ර ලීලායෙන් ඇත් මැත් බලා සක්මන් කරනසේක.

චූලනී රජ්ජුරුවෝ වනාහි බෝධිසත්වයන්වහන්සේගේ කන්දප්ප ප්‍රභාති මනහර රූප විලාස ශ්‍රී දැක සිත පහදවා ගත නුහුනුවාහු දූන් දූන් මොහු අල්වා ගනිමියි සිතා වහ වහා වජ්‍රාඞ්කුශයෙන් ඇතු මෙහෙයන්නාහ. මේ දූක පණ්ඩිතයන්වහන්සේ සිතනසේක් මෙ රජ ඒකාන්තයෙන්ම වෛදෙහයා මාවිසින් හසු කරනලදැයි සිතා වහ වහා ඇතු මෙහෙයමින් එන්නේ ය. තමන්ගේ අඹු දරුවන් හැරගෙන අපගේ රජ්ජුරුවන් මිසුලු නුවරට ගිය නියාව තව නොදන්නා වන්හයි සිතා සකස් කොට ඔප් නැඟු

රන් කැටපතෙක පැහැ සමානවූ මාගේ මුහුණ රජුට දක්වාලා රජ හු හා සමඟ කථා කෙරෙමියි සිතා සිවු මැදුරු කවුළුවෙන් රජු මුහුණ බලා මධුර ස්වරයෙන් රජු හා සමග කථා කරන සේක් මෙසේ කීහ.

කින්නු සන්තරමානො'ව, කාගං පෙසෙසි කුඤ්ජරං
පහට්ඨරූපො ආපතසි, ලද්ධත්‍ථො'සමීති මඤ්ඤසි.

ඔහරෙතං ධනුං චාපං, ඛුරප්පං පටිසංහර
ඔහරෙතං සුභං වම්මං, වෙළුරිය මණිසන්ථතන්ති.

ඇයි මහරජ! ඉක්මන්ව ඉක්මන්ව ඇතු මෙහෙයනසේක් තමාගේ අභිමතාර්ථය සිද්ධවීයයි සිතනසේක් ද? එක විටකුත් එසේ නොසිතුව මැනව. මහරජ! නුඹවහන්සේ සිත ඇත්ත තබා පියා මෙවිට මා කීවකුත් කළ මැනව, ඊයේ දවස පෙර සවස දුනුම්ට තරව අල්වා ගත් අත තව දක්වා මිට මිරිකා ගැන් මෙන් සිරිගී ගියහයි සිතමි. එසේ හෙයින් තොප අත තුබූ තෙල මැඩහගූ දුන්නෙන් කාරිය කිම ද? දුනු ඊතල දමා හෝ පියව මෙවැනි දුන්නක් සතුරන් ඇරගත හොත් ලැබ ගත නොහැක්ක. වල හෝ සඟවා ලව. තෙල පිට බැඳි හියොවුරෙනුත් ප්‍රයෝජන නැත. එයිත් මුදාපියව. තවද පෙර සවස[1] කල් තබා සන්නාහ සන්නද්ධ ඊ පිට බැඳි රන්කම් කළ හියොවුර සියුමැලි[2] නුඹවහන්සේගේ රන්වන් බඳ ඉදී ගියේයයි සිතමි.

තවද වෛදූර්‍ය්‍ය මාණික්‍යමය කොට කරනලද ඉතා ශෝභමානවූ සන්නාහයක් ඊයේ පසුවරුම ලා සන්නද්ධවූ හෙයින් ශරීරය ඉදී නුඹවහන්සේට බොහෝ විඩා වීයයි සිතමි. නොහොත් ශරීරය පඬුවන් පැවීයයි සිතමි, තවද ඊයේම පස්වරු පටන් තුන් යම් රාත්‍රියෙහි නිදි මරා විඩාව ගියසේක. තවද ඉර'වූ කනා කලානන නොවී නිදා නැගී නුඹවහන්සේගේ නුවරට පලාගොස් මාලිගාවෙහි සුවසේ සැතපී වදාළ මැනවැයි රජුහා කෙළනාසේ වෙහෙසූසේක.

චූලනී රජ්ජුරුවෝ ද පණ්ඩිතයන්වහන්සේ වදාරන බස් අසා ගොවියා පුතා මාහා කැටුව කෙළෙනෝ ය. අප තොප දෙන්නාට කළමනා දෙය දන්නෙම් වේදූයි බෝධිසත්වයන් වහන්සේ හයගන්වා කියන්නාහු මෙසේ කියත්.

1 පස්වරු 2 සිවුමැලි

පසන්නාමුඛවණ්ණො'සි, මිහිතපුබ්බඤ්ච භාසසි
හොති ඛො මරණකාලෙ - තාදිසී වණ්ණසම්පදා'ති.

මහෞෂධය! තෝ පුන්සඳ මඩලක් සේ බබලන්නාවූ මුඛ ශොභාව ඇත්තෙහි, සිනා පෙර දැරිකොට බණන්නාවූ තෙපුල් ඇත්තෙහි, මා කිසිවකුත් කොට නොසලකා හෙවත් මෙසා සේනාවක් ගෙන කොපයෙන් දිලිහි මාංශකරෙහි මද සරුවක් නැත්තෙහි, මියන්ට ආසන්නකල මිනිසුන්ගේ රූ යාපත් වෙති යනු සැබව. ඉන්වේද තා මෙබඳු රූප විලාසයකට පැමිණියේ. දූන් දූන් හා මරා ඉස කපා පියා මැඩ ගෙන ජය පානය අනු භව කරමි[1] හයි' කීහ.

මෙසේ ඒ රජ්ජුරුවන් බොධිසත්‍වයන් හා සමග කථා කරන වේලෙහි එක් සියයක් රජුන් හා මහාසේනාව බොධිසත්‍වයන්ගේ රූප ශොභාව දූක අපගේ රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන් හා සමග කථා කෙරෙතියි. කුමක් කියද්දෝ හෝයි උන් දෙන්නා කරන කථා අසන්නාහු චූලනී රජ්ජුරුවන් සමීපයට ගියාහ. පණ්ඩිතයන්වහන්සේද රජ්ජුරුවන් කියන බස් අසාත් මා මහෞෂධ පණ්ඩිත නියාව මේ රජ නොදන්නේ ය. මම මා මරා ගන නොදෙමියි සිතා වදුරනසේක් මහරජ! යම් දවසෙක නුඹ වහන්සේ හා කෙවට්ටයා හා දෙන්නා සිතින් එකක් සිතා බසින් එකක් කියා කල මන්ත්‍රණයෙන් සිතින් සිතුවා නොවීය. බසින් කිවාම වීයයි, ප්‍රකාශ කොට වදුරනසේක්,

මොඝං තෙ ගජ්ජිතං රාජ, භින්නමන්තො'සි ඛත්තිය!
දුග්ගණ්හො'සි තයා රාජ, ඛළුඞ්කො'ව සින්ධවො.
තිණ්ණො හි රාජා ගඞ්ගං, සාමච්චො සපරිජ්ජනො
හංසරාජං යථා වකො, අනුජවං පපතිස්සසී'ති.

මහරජ! නුඹවහන්සේ හා කෙවට්ටයා හා දෙන්න සිතින් මන්ත්‍රණයක් කරනසේක් අපදෙන්නා මුත් අනික් දන්නෝ නැතැයි සිතා කල මන්ත්‍රණය මා නොදනිතියි සිතූසේක් ද? එසේ නොසිතුව මැනව. ඒ මන්ත්‍රණය මටම කියාපු දෙයක් සේ ඉඳුරාම දනිමි. නුඹවහන්සේගේ මන්ත්‍රණයත් භින්න මන්ත්‍රව ගියේ ය. වල විදි ශරයක්සේ ඉතා ප්‍රයෝජන නැත. එසේ හෙයින් අපගේ රජ්ජුරුවෝ තමන්ගේ නුවරටම පලා ගියාහ. ඉදින් ලුහුබඳවා අල්වා ගනිමියි සිතනසේක් වී නම් එයිත් නොපිළිවන. අපගේ රජ්ජුරුවෝ ජාති සෛන්ධවයකු හැගි

1 බොමිහි

බලවත් අශ්වාචාර්යයකු වැන්නාහ. නුඹවහන්සේ කොටළුවකු නැඟී යන සුළු පුරුෂයකු වැනිසේක. එසේ හෙයින් ලුහු බඳවා අල්වා ගන්නට ඉතා නොපිළිවන. කෙවට්ටයා කොටළුවකු වැන්න නුඹවහන්සේ කොටළුවා නැඟි පුරුෂයා වැනිසේක. මම ආජානීය සෛන්ධවයකු වැන්නෙමි. අපගේ රජ්ජුරුවෝ ඒ සෛන්ධවයා නැඟී යන පුරුෂයා වැන්නාහයි උපමා කොට වදාළසේක.

එසේ හෙයින් අප්ගේ රජ්ජුරුවෝ ඊයේ ගහින් එතෙර යන්නාහු තනිව ගියාහු නොවෙති. සේනාවාහන සහිතව අමාත්‍ය මණ්ඩලය පිරිවරා මහා පෙරහරින් වැඩිසේක. ඉදින් නුඹවහන්සේ ලුහු බඳවා අල්වා ගනිම්සි දිවනසේක් වී නම් දිව අල්වා ගත නොහී අතර මඟම නස්නාසේක. කුමක් මෙන්ද යත්? සුවර්ණ හංසයකු ලුහු බඳවා දිවන කොකෙක් පියාසර කොට විඩාව ගොස් දෙපියායෙහි ගිනි වැදගෙන අතර මඟ මියන කොකකු පරිද්දෙන් නස්නෙහි වේදැයි වදරා නැවත අසම්භින්න කේශර සිංහරාජයකු පරිද්දෙන් උපමාවක් දක්වනසේක් මෙසේ වදාරන සේක.

සිගාලා රත්තිභාගෙන, ඵුල්ලං දිස්වාන කිංසුකං
මංසපෙසී'ති මඤ්ඤන්තා, පරිබ්බූළ්හා මිගාධමා.

වීතිවත්තාසු රත්තීසු - උග්ගතස්මිං දිවාකරෙ
කිංසුකං ඵුල්ලිතං දිස්වා, ආසාඡින්නා මිගාධමා

එවමෙව තුවං රාජ, වෙදෙහං පරිවාරිය
ආසච්ඡින්නො ගමිස්සසි – සිඟාලා කිංසුකං යථා'ති.

තව ද මහරජ! නුඹවහන්සේ මේසා සේනාවක් ඇරගෙන තුන්යම් රාත්‍රියෙහි නිදි මරා සිතූ අර්ථයෙන් ස්වල්ප මාත්‍රයකුත් සාධා ගත නුහුනු නියාව කුමක් වැනිදයත්? යම්සේ ගොදුරු සොයා ඇවිදිනා සිවල් මුළෙක් සුපුෂ්පිත වූ කලෑ වෘක්ෂයක් චන්ද්‍රාලෝකයෙන් වත්, තාරකා විද්‍යුල්ලතාදි කිසි ආලෝකයකින් වත් එල්ලෙන්නාවූ මල් කැන් දුටුවාහු මේ වූ කලි ඒකාන්ත යෙන්ම මස්වැදලිය යි වරදවා සිතා ගත්තාහු අනෙක් ගොදුරක් සොයා නොගොස් දඬමස් කම්හයි ගස මුල හිඳ අරුණු නැඟී පහන්ව හිරු නැඟි කල සුපුෂ්පිත කැලමල් දැක ඒ සිගාලයෝ ඔවුනොවුන්ට කියනුවෝ කොල! මේ මස් වැදලි නොවෙයි. කැලමල් කැනයි නියම දැන එහි ආලය හැර කැලමල් රුක හුන් කැනහිලුන් මෙන් ආලය හැර තොපගේ නුවරටම යන්නෝ වේදැයි වදාළසේක,

නැවතත් වදුරනයේක් මහරජ! නුඹවහන්සේත් වෙදෙහ රජු හසු කෙළෙමියි අනේ! තියමු රැ නිදි මරා ඇවිද අඩමවූ සිගාලයන් පරිද්දෙන් අපගේ රජ්ජුරුවන් කෙරෙහි ආලය හැර යනසේක් වේදැයි වදාළසේක.

රජ්ජුරුවෝ බෝධිසත්‍වයන් කිසි චකිතයක් නැතිව නිර්භීතව කියන බස් අසා සිතන්නාහු ගොවියා පුතා ඉතාම බුහුටිව කිසි සැකයක් නැතිව කථා කරන්නේයයි කියන කොට වෙදෙහ රජ පලාගිය වනැයි සිතා විෂ ඝොර සර්ප රාජයකු දණ්ඩෙන් පහළ කලක් මෙන් කිපී පලමූ අපි ගොවියා පුතු කිසා බඹ වසන උතුරු සළුව පමණකුත් නොලදුම්හ. දැනුත් ඔහු විසින් අපට හස්තප්‍රාප්තවූ පසමිතුරා හෙවත් මාගේ සතුරා පලවා පියනලද. මූ තරම් මට අනර්ථකාරයෙක් නැත රජුටත් මූටත් දෙන්නාටම කළමනා වධ බන්ධන ඉස් සිදිම් ආදී යම්ම වධයෙක් ඇත්නම් මොහුට කෙරෙමියි සංවිධාන කරන්නාහු මෙසේ ද කියත්.

ඉමස්ස හත්ථපාදෙ ච, කණ්ණ නාසඤ්ච ඡින්දථ
යො මෙ අමිත්තං හත්ථගතං, වේදෙහං පරිමොචයි.

ඉමං මංසං වත පාතබ්බං, සූලෙ කත්වා පචන්තු යො
යො මෙ අමිත්තං හත්ථගතං, වෙදෙහං පරිමොචයී'ති.

මේ මහෞෂධ පණ්ඩිතයා මා හස්තප්‍රාප්තවූ වෙදෙහ රජු ගලවා යවාපීද. එසේ කළාවූ මොහුගේ දෑත්, දෙපා, කන්, නාසා කපා හරුව. තවද මාගේ වෙදෙහ නමැති සතුරා අතපත්වූවහු මේ මහෞෂධ පණ්ඩිතයා පිටත් කොටපීද. ඔහුගේ ඇඟ මස් කපා උල අමුනා පලහව. තවද සිංහ, ව්‍යාඝ්‍ර, වෘෂභ, මෘග ආදීන්ගේ සම් කිම වනා වට කණු ගසා වියලන්නාහ. එපරිද්දෙන් මාගේ අත්පත්වූ සතුරා වෙදෙහයා පිටත් කළ මේ මහෞෂධයාත් බිම හොවා සතර අත වනා කණු ගසා වධ කරව. තවද මාගේ හස්තප්‍රාප්තවූ සතුරු පැලවූ මේ මහෞෂධ පණ්ඩිතයා බිම හොවාලා තීක්ෂණවූ මුවහත් ඇති කඩුවෙන් කොටා පලා වධ කරව, සිංහ, ව්‍යාඝ්‍ර, මෘග, සූකරාදීන්ගේ මාංස පරිද්දෙන් කොටා, පලා, ඉරා, ලියා වධ කරවයි කීහ.

මේ එන රජකු තබා දස දහසක් සක්වළ රජදරුවෝත් එක්ව මාගේ ස්වාමි දරුවාණන්වහන්සේට එවැන්නක් කරන්ට අසමර්ථයහ. ඒ රජුගේ බස මූත් කිවායෙන් කිසිවකුත් කළ නොහෙන්නාවූ සිස්වූ බස අසා බොධිසත්වයන්වහන්සේ සෙවතු

වලාහෙයත් මදින් මඳ නික්මෙන අඩ සඳක්සේ දනන මරීචි නිගීත කොට හෙවත් මඳක් සිනා පහළකොට වදාළසේක. රජහු කිපෙත් කිපෙත් මාගේ ස්වාමිදරුවාණන් මුහුණ පෙම් වඩනා නියාව කුමක් වැනිද යත්? බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ ඉතා රළු ක්‍රොධ නමැති සූත්තෙන් උළා ඔප් නැඟූ රන් කැටපතෙක පැහැ සමානව වඩ වඩා ශොභාවත්ව අතිශයෙන් බලන්නට වන. එවිට සිතනසේක් මේ නුවණ නැති රජ තමන්ගේ තෑයන් ආ ගිය අත් නොදන මට වධයට විධාන කරන්නේ ය. මැණිය නුත්, අඹුවනුත්, දරුවනුත් ගෙන්වා ගෙන මිහුලු නුවරට යැවූ නියාව නොදන මට සැපෙන්නාහ.[1] මේ රජ මහා ඓශ්වර්‍යයෙහි පිහිටා සිටියේ ය. මා කළ දෙයක් කොළේ යයි සිතා ක්‍රොධවශයෙන් අත තුබූ හියෙන් විදපි හමුත් අන් කිසි උපක්‍රමයකින් නසාපී නමුත් නපුරුවූ මේ රජහු ශොකයෙන් මූර්ච්ඡා කරවා හුන් ඇතු පිටම විසංඥ කරවා පියා නැවත අස්වසා ලම් සිතා වදාරනසේක්.

සවෙ මෙ හත්පාදෙ ච, කණ්ණනාසඤ්ච ඡෙච්ඡසි
එවං පඤ්චාලචණ්ඩස්ස, වෙදෙහො ඡෙදයිස්සති.

සවෙ මෙ හත්පාදෙ ච, කණ්ණනාසඤ්ච ඡෙජ්ජසි
එවං පඤ්චාලචණ්ඩියා, වෙදෙහො ඡෙදයිස්සති

සවෙ මෙ හත්ථෙ ච පාදෙ ච කණ්ණනාසඤ්ච ඡෙදසි
එවං නන්දාය දෙවියා – වෙදෙහො ඡෙදයිස්සතී'ති.

මහරජ! ඉදින් නුඹවහන්සේ මාගේ අත් පා කන් නාසා කපා වධ කරන්නා වූසේක්වී නම් ඒ නුඹවහන්සේගේ වධකයන් මට කළ වධ මුළුල්ලම නුඹවහන්සේගේ පුතණුවන් පඤ්චාලචණ්ඩ කුමාරයන්ට ද අපගේ වෙදෙහ රජ්ජුරුවෝත් අත් පා කන් නාසා කපා වධ කරන්නාහ. මහරජ! ඉදින් මාගේ අත්, පා, කන්, නාසා කැපූසේක්වී නම් ඒ නුඹවහන්සේගේ දුවණියන් පඤ්චාලචණ්ඩි කුමාරිකාවන්ගේ අත්පා කන් නාසා කපා පියන්නාහ. ඉදින් මාගේ අත්, පා, කන්, නාසා, කැපූසේක්වී නම් අපගේ වෙදෙහ රජ්ජුරුවෝත් නුඹවහන්සේගේ අඹුදරුවන් අත් පා, කන්, නාසා කපන්නාහා. නුඹවහන්සේ වැදූ මැණියන් ආදිවූ සතර දෙනා අපගේ රජ්ජුරුවෝ අත් පා කන් නාස කපා වධ කරන්නාහ.

1 සැපහන්නාහ

මහරජ! නුඹවහන්සේ මාගේ ඇඟ මස් ලියාපියා උල අඹුනා පලඟා වධ කරවූද වී නම් අපගේ රජ්ජුරුවෝත් නුඹවහන්සේගේ පුතණුවන්, දුවණියන් ඇඹෙණියන් හා මැණියන් ඇතුළුවූ තෑයන් සතර දෙනා අල්වා ගෙන ඇඟ මස් ලියා පියා උල්, මස් කොට පලඟා වධ කොට මරන්නාහ, තවද මහරජ! නුඹවහන්සේ සිංහ ව්‍යාඝ්‍ර මෘග වෘෂභ ආදීන්ගේ සම් බිම වතාලා වට කණු ගසා වියලන්නාසේ මට වධ කරවූ ද වී නම් මාගේ රජ්ජුරුවෝ නුඹවහන්සේගේ අඹුදරුවන්ට එපරිද්දෙන්ම වධ කරවා මරන්නාහ. තවද මහරජ! යම්සේ වඩිකාරයන් ලවා සම් සියක් පටින්වත් ඇති විවරකින් මඳ[1] කොට කරවා වැලඳ ගන්නාලද සන්නාහය තමහට බැහැරින් වදනා ශර නිවාරණය කොට ආත්ම රක්‍ෂා පිණිස වන්නේ ය. එසේම මම මාගේ රජ්ජුරුවන්ට සම් සියක් පටින් කළ සන්නාහයක් පරිද්දෙන් ඉදිරිව සිට කිසි භයක් නොවැද්ද දී සැප එලවමියි වදාළසේක.

මෙසේද කියා නැවත වදාරනසේක් මහරජ! වැලිත් මෙ මා තිකම් කියන දෙයෙකැයි නොසිතුව මැනව. නුඹවහන්සේගේ අඹු දරුවන් හා මැණියන් හා අපගේ රජ්ජුරුවන්ට පාවා දී මියුලු නුවරට යවන්නෙම් මහරජ! ඉදින් චූලනී රජ්ජුරුවෝ නුඹ වහන්සේ තමන්ට සොරා යවාපීහයි මා අල්වා ගෙන අත්, පා, කන්, නාසා කපා වධ කරවු නම් කුමක් කරනසේක් දැයි කී හෙයින් මහෞෂධ පණ්ඩිතයෙනි! ඒ රජ සැබැවින් තොපට එසේ වධයක් කෙළේ වී නම් ඒ තොපට කළ වධ මුළුල්ල ඒ රජ තමා මහබල ඇති හෙයින් ඔහට කළ නොහෙතත් ඔහුගේ අඹු දරුවන්ට හා මැණියන්ට තොපට කළ වධයට දියුණක්ම කරමියි කීහ. සැබැවින් මහරජ! නුඹවහන්සේ මා එක තැනැත්තවුට එක වධයක් කළසේක් වී නම් නඳුදේවීන් හා දරු දෙන්නා ඇතුළුවූ නුඹවහන්සේගේ තෑයන්ට අපගේ රජ්ජුරුවෝත් තමන්ට කළ වධයට පුළුවන් වධ බන්ධන කරන්නාහයි වදාළසේක.

මෙසේද කියා මහරජ! නුඹවහන්සේගේ ප්‍රඥා නමැති ශීයට මම සම්සියක් පටින් කළ සන්නාහයක්ව ඉදිරිව සිට මාගේ වෛදෙහ රජ්ජුරුවන්ට ඒ ශරයෙන් වන්නාවූ උපද්‍රව දුරුකොට සැපයක්ම කෙළෙමියි වදාළසේක.

---

1 සකස්

ඒ ඇසූ චූලනී රජ්ජුරුවෝ සිතන්නාහු මේ ගොවියා පුතා කුමක් කියාද? මම යම් වධයක් තමාට කරවම්හි කීම් නම් තෙමේත් මාගේ අඹුදරුවන්ට තමාගේ වෛදෙහ රජ කරවතියි යෙයි.

මා ඒයේ සවස එන ගමනේ මාගේ අඹුදරුවන්ට සුරක්‍ෂිත කොට රැකවල් ලවාලා ආ නියාව නොදන්නා වන. දූන් තෙමේ මියන හෙයින් මරණ භයින් තන්දෙඩයි කියා බොධිසත්‍වයන්ගේ බස් රජ්ජුරුවෝ නොඇදහුහ. පරසිත් දන්නා නුවණැති මාගේ බොධිසත්‍වයන්වහන්සේ මේ රජ තෙමේ මා මරණ භයින් දෙඩති- යි සිතයි. සැබෑ සරූප මා හගවාලුව මැනවැයි සිතා වදාරනසේක්,

ඉඬ්ඪ පස්ස මහාරාජ! සුඤ්ඤං අන්තොපුරං වරං
ඔරොධා ච කුමාරා ච, තව මාතා ච ඛත්තිය!
උම්මග්ගා නික්ඛමිත්‍වාන, වෙදෙහස්ස පනාමිතාති.

යන මේ ගාථාවෙන් බ්‍රහ්මදත්තයෙනි! තොපි මාගේ බස් නො අස්නා බැවින් තොපගේ සිස්වූ අන්තඃපුරය මිනිසුන් යවා බලව. තොපගේ බිසවුන්ද, දරුවන් දෙන්නාද, මෑණියන්ද යන සතර දෙනාම යවාපීම්යි වදාළසේක. ඒ කෙසේද යතහොත්? මාගෙන් සේවායන් යවා මාලිගාවෙන් බාවාගෙන සුළු උමඟින් ගෙන්වා ගෙනවුත් මහඋමඟින් පිටත් කොට වෛදෙහ රජ්ජුරුවන්ට මා විසින් පාවාදෙන ලදූයි හෙවත් රජ්ජුරුවන් හා කැටිව මිථුලු නුවරට මේ සතරදෙනාම යවාපිම්යි වදාළසේක.

එබස් අසා රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයෝ ඉතාම තර කොට කියති. මා විසිනුත් මධ්‍යම රාත්‍රිවේලෙහි ගඟ දිශාවේ තනූ දෙවීන්ගේ කටහඬ වැනිවූ හඬකුත් අසන ලද. මේ පණ්ඩිතයෝත් මහනුවණ ඇත්තෝ ය. කිසි උපායකින් යවාපි නම් නපුරැයි උපන්නාවූ බලවත් ශොකයෙ[illegible] ඇත්තාවූ රාජ ධෛර්‍ය්‍යය උපදවා පණ්ඩිතයන්වහන්සේගේ බස් කන් දී නොඅසන කෙනකුත් මෙන් එක්වන් ඇමැත්තකු කැඳවා සරූප දන්නා පිණිස නුවරට එවන්නාහු මේ පණ්ඩිත යන් මෙසේම තරකොට කියන බැවින් උන්ගේ බසෙහි සබා බොරුව මාගේ අන්තඃපුරයට ගොස් පරීක්‍ෂා කොට එවයි යැවූහ.

ඒ අමාත්‍යයා තමාගෙන් පිරිවර සහිතව මාලිගාවට ගොස් දොර හැර රජගෙට ගොස් අත් පා බැඳ කට කඩ ඔබා කිත්ති කොකුවල එල්වා තුබූ පුර රකින්නන්, කූරුන්, කුදූන් ආදීවූවන්ද

බඳුන් බිඳපියා ඒ ඒ ස්ථානයෙහි විසුරුවාපියා තුබූ කන බොන දේ ද, රුවන් ගබඩාවල දොර හැරපියා රුවන් උකාගත් තෙන ඉසපියා තුබූ රුවන් සමූහයද, දොර හැරපියා තුබූ ශ්‍රීයහන් ගබඩාවද, එසේම හැරපියා තුබූ සිවුමැදුරුකවුළුයෙන් ඇතුලට වැද උනුන් කටින් පූ උදුරා කන්නාවූ කා රැස් බැඳ හැසිරෙන්නාවූ කපුටු සමූහයාද, මූදුබඩ කෙවුලන්හැරපියා ගිය සැඩ ගමක්සේද, තවද අමුසොහොනක් සේද, ඉතා නිඃශ්‍රීකවූ රාජභවනය බලාපියා ගොස් රජහට කියන්නේ මෙසේදකියා,

එව මෙව තුවං රාජ, යථා ආහ මහොසධො
සුඤ්ඤං අන්තොපුරං සබ්බං, කාකපට්ටනකං යථා'ති.

මහරජ! ඇසුව මැනව, යම්සේ මහෞෂධ පණ්ඩිතයෝ යමක් කිවුද? උන් කියෙන් එක බසකුත් බොරු දෙයෙක් නැත. ඒ සැබෑමය. යම්සේ නුඹවහන්සේගේ මාලිගාව පෙර දිව්‍යපුරයක් වැන්නැයි සිතමි. එසේවූ රජගෙය දැන් තිබුලෙස මූදු අස කෙවුලන් හැරපියා ගිය ගමක මවජ ගඬයට හැසිරෙන්නාවූ කාක සමූහයක් සේ මාලිගාව කපුටුවන්ගෙන් අතුරු සිදුරු නැතිව තුබූයේය. ඒ රජගෙයි නුඹවහන්සේගේ අඹුදරුවනුත්, මැණියන් දැත්, මා දුටුයේ නැත. ආ ගිය තෙනක් ඇසුවෙත් නැත. මාලිගාව මෙවක කපුටුවන් විසින්ම ගැවසිගත්තේය. පණ්ඩිතයන් කීයේම සැබෑයයි කිය.

රජ්ජුරුවෝ තැයන් සතර දෙනාගේ වියෝදුකින් තාමපිතව වෙවුලන්නාහු මේ දුක්ඛය හොවියා පුතු නිසායයි මට වූයේයි. දණ්ඩකින් පහරනලද ආශිවිෂයකු පරිද්දෙන් බොධිසත්වයන් කෙරෙහි පලමු තරමට වඩා කිපුනාහ. බොධිසත්වයන් වහන්සේ රජහුගේ ආකාරයෙන්ම දැන සිතනසේක් මේ රජ්ජුරුවෝ මහා යසස් ඇත්තාහ. යම් කිසි කලෙක්හි ක්‍රොධ වශයෙන් තමන්ට මා නිසා වන්නාවූ අභිවෘද්ධිය නොසලකා රාජමානයෙන් මොහුගෙන් මට කාරිය කිම්දැයි සිතා සතුරන් අතට පැමිණියෝ මලවුන් හා සරියෝයයි, ඉදින් මට හිංසාවක් කොලෝ නම් ඒ නපුර. නුවණ නම් මෙසේවූ තෙනට වේද උපායකින් මේ රජහු නුදුටුවිරු කෙනෙකුන් පරිද්දෙන් ඒ බිසවුන්ගේ රූපශ්‍රී වණ්නා කොලෙම් නම් ඒ බිසවුන් සඳහන් කරන්නාවූ මේ මහෞෂධ පණ්ඩිතයන් ඉදින් මම මරාපීම් නම් එබඳු මාගේ ස්ත්‍රීරත්නයක් නොලබමි. ඉදින් උන් නොමැරීම් නම් එකාන්තයෙන් ලබමියි

සිතා තමන්ගේ බිසවුන් කෙරෙහි කළ සෙනහසෙයන් මට කිසි අපරාධයක් නොකරන්නාහයි සිතා තමන්වහන්සේගේ ආත්ම රක්‍ෂාව පිණිස මාලිගාවේ මතු මහලේ වැඩසිටි සේක්ම සඛ්‍යා වලා පටලයක් අස්සෙන් ගැසූ සියරැලි විදුලියක් පරිද්දෙන් පෙරව සිටියාවූ රන් පලස යටින් රත්වන් ශ්‍රී හස්තය මැත් කොට ගෙන ඒ තනූ දෙවීන් ගිය මාර්ගය මේයයි කියන්නාසේ උන්ගේ රූප වර්‍ණනා කරනසේක් වදාළසේක.

ඉතො ගතා මහාරාජ, නාරී සබ්බඞ්ග සොභනා
කොසුම්භ ඵල සුමෙස්සාණා, හංස ගග්ගර භාණිනී,

මහාරාජ ඉතො නීතා, නාරී සබ්බගග සොභනා
කොසෙය්‍ය වසනා සාමා, ජාතරූප සුමෙඛලා,

සුරත්තපාද කල්‍යාණී, සුවණ්ණ මණිමෙඛලා
පාරෙවතක්ඛි සුතනු, බිම්බොට්ඨ තනු මජ්ඣිමා

සුජාතා භුජඞගලට්ඨී'ව, වෙල්ලී'ව අනුමජ්ඣිමා
දීඝස්ස කෙසා ¡ සිතා, ඊසකග්ගං පවෙල්ලිතා

සුජාතා මිගඡාපීව, හෙමනෙතග්ගි සිඛා'රිව
නදී'ව ගිරි දුග්ගෙසු, සඤ්ඡන්නා බුද්දවෙළුහි

නාගනාසූරු කල්‍යාණී, පඨමා තිම්බරුත්ථනී
නෙවා'ති දීඝා නාරස්සා, නාලොමා නාති ලොමසා'ති.

රජ්ජුරුවන් වහන්ස! සූසැටක් පමණ සත්‍රී ලක්‍ෂණයෙන් හෙබියාවූ ඒ තනූදෙවී මෙසේ ගියාහ. කෙසේ ගියාදයත්? මා විසින් උමගකින් පිටත් කරවා වෙදෙහ රජ්ජුරුවන් හා කැටුව මියුලු නුවරට යවාපියන ලද.

තවද මහරජ! නුඹවහන්සේ ඒ බිසවුන් කෙසේවූ රූ ඇති කෙනෙකුන් වනැයි සිතන සේක්ද? උන්ගේ උපමා රහිතවූ රූප ශ්‍රී විලාසය මා අතින් අසා ගත මැනව. සතරන් පණීතයක් මුදුනෙහි තබනලද තිල්වලාකුළක් වැනිවූ දේ හෝ නොහොත් රන් ලියයක් මත්තෙහි පිල් විදහා හුන් නීල මයුරයකු වැනි ගවසා නමනලද නීල කෙශකලාපයක් ඇත්තාහ.

තවද ඒ ඒ කල්‍යාණවූ කෙශයෝ තුමූ රත්වන් පිට්දූ මැද මුදූ එලන ලද්දවූ දික්බැවින් රන්වන් ගිරි අතලෙක වතල පෝටා ලියයක් මෙන් දේ හෝ නොහොත් මොනර පිල් කලඹක් මෙන්

පිපිදූ මැද ගොසින් කකුලෙහි පැහැර අක් බඹරුවැ රිය හස්සෙන් උඹයිජීගුව සිටිනාහ. නිල් වලාකුලයකින් නික්ම මදක් පෙනෙන්නාවූ අඩ සඳක් සේද නොහොත් කාමදෙව විසින් අනඞ්ගරස නමැති සුරා පානය අනුභව කරන්නන් තමන ලද්දාවූ රන් වඩමක් හා සමානවූ ලලාට තලයක් ඇත්තාහ. අනඞ්ගයාගේ මාලිගා දොරකඩ තනන ලද්දාවූ රුවන් තොරණක් හා සමාන වූද නොහොත් ස්වර්ණ පජිනයක් ආශ්‍රය කොට නැංගාවූ දෙව්දුනු සඟලක් හා සමානවූ නිම්බ පත්‍රාකාර බැම සඟලක් ඇත්තාහ.

තවද රූප නමැති මාලිගාවෙහි තනන ලද්දාවූ ඉඳුනිල් මුවා කවුළු සඟලක් වැනි ද්‍රෝ හෝ නොහොත් දෙලන් පනෙන වැඩියාවූ බාල මුවපොල්ලකුගේ ඇස් සඟලක් වැනි නිලුපුල් පෙති දෙකක් වැනි දිගුපුළුල් පස් පැ දිස්නා ඇස් සඟලක් ඇත්තාහ. මුඛ නමැති පද්මයෙහි පියාසර කරන ස්වර්ණ හංසරාජයකු වැනිවූ ද්‍රෝ හෝ නොහොත් සන රන් අකුස්සක් වැනි තිල පුෂ්පාකාර නාසිකාවක් ඇත්තාහ. සඳරැස් වගුරන බඳුවද මල් පෙත්තක් බඳුවූ ද්‍රෝ හෝ නොහොත් කල්‍යාණවූ මොලොක් සිතිඳු සුව පහස් ඇති බැවින් මනාව විලිකුන් කෙම් පලසක් හා සමානවූ දනනවල අධරොෂ්ඨ පල්ලවයක් ඇත්තාහ. පබළු පනෙක සාදා හිඳුවන ලද විදුරු පෙළක් බඳුවූ ද්‍රෝ හෝ නොහොත් කොඳ කුසුම් පෙළක් බඳුවූ සුදු රස් විහිදුනාවූ දනන පඞ්කතියක් ඇත්තාහ.

තවද ඒ නාඝදෙවීන්ගේ සිත්කලුවූ කන්පට සඟලක් තෙමේ මේඝ මුඛයකින් ගසනලද විදුලිය දෙකක් වැනි ද්‍රෝ හෝ නොහොත් අනඞ්ගයා සොලනාවූ රනෝවිල් දෙකක් වැන්නේය. කැඩපත් මිටක් හා සමානවූ මනාහර උන්ගේ ග්‍රිවයට රන් කලස් කර උපමා මම නොසිතමි. ස්වර්ණලතා විටපයකින් හුනු සතරන් අරළු දෙකක් බඳු උන්ගේ ලීලොපෙත බාහු යුග තලයට උපමාවක් මාතුඩ නොවකමි. රන්ගිරි අතල දෙකක් වැති උන්ගේ පුළුල්වූ උර මඬලට රාජහංසයන් උපමාවටත් නොසිතමි. ගිම් සමයෙහි ඇවිලෙන ගිනි කඳක්සේ නොපැහැපත්ව බබලන්නාවූ ද්‍රෝ හෝ නොහොත් හෙමනන කාලයෙහි ගිනිකඳක් මෙන් බැලුවන්ට ඉතා ප්‍රියවූ ගින්නක් දැකත් ප්‍රියවන්නාහු ඇත්දයත්? ඇතැයි දතයුතු. කෙසේදයත්? ගිම් සමයෙහි ගිනිකඳක් දුටු කල්හි එහි අත් තවාපියන්ට නොසිතන කෙනෙක් එකද සත්ව කෙනෙක් නැත. එසේ පැහැපත්වූ වන්නී සියක් බඳුවූ ඒ නාඝදෙව්යම් පුරුෂයෙක් දුටුයේ වීනම් ඔවුන් ප්‍රාර්ථනා නොකරනලද එකද පුරුෂයෙක් නැත. මේ උපමාව සිතාත් ඒ බිසවු ගිනි කඳක් හා සමානයහ.

තවද පණීත ප්‍රාන්තයකින් හුනු ගංගාව දෙපාශ්වීයෙහි දෙබිත්තියෙන් දියට ගී එක පිටට ගමන් ගෙන එන්නාවූ සිරි සිඟිති තල කොල සමූහයන් ඒ ගංගාව ඉතා හොබනේද, එපරිද්දෙන්ම සර්වාඞ්ගයෙහි තුනුවූ නොදික්වූ නිල්වූ එහගි සිටියාවූ ඒ තාත්‍රදෙවීන්ගේ කෙශ කලාපයෙන් හොබනාවූ වෂාරොදනෙ‍ඉම් සතරන් කළසයෙන් බැස නාභි නමැති පුෂ්කරණීයට යන්නාවූ අනංගයා නමැති රසධාරාවක් වැන්නේ ද්‍රේ හෝ-

තවද ඒ තාත්‍රදෙවී ඡවි කල්‍යාණයෙන්, මාංශ කල්‍යාණයෙන්, කෙශ කල්‍යාණයෙන්, දන්ත කල්‍යාණයෙන්,අෂ්ටි කල්‍යාණයෙනැයි මෙසේ ආශ්චය්‍යීවූ පඤ්ච කල්‍යාණයෙන් යුක්තයහ.

තවද ඒ තාත්‍රදෙවී තුන් වයසින් පළමු වන සොළොස් හැවිරිදි වයස සිටියාත් වැන්නාහ. තවද ඉතා යහපත්වූ සවණී එලයෙක තබාලූ රන්තිඹිරි එල දෙකක් මෙන් ඉතා සන්තොෂ කරවූ දරුවන් කෙතෙක් ලදත් ආයුෂ කෙතෙක් ගියත් සොළොස් ඇවිරිදි වයස පිහිටිසේ ඉතා දැඩිවූ තන යුග්ම ඇත්තේය.

ඒ බිසවුන්ගේ තන දැඩි තියාව කියන්ට කාරණා කිම්දයත්? යම් ස්ත්‍රියක් දෙවඟනක් මෙන් යහපත් රූ ඇත්තී නමුත් ඒ ස්ත්‍රිය නඛාග්‍රයෙහි පටන් කෙශාග්‍රය දක්වා ඇගේ සර්වාඞ්ගයෙහි ඒ ඒ ස්ථානයෙහි සැරහූ මනා විචිත්‍රවූ නොයෙක් පළඳනායෙන් අනූනව සැරහී සිටියා නමුත් ඇගේ තනය මොලොක් විනම් පුරුෂයන් ඇනොරෙති කරන්නාවූ සනා සුලාක්[1] තනය සේම මොලොක් වන්නේය එබැවින් ඒ බිසවුන්ගේ රුවත් සිත්කලුය. තන දෙක ඔවුන් දුටු පුරුෂයන්ගේ සෙනහය පරිද්දෙන් ඉතා දැඩිය. එසේවූ සිසුමැලි බිසවු මෙසේ මියුලු නුවරට පැලැහ[2]යි ශ්‍රී හස්තය ඔසවා පෑ වදාළසේක.

තවද දෙවසිනි! බිසවු මැලි ගමන් වේලෙහි ලීලොපෙත මිරිකුළු ලියයක් සමානවූ මනහර ලීලා ඇති ඒ තාත්‍ර දේවී තුනු රන් රඹ කෙඳි දෙකක් හා සමානවූ ද්‍රේ හෝ නොහොත් රුවන් මාලිගාවක් ඉදිරියෙහි හිඳුවනලද සවණීමයවූ ජයස්තම්භ යුග්මයක් හා සමානවූ හස්ති රාජයකු අපහාස කරන්නාක් බඳුවූ වට මට සිලුටුවූ මොලොක් සුව පහස් ඇති කලවා සඟලක් ඇත්තාහ. රන් මෙවුල්දම් පළඳනාවූ ඒ තාත්‍ර දේවීන්ගේ රූපය එක් දශාවකත් මනුෂ්‍ය ලොකයේ නෙසු ගැනුන්ගේ රූපය එක් දශාවකත්

1 ජසනහ සුහක්
2 බලා ගියාහයි

ලාලා කවර දශාව බර දේ භෝ ගි කිරන්ට මහාබ්‍රහ්මයා විසින් මවනලද තරාදිය උතු දෙකක් හා සමානවූ දණ උතු දෙක උත්තරසාගරයෙන් නැංගාවූ දිය බුබුලට නින්දා කරන්නාක් වැන්න.

ගොදුරු සනහුවෙන් හඬා බස්නා හංස පැටවුන්ගේ නාදයට අපහාස කරන්නාක් බඳුවූ මිහිරි කටහඬ ඇති නන්දාදෙවීන්ගේ එණිමෘගයන් පරාජය කරන්නාවූ ජඞ්ඝා යුගලය තෙමේ දුනුකේ කැකුළු දෙකක් මෙන් හොබනේය. තවද රන් මිරිවැඩි සහලක් හා සමාන පිරිහුන් මොලොක් පතුල් සහලක් තෙමේ රන් පියුම් පෙති දෙකක් මෙන් ශොභමානය.

තවද උන්ගේ හස්තතල පාදතලාග්‍රයෙහි විරාජමානවූ අඞ්ගුලීහු උතුම් චන්ද්‍රකාන්ති පරිද්දෙන් ප්‍රවිෂ්ට පල්ලව පත්‍රයෙන් ශොභනවූ සුන්දරවූ අතුල් තලයෙහි ඇඟිලි අග විරාජමාන වූ නඛ පන්තිය පබළු දළු අග පිහිටි මුතුබින්දු වැන්නේය.

මෙසේ දේවයිනි! වාග් විෂයාතික්‍රාන්ත ඇති පඤ්ච කල්‍යාණයෙන් සමන්විතවූ ඒ නන්දාදේවීතුමූ කොඹු කාශී දේශයෙහි රන්කම් කල සිහින් පිළි ඇන්දවූද කනක කටක සරණ නූපුර නාඞ්ඝක වලයාදී නානාභරණයෙන් ප්‍රතිමණ්ඩිතව දෙවඟනක මෙන් හොබනාවූ බිසවුන් අපගේ රජ්ජුරුවන් හා කැටිව මියුලු නුවරට ගියහයි වදාළසේක.

එසේ බොධිසත්වයන්වහන්සේ ඒ නන්දාදේවීන්ගේ රූප වණ්ණනාව විස්තරකොට වණ්ණනා කරත් කරත් චූලනී රජ්ජුරුවෝ ඒ නන්දාදේවීන්ගේ රූප විලාසය පෙර තමන් ඇස නුදුටු විරූ කෙනකුන් පරිද්දෙන් සෙනහස ඉපද වූහ. රජුගේ සෙනෙහස කාරණය දැන බොධිසත්වයන්වහන්සේ මෙසේ වදාරනසේකි.

නන්දාය නූන මරණං, නන්දාසි සිරිවිගණා
අහං ච නූන නන්ද ච, ගච්ඡාම යමසාධනං'ති.

මහරජ! මෙබඳු රූපශ්‍රීන් විරාජමානවූ ඒ නන්දා දෙවීන්ගේ මිය යාමෙහි නුඹ වහන්සේ සතුටු වන සේක්ද? ඇයි? උන් මළ කල නුඹවහන්සේට කිසි ප්‍රයොජනයෙක් නැත. තවත් උන් මළහොත් මට ඉතා සන්තොෂකරය. ඊට කාරණ කිමිදයත්? නුඹවහන්සේ මොබදී මා අල්වාගෙන මරාපීසේක් විනම් මාගේ රජ්ජුරුවෝත් ඔබින් නන්දා දෙවීත් මරාපියති. එකල නන්දාදෙවීත් මමත් දෙන්න යමරජු ලඟට යම්හ. ඒ යමරජ අපදෙන්නා බලාපියා පුරුෂයන් ගෙන් මහෞෂධ පණ්ඩිතයන් වැනි කෙනකුත් නැත. ස්ත්‍රීන්ගෙන්

තනුදෙවීන් වැනි කෙනෙකුත් නැතැයි තනුදේවීන් තරම් මහෞෂධ පණ්ඩිතයන්ටමයයි තනුදෙවීන් මට පාවා දී පියන්නේය.

එබැවින් මියත් මා එබඳු සත්‍රීරත්නයක් ලබනකල සෙසු කුමක් නම් මට සිද්ධ නොවේද? එබැවින් මහරජ! මියයාමෙහි කිසි හානියක් මා දන්නේ නැතැයි වදාලසේක. බෝධිසත්වයන් වහන්සේ නොයෙක් පරිද්දෙන්ම තනු දෙවීන් රූ වර්ණනා කල සේක. සෙස්සවුන්ගේ නමක් නොකීසේක. කුමක් පිණිසදයත්? පුරුෂයෝ නම් ප්‍රියවූ මත වඩන්නාවූ අඹුවන් කෙරෙහි ඇති සෙනහ සෙස්සවුන් කෙරෙහි නැත්තාහ ඒ තනු දෙවීන් සඳහන් කරන්නෝ දරු දෙන්නාත් සඳහන් කෙරෙත්මයයි සිතා තනු දෙවීන්ම වර්ණනා කලසේක. තලතා දෙවීන් මැහැලි හෙයින් උන්ගේ නමකුත් නොවදාලසේක.

ප්‍රඥා සම්පන්නවූ ඒ මාගේ සවාමිදරුවාණන් නුවණින් යෙදී මධුර සවරයෙන් වර්ණනා කරත් කරත් තනු දෙවීන් අවුත් ඉදිරියේ සිටියාසේ වූහ. එවිට රජ්ජුරුවෝ සිතන්නාහු මහෞෂධ පණ්ඩිතයන් හැර අනික් කෙනෙක් මාගේ ප්‍රිය භාර්‍යාවවූ තනු දෙවීන් ගෙනවුත් මට දෙන්ට සමර්ථ කෙනෙක් නම් නැතැයි ඒ බිසවුන් සිතන්නාවූ රජහට බලවත් ශොක උපන්නේය. රජහුට උපන් ශොක කාරණය තමන්වහන්සේගේ ප්‍රඥාවෙන් දැන මහරජ! නොසිතා වදාල මැනව. තනු දෙවීන් පුතණුවෝත් නුඹවහන්සේගේ මැණියන් වහන්සේත් තුන් දෙනම එන්නාහ. උන් හැම මීට එන ගමනට බාධා නම් මා ඔබ නොයන පමණෙක්මය. ගිය විට එතියි වදාලසේක.

මෙසේද කියා මහරජ! මා ඉන්දදී මෙපමණකට ශොක නොකල මැනවයි රජ්ජුරුවන් අස්වසා වදාලසේක. ඉක්බිති රජ්ජුරුවෝ මම මාගේ නුවර සතුරන්ට අවකාශයක් නොදෙන ලෙස සකස් කොට රැකවල් ලවා තරකොට මේ උපකාරී නුවර අටලොස් අක්ෂෞහිණියක් පමණ සේනාවකින් වට ලාගෙන සිටියෙමි. මේ මහෞෂධ පණ්ඩිතයෝ වනාහි මෙතෙක් සුරක්ෂිතවූ මාගේ නුවරින් බිසවනුත්, පුතණුවන්ද, දියණියන්ද, මාගේ මැණියන්දැයි සතර දෙනා කිසි කෙනකුන් නොදන්නා පරිද්දෙන් ගෙනවුත් වෙදෙහ රජහට පාවා දුන්හ. අපත් වැලිත් මෙසේම පිරිවරාගෙන සිටියදීම කිසි කෙනකුන් නොදන්නා පරිද්දෙන් සේනා වාහන සහිතව වැද රජුන් මිසුලු නුවරට යවාපීය, කිමෙක්

අද් හෝ දිව්‍ය මායමක් දනිත් අද් හෝ නොහොත් ඉන්ද්‍රජාලයක් දනිත් අද් හෝයි විචාරා බලමියි සිතා කියන්නාහු මේ ගාථාවෙන් කිහ.

දිබ්බං අධීයසෙ මායං, අකාසි චක්ඛුමොහනං
යො මෙ අමිත්තං හත්ථගතං, වෙදෙහං පරිමොචයී'ති.

කිමෙක්ද? පණ්ඩිතයෙනි! මේසා රාජසෙනාවක් තුන්යම් රාත්‍රියෙහි නිදි මරා රැකවල් ගෙන වටලා සිටියදී ඒසා මහත් රැකවල හුන් මාගේ තැයන් සතරදෙනා ගෙන්වාගෙන මාගේ පසමිතුරා නොහොත් සතුරු වෙදෙහ රජුත් එක්කොට නුවරින් පිටත් කොට යවාපුව. කිමෙක්ද තෙපි දිව්‍ය මායමක් දනුද, නොහොත් ඇසට ඉන්ද්‍රජාලයක් දනුදැයි විචාළහ. ඒ අසා බොධි සත්වයන්වහන්සේ මහරජ! මම දිව්‍යමායමුත් දනිමි. ඉන්ද්‍රජාලත් දනිමි. නුවණැත්තෝ දිව්‍යමායමුත් ඉගෙන යම්සේ තමන්ට භයක් පැමිණි පතනදී ඒ භයින් තුමූත් ගැලවී අනුන්ුත් ඒ දුකින් ගලවා ගන්නෝ වේදැයි වදරා මේ ගාථාවෙන් කිහ.

අධියන්ති මහාරාජ, දිබ්බමායි'ධ පණ්ඩිතා
තෙ මොචයන්ති අත්තානං, පණ්ඩිතා මන්තිනො ජනා,

සන්ති මානවපුත්තා මෙ, කුසලා සන්ධිච්ඡෙදකා
යෙසං කතෙන මග්ගෙන, වෙදෙහො මිථිලං ගතො'ති.

ඇසුව මැනවි. මහරජ! වැලිත් මාවිසින් මෙයට කළදිව්‍ය මායම කුත් නැත ඇසට ලූ ඉන්ද්‍රජාලයෙකුත් නැත. එසේ කල කෙසේ ගියෝදයත්? උමං බිඳීමෙහි දක්‍ෂවූ මාගේ තරුණ යොධයන් විසින් විසිතුරු කොට බිඳ දිව්‍යපුරයක් මෙන් සරහනලද උමගකින් වෙදෙහ රජ්ජුරුවෝ නුඹවහන්සේගේ තැයනුත් හැර ගෙන මියුලු නුවරට පලාගියහයි වදාළසේක.

එපවත් අසා ඉක්බිති රජ්ජුරුවෝ සිතන්නාහු එකෙකු දෙන්නෙකු පවා උමගකින් යනකල මහා ව්‍යසනයෙන් දුකසේ පිටත්ව යන්නේය. මේ පණ්ඩිතයෝ සෙනාව සහිතවූ රජ්ජුරුවෝ සුවසේ උමගින් පැලාගියහයි කියති. ඒ උමග කෙබඳුදයත් අද් හෝයි උමග දක්නාං කැමතිවූහ. සකල ජනානන්දකරවූ තිලෝගුරු මාගේ බොධිසත්වයන්වහන්සේ රජ්ජුරුවන්ගේ ආකාරයෙන්ම දැන රජ්ජුරුවත් උමග දක්නා කැමති සැටිය. උන්ගේ මනදෙළ පුරවා උමග දක්වා පියමි සිතා රජහට මේ ගාථාවෙන් වදාරනසේකි.

ඉඩඝ පස්ස මහාරාජ, උම්මග්ගං සාධු මාපිතං
හත්ථිනං අථ අස්සානං, රථානං අථ පත්තිනං–
ආලෝකභූතං තිට්ඨන්තං, උම්මග්ගං සාධු නිට්ඨිතන්ති.

මෙසේ වදුරා මහරජ! මාවිසින් මවනලද උමඟ චිත්‍රකාරයන් විසින් සරහා සිටුවන ලද ඇතුන්ද, එසේම සරහා නිමවනලද අසුන්ද, එසේම අසුන් සරහා නිමවනලද රථවාහනද යුද්ධයට සැරහී සිටියාක් වැනි සජීවයයි මුත් අජීවයයි වහා නොදත හැක්කාවූ නොයෙක් ආයුධ ගත් අත් ඇති පාබල මහා සේනාවද යන සියලු අලංකාරයෙන් දිව්‍ය සභාවක් මෙන් ආලෝකවත්ව සිටියාවූ දසදහක් සක්වළ එක තෙනකත් මෙබඳු ආශ්චර්යයක් නැත්තාවූ ඒ උමඟ මහරජ බලා වදාළ මැනව.

තවද මහරජ! මාගේ ප්‍රඥ නමැති චක්ෂුයා හා උපායනුවණ නමැති සූර්යයා හා එක්ව සිට නැංගාවූ ඒ ස්ථානයෙහි සරහනලද උමඟ අසූවක් පමණ මහදොර ඇත්තේය. සූසැටක් පමණ සුළුදොර ඇත්තේය. එක්සියයක් පමණ ශ්‍රියහන් ගබඩාවල දොර ඇත්තේය. තවද නොයෙක් සියදහස් ගණන් පහන් ගබඩාවල දොර ඇත් තේය. තවද උඩ බිම දෙපාශ්වයෙහි අනෙක ප්‍රකාර විචිත්‍රවූ චිත්‍ර කර්මාන්තය යන මේ සියල්ලම වඩුවා සිතක් නැතිව මා හා සමග සතුටු සිතින් අවමැනව. අවෛරීව මට අවනතව තුඹවහන්සේගේ එක්සියයක් රජදරුවන් හා අමාත්‍ය මණ්ඩලය පිරිවරා බලවාහන සහිතව මේ උපකාරී නුවරට වැඩිය මැනව.

ඉදින් එසේ නොව ගිය වෙදෙහ රජු ගියත් අඩියක් ලද්දේ පණ්ඩිතයෙකැයි කිවාසේ මා කෙරේ මායමින් හිතසිතක් නොහඟවා නොසතුරු ලෙසින් නුවරට වැඩිය මැනව. එසේ වැද දෙන්නාටම කරන දෙය මුටම කෙරෙමියි සිතා මා අල්වාගන්ට මායම් සිතකින් ආසේක් වීනම් දසදහසක් යොදුන් දඹදිව එක් සියයක් රජුන් හා අටළොස් අක්ෂෞහිණී සඞ්ඛ්‍යාත චතුරඞ්ගිනී මෙපමණ සේනාවක් තබා ඉදින් සෘද්ධි සම්පන්න චක්‍රවර්ති රජෙක් තමාගේ ආනුභාවයෙන් සතර මහාද්වීපයෙහි සෙනාව ඒ ඒ රජ දරුවන් සහිතව ගෙන ආයේ වී නමුත් මාගේ එකදු උපන් යොධයන්ගෙන් එකෙක් ඒ සේනාව මරා ලුහු බඳවා ජයගෙන මා රැක ගන්නට පොහොසත් වන්නේය. එබැවින් මහරජ! මා කෙරෙහි පරණ වෛරයක් සිත ඇත් නම් දුර්බුද්ධියක් නොසිතා වහා වැඩිය මැනවැයි කියා උපකාරී නුවර වාසල් හරවා වදාළසේක.

---

1 උපද්‍රවයක්

චූලනී රජ්ජුරුවෝ් එක් සියයක් රජුන් හා අමාත්‍ය මණ්ඩලය පිරිවරා උපකාරී නුවරට වන්හ. අභිමතාර්ථ සාධකවූ චින්තාමාණික්‍යයක් බඳුවූ සර්වජන නෙත්‍ර රසායනයක් බඳුවූ මාගේ අභීත කෙශර සිංහරාජයකු මෙන් මාලිගාවෙන් බැස රජ්ජුරුවන් වැඳ ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් ඇතුළුවූ එක් සියයක් රජදරුවන් හා මහා සේනාව පිරිවරා උමඟට වන්සේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ් රාජ මඞ්ගලයට සරහනලද මාහැඟි නුවරක් බඳුවූ ඉතා ආශ්චර්‍ය්‍ය වත්වූ උමඟ දැක බෝධිසත්ත්වයන්වහන්සේගේ ගුණ වර්ණනා කියන්නාහු,

> ලාභා වත විදෙහානං, යස්ස මෙදිසා පණ්ඩිතා ඝරෙ
> වසන්ති විජිතෙ රට්ඨෙ, යථා ත්වං'සි මහොසධො'ති.

එම්බා දරුවෙනි! යම් රජක්හුගේ ජනපදයෙහිද, එක රටකද, එක නුවරකද, එක රජගෙහිද, මේ මහෞෂධ පණ්ඩිතයන් වැනි කෙනෙක් වෙසෙත් නම් ඒ රටවස් ජනපදවාසීන්වත් ඒ රජුන් වත් ලාභයක් මූත් අලාභයෙක් නැත්තේය. එසේහෙයින් මේ පණ්ඩිතයන් හා සමග වසන්නාවූ වෛදෙහ රජහට වූයේ මහා ලාභයෙකැයි බෝධිසත්ත්වයන්වහන්සේට ස්තුති කරන්නාහු වෛදෙහ රජු කෙරෙහි භජනයෙන්[1] ඉදින් මේ මහෞෂධ පණ්ඩිතයෝ් මා සමීපයෙහි මාගේ රජගෙහිවත් මාගේ නුවරවත් මාගේ ජනපද යෙහිවත් මාගේ ආඥා පවත්නා රට දනව්වෙහිවත් වෙසෙත් නම් මටත් වන්නේ මහා වැඩෙක්මය. මහාඅභිවෘද්ධියෙක්මයයි ප්‍රශංසා කොට කීහයි දතයුතු.

ඉක්බිති බෝධිසත්ත්වයන්වහන්සේ රජ්ජුරුවන්ට එක් සිය යක් ශ්‍රී යහන් ගබඩා දැක්වූහ. ඉන් එක ගබඩාවෙක දොර හළ කල මුළුල්ලේම දොර හැරී යන්නේය. එක් ගබඩාවෙක දොර පියූ කල මුළුල්ලෙහිම දොර පිහියන්නේය. මෙසේ ආශ්චර්‍ය්‍යවත්වූ උමඟ විස්තර බලමින් රජ්ජුරුවෝ් පළමුව යන්නාහ. බෝධිසත්ත්වයන්වහන්සේ රජ්ජුරුවන් පස්සෙහි වඩනාසේක. එක් සියයක් රජදරුවන් හා මහා සේනාව හා උමඟට වන්හ. මහඋමඟ දෙගවුව ගෙවා ගොස් රජ්ජුරුවෝ් උමං දොර එළිපතින් පිටත්වූහ.

බෝධිසත්ත්වයන්වහන්සේ රජහු පිටත් බව දැන තමන් වහන්සේ උමඟින් පිටත්වන සේක් අනිකක්හු පිටත්විය නොදී උමඟ දොර පියනසේක් නොහඟවා ඇතයක් මැඩලූසේක. ඒ ක්ෂණයෙහි අසූ මහදොරය, සූසැටක් සුළුදොරය, එක් සියයක් ශ්‍රී

1 ව්‍යාජයෙක්

යහන් ගබඩාවල දෙරය, නොයෙක් සිය දහස් ගණන් පහන් ගබඩාවල දෙරය යන සියලු ගබඩාවල දෙරවල්ම එක පැහැර පිහි අගුළු ගී ගියේය. ඒ සියලු උමඟ ලොකාන්තරික මහා නරකය මෙන් අන්ධකාර විය. මහා ජනයෝ භයින් තැති ගෙන ගියහ. උමඟ හසුවූ මහා ජනයෝ ඔවුනොවුන්ගේ ශබ්දමුත් මූ මූයයි නොදත්හ.

බොධිසත්ත්වයන්වහන්සේ ඊයේ රෑ වෙදෙහ රජහු යවා නැවත උමඟට වදනාසේක් තමන්වහන්සේගේ මඟුල් කඩුව උමඟ දෙරකඩ වැලි පීරාපියා සඟවා තුබූසේක්ද? ඒ කඩු රුවන අතට ගෙන බිමින් අවලොස් රියනක් පමණ තැන් ආකාශයට පැන නැඟී සියරැලි විදුලිය මෙන් කඩු රුවන හිස ඔසවා ආකාශයෙන් බැස බිම සිට රජහු අත අල්වාගෙන කඩු රුවන තිරිප්පු කොට බොටුවට පෑ අමෝරා භයගන්වා මහරජ! මේ සියලු දඹදිව රාජ්‍යය කාගේදැයි විචාළසේක. රජ්ජුරුවෝ භයින් තැති ගෙන පණ්ඩිත යෙනි! තොපටයයි තොපටයයි තුන් විටක් කියා මා නොමරා මට අභය දෙවයි කීහ.

ඒ අසා බොධිසත්ත්වයන්වහන්සේ වදාරනසේක් මහරජ! නොබා වදාළ මැනව. මම නුඹවහන්සේ මරණ පිණිස කඩුව එස වූයෙම් නොවෙමි. මාගේ ප්‍රඥාවෙහි ආනුභාව දක්වන පිණිස කඩුව එසවීමියි කියා රජ්ජුරුවන් අතට කඩුව දුන්සේක. ඉක්බිති රජහු කඩුව ගෙන සිටිකල්හි වදාරනසේක් මහරජ! ඉදින් මා මරනු කැමතිසේක් වීනම් මේ කඩුවෙන් මරා වදාළ මැනව. නොම රන සේක් වී නම් මට අභය දෙවා වදාළ මැනවැයි වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ කියන්නාහු පණ්ඩිතයෙනි! තොපට මා විසින් අභය දෙන ලද්දේමය. තොපි මා කෙරෙහි සැක නොකරවයි කඩුව ගෙන ඔවුනොවුන්ට මතුත් නොවරදනා ලෙස ශපථ කළහ.

ඉක්බිති බොධිසත්ත්වයන්වහන්සේට රජ්ජුරුවෝ කියන්නාහු පණ්ඩිතයෙනි! තොපගේ මෙබඳු ප්‍රඥාබල හා කායබල ඇතිව කුමක් පිණිස දඹදිව රාජ්‍යය නොගත්තුදැයි කීහ. මහරජ! ඉදින් කැමැත්තෙම් වීම් නම් අදම සියලු දඹදිව සියලු රජදරුවන් මරා රාජ්‍යය ගනිමි. අනුන් මරා යසස් ගැන්ම නුවණැත්තන් විසින් නිඤ කරන ලද්දැයි වදාළසේක. රජ්ජුරුවෝ එබසට සන්තොෂව කියන්නාහු පණ්ඩිතයෙනි! උමඟ හසුවූ මහජනයා දෙර නොහර නොත් වලප්නාහ. උමඟ දෙර හැර බොහෝ දෙනාට ජීවිත දානය දෙවයි කීහ.

සකල ජනානන්දකරවූ තිලෝක තිලකවූ අනාථ නාථවූ අසරණසරණවූ කරුණා නිධානවූ මාගේ ස්වාමිදරුවාණෝ එවේලෙහි උමඟ දොර හැර වදාළසේක. සියලු උමඟ හිරු නැංගාසේ එකාලෝකව ගියේය. උමඟ හසුවූ ජනයෝ අස්වස් ලදින් සැපසේ සිටියාහ. එක් සියයක් රජදරුවෝ තම තමන්ගේ අගම් පඞ සෙනාව හා සමග උමඟින් පිටත්වැ බෝධිසත්ත්වයන්වහන්සේ සිටි තෙනට ගියාහ. බෝධිසත්ත්වයන්වහන්සේ චූලනී රජ්ජුරුවන් හා සමග මහවිසල් මලුවෙහි සිටියාහ.

ඉක්බිති රජදරුවෝ බෝධිසත්ත්වයන්වහන්සේට කියන්නාහු පණ්ඩිතයෙනි! තොප නිසාය අප දිවි ලද්දේයයි මද ඇසිල්ලකින් දොර නොහලුවෝ වී නම් අපි හැම උමඟම මළමෝයයි කීහ. ස්වාමි දරුවෝ වදුරනසේක් ඇසි ද්රුවෙනි! දුන් මතු නොවෙයි. පළමුත් තොප හැම රැක්කෙම් මම්ම වේදැයි වදාළසේක. ඔබ නිසා තමන් රැකුණු නියාව නොදන්නා රජදරුවෝ ඒ කවර කලද? පණ්ඩිත යෙනි! කීහ.

ස්වාමිදරුවාණෝ උන් හැම ගිවිස්වා සලකුණු වදුරනසේක් රජදරුවෙනි! අපගේ මිථුලු නුවර තබා සියලු දඹදිව රාජ්‍යයන් ගෙන මේ උත්තර පඤ්චාල නුවරට අවුත් මගුල් උයනදී ජය පානය බොම්හයි රා මස් ආදී සියල්ල සැපයූ දවස් සිහි කරවයි වදාළසේක. එසේය පණ්ඩිතයෙනි! සඳහන් ඇතැයි කීහ. එසේ වී නම් මේ රජ්ජුරුවන් හා කෙවට්ටයා හා කළ නපුරු මන්ත්‍රණය කින් කෙවට්ටයාගේ බස් ගෙන විෂ මිශ්‍රවූ රා හා මච්ඡ මාංස කවා තොප හැම මරන පිණිස කළාවූ ඒ මන්ත්‍රණය මම දැන පොළෝ තෙලෙහි මා බඳු පණ්ඩිත කෙනකුන් ජීවත්ව ඉන්දදී මා බල බලා මේ රජදරුවෝ අනාථ මරණෙන් නොමියෙත්වයි සිතා මාගේ සහජාත යොධයන් එවා සියලු රා හා මච්ඡ මාංස පිරූ සැළවල් බිඳුවාපියා දුෂ්ටවූ කෙවට්ටයාගේ හා මේ රජ්ජුරුවන් කළ මන්ත්‍රණය බිඳ තොප හැමදෙනාට ජීවිත දානය දුන්නෙම් වේදැයි වදාළසේක.

එබස් අසා එක් සියයක් රජදරුවෝ කලකිරුණු සිත් ඇතිව සැබෑද? මහරජ! එසේ කෙළේයයි කීහ. කෙවට්ටයාගේ බස් ගෙන මා එසේ කෙළේසැබව. බොරුවෙක් නොවෙයි. පණ්ඩිතයන් කීයේ සැබෑවයි කීහ. රජදරුවෝ හැම දෙනම බෝධිසත්ත්වයන් වහන්සේ සිපගෙන පණ්ඩිතයෙනි! අප හැම දෙනාට පිහිටව සිටියෝ තොපිමය. තොප නිසාය අප හැම දෙන දිවි ලද්දේයයි

තම තමන් පලන් ඔටුනු සහිතවූ සුසැට ආභරණයෙන් බෝධිසත්ව යන්ට පූජා කළාහ. ඒ පූජා විඳගෙන සිටිය චූලනී රජ්ජුරුවන්ට උපන් කහස්සලු දුරු කරවනසේක් මහරජ! නොසිතුව මැනව. නුඹවහන්සේගේ වරදෙක් නොවෙයි. මේ වූකලී නෙල දුෂ්ටවූ පාප මිත්‍රද්‍රෝහිවූ කෙවට්ටයාගේ අමිත්‍ර සංසර්ගයෙන් වූ දෝෂයම මතු මෙවැන්නක් නොකෙරෙමියි මේ රජදරුවන් ක්ෂමාකරවා ගත මැනවයි වදාළසේක.

රජ්ජුරුවෝත් කියන්නාහු රජදරුවෙනි! මාගේ නුවණකින් තොප හැම දෙනා කෙරෙහි ජනමංහතර වෛරයකින් මා කළ දෙයෙක් නොවෙයි. තෙල ඉතා දූජිතවූ ගුණමකුවූ ලාමක කොලෙහි ගුණ නොදන්නාවූ අලජ්ජිවූ අනාර්ය්‍ය සවරූප ඇති අව ලක්ෂණවූ කේවට්ට නම් ජඩයා නිසා මා නොදැන කළ අපරාධය ක්ෂමා කරව. නැවත මෙවැන්නක් මා පණතබා කරන්නේ නැතයි සිතන්නේ නැතයි ක්ෂමා කරවූහ. නැවත රජ්ජුරුවෝ ඔවු නොවුන්ගේ වරද දෙසා හැම දෙනම එක්සිත් වීමෙන් සමග වූහ.

ඉක්බිති බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ බොහෝ කන බොනදෑ හා මල් හා ගඳ විලවුන් ගෙන්වා සියලු රජදරුවන් හා උත්තර පඤ්චා ලය, මියුලු නුවරය යන දෙරට සේනාව එක්ව සත්දවසක් උමඟ ඇතුලෙහිම උත්සව කෙළ ඉන් නැඟී උපකාරී නුවරට වැද බෝධි සත්වයන්වහන්සේට බොහෝ සත්කාර සම්මාන කොට එක් සිය යක් රජදරුවන් පිරිවරා මාළිගාවේ මතු මහල්තෙලෙහි හුන්නාහු බෝධිසත්වයන්වහන්සේ තමන් සමීපයෙහි රඳවනු කැමතිව කියන්නාහු,

> වුත්තිඤ්ච පරිහාරඤ්ච, දිගුණං භත්තවෙතනං
> දදාමි විපුලං භොගං, භුඤ්ජ කාමෙ රමස්සු ච
> විදෙහං පච්ඡා ගමිස්සාමි, කිං වෙදෙහො කරිස්සතී'ති.

මහෞෂධ පණ්ඩිතයෙනි! දවස් පතා ජීවිකා වෘත්තියට දෙනලද වියදම් ආදියද ගම් බිම් ගව මහිෂ ඇත් අස් රථ ආදී වාහන සමූහ යද, මුතු මැණික් පබළු වෛදූර්‍ය්‍ය මාසාරගල්ල ලොහිතඞ්ක සඞ්ඛ ප්‍රවාල රජත සවර්ණාදී දස විධ රුවන් සමූහයද, ඒ ඒ දෙශයෙහි අනෙක ප්‍රකාර වස්ත්‍ර සමූහයන්ද, දාසි දාස ආදීවූ නොයෙක් කර්මාන්ත කාරයන්ගෙන්ද මාගේ රාජාභිවෘද්ධිය දෙවනු කොට තොප නොයෙක් පරිද්දෙන් ආඪ්‍ය කොට සිටුවා ලමි. වෙදෙහ රජ්ජුරුවන් තබා දුන් වෘත්තියට හැමදෙයින්ම ත්‍රිගුණ කොට දෙමි. එක දෙශයකට නායක වෙදෙහ රජ්ජුරු වන් තොප රැකලිය ගෙන කල දස දහසක් ගොදුන් දඹදිවට නායකව රජවූ මම රකිනෙම්ම වේද.

තවද තොප මියුලු නුවර එක වෛදෙහ රජ්ජුරුවන්ට වෛදෙහ රටට සෙනෙවි රත් කම් කරන පමණෙක් වේද? මා සමීපයෙහි රැඳුනු නම් දස දහසක් යොදුන් දඹදිවට නායකව රජවූ මටද එක් සියයක් රාජධානියෙහි රජදරුවන්ටද, තොප තනිව සෙනෙවි රත් ධූරය කරන හෙයින් රජහු එක් සියයක් දෙනය. එක සෙනෙවි රද්දුයයි රජදරුවන් මූළුල්ලට වඩා තොපගේ ආඥවත් තෙජසත් ප්‍රඥවත් කීර්තියත් හැමදෙනාටම වඩා සිටින්නේය. ඉදින් තෙපි මෙහි රඳවූ නම් එක් සියයක් රාජධානිවල අමාත්‍ය මණ්ඩලය සහිතවූ මනුෂ්‍යයෝ තොප මූත් අප ඇතැයි කියාත් නොදන් නාහ. තවද තොපි මෙහි හුනු නම් අවශෙෂ මනුෂ්‍යයන් තබා එක් සියයක් රජදරුවන් හා සමග මාත් තොප කිවක් මූත් අප සිතින් සිතා කිසිවකුත් නොකරම්හ. බොධිසත්‍වයන්වහන්සේ ඒ ප්‍රතික්‍ෂෙප කරනසේක් මෙසේ වදාරනසේක.

යො වජෙථ මහාරාජ, භත්තාරං ධන කාරණා
උභින්නං හොති ගාරය්හො, අත්තනො ච පරස්ස ච
යාව ජීවෙය්‍ය වෙදෙහො, නාඤ්ඤස්ස විජිතෙ වසෙ'ති.

මහරජ! යම් පුරුෂයෙක් බොහෝ දවසක් බොහෝ සම්පත් දී භර්තෘ ස්වාමිව රක්‍ෂා කළ රජක්හු සමීපයෙන් අනික් රජක්හු ඒ සම්පතට වඩා සැපත් දෙමි කිවයි ඒ චිරාත් කාලයක් මූළුල්ලෙහි රැකි රජු හැර අමුතුව සම්පත් දෙමි කී රජහුගේ සම්පත් නිසා එහි ලොභයෙන් ගියේ වී නම් ඔහට තමා විසිනුත් නින්‍දමය. අනුන් විසිනුත් නින්‍දමයයි වදාළසේක. ඒ කෙසේද යත්? තමා බාල අවස්ථාවෙහි පටන් කාරණා කාරණා උගන්වා සියලු සම්පත්තීන් ආඪ්‍ය කොට මේසා නනතුරෙක තබා රකිමින් සිටි රජහු හැර සැපත් වඩා දෙම්හ[1]යි කී පමණකින්ම මෙතෙක් දවස් කළ උප කාර ජල රේඛාවක් පරිද්දෙන් කෙළේය

තැවත දූත් ගිය තැන රජහටත් එතෙක්ම වේදූයි අනුන්ගෙ නුත් නින්‍දම ලබමි. මේ අනුන් ගෙන් ලබන නින්‍දනම්ය. තමාවිසින් ලබන නින්‍දනම් මේ රජ්ජුරුවෝ මා තමන්ට නොතැව නොවදූව[2] සත් හැවිරිද්දෙහි පටන් මා තමන් සමීපයෙහි වස්වා[3] මා නිසාම මාගේ දෙමවුපියන්ට ඒසා උපකාරයකුත් කොට මා මේසා නනතුරෙක තබා මහා ඓශ්වර්‍ය්‍යයෙහි පිහිටුවා රකිමින් සිටි රජහු අතහැර වඩා සැපත් දෙමි කීවයි මා කළදූ ඉතා යහපත්

1 දෙම් කී
2 නොසු හැසිය කමක් නැතිව
3 රඳවා

තොවන්නේයයි තමාම තමහට තිඳුකරතහෙයින් දෙතෙන තිඳුයෙන්ම මට ගැලවීමෙක් නැත. එබැවින් මාගේ රජ්ජුරුවෝ යම්තාක් ජීවත් වේද ඒතාක් මුළුල්ලෙහිම වෙදෙහ රජ්ජුරුවන් ගේ මහෞෂධ පණ්ඩිතයෝයයි කිවත් ලවාම බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මහෞෂධ පණ්ඩිතයෝයයි නොකියවමි.

මිථුලු නුවර මහෞෂධ පණ්ඩිතයෝයයි කිවත් ලවාම උත්තර පඤ්චාල දෙශයෙහි මහෞෂධ පණ්ඩිතයෝයයි නොකියවමි. මාගේ රජ්ජුරුවන් ජීවත්ව ඉන්දදීම මා රඳන්නේ නැතැයි වදාළසේක.

නැවත රජ්ජුරුවෝ කියන්නාහු එසේ වී නම් පණ්ඩිතයෙනි! තොපගේ රජ්ජුරුවන් ස්වර්ගස්ථවූ කල එම්යි මට ප්‍රතිඥා දෙවයි කීහ. මහරජ! ජීවිතය නම් බාලයයි මහලුයයි නිමයෙක් නැත. එතෙකට මම රැකී හුන්නෙම් වීම් නම් එම්යි වදාළසේක.

ඉක්බිති රජ්ජුරුවෝ බොධිසත්වයන්වහන්සේට ප්‍රමාණාතික්‍රාන්තවූ මහා සත්කාර කරවා සත් දවසක් ඉකුත්වූ කල්හි බොධිසත්වයන්වහන්සේ ගමනට සමු ඉල්ලූසේක. චූලනී රජ්ජුරුවෝ පණ්ඩිතයෙනි! තොපට මේ මේ දෙය දෙමි. ඒත් ගෙන යවයි ප්‍රසාද කියන්නාහු මේ ගාථාවෙන් කියත්.

> දම්මි නික්ඛ සහස්සං තෙ, ගාමා'සීතිඤ්ච කාසිසු
> දසී සතානි චත්තාරි, දම්මි භරියා සතඤ්ච තෙ
> සබ්බං සෙනඞ්ග මාදාය, සොත්ථිං ගච්ඡ මහොසධා,ති.

මහෞෂධ පණ්ඩිතයෙනි! තොපටම නික් දහසක් දෙමි නොහොත් මාඑ රත්රන් තොපට පසළොස් දහසක් දෙමි. තවද තොපගේ මිථුලු නුවරට බද වෙදෙහ රටට ආසන්නවූ කාසි දෙශ යෙන් එකී එකී ගමකින් අවුරුද්දකට ලක්ෂයක් බැගින් අය නිමන්නාවූ මෙසෙයින් අවුරුද්දකට අසූ ලක්ෂයක් නිමන උතුම් සළුගම් අසූවක් දෙමි. තවද නොමැහැලිවූ බාලපරායෙහි තන සිටි කෙල්ලන් සාර සියයක් දෙමි. තවද නොයෙක් බිසෝ පලඳනා යෙන් සරහා නිමවනලද ශරීර අවයව ඇති සර්ව ලක්ෂණ සම්පන්න දෙවඟනන් වැනි මාගේ බිසෝවරුන්ගෙන් සියයක් තොපට නිති තින්දේ කොට පාවා දෙමි. තවද මාගේ චතුරඞ්ගිනී සෙනාව තොපට තින්දේම ප්‍රසාද සේනාවක් කොට දෙමි. තොපගේ සේනාවත් මාගෙන් දුන් සේනාවත් හැර ගෙන සුවසේ තොපගේ රටට යවයි සමු දුන්නාහු.

ඉදින් නන්දා දේවීන් යා නෑයන් සතර දෙනා වෙදෙහ රජ්ජුරුවෝ නේවත් නමුත් පණ්ඩිතයන් වහන්සේ තමන්ගේ ආඥාවට[1] රුදුනුදදී නමුදු බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ චක්‍රරත්නය හස්ත ප්‍රාප්තවූ සක්විති රජකු මෙන් සන්තෝෂවත් මූත් පිටත මාගේ බිසවුන් හා නෑ කොතෙක් ඇත්තෝ වේදැයි කියන්නා තබා සිතිනුත් නොසිතන්නාහ.

බෝධිසත්ත්වයන්වහන්සේ තමන් වහන්සේට සමු දුන් රජ්ජුරුවන් අස්වසා වදාරනසේක් මහරජ! නුඹවහන්සේගේ නෑයන්ට මාගේ නෑ කොතෙක් සාර සියයක් ගවුවෙන් දුර වෙත්දැයි නොසිතුව මැනව. නැවත ඒ මාගේ රජ්ජුරුවන් යවන ගමනේම මෙබඳුවූ සම්මානයක් කෙළෙමි. මහරජ! නන්දා දේවීන් මවු තනතුරෙහි තිබුව මැනව පඤ්චාලචණ්ඩ කුමාරයන් මල් තනතුරෙහි තබාලුව මැනවැයි කියාත් නවද නුඹවහන්සේගේ දුවණියන් පඤ්චාලචණ්ඩි කුමාරිකාවන් අභිෂේකයට පමුණුවා සොළොස් දහසක් බිසෝවරුන්ට නායක කොට ඔටුනු පළඳවා රජහට පාවා දී යැවීමි. නුඹවහන්සේගේ මැණියන් වහන්සේත් බිසවුන් වහන්සේත් පුතණුවන්දැත් මා ගිය නොබෝ දවසකින්ම වහා එවාලමියි වදාළසේක.

යහපත පණ්ඩිතයෙනි! කියා තමන්ගේ දුවනියන්ට දුනමනා දායාදයට දැසි දස වස්ත්‍රාලඞ්කාර මුතු මැණික් ආදිවූ දසවිධ අනර්ඝ වූ රුවන් සමූහයද රත්නාලඞ්කාරයෙන් සරහා නිමවනලද ඇත්, අස්, රථ, ආදී වාහන සමූහයද යන මේ දායාද මුළුල්ලම කිසිවකිනුත් අඩුවක් නොකොට තමන්ගේ නායක තනතුරට හා රජව මූත් මෙසේ දිය හැකිදැයි කට කට කයිවාරු කරන පරිද්දෙන් නොයෙක් සම්පත් මුළුල්ල මාගේ දුවණියන්ට දෙමයි බෝධිසත්ත්වයන්ට පාවා දී බෝධිසත්ත්වයන් හා කැටිව යන සේනා වාහන ආදියට කළමනා කටයුතු විචාරන්නේ එහි විධානයේ සිටියවුන්ට මෙසේ විධාන කෙරෙත්. කෙසේදයත්?

යාව දදන්ති හත්ථිනං, අස්සානං දිගුණං විය
නපෙසන්තු අන්නපානෙන, රථිකෙ පත්තිකාරකෝ'ති.

එම්බා සගයෙනි! වෙදෙහ රජ්ජුරුවන්ගේ සොළොස් දහසක් ඇත් ඇණිය, සොළොස් දහසක් අස් ඇණිය, සොළොස් දහසක් රථ ඇණිය, එතරමට නොඅඩුවූ චතුරඞ්ගිනී සේනාවයයි යන මේ සියල්ලෝම වෙදෙහ රජ්ජුරුවන් හා කැටිව ගියාහ. මෙවිට

1 යාඥාවට

සිටියාහු බොහෝ දෙනෙක් නොවන්නාහ. මහෞෂධ පණ්ඩිතයන්ගේ අගම්පති සේනාව සිටිනා සොළොස් දහසක් ඇත් ඇණිය, සොළොස් දහසක් අස් ඇණිය, සොළොස් දහසක් රථ ඇණිය, ඒ තරමට වඩා සිටිනා පාබල සේනාවය. උන් උන්ට දෙන්නේ වැඩියෙක් නොවන්නේය.

උන් උන්ට පළමු දෙන තරමට පණ්ඩිතයන්ගේ වියදම් කැමියන් අතින් තියම දූත පළමු දෙන්නාට දෙන වියදම් තෙපි එකකුට බැගින් සියල්ලවුන්ට දෙන වෘත්තීය උත්තමයන් කෙරෙහි පටන් අධමයන් දක්වාත් ඇතුන් අසුන් කෙරෙහි පටන් ගවයන් දක්වාත් පළමු වියදම් කා සිටියවුන්ට කිසි කෙනකුනුත් රුහැණි නොකරවා වහා දෙව. අන්නපානයට තෙල් සාල් උඳු මුං උක්දඬු කෙසෙල් ආදීවූ ඵල රසයන්ද වස්ත්‍රාභරණාදීවූ සියල්ලම කිසිව කිනුත් අනූන නොකොට දෙව. එසේ කල සාරසියයක් ගවු ගෙවායන්නාහු මඟ සුවසේ නිදුකින් කල්‍ාන්ත නොවී යන්නාහයි විධාන කළහ. නැවත බෝධිසත්වයන්වහන්සේට සමූ දෙන්නාහු මෙසේ කියත්.

ඤත්ති අසෙස රට්ඨෙ පත්තී, ගවෙජ්'වාදාය පණ්ඩිත
පසසතු තං මහාරාජ, වෙදෙහො මිථිලං ගත'නති.

මහෞෂධ පණ්ඩිතයෙනි! ඇත් අස් රථ පදාදී සේනාව පිරිවරා මහාසනෙතාෂයෙන් අසුර විජය කොට ජයලත් ශක්‍රදෙවෙන්ද්‍රයා පරිද්දෙන් වහා තික්මෙව. තොප එසේ සුවසේ මියුලු නුවරට ගියවුන් තොප දකින්ට පුල පුලා හුන් වෙදෙහ රජ්ජුරුවන් හා පෙර මඟ බල බලා හිඳිනා නුවරවාසින් හා තොප ගියවුන් දැක සතුටු වෙත්වයි කීහ.

මෙසේ බ්‍රහමදත්ත රජ්ජුරුවෝ බෝධිසත්වයන්වහන්සේට මහත් සත්කාර කොට සමූ දී යවූහ. එක් සියයක් රජදරුවෝද බෝධිසත්වයන්වහන්සේට බොහෝ සත්කාර සම්මාන කොට පඬුරු දුන්හ. ඒ ඒ රජදරුවන් අතුරෙහි පළමු සිටි වරපුරුෂයෝ එක් සියයක් දෙන තම තමන්ගේ පෂීත් හා සමග අවුත් පණ්ඩිතයන් වහන්සේ පිරිවරා ගත්හ. ඒ මහතාණන්වහන්සේ ප්‍රමාණාතික්‍රාන්තවූ නොයෙක් මෙතෙකැයි ගැණ පමණ දත නොහැක්කාවූ චතුරඞ්ගිනී සේනාවෙන් යම්සේ ගොඩ ගමන් ගත් මහාසමුද්‍රය පරිද්දෙන් තික්ම මහට[1] පැමිණීසෙක් අතර මඟ සිටම බ්‍රහමදත්ත

1 ගඟට

රජ්ජුරුවන් දූන් සළුගම් අසුයෙහි අය එලවා ගෙනෙවයි ලියන් තන් හා මිතිසුන් යවූහ. තමන් වහන්සේ වෙදෙහ රටටම සම්ප්‍රාප්තවූසේක.

එදවස් උමඟින් යන්නටයයි කී බසින් දණ වැලම්ටි කඩරෙදි බැඳ කෝනම් හැඳ සැරහුනු ප්‍රඥාසමුද්‍රවූ ඉතා ගැටවූ සෙනකයා මතු වන්නා දැක උත්තරපඤ්චාල නුවර සිට වේදෙහ රජ්ජුරුවන් හා කැටිව මියුලු නුවරට එන්නේ අතර මඟ නුවරට දෙළොස් ගවුවකින් මත්තෙහි චූලනී රජ්ජුරුවන් නැවත මියුලු නුවරට එන්නාද? නොඑන්නාද? උත්තරපඤ්චාල නුවරින් කිසිකෙනකුන් එතොත් නියම දැන කියා ලවයි තමන්ගේ මිනිසකු කාවලට[1] සිටු විය. ඒ පුරුෂ තෙමේ මියුලු නුවරට දෙළොස් ගවුවකින් ඔබ්බේම බොධිසත්වයන්වහන්සේ වඩනාවුන් දැක වහ වහා දිව ගෙන ගොස් මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ මහා පෙරහරින් සිව්රඟ සෙන් පිරිවරා වඩිමින් සිටිසේකැයි දිව දිව අවුත් සේනකයාට කිය.

ඒ අසමින් සෙනකයා වහ වහා රජගෙට ගියේය. රජ්ජුරුවෝත් මාලිගාවේ මතු මහලේ සිට සිවුමැදුරු කවුළුවෙන් පිටත බැලුවෝ එන්නාවූ මහාසේනාව දැක මෙසේ කියත්. සෙනකය! කුමක් කියයිද? අපගේ පණ්ඩිතයන්ගේ සෙනාව මඳ, උන්ගේ හැම තමා සොළොස් දහසක් ඇත් ඇණිය, සොළොස් දහසක් අස් ඇණිය, සොළොස් දහසක් රථ ඇණිය, එපමණට තරම් පාබල සේනාවය. මේ සේනාව එන නියාව ඉතා භයානක ස්වරූප ඇත්තේයයි හයින් තැති ගෙන සේනකයා අතින් විචාරන්නාහු.

හත්ථි අස්සා රථා පත්ති සෙනා සන්දිස්සතෙ මහා
චතුරඞ්ගිනී භිංස රූපා කිත්නු මඤ්ඤසි පණ්ඩිතා,ති.

ඇත් සේනාවය, අස් සෙනාවය, රථ සෙනාවය, මෙතෙකැයි පමණ නැති පාබල සෙනාවය. එසේ හෙයින්ම ඉතා භයානක ස්වරූප ඇත්තේය. සෙනකයෙනි! තොපි උන් කවුරුනැයි සිතවු දැයි කීහ. සෙනකයා රජහු සැක හරවා තත්වූ පරිද්දෙන් කියන්නෝ මෙසේ කියා,

ආනන්දො තෙ මහාරාජ! උත්තමො පතිදිස්සති
සබ්බ සෙනඞ්ග මාදාය සොත්ථිං පත්තො මහොසධො'ති.

1 රැකවලට

මහරජ! නොබා වදාළ මැනව. තුඹවහන්සේට උතුම්වූ සන්තොෂයෙක් වන්නේය. එක් සියයක් රජුන්ගේ සේනාවය, බ්‍රහමදත්ත රජ්ජුරුවන්ගේ සේනාවය, අපගේ මියුලු නුවරින් ගිය සේනාවය යන චතුරඞ්ගිනී සෙනාව පිරිවරා සුවසේ එනසේක් අපට යස දායකවූ අපගේම ළයක් වැනි, අපගේම ඇසක් වැනි, අපගේම ජීවිතයක් වැනි, අපගේම ස්වාමිදරුවූ ජනානන්දකරවූ ලොකස්වාමිවූ තිලෝගුරුවූ තිලොකෙක තිලකවූ තිලොකෙක බන්ධුවූ තිලොකෙක නාථවූ ප්‍රඥසම්පන්නවූ සරණාගත වජ්‍රපඤ්ජරවූ ප්‍රඥප්‍රදීපවූ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ වඩනාසේකැයි කිය.

සෙනකය! කුමක් කියයිද? පණ්ඩිතයන්ගේ සෙනාව මඳය. මේ සෙනාව එදවස් බ්‍රහමදත්තයන් ආ තියාව මෙන් මහා සෙනාව කැයි කිහ. නැවත සෙනකයා කියන්නේ මහරජ! නොසිතා වදාළ මැනව. අපගේ ඒ ස්වාමිදරුවාණන්ගේ ඉතා මිහිරිවූ කණ්රසායනයක් බඳුවූ ධර්මාන්විතවූ මධුර කථාවෙහි බැඳුනු රජ්ජුරුවන් විසින් ඔබ කෙරෙහි පැහැද ඔබට ප්‍රසාද කොට දුන් සෙනාවය. සැක නොකොට වදාළ මැනවැයි කීය.

ඒ අසා රජ්ජුරුවෝ ඉතා සතුටුව නුවර බෙර ලවන්නාහු මේ මාගේ සත් යොදුන් මියුලු නුවර දිව්‍යපුරයක් මෙන් සාදා පණ්ඩිතයන්ටපෙරගමන් කෙරෙත්වයි කියා නුවර බෙරලැවූහ. නුවරවාසීහු දැක්මට පුල පුලා හුන්නාහු ඒ බව අසමින්ම අටවිසි ගවුවක් පමණ ඒසා මහත් නුවර අසුර විජය කොට ජය ගෙන එන ශක්‍රදෙවෙන්ද්‍රයන්ට සරහා නිමවනලද ශක්‍රපුරය මෙන් අතිමනොහර කොට ධවජ, පතාක, පුන්කළස්, කදලි, තොරණාදියෙන් හා සුදු වැලි ලද පස්මල් දම් ආදියෙන් විසිතුරු කොට සරහා නුවර වාසීහු සර්වාභරණයෙන් සැරහී ස්වාමිදරුවාණන්ට පෙර ගමන් කොට වඩා ගෙනාහ.

පණ්ඩිතයන් වහන්සේ ඒ නුවර වාසීවූ ස්ත්‍රී පුරුෂයන්ගේ තිලුපුල් පෙතිසේ වූ නෙත්‍රයන් සතුටු කඳුලෙන් පුරා තුෂාරයෙන් ආර්ද්‍රවූ තිලුපුල් පෙතිසේ කෙරෙමින් ඇස් තිවා සිත් තිවා තමන්වහන්සේ පස් මසක් මුළුල්ලෙහි නුදුටුවවුන්ගේ ශොක සංහිඳුවා ළෙහි අමා දී ඇසට රසාඤ්ජනයක් දෙන්නක්හු මෙන් අනන්තයා මෙන් දහසක් මුඛ මවාත් ඉදින් කියන කොත් ඒ මහතාණන්ගේ ශ්‍රී විභූතියෙන් ස්වල්ප මාත්‍රයකුත් කියන්නට අසමර්ථවූ අනොපමෙය්‍යවූ ශ්‍රී විලාසයෙන් රජගෙට වැද රජ්ජුරුවන් වැඳිසේක. රජ්ජුරුවෝ බොධිසත්වයන්වහන්සේ දැක සන්තොෂයෙන් පිනා ගියාහු වහා හුනස්නෙන් නැගී සිට ඉදිරියට අවුත් පණ්ඩිතයන්වහන්සේ සිප ගෙන නැවත ගොස් ආසනයෙහි හිඳ

සිහි කළයුතු මියුරු කථා කොට නැවත උපමාවක් කියා බලමියි සිතා කියන්නාහු මේ ගාථාවෙන් කියත්.

යථාපෙතං සුසානසමිං ඡඩ්ඩෙත්වා චතුරො ජනා
එවං කම්පිල්ලියෙ ත්‍යම්හා ඡඩ්ඩයිත්වා ඉධාගතා.

අථ ත්වං කෙන වණ්ණෙන කෙන වා පන හෙතුනා
කෙන වා අත්ථජාතෙන අත්තානං පරිමොචයි'ති.

එම්බා පණ්ඩිතයෙනි! මළ මිනියක් සතර දෙනෙක් කුරාල යහ ලා උසුලාගෙන ගියාහු අමු සොහොනේ දමාපියා ඔහුකෙරේ කිසි අපෙක්ෂාවක් නැතිව නැඟී එද්ද. එපරිද්දෙන්ම අපිත් තොප කම්පිල්ල දෙශයෙහි ලාපියා අපගේ පණ ගලවාගෙන තොපකෙරේ කිසි අපෙක්ෂාවක් නැතිව නැඟී ආම්හ. පසමිතුරන් අතට පැමිණ කවර කාරණයකින් කවර නුවණකින් කවර හෙතුවකින් තෙපිත් රැකී සෙනාවත් රැකගෙන සුවසේ අවුදුයි විචාළහ. ඒ අසා සවාමි දරුවාණෝ මේ ගාථාවෙන් වදාරනසේක්.

අත්ථං අත්ථෙන වෙදෙහ! මන්තං මන්තෙන ඛත්තිය!
පරිවාරයිස්සං රාජානං ජම්බුදීපං, ව සාගරො'ති.

මහරජ! බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් විසින් සිතූ යම් අර්ථයක් මාගේ තීක්ෂණවූ ප්‍රඥවෙන් අනික් අර්ථයක් සිතා ඔහු සිතූ යම් අර්ථයක්ම මම ජය ගතිමි. එරජ යම් මන්ත්‍රණයක් සිතුයේ වීනම් මාගේ මන්ත්‍රණයෙන්ම ඔහුගේ මන්ත්‍රණයත් මම ජය ගතිමි. තවද මහරජ! යම්සේ දඹදිව පිරිවරා සිටි සාගරය පරිද්දෙන් දඹදිවට අධිපතිවූ එක් සියයක් රජුන් හා සේනාව මාගේ ප්‍රඥබලයෙන් මා පාපිට ගස්වා මම චක්‍රවර්ති රජක්හු සේ සියලු රජුන් හා සේනාව පිරිවැරුයෙම් වේදුයි වදාළසේක.

මෙසේද කියා නැවත වදාරනසේක් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් සටනට සෙනාව මෙහෙයූ තැන් පටන් නුවර වාසල් හරිනා තුරු කී කල දෙයත් නැවත උමඟට වන් තැන් පටන් උමඟින් රජහු ගෙන ගොස් මහවිසල් මලුවෙහිදී කඩුව සැරහූ තැන් දක්වා එතෙනදී සපථ කොට රජහුගේ ආඥවෙන් උමඟ හසුවූ රජදරුවන් සහිතවූ සේනාවට දොර හැර උන් හැම මරණින් මුදා සවසථ කොට නැවත සත් දවසක් උමඟ කෙළියෙන් දවස් යවා ඉන් ඉක්බිති සත් දවසක් රජදරුවන් හැම දෙනා තමන්වහන්සේට දුන් පඬුරු හා නැවත බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් දුන් නොයෙක් ප්‍රසාද හා

නැවත එම රජහු දුවණියන්ට දුන් දෑයාද හා නැවත චූලනී රජ්ජුරු වන් ඇතුළුවූ සියලු රජදරුවන් තමන්වහන්සේට දුන් ප්‍රසාද සෙනාව ඇතුළුවූ සියල්ල කිසිවකිනුත් නොවලහා තමන්වහන්සේ ලත් දෙයත් කී කළ දෙයත් තත්වූ පරිද්දෙන් රජහට වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ අතිප්‍රසන්නවූසේක. නැවත බොධිසත්වයන් වහන්සේ චූලනී රජ්ජුරුවන් තමන්වහන්සේට දුන් ප්‍රසාද වදාරනසේක්,

දින්නං නික්ඛසහස්සං මෙ ගාමාසීති ච කාසිසු
දාසී සතානි චත්තාරි දින්නං භරියා සතඤ්ච මෙ
සබ්බං සෙනඞ්ග මාදාය සොත්ථිනම්හි ඉධාගතො'ති.

මාස රත්රන් පසළොස් දහසක් දුන්හ. සර්වාභරණයෙන් සැරහූ ශරීරශොභා ඇති බාල කෙල්ලන් සාරසියයක් හා එසේම බිසෝපලඳනායෙන් සැදි බිසෝවරුන්ගෙන් අනඝීවූ රූ ඇති කිරින්දන් සියයක් හා අපගේ මේ වේදෙහ රටට ආසන්නයේ කසී දෙශයෙන් එක් ගමකින් අවුරුද්දකට ලක්ෂයක් බැගින් අසූ ලක්ෂ යක් නිමන සළුගම් අසූවක් හා බ්‍රහ්මදත්තයන්ගේ හා එක් සියයක් රජුන්ගේ චතුරඞගිනී සේනාව ඇතුළුවූ සියල්ලම මට ප්‍රසාද කොට උන්කෙරෙහි නිරපෙක්ෂව මට දුන්හ. ඒ සියලු සෙනාව පිරිවරා කිසි උපටලියක් නැතිව මහා සන්තොෂයෙන් යුක්තව නැඟී ආම්යි වදාළසේක. ඒ අසා ප්‍රීතින් පිනාගියාවූ රජ්ජුරුවෝ බොධි සත්වයන්වහන්සේගේ ගුණ කියන්නාහු,

සුසුඛංවත සංවාසො, පණ්ඩිතෙහිති සෙනක!
පක්ඛිව පඤ්ජරෙ බද්ධෙ, මච්ඡෙ ජාලගතෙරි'ව
අමිත්තහත්ථත්ථගතෙ මොචයී නො මහොසධො'ති.

සෙනකය! නුවණැත්තවුන් හා එක්ව විසීම ඉතා යහපත් වන්නේය. ඉනුත් මෙම මහෞෂධ පණ්ඩිතයන් හා එක රටෙක එක නුවරෙක එක තෙනක යමෙක් වෙසෙත් නම් මේ ලොව සොර සතුරු බියෙක් වත් පරලොව අපාය භයෙක්වත් නැත්තේය. ඊට කාරණා තෝම දුටුයෙහි වේද? අටළොස් අක්ෂොභිණී සඞ්ඛ්‍යාත ඒසා මහත් සතුරු සේනාවක් මැදට හසුවූ තොප හා අප හා දෙමුරයෙක ගලවා ගත් නියාව තොපටම දැනෙන්නේ වේද? එසේහෙයින් නුවණැත්තවුන් හා එක්ව විසීම ඉතා යහපතැයි ගුණ වර්ණනා කළහ. සෙනකයාත් රජුගේ බස් මුදුනෙන් පිළිගෙන සැබවැයි කියා තමා ඇතිවක් පටන් සම සිතින් බොධිසත්වයන්ගේ ගුණ කියන්නේ,

එවමෙව මහාරාජ! පණ්ඩිතා හි සුඛාවහා
පක්ඛී'ව පඤ්ජරෙ බද්ධෙ මච්ඡෙ ජාලගතෙ'රිව
අමිත්තහත්ථගතෙ මොචයී නො මහොසධො'ති.

රජ්ජුරුවන් කී ලෙසම කියන්නෝය. මහරජ! සැබව නුවණැති පණ්ඩිතවරු නම් මෙලොවින් පරලොවින් ඉෂ්ටයක් මුත් අනිෂ්ටයක් විය නොදෙන්නෝමය. මැදිරියෙක හසුවූ පක්ෂීන් මෙන්ද, දැල හසුවූ මසුන් පරිද්දෙන්ද, සතුරන්ට අත්පත්ව ජීවිත විනාශයට පැමිණ සිටි අප හැම ගලවා සැපයෙහි පිහිටුවා ලූසේක. සමස්ත ලොකයෙහි නුවණැත්තාවූ සියලු සත්ත්වයන්ට ශතසහස්‍ර ගුණයෙන් වඩනාසේක් මේ අපගේ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේම යයි තමාගේ මුඛ නොසෑහෙන පරිද්දෙන් වෙනසක් නැතිව සම සිතින්ම ගුණ වර්ණනා කෙළේය.

ඉක්බිති රජ්ජුරුවෝ නුවර බෙර ලවන්නාහු සත් දවසක් සැණ කෙළි කෙළව, යම් කෙනෙක් මට හිතයෝ වූ නම් ඒ සියල් ලෝම පණ්ඩිතයන්ට නොයෙක් පඬුරෙන් සත්කාර සම්මාන කෙරෙත්වයි විධාන කළහ. ඒබව ප්‍රකාශ කොට වදාරන බුදුරජාණන්වහන්සේ මෙසේ වදාරනසේකි.

ආහඤ්ඤන්තු සබ්බවීණා භෙරියො දෙණ්ඩිමානි ච
නදන්තු මාගධා සබ්බා වග්ගුං වාදන්තු දුන්දුභී'ති.

එම්බා, මහණෙනි! ඒ වෛදෙහ රජුගේ විධානයෙන් සියලු වීණා වාද්‍ය ඉතා සිත්කලු කොට කණ්ණරසායන කොට ගායනා කළහ. තවද කරසක් මිටිසක් ජයතුරාසක් ආදී පඤ්චප්‍රකාර සඬ්ඛ නාද පැවැත්වූහ. තවද ආතතය, විතතය, විතතාතතය, ඝනය, ශුෂිරය යන පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය නාද පැවැත්වූහ.

තවද නැවත කවරේදයත්? වීණා, වේණු, වංශී, චස්දඬු, ඛත්තු, තන්ත්‍රි පටාවිජයොත් වන්නි අං සින්නම් ධාරා රන්සක් රිදීසක් ජයසක්[1] ආදී කාහල පිඹිත්වයි, ඩැක්කි, මණ්ඩල ගැට පටහු පනා අවුර තල ප්‍රවිරන්දම් තම්මැට තිසාන දුඳුංගු මහබෙර සමුද්‍රඝොෂා ආදිවූ භෙරි ජාතීන් වයත්වයි ඒ ඒ ස්ථානයෙහි ගී මඩුලු බැඳ නටා ගී කියත්වයි යනාදීන් උත්සවයට මේ ලෙස විධාන කළහ.

නුවර වාසීහුද, ජනපද වාසීහුද ස්වභාවයෙන්ම ස්වාමිදරුවාණන්ට සත්කාර කරන්ට සිතන්නාහු බෙර හඬ අසමින් වඩ වඩා සන්තොෂව ශක්ති පමණින් මහත් සත්කාර කළහ. නුවරවාසීන් හැමදෙනම බොධිසත්ත්වයන්වහන්සේට සත්කාර කළ පරිදි වදාරන තිලෝගුරු බුදුරජාණන්වහන්සේ,

1 විජයසක්

ඔරොධා ච කුමාරා ච වෙසියානා ච බ්‍රාහමණා
බහුං අන්නඤ්ච පානඤ්ච පණ්ඩිතස්සා'භිහාරයුං.

හත්ථාරූහා අණීකට්ඨා රථිකා පත්තිකාරකා
බහුං අන්නඤ්ච පානඤ්ච පණ්ඩිතස්සා'භිහාරයුං.

සමාගතා ජානපදා නෙගමා ච සමාගතා
බහුං අන්නඤ්ච පානඤ්ච පණ්ඩිතස්සා'භිහාරයුං.

බහුජ්ජනො පසන්නොසී දිස්වා පණ්ඩිත මාගතං
පණ්ඩිතමහි අනුප්පතෙන චෙලුක්ඛෙපො අවත්තථා'ති.

එම්බා මහණෙනි! ඒවේදෙහ රජුගේ අගමෙහෙසුන්වූ උදුම්බරා දෙවී ඇතුළුවූ සොළොස් දහසක් බිසෝවරුද, රජකුමරුවෝද, බ්‍රාහමණයෝද, ව්‍යාපාරයෝද යන සියල්ලෝම බොහෝ කන බොන දෑ හා නොයෙක් පඬුරු මහෞෂධ පණ්ඩිතයන්ගේ ගෙට ගෙන ගියහයි වදාළසේක.

තවද ඇතුන් නැගෙන්නෝද, අසුන් නැගෙන්නෝද, රථ නැගෙන්නෝද, පාබල සේනාවෙ ඇත්තෝද බොහෝ කන බොන දෑ හා නොයෙක් පඬුරු මහෞෂධ පණ්ඩිතයන්ගේ ගෙට ගෙන ගියහයි වදාළසේක. තවද රැස්වූ ජනපද වාසීහුද, නියම්ගම් වාසීහුද බොහෝ කන බොන දෑ හා නොයෙක් පඬුරු ගෙන පණ්ඩිතයන්ගේ ගෙට ගියහයි වදාළසේක.

එම්බා මහණෙනි! මහෞෂධ පණ්ඩිතයන් එක් සියයක් රජ දරුවන් හුන් තෙනට තමන්ගේ රටින් සාර සියයක් ගවු ගෙවා උන්ගේ රටට ගොසින් තමන් මරන්නට වටලා ගත් රජදරුවන් හා ඒසා මහත් චතුරඞ්ගිණී සේනාව තමන්ගේ ප්‍රඥාබලයෙන් තනිව ජය ගෙන උත්තරපඤ්චාල දෙශයෙන් මිථුලුනුවරට ආ දවස පටන් රැස්වූ බොහෝ මනුෂ්‍යයෝ සුවසේ ආවාවූ පණ්ඩිතයන් දූත බ්‍රහමදත්ත රජ්ජුරුවන් ඇතුළුවූ එක් සියයක් රජුන් ජය ගෙන ආසේකැයි ඉතා ප්‍රසන්නව ඒ පණ්ඩිතයන්ගේ කිත්තිය පැතිරෙන් නාක් පරිද්දෙන් සත් දවසක් මුළුල්ලෙහි පිළී හිස නටවමින් ඔල්වර හඬ දිදී නෙසියාඩම් කෙළියහයි වදාළසේක.

මෙසේ බොධිසත්ත්වයන්වහන්සේ සත් දවසක් නුවර සැණකෙළි කෙල අනතවූ කල්හි රජගෙට ගොසින් මහරජ! චූලනී රජ්ජුරුවන්ගේ මෑණියන් හා පුතණුවන් හා බිසවුන් හා වහා යැවුව මැනවැයි වදාළසේක. යහපත පුත! මට කියන්නේ කිම්ද?

යවාපියවයි කීහ. බොධිසත්ත්වයන්වහන්සේ ඔවුන් තුන් දෙනාට වෙන වෙනම බොහෝ සත්කාර සම්මාන කොට එක් සියයක් රජ දරුවන් හා බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා තමන්වහන්සේට ප්‍රසාද යෙහි දුන් චතුරඞ්ගිනී සේනාවට බොහෝ ප්‍රසාද දීමෙන් සත්කාර සම්මාන කරවා ඒ මහා සේනාවත් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් තමන් වහන්සේට බිරින්ද කොට පාවා දුන් බිසෝවරුන් සියය හා කම් මිත්තන් සාරසියය ඇතුළුවූ පන්සියය නන්දා දෙවින්ට පාවා දී ප්‍රසාද සේනාවක් තමන්වහන්සේගෙන් උන් හැරලා එන පරිද්දෙන් පාවා දී මඟපෙරහරින් යැවූසේක.

ඒ රජදරුවෝ තුන් දෙන අපමණවූ රජපෙරහරින් යන්නාහු සාරසියක් යොදුන් මඟ ගෙවා උත්තරපඤ්චාල නුවරට පැමිණියාහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මැණියන් විචාරන්නාහු කිමෙක්ද? මැණියන්වහන්ස! වෙදෙහ රජ්ජුරුවෝ සතුරාගේ නැයෝයයි මා කෙරෙහි කළ වෛරයෙන් නුඹවහන්සේ කෙරෙහි නොසතුටුව විසූද? නොහොත් සංග්‍රහ කළෝදැයි කීහ

දෙවී කියන්නාහු පුතණ්ඩ! කුමක් කියන්නේද? මා තමන්ට මවු තනතුරටත් වඩා දේවතා තනතුරෙහි තබා දුටහ. නන්දා දෙවින් වැදූ මවු තනතුරටත් වඩා දුටහ. පඤ්චාලචණ්ඩ කුමාරයන් එක කුසින් උපන් මල් තනතුරේ තබා බොහෝ ආචාර සමාචාරයෙන් බොහෝ සත්කාර සංග්‍රහ කළහයි මැහැලින්වහන්සේ තමන් මුඛ නොසෑහෙන පරිද්දෙන් ගුණ කීහ.

රජ්ජුරුවෝ එබස්අසා වඩ වඩා සන්තොෂයට පැමිණ බෑනණු වන්ට බොහෝ පාක්කුඩම් හා පඬුරු යවූහ. වෙදෙහ රජ්ජුරුවන් කළ සංග්‍රහ මැණියන් අතින් විචාරන්ටත් නන්දා දෙවින් අතින් නොවිචාරන්ටත් කාරණා කිම්දයත්? නන්දා දෙවින් තරම් රූ ඇති කෙනෙක් දඹදිව අනික් රජක්හට ඇත්නම් ඈ තමා සමීපයෙන් සාරසියයක් ගවුවේ හිඳ මා කළ දෙයක් කෙළේයයි සිතා, මා කෙරෙහි ආදරයක්වත් භයක්වත් නැතිව අනාචාරශීලීව තමන් සිත්වූ පරිද්දෙන් වැසපුවා වීනම් තමන් අතින් විචාළ කල අනිකක්ම කියත් මුත් ඇති සැටියක් නොකියන්නාහ.

නැන්දේ නම් යෙහෙලියන්ට කුකුළන් හා බළලුන්සේම ශත්‍රු කෙනෙක. ඇත්තක් තබා නැත්තකුත් කියා බිඳුවන්ට තිස්සහ. එසේ හෙයින් බිසවුන් අතින් නොවිචාරා මැණියන් අතින් විචාළ හයි දතයුතුයි. එතැන්පටන් කොට චූලනී රජ්ජුරුවෝ වෙදෙහ රජ්ජුරුවන් හා සමගව සතුටු සිතින් එක්සිත්ව විසූහ.

මහා උමංගඩ නිමි.

එතැන් පටන් පඤ්චාලචණ්ඩි කුමාරිකා බිසවු වෛදෙහ රජ්ජුරුවන්ට ප්‍රියමනාප. සිත් ගෙන වසන්නාහු දෙවන හවුරුදු පුතණු කෙනකුන් වැදූහ. ඒ කුමරු වැඩී දස හැවිරිදි කල වෛදෙහ රජ්ජුරුවෝ සවර්ගස්ථ වූහ. බොධිසත්ත්වයන්වහන්සේ දස හැවිරිදි කුමාරයන්ට ධවලච්ඡත්‍ර නංවා රාජ්‍යයෙහි පිහිටුවා දෙවයන් වහන්ස! මම නුඹවහන්සේගේ මුතුන්වූ චූලනී රජ්ජුරුවන් සමීප යට යෙමියි වදාළසේක.

කුමාරයෝ කියන්නාහු පණ්ඩිතයෙනි! මා බාල තැනැත්තනු හැරපියා නොයව. මම තොප පියතනතුරෙහි තබා රකිමි. සියල් ලෙන්ම ආදර කෙරෙමියි කීහ. ඒ අසා පඤ්චාල චණ්ඩි කුමාරිකා බිසවු කියන්නාහු මාගේ දෙමවුපියන් ඇතත් මට පිය තනතුරෙහි සිට මේ සාරසියයක් ගවුවට සරණ දුන්දූත් නුඹදෑමය. ජනමානතර වෛරී රජවරුන් කිරඹසේ එක් සිත් කරවා අවෛරී කළදෑත් නුඹ දෑමය. එසේහෙයින් මටත් මපුතණුවන්ටත් අභිවෘද්ධිදායකදෑත් නුඹදෑමය. නුඹ මින් ගිය හොත් අපට කිසි පිටිවහලෙක් අනික් පිළිසරණෙක් නැත. නොගිය මැනව. දරුවන්ගේ පිය රජ්ජුරුවන් සිටියාසේ එක් දහස් තුන්සියයක් ගවු වට ඇති වෛදෙහ රටත් මේ සත්යොදුන් මියුලු නුවරත් සියලු රාජ්‍යසම්පත් රජ්ජුරුවන් හුන්නාසේ අනුභව කොට රාජ්‍යය කළ මැනවැයි කීහ.

පණ්ඩිතයන් වහන්සේද මා විසින් චූලනී රජ්ජුරුවන්ට අපගේ වෛදෙහ රජ්ජුරුවන් සවර්ගස්ථවූ කල එමියි කියා ප්‍රතිඥා කරනලදැ. එසේහෙයින් නොගොස් රඳන්නට නොපිළිවනැයි කියා ඒ මියුලු නුවර බොහෝ ජනයන් කරුණායෙන් බැගෑපත්ව අඬමින් සිටියදී අමරා දෙවින්දූ හා සහජාත යොධයන් හා අවශෙෂ දූසි දස් ආදී නොයෙක් දෙනාගෙන් කැටිව ගියමනාවුන් හැරගෙන නික්මුණුසේක් සාරසියයක් ගවු ගෙවා ගොස් උත්තරපඤ්චාල නුවරට වැඩිසේක.

මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ එනසේකැයි යනු චූලනී රජ්ජුරුවෝ අසාචතුරඞ්ගිනී සෙනාව පිරිවරා පෙරගමන් කොට වඩනා පෙරමඟට ගොස් උපමා නැත්තාවූ මහත් ශ්‍රී විභූතියෙන් නුවරට වඩා ගෙන ගොස් හිඳිනට මාහැඟි මාළිගාවක් දුන්හ. පළමු දුන් සුළුගම් අසුව විනා අනික් දුන් දෙයෙක් නැත්තේය. අමුතුව දුන් දෙයක් නැතත් එහි කිසි සාතස්සල්ලක් නොව කළමනා වේලේ නොපමාව රාජසෙවය කරනසේක.

එසමයෙහි ඉතා නුවණැත්තාවූ කීමෙහි බිණීමෙහි දක්ෂවූ කාරණා කාරණා දන්නාවූ ඉතා ධර්මිෂ්ඨාවූ "භෙරි" නම් පරිව්‍රාජිකා කෙනෙක්රජගෙහි වළඳා මඟුල් උයන වසන්නාහ. මෙබඳු ගුණ නුවණ ඇති කෙනකුන්ද රජගෙහිදී නිරන්තරයෙන් වළඳනාසේකැයි බොධිසත්වයන් වහන්සේත් අසා දන්නාසේක.

මහෞෂධ පණ්ඩිතයෝයයි යන කෙනෙක් රජ්ජුරුවන්ට සේවය කෙරෙත්ල. උන් හා සමාන නුවණැති කෙනෙක් දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මාදී සතර කෙනකුන් කෙරෙහිත් නැත්ලයි පරිව්‍රාජිකාවන්දැත් තමින් අසා දන්නාසේක. එක දවසකුත් ඔවුන් දුටුවිරූත් නැත්මය.

නන්දාදෙවීත් එදවස් මා උමඟින් සොරා ගෙන ගොස් නොයෙක් අයින් මසක් වන ගණන් රජ්ජුරුවන්කෙරෙන් වියෝ කොට පීනයි තමන්ගේ එපමණ ප්‍රිය විප්‍රයොගයට බොධිසත්වයන්වහන්සේ කෙරෙහි නොපහන් නෙතත්තෝ වෛරයෙන් තුමූ කිසිවකුත් කරන්ට අසමර්ථව තමන් කෙරෙහි වල්ලභ ස්ත්‍රීන් පස්දෙනකුට කියන්නාහු තොපි හැම මහෞෂධ පණ්ඩිතයාගේ යම්කම් අපරාධයක් පරීක්ෂා කොට රජ්ජුරුවන්ට කියා බිඳුවා පියවයි කීහ.

ඒ ස්ත්‍රීහු මහතාණන්ගේ වරදක් සොයන්නාහු ඔබ ආ ගිය තෙන තමන් ස්වභාවයෙන්ම සෙරුන් හෙයින් අනුන්ට කිසිවකුත් නොහඟවා පරීක්ෂා කොට ඇවිදිනාහ.

එක් දවසක් පරිව්‍රාජිකාවන්ද රජගෙහිදී වළඳා තමන්වහන්සේගේ ආවාසයට වඩනාසේක් බොධිසත්වයන්ද රාජසේවයට යන්නවුන් රාජාංගනයෙහි මිදුලෙහිදී දුටහ. බොධිසත්වගන්ද පරිව්‍රාජිකාවන්ද වැඳලා සිටිසේක. එවිට පරිව්‍රාජිකාවන්ද සිතන සේක් මේ පණ්ඩිතයෝ ඉතා නුවණැත්තෝල. එබැවින් උන් නුවණැති නියාවත් නුවණ නැති නියාවත් පරීක්ෂා කෙරෙමියි සිතා බසින් කීවා කවුරුත් දැනගන්නාහ. හස්තමුද්‍රා නම් ඉතා නොදත හැකි දෙයෙක. එසේහෙයින් හස්තමුද්‍රායෙන් ප්‍රශ්න විචාරමි සිතා බොධිසත්වයන්ද මූහුණ බලාලා අත්ල විදහාපෑසේක. ඒ කුමක් නිසාදයත්? කිමෙක්ද පණ්ඩිතයෙනි! රජ්ජුරුවෝ තොප නොරටින් දූකසේ මේ රටට ගෙන්වා ගෙන නොයෙක් සම්පත් අත විදහා දීපියා ඉඳුරා සුවසේ රකිත්දැයි සිතින් සිතා මුවෙන් නොබැණ අත විදහා පෑසේක.

බොධිසත්වයන්වහන්සේ සිතනසේක් මා අතින් හස්තමුද්‍රායෙන් ප්‍රශ්න විචාරනසේක්වනැයි ඔබ සිතා පැවා තමන්වහන්සේ ප්‍රඥා නමැති දිවැසින් දූත ප්‍රශ්න විසඳනසේක් මිට හකුළුවා පෑසේක.

ඉන් කුමක් කී නියාදයත්? ස්වාමීනි! එදවස් මා අතින් මා සමීපයට එවයි ප්‍රතිඥා ගෙන දැන් මා එවාගෙන මිට තබා අනුන්ට නොදෙන් නාක් පරිද්දෙන් කිසිවකුත් මට නොදෙන්නාහයි සිතින් සිතා අතින් ප්‍රශනය විසර්ජනය කළසේක.

නැවත පරිව්‍රාජිකාවන්ද ඔබ දැනගත් නියාව තමන්දැත් දැන අත ඔසවා තමන්දැගේ හිස පිරිමැදලූසේක. ඉන් කුමක් කී නියාද යත්? පණ්ඩිතයෙනි! ඉදින් උකටලීවූ නම් අපසේ මහණව නොකනුනැයි හැඟවූ නියාය. ඒ දැන බොධිසත්වයන්වහන්සේ තමන්වහන්සේගේ බඩ පිරිමැදලූසේක. ඉන් කියන්නේ නම් ස්වාමීනි! මාවිසින් පොෂ්‍යය කරන්නාවූ බන්ධු ජනයා ආදීවූවන්ගේ බඩවල් බොහෝය. එසේ හෙයින් පැවිදි වන්නට නොපිළිවනැයි කී නියාය. මෙසේ ඒ පරිව්‍රාජිකාවන්ද හස්තමුද්‍රායෙන් ප්‍රශන විචාරා තමන්වහන්සේගේ ආවාසයට වැඩිසේක. බොධිසත්වයන් දැත් පරිව්‍රාජිකාවන්ද වැද රාජසෙවයට ගියසේක.

ඒ වූ නියාව නන්දා දේවීන්ගේ වල්ලභස්ත්‍රීහු රජගෙයි සිවුමැදුරු කවුළුයෙහි සිටියාහු මේ ක්‍රියාව දැක චූලනී රජ්ජුරුවන් සමීපයට ගොස් දෙවයන්වහන්ස! මේ මහෞෂධ පණ්ඩිතයන් හා භෙරි පරිව්‍රාජිකාවන් හා එක්ව නුඹවහන්සේට සතුරුව රාජ්‍යය ප්‍රාර්ථනා කරන්නාහ. නොබෝ කලකින් නුඹවහන්සේ මරා රාජ්‍යය ගන්නාහයි බිඳුවාපීහ.

ඒ අසා රජ්ජුරුවෝ කියන්නාහු කිමෙක්ද, තොප දුටු දෙයෙක්ද? ප්‍රත්‍යක්ෂ කොට ඇසූ දෙයෙක්දැයි කීහ. එසේ වී නම් ඇසුව මැනව පරිව්‍රාජිකාවන්ද ඊයේ රජගෙහිදී වළඳා මාළිගාවෙන් බැසයනදැ රජගෙහි මිදුලෙහිදී මහෞෂධ පණ්ඩිතයන් දැක බොහෝ දෙනා හෙයින් බසින් මන්ත්‍රණයට භය ඇතිව අතින් ඉඟි පානාහු නැයි පණ්ඩිතයෙනි! තොපි නුවණැත්තෝ වූහල. මේසා දසදහසක් යොදුන් දඹදිව සියලු රාජ්‍යය අතුල් තලයක් මෙන් නොහොත් කලමඩලක් මෙන් තනා ගෙන රාජ්‍යය තොප අත්පත් නොකර නැයි තමන්දැගේ අත්ල විදහා උපමා කොට පැදූය. ඒ දැනගෙන පණ්ඩිතයෝ කඩුව මෙසේ ගනිමි නම් කීප දවසකින් රජහු හිස කපා රාජ්‍යය මා අත්පත් කොට ගනිමියි කඩුව ගන්නාලෙස අත මිට හකුළුවා ලූහ.

පරිව්‍රාජිකාවෝ එසේ වී නම් පණ්ඩිතයෙනි! රජහු හිස කපා හැරපියවයි තමන් හිස පිරිමැද ලූහ. ඉසට ගැසූ කල මාගේ හයින් අත වැරද මුදුනෙන් හිස පලා ගියේ නම් නපුර. බඳ මැදින් දෙපළ

කොරෙමියි තමාගේ බඩ පිරිමැද්දූහ. මහරජ! ඇසූ දෙයක් කුමට කියමෝද? අප සිය ඇස් පුරා දුටුම්හ. සැක නොකොට අප්‍රමාදව මහෞෂධ පණ්ඩිතයා මරාපියව්යි කීහ.

රජ්ජුරුවෝ උන්ගේ බස් අසා මෙසේ සිතූහ. මාවිසින් පණ්ඩිතයන්ව වරදින්ට නොපිළිවන. පරිව්‍රාජිකාවන්දෑ විචාරා දැන පිළිනම් යහපතැයි සිතා දෙවන දවස් පරිව්‍රාජිකාවන්දෑ වළඳා අනන යෙහි උන්වහන්සේ සමීපයට ගොස් විචාරන්නාහු කිමෙක්ද? ස්වාමීනි! මහෞෂධ පණ්ඩිතයන් දුටුසේ ඇද්දැයි කීහ. එසේය, මහරජ! ඊයේ රජගෙහිදී වළඳා යන්නාමෝ අතර මගදී දුටුම්හයි කීහ. කිමෙක්ද? උන්හා පසු පෙරතුව[1] කළ කථා අල්ලාප සල්ලාප යෙක් වීදැයි කීහ. මහරජ! අපි උන් නුවණැතැයි යනු අසා ඉදින් නුවණැත්තෝ වී නම් මේ දැනගන්නාහයි සිතා උන්ගේ නුවණ පරීක්ෂා කරන පිණිස හස්තමුද්‍රාවෙන් ප්‍රශ්න විචාරන්නෙම් කිමෙක්ද? පණ්ඩිතයෙනි! රජ්ජුරුවෝ තොපගේ ටවින් තොප ගෙන්වාගෙන අත විදහා විපුල කොට සම්පත් දීපියා තොප සුවසේ රකිත් දැයි අත්ල විදහා පෑමි.

ඒ වූ නියාව දැනගත් පණ්ඩිතයෝ මාගෙන් ප්‍රතිඥා ගෙන මා ගෙන්වාගෙන මිට සඟවා ගත් දෙයක් අනුන්ට නොදෙන්නාක්නු පරිද්දෙන් මට කිසිවකුත් නොදෙන්නාහයි කියා තමන් මිට හකු එවා පෑහ. එසේකල රාජවෘත්තියක් නැතිව තොරට දූකසේ කෘපණ ව ජීවත් වන්නා බලා අපසේ පැවිදිව නොගනුතැයි මාගේහිස පිර් මැදලීමි. ඒ බව දැනගත් පණ්ඩිතයෝ මා රකිනේ එක බඩෙක් නොවෙයි. මතු බොහෝ බඩවලැයි තමන් බඩ පිරිමැද්දූහයි වදාල සේක. ස්වාමීනි! පණ්ඩිතයෝ නුවණැත්තෝදැයි කීහ. එසේය මහ රජ! නුවණැත්තෝය. අනන්තාපරිමාණ සක්වළ දිව්‍ය, බ්‍රහ්ම, නාග සුපර්ණ මනුෂ්‍යයන් අතුරෙන් උන් හා සමාන නුවණැති කොනෙ කුත් නැත. උන්ට වඩනා කෙනෙකුත් කැලම නැතැයි වර්ණනා කළහ.

රජ්ජුරුවෝ පරිව්‍රාජිකාවන්දෑගේ බස් අසා වැද පන්සලට යැවූහ. උන් වහන්සේ ගිය ඉක්බිති ජනානන්දකරවූ ප්‍රිය නෙපුල් ඇති බොධිසත්වයන්වහන්සේ රාජසේවයට ආකල්හි රජ්ජුරුවෝ විචාරන්නාහු කිමෙක්ද? පණ්ඩිතයෙනි! හෙරී පරිව්‍රාජිකාවන්දෑ දුටුදැයි විචාළහ. එසේය, මහරජ! ඊයේ රජගෙයි සිට යන්නවුන්දෑ

1 පෙරත්තුව

දිවිම් වදාළසේක. කල කථා ඔබ්ඳුයි කීහ. බයින් කී දෙයෙක් නැත. හස්තමුද්‍රාවෙන් පැනයක් විචාළසේක. ඒ විචාළ පැන මමත් නොවරදවා හස්තමුද්‍රායෙන් විසඳීමියි පරිව්‍රාජිකාවන්ද කී පරිදි දෙන්ම නොවරදවා වදාළසේක.

රජ්ජුරුවෝ මහතාණන් කෙරෙහි පැහැද දසදහසක් යොදුන් දඹදිව මුළුල්ලට නායක කොට සෙනෙවිරත් ධුරය පාවාදී පට බැන්දූහ. සියලු රාජ්‍යය මුළුල්ල පණ්ඩිතයන් කියෙක්ම කෙළේමය. මෙවක් පටන් මා කරන්නේත් උන් කියෙක්මය. යනාදීන් සියලු දඹදිව විධාතම උන්වහන්සේටම පාවාදුන්හ.

හිමාලයෙන් හුනු පස්වූ මහාගඞ්ගා එක්ව මහමුහුදට වදනා කලක් පරිද්දෙන් බෝධිසත්වයන්ගේ ගෙට සියලු සම්පත් හා ඓශ්වර්ය්‍යය මහමුහුද වඩදිය වඩනා සේ ප්‍රමාණාතික්‍රාන්තව ඉතා බොහෝ විය. රජහු තමන් වහන්සේට යසස් දීමෙන් ඉක්බිති නුවණැති ඒ මහෞෂධ මහතාණෝ මෙසේ සිතූසේක.

ඒ කෙසේදයත්?

රජ්ජුරුවන් වහන්සේ එකවිටම මෙසා මහත් තනතුරක් දී තමන් හා මා මුත් සම්පත්තීන් ආඪ්‍ය කෙනකුන් නැති නියාවට මෙසේ මහත් ඉසුරෙහි පිහිටුවාලූහ. රජදරුවෝ යමක්හු කෙරෙහි වෛරී වූ නම් පස්වරු නසත් නම් පෙරවරු මහාසම්පත් දෙන්නාහ. දැන් මටත් මෙතෙක් දවස් කිසිවකුත් නොදී මහොඝයක් පරිද්දෙන් මේසා සම්පතක් එක පැහැර දීපීහ. රජ්ජුරුවන් මා කෙරෙහි හිත සිතින් දුන් බවත් අහිත සිතින් දුන් බවත් නොදනිමි. කාලක්‍ෂෙප කොට එයිත් දූතපිම් නම් යහපතැයි සිතා රජ්ජුරුවන්ගේ අදහස් තත්වූ පරිද්දෙන් දූතපියන්ට අතික් කිසි කෙනකුන්ටත් නොපිළිවන. "භෙරි" පරිව්‍රාජිකාවන්වහන්සේ මහාප්‍රඥ ඇතිසේක. උන්වහන්සේ එක් උපායකින් ඒ දූතපියන්ට තරම්සේකැයි සිතා බොහෝ සුවඳ මල් ආදිය ගෙන්වා ගෙන පරිව්‍රාජිකාවන් වහන්සේගේ පන්සලට ගොස් සුවඳින් මලින් පූජා කොට ස්වාමීනි! නුඹවහන්සේ රජ්ජුරුවන්ට මාගේ ගුණ කීවක් පටන් රජ්ජුරුවෝ තමන් හැර සම්පත්තීන් මා මුත් අතික් කෙනකුන් නැති නියාවට මහවතුරක් මෙන් මාගේ මාලිගාව ඉසුරෙන් සමෘද්ධ කොට පීහ. ඒ මා කෙරෙහි හිතකමින් දුන් බවත් මා නසාපියන පිණිස වෛරී සිතින් දුන් බවත් මට නොහැකෙයි. රජහු මා කෙරෙහිදු ඇති සාධු ගුණය තත්වූ පරිද්දෙන් දූත වදාළ මැනවැයි කීහ.

පරිබ්‍රාජිකාවන්ද යහපතැයි ගිවිස දෙවන දවස් රජගෙට යන ගමනේ “දියරකුසු පැනය”යි යන ප්‍රශ්නයක් සිතූසේක. ඒ ප්‍රශ්නය සිතා නැවත සිතනසේක් පණ්ඩිතයන් හා එක්ව කථා කළ වරපුරුෂයකුසේ නොවී උපමාවකින් ප්‍රශ්නය විචාරා පණ්ඩිතයන් කෙරෙහි රජ්ජුරුවන් හිත අහිත දෙක දැනපියම් සිතා ගොසින් වළඳා අනනයෙහි රජ්ජුරුවන් අවුත් වැඳ හුන්කල්හි පරිබ්‍රාජිකාවන්දුව මෙසේ වූ අදහසෙක් වූයේය. කෙසේදයත්? ඉදින් මේ ප්‍රශ්නය සබයෙහි බොහෝදෙනා මධ්‍යයෙහි විචාළෙම් නම් රජ්ජුරුවෝ පණ්ඩිතයන් කෙරෙහි වෛරවූ නම් බොහෝදෙනා මධ්‍යයෙහි වෛරීබව කිවුනම් යුක්ත නොවෙයි සිතා මහරජ! තනිව රහස් කථාවක් කැමැත්තම්හයි වදාළසේක.

රජ්ජුරුවෝ සමීපයෙන් මිනිසුන් පිටත් කරවූහ. එවිට පරිබ්‍රාජිකාවන්ද කියනදූ මහරජ! තොප අතින් ප්‍රශ්නයක් විචාරමි වදාළසේක. විචාළ මැනව ස්වාමීනි! දනිම් නම් කියමි කීහ. එවිට පරිබ්‍රාජිකාවන්ද ගාථාවකින් මෙසේ කියත්.

සචෙ වො වුය්හමානානං – සත්තන්නං උදකණ්ණවෙ
මනුස්සබලි මෙසානො නාවං ගණ්හෙය්‍ය රක්ඛසො
අනුපුබ්බං කථං දත්වා මුඤ්චසි දකරක්ඛිතො'ති.

මහරජ! තොපගේ වැදූ මෑණියෝ තලතාදෙවීය, තොපගේ නායක බිසවූ නන්දාදෙවීය, තොප හා එක කුසින් උපන් මලණුවෝ තීක්ෂ්ණමන්ත්‍රි කුමාරයෝය, තොපගේ යාළුවෝ ධනුශෙඛර කුමාරයෝය. අග්‍ර පුරෝහිත කෙවට්ට බ්‍රාහ්මණයාය, මහෞෂධ පණ්ඩිතයෝය, මහරජ! තොපිය යන මේ සත් දෙනා මහාසමුද්‍රයෙහි එක නැවකින් යන්නවුන් දක මිනිසුන් කා ඇවිදිනා උදක රාක්ෂසයෙක් මිනිස් බිල්ලක්ම සොයා ඇවිදිනේ තොප හැම නැඟී යන්නා වූ නැව දක බලසම්පන්නවූ ඒ රකුසු තෙමේ මුහුද දිය දෙබේ කොට ගෙන අවුත් තොප හැම නැඟී යන නැව අල්වාගෙන තොපට කියනකල මහරජ! තොප හා කැටිව යන නෑයන් සදෙනා පිළිවෙළින් එක් එක් කෙනකු දුනහොත් මුත් නැව නොහරිමියි කී නම් ඒ සදෙනාගෙන් පළමු කවුරුන් දෙවුද? දෙවනු තුන්වෙනුව කවුරුන් දෙවුද? සතර වෙනිව කවුරුන් දෙවුද? පස්වෙනිව කවුරුන් දෙවුද? සවෙනිව කවුරුන්ද යයි කවුරුන් පළමු කොට කවුරුන් අනන කොට බිලි දී ඒ ජලරාක්ෂසයා අතින් ගැලවෙවුදැයි විචාළසේක. ඒ අසා රජ්ජුරුවෝ තමන් සිත වඤ්චාවක් නැතිව අදහස්වූ පරිද්දෙන් නොවළහා කියන්නාහු ගාථාවකින් කියත්.

මාතරං පඨමං දජ්ජං භරියං දත්වාන භාතරං
තතො සහායං දත්වාන පඤ්චමං දජ්ජං බ්‍රාහ්මණං
ඡට්ඨා'හං දජ්ජ මත්තානං නෙවදජ්ජං මහොසධ'න්ති.

ස්වාමීනි! ඒ ජලරාක්ෂසයා අප සත්දෙන නැගි නැව අල්වාගෙන මට කියන කල තෙලෙ නැව සිටිනා සදෙනා පිළිවෙළින් මට බිලි දී තෙපි ගැලවෙවයි කී නම් ඔහට බිල්ලට පළමු කොට මෑණියන් දෙමි. දෙවෙනිව මාගේ ප්‍රියභාර්‍යාවන් නන්ද දෙවීන් දෙමි. තුන්වෙනිව මාගේ මලණුවන් තීක්ෂ්ණමන්ත්‍රී කුමාරයන් දෙමි. සතරවෙනිව මාගේ යාළුවා දෙමි. පස්වෙනිව කෙවට්ටයා දෙමි. පස්දෙනා දීපියා මහෞෂධ පණ්ඩිතයන් හා මා හා දෙන්නා මතු සිටිකල පළමු ලත් පස්දෙනාගෙන් තොයාදී [1] නැවත බිලි ඉල්වා නම් පිළිතර කොට හැඳ කැසපට කවාගෙන දස දහසක් යොදුන් දඹදිව මා කරන්නාවූ රාජ්‍යශ්‍රීය සිතිනුත් නොසිතා "එම්බල! මා කාපියව"යි කියා මහෞෂධ පණ්ඩිතයන් හයා මා පිටිපස්සේ ලා පියා ඒ රාක්ෂසයා කට දල්වා ලූ කල්හි පණ්ඩිතයන් මාරුවේ ඔහු කටට පැන ඔහට බිලි වෙමි. නමුත් මා පණ ඇතිව හිඳ මා ඇසින් බල බලා මාගේ සිතින් මාගේ පණ්ඩිතයන් රාක්ෂසයාට නොම දෙම්මැයි කීහ.

මේ ප්‍රශ්නය මෙතෙකින් නිමියේය. එතෙකුදු වුවත් රජ්ජුරුවන් පණ්ඩිතයන් කෙරෙහි ඇති හිත සිතත්, මා විචාළ ප්‍රශ්නයත් මා ඇසූ පමණකින්ම ප්‍රසිද්ධවන්නේ නොවෙයි. එබැවින් සමුද්‍රයෙහි දියපිට ඉසලූ තෙලිත්තක් මුළුල්ලෙහි විහිද ගියා පරිද්දෙන් කෙළෙම් නම් යහපතැයි සිතා මේ රජහු පණ්ඩිතයන් කෙරෙහි ඇති හිතකම් බොහෝ ජනයන්ටත් ප්‍රසිද්ධ කෙරෙමි. මේ රජ්ජුරුවන්ගේ මෑණියන් තලතාදෙවීන් ආදීවූ දියරකුසාට දෙමි කී පස්දෙනාගේ ගුණ බොහෝ දෙනා මධ්‍යයෙහි කියමි. පණ්ඩිතයන්ගේ නුගුණ කියමි. රජ්ජුරුවෝ උන්ගේ බොහෝ නුගුණ කියා මහෞෂධ පණ්ඩිතයන්ගේ ගුණ පමණ නැතිව කියති එසේකල්හි බොධිසත්ත්වයන්ගේ ගුණ ආකාශයෙහි පූර්ණ චන්ද්‍රමණ්ඩලයසේ මේ මුළු පොළොව පහළ වන්නේයයි සිතා මහරජ! තොපගේ අන්තඃපුර වාසීන් හා රාජකුමාරවරුන් හා මේ අටසාලිස් ගවු පමණ වට ඇති නුවර ප්‍රසිද්ධ ජනයන් එකහෙලා රැස් කරවා ජනසමාගමයේ හිඳ විචාරමි සිතා රජහු ලවා ජනසමාගමය කරවා රාජාඞ්ගනයෙහි මාහැගි ආසනයෙක්හි හුන් පරිව්‍රාජිකාවන්ද රජහු අතින් පළමු තමා තනිව විචාළ පරිද්දෙන් ජලරාක්ෂස ප්‍රශ්නය ආදියෙහි පවත්

1 තොයාපී

විචාරා රජ්ජුරුවනුත් තමන් පළමු කී පරිද්දෙන්ම උදකරාක්ෂසයාට පළමු මැණියන් හා සවෙනිව තමන් හා පිළිවෙළින් යක්ෂයාට බිලිවත්ම මහෞෂධ පණ්ඩිතයන් රකිම්මැයි මා පණ තබා ඇසිල්ලකුත් මාගේ මහෞෂධ පණ්ඩිතයන් කෙරෙන් වියෝව විසිය නොහෙම්මයයි කී කල්හි පරිව්‍රාජිකාවන්ද කියන්නාහු මහරජ! සිත එකක් තබා බසින් එකක් නොකියව. අපවැන්නන්ටත් මායම් කියත්ද? රාජ මායම් නොකියව. තොප මේ කියන්නේ කවුරුන් අදහා ගන්නා දෙයක්ද? දියරකුසා නැව අල්වා ගත්කල පළමුව වැදූ මැණියන් දෙමි යව. දෙවනුව බිසවුන් දෙමි යව. තුන්වැනිව මලණුවන් දෙමි යව. සතරවැනිව යාළුවා දෙමි යව. පස්වැනිව කෙවට්ටයා දෙමි යව. උන් පස්දෙනා තරම් තොපට ප්‍රාණ සමානයන් අනික් කවුරුනුත් නැත. තවද උන් පස් දෙනාගෙනුත් නොසැතපී ඉල්වූනම් රාක්ෂසයාට තොප ගොදුරු වුවත් මහෞෂධ පණ්ඩිතයන් රකිමි කිව. බැලූකල මහෞෂධ පණ්ඩිතයන් තරම් තොපට සතුරෝ ඇද්ද?

ඊට කාරණා කිම්දයත්?

ඒ මහෞෂධ පණ්ඩිතයන් එවක තොපට කළාවූ ද්‍රෝහිකම් කියන්නමෝ තම් කෙවට්ට බ්‍රාහමණයාගේ උපායෙන් සත් අවුරුදු සත් මස් සත් දවසකින් දික් විජය කොට දඹදිව එක් සියයක් රාජධානි සාධා සියයක් රජුන් හා සමඟ උයනෙහිදී විෂමිශ්‍ර සුරායෙන් රජුන් දිවි නසා එක්සත් කරන්නට හුන් දවස් මූත් තමන්ගේ යොධයන් එවා කරවූ ආලොහලයෙන් ඒ සා උත්සවයක් බිඳගිය එකක් වුව.

නැවත ඒ කොපයෙන් දිලිහුණු එක් සියයක් රජුන් හා චතුරඞගිනී සේනාව පිරිවරා මියුලු නුවරට ගියවුන්ට තමන්ගේ සෙවකයන් යවා තොප ඇතුළුවූ රාජසෙනාවට නින්දා පරිභව බණවා නැවත තමන්ගේ අනුකෙවට්ටයාගේ මන්ත්‍රණයෙන් තොප සියල්ලවුන් කෙරෙහි භයින් තනිව රෑ පැලැවාවූ තොපට චූලනී රජ සොරා පැලැයයි සෙනාව මැද හඬ ගස්වා ඒ හඬ ඇසූ එක්සියයක් රජුන් සහිත ඒ සා මහත් සෙනාව ඇතුන්, අසුන් ආදිකොට ආයුධ හා හන් පලන් පිළී අනනකොට ගෙනගිය නොයෙක් සම්පත්තීන් කිසිවකුත් නොගෙන ඉස් ලූ ලූ අත පලවා කළ අනර්ථයෝ මෙතකැයි පමණ නැත්තාහ.

ඒ ලජ්ජාවෙන් මෙසේ වෙදෙහයා සාදා ගනිමියි දූවණියන් සරණ දෙමි සිතා ගෙන්වාගෙන සිත ඇත්ත සාදාගන්ට හුන් දවස් තොප හා මෙතෙක් රජදරුවන් සහිතවූ මේසා සෙනාවක් තමන් හුන් උපකාරී නුවර වට්ලා ගෙන සිටියදී මේ පණ්ඩිතයන් තමන්ගේ රජු පමණක් ගලවා යවා තොපියා තොපගේ රජගෙයි රැකවලින් සුරක්ෂිතව හුන් නෑයන් සතර දෙනා තමන්ගේ යොධයන් ලවා තොපගේ රුවන් ගබඩාවල තුබූ අනඝවූ රුවන් හා සමග වෛදෙහ රජ්ජුරුවන්ට පාවා දී රෑ උමඟින් පිටත් කොට සාර සියයක් ගවු ගෙවා දෙවන දවස් පාන් වූ කල තොප ඇතු නැඟී පිරිස මෙහෙයමින් එන්නවුට තමන් [1] සර්වාභරණයෙන් සැරසී රන් මිරිවැඩි පිට සිට චඳවෙකු ලීලායෙන් මාලිගාවේ මතු මාලේ සිට රජ්ජුරු කෙනෙකැයි කිසි භයකුත් නැතුව තොපට කෙළි කවට කොට තමා නුවණැති හෙයින් කතස්සලු කරවා තොප තමාගේ වසඟයට පමුණුවා නන්දා දෙවීන්ගේ රූප වර්ණනා කොට එහි බැඳුනාවූ තොප තමාට නොසතුරු බව දැන උමඟ බලනු කැමති තොප නුවරට ගෙන රජදරුවන් හා සෙනාව සහිතවූ තොප උමඟින් ගෙන ගොස් උමඟින් පිටත මහවිසල් මලුවෙන් පිටත් කොට ගෙන අතිකකු පිටත් විය නොදී රජදරුවන් හා මහා සේනාව උමඟ හසු කොට අගුළු ගෙන තනිවූ තොපට තමන්ගේ බල පෑ කඩුව සරහා තොප සියුමැලි තැනැත්තන් භය ගන්වා නැවත තමන්ගේ නුවණින් මිහිරි බස් කියා භය හරවා [2] එවිටම ඔවුනොවුන්ට සපථ කොට අභය ඉල්වාගෙන තොප ලවාම තමාට යාඥ කරවා උමඟ දොර හැර එතෙනට ආ එක් සියයක් රජදරුවන් විසින් පණ්ඩිතයෙනි! ඇසිල්ලෙක දොර නොහළවානම් අපි හැමත් සෙනාවත් මළමෝය. අප දිවි ලද්දේ තොප නිසායයි උන් උන් ලවාම තමන්ගේ ගුණත් එතෙනම කියවා ඇයි රජදරුවෙනි! දැන් මතුද මා තොප දිවි රැක්කෝයයි උයනේදී විෂ රා පොවා මරන්නවුන් රැක්කෙම් වේදැයි කියා ඒ රජුනුත් තොප කෙරෙහි දොම්නස් කරවා නැවත තමන්ගේ නුවණින්ම රජ්ජුරුවන්ගේ වරද නොවෙයි. කෙවට්ටයාගේ අසත් සමවායෙනැයි ඒ වරද බමුණු මාල්ලා පිට තබාපියා සිවි පියෙහි සිට එක්සියයක් රජදරුවන්ගේ එක්සියයක් ඔටුනු හා එකී එකී රජක්හුගේ සුසැටත් පමණ ආභරණ හා එක් සියයක් දෙනාගේ පලන් ඔටුනු සහිත ආභරණ තාක් මූළල්ල රජුන් මස්තකයෙන් පැලඳ තමන් පාවිට පූජාවට වැසපි. සත්රුවන් වර්ෂාවක් පරිද්දෙන් පූජා කරවා නැවත තොපගෙන් හා රජදරුවන්ගෙන් අපමණවූ සත්කාර සම්මාන ලදින් ගම් බිම් හා

1 තුඹු   2 නවතා

යාත වාහන ලදින්. තොපගෙන්ම පිරිස් සම්මත කරවා තමාගේ නුවරට ගොස් රජහු කාලක්‍රියා කළ කල තොපට තමන් පෙර කළ මෙතෙක් අපරාධ නොසිතා හයක්වත් නැතිව නැතිගැන්මක් වත් නැතිව ලජ්ජා ශූන්‍යව ඉතා අලජ්ජී වූ එකකු පරිද්දෙන් තොප මුහුණ දූලි ගානාසේ තොපගේ නුවරටම අවුත් තෙමේ සාපරාධමැ නිරපරාධවූ එකක්හු මෙන් මෙහි වසන්නා වූ මේ මහෞෂධ පණ්ඩිතයන් ඇතිවක් පටන් මෙවක් දක්වා තොපට කළ කවර ගුණයක් සිතා උන් රැක උන් මාරුවේ තොප රාක්ෂසයාට කීලි වන්නට කාරණා කිම් ද?

නැවත වැදූ මවුනම් සත්ත්වයන්ට උන්ට වැඩි උපකාරී කෙනෙකුත් නැත. ඉතුත් තොපගේ මැණියන් සෙස්සවුන්ගේ මවුන්සේ අල්ප වූ ගුණ ඇති කෙනකුන් සේ නොවත් උන් තොපට බොහෝ උපකාරී වූහයි. තලතාදේවීගේ ගුණ කියන්නාහු මෙසේද කියත්.

ඡපාසෙතා තෙ ජනෙත්ති ච දීඝරත්තා'නුකම්පිකා
ජමහිතා,සි පද්දුට්ඨස්මිං පණ්ඩිතා අත්ථ දස්සිනී.
අඤ්ඤදං උපනිසං කත්වා වධා තං පරිමොචයි.
තං තාදිසිං පාණදදිං ඔරසං සබ්බධාරිනිං
මාතරං කෙන දොසෙන දජ්ජාසි දකරක්ඛිනො'ති.

මෙසේද කියා මහරජ! තොප ඉතා බාල අවස්ථාවෙහි පටන් දවසකට දෙතුන්වරක උලා නාවා අඳුන් තෙල් ගාවා කවා පොවා කන් නාසා අත් පා හඹා පොෂ්‍ය කොට වැඩූහ. දසමසය් කුසින් උසුලා වැඩූහ. බොහෝකලක් මොලොක්වූ සිත අදහස් ඇතිවැ දයා කළහ. යම් කලෙක "ජමහී" නම් බමුණා තොප මරන්ට සිතී ද එකල්හි කාරණ දන්නා ස්ථානොචිත ප්‍රඥා ඇති තොපගේ මැණියෝ අතික් සුදුසු උපායක් කොට තොප ඒ මරණින් මිදූ ද එසේ තොපගේ පණ රැක ලෙහි ලා වැඩූ මැණියන් කවර වරදකින් දිය රකුසාට දෙවු දූසි කීහ.

ඒ පණ රැකා දුන්නේ කෙසේ ද යත්? මේ චූලනී රජ්ජුරුවන්ගේ පියාණෝ මහාචූලනී රජ්ජුරුවෝ යයි කෙනෙක් වූහ. මේ චූලනී කුමාරයන් බාල කල ඒ රජහු සිහාව පිරිමසා සිටි "ජමහී" නම් පුරෝහිත බමුණා හා මේ තලතාදෙවීන් ලොකාස්වාද රතියෙන් සතුටුව සමහව වසන්නාවුන් විෂ මිශ්‍ර භොජනයකින් රජහු මරා බමුණාට ධවලච්ඡත්‍ර නංවා ඕහට අග මෙහෙසුන්ව බමුණා ලවා රාජ්‍යය කරවන සමයෙහි එක් දවසක් චූලනී කුමාරයෝ මැණියන්වහන්ස! බඩ සායයි කීහ. ඕහට

මී සකුරු ආදීන් පැණියක් හා කැවුම් දෙවූහ. එහි මැස්සෝ පිරිවරා ගත්හ. ඒ කුමාරයෝ මැස්සන් දුරුකොට පියා කැවුම් කාමි සිතා රන් තැටියෙන් මී බිඳු බිම ඉසලා තැටියේ හුන් මැස්සන් ගසා තෙරපීහ. මීමැසි සමූහයා තැටියෙන් ගොසින් බිම ඉසළු මීපැණි බිඳුවල වසා ගත්හ. එවේලෙහි මැස්සන් මීයෙන් තොරා කැවුම් කා අත කට ශුද්ධ කොට කෙළියට ගියාහ.

බ්‍රාහ්මණයා මේ ක්‍රියාව දැක සිතන්නේ මේ දූන්ම ඉස නොතැගම තමා කන කැවුමෙහි හුන් මැස්සන් පලවාපියා කැවුම් කැය. ඉදින් නොනැසී වැඩුනි නම් මට රාජ්‍යය නොදෙන්නේය. මොහු දූන්ම මරාපියමි සිතා එපවත් තනිව තලතාදෙවීන්ට කීය. බිසවු කියන්නාහු දෙවයන්වහන්ස! මම නුඹවහන්සේ කෙරෙහි කළ සෙනහයෙන් මාගේ එවැනි වූ රජ්ජුරුවන් පවා විෂ ලා මරාපීමි. රා බොන තැනැත්තන් "පොර තල් කඩන්නාසේ[1]" මූගෙන් මට ප්‍රයොජන කිම්ද? බොහෝ දෙනාට සැල නොකොට ගොරා මරා පියම්සි කියා බමුණා වඤ්චාවෙන් අස්වසාලා ඉතා නුවණැතිවූ උපාය දන්නා වූ ස්වභාවයෙන්ම ස්ත්‍රී මායම් දන්නාවූ තමද පඤ්චාල දෙශයෙහි ඉතා නුවණැති පණ්ඩිතවරුන් දස දෙනාට වඩා නුවණැති එකොළොස් වෙනි පණ්ඩිත වූ ඒ බිසවු උපායෙක් ඇතැයි ක්ෂණයෙහි සිතා අරක්කැමියා කැඳවා දරුව! මාගේ පුතණුවෝ චූලනී කුමාරයෝත් තොපගේ පුතණුවෝ ධනුශෙඛර කුමාරයෝත් එකද උපන්හ. සමානවූ කුමාර!පෙරහරින් වැඩියාහ. එබැවින් ඔවුනොවුන්ට ප්‍රාණ සමාන යහළුවහ. දැන් ජම්භි නම් බ්‍රාහ්මණයා මපුතණුවන් මරණු කැමතිය. තෙපි මා දරුවන් දිවි රැක දෙවයි කීහ.

යහපත දෙවීන්වහන්ස! කුමක් කෙරෙම්දැයි කීය. එවිට එසේ වීනම් මපුතණුවෝ එක්වත් තොපගේ ගෙහිම වෙසෙත්වයි කවුරුනුත් සැක නොකරන පරිද්දෙන් හා හැමදෙනා දන්නා පරිද්දෙන් කීප දවසක් තුන්දෙනා මතු තනිව මහ මුළුතැන්ගෙයි වැද හොවා චූලනී කුමාරයන් හා අරක්කැමියා හා පුතු ඇතුළු තුන් දෙනාම මුළුතැන්ගෙයි මය දවස් යවන්නේයයි, සැක නැතිවූ කල තොප වැදහොත් තෙන එළුවන්ගේ ඇට ඇදලාපියා මිනිසුන් රැ නිදි ගත්කල මුළුතැන් ගෙයි ගිනි ලාපියා කිසි කෙනකුන්ටත් නොහගවා මාගෙත් තොපගෙත් දරු දෙන්නා හැර ගෙන මේ නුවර හළවාහලින් පලමු තික්ම පසල් දනවුවෙහි අනික් රටකට පලාගොස් මපුතණුවන් රාජකුමාරයන් බව කාටත් නොහඟවා දිවි රැක දෙව[2]යි කීහ.

1 පොල් තල් වඩන්නාසේ

2 රැක පියවයි

ඒ අරක්කැමියා යහපතැයි ගිවිසි කල්හි ඕහට හස්තසාර කොට මෙයින් හැරගෙන යවයි මුතු මැණික් ආදී රුවනින් යම්තම් දෙයක් දුන්හ. ඒ අරක්කැමියාත් කිසවුන් කී පරිද්දෙන් ජන ශඞ්කා රහිත වන තෙක් කිප දවසක් මුළුතැන්ගෙහි තුන් දෙනම ලැගුම් ගෙන යන දවස් ගෙහි ගිනි ලා යන්නාහු ක්‍රමයෙන් ගොස් මදුරට සාගල නුවරට වැද රජ්ජුරුවන් දැක සේවය කොට තමන්ගේ ජාති හැඟවූහ. මදුරට රජ්ජුරුවෝ තමන්ගේ පරණ අරක්කැමියා හැර ඔහුගේ මූළුරැකි[1]නා ධුරය ආගන්තුක අරක්කැමියාට දුන්හ.

කුමාරවරු දෙදෙන ඕහු හා සමග එක්ව[2] රජගෙට යන්නාහ. රජ්ජුරුවෝ මේ කුමාරවරු කාගේ දරුවෝදැයි විචාළහ. මාගේම දරුවෝයයි කී කල්හි මේ එක් වැනිය, මේ එක්වැනි නොවෙයි.[3] කී කල්හි මහරජ! මාගේ දෙබිරින්දගේ දරු දෙන්නායයි කීය. එසේ කල් යත් යත් එක්වන් ඔවුනොවුන් දැක්මෙන් හා එකතැන සඤ්චාරය කිරීමෙන් හා හැඟිලී ගොස් මදුරජ්ජුරුවන්ගේ දුවණී යන් හා එක්ව රජගෙයිම කෙළනාහ.

නැවත චූලනී කුමාරයන් හා රාජකුමාරිකාවන් හා එක්වන් දැකීමෙන් ඔවුනොවුන් කෙරෙහි පිළිබඳ අදහස් ඇතිවූහ. කෙළි මඩලේදී චූලනී කුමාරයෝ තමන් කෙළිනා පලස් හූවටත් ලනුවත් රාජකුමාරිකාවන් ලවා අර ගෙන, තෙල ගෙනැයි යනාදීන් තමන් සිටි තෙනට ගෙන්වා ගන්නාහ. සමහරවිට නොගෙනා කල තරවා ඔළුවේ ඇන ලන්නාහ. කුමාරයා තමාගේ රාජමානයෙන් තරවා ගැසූ පහර සමහරවිට සනායෙන් ඉවසා යති. ඉතාම රිදී යන්නා දූරිය ඉවසිය නොහී හිස අත ගගා අඬන්නාහ.

ඒ අසා රජ්ජුරුවන් මාගේ දරුවන්ට ගැසුවෝ කවුරුදැයි කී කල්හි කිරිමවුන් ගොසින් විචාළ කල මොහුමය ගැසුවේ කීම් නම් මපියාණෝ මෝහට රාජාඥ කරවන්නාහයි ඔහු කෙරෙහි සෙනහ යෙන් ඒ බව හඟවා කුමක් කියවුද? මා කවුරු මරද්ද? නිකම් හඬාපීම්යි මායම් කියා යට කරන්නාහ.

නැවත එක් දවසක් මරන්නවුන් රජ්ජුරුවෝ තුමූම දැක මෙසේ වූ සිතක් සිතූහ. මේ කුමාරයා මූ හා එක සැටින් නොවන් නේය. සවණී ප්‍රතිබිම්බයක් මෙන් බැලූවන් ප්‍රසාද එලවන්නාවූ

1 මූළුරකිනා
2 එක්වත්
3 මේ වෙනස්නැයි

එකෙකැ. මේ රජගෙයකැයි වත්, රජ්ජුරුවන්ගේ දුවකැයි වත්, මම තොරපින් ආමිවත්, අරක්කැමියාගේ පුතෙකි වත්, කිසි භයක් වත් තැති ගැන්මක් වත් නැත්තේය. මට වළඳා කී බව මුත් අරක්කැමියාගේ පුතෙක් නොවෙයි සිතා එතැන් [1] පටන් පරීක්‍ෂා කරන්නාහ. කිරිමවු කුමාරවරුන් කෙළනා තෙනට කැවුම් ආදී දෙය ගෙනගොස් දෙන්නාහ. ඒ කැවුම් කුමාරිකාවෝ සෙසු බාල දරුවන්ට බෙදා දෙන්නාහ. සෙස්සෝ දික් කළ කැවුම් ගන්නා කල දණ වක නමාගෙන තැඹුරුව දෑත් පුං දික් කොට ආදර යෙන් හැරගෙන කන්නාහ.

චූලනී කුමාරයෝ කෙළිමින් සිට අතින් උදුරාගෙන කන්නාහ. එසිත් රජ්ජුරුවෝ තුමූම දුටහ. නැවත එක් දවසක් චූලනී කුමාරයන් කෙළනා බඹර දමාලුව.[2] රජ්ජුරුවන්ගේ කුඩා යහන යටට ගියේය. කුමාරයෝ ඒ ගන්නා නැනැත්තෝ තමන්ගේ ඓශ්වර්‍ය මදයෙන් හා රාජ මානයෙන් මත්ව මේ ප්‍රත්‍යන්ත රජුගේ ඇඳ යටට ඉස නැමීම නම් ඔහු වැන්දුව අඩුදැයි අභිමාන උපදවා දණ්ඩකින් ඒ බඹරය මෙහෙයා මැත් කොට ගත්හ.

රජ්ජුරුවෝ ඒ ක්‍රියාවත් දැක එකාන්තයෙන්ම මේ අරක්කැමියාගේ පුතෙක් නොවෙයි කියා [3] අරක්කැමියා කැඳවා මේ තාගේ පුතෙක්දැයි විචාළහ. දෙවයන්වහන්ස! මාගේ පුතායි කීය. එම්බල අරක්කැමිය! තාගේ පුතාත් නුපුතාත් මම දනිමි. කියයි නම් බොරු නොකියා ඇති සැටියේ කිය බොරු කී නම් දන්නෙම් වේද? තාගේ ජීවිතයට නොසිතයි කඩුව අමෝරා භය ගැන්වූහ. ඒ මරණ භයින් තැතිගෙන කියමි කියමි ස්වාමීනි! තනිව දන්වා ලන්නා කැමැත්තෙමි කී කල්හි රජ්ජුරුවන් මිනිසුන් දුරු කරවූ කල්හි යාඥා කොට අභය ඉල්වාගෙන කියන්නේ වැඩිමාලු චූලනී රජ්ජුරුවන්ට බේත් ලා මැරූ තැන් පටන් රජහු විචාළ තැන් දක්වා තමන් කොට ආ ප්‍රවෘත්ති කථාව වූ පරිද්දෙන් නොවළහා කීය.

රජ්ජුරුවෝ තත්වූ පරිද්දෙන් අසා දැන ගෙන තමන්ගේ දුව ණියන් සියලු කිසෙස් පලඳනාවෙන් සරහා චූලනී කුමාරයන්ට කිරින්ද කොට පාවා දුන්හ. මේ චූලනී කුමාරයන් ගොස් මදුරට විසූ නියාවය.

1 එවක් පටන් 2 දමාලුවා
3 දක්වා

අරක්කැමියා හා කුමාරවරුන් ගිය දවස් අරක්කැමියාත් පුතාත් චූලනී කුමාරයෝත් තුන් දෙනම මූළුතැන්ගෙයි දහත් ගින්නෙන්ම ඇතුළේදී මලහයි නුවර මුළුල්ලේ එක කොලාහල විය. තලතාදෙවී එපවත් අසා බමුණාට කියන්නාහු දෙවයන් වහන්ස! නුඹ හා අප හා සිත ඇත්ත මුදුන් පත් වීයයි තුන් දෙන එක මූළුතැන්ගෙහිම දා මළ නියාව කී කල්හි බමුණා ඔද වැඩී සතුටු වීය.

ඒ තලතා නම් මායම් දෙවී චූලනී කුමාරයන්ගේ ඇටයයි එළු ඇට ගෙන්වා බ්‍රාහමණයාට පෑ ගිවිස්වූහ. මේතිසා පරිව්‍රාජිකාවන්ද අනික් උපක්‍රමයක් තමන්ගේ නුවණින් දක්වා නොහොත් එළුවන්, ඇට තොපගේ ඇටයයි බමුණාට පෑ ගිවිස්වා තොප මරණින් මුදා රැක්කීයයි කීසේක.

මෙසේද කියා තොප දස එකඩ මසක් කුසින් උසුලා ප්‍රෙම සහිතව වඩා මරණින් මුදා මේසා රජඉසුරක පිහිටුවා අපමණ අභිවෘද්ධි දායකවූ මෑණියන් කවර වරදකින් ජලරාක්ෂයාට දෙවුදැයිකීහ.

ඒ අසා රජ්ජුරුවෝ කියන්නාහු සවාමිනි! මාගේ මෑණියන්ගේ ගුණ බොහෝ තියාවත් මට උපකාරී නියාවත් දනිමි. ඒ මාගේ මෑණියන්ගේ නුඹවහන්සේ වදාළ ගුණයට වඩා මා දන්නා නුගුණ යෝ බොහෝයයි මෑණියන්ගේ නුගුණ කියන්නාහු.

දහරා විය අලඞ්කාරං ධාරෙති අපිලන්ධියං
දොවාරිකෙ අණීකට්ඨෙ අතිවෙලං ජිජගඝති.

තතො පි පටිරාජූනං සයං දූතානි සාසති
මාතරං තෙන දොසෙන දජ්ජාහං දකරක්ඛිනොති.

සවාමීනි! උන්දෑගේ නුගුණ හැම කියම් නම් ඒ මට නොපිළිවන. යම්තම් දෙයක් කියමි. අසා වදාළ මැනව. තමන්දෑ ඉතා වයොවෘද්ධව සිට සොලොස් හැවිරිදි වයස සිටි බාල ස්ත්‍රීන් පලඳනා වූ රාව ප්‍රතිරාව දෙන්නා වූ මිණිමෙවුල් දම් ආදී නොපලඳමනා පලඳනා පැලඳ නොහොත් විදුරු පිරූ මණිමෙඛලා දම්පැලඳ මා අමාත්‍ය මණ්ඩලය පිරිවරා යට මාලේ නඟතලද ධවලච්ඡත්‍ර යට සිංහාසනාරූඪව හුන් කල්හි බොහෝ දෙනාට පෙනෙන පරිද්දෙන් ඇත් මෑත් බලා සක්මන් කරන කල්හි පැලඳි මිණි මෙවුල් දම් හඬ සියලු රජගෙය එකතින් නාද කෙරෙමින් පවත්නේය. සිටි අමාත්‍යමණ්ඩලයාත් මාත් මුන්වහන්සේ පලන් ආභරණයෙහි ශබ්ද නියාව දැන මම ලජ්ජායෙන් කරබා ගනිමි. අමාත්‍ය සමූහයා ඔවුනොවුන් මුහුණ බලන්නාහ.

තවද ඇතුන් අසුන් රථ ආදි වාහන බලන්නවුන් හා වාසල් රක්නා පුරුෂයන් හා නැවත රජදරුවන් ළඟ සිට කරන කථාවක් තබා දක්කාදී කන්නටත්[1] කැත කරන තරම් ආසන්නයටත් නොවැද්ද හැක්කවුන් තමන්දැගෙන් මිනිසුන් යවා උන් නේපත් අතින් දී ගෙන්වා ගෙන රජගෙවල මිනිසුන් සිටිය මනා වේලා මේය. පිටත් වුවමනා වේලා මේයයි ව්‍යවස්ථාවක්[2] නැතිව ගෙන රෑ වුවත් දහවල් වුවත් යන්ට අවකාශ නොදී මහත් කොට සිනාසී කෙළි ගොෂ්ටි කෙරෙමින් බොහෝසේ දවස් යවනදෑය.

ඊටත් වඩා තවත් නොකටයුත්තක් බලා වදාළ මැනව. ප්‍රත්‍යන්තයෙහි මා හා සතුරුවූ රජදරුවන් මා යැවුවා කොට පත් ලියා යවන කල මාගේ මෑණියෝ මැහැලි නොවනදෑය. සොළොස් හැවිරිදි වයස සිටියන්ට මුත්දෑම වඩනදෑය. පඤ්චකාම අනුභවයට තරම්දෑය. මේ නම් රජ්ජුරුවෝ අවුත් තමන්ට බිරින්ද කොට ගෙන යෙත්වයි කියා මා යවුවා කොට මට සොරා පත් යවනදෑය.

ඒ රජ්ජුරුවෝ පත් බලා භයින් තැති/ගෙන නැවත මට පත් එවන කල අප තමන්වහන්සේගේ සේවකයන් වුව කුමක් නිසා මෙසේ නොතරම් කටයුත්තක් කියා එවුසේක්දැයි පත් එවන්නාහ. ඒ ගෙනා පත් සබයේ කියවන කල්හි මා හිස් වද්දන තැන් තැත්තා සේ මහා ලජ්ජා වන්නේය. මේ මේ දෝෂ නිසා වැඳූ මෑණියන් දියරකුසාට පළමු කොට දෙම් කීහ.

මහරජ! ඒ වන්නා මේ දෝෂයෙන් මෑණියන් දියරකුසාට දෙව; තොපගේ බිරින්ද නම් ඉතා බාල අවස්ථාවෙහි පටන් තොපට උන් තරම් ගුණ ඇති කෙනෙක් නැතැයි නන්දා දෙවීන්ගේ ගුණ කියන පරිව්‍රාජිකාවන්දෑ මෙයින් වදාරනසේකි.

ඉත්ථිගුම්බස්ස පවරා - අච්චන්ත පියවාදිනී
අනුග්ගතා සීලවතී - ඡායා'ව අනපායිනී.

අක්කොධනා පඤ්ඤවතී - පණ්ඩිතා අත්ථදස්සිනී
උබ්බරිං කෙන දොසෙන - දජ්ජාසි දකරක්ඛිනො'ති.

මහරජ! මේ නන්දා දේවී නම් තොපගේ සොළොස් දහසක් බිසෝවරුන්ට නායකායහ. සිවුසැටක් පමණ ස්ත්‍රී ලක්ෂණයෙන් විරාජමානයහ. පඤ්චකල්‍යාණයෙන් යුක්තයහ. තවද තොප බාල අවස්ථාවෙහි පටන් ඡායාව සේ තොප අත් නොහැර පැවැත්තාහ[3] ආදියෙහි පටන් ඇගේ ගුණ කියම් නම් මිදුරට සාගල නුවර තොප වසන සමයෙහි නොප තමා මැරූකල ගෙඩි කත් මුත් තොපගේ ආඥව මුරුත්තු වෙයි යන භයින් තොප කෙරෙහි කළ සෙනහ යෙනුත් දෙමවුපියන්ට පමණක් නොකීන.[4]

1 සරත්තටත්
2 බැවහාරයක්
3 පැවැත්තීය
4 නොකිව

මෙබඳු ගුණ ඇති නොකිපෙනසුලුවූ ගුණ ඇත්තාවූ කාරණා කාරණා දන්නාවූ සඟවා කී බසෙකත් නත්වූ පරිද්දෙන් අභිප්‍රාය දන්නාවූ බාලයෙහි පටන් ඡායාව මෙන් අත් නොහැර ආවාවූ තොප සිත්වූ පරිද්දෙන් වැස තොප වැනි පිනැතිවූ දරුවන් වදා රාජාභිවෘද්ධිය වඩා දුන් ඒ නන්දාදේවීන් කවර වරදකින් ජලරාක්ෂසයාට දෙවුදැයි කීසේක. රජ්ජුරුවෝ ඒ අසා බිසවුන්ගේ නුගුණ කියන්නාහු මේ ගාථාවෙන් කීහ.

ඛිඩ්ඩාරතී සමාපන්නං – අනත්ථ වස මාගතං
සා මං සකානං පුත්තානං – අයාචං යාචතෙ ධනං.
සො'හං දදාමි සාරත්තො ලහුං උච්චාවචං ධනං
සුදුච්චජං චජිත්වාන – පච්ඡා සොචාමි දුම්මනො
උබ්බරිං තෙන දෙසෙන – දජ්ජාමි දකරක්ඛිනො'ති.

ස්වාමීනි! මේ ලෝකයෙහි ස්ත්‍රී වසඟවූ යම් පුරුෂයක්හු සතර අපායට ගෙනයන පරිද්දෙන් මාරයාගේ දූත මෙහෙවරට සිටුවූ චාක් වැනි ස්ත්‍රීන්ගේ පඤ්චකාම නමැති පහසින් මේ නන්දාදේවී රහසිගතව ලෝකාස්වාද රතියෙන් සන්තුෂ්ටව මා තමා වසඟභාවයට පමුණුවා මා අතින් නොඉල්විය යුතු ආභරණාදිය ඉල්වයි.

ඒ කවරේද යත්? මාගේ සෙසු බිසෝවරුන්ට හා උන් උන් ගෙන් මට උපන් දූදරුවන්ට මා විසින් කරවා පළඳවා ලන ලද බිසෝ පළඳනා හා කුමාර පළඳනා හා මා අතින් ඉල්වයි. මම ඒ දුන් කල මතු ඒ පළඳනා ඇත්තවුන්ටත් මටත් පසුතැවිලියෙක් කනස්සලුවෙක් මේ නිසා මතු වෙයි යන්නක් නොසිතා කාමරාග යෙන් දවන ලද අදහසින් මොහයෙන් මූර්ඡාව ඈ ඉල්වූ පළඳනා ආදිය උදුරා දෙමි. මෝ ඒ හැරගෙන බිසෝවරුන්ට හා දරුවන්ට දුන් දෙය උදුරවා ගනිමියි සතුටු වෙයි. ඒ පළඳනා උදුරා ගත් කල ඒ බිසෝවරු හා දරුවෝ අවුත් මෙකී වස්තු අපට දුන්නේත් හැයිද? නැවත උදුරා ගත්තේත් හැයිදැ'යි ශොකාතුරව ඇවිත් බොහෝ මැසිවිලි කියා සබයෙහි මහරජ! නුඹවහන්සේ අමැදහත් නියායයි යනාදීන් කියත්. ලජ්ජාවෙන් හිස පැළී යන්නාසේද? පොළොව පැළී යන්නාසේදැයි සිතමි.

දෙවන දවස් උන් හඬමින් වලපමින් සිටි කල්හි මමත් මා කෙළේ කළමනා දෙයක් නොවෙයි. ඉතා නොකළමනා දෙයකැයි කනස්සලුව නැවත භාණ්ඩාගාරයෙන්[1] උදුරා ගත් දෙයට දිගුණක් දීත් උන් සන්හිඳුවා ගත නොහෙමි. මෙසා දෙම්නසෙක් වන්නේ උන් නිසා වේද? මේ වරද මුල් කොට ජලරාක්ෂසයාට නන්දාදේවීන් දෙමි කීහ.

1 භාණ්ඩාගාරයෙන්

නැවත පරිව්‍රාජිකාවන්ද බිසවුන් වන්නා මේ වරදින් දියරකුසාට දෙව. තොපගේ මලණුවෝ තීක්ෂණමන්ත්‍රී කුමාරයෝ නම් ඉතා තොපට උපකාරීහුය. උන්ගේ කවර වරදක් හෙතුකොට ගෙන දියරකුසාට දෙවුද? උන් කළ දෙයම ගුණ කියනසේක් මෙසින් වදාරනසේකි.

යෙනොවිතා ජානපදා ආනීතා ච පටිග්ගහං
ආහතං පර රජ්ජෙහි අභිට්ඨාය බහුං ධනං.
ධනුග්ගහානං පවරං සූරං තික්ඛිණමන්තිනං
භාතරං කෙන දෙසෙන දජ්ජාසි දකරක්ඛිතො'ති.

මහරජ! තොප ස්වදෙශයෙන් ගොස් අන්‍ය දෙශයෙහි වැඩෙන්නවුන් හොහොත් උපන් රටින් ගොස් තොරට හුන්නවුන් තමන්ගේ උපායෙන් තොප ගෙනවුත් අන්න පාන වස්ත්‍රාභරණාදී දසවිධ රත්නයෙන් අනූනවූ රාජ්‍යයෙහි පිහිටුවූහ. තවද දස දහසක් යොදුන් දඹදිව දුනුවායන්ට අග්‍රවූ ධනුශ්ශිල්පයෙහි දක්ෂවූ හෙවත් තුන්සිය සූසැටක් තුඩයෙහි කෙළ පැමිණියාවූ යුද්ධයෙහි දක්ෂවූ පරසතුරන් මැඩ බොහෝ සම්පත් තොපට එලවන ලද ඉතා වැර සර වූද තීක්ෂණමන්ත්‍රී වූ එකකුසින් උපන් මලණුවන් කවර වරදකින් දියරකුසාට දෙවුදැයි වදාළසේක.

පූර්වයෙහි ඒ තමා කෙසේවූ ප්‍රවෘත්තියෙක යත්? ඒ තීක්ෂණමන්ත්‍රී කුමාරයෝ නම් මැණියන් තලතාදේවීන් වැඩිමහලු චූලනී රජ්ජුරුවන් විෂ යොදා මරා බමුණා හා එක්ව වසන කල උපන්හ. එසේ බව මුත් උපන්නේ මහලු චූලනී රජ්ජුරුවන්ටමය. ඒ තීක්ෂණමන්ත්‍රී කුමාරයන් වැඩුණු කල කඩුවක් අතට දී මම් අල්වා ගෙන මා ළඟ එක්වන් සිටුවයි කීය. ඒ කුමාරයෝත් බ්‍රාහමණයා තමන්ගේ පියාණනැයි සිතාම උපස්ථාන කරන්නාහ.

එ කලුත් දූන් සේම වියරුවෝ ඇතිවන්නාහ. එක් අමාත්‍යයෙක් කුමාරයෙනි! තොපි මේ බමුණාගේ පුතණු කෙනෙක් නොවව. තොප මවු කුස වසන සමයෙහි තොප මවූ තලතාදෙවි මේ බමුණා පිණිස තොප පියාණන් මහාචූලනී රජ්ජුරුවන් සිරිහිලා මරා මේ බමුණාටම ධවලච්ඡත්‍රය නංවා රාජ්‍යයෙහි පිහිටුවූහ. තොපි මහාචූලනී රජ්ජුරුවන්ගේ කුමාරයෝයයි කීය.

එපවත් අසා කුමාරයෝ දණ්ඩකින් පහළ ආශීවිෂයකු පරිද්දෙන් කිපී එක් උපායකින් මේ බමුණා මරමි සිතා රජගෙට ගොස් වදනෝ තමන්ට ඒ බමුණා දුන් කඩුව තමන් ළඟ සිටි එකක්හට දී අනිකක්හට කියන්නාහු තෝ තෙල කඩුව මාගේ කඩුවයයි විවාද

කොට කලහ වඩවයි. රජගෙට වන්හ. ඔහු දෙදෙනා ඔවුනොවුන් හා මේ මාගේ කඩුවය. තව දුන්නෝ කවුරුදැයි යනාදීන් කලහ කළහ. කුමාරයෝ පළමු තුමූ නොදත්වන් සේ කොල කුමන කලහයෙක් දැයි එකකු බලන්නට එවූහ. ඒ අවුත් නුඹවහන්සේගේ කඩුව අතිකෙක් තමාගේ කඩුවයයි උදුරා කලහ කෙරෙති කීය.

බමුණා ඒ අසා කුමක්දැයි විචාළ කල්හි නුඹවහන්සේ මට දුන් කඩුව අනුන්ගේ කඩුවෙක්දැයි කීහ. කුමක් කියවුද? පුත! මාගේ භාණ්ඩාගාරයෙහි සිය දහස් ගණන් අනර්ඝවූ කඩු තිබියදී තොප එකම පුතණුවන්ට අනුන්ගේ කඩුවක් කුමට දෙම්දැයි කීය. එසේ වී නම් නුඹවහන්සේ මට දුන් කඩුව හැඳිනගත හෙනසේක් වී නම් පරීක්ෂා කරන පරිද්දෙන් ගෙනෙම්දැයි කීහ. හැයි පුතණ්ඩ! මා දුන් කඩුව මම් නොහඳුනෙම්දැයි කියා වහා ගෙන්වයි කීය. කුමාරයෝ කඩුව ගෙන්වා කොපුයෙන් හයා මැත් කොට බැලුව මැනවැයි කඩුව පාතා එකක්හු පරිද්දෙන් වමතින් කොපුව ගෙන විදුලියක් ගැසූ ඇසිල්ලෙහි මෙන් කඩුව ඇද බැලුව මැනවැයි කියා බලන්ට දික් කල ඒ ක්ෂණයෙහි එක පහරින් බමුණා හිස කපා තමන් පාපිට හෙළා ගත්හ.

එංවේලෙහි මල බමුණා රජගෙන් පිටත් කොට ගෙය පවිත්‍ර කරවා නුවර සරහා කුමාරයන්ට ධවලච්ඡත්‍රය නංවන්ට සිටිකල්හි මැණියෝ තලතාදෙවි වැඩිමහලු පුතණුවන් මදුරට සාගල නුවර වසන නියාව කීහ. ඒ අසා තීක්ෂ්ණමන්ත්‍රී කුමාරයෝ චතුරඞ්ගිනී සේනාව පිරිවරා ගොස් බෑණන් ගෙනවුත් රාජාභිෂේකයට පමුණුවා රාජ්‍යයෙහි පිහිටුවූහ. ඒ කුමාරයන් යම් මන්ත්‍රණයක් ක්ෂණයෙහි සිතා පියන තරම් බුද්ධි ඇති හෙයින් එවක් පටන් තීක්ෂ්ණමන්ත්‍රී කුමාරයෝයයි දඹදිව ප්‍රසිඩවූහ. පරිව්‍රාජිකාවන්දැ මෙබඳු කුමාරයන් කවර වරදකින් උදක රාක්ෂසයාට දෙවුදැයි විචාළසේක. ඒ අසා රජ්ජුරුවෝ මලණුවන්ගේ නුගුණ කියන්නාහු මෙසින් කියනසේකි.

> මයොචිතා ජාතපදා ආනීතා ච පටිග්ගහං
> ආහතං පරරජ්ජෙහි අභිට්ඨාය බහුං ධනං.
>
> ධනුග්ගහානං පවරො සූරො තිඛිණ මන්ති ච
> මයා'යං සුඛිතො රාජා අතිමඤ්ඤති දූරකො.
>
> උපට්ඨානම්පි මෙ අය්‍යෙ! න සො එති යථාපුරෙ
> භාතරං තෙන දෙමෙසත දජ්ජා'හං දකරක්ඛිනො'ති.

සවාමීනි! මා තොරටින් තනිව වසන්නහු මේ නුවරට ගෙන වුත් තමන්ට පැමිණි රාජ්‍යයෙහි මහාඓශ්වර්‍ය්‍යයෙහි පිහිටුවා ලීම්යි කියාත් හැම විද්‍යාමෙහිත් නද දුනු ඇදුමෙහිත් ධනුශ්ශිල්ප යෙහිත් මට වඩනා දක්‍ෂ එකෙක් මේ දස දහසක් යොදුන් දඹදිව නැතැයි කියාද, සවාමීනි! සෙස්සක් තබා පෙර රාජ සේවයට එන කල බොහෝ දෙනා දක්නා වේලේ කල් තබා එන්නේය. දූන් මේ නිසා අභිමානයෙන් කල් යවාත් එන්නේය. සමහර දවස් තුමාම නොඑන්නේය. තොරට වසන්නවුන් ගෙනවුත් මේසා රාජ්‍ය සම්පත්හි පිහිටුවූයෙම් මම්ම යයි මා හෙළා දක්නේය. එසේ හෙයින් මේ වරද නිසා මාගේ මලණුවන් ජලරාක්‍ෂසයාට දෙමි කීහ.

පරිව්‍රාජිකාවන් වන්නාව, මලණුවන් ඒ වරදින් ජලරාක්‍ෂස යාට දෙව. ධනුශෙඛර කුමාරයා නම් තොප හා එකාත්මික සමාන වූ බොහෝ ගුණ ඇති උපකාරී යහළුවායයි ඔහුගේ ගුණ කියන පරිව්‍රාජිකාවන්ද,

එකරත්තෙන උභයො තුවඤ්ච ධනුසෙඛචා
උභො ජාතෙත්ථ පඤ්චාලා සහායා සුසමා වයා

චරියා තං අනුබන්ධිත්‍වො එක දුක්ඛ සුඛො තව
උස්සුකො තෙ දිවාරත්තිං සබ්බකිච්චෙසු ව්‍යාවටො
සහායං කෙන දොසෙන දජ්ජාසි දකරක්ඛිනො'ති.

මහරජ! ධනුශෙඛර කුමාරයා නම් නද දුනු ඇදුම්හිත්, විද්‍යමෙහිත් දක්‍ෂය. මෙම පඤ්චාල නුවර තොප හා එකදවස උපන. එබැවින් සමවූ වයස් ඇත්තේය. හිය සේයාසේ බාලයෙහි පටන් සුව දුක් දෙකම එක්ව විඳ ආය. තවද තොපගේ රාජ්‍යකෘත්‍යයෙහි රෑ දෙවෙහි අප්‍රමාදව වසන්නේය. එසේ වූ බන්‍ධු සමානවූ යහළුවා සාවර වරදකින් දියරකුසාට දෙවුදූයි කීහ. ඉක්බිති යහළුවාගේ නුගුණ කියන්නාවූ රජ්ජුරුවෝ මේ ගාථාවෙන් කියත්.

චරියාය අයං අය්‍යෙ පජග්ඝිත්‍වො මයා සහ
අජ්ජාපි තෙන වණ්ණෙන අතිචෙලං පජග්ඝති.

උබ්බරියා'පි මෙ අය්‍යෙ මන්තයාමි රහොගතො
අනාමන්තාපි පවිසති පුබ්බෙ අප්පටිවෙදිතො.

ලද්ධචාරො කතොකාසො අහිරිකං අනාදරං
සහායං තෙන දොසෙන දජ්ජා'හං දකරක්ඛිනො'ති.

සවාමීනී! ඒ මාගේ යාළුවා කුමාර කල පටන් එක්ව කා බී එක්ව හිඳ සිට එක්ව කෙළ බොහෝ දවසක් මාකෙරෙහි භය ලජ්ජාව රහිතව විසූ පමණක් සිත සිතාගෙන දූන් මා රජව මේසා රාජ්‍ය

සම්පන්නක පිහිටි කල්හිත් පළමු පරිද්දෙන් මා කෙරෙහි ආදර නැත්තේය. තමාට රැකවල් නැතිහෙයින් කවර වේලෙකත් බිසවුන් හා තනිව රහස් කථාවක් නොකෙරෙම් නමුත් සිටි රැකවලුන් නවත්ව නවත්වා උත්ට පරුෂ බැණ උන් භය ගන්වා තෙමේ නිර්භීතව තනිව හුන් තැනට ගොස් වදනේය. ලජ්ජාශූන්‍යව බස් කියන්නේය. අනාදර කරන්නේය. මා ඉදිරියෙහි දත් තියා ගෙන අත් පොලා සෙන්නේය. මා දුප්පත් සමයේ සේ දැනුත් සිතන්නේය. පළමු කියා නේවා මා හුන් තෙනට වහා එන්නේය. එසේ හෙයින් මේ වරද මූල් කොට මාගේ යාළුවා දියරකුසාට දෙමි කීහ.

ඒ අසා වත්තාට! යහළුවා ඒ වරදින් දියරකුසාට දෙව. මේ කෙවට්ට නම් පුරෝහිත බමුණා තොපට බොහෝ උපකාරීයයි ඔහුගේ ගුණ කියන්නාවූ පරිව්‍රාජිකාවන්දු මේ ගාථාවෙන් කියනසේකි.

කුසලො සබ්බනිමිත්තානං රුදඤ්ඤූ ආගතාගමො
උප්පාදෙ සුපිනෙ යුත්තො නියානෙ ච පවෙසනෙ.

පඬො භුම්මන්තලික්ඛස්මිං නක්ඛත්තපදකොවිදෙ
බ්‍රාහ්මණං කෙන දෙසෙන දජ්ජාසි දකරක්ඛිනො’ති.

මහරජ! මේ කෙවට්ටයෝ නම් සිතූ යම් දේයක් තමා ඇසූ දුටු දෙයක්සේ මේ මේ නිමිත්තෙන් මෙසේ මෙසේවූ වැඩෙක් වෙයි කියා සියලු පූර්ණකුම්භ මාංස කණ්ඩ වෙශ්‍යාස්ත්‍රී මත්තකෙශ නග්න රූප වර්ෂී නිදර්ශනාදී නිමිත්තෙහි ඉෂ්ටානිෂ්ට විභාග දැන්මෙහි දක්ෂයහ. සුනන්, බල්ලන්, කැරල්, කැනහිලුන්, කපුටුවන් කොවුලන්, ආදී සත්වයන්ගේ හඬෙහි වැඩ අවැඩ දන්නාහ. ඍග්වේදය, යජුර්වේදය, සාමවේදය, යන වෙදත්‍රයද තර්කය, ව්‍යාකරණය, ජ්‍යොතිශ්ශාස්ත්‍රය, නිඝණ්ඩුය, නිරුක්තිපදය, ඡන්දෝවිත්‍යය, යන ෂඩ්වෙදාඞ්ගයද, සාමාන්‍ය පුරුෂ ලක්ෂණය හා සූසැට දහසක් ග්‍රන්ථද නිමවා දන්නාහ චන්ද්‍රග්‍රහණ, සූර්‍ය්‍යග්‍රහණ, උල්කාපාත දිග්දාහ, ධූමකෙතු, අසනිපාත, භූමිකම්පන, වලාකුළුහි දිවීම් ආදියෙහිද, සියලු සීනයෙහිද වැඩ අවැඩ දන්නාහ. මේ නකතින් ගමන් යායුතුය. මේ නකතින් යුධයට යායුතුය. මේ නකතින් නුවරට වැඩ යායුතුය. ගෙට වැඩ යායුතුය. යනාදීන් නක්ෂත්‍ර යොජනයෙහිද දක්ෂයහ. වාස්තුවිද්‍යා ආදීවූ භූමියෙහි ගුණාගුණ මේය. ආකාශයෙහි ගුණාගුණ මේයයි භූමියෙහිද, ආකාශයෙහිද, ගුණ දොෂ දක්නට සමර්ථවූහ. අටවිසි නැකතෙහිද, දොළොස් රාසෙහිද,සප්ත දිනයෙහිද, නව ග්‍රහයන්ගේද,උත්පත්තියද දන්නාහ. මෙබඳු මහා නුවණ ඇති තොපගේ පුරෝහිත බමුණා නම් කවර වරදකින් දියරකුසාට දෙවුදැයි කීසේක.

ඒ අසා බමුණාගේ වරද කියන්නාහු මේ ගාථාවෙන් කියත්,

පරිසායමපි මෙ අය්‍යෙ! මීලයිත්වා උදික්ඛති
තස්මා අජ්ජ හම්බුං ලුද්දං දජ්ජා'හං දකරක්ඛිනො'ති.

ස්වාමීනි! ඒ බමුණු මහල්ලාගේ වරද ඇසුව මැනව. මම අමාත්‍ය මණ්ඩලයා පිරිවරා මහා සමෘද්ධීන් සිංහාසනාරූඪව හුන්නෙම් වීම් නම් මේ තමාගේ බැම රැළියෙන් වැසී තිබෙන්නාවූ ඇටි කුළුන්ගේ ඇස් මෙන් ඉතා රත්වූ ඇසින් බැම නගාලා කිපී බලන එකක් මෙන් එක්වන් මා මුහුණ බලන්නේය. ඉදින් සිහිනෙන් දුටුවත් බමවන තරම් මොහුගේ රූප විලාසය හා සාඩ දත් හා ඉතා විරූපවූ මූණ හා රත් වූ ඇස් ඇති රාක්‍ෂසයකු දුටුවාක්මෙන් ඉතා භයපත්ව මොහු දකිනාසේයයි සිතමි. එසේවූ බැලුම් නපුරුවූ විරූපවූ බමුණා මේ වරද නිසා දියරකුසාට දෙමි කීහ.

ඒ අසා පරිව්‍රාජිකාවන්ද මහරජ! ඒ වන්නා තෙපි වැදූ මෑණියන් ඇතුළුවූ පස්දෙනා ජලරාක්‍ෂසයාට බිල්ලට දී නැවත මේසා රාජ්‍ය සම්පතක් හා නොයෙක් ශ්‍රී විභූතිය අළුයම දෑමූ කෙලසේත් නොසිතා තොපගේ ජීවිතය මහෞෂධ පණ්ඩිතයන්ට දෙමි යව, නොහොත් උන් රකිනා පිණිස උන් මාරුවේ උදකරාක්‍ෂසයාට බිලියෙමි යව, ඒ පණ්ඩිතයන් පෙර ගිය දවස වත් මතු එන දවස වත් උන්ගේ කවර ගුණයක් දැක කවර ගුණයක් සලකා එවැන් නක් කරවුදැයි රජ්ජුරුවන්ගේ යසස් හා කීර්ති හා වර්ණනා කරන පරිව්‍රාජිකාවන්ද මේ ගාථාවෙන් කියනසේකි.

සසමුද්ද පරියායං මහිං සාගර කුණ්ඩලං
වසුන්ධරං ආවසසි අමච්ච පරිවාරිතො.

චාතුරන්තො මහාරට්ඨො විජිතාවී මහබ්බලො
පඨව්‍යා එකරාජා'සි යසො තෙ විපුලංගතො.

සොළසිත්ථි සහස්සානි ආමුත්තමණිකුණ්ඩලා
නානා ජනපදා නරියො දෙවකඤ්ඤුපමා සුභා.

එවං සබ්බඞ්ග සම්පන්නං සබ්බකාම සමිද්ධිනං
සුඛිතානං පියං දීඝං ජීවිතං ආහු ඛත්තිය.

අථ ත්වං කෙන වණ්ණෙන කෙන වා පන හෙතුනා
පණ්ඩිතං අනුරක්ඛන්තො පාණං චජසි දුච්චජ'න්ති.

මෙසේද කියා මහරජ! තෙපි වූ කලී සතරදිගින් පිරිවරනලද මහාසමුද්‍රය කෙළවර කොට ඇති දසදහසක් යොදුන් දඹදිවට අග්‍රරජව පෘථිවීශ්වරව තොපට සේවකවූ තෙසු රජදරුවන්ට තෙපි අනුශාසනා කරව. නොහොත් දඹදිවට නායකව රජ කරව.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු